භදන්තාචරිය බුද්ධඝෝෂ ස්ථවිරපාදයන් විසින් විරචිත

# පරමත්ථ දීපනී නම් වූ

# පඤ්චප්පකරණට්ඨකථා

# II

(සිංහල පරිවර්තනය)



ප්‍රකාශනය

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

# පඤ්චප්පකරණට්ඨකථා
# දෙවෙනි කොටස
# සිංහල පරිවර්තනය

පාලි අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉල්ලීම පරිදි, පඤ්චප්පකරණට්ඨ කථා දෙවෙනි කොටස පරිවර්තනය කරන ලද්දේ බී.එම්.පී. බාලසූරිය මහතා විසිනි.

බාලසූරිය මහතා ප්‍රාචීන පඬිවරයෙකි. ඔහු ප්‍රාචීන භාෂා ශාස්ත්‍ර හදාරන ලද්දේ විද්‍යෝදය පිරිවෙන මගිනි. විද්‍යෝදය පිරිවෙනේ අවසාන විභාගයත්, ප්‍රාචීන පණ්ඩිත උපාධියත් තරුණ වියේදීම ලබාගත් බාලසූරිය මහතා, නීති විද්‍යාලයට ඇතුළත් වී නීතිඥයකු වශයෙන් ජීවිකා වෘත්තිය ඇරඹීය. බෞද්ධ ආගමික දේපල සම්බන්ධයෙන් අධිකරණ තීන්දු ඇතුළත් නීති වාර්තා පරිවර්තනය ඒ මහතා අතින් සිදුවිය. අනුරාධපුර බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්ව විද්‍යාලයේ සිවිල් නීතිය පිළිබඳ දේශකයකු වශයෙන් ද කලක සිට එතුමා සේවය කරයි.

පාලි අට්ඨකථා සිංහලට පරිවර්තන මණ්ඩලයේ පරිවර්තකයකු වශයෙන් සේවය කරන ඒ මහතාගේ පළමු වන පරිවර්තනය ''විභංගට්ඨ කථා'' වයි. පාලි පද්‍යකරණයේ විශේෂ දක්ෂතාවයක් උසුලන ඒ මහතා පාලි පද්‍ය ග්‍රන්ථ කීපයක් ද ලියා ඇත. බෞද්ධ ආගමික නීතිය නම් පොතද ඒ මහතාගේ කෘතියකි. පාලි-සිංහල පරිවර්තන පමණක් නොව, ඉංග්‍රීසි භාෂා පරිවර්ත-කයකු වශයෙන් ද හේ කටයුතු කරයි. චීන ජ්‍යොතිශ් ශාස්ත්‍රය එතුමාගේ එවැනි පරිවර්තනයකි. පරිවර්තනයේ පමණක් නොව, දහම් කරුණු නිරවුල්ව විස්තර කිරීමේ දක්ෂතාවයද එතුමා සතුව පවතී.

Vol - xxxviii

භදන්තාචරිය බුද්ධඝෝෂ මහා ස්ථවිර පාදයන් විසින් විරචිත

## පරමත්ථදීපනී නම් වූ

# පඤ්චපපකරණට්ඨ කථා - 2

## (සිංහල පරිවර්තනය)

*බුද්ධශාසන අරමුදලේ පූර්ණ අනුග්‍රහයෙනි.*

පාලි අට්ඨකථා සිංහල පරිවර්තන - 33

භදන්තාචරිය බුද්ධඝෝෂ මහා ස්ථවිර පාදයන් විසින් විරචිත

## පරමත්ථදීපනී නම් වූ

# පඤ්චපපකරණට්ඨ කථා-2

## (සිංහල පරිවර්තනය)

සිංහල පරිවර්තනය

**රාජකීය පණ්ඩිත - නීතිඥ**

**බී.එම්.පී. බාලසූරිය**

අධීක්ෂණය

**පී.ඇල්.කේ. පෙරේරා**

ශාස්ත්‍රපති - තුලනාත්මක වාග් විද්‍යා - (බර්ලින්)

ප්‍රකාශනය

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.

දුරකථන: 2734256 ෆැක්ස්: 2736737

භදන්තාචරිය බුද්ධඝෝෂ මහා ස්ථවිර පාදයන් විසින් විරචිත

**පරමත්ථදීපනී නම් වූ**

# පඤ්චපපකරණට්ඨ කථා-2

(සිංහල පරිවර්තනය)

ප්‍රථම මුද්‍රණය 2008

I S B N - 978-955-1604-29-5

*පරිගණක අකුරුකරණය*

උපමාලි කුලසේකර - කටුගස්තොට.

*පිටකවරය*

සුසිල් ජයශාන්ත පෙරේරා - මහරගම.

මුද්‍රණය

අජිත් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

342, පරණ කැස්බෑව පාර, රත්තනපිටිය, බොරලැස්ගමුව.

දුරකථනය: 0112517269

*ප්‍රකාශනය*

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.

දුරකථන: 2734256, 2728468, 2726234 ෆැක්ස්: 2736737

විද්‍යුත් තැපෑල: bcc456@sltnet.lk

www.buddhistcc.com

# ප්‍රස්තාවනා (අට්ඨකථා)

පාළි භාෂාව මධ්‍යතන ඉන්දු ආර්ය පූර්ව අවධියට අයත් ප්‍රාකෘත විශේෂයක් බවත්, එම ප්‍රාකෘතය වූ කලී එකල උත්තර භාරතයේ ඒ ඒ ප්‍රදේශවල පැවති පොදු ජනයාගේ කථා ව්‍යවහාරය බවත්, පිළිගත් විද්වත් මතයයි. ප්‍රාකෘත ව්‍යවහාරය පොදු ජනතාවගේ හා ශ්‍රමණ සම්ප්‍රදාය ගරු කළ චින්තකයන්ගේ ද භාෂා මාධ්‍යය විය. එය උත්තර භාරතයේ පැතිරී ගිය ඉන්දු යුරෝපීය භාෂා ව්‍යවහාරයෙන් ජනිත වූවක් සේ සැලකිය යුතුය. මෙම ප්‍රාකෘත ව්‍යවහාරයේ ලිඛිත සාධක අනුව මූල අවස්ථාවක් සේ පෙනෙන පාළි භාෂාව උත්තර භාරතයේ කිසියම් විශේෂ ප්‍රදේශයක කථා ව්‍යවහාරයේ මාධ්‍යයක් විය.

1. පාළි භාෂාව ක්‍රි.පූ. 6 වැනි 7 වැනි සියවස්වල කොසොල් රට පැවති කථා ව්‍යවහාරය පදනම් කොට ඇති වූවෙකැයි ද එය නොයෙක් ජනපදවල ජනයාගේ පොදු භාෂා මාධ්‍යය වී යැයි ද මහාචාර්ය රීස් ඩේවිඩ්ස් තුමා පවසයි.

2. පාළිය උජ්ජයිනී ප්‍රදේශයේ භාෂාව යැයි වෙස්ටර් ගාඩ් සහ ඊ කුන් සහ ඔටෝ ප්‍රොන්කේ වැනි විචාරකයෝ පවසති.

3. පාළිය මගධයේ කථා ව්‍යවහාරයයි යන බුද්ධඝෝෂ හිමියන්ගේ මතය මහාචාර්ය ගෛගර් තුමා අනුමත කරයි.

4. බුදුරජාණන් වහන්සේ මුලදී කොසොල් රට බසින් දහම් දෙසන්නට ඇතැයි සලකන වින්ටර්නිට්ස් පාළි ත්‍රිපිටකයේ භාෂාව පැරණි මගධ ව්‍යවහාරය බව පදනම් කොට වෙනත් ප්‍රදේශ ව්‍යවහාරයන්ගේ සම්මිශ්‍රණයද ඇතිව ගොඩනැගුණු බෞද්ධයන්ගේ සාහිත්‍යයික භාෂාවකැයි පවසයි.

5. බුදුන් වහන්සේ ධර්ම ප්‍රචාරයේ යෙදුණු පන්සාළිස් වසින් වැඩි කොටසක් කොසොල් මගධ ප්‍රදේශවල සැරිසැරූ බව බෞද්ධ සාහිත්‍යයේ පෙනෙන බැවින් පාළි භාෂාව කොසොල් මගධ දෙරට

කථා ව්‍යවහාරය පදනම් කොටගෙන බිහි වූවාක් සේ සැලකීමට පුළුවන් බව ඒ කුන් නම් විචාරකයා පෙන්වා දෙයි.

මෙම විග්‍රහයන් ශාස්ත්‍රීය වශයෙන් වැදගත් වන අතර විශේෂයෙන් සැලකිය යුත්තේ බුදුන් වහන්සේගේ මතයයි. බුදුරජාණන් වහන්සේ දක්වා වදාළ ආකල්ප විග්‍රහ වන්නේ මජ්ඣිම නිකායේ අරණ විභංග සූත්‍රයෙනි. මෙම සූත්‍රයෙන් පෙන්වන්නේ උන්වහන්සේ භාෂා මාධ්‍යයෙහි අනවශ්‍ය ලෙස දැඩිව එල්බ ගත් ශාස්තෘවරයෙකු නොවන බවයි. එකම දෙය විවිධ ජනපදවල නාම කීපයකින් හඳුන්වනු ලබන කල ඒ එක නාමයක් දැඩිව අල්ලා නොගෙන ඒ ඒ ලෙසට ව්‍යවහාර කළ යුතු බවත් ලෝක ව්‍යවහාරය නොඉක්මවිය යුතු බවත් අරණ විභංග සූත්‍රයෙහි උගැන්වෙයි.

බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ත්‍රිපිටකය සංගීත වූ භාෂාව වන පාළි භාෂාව ථේරවාදීන්ගේ ආගමික භාෂාව විය. එය සමස්ත ත්‍රිපිටකය පුරා රැඳී ගියේය. ථේරවාදීන්ගෙන් බිඳී ගිය මහායානිකයෝ බුද්ධ ධර්මය සංස්කෘතයට පෙරළා ගත්හ. ඔවුන්ගේ සංස්කෘත සාහිත්‍යය දියුණුවීමත් මුස්ලිම් ආක්‍රමණ වැනි ආක්‍රමණත් මහායානික දර්ශනය විශ්ව විද්‍යාල මගින් රට මුළුල්ලෙහි බෙදා හැරීමත්, මහායානිකයන් ආමිස පූජා යන්ත්‍ර, මන්ත්‍ර ආදියෙන් පෘථග්ජන ප්‍රසාදය දිනාගැනීමත්, භික්ෂු විනය නීති ලිහිල් ලෙස මහායානිකයන් විසින් සකස් කිරීමත් ආදිය නිසා බුද්ධ ධර්මයත් පාළි භාෂාවත් බුද්ධජන්මභූමියෙන් අතුරුදහන් විය. එය ශ්‍රී ලංකාද්වීපයේ තහවුරු විය.

## හෙළඅටුවා

සම්බුද්ධ පරිනිර්වාණයෙන් දෙසිය පන්තිස් වැන්නෙහි අශෝක අධිරාජයාගේ දායකත්වයෙන් පැලලුප් නුවරදී තුන්වන සංගායනාව පැවැත්වීය. මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් රහතන් වහන්සේලා දාහක් සම්බන්ධ වෙමින් මෙම සංගායනාව පවත්වා ඇත. සාහස්සිකා නමින් හඳුන්වන මෙම සංගායනාව නව මසකින් සම්පූර්ණ විය.

තෘතිය සංගායනාවසානයේ දඹදිව ථේරවාදාචරිය පරම්පරාවේ අවසන් පුරුෂයා වූ මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ ශිෂ්‍ය

මිහිඳු මහ රහතන් වහන්සේ විසින් තෘතීය සංගායනාවේදී තෝරා බේරා ගෙන සංග්‍රහ කළ, ථේරවාදී ත්‍රිපිටකය ශ්‍රී ලංකාවට ගෙන එන ලදි. මිහිඳු හිමියන් විසින් ලක්දිවට ගෙන එන ලද පාළි ත්‍රිපිටකය මහා අරිට්ඨ රහතන් වහන්සේ ප්‍රමුඛ කොට ඇති සිංහල භික්ෂූන් වහන්සේලා උගත්හ. පාළියෙන් තිබූ ත්‍රිපිටකයේ ගැටලු තැන් සිංහල ජනතාවට පැහැදිළි කර දීම අවශ්‍ය විය. බුද්ධ කාලයේ සිට වාචනා මාර්ගයෙන්, ආචාර්ය පරම්පරා වලින් පැවත ආ අර්ථ විවරණ ක්‍රම මිහිඳු හිමියන්ගෙන් සිංහල භික්ෂූන් වහන්සේලා උගෙන ත්‍රිපිටකයේ ගැටලු තැන් හෙළ බසින් අරුත් විවරණය කළහ. හෙළටුවා නමින් මේවා හඳුන්වයි.

අටුවා වනාහි ත්‍රිපිටකයට අයත් පොත් වලට ලියා ඇති ව්‍යාඛ්‍යාන සංග්‍රහ සමූහයයි. අටුවාවල පරමාර්ථය පෙළෙහි ඇති දුරවබෝධ වචන සහ ධර්මයේ ගැඹුරු තැන් විස්තර කිරීමත් අවශ්‍ය තැන්වලදී විස්තරාර්ථ සැපයීමත්ය. මෙම පරමාර්ථයෙන් ලියන ලද හෙළටුවා නම්,

**මහා අට්ඨකථා**
**කුරුන්දි අට්ඨකථා**
**පච්චරිය අට්ඨකථා නම් වේ.**

හෙළ අටුවා අතුරින් ප්‍රමුඛ ස්ථානය දරුවේ මහා අට්ඨකථාව හෙවත් මූල අට්ඨ කථාවයි. බුද්ධඝෝෂ හිමියන්ගේ අට්ඨ කථා සියල්ලටම පාහේ ශරීරය කරගෙන ඇත්තේ මෙම අටුවාවයි. තුන් පිටකයටම අයත් අට්ඨ කථාවන්හි මහා අට්ඨකථාව ගැන සඳහන් වන බැවින් එය තුන්පිටකයම අළලා සකස් වුනු හෙළටුවාවක් වශයෙන් සැලකිය හැකිය. වස්තු විෂය අතින් සෙසු හෙළටුවාවන්ට වඩා පරිපූර්ණ වී තිබුණ මහා අට්ඨකථාවේ ලක්දිව සිදුවූ දේ පිළිබඳව බොහෝ වෘතාන්ත ද සඳහන්ව තිබුණ බව සිතා ගත හැකිය.

මහා පච්චරිය අට්ඨකථාවට එම නම ලැබුනේ පච්චරියක් හෙවත් පහුරක් උඩදී එය ලියන ලද බැවිනි. කුරුන්දිවේලු විහාරයේදී ලියන ලද හෙයින් කුරුන්දි අටුවා නම් විය.

මෙම ප්‍රධාන හෙළටුවාවන්ට අමතරව තවත් අටුවා කීපයක් දක්නට ඇත. අන්ධ අට්ඨකථාව එයින් එකකි. දකුණු ඉන්දියාවේ කාඤ්චිපුර

(කොන්ජිවරම්) යෙහි පැවති අටුවාවයි. එය ආන්ධ්‍රා භාෂාවෙන් ලියා ඇතැයි සැලකේ.

## බුද්ධඝෝෂ හිමි

දඹදිව බෝමැඩට නුදුරු ඝෝෂ නම් ග්‍රාමයේ බමුණු කුලයක උපත ලද බුද්ධඝෝෂ වාදයෙහි දක්ෂ වූ රේවත නම් මහා තෙරපාණන් වෙත පැවිදි වූ බව ප්‍රචලිත මතයයි. බුද්ධඝෝෂ මහාබෝධි මණ්ඩපයට දකුණුදිග බමුණුගම උපන් බව සද්ධම්මසංගහ නම් පොතෙහි සඳහන් වේ. බෝමැඩට නුදුරෙහි ඝෝෂ නම් වූ ගමේ උපන් බව බුද්ධඝෝසුප්පත්ති නම් කථාවේ ද සඳහන් වේ. මෙවැනි විවිධ කරුණු විමංශනයෙන් පසුව බුද්ධඝෝෂ ජන්ම භූමිය මොරණ්ඩඛේටක නම් ගම බව පිළිගෙන ඇත. ආන්ධ්‍ර දේශයේ ගුන්ටූර් දිස්ත්‍රික්කයේ පාල්නාඩ් තලුන් පෙදෙසේ "කෝටනේමලී පුරිගුන්ඩිලු පල්ලි" යන ලඟ පිහිටි ගම් දෙක මොරන්ඩඛේටක යැයි පැවසේ. උන්වහන්සේ උපන් පෙදෙස මොරන්ඩඛේටක යැයි විසුද්ධි මග්ගයෙන් පෙනේ. මජ්ඣිමනිකායට්ඨ කථාවේ කර්තෘ සංදර්ශක ගාථාවක මයූර සුත්ත පට්ඨන හෝ මයූර රූප පට්ඨන සඳහන් වන බැවින් එතුමා එහි විසූ බව ද සිතිය හැකිය.

ව්‍යාකරණ විෂයෙහි ද දර්ශන ශාස්ත්‍රයෙහි ද වෛදික ග්‍රන්ථ විෂයෙහි ද ඉතිහාස පුරාවිද්‍යා විෂයෙහිද කාය ව්‍යවච්ඡේද විද්‍යාවන් හීද ලක්ෂණ ශාස්ත්‍රයෙහිද පැතිරී ගිය බුද්ධි ප්‍රභාවයක් එතුමා කෙරෙහි පැවති බව පැහැදිලිය. බුද්ධඝෝෂ හිමියන් ලංකාවට පැමිණීමට පෙර ඤාණෝදය නම් ධර්ම ප්‍රකරණයත් අත්ථසාලිනී අටුවාවත් දඹදිව දී කළ බවද සඳහන්ය. බුද්ධෝඝෝෂ හිමියන් කලින් සර්වාස්ති වාදියෙකුව සිට පසුව ථේරවාදී වූ බව ඇතැම් විචාරකයන්ගේ පිළිගැනීමයි.

බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට පැමිණියේ අනුරාධපුරය රාජධානිය කරගත් මහානාම රජ දවසය. බුද්ධවර්ෂ 953-975 අතර කාලයේය. උන්වහන්සේ ලංකාවට වඩින විට අට්ඨකථා සංහිතා කීපයක්ම මේ දිවයිනේ පැවති බවත් ඒවා හෙළ බසින්ම උගත් බවත් මෙයින් සමහරක් ග්‍රන්ථ ස්වරූපයෙන්ද සමහරක් පූර්වාචාරීන්ගේ මතවාද ඇතුලත් වුන සාහිත්‍යය වශයෙන්ද පැවති බවත් ආචාර්ය අදිකාරම් මහතා පවසයි.

මිහිඳු හිමියන් දවසම ආරම්භ වූ සිංහල අටුවා කථා වසර 700ක පමණ කාලයක් සිංහල ත්‍රිපිටකය හෙළි පෙහෙළි කරමින් පැවතියහ. ත්‍රිපිටක පාළියට සිංහල අටුවා ලියා ඇති බව දඹදිව විසූ රේවත හිමියන්ද දැන ගැනීමෙන් සිංහල අටුවා පාළියට පරිවර්තනය කිරීම, බුදුදහම චිරස්ථායී වීමට හේතුවක් යැයි උන්වහන්සේ ද සලකා හෙළටුවා පාළියට පරිවර්තනය කිරීම සඳහා බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට එවන්න ඇතැයි සැලකිය හැකිය.

බුද්ධඝෝෂ හිමියන් මෙහි පැමිණ බුදුන් වදාල දෙලක්‍ෂ පන්සැත්තෑ දහස් දෙසියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් ඇති ආගමයට තුන්ලක්‍ෂ එක්සැටදහස් සත්සියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් පමණ අටුවා කථා ලියා ආගමයෙහි පහන් නැගූ සේකැයි දත යුතු යැයි පූජාවලියේ සඳහන්ව තිබේ.

සංස්කාරකයෙකු හා අනුවාදයකු වශයෙන් බුද්ධඝෝෂ හිමියන්ගේ කාර්යය වූයේ තමන් ඉදිරියෙහි වූ හෙළටුවාවන්හි අන්තර්ගත වූ විවරණ වෙනස් කිරීම නොව, ඒවා සකස් කිරීම සහ අවශ්‍ය ස්ථාන පිඬු කරමින්, අවශ්‍ය ස්ථාන විස්තරාර්ථ දක්වමින්, විධිමත්ව සුගමව පාළි භාෂාවට නැගීමයි. බුද්ධඝෝෂ හිමියන්ට අට්ඨකථා සකස් කරන්නට මහාවිහාරයෙන් ඉඩ ලැබී ඇත්තේ මහාවිහාර වාචනා 'මාර්ගයට විරුද්ධ මත ඒවායේ ඇතුලත් නොවිය යුතුය' යන කොන්දේසිය ද සහිතවය.

"මහා අට්ඨකථාව ශරීරය කොටගෙන මහාපච්චරිය කුරුන්දි ආදී විශ්‍රුතඅර්ථ කථාවන්හි යම් විනිශ්චයක් වේද එහි යුක්තාර්ත සහ ඇතුලත් වන්නා වූ ස්ථවිර වාදයද අත්නොහරිමින් සංවර්ධනය හොඳින් ආරම්භ කරන්නෙමු."

තව ද එම අර්ථ කථාවලින් භාෂාන්තරය පමණක් අත්හැර විස්තර තැන් පිඬුකොට සියලුම විනිශ්චයන් ඇතුලත් කොට කිසිම තන්හි යුත් අත් නොඉක්මවා සංවර්ණනය කරන්නෙමු යි බුදුගොස් හිමියෝ පවසති.

බුද්ධඝෝෂ හිමියන් විසින් කරන ලද අට්ඨකථා සියල්ලම මිහිඳු මාහිමියන් විසින් ලක්දිවට ගෙන එන ලදුව මහා විහාරිකයන් විසින් ආරක්ෂා කරනු ලැබූ හෙළටුවාවන්හි පාළි අනුවාද බවත් මහා අට්ඨකථාවේ සාරය ගෙන පාළි අට්ඨකථා රචිත බවත් මෙම අට්ඨකථාවල සඳහන් වේ.

මේ අනුව බුදුගොස් හිමියන්ගේ කාර්යය වූයේ බුදුසමය පිළිබඳව අමුතුවෙන් පොත් ලිවීම නොව එතෙක් හෙළටුවාවන්හි ආ කරුණු විධිමත්ව හා සුගමව පාළි භාෂාවට නැගීම වෙයි. පාළි අටුවා පොත්වලින් අඩකටත් වඩා සපයා ඇත්තේ බුදුගොස් හිමියන් විසිනි. බෞද්ධ අට්ඨකථාචාරීන් අතුරෙන් එතුමා ශ්‍රේෂ්ඨතමයායි. එතුමාගේ ජීවන චරිතය වටා විවිධ ජනප්‍රවාද ගෙතී ඇත්තේ ඒ නිසාමය. එතුමා මෙලොව පහළ වූයේ බුදුන්ගේ පර්යාප්ති ශාසනය දීර්ඝ කාලයක් නිර්මලව පවත්වාගෙන යාම සඳහා පාළි අට්ඨකථා ලිවීමටමය යන ජන ජනප්‍රවාදයක් ද ඇත.

## අටුවා විස්තරය

### විනය පිටකය

| | පෙළ | | අටුවාව | කර්තෘ | කාලය |
|---|---|---|---|---|---|
| උභය විභංග | 1 පාරාජිකා පාළි | 1 ආණා දෙසනා | සමන්තපාසාදිකා | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| | 2 පාචිත්තිය පාළි | 2 යථාපරාධ සාසන | විනය අට්ඨකථා | | |
| ඛන්ධක | 3 චුල්ල වග්ග පාළි | 3 සංවරාසංවර කථා | | | |
| | 4 මහාවග්ග පාළි | | | | |
| පරිවාර | 5 පරිවාර පාළි | | | | |
| | | භික්ඛුපාතිමොක්ඛ | කඞ්ඛා විතරණී | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| | | භික්ඛුණී පාතිමොක්ඛ | (මාතිකට්ඨ කථා) | | |

### අභිධර්ම පිටකය

| | | | | |
|---|---|---|---|---|
| 1 ධම්මසංගණිප්පකරණ | 1 පරමත්ථ දේසනා | අත්ථසාලිනී | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| 2 විභංගප්පකරණ | 2 යථාධම්ම සාසන | සම්මෝහ විනෝදනී | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| | 3 නාමරූප පරිච්ඡේද කථා | | | |
| 3 කථාවත්ථුප්පකරණ | | | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| 4 පුද්ගලපඤ්ඤත්තිප්පකරණ | | | | |
| 5 ධාතුකථාප්පකරණ | | පරමත්ථදීපනී | | |
| 6 යමකප්පකරණ | | පඤ්චප්පකරණට්ඨකථා | | |
| 7 පට්ඨානප්පකරණ | | | | |

## සූත්‍ර පිටකය

| | | | |
|---|---|---|---|
| 1 දීඝනිකාය | 1 වොහාරා දේශනා | සුමංගල විලාසිනී | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 2 මජ්ඣිමනිකාය | 2 යථානුලෝමසාසන | පපඤ්ච සූදනී | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 3 සංයුක්තනිකාය | 3 දිට්ඨි විනිවෙඨන කථා | සාරත්ථප්පකාසිනි | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 4 අංගුත්තරනිකාය | | මනෝරථපූරණී | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 5 ඛුද්දක නිකාය | | | |
| 1 ඛුද්දකපාඨ | පරමත්ථ ජෝතිකා | | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 2 ධම්මපද | ධම්මපදට්ඨ කථා | | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 3 උදාන | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 4 ඉතිවුත්තක | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 5 සුත්තනිපාත | පරමත්ථ ජෝතිකා | | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 6 විමානවත්ථු | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 7 පේත වත්ථු | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 8 ථේර ගාථා | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 9 ථෙරී ගාථා | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 10 ජාතක | ජාතකට්ඨකථා | | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 11 නිද්දේස (චුල්ල-මහා) | | සද්ධම්ම ජෝතිකා | උපසේන ආචාර්ය 6වන ශ.ව. |
| 12 අපදාන (ථේර-ථෙරී) | | විසුද්ධ ජන විලාසනී | මහානාම ආචාර්ය 7වන ශ.ව. |
| 13 පටිසම්භිදා මග්ග | | සද්ධම්මප්පකාසිනී | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 14 බුද්ධවංස | | මදුරත්ථප්පකාසිනි | බුද්ධදත්ත හිමි 5වන ශ.ව. |
| 15 චරියාපිටක | | පරමත්ථ දීපනී | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| | | විසුද්ධි මග්ග | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |

| | | |
|---|---|---|
| නෙත්තිප්පකරණ | නෙත්ති අට්ඨකථා | ධර්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| චතුභාණවාරපාළි | චතුභාණවාර අට්ඨකථා | ආනන්ද වනරතන 8වන ශ.ව. |

බුද්ධඝෝෂ හිමියන් විසින් පාළියට නොනගන ලද අට්ඨ කථා පාලියට නගන ලද්දේ බුද්ධදත්ත ධම්මපාල උපසේන සහ මහානාම තෙරවරුන් විසින්ය.

## බුද්ධදත්ත හිමි

බුද්ධඝෝෂ හිමියන්ගේ සමකාලීනයෙකි. මධුරත්ථ විලාසිනි නම් බුද්ධවංශ අටුවාව උන්වහන්සේ ලියා ඇත.

### උපසේන හිමි

සද්ධම්මජෝතිකා නම් නිද්දේශ අට්ඨකථාව මහාපරිවේනවාසී උපසේන හිමියන් විසින් කරන ලදි.

### මහානාම හිමි

පටිසම්භිදාමග්ග අට්ඨකථාව වන සද්ධම්මප්පකාසනිය මුන්වහන්සේ විසින් ලියන ලදී.

### ධම්මපාල හිමි

පරමත්ථදීපනී අට්ඨකථා - උදාන - ඉතිවුත්තක - විමානවත්ථු - ප්‍රේතවත්ථු - ථෙර ථෙරී ගාථා අට්ඨකථා මුන්වහන්සේ ලියන ලදී.

මෙම අට්ඨකථාවන් උගෙන ඒවා ආරක්ෂා කළ අය අට්ඨකථිකා නමින් හඳුන්වා ඇත. අට්ඨකථාචරියා යනු අට්ඨකථා සම්පාදනය කළ ආචාර්යවරයෝය. ආචරිය වාද, ආචරිය මත, ආචරිය වාද යන නම්වලින් කියවෙන්නේ අට්ඨකථාවන් මැයි.

අට්ඨකථාවන් පිළිබඳ විවිධ විවේචන හා මතවාද උගතුන් අතර පවතී. මෑතකාලීන වියතුන් අතුරින් අග්ගමහාපණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ එවැනි විවේචකයෙකි. උන්වහන්සේගේ අටුවා පරීක්‍ෂණ නම් පොතෙන් එවැනි විවේචන ඉදිරිපත් කර ඇත. අටුවාකථා බුදුන් වහන්සේගේ දේශනා නොවන බව කවුරුත් පිළිගනිති. අටුවාචාරීන් වහන්සේලා අතරද විවිධ මතභේද තිබූ බව දක්නට ඇත. වසර හත්අට සියයක් ගෙන ආ ලිඛිතව නොතිබූ අර්ථ කථා සාහිත්‍යයට එවැනි දේ ඇතුළත් වන්නට පහසුකම් තිබේ. මිහිඳු හිමියන් විසින් ගෙන එන ලද පාළි විවරණ මහාවිහාරික භික්‍ෂූන් විසින් සිංහලට පරිවර්තනය කොට එම හෙළටුවා පස්වන සියවසේ බුද්ධඝෝෂ හිමියන් විසින් නැවත පාළි භාෂාවට පරිවර්තනය කළ බව පිළිගත් සම්ප්‍රදායයි. මේ තැන්වලදී එම මතිමතාන්තර ඇතුළත් වන්නට ඇති බව සිතිය යුතුය.

මහාවිහාරීය සම්ප්‍රදාය එකකි. අභයගිරි ජේතවන පරම්පරා හිද එවැනි සම්ප්‍රදායන් පැවතුණු බවට සැකයක් නැත. ස්වකීය පාරම්පරික මතවලට පටහැනි සූත්‍ර ධර්මයන් පෙළෙහි ඇති බව දන දනත් සිය මතය

තහවුරු කරනු සඳහා ඒවා මදකිනිදු වෙනස් නොකර, ඉවත් නොකර, සංගායනාවලදී පැවති තත්ත්වයෙන්ම ත්‍රිපිටකය රැකගෙන ඒම ගැන මහාවිහාරීය පරම්පරාවට බෞද්ධයාගේ ප්‍රණාම පූර්වක ගෞරවය හිමිවිය යුතුය.

මේ අන්දමින් පැවතගෙන ආ අට්ඨකථා අපේ හාමුදුරුවරු තවත් වර්ෂ සිය ගණනක් තම ආරාමවල පොත්ගුල්වල තබා පුස්තකාලවල තැන්පත්කොට උදේ සවස සුවඳ දුම් අල්ලා ධර්ම ගෞරවයෙන් ධර්ම රත්නය රැකගෙන ආහ. අනගාරික ධර්මපාලතුමාගේ ජාතික ආගමික වැඩපිළිවෙළ ආරම්භ වීමෙන් පසුව එතුමාගේම පවුලේ නෑයන් විසින් අට්ඨකථා මුද්‍රණය කිරීමේ වැඩපිළිවෙළ ආරම්භ කර ඇත. ඒ ධර්මපාලතුමා විසින් ඇතිකරන ලද ආගමික ප්‍රබෝධයේ එක් ආභාෂයකි. 1916 ජූලි 05 දින **ත්‍රිපිටක මුද්‍රණසභා** නම් ආයතනයක් සයිමන් ඇලෙක්සැන්ඩර් හේවාවිතාරණ මහතුන්ගේ මැදහත්වීමෙන් කොල්ලුපිටියේ පාම් හවුස්හි පිහිටුවා ඇත. 1929 ජුනි 29 දින මෙම ත්‍රිපිටක සභාවේ රැස්වීමක් කොළඹ ඩික්මන් පාරේ තක්සලාහිදී පවත්වා තිබේ. මෙම රැස්වීමට අති පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල මහා නාහිමියන්ද, රත්මලානේ ශ්‍රී ධම්මානන්ද ධර්මාලෝක නායක හිමියන්ද ප්‍රධාන පණ්ඩිත ධර්මධර භික්ෂූන් වහන්සේලා 25 නමක් සහභාගී වූ බව සඳහන් වේ. අනගාරික ධර්මපාලතුමා ප්‍රධාන සාසනමාමක පිරිස්ද මෙම රැස්වීමට සහභාගී වී ඇත. මෙම නායක පණ්ඩිත ස්වාමීන් වහන්සේලා එක් එක් අටුවා ග්‍රන්ථ සංස්කරණය භාරගත් බවද සඳහන් වේ.

සයිමන් හේවාවිතාරණ මහතාගේ අභාවයෙන් පසුව සෝමලතා හේවාවිතාරණ ළමාතැනී විසින් ත්‍රිපිටක මුද්‍රණය සඳහා අරමුදල පිහිටුවීය. එම අරමුදල මගින් හේවාවිතාරණ අට්ඨකථා ග්‍රන්ථ සමූහය මුද්‍රණය කර ඇත. ආගම ධර්මය, ඉතිහාසය, පුරාවිද්‍යාව, සාහිත්‍යය ආදී ශ්‍රී ලංකා සංස්කරණ විවිධ ක්ෂේත්‍රයන් පර්යේෂණාත්මක අධ්‍යයනවලට යොමු කරමින් ශාස්ත්‍රීය පොතපත සපයා සංස්කෘතිය පිළිබඳව අවබෝධයක් ජනතාවට ලබාදීමේ අරමුණින් 1845 දී ආරම්භ කළ ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ සිංහල අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය මගින් පොත් දහයක් මුද්‍රණය කිරීම මහඟු කාර්යයකි.

අභාවයට යන පැරණි බෞද්ධ පොත්පත් හා අලුතින් ලියැවෙන බෞද්ධ පොත්පත් මුද්‍රණය කරවීමත් ඉංග්‍රීසි බෞද්ධ පොත්පත් සිංහලට

පරිවර්තනය කර මුද්‍රණය කිරීමත් පරපුරෙන් පරපුරට බුද්ධ ධර්මය ගෙන යාමත් බෞද්ධ සංස්කෘතියේ ආරක්ෂාවත් සඳහා පිහිටුවා ඇති අප ආයතනය වන බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් බුද්ධ ජයන්ති ත්‍රිපිටකයේ පුනර්මුද්‍රණය නිමවීමෙන් පසු අට්ඨකථා සිංහලට පරිවර්තනය කොට මුද්‍රණය කිරීමට ප්‍රතිපත්ති සකස් කරන ලදී. සිංහලෙන් මුද්‍රණය අවසන් කොට අටුවා කථා ඉංග්‍රීසියට පරිවර්තනය කර මුද්‍රණය කිරීම අපේ අදහසයි.

"කථා පවත්තිනී" නම් පාඨයක් ත්‍රිපිටකයේ අංගුත්තර නිකායේ සඳහන් වෙයි. ධර්මදේශකයා පෙළත් අටුවාවත් දනී නම් දහම් අසන්නා පෙළත් අටුවාවත් දනී නම් දහම් දෙසන්නාත් අසන්නාත් දෙදෙනාම පෙළත් අටුවාවත් දනීනම් එම ධර්ම දේශනාව සාර්ථක දේශනාවක් වන බව මෙහි සාමාන්‍ය අදහසයි. තථාගත ධර්මය වඩාත් ප්‍රකට වීම විවෘත වීම එහි පැවැත්මට හා උත්තරීතර භාවයට හේතුවන බව සඳහන්ය. මෙම කරුණු පිළිබඳ විමසිලිමත් වනවිට අට්ඨකථා පරිවර්තනයේ හා මුද්‍රණයේ අවශ්‍යතාව වඩාත් පැහැදිලි වන්නේය. එයට අමතරව විශ්ව විද්‍යාලවල පාළි හා බෞද්ධ අධ්‍යයනාංශවල උසස් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ට විෂය නිර්දේශානුකූල අට්ඨකථාවල සිංහල පරිවර්තන නොමැතිකමේ බාධාවද, එම ගුරු ශිෂ්‍ය දෙපිරිසටම මේ මගින් දුරු කිරීමද අපේ පරමාර්ථයකි.

අපගේ ඉල්ලීමද පූජ්‍ය රාජකීය පණ්ඩිත වැළමිටියාවේ කුසලධම්ම නාහිමියන්ගේ අනුශාසනාවද අනුව අටුවා කථා සිංහලට පරිවර්තනය කර මුද්‍රණය කරවීමේ භාරදූර කර්තව්‍යය ශ්‍රී ලංකා ජනරජයේ වර්තමාන ආගමික අමාත්‍යාංශය මගින් ඉතාම කෙටි කාලයක් තුළ අවසන් කිරීම සඳහා අපට පවරන ලදි. බුද්ධ ජයන්ති ත්‍රිපිටක පුනර් මුද්‍රණය මගින් අප දක්වූ ආදර්ශයත් ගොඩනැගූ විශ්වාසයත් මෙයට හේතු වූ බව නිසැකය. මෙම කාර්යය අපට පැවරීම පිළිබඳව ශ්‍රී ලංකා ජනරජයේ ගරු ජනාධිපතිතුමන්ට, ගරු අගමැතිතුමන්ට, ගරු බුද්ධශාසන නියෝජ්‍ය ඇමතිතුමන්ට, ආගමික අමාත්‍යාංශයේ ලේකම් මහතාට සහ අමරහේවා මද්දුම මහතාට ද අපේ කෘතඥතාවය, පුණ්‍යානුමෝදනාපූර්වකව පළකරමු.

අටුවා පරිවර්තනයේදී ආමිෂ ලාභයම නොව ශාසනික සේවයම සලකා එක් එක් පොත භාරගෙන මැනවින් සිංහලට පරිවර්තනය කරදුන් පණ්ඩිත ස්වාමීන් වහන්සේලාට ද, උගත් ගිහි මහතුන්ට ද අපගේ

කෘතඥතාව හිමිවේ. සිංහල අටුවා පරිවර්තන සමීක්ෂණය කළ උගත් ගිහි පැවිදි දෙපිරිසටම අපගේ කෘතඥතාව හිමිවේ.

අටුවා කථා පරිවර්තන කාර්යය සම්බන්ධීකරණය කරමින් කටයුතු කළේ විජිතනන්ද සරත්චන්ද්‍ර මහතාය. එම ග්‍රන්ථාවලිය මුද්‍රණය කරවීමේ කාර්යය භාරවූයේ අප ආයතනයේ මුද්‍රණ කටයුතු අධ්‍යක්‍ෂ පාලිත ලියනගේ මහතාටය. මෙම මහත්වරු දෙපළම ඉතා උනන්දුවෙන් මෙම කටයුතුවල නියැලීම පිළිබඳව එම මහත්වරුන්ටද මාගේ කෘතඥතාවය පළවේ. මෙයට අමතරව මෙම කාර්යයට හොඳහිතින් අවංකව සහාය දුන් සියලු දෙනාටම පින් පුරවමින් ආසිරි පතම්හ.

මෙයට,

ශාසනස්ථිතිකාමී,

**කිරම විමලජෝති ස්ථවිර,**
**අධ්‍යක්‍ෂක, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,**
නැදිමාල, දෙහිවල.

# බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ
# අට්ඨකථා පරිවර්තක මණ්ඩලය

පූජ්‍ය රාජකීය පණ්ඩිත අම්බලන්ගොඩ ශ්‍රී සුමංගල නායක මාහිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත යටගම ධම්මපාල අනුනායක මාහිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත ආදාවල දේවසිරි නායක මාහිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත තුඹුල්ලේ ධම්මානන්ද නායක මාහිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත යාලේගම චන්දකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත වටගෙදර විමලබුද්ධි හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත විදුරුපොල ආනන්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත හත්තොටුවේ ඉන්දරතන හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පල්ලේගම සමිත හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මාවතාතේ සෝමින්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත බලපිටියේ සිරිසීවලී හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත බමුරුගම ධම්මවංස හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පන්නල සුමේධ හිමිපාණන් වහන්සේ

| | |
|---|---|
| රාජකීය පණ්ඩිත | කීර්ති නාරම්පනාව මහතා |
| ශාස්ත්‍රවේදී | ඇන්.එච්. පෙරේරා මහතා |
| පණ්ඩිත | ජේ.පී. නිමල්ලාල් රංජිත් මහතා |
| පණ්ඩිත | ටී.ජී. ජයතිලක මහතා |
| පණ්ඩිත | ඒ.ඇම්.ඩී.වයි. සරත්චන්ද්‍ර අමරතුංග මහතා |
| පණ්ඩිත | බී.ඇම්.පී. බාලසූරිය මහතා |
| පණ්ඩිත | සෝමරත්න ගම්ලත් වෙලගෙදර මහතා |
| පණ්ඩිත | දයා ගුණසේකර මහතා |
| පණ්ඩිත | ඩබ්ලිව්. ඇල්.පී. ධර්මදාස මහතා |
| පණ්ඩිත | ජිනදාස ගොඩකන්ද මහතා |
| පණ්ඩිත | ලසිත් නලන්ත මහතා |
| පණ්ඩිත | පී.ඇල්.කේ. පෙරේරා මහතා |

**සම්බන්ධීකරණය:-** විජිතනන්ද සරත්චන්ද්‍ර මහතා

# බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තක සමීක්ෂණ මණ්ඩලය

1. පූජ්‍ය මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ (පේරාදෙණිය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය)
2. පූජ්‍ය කොටියාගල උපරතන හිමිපාණන් වහන්සේ (කැලණිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය)
3. පූජ්‍ය මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ. (ශාස්ත්‍රපති)
4. පූජ්‍ය ඇස්වත්තේ රේවත හිමිපාණන් වහන්සේ. (ශාස්ත්‍රපති)
5. හේමචන්ද්‍ර දිසානායක මහතා. (ශාස්ත්‍රවේදී)
6. පණ්ඩිත දයා ගුණසේකර මහතා (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව)
7. පණ්ඩිත ඒ ලසිත් නලන්ත මහතා (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව)
8. පණ්ඩිත සිරිමෙවන් සේනක මහතා (ශාස්ත්‍රවේදී)
9. අභිධර්මාචාර්ය බුද්ධික විජේසිංහ මහතා (ශාස්ත්‍රවේදී-විද්‍යාවේදී)

# සංඥාපනය

විජම් පිටකයේ ධම්මසංගණී විභංග ප්‍රකරණ දෙක හැර ඉතිරි ධාතුකථා පුග්ගලපඤ්ඤත්ති කථාවත්‍ථු යමක පට්ඨාන ප්‍රකරණ පංචකයේ ලීනාර්ථ විස්තර කිරීම සඳහා බුද්ධඝොෂ මහා ස්ථවිරපාදයන් වහන්සේ විසින් පාලි භාෂාවට නගන ලද අර්ථ වර්ණනාව (අටුවාව) හඳුන්වා දී තිබෙන්නේ පරමත්‍ථ දීපනී නාමයෙනි. වර්ණනා කිරීම, ප්‍රකට කිරීම, විස්තර කිරීම යන අරුත් 'දීපනී' පදයෙහි ගැබ්ව ඇත්තේය. අභිධම්ම පිටකට්ඨ කථා, පඤ්චප්පකරණට්ඨ කථා නම්වලින් ද මෙම අටුවාව හැඳින්වේ. 'පඤ්චප්පකරණට්ඨ කථා' යන්න බහුල ව්‍යවහාරයයි. කාණ්ඩ දෙකකින් මුද්‍රිත මෙහි ප්‍රථම භාගයට ධාතුකථා, පුග්ගල පඤ්ඤත්ති, කථාවත්‍ථු ප්‍රකරණ තුනට ඇතුළත් විස්තර වර්ණනාව වේ. ද්විතීය භාගය ඉතිරි ප්‍රකරණ දෙකේ විස්තර ඇතුළත් වේ. ධම්මසංගණී, විභංග ප්‍රකරණ දෙකට ද පිළිවෙළින් අත්‍ථසාලිනී, සම්මොහවිනොදනී අර්ථ වර්ණනා ද බුදුගොස් හිමියන් විසින්ම සම්පාදනය කරනු ලැබ ඇත. ප්‍රථම භාගයට අයත් ප්‍රකරණ තුනට මෙහි සිංහල පරිවර්තනය සකසන ලදී.

පරමත්‍ථදීපනියේ ප්‍රථම භාගයට අයත් ප්‍රකරණ තුන සඳහා හැඳින්වීමක් (විශේෂයෙන් කථාවත්‍ථුව සඳහා) ඒවා සිංහල භාෂාවට පරිවර්ත්තනය කළ වියත් ගණදෙටු නාහිමිවරුන් විසින් කරනු ලැබ ඇති බව ප්‍රකාශ කරමින් එකී ප්‍රකරණ සඳහා පරමත්‍ථදීපනී අර්ථ වර්ණනාවේ විශේෂ තැන් කීපයක් මෙම සංඥාපනයට ඇතුළත් වේ.

ධාතුකථා ප්‍රකරණයේ මාතිකා වර්ණනාවට ඇතුළත් සංගහ අසංගහ ආදි වශයෙන් මේ ප්‍රකරණය තුදුස් අයුරින් බෙදා දක්වන ලද අතර ඒ සියල්ල උද්දේස නිද්දේස වශයෙන් දෙපරිදි වන අයුරු පෙන්වයි. එය මාතිකා උද්දේසය, නයමාතිකා, අබ්භන්තර මාතිකා, නයමුසේ මාතිකා, ලක්ඛණ මාතිකා, බාහිර මාතිකා වශයෙන් පස් ආකාර වේ. ඒවායේ විස්තර පරිවර්තනයේ දී ඇත. සංගහ අසංගහ සම්පයුත්ත විප්පයුත්ත පද සතර පදනම් කොට ස්කන්ධාදී ධාතු සම්බන්ධ බෙදීම් විස්තර ධාතු කථාවෙහි ඇතුළත් වේ.

පඤ්ඤත්ති යන වචනය ප්‍රඥප්තිය, පැණවීම, නියමය, ශික්ෂාපදය,

ව්‍යවහාරය යනාදි අරුත්වල යෙදේ. මෙහිදී පැණවීම අරුත අභිමත වේ. පෙළෙහි 'ඛන්ධා'දි පැණවීම් සය ද පෙළ හැර අටුවා නයින් 'විජ්ජමාන' පඤ්ඤත්ති ආදි සයද අටුවා හැර ආචාරිය ව්‍යාඛ්‍යාන වශයෙන 'උපාදාන' පඤ්ඤත්ති ආදි සය ද තවත් ආචරිය ව්‍යාඛ්‍යාන වශයෙන් 'කිච්ච' පඤ්ඤත්ති ආදි සය ද තවත් ආචරිය ව්‍යාඛ්‍යාන වශයෙන් 'කිච්ච' පඤ්ඤත්ති ආදි සයද පුග්ගල පඤ්ඤත්ති මාතිකාවේ දක්වයි. එකේ සිට පිළිවෙළින් නිද්දේස දහයකින් බෙදා දක්වන විවිධ පුද්ගලයින් තුන්සිය අසූතුන් දෙනෙකු පිළිබඳ විස්තර සංග්‍රහ කිරීම එහි දැක්වේ. අට නවය නිද්දේස අමුතුවෙන් විස්තර නොකොට මුල නිද්දේසවලට සම්බන්ධ කර තිබේ. එක පුද්ගලයාගේ සිට ක්‍රමයෙන් වැඩිවන පුද්ගලයින් දෙදෙනා තුන්දෙනා ආදි වශයෙන් මේ නිද්දේස දහය අංගොත්තර සඟියේ මෙන් දක්වා ඇත්තේය.

මෙහි වැඩි වශයෙන් සාකච්ඡාවට බඳුන් වී ඇත්තේ ධ්‍යාන මාර්ග ඵල ක්ෂේත්‍රවලට අයත් පුද්ගලයින් සම්බන්ධයෙනි. ආධ්‍යාත්ම විමුක්තිය අරබයා සිදුකරනු ලබන එම විස්තර නැවත නැවත කියවීමට තරම් ආශ්වාද ජනක වේ. ස්ථවිරවාදය ස්ථාවර වනසේ විස්තර කරන උභතොභාග විමුත්ත පුද්ගලයා ආදින් පිළිබඳව කෙටි සඳහනක් මෙහි තබමි.

උභතොභාග විමුත්ත නිද්දේසයෙහි, උභතොභාග විමුත්ත පුද්ගලයා කොටස් දෙකකින් වාර දෙකකදී මිදීම උභතොභාග විමුත්ත වේයයි දැක්වේ. මේ සම්බන්ධයෙන් ථෙරවාදයේ අදහස **තිපිටක චූළනාග** මහතෙරුන් සඳහන් කරන්නේ මෙසේය. 'සමාපත්තියෙන් විෂ්කම්භන විමොක්ෂයෙන් එක්වරක් මිදේ. (සෝවාන් ආදි) මාර්ගයෙන් සමුච්ඡෙද විමොක්ෂයෙන් දෙවෙනිවර මිදේ. **තිපිටක මහා ධම්මරක්ඛිත** මහතෙරහු මෙය නාම නිශ්‍රිතයයි අච්චි යථා ආදි ගාථාව පෙන්වා 'නාම කයින් ද රූප කයින් ද මනාව මිදුනේ උභතොභාග විමුත්ත යයි කීහ. **තිපිටක** චූළාභය මහතෙරහු 'සමාපත්තියෙන් විෂ්කම්භන විමොක්ෂයෙන් එක්වරක් ද මාර්ගයෙන් සමුච්ඡෙද විමොක්ෂයෙන් එක්වරක් ද මිදුනේ උභතොභාග විමුත්ත යයි කීහ. මේ මහතෙරහු තිදෙනාම පණ්ඩිවරුහයි තිදෙනාගේ වාද සකරුණ යයි වාද තුනම පෙළබසට නගා තැබූහයි බුදුගොස් හිමියෝ පවසති. එය සංක්ෂේපයෙන් අරූප සමාපත්තියෙන් රූපකායෙන් මිදීම ද මාර්ගයෙන් නාමකායෙන් මිදීම ද උභතොභාග විමුත්ත වේ.

සද්ධානුසාරී නිද්දේසයෙහි සද්ධානුසාරී යනු සෝවාන් මාර්ගයටම නමකි. සෝවාන් පලයට පැමිණියේ ධම්මානුසාරී වේ. මෙය සප්තවිධ ශෛක්‍ෂයන් සහ පෘථග්ජනයා සම්බන්ධව යෙදෙන ආකාරය මෙහි විස්තර වේ. සදධාධුර විඤ්ඤාධුර, සදධා විමුත්ත පඤ්ඤා විමුත්ත, කාය සක්ඛි, දිට්ඨිප්පත්ත අවස්ථා සහ ඒවා සදධා විඤ්ඤා ධුරවලින් වෙනස්වන ආකාරය සෝවාන් මග ඵල ඤාණවලදී පැහැදිලි කරයි. සෝවාන් පුද්ගලයා සත්‍යාවබෝධ සම්පූර්ණ කර රහත්බව ලබනතුරු සිටින එකබීජී, කොලංකොල, සත්තක්ඛත්තුපරම අවස්ථාවල යථා තත්ත්වය මෙහිදී පහදයි.

භයූපරක නිද්දේසයෙහි බියෙන් වෙන්වීම භයූපරත දෙපදයෙහි තේරුම වේ. සප්තවිධ ශෛක්‍ෂයින් සහ පෘථග්ජනයා බිය වී පවින් වෙන්වෙති. පව් නොකරති. බිය සතරක් දැක්වේ. දුගති, සසර, කෙලෙස්, උපවාද යනුවෙනි. මේ සතරින්ම බියවී පෘථග්ජනයා පව් නොකරයි. සෝවාන් සකෘදාගාමි අනාගාමි තිදෙනා දුගති බිය ඉක්ම වූ නිසා සෙසු තුනෙන් බියවී පවින් වැලකෙති. මාර්ගස්ථ ශෛක්‍ෂයා පැමිණීම් වශයෙන් හෝ විනාශ නොකළ බියෙන් හෝ භයූපරත වේ. ක්‍ෂීණාශ්‍රවයන් වහන්සේ මේ එකකින්වත් බිය නොවේ. උපවාද (දෝසාරෝපන) බිය නැතත් උපවාදයෙන් ආරක්ෂාවීම සුදුසු යයි දක්වා (දොණුප්පලවාපිගාමෙ) දෝණ උපුල් වැවගම රහතන් වහන්සේ මෙන් යයි පෙන්වා දෙයි.

මෙහිදී කරුණු දෙකක් ගැන අවධානය යොමුකළ මනාය. බියවීම හෝ බියගැන්වීම මානසික වර්ධනයට බාධාවක් වේද යන්න හා තත්කාලීනව වැඩසිටි ආදර්ශ සම්පන්න වූ රහතන් වහන්සේලාගේ චරිත විස්තර ගිලිහී යෑමය. අපේ විහාරස්ථානවල අපාය විස්තර බිතුසිතුවමට නගන ලද්දේ දුගති බිය ඇතිකරනු සඳහා යයි සිතමි. ළමයින් ප්‍රධාන කවරකු තුළ වුවත් බිය ඇතිවීම මානසික වර්ධනය හීනවීමටත් නොයෙක් පසුබටතාවලට බලපාන බවටත් මනෝවිද්‍යාඥයන් ගේ මතයට මෙය පටහැනි වේද? එය එසේ නොවන්නේ මෙහි තමාම ඉන්ද්‍රිය ඤාණයෙන් ලබාගන්නා යථාර්ථයෙන් දුගති ආදි අවස්ථාවලට පත්කරන පසුක්‍රියාවන් ගෙන් වෙන්වීම මානසික වර්ධනයට කිසිදු බාධාවක් නොවේ. මනෝ විද්‍යාඥයින් පෙන්වා දෙන්නේ තම අවබෝධයෙන් තොරව බාහිරව සිදුකරන බිය මානසික වර්ධනයට බලපාන බවය. මීට වඩා මේ පිළිබඳ විග්‍රහයක යෙදීමට මෙහිදී හැකි නොවේ.

දෙවැන්නා වූ රහත් චරිත පිළිබඳ තොරතුරු ගිලිහී යෑම සංවේගය දනවයි. උපවාදයෙන් වැලකීමට රහතන් වහන්සේගේ පවා චර්යාව සකස්වී තිබුණු ආකාරය ගමේ නමින් පමණක් හඳුන්වා ඇති රහත් චරිතයෙන් පෙන්වා දෙයි. සමහර තැනක ගමේ නම නැතිව ව්‍යවහාර කළ නමින් දක්වා ඇති රහත් චරිත ද මෙහි පෙනේ. සමසසික නිද්දේසයෙහි දී සමසීසි යයි හඳුන්වන්නේ පෙරපසු නොවී එකවිට යන අර්ථයෙනි. ඉරියාපථ, රෝග, ජීවිත වශයෙන් සමසීසි අවස්ථා තුනක් සඳහන් වන අතර ඉරියාපථ අවස්ථාවේ සක්මන් කරමින් පිරිනිවන්පෑ 'පදුම' නම් රහතන් වහන්සේ සහ හිඳගෙන සිටි විදර්ශනා වඩා රහත්වී හිඳගෙන සිටියදී පිරිනිවන්පෑ කොටපව් වෙහෙර වැසි (කොට පබ්බත විහාරවාසී) තිසස රහතන් වහන්සේ යන දෙනමගේ වෙන කිසිදු විස්තරයක් සඳහන් නොවේ. හෙළටුවාවල මේ චරිත සවිස්තරව සඳහන් වන්නට ඇත.

ගිලානූපම නිද්දේසයෙහි පැවිදි ශිෂ්‍ය, සහෝදරයින් නැති තමාගේ ගිලන්බව නිසා යැපීමට නොහැකි භික්ෂූන් වහන්සේ රැකබලා ගැනීම මහා සංඝයාට පැවරී තිබුණු වගකීමක් ලෙස දක්වා තිබීම අදට වුව වලංගු විය යුතු මාහැඟි කාර්යයක් කොට සැලකිය හැකිය. එසේ ගිලන්බවට පැමිණි භික්ෂූන් වහන්සේ කෙනෙකුන් උදෙසා එක් භික්ෂුවක් (වස් දහය නො ඉක්මවූ) හා සාමණේර නමක් උන්වහන්සේට උපස්ථාන කිරීමට අවසර ලබාගෙන මහා සංඝයා වහන්සේ විසින් ලබාදිය යුතුය. ගිලාන හා ඒ දෙදෙනාට අවශ්‍ය සියළු දේ සැපයීම භික්ෂු සංඝයාට භාර කටයුත්තක් විය. එය වඩා තහවුරුවීම සඳහා අටුවා පාඨය මෙහි බහාලමි. 'තසමිං ගිලානෙ අතතනො ධමමතාය යාපෙතුං අසකෙකානෙත භිකඛු සංඝෙන තසස එකො භිකඛු ච සාමණෙරො ච ඉමං පටිජගගකාති අපලොකෙත්වා දාතබබා, යාව පන තෙ පටිජගගනති තාව ගිලානසස ච තෙසඤච දවිනතං යෙනතෙථා සබබං භිකඛු සංඝසෙස ච භාරො'

පංචක නිද්දේසයේ 'න ආරමහති න විපපටිසාරො හොති' පද වර්ණනාවේ ඇවැත්වලට පැමිණ නැති විපිළිසර නැති වීර්ය අත්හැර විදර්ශනා නොවඩා මෛත්‍රී බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි නිවන් දැකීමට සිතා සිටින භික්ෂූන් වහන්සේට සංවේග දනවා පෘථග්ජන භාවයේ අනිස්ථිර භාවය පහදා රහත්වීම සඳහා විදර්ශනා භාවනාව වැඩීමට උපදෙස් දීමෙන් පැහැදිළි කරන්නේ, මේ බුද්ධ ශාසනයේ ම නිවන්

දැකිය හැකි බවයි. බුදුගොස් හිමියන් ලක්දිව වැඩසිටි සමයේ රහතන් වහන්සේගෙන් අඩුවක් නොවීය. එක් කලෙක රහත් නොවූ එකද භික්ෂූන් වහන්සේ නමක්වත් වැඩ නොසිටියහයි ද සඳහන් වේ. කම්ම, විපාක, කෙලෙස් ආවරණ රහිත පුද්ගලයන්ගෙන් ලෝකය හිස් නොවේ යනු මාගේ හැඟීමය.

චතුක්ක නිද්දේසයෙහි 'රූපප්පමාණාදීසු සමපත්තියුත්තං' පද වර්ණනාවේ ජනයා පහදින කරුණු වශයෙන් රූපය, කීර්තිය, රූක්ෂභාවය, ධර්මය මේ සතර පෙන්වා දී ඒවා සඳහා පැහැදීමේ ප්‍රමාණය ද දක්වයි. සියළු සතුන්ගෙන් තුනෙන් දෙකක් රූපයට පැහැදේ. පහෙන් හතරක් කීර්තියට ද දහයෙන් නවයක් රූක්ෂ ප්‍රතිපදාවට ද ලක්ෂයෙන් එකක් ධර්මයට ද පැහැදේ යයි පෙන්වා දී තිබේ. බුදුන්වහන්සේ මේ කරුණු සතරින් ම පැහැදෙන්නවුන් අතර අග්‍ර පුද්ගලයා වන අතර මේ සතරින් ප්‍රමාණ කරන ලෝකයා මිටින් ගෙන මෙන් වැඩසිටිතියි පෙන්වා දෙයි. අද වුවද පැහැදීමේ තත්වය මීට වඩා වෙනසක් වේයයි සිතිය හැකි නොවේ.

කථාවත්ථුප්පකරණය සම්බන්ධයෙන් පරමත්ථදීපනී අටුවාව ද ඇසුරුකොට ප්‍රශස්ත හැඳින්වීමක් වියත් පඬිවර ලබුගම ලංකානන්ද නාහිමියන් විසින් බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාවේ කථාවත්ථුප්පකරණයේ පළමුවන කොටසේ දක්වා තිබේ. අටුවාව සම්බන්ධයෙන් කිවයුතු කරුණු ද එහි අන්තර්ගත නිසා අෂ්ටමුඛ වාද යුක්තිය සහ වාද ක්‍රමය පමණක් මෙහි දී සරලව ඉදිරිපත් කරනු ලැබේ. පරමත්ථදීපනී අටුවා නිදාන කථාවෙහි

> පුග්ගල වාදෙ තාව චතුසු පඤ්හෙසු දවිනනං
> පඤ්චකානං වසෙන අට්ඨමුඛවාදයුත්ති

පුද්ගල වාදයේ
ප්‍රශ්න සතරෙහි:-

1. පරමාර්ථ වශයෙන් පුද්ගලයකු ලැබේද?
2. හැම තැනම පරමාර්ථ වශයෙන් පුද්ගලයකු ලැබේද?
3. හැමදා පරමාර්ථ වශයෙන් පුද්ගලයකු ලැබේද?
4. හැම විෂයකම පරමාර්ථ වශයෙන් පුද්ගලයකු ලැබේද?

1. පරමාර්ථ වශයෙන් පුද්ගලයකු නොලැබේද?
2. හැමතැනම පරමාර්ථ වශයෙන් පුද්ගලයකු නොලැබේද?
3. හැමදා පරමාර්ථ වශයෙන් පුද්ගලයකු නොලැබේද?
4. හැම විෂයකම පරමාර්ථ වශයෙන් පුද්ගලයකු නොලැබේද?

හැමතැනම - සෑම ශරීරයකම
හැමදා - සියළු කාලවලම
හැම විෂයකම - සියලු විෂයවල එනම්,
ස්කන්ධ, ආයතන, ධාතු, ඉන්ද්‍රිය

5. ස්කන්ධ - රූප, වෙදනා, සඤ්ඤා සංඛාර විඤ්ඤාණ

12 ආයතන

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ආයතන | -චක්ඛු | සොත | ඝාන | ජිව්හා | කාය | මන |
| | රූප | සද්ද | ගන්ධ | රස | පොට්ඨබ්බ | ධම්ම |

18 ධාතු

| | | | |
|---|---|---|---|
| චක්ඛු | රූප | චක්ඛු | විඤ්ඤාණ |
| සොත | සද්ද | සොත | විඤ්ඤාණ |
| ඝාණ | ගන්ධ | ඝාන | විඤ්ඤාණ |
| ජිව්හා | රස | ජිව්හා | විඤ්ඤාණ |
| කාය | පොට්ඨබ්බ | කාය | විඤ්ඤාණ |
| මනො | ධම්ම | මනො | විඤ්ඤාණ |

22 ඉන්ද්‍රිය චක්ඛු සොත ඝාන ජිව්හා කාය මන ඉත්ථි
පුරිස ජීවිත සුඛ දුක්ඛ සොමනස්ස දොමනස්ස
උපෙක්ඛා සද්ධා විරිය සති සමාධි පඤ්ඤා
අනඤ්ඤඤ්ඤස්සාමීති අඤ්ඤා අනඤ්ඤඤ්ඤාථා

දුතියං පංචකානං

මෙහි සුද්ධ සච්චකට්ඨය පමණක් දැක්වේ. එහි අනුලෝම පච්චනික පංචකය, පච්චනිකානු ලොම පංචකය යයි පංචක දෙකක් වේ.

| පළමුවැන්න | දෙවැන්න |
| --- | --- |
| අනුලෝම පච්චනීක පංචය | පච්චනීක අනුලෝම පංචකය |
| පටිකම්ම චතුක්කය | පටිකම්ම චතුක්කය |
| නිග්ගහ චතුක්කය | නිග්ගහ චතුක්කය |
| උපනයන චතුක්කය | උපනයන චතුක්කය |
| නිගමන චතුක්කය | නිගමන චතුක්කය |

ඉහත කී පරමාර්ථ වශයෙන් පුද්ගලයකු ලැබේද නොලැබේද යන ප්‍රශ්න කොටස් දෙකෙහි එක ප්‍රශ්නයක එක බැගින් නිගයහ අටක් ලැබේ. ඒ අට අට්ඨමුඛ වාදයුත්ති වේ. පාළියෙහි අට්ඨක නිග්ගහ යයි හඳුන්වයි.

වාද ක්‍රමය - ඨපනා පාපනා ආරෝපනා

ඨපනා - විරුද්ධ මතය බිඳීමට ඉදිරිපත් කරන ප්‍රධාන තර්ක අංශය

පාපනා - ඨපනාවෙන් ලැබෙන ඵලය

ආරෝපන - ප්‍රතිවාදින් මත නැගෙන නිග්‍රය පරාජය

යට සඳහන් කළ ප්‍රශ්න කොටස් දෙක වෙන් වෙන්ව දැක්වූයේ තේරුම් ගැනීමේ පහසුව නිසාය. එහෙත් වාදයේදී එකට යෙදෙන ආකාරය පුද්ගල වාදයෙන් ම මෙසේ පෙන්වා දිය හැකිය.

සකවාදියා පුච්ඡා - සත්‍යාර්ථ පරමාර්ථ වශයෙන් පුද්ගලයෙක් ලැබේද?

පරවාදියා පටිඤ්ඤා - එසේය (ඔව්)

පර පටික්ඛෙන - එසේ නොකිව යුතුය (නැත)

සක නිග්ගහය - නිග්‍රහය පිළිගන්න

අනුලෝම ඨපනා - පරමාර්ථ වශයෙන් පුද්ගලයකු ලැබේ නම්

අනු ඨපනා - ස්කන්ධ ආදි පරමාර්ථ ධර්ම වශයෙන් ඒ පුද්ගලයා ලැබෙන බව කිවයුතුය.

අනු ආරොචනා - පරමාර්ථ වශයෙන් ඒ පුද්ගලයා දන්නා ලැබේ යයි කිවයුතු යයි ද ස්කන්ධාදි පරමාර්ථ වේද, ඒ පරමාර්ථ වශයෙන් ඒ පුද්ගලයා දන්නා ලැබේ යයි නොකිවයුතු යයි ද ඔබ කියනවා නම් එය ඔබේ මිථ්‍යාවක්.

පටිලෝම ඨපනා - ස්කන්ධාදි පරමාර්ථ ධර්ම වේද, ඒ පරමාර්ථ ධර්ම වශයෙන් පුද්ගලයා දන්නා ලැබේ යයි නොකිව යුතු වේ නම් පරමාර්ථ වශයෙන් ඒ පුද්ගලයා දන්නා ලැබේ යයි නොකිව යුතුමය.

පටි පාපනා - පරමාර්ථ වශයෙන් පුද්ගලයා දන්නා ලැබේ යයිද.

පටි ආරෝපන - ස්කන්ධාදි පරමාර්ථ වේද, ඒ පරමාර්ථ මෙන් පුද්ගලයා දන්නා ලැබේ යයි නොකිවයුතු වේ යයි ද ඔබ කීවේ නම් එය මිථ්‍යාවකි.

අනුලෝම පංචකයයි.

මේ අනුව පටිකමම චතුකකය, නිගගහ චතුකකය, උපනයන චතුකකය, නිගමන චතුකකය සහ පචචතත පංචකය ද අවබෝධ කරගැනීමට අපහසු නොවේ යයි සිතමි.

පුගගල කථා වණණනාවේ සිට අපරිනිපපනන කථා වර්ණනාව දක්වා කථා වණණනා දෙසි තුදුසකින් පරිමිත කථාවත්‍ථු වණණනාවේ ථෙරවාදයට පටහැනි නිකායාන්තර ලබ්ධි ථෙරවාදී සූත්‍ර පදනම්කොට වාදයුක්ති මගින් බැහැර කරන අයුරු පෙනේ.

තත්කාලීන සමාජයේ ශාස්ත්‍රීය අධ්‍යාපනය මෙන්ම තාක්‍ෂණික අධ්‍යාපනය ද උසස් මට්ටමකින් පැවති බවට 'විජ්ජට්ඨානසප්පායතනානි' පැහැදිලි කරයි.

බී.එම්.පී. බාලසූරිය

නො. 12,
කුලියාපිටිය පාර,
හෙට්ටිපොල.
දූ.ක. 037-2291175

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| **යමකප්පකරණ වර්ණනා** | | |
| **මූල යමක වර්ණනා** | | |
| උද්දේස වාර | වර්ණනා | 01 |
| මූල වාර | වර්ණනා | 04 |
| **පණ්ණත්තිවාර වර්ණනා** | | |
| උද්දේස වාර | වර්ණනා | 06 |
| පද සෝධන වාරය | වර්ණනා | 08 |
| පද සෝධන මූල චක්කවාර | වර්ණනා | 08 |
| සුද්ධ ඛන්ධවාර | වර්ණනා | 09 |
| සුද්ධ ඛන්ධ මූල චක්කවාර | වර්ණනා | 09 |
| **ඛන්ධ යමක වර්ණනා** | | |
| පවත්ති මහා වාර | වර්ණනා | 10 |
| පරිඤ්ඤාවාර | වර්ණනා | 17 |
| **අනුසය යමක වර්ණනා** | | |
| ආයතන යමක | වර්ණනා | 20 |
| ධාතු යමක | වර්ණනා | 24 |
| සච්ච යමක | වර්ණනා | 25 |
| පණ්ණත්ති වාර | වර්ණනා | 27 |
| සංඛාර යමක | වරණනා | 29 |
| අනුසය වාර විනිශ්චය | කථා | 31 |
| සානුසය වාර | කථා | 39 |
| පජහන වාර | කථා | 40 |
| පරිඤ්ඤා වාර | කථා | 41 |
| ප්‍රහීණ වාර | කථා | 41 |
| ධාතුවාර | කථා | 42 |
| මාතිකා ඨපන | වර්ණනා | 43 |
| චිත්ත යමක | වර්ණනා | 47 |
| ඉන්ද්‍රිය යමක | වර්ණනා | 49 |

පච්චය නිද්දෙස වාර වර්ණනා


| | | |
|---|---|---|
| උද්දේස වාර | වර්ණනා | 53 |
| හේතු පච්චය | නිර්දේශය | 65 |
| ආරම්මණ පච්චය | නිර්දේශය | 69 |
| අධිපති පච්චය | නිර්දේශය | 71 |
| අනන්තර පච්චය | නිර්දේශය | 73 |
| සමනන්තර පච්චය | නිර්දේශය | 75 |
| සහජාත පච්චය | නිර්දේශය | 75 |
| අඤ්ඤමඤ්ඤ පච්චය | නිර්දේශය | 76 |
| නිස්සය පච්චය | නිර්දේශය | 77 |
| උපනිස්සය පච්චය | නිර්දේශය | 78 |
| පුරේජාත පච්චය | නිර්දේශය | 81 |
| පච්ඡාජාත පච්චය | නිර්දේශය | 82 |
| ආසෙවන පච්චය | නිර්දේශය | 83 |
| කම්ම පච්චය | නිර්දේශය | 84 |
| විපාක පච්චය | නිර්දේශය | 86 |
| ආහාර පච්චය | නිර්දේශය | 87 |
| ඉන්ද්‍රිය පච්චය | නිර්දේශය | 88 |
| ඣාන පච්චය | නිර්දේශය | 90 |
| මග්ග පච්චය | නිර්දේශය | 91 |
| සම්පයුත්ත පච්චය | නිර්දේශය | 92 |
| විප්පයුත්ත පච්චය | නිර්දේශය | 93 |
| අත්ථි පච්චය | නිර්දේශය | 94 |
| නත්ථි පච්චය | නිර්දේශය | 96 |
| විගත පච්චය | නිර්දේශය | 97 |
| අවිගත පච්චය | නිර්දේශය | 97 |


කුසලත්තික පට්ඨාන වර්ණනා


| | | |
|---|---|---|
| පච්චය නිර්දේශ වාර | වර්ණනා | 98 |
| පණ්ණත්තික වාර | වර්ණනා | 106 |
| පච්චයානු ලොම | වර්ණනා | 122 |
| පච්චාය පච්චනීය | වර්ණනා | 131 |
| පච්චයානුලොම පච්චනීය | වර්ණනා | 133 |
| පච්චය පච්චනීයානුලෝම | වර්ණනා | 134 |
| සහජාත | වර්ණනා | 136 |

පච්චනීය වර්ණනා 136
නිස්සය වාර වර්ණනා 140
සංසට්ඨ වාර වර්ණනා 141
සම්ප්‍රයුක්ත වාර වර්ණනා 141
පඤ්හවාර විභාග වර්ණනා 142
හේතුමූලක වර්ණනා 143
පඤ්හවාරයේ ගැලපීම් වර්ණනා 162
නහේතුක මූලික වර්ණනා 170
පච්චනීය වර්ණනා 181
න හේතු මූලක වර්ණනා 183
පඤ්හවාර පච්චනීය වර්ණනා 187

ධම්මානුලොමික තිකපට්ඨාන වර්ණනා
වෙදනාත්තික වර්ණනා 188
විපාකතික වර්ණනා 192

අනුලොම පට්ඨාන වර්ණනා
දුක පට්ඨාන වර්ණනා 197
දුක තික පට්ඨාන වර්ණනා 198
තික දුක පට්ඨාන වර්ණනා 199
තික තික පට්ඨාන වර්ණනා 200
දුක දුක පට්ඨාන වර්ණනා 200
අනුලොම පට්ඨාන වර්ණනා 200

පච්චනීයානුලොමක පට්ඨාන වර්ණනා
පච්චනීය පට්ඨාන වර්ණනා 201
අනුලෝම පට්ඨාන වර්ණනා 202

# පරමත්ථදීපනී නම් වූ
# පංචපපකරණට්ඨ කථා-2

**නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට
නමස්කාරය වේවා !

දෙවියනට දෙව් වූ - කෙලෙසුන් දිනුව මුනිරජ
සුරලොවදී දෙව්නට - කතා වස්තුව දෙසා සැකෙවින්

යම විසය ඉක්මවූ - යමක ලකර වූ නා නා
'බිදම් පකරණ' නම් - සවැනි සවැනි වූ දේසක

යමක මෙය ඇවැටූ - නිලමල තනුරුහ
දෙසී යම් පැමිණැක - එහි නයවැනුම් පිළිවෙල

මූල යමක, ඛන්ධ යමක, ආයතන යමක, ධාතු යමක, සච්ච යමක, සංඛාර යමක, අනුසය යමක, චිත්ත යමක, ධම්ම යමක, ඉන්ද්‍රිය යමක යයි මේ යමක දහය වශයෙන් මේ ප්‍රකරණය දහ ආකාරයකින් බෙදන ලදැයි කියන ලදී. ඒවායේ ද මේ ප්‍රකරණයේ ද නමෙහි අර්ථය පළමුකොට දතයුතුය.

කුමන අර්ථයකින් යමක වේද? යුගලය යන අර්ථයෙන් එසේ යුගලය යමක යයි කියනු ලැබේ. යමාමහ පෙළහර, යමක සාලා ආදියෙහි මෙනි. මෙසේ යුගල සංඛ්‍යාත වූ යමක වශයෙන් දෙසන ලද බැවින් මේ දහයෙහි එක එකක් යමක නම් වේ. මේ යමකයන්ගේ වනාහි සමූහ භාවයෙන් මේ සියළු ප්‍රකරණය යමක යයි දතයුතුය.

එහි මූල වශයෙන් ප්‍රශ්න නගා විසඳීම් කොට දෙසන ලද බැවින් සියල්ලට පළමු දහය මූල යමක යයි කියන ලදී. එහි උද්දේස වාරය නිද්දේස වාරය යයි වාර දෙකක් වේ. ඒවායෙහි දක්වන ලද අනුක්‍රමයෙන් පෙන්විය යුත්ත උද්දේස වාරය පළමුව. එහි **යෙ කෙචි කුසලා ධම්මා සබ්බෙ තෙ කුසල මූලා, යෙ වා පන කුසල මූලා සබ්බෙ තෙ ධම්මා කුසලාති** මේ යමක ආදිය. එහි කුසලාකුසල මූල සංඛ්‍යාත අර්ථ දෙකක් වශයෙන් අර්ථ යමකයයි හෝ ඒ අර්ථයන්ගේ වශයෙන් අනුලොම් පිළිලොම් වශයෙන් පවත්නා පෙළ ධර්ම වශයෙන් ධර්ම යමක යයි හෝ අනුලොම් පිළිලොම් වශයෙන් පවත්නා පුච්ඡා වශයෙන් පුච්ඡා යමක යයි හෝ තුන් ආකාර යමක භාවය දතයුතුය. සෙස්සෙහි ද මෙම නයමය.

දැන් මෙම යමකයන්ගේ වශයෙන් දේශනා කරන ලද මේ මූල යමකයෙහි උද්දේශ වාරයේ පළමුව නය යමක පුච්ඡා අර්ථ වාර ප්‍රභේද වශයෙන් පෙළෙහි නියමය මෙසේ දතයුතුය. කුසලත්‍රික මාතෘකාවෙහි **කුසලා ධම්මා** යන මේ මුල්පදය නිසා මූල නය, මූල මූල නය, මූලක නය, මූල මූලක නය යයි මේ සතර නය වේ. ඒවායේ එක එක නයෙහි මූල යමක, ඒකමූල යමක, අඤ්ඤමඤ්ඤ මූල යමක යයි යමක තුන බැගින් වේ. මෙසේ සතර නයෙහි යමක දොළොසෙක් වේ. එක් එක් යමකයෙහි අනුලෝම පටිලෝම වශයෙන් පුච්ඡා දෙක බැගින් පුච්ඡා විසිහතරෙක් වේ. එක් එක් පුච්ඡාවෙහි නිශ්චය සංශය වශයෙන් අර්ථ දෙක බැගින් අර්ථ හතලිස් අටෙක් වේ. එහි **යෙ කෙචි කුසලා ධම්මා** යන කුසලයන්හි කුසල් වේද, කුසල් නොවේදැයි සැක බැවින් මේ පදයෙහි නිශ්චයාර්ථය දතයුතුය.

**සබ්බෙ තෙ කුසල මූලා** යන ඒ සියළු කුසල ධර්මයෝ කුසල් මුල් වේද නොවේදැයි විමති වශයෙන් විචාරන ලද බැවින් මේ පදයෙහි සංශයාර්ථය දතයුතුය. හෙද වනාහි වෛනේයයන්ගේ සංශය ස්ථානයෙහි සංශය දැක්වීම සඳහා කියන ලදී. තථාගතයන් වහන්සේට වනාහි සැකයක්

නැත. මෙයින් පසුව පුච්ඡා පදවලවල ද මෙම නයම වේ. යම්සේ කුසල පදය නිසා මේ සතර නය වේ. එක් එක් නයෙහි යමක තුන බැගින් යමක දොළොසෙක් වේ. එක් එක් යමකයෙහි පුච්ඡා දෙක බැගින් විසිහතරෙක් වේ. එක් එක් පුච්ඡායෙහි අර්ථ දෙක බැගින් අර්ථ හතලිස් අටක් වේ. අකුසල පදය නිසා ද එසේමය. අව්‍යාකතන පදය නිසාද එසේමය. පද තුනම එකක් කොට නිර්දිෂ්ට නාම පදය නිසාද එසේම යයි කුසලත්‍රික මාතෘකාවේ සතර පදවල සියල්ල නය සොළසකි. යමක අටසාළිසකි. පුච්ඡා අනූහයකි. අර්ථ එකසිය අනූදෙකකි. උද්දේශ වශයෙන් කියන ලදැයි දතයුතුය. මෙපමණකින් මූලවාර නම් පළමු උද්දේශය වේ.

ඉන්පසුව **යෙ කෙචි කුසලා ධම්මා සබ්බෙ තෙ කුසල හෙතු** යනාදිය එහි මූල වාරයේම පර්යාය වචන වශයෙන් වාර නවයක් දක්වන ලදී. මෙසේ මූල වාරය, හේතු වාරය, නිදාන වාරය, සම්භව වාරය, පභව වාරය, සමුට්ඨාන වාරය, ආහාර වාරය, ආලම්බන වාරය, පච්චය වාරය, සමුදය වාරය යයි සියල්ල දසවාරයක් වේ. එහි මූලවාරයෙහි පැමිණි පිරිසිඳීමෙන්ම සෙස්සෙහි ද නයාදිය දතයුතු යයි සියළු දසවාරවල නය එකසිය හැටක් වේ. යමක හාරසිය අසූවක් වේ. පුච්ඡා නවසිය හැටක් වේ. අර්ථ එක්දහස් නවසිය විස්සක් දක්වන ලදැයි දතයුතුය.

**මූලං හෙතු නිදානඤ්ච** යනාදි ගාථා දසවාරවල උදාන ගාථා නම් වේ. එහි මූලාදි සියල්ල ද හේතු පර්යායම වේ. හේතු වනාහි පිහිටීම් අර්ථයෙන් මූල වේ. තමාගේ පල නිපදවීම සඳහා හිතවූයේ පවතීයයි **හේතු** වේ. එසේනම් එය ගනුවයි දක්වන්නාක් මෙන් තමාගේ පලය දක්වයි යනු නිදාන මේ මෙයින් පලය හටගනී යයි **සම්භව** වේ. පලය ප්‍රභව (ආරම්භ) වේ යයි **පභවො** වේ. එහි පලය හටගනී හෝ එයින් හටගනී හෝ **සමුට්ඨාන** වේ. තමාගේ පලය ගෙනඒනුයි **ආහාරො** වේ. ප්‍රතික්ෂෙප නොකළහැකි අර්ථයෙන් තමාගේ පලයෙන් එල්බී ගනියයි **ආලම්බන** වේ. මෙයින් පලය උපදවානුයි **සමුදයො** වේ. මෙසේ මේ පදවල වචනාර්ථය දතයුතුය.

උද්දේසවාර වර්ණනාව නිමි.

දැන් **යෙ කෙචි කුසලා ධම්මා** යනාදි නයින් නිද්දේස වාරය ආරම්භ කරන ලදී. එහි **යෙ කෙචි** යනු සියළු වචනයයි. **කුසලා ධම්මා** යනු කුසලත්‍රික පදභාජනයෙහි කියන ලක්‍ෂණ අනවද්‍ය සැප විපාක වූ කුසල ස්වභාවයයි. **සබ්බෙ තෙ කුසලමූලා** කිම? ඒ සියල්ලම කුසල මූලවේදැයි අසයි. **තීණෙව කුසල මූලානි** සියල්ල කුසල මූල නොවේ. අලෝභාදි තුනම කුසල් මුල් යන අර්ථයයි. **අවසෙසා කුසලා ධම්මා න කුසල මූලා** අවසේස වූ ඵස්සාදි ඵස්සාදිය කුසල ධර්ම වේ. කුසල් මුල් නොවේය යන අර්ථයි. යෙ වා පන **කුසලමූලා** යෙ වා පන පළමුවන ඇසීමෙන් දෙවන පදයෙන් කුසල් මුල් යයි අලෝභාදි තුන ගන්නා ලදී. **සබ්බෙ තෙ ධම්ම කුසලා** කිම ඒ සියළු ධර්ම තුන කුසලදැ?යි අසයි. **ආමන්තා** සියළු කුසල මූලයන්ගේ කුසලභාවය පිළිගන්නේ කීය. මෙය පළමුව මූල නයෙහි මූල යමකයේ අර්ථයයි. මේ උපායෙන් සියළු පුච්ඡාවල විසඳීම් නය දතයුතුය. එහි විසේස තැන් පමණක් වර්ණනා කරන්නෙමි.

පළමුව ඒකමූල යමකයෙහි **සබ්බෙ තෙ කුසල මූලෙන එක මූලා** ගණ අර්ථයෙන් ඒකමූල බව නොගෙන සමාන අර්ථයෙන් ගතයුතුය. මෙහි අර්ථය මෙයයි. ඒ සියල්ල කුසල මූලයෙන් සමාන මූල වේද? ඵස්සයේ වූ මූලය වේදනාදියේත් වේද? ඉක්බිති ඒවායේ එසේ වන බව පිළිගන්නේ **ආමන්තා** යයි කීය. **කුසල සමුට්ඨානං** කුසල සිතේ හටගන්නා රූපය දක්වන ලදී. **එකමූලං** අලොභාදි කුසල මූලයෙන් සමාන මුල් වේද, යම්සේ ඵස්සාදියේ අලෝභාදිය හේතුප්‍රත්‍ය බැවින් මුල් වේ. එසේම එයින් හටගන්වන රූපයේ ද මුල් වේ. කුසල ලක්‍ෂණ භාවයෙන් වනාහි එය කුසල නොවේ.

අඤ්ඤමඤ්ඤ යමකයෙහි යෙ කෙචි කුසලා යයි නො අසා **යෙ කෙචි කුසල මූලෙන එකමූලා** යයි ඇසීම කරන ලදී. කුමක් නිසාද? මේ ව්‍යඤ්ජනයෙන් ම එහිම අර්ථය සම්භවය වූ හෙයිනි. **කුසලමූලා** යන මෙය පෙර වූවට විවේසන වේ. **මූලානි යානි එකතො උපපජ්ජන්ති** මෙයින් කියන ලදී. ඒවා වනාහි කුසලමූලද වේ. අකුසල අබ්‍යාකත මූලද වේ. මෙහි කුසල මූල යයි විශේෂ දැක්වීම සඳහා කියන ලදී. **අඤ්ඤමඤ්ඤ මූලානි ච** අඤ්ඤමඤ්ඤ හේතුප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වේ යන අර්ථයයි. එහිම පටිලෝම පුච්ඡාවෙන් ඒ සියළු ධර්ම කුසල මූලයෙන් ඒකමූල යයි නොකියා **සබ්බෙ තෙ ධම්මා කුසලා** යයි කියන ලදී. කුමක් හෙයින්ද? අර්ථ විශේෂද් භාවයෙන්. කුසල මූලයෙන් ඒක මූල යයි පුච්ඡාවෙන්

කරන ලද බැවින් යම් මූලයන් එකට උපදී යයි යට කියන ලද නයින්ම මූල විසඳීම කළයුතු වන්නේය. මෙසේ ඇතිකල්හි අර්ථ විශේෂ අභාවය වේ. එහෙයින් එසේ නොකොට මෙසේ පුච්ඡා කරන ලදී. මේ උපායෙන් මූලමූල නය ආදියෙහි ද අඤ්ඤමඤ්ඤ මූල යමකයෙහි පුච්ඡා විශේෂය දතයුතුය.

මූල මූල නයෙහි **සබ්බෙ තෙ කුසල මූලාති** ඒ සියළු කුසල මූල සංඛ්‍යාත මූල යයි අසයි. **එකමූලා** සමාන අර්ථයෙන් එකම මූල මූලය මොවුන්ට යයි එකමූල මූලා වේ. **අඤ්ඤමඤ්ඤ මූලමූලා** අඤ්ඤමඤ්ඤයන්ගේ මූලය අඤ්ඤමඤ්ඤ මූල වේ. අඤ්ඤමඤ්ඤ මූලය හේතුප්‍රත්‍ය අර්ථයෙන් වූ මූලය මොවුන්ටනුයි අඤ්ඤමඤ්ඤ මූලය වේ.

මූලක නයෙහි **කුසල මූලකාති** හේතුප්‍රත්‍ය අර්ථයෙන් කුසල මූල මොවුන්ට වේනුයි කුසල මූලක වේ. මූල මූලක නයෙහි **කුසල මූල මූලකා** යයි කුසලයන්ගේ මූලය කුසලමූල වේ. හේතුප්‍රත්‍ය අර්ථයෙන්ම කුසලමූල මූල මොවුන්ට වේනුයි **කුසල මූල** මූලක යයි. මෙය පළමුව කුසල පදය නිසා නය යමක පුච්ඡාදියෙහි විශේෂ අර්ථ වේ. අකුසල පද ආදියෙහි ද මෙම නයම වේ. මෙය වනාහි විශේෂයකි. **අහෙතුකං අකුසලං** යයි විචිකිච්ඡාවෙන් මෙන්ම උද්ධච්චයෙන් ද යුක්ත වූ මෝහය නිසා කියන ලදී. **අහෙතුකං අබ්‍යාකතං** යනු අටළොස් සිත්, රූප, නිබ්බාන ද වේ. **අබ්‍යාකත මූලෙන එකමූලං** යයි මෙහි වනාහි සහේතුක අව්‍යාකතත සමුට්ඨාන රූප හැර, සෙස්ස ලැබේ. සහේතුක අබ්‍යාකත සමුට්ඨාන රූප අබ්‍යාකත මූලයෙන් ඒකමූලයක් වේ. එය ගණන් නොගෙන එක්තැන්ව ලැබීම් වශයෙන් ම මෙය විසඳීම් කරන ලදී. **නාමා ධම්මා** නාම සංඛ්‍යාත ධර්මය. ඒවා අර්ථ වශයෙන් අරූප ස්කන්ධ සතර සහ නිවන ද වේ. **නවෙව නාමමූලානි** කුසල අකුසල අබ්‍යාකත මූල වශයෙන් මූල නවයක් වේ. **අහෙතුකං නාමං නාම මූලෙන න එකමූලං** සියළු අහේතුක අටළොස් සිත් විචිකිච්ඡා උද්ධච්ච සම්ප්‍රයුක්ත මෝහ හා නිවන් සංඛ්‍යාත නාමය නාම මූලයෙන් ඒකමූලයක් නොවේ. එය එය සමග නූපදී. **සහෙතුකං නාමං නාම මූලෙන** යන පදයෙහි ද සහේතුක නාමය නාම මූලයෙන් ය යන අර්ථයයි. සෙසු සියල්ල නොගැඹුරු අරුත් වේ.

**මූලවාර වර්ණනාව නිමි.**

හේතුවාරාදියෙහි ද මේ උපායෙන් අර්ථය දතයුතුය. **මූලංහෙතු නිදානඤ්ච** යන ගාථා දක්වන ලද දසවාරයන්ගේ නැවත උදාන වශයෙන් කියන ලදී.

## මූලයමක වර්ණනාව
## නිමි.

දැන් මූලයමකයෙහි දෙසන ලද්දා වූ**ම** කුසලාද ධර්මයන් ස්කන්ධ වශයෙන් සංග්‍රහකොට මූලයමකයට අනතුරුව දෙසන ලද බන්ධ යමකයේ වර්ණනාව වේ. එහි පළමුව පෙළෙහි නියමය මෙසේ දතයුතුය. මේ බන්ධ යමකයෙහි මහාවාර තුනක් වේ. පණ්ණත්තිවාර, පවත්තිවාර, පරිඤ්ඤාවාර යනු ඒ තුනයි. ඒවායින් පණ්ණත්තිවාරය ස්කන්ධයන්ගේ නම් අභිධාන සෝධන වශයෙන් ගන්නා ලද බැවින් පණ්ණත්තිවාර යයි කියනු ලැබේ. පවත්තිවාරය එයින් ශෝධනය කරන ලද නම් අභිධාන ස්කන්ධයන්ගේ උත්පාද නිරෝධ වශයෙන් පැවැත්ම ශෝධනය කරමින් ගන්නා ලදී. එහෙයින් පවත්තිවාර යයි කියනු ලැබේ. පරිඤ්ඤාවාරය මේ අනුක්‍රමයෙන් පවත්නා ස්කන්ධයන්ගේ සංක්ෂෙපයෙන් පරිඤ්ඤා තුනක් දක්වමින් ගන්නා ලදී. එහෙයින් පරිඤ්ඤාවාර යයි කියනු ලැබේ.

එහි පණ්ණත්තිවාරය උද්දේස නිද්දේස වශයෙන් දෙයාකාරයකින් විස්තර කරන ලදී. ඉතිරි දෙකෙහි උද්දේසවාරය නැත. මුල පටන් පුච්ඡා විසඡ්ජන (ඇසීම් විසඳීම්) වශයෙන් එක් ආකාරයකින් නියම කරන ලදී. එහි **පඤ්චක්කන්ධා** යන පදය මුල්කොට **න ඛන්ධා න සංඛාරා** පදය දක්වා පණ්ණත්තිවාරයේ උද්දේස වාරය දතයුතුයි. පුච්ඡාවාර යනු ද ඊටම නමකි. එහි **පඤ්චක්කන්ධා** යන මෙය යමක වශයෙන් ඇසිය යුතු ස්කන්ධයන්ගේ උද්දේසයයි. **රූපක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො** යනු ඒවායේම ප්‍රභේද වශයෙන් නාම වෙන් කිරීමයි. දැන් මේ ස්කන්ධයන්ගේ වශයෙන්, පද ශෝධන වාරය පදසෝධන මූල චක්කවාරය, සුද්ධ ඛන්ධවාරය, සුද්ධඛන්ධමූලචක්කවාරය යයි නය වාර සතරෙක් වේ. එහි **රූපං රූපක්ඛන්ධො රූපක්ඛන්ධො රූපං** යනාදි නයෙන් පදම ශෝධනය කොට

යන ලද්දේ පදශෝධනය වාරය නම් වේ. එය අනුලෝම පටිලෝම වශයෙන් ද්විධ වේ. එහි අනුලෝම වාරයෙහි **රූපං රූපක්ඛන්ධො, රූපක්ඛන්ධො රූපං** යනාදි පංච යමක වේ. පටිලෝම වාරයෙහි ද **න රූපං න රූපක්ඛන්ධො න රූපක්ඛන්ධො න රූපං** යනාදි පසම ඉන්පසු ඒවායේම පද ශෝධන වාරයෙහි සේදූ ස්කන්ධවල **රූපං රූපක්ඛන්ධො, ඛන්ධා වෙදක්ඛන්ධො** යනාදි නයින් එක් එක් ඛන්ධ මූලකවල සතර සතර චක්‍ර බැඳ ගියේ පදශෝධන මූලකවල චක්‍රයන්ගේ ඇති බැවින් පදසෝධන මූල චක්කවාර නම් වේ. එය ද අනුලෝම පටිලෝම වශයෙන් ද්විධ වේ. එහි අනුලෝම වාරයෙහි **රූපං රූපක්ඛන්ධො, ඛන්ධා වෙදනාක්ඛන්ධො** යනාදි එක් එක් ඛන්ධ මූලකවල සතර සතර කොට යමක විස්සෙක් වේ. පටිලෝම වරයෙහි ද **න රූපං රූපක්ඛන්ධො, න ඛන්ධා වෙදනාක්ඛන්ධො** යනාදි විස්සක්ම වේ. ඉන්පසු **රූපං රූපක්ඛන්ධො, ඛන්ධා රූපං** යනාදි නයින් සුද්ධ ඛන්ධ වශයෙන් ම ගියේ සුද්ධ ඛන්ධවාර නම් වේ. එහි **ඛන්ධා රූපං** යනාදියෙහි ඛන්ධ රූප ස්කන්ධ වේ. ඛන්ධ වේදනාස්කන්ධ වේ යන අර්ථය ගතයුතුය. කුමක් හෙයින්ද? නිද්දේස වාරයෙහි මෙසේ බෙදන ලද බැවිනි. එහි වනාහි **රූපං ඛන්ධොති ආමනතා ඛන්ධා රූපක්ඛන්ධොති රූපක්ඛන්ධො ඛන්ධොචෙව රූපක්ඛන්ධො ච අවසෙසා ඛන්ධා න රූපක්ඛන්ධො** යයි මෙසේ **ඛන්ධා රූපං** යනාදියේ **ඛන්ධා රූපක්ඛන්ධො** යනාදි නයින් පද උදුරා අර්ථය බෙදන ලදී. ඒ කාරණයෙන් ද මෙය සුද්ධ ඛන්ධවාර යයි කියන ලදී. වචන සෝධනයෙහි මෙන් මෙහි ඛන්ධ යන වචනය ප්‍රමාණ නොවේ. සුද්ධ ඛන්ධ ලැබෙන හැටියෙන් අර්ථ ප්‍රමාණ වේ. පසුව එන ආයතන යමකාදියෙහි ද මෙම නයම වේ. මේ සුද්ධ ඛන්ධ වාරය ද අනුලෝම පටිලෝම වශයෙන් දෙවදෑරුම් වේ. එහි අනුලෝම වාරයෙහි රූපං ඛන්ධො ඛන්ධා රූපං යනාදි පංච යමක වේ. පටිලෝම වාරයෙහි ද **න රූපං න ඛන්ධො න ඛන්ධා න රූපං** යනාදි පසක්ම වේ. ඉන්පසුව ඒ සුද්ධ ඛන්ධයන්ගේ ම **රූපං ඛන්ධො, ඛන්ධා වෙදනා** යනාදි නයින් එක් එක් ඛන්ධ මූලක සතර සතර සක් බැඳ ගියේ සුද්ධ මූලකවල සක් ඇති බැවින් සුද්ධ ඛන්ධ මූල චක්කවාර නම් වේ. එහි **ඛන්ධා වෙදනා** යනාදියෙහි ඛන්ධ වෙදනා ස්කන්ධ යයි ආදි නයින් අර්ථය දතයුතුය. නිද්දේස වාරය සමග අන් අයුරකින් විරෝධ වේ. එය ද අනුලෝම පටිලෝම වශයෙන් දෙයාකාර වේ. එහි අනුලෝම වාරයෙහි **රූපං ඛන්ධො ඛන්ධා වෙදනා** යනාදිය එක් එක් ඛන්ධමූලක සතර සතර කොටස් වශයෙන් විසි යමක වේ. පටිලෝම වාරයෙහි ද **න රූපං න ඛන්ධො, න ඛන්ධා න වෙදනා** යනාදි විස්සක්ම වේ. මෙසේ පළමුව යමක එක්සිය එකකින්

පුච්ඡා දෙසීයකින් එක් එක් පුච්ඡායෙහි නිශ්චය සංශය වශයෙන් අර්ථ දෙක දෙක කොට අර්ථ හාරසියයකින් ප්‍රතිමණ්ඩිත පණ්ණත්තිවාරයේ උද්දේසවාරය දතයුතුය.

උද්දේසවාර වර්ණනාව
නිමි.

දැන් රූපං රූපක්ඛන්ධො යනාදි නයින් නිද්දේසවාරය අරඹන ලදී. එහි රූපං රූපක්ඛන්ධො යයි යම්කිසි රූපයක් කියයි. ඒ සියළු රූපය රූප ස්කන්ධය දැයි වචන සෝධනය සඳහා අසයි. පියරූපං සාතරූපං රූපං, න රූපක්ඛන්ධො යයි යම් ප්‍රිය රූපයක් මිහිරි රූපයක් යයි මෙහි රූපයයි කියන ලදී. ඒ රූපයම රූප ස්කන්ධ නොවේය යන අර්ථය වේ. රූපක්ඛන්ධො රූපඤ්චෙව රූපක්ඛන්ධො ච යයි යම් රූප ස්කන්ධයක් එය රූපය යයි ද රූප ස්කන්ධය යයිද කීමට වටී යන අර්ථයයි. රූපක්ඛන්ධො රූපං යන මෙහි වනාහි රූප ස්කන්ධය නියමයෙන්ම රූපය යයි කිවයුතුය. එහෙයින් ආමන්තා යයි කීය. මෙම උපායෙන් සියළු විසඳුම්වල අර්ථය දතයුතුය. යම්තැනක විශේෂයක් වේනම් එය වර්ණනා කරන්නෙමු. සංඥා යමකයෙහි පළමුව, දිට්ඨි සඤ්ඤා ප්‍රපංච සඤ්ඤා යනාදියෙහි දෘෂ්ටි සංඥා ආවේය. සංස්කාර යමකයෙහි අවසෙසා සංඛාරා යන 'අනිච්චා වත සංඛාරා' යනාදියෙහි ආවා වූ සංස්කාර ස්කන්ධයෙන් සංඛත ධර්ම අවසේසය. පටිලෝම වාරයෙහි ද මෙම නයම වේ.

පද සොධන වාරය නිමි.

පදසොධන මූලචක්ක වාරයෙහි ඛන්ධා වෙදනාක්ඛන්ධො යම්කිසි ස්කන්ධයක්, ඒ සියල්ල වේදනා ස්කන්ධයදැයි අසයි. ඒ වේදනා ස්කන්ධය, ස්කන්ධය ද වේදනා ස්කන්ධය ද වේ. සෙසු ස්කන්ධ වේදනා ස්කන්ධ නොවේය යන විසඳුමයි. සෙසු පුච්ඡාවල ද මෙම නයයි. පටිලෝමයෙහි න ඛන්ධා න වෙදනාක්ඛන්ධො යන මෙහි ප්‍රඥප්ති වූ නිර්වාණ සංඛ්‍යාත

ධර්ම ස්කන්ධ නොවේ. ඒ යම් වේදනා ස්කන්ධ ද නොවේ. එහෙයින් ආමන්තා යයි කීය. සෙසු විසඳුම්වල ද මෙම නයම වේ.

**පදසොධන මූල චක්කවාරය නිමි.**

සුද්ධ ඛන්ධවාරයෙහි **රූපං ඛන්‍ධො** යයි යම්කිසි රූපයක් කියන ලදී. ඒ සියල්ල ස්කන්ධදැයි අසයි. එහි යම්හෙයකින් ප්‍රියරූප සාත රූප සංඛ්‍යාත වූ රූපය හෝ වේ. භූත උපාදාය රූප හෝ, සියල්ල පංච ස්කන්ධවල සංග්‍රහයට යේමය. එහෙයින් **ආමන්තා** යයි පිළිගනී. දෙවන පදයෙහි **ඛන්‍ධා රූපං** ඇසිය යුත්තෙහි යම්හෙයකින් රූපය යන වචනයෙන් රූපස්කන්ධයම අදහස් කරන ලදී. එහෙයින් වචනය නොගෙන අර්ථ වශයෙන් අසන්නේ, **ඛන්‍ධා රූපක්ඛන්‍ධො** යයි කීය. මෙම නයින් සියළු පදවල අර්ථය දතයුතුය. පසුව එන ආයතන යමකාදියේ නිද්දේස වාරයෙහි ද මෙම නයම වේ. **සඤ්ඤාක්ඛන්‍ධො** යයි මෙහි ද දෘෂ්ටි සංඥාව හෝ සංඥාව හෝ වේවා සියල්ල ද ස්කන්ධ භාවයෙන් ආමන්තා යයි කියන ලදී. **සංඛාර ඛන්‍ධො** යන පදයෙහි ද මෙම නයම වේ. ස්කන්ධ විනිර්මුක්තව සංස්කාර නම් නැත. පටිලෝමයෙහි **න රූපං න ඛන්‍ධො** යම් ධර්ම ජාතයක් රූප නොවේ නම් එය ස්කන්ධ නොවේදැයි අසයි. මෙහි විසඳුමෙහි වනාහි රූපය හැර සෙසු ස්කන්ධ **න රූපං ඛන්‍ධා** යන රූපයෙන් අන්‍ය වූ වේදනාදි ස්කන්ධ රූපයම නොවේ. ස්කන්ධ වේ යන අර්ථයයි. **රූපඤ්ච ඛන්‍ධෙ ච ඨපෙත්වා** අවසෙසා යයි පංච ස්කන්ධ විනිර්මුක්ත වූ නිවන ද ප්‍රඥප්තිය ද වේ. මෙයින් පසුව ද **අවසෙසා** යන පදවල මෙම නයම වේ.

**සුද්ධ ඛන්ධවාරය නිමි.**

සුද්ධඛන්ධමූලචක්ක වාරයෙහි රූපං ඛන්‍ධො යට කියන ලද නයින්ම දැනගත යුතුය.

**සුද්ධඛන්ධ මූල චක්කවාර නිමි.**

**පණ්ණත්තිවාර වර්ණනාව සමාප්තය.**

දැන් **යසස රූපකඛන්ධො** යනාදි නයින් පවත්තිවාරය අරඹන ලදී. එහෙයින් මෙහි උද්දේසවාරය නොකියන ලදද? යට දක්වන ලද නය බව. පණ්ණත්තිවාර උද්දේස වාරයෙහි නය දක්වන ලදී. ඒ නයින් වනාහි මෙහි නොකියන ලද එය දැනගැනීමට හැකියයි එය නොකියා නිද්දේසවාරයම අරඹන ලදී. මේ පවත්තිවාර සංඛ්‍යාත මහා වාරයෙහි උප්පාද වාරය නිරොධ වාරය උප්පාදනිරොධවාරය යයි අන්තර්වාර තුනක් වේ. ඒවා අතුරෙන් පළමුව ධර්මයන්ගේ උප්පාද ලක්ෂණය දක්වන ලද බැවින් උප්පාදවාරය යයි කියයි. දෙවනුව ඒවායේම නිරෝධ ලක්ෂණ දක්වන ලද බැවින් නිරෝධවාරය යයි කියයි. තෙවනුව දෙකේම ලක්ෂණ දක්වන ලද බැවින් නිරෝධවාරය යයි කියයි. මෙහි උප්පාද වාරයෙන් ධර්මයන්ගේ උපදිනා ආකාරයම දක්වන ලදී. නිරොධ වාරයෙන් ඉපදීම නම් නිත්‍ය නොවේ යයි ඒවායේම අනිත්‍යතා දක්වන ලදී. උප්පාද නිරෝධවාරයෙන් ඒ දෙකම දක්වන ලදී. එහි උප්පාද වාරයෙහි පළමුව අද්ධ තුන වශයෙන් කාලභේද හයක් වේ. වර්තමානය, අතීතය, අනාගතය, වර්තමානයෙන් අතීතය, වර්තමානයෙන් අනාගතය, අතීතයෙන් අනාගතය. ඒවා අතරෙන් යමකට රූපස්කන්ධය උපදී යයි වර්තමානය අභිධාන වශයෙන් වර්තමානය දතයුතුය. එය වර්තමාන ධර්මයන්ගේ ප්‍රත්‍යක්ෂ වශයෙන් ගතයුතු හෙයින් අතිශයින් දැනගන්නේ යයි පළමුව කියන ලදී. **යසස රූපකඛන්ධො උප්පජ්ජත්ථ** අතීත අභිධාන වශයෙන් අතීතය දතයුතුය. එය ප්‍රත්‍යක්ෂයෙන් අනුභූත පූර්ව වූ අතීත ධර්මයන්ගේ අනුමානයෙන් අනාගතයෙහි හොඳින් දැනගැනීම කරන හෙයින් දෙවනුව කියන ලදී. **යසස රූපකඛන්ධො උප්පජ්ජිස්සති** අනාගත අභිධාන වශයෙන් අනාගතය දතයුතුය. එය ප්‍රත්‍යක්ෂයෙන් ම අනුභූත පූර්ව වශයෙන් ම ගන්නා ලද ධර්ම අනුමානයෙන් අනාගතයෙහි ද මෙබඳු වූ ධර්ම උපදින්නේ යයි ගතයුතු වශයෙන් තුන්වනුව කියන ලදී. **යසස රූපකඛන්ධො උප්පජ්ජති, තසස වෙදනාකඛන්ධො උප්පජ්ජත්ථ** මෙසේ වර්තමානය සමග අතීත අභිධාන වශයෙන් වර්තමානයෙන් අතීතය දතයුතුය. එය තුන් මිශ්‍රකවල දැනගත හැකි බැවින් සතරවනුව කියන ලදී. **යසස රූපකඛන්ධො උප්පජ්ජති, තසස වෙදනාකඛන්ධො උප්පජ්ජිස්සති** වර්තමානය සමග අනාගත අභිධාන වශයෙන් වර්තමානයෙන් අනාගතය දතයුතුය. එය ප්‍රත්‍යක්ෂ වශයෙන් ගතයුත්තක් ඇති බැවින් අර්ථ වශයෙන් හොඳින් දතහැකි යයි පස්වනුව කියන ලදී. **යසස රූපකඛන්ධො උප්පජ්ජත්ථ තසස වෙදනාකඛන්ධො උප්පජ්ජිස්සති** මෙසේ වර්තමානය සමග අනාගත අභිධාන වශයෙන්

අතීතයෙන් අනාගතය දතයුතුය. එය මුලින් දැනගැනීමට අපහසු යයි සවැනිව කියන ලදී. මෙසේ මේ කාලභේද සයෙහි යමක් මේ පළමු වර්තමානය, එහි පුගගලතො ඔකාසතො පුගගලො කාසතො යයි වාර තුනක් වේ. ඒවායින් යස්ස මෙසේ පුද්ගල වශයෙන් ස්කන්ධයන්ගේ උත්පත්තිය දක්වන්නේ පුද්ගල වාර වේ. යත්ථ මෙසේ ඕකාශ වශයෙන් ස්කන්ධයන්ගේ උත්පත්ති දක්වන්නේ ඕකාසවාර වේ. යස්ස යත්ථ මෙසේ පුද්ගල ඕකාශ වශයෙන් ස්කන්ධයන්ගේ උත්පත්ති දක්වන්නේ පුද්ගල ඕකාස වාර වේ. මේ වාර තුනම පළමුව අනුලෝම නයින් නිද්දේස කොට පසුව පටිලෝම නයෙන් නිර්දිෂ්ටය. ඒවායින් 'උප්පජ්ජති', 'උප්පජ්ජිත්ථ', 'උප්පජ්ජිස්සති' මෙසේ වචනයෙන් උත්පත්ති දක්වන්නේ අනුලෝම නය වේ. 'නුප්පජ්ජති', 'නුප්පජ්ජිත්ථ', 'නුප්පජ්ජිස්සති' මෙසේ වචනයෙන් අනුත්පත්ති දක්වන්නේ පටිලෝම නය වේ. එහි වර්තමාන කාලයෙහි පළමුව පුද්ගල වාරයේ අනුලෝම නයෙහි යස්ස රූපක්ඛන්ධො උප්පජ්ජති, තස්ස වෙදනාක්ඛන්ධො උප්පජ්ජති යස්ස වා පන වෙදනාක්ඛන්ධො උප්පජ්ජති, තස්ස රූපක්ඛන්ධො උප්පජ්ජති, තස්ස සඤ්ඤාක්ඛන්ධො, සංඛාරක්ඛන්ධො, විඤ්ඤාණක්ඛන්ධො උප්පජ්ජති, යස්ස වා පන විඤ්ඤාණක්ඛන්ධො උප්පජ්ජති, තස්ස රූපක්ඛන්ධො උප්පජ්ජති. මෙසේ රූපස්කන්ධ මූලක, යමක සතර වේ. යස්ස වෙදනාක්ඛන්ධො උප්පජ්ජති, තස්ස සඤ්ඤාක්ඛන්ධො උප්පජ්ජති යනාදි නයෙන් වෙදනාක්ඛන්ධ මූලක තුන, සඤ්ඤාක්ඛන්ධ මූලක දෙක, සංඛාරක්ඛන්ධ මූලක එක යයි අගහිත ගහණයෙන් (නොගන්නා ලද්ද ගැනීමෙන්) යමක දහයක් වේ.

එහි රූපස්කන්ධ මූලක සතරෙහි මුලින් එකක්ම විසඳන ලදී. සෙස්ස ඊට සමාන විසඳීම් යයි පෙළෙහි ලඝුභාවය සඳහා සංක්ෂිප්ත කරන ලදී. වෙදනාක්ඛන්ධාදි මූලකවල ද ආමනතා යයි එකසමාන විසඳීම වේ. එහෙයින් ඒවා ද පෙළෙහි ලඝුභාවය සඳහා සංක්ෂෙප කරන ලද්දේමය. මෙසේ මේවා වර්තමාන කාලයේ පුද්ගලවාරයේ අනුලෝම නයෙහි එක් යමක විසඳීමකින්ම යමක දහයක් විසඳන ලද්දේ වේයයි දතයුතුය. පුද්ගල වාරයෙහි දහය මෙන් ඕකාස වාරයෙහි දහයක් ද පුගගලොකාස වාරයෙහි දහයක්දැයි වර්තමාන කාලයේ තුන්වාරයේ අනුලෝම නයෙහි යමක තිහක් වේ. අනුලෝමයෙහි මෙන් පටිලෝම නයෙහි ද සියල්ල වර්තමාන කාලයේ යමක හැටක් වේ. ඒවායේ පුච්ඡා එක්සිය විස්සක් වේ. අර්ථ දෙසිය සතලිසක් වේ යයි දතයුතු. මෙසේ සෙසු පස්කාල භේදයෙහි ද පුද්ගලාදි භේදයෙන් අනුලෝම පටිලෝම නය වශයෙන්

සය සය වාර, එක එක වාරයෙහි දහය දහය කොට හැට හැට යමක යයි යමක තුන්සියයක්. ඒවා පෙර ඒවා සමග යමක තුන්සිය හැටක් වේ. පුච්ඡා හත්සිය විස්සක් වේ. අර්ථ එක්දහස් හාරසිය හතලිහක් වේ. මෙය උප්පාද වාරයෙහි පෙළෙහි නියමයයි. උපපාද වාරයෙහි නිරෝධ වාරයෙහිද උපපාද නිරෝධ වාරයෙහිදැයි සියළුම පවතති මහා වාරයෙහි යමක එක්දහස් අසූවක් වේ. පුච්ඡා දෙදහස් එකසිය හැටක් වේ. අර්ථ හාරදහස් තුන්සිය විස්සක් වේ යයි දතයුතුය.

පෙළෙහි වනාහි උප්පාද නිරෝධ වාරවල අසම්මිශ්‍ර කාල භේදවල ඒ ඒ වාරයෙහි යමක එක එකම විසඳ සංක්ෂෙප කරන ලදී. මිශ්‍රක කාලභේද තුනෙහි **යස්ස වෙදනාක්ඛන්ධො උප්පජ්ජති, තස්ස සඤ්ඤාක්ඛන්ධො උප්පජ්ජිත්ථ** යනාදි නයෙන් වෙදනාකඛන්ධාදි මූලකවලද එක් යමකයක් විසඳන ලදී. සෙස්ස එයින් සමාන විසඳීම් වන බැවින් සංක්ෂෙප කරන ලදී. මෙය සියළුම පවතති මහා වාරයෙහි පෙළේ නියමයයි.

මෙහි අර්ථ විනිශ්චය සඳහා මේ ලක්ෂණය දතයුතුයි. මේ මහා පවතතිවාරයෙහි සතර ප්‍රශ්නයන්ගේ පස් විසඳුම් විසිහත් තැනක බහා අර්ථ විනිශ්චය දතයුතුය. එහි පෙර ප්‍රශ්නය පසු ප්‍රශ්නය පරිපූර්ණ ප්‍රශ්නය මෝඝ ප්‍රශ්නය යයි මේ සතර ප්‍රශ්න නම් වේ. එක එක යමකයෙහි පුච්ඡා දෙක දෙක වේ. එක එක පුච්ඡාවෙහි දෙක දෙක පද වේ.

එහි යම් පුච්ඡාවක් විසඳන කල්හි එකම පදයකින් ගන්නා ලද ස්කන්ධයේ උප්පාදය හෝ නිරෝධය හෝ ලැබේ. මෙය පෙරපද ප්‍රශ්නය වේ. යම් පුච්ඡාවක් විසඳන කල්හි පද දෙකකින් ගන්නා ලද ස්කන්ධයන්ගේ උපපාදය හෝ නිරෝධය හෝ ලැබේ. මෙය පසු ප්‍රශ්නය නම් වේ. යම් පුච්ඡාවක් විසඳන කල්හි එකම පදයෙන් ගන්නා ස්කන්ධයේ පද දෙකකින් ගන්නා ලද ස්කන්ධයන්ගේ උපපාදය හෝ නිරෝධය හෝ ලැබේ. මෙය පරිපූර්ණ ප්‍රශ්නය නම් වේ. යම් පුච්ඡාවක් විසඳන කල්හි ප්‍රතික්ෂෙපය හෝ ප්‍රතිෂෙධය හෝ ලැබේ. මෙය මෝඝ ප්‍රශ්නය නම් වේ. යම්හෙයකින් මෙය නො දක්නේ දැනීමට නොහැකි වේ. එහෙයින් එය දක්වන්නෙමු.

**යත්ථ රූපක්ඛන්ධො නුප්පජ්ජති තත්ථ වෙදනක්ඛන්ධො නුප්පජ්ජති** යම්තැනක රූපස්කන්ධය නූපදීද එතැන වේදනාස්කන්ධය නූපදී යනු

ඇසීමෙන් **උපපජ්ජති** උපදී යන මේ විසඳුමෙහි ඒක පදයකින් ගන්නා ලද වේදනා ස්කන්ධයේ ඉපදීම ලැබේ. මෙසේ මෙය ද අන්‍ය වූ ද මෙබඳු රූප වූ ප්‍රශ්නය පෙර ප්‍රශ්නය යයි දතයුතු. **යස්ස රූපක්ඛන්ධො උපපජ්ජිත්ථ තස්ස වේදනාක්ඛන්ධො උපපජ්ජිත්ථ** යමකට රූපස්කන්ධය ඉපදුනේය. ඊට වේදනා ස්කන්ධය ඉපදුනේද? ඇසීමෙන් වනාහි **ආමන්තා** ඔව් යයි මේ විසඳුමේ දෙපදයකින් ගන්නා ලද රූප වේදනා ස්කන්ධයන්ගේ යම්කිසි සත්ත්වයෙකුට අතීතේ උපත ලබයි. මෙසේ මෙය ද අන්‍ය වූ ද මෙබඳුරූප වූ ප්‍රශ්නය පරිපූර්ණ වූ ප්‍රශ්නය යයි දතයුතුය. පෙර ප්‍රශ්නය යනුද මෙයටම නමකි.

මේ විසඳුමේ පළමු කොටසෙහි එක පදයකින් සංග්‍රහ කරන ලද රූපස්කන්ධයේම අපත දක්වන ලදී. දෙවන කොටසෙහි දෙපදයකින් සංග්‍රහ කරන ලද රූපවේදනා ස්කන්ධයන්ගේ උපත දක්වන ලදී. මේ ලක්ෂණයෙන් ම යම්තැනක එක පදයකින් සංග්‍රහ කරන ලද ස්කන්ධයෝ උප්පාදය හෝ නිරෝධය හෝ ලැබේ. එය පෙර ප්‍රශ්නය යයි කියන ලදී. යම්තැනක දෙපදයකින් සංග්‍රහ කරන ලද ස්කන්ධයන්ගේ උපපාදය හෝ නිරෝධය හෝ ලැබේ. එය පසු ප්‍රශ්නය යයි කියනු ලැබේ. **යස්ස රූපක්ඛන්ධො නුපපජ්ජිත්ථ තස්ස වෙදනක්ඛන්ධො නුපපජ්ජිත්ථ** යමෙකුට රූපස්කන්ධය නොඉපදුනේය. ඊට වේදනා ස්කන්ධය නො ඉපදුනේ ද? මේ ඇසීමෙන් වනාහි **නත්ථීති** නැතැයි යන මේ විසඳුමේ ප්‍රතික්ෂෙපය ලබයි. **යස්ස රූපක්ඛන්ධො උප්පජ්ජති තස්ස වෙදනාක්ඛන්ධො නිරුජ්ඣති** යමකට රූපස්කන්ධය උපදී. ඊට වේදනා ස්කන්ධය නිරුද්ධ වේ. ඇසීමෙන් **නොති** මේ විසඳුමෙහි පටිලෝමය ලබයි. එහෙයින් මෙය ද ද්විධ වූ අන්‍ය වූ මෙබඳු රූප ප්‍රශ්නය ද මොඝ ප්‍රශ්නය යයි දතයුතුය. හිස් ප්‍රශ්නය යනුද කියයි. මෙසේ ප්‍රශ්න සතර දතයුතුය.

පෙළෙහි ස්වභාවයෙන් විසඳීම ප්‍රතිවචනයෙන් විසඳීම ස්වරූප පෙන්වීමෙන් විසඳීම, ප්‍රතික්ෂෙපයෙන් විසඳීම, ප්‍රතිසෝධයෙන් විසඳීම මේ විසඳීම් පස නම් වේ. එහි යම් විසඳීමක් පෙළෙහි පදවලින් ම අර්ථය විසඳයි. මෙය පාළිගතියා විසස්ජජන නම් වේ. එය පෙර ප්‍රශ්නයෙහි ලැබේ. **යත්ථ රූපක්ඛන්ධො නුපපජ්ජතීති තත්ථ වෙදනාක්ඛන්ධො නුපපජ්ජති** යන ප්‍රශ්නයෙහි **උපපජ්ජති** යනු මේ විසඳුම පෙළෙහි පදවලින්ම අර්ථය විසඳීම විය. එහෙයින් මෙබඳු වූ ස්ථානවල පාළි ගතියෙන් විසඳීම දතයුතුය.

යම් විසඳුමක් ප්‍රතිවචන භාවයෙන් අර්ථය විසඳයි. මෙය පටිවචන විසසජ්ජන නම් වේ. එය පසු ප්‍රශ්නයෙහි ලැබේ. **යසස රූපකඛනෙධා උපපජ්ජිසථ තසස වෙදනාකඛනෙධා උපපජ්ජිසථ** යන ප්‍රශ්නයෙහි ආමනතා යනු විසඳීමයි. ප්‍රතිවචන වශයෙන් අර්ථයෙන් විසඳීම විය. එහෙයින් මෙබඳු වූ ස්ථානවල පටිවචන විසසජ්ජනය දතයුතුය. යම් විසඳීමක් ස්වරූපයෙන් දක්වා අර්ථය විසඳයි. මේ ස්වරූප දැක්වීමෙන් විසඳීම වේ. එය පරිපූර්ණ ප්‍රශ්නයෙහි ලැබේ. **යසස රූපකඛනෙධා උපපජ්ජති තසස වෙදනාකඛනෙධා උපපජ්ජති** යන ප්‍රශ්නයෙහි අසඤ්ඤසතතයෙහි ඉපදුන අයට මේ විසඳුමයි. මොවුන්ට රූපස්කන්ධය උපදී. වේදනා ස්කන්ධය නොවේ. මොවුන්ට රූපස්කන්ධයම උපදී. වේදනා ස්කන්ධය යයි ස්වරූප දැක්වීමෙන් ම අර්ථයේ විසඳීම විය. එහෙයින් මෙබඳු තැන්වල ස්වරූප දැක්වීමෙන් විසඳුම දතයුතුය.

යම්කිසි විසඳුමක් වනාහි එබඳු අර්ථයක් නොමැතිවීමෙන් අර්ථ ප්‍රතික්‍ෂෙපයෙන් ප්‍රශ්නය විසඳයි. මෙය පටිකෙඛපෙන විසසජ්ජන නම් වේ. එබඳු වූ යම් අර්ථයක් එකෙණෙහි නොලැබීමෙන් අර්ථ ප්‍රතිශෝධනයෙන් ප්‍රශ්නය විසඳයි. මෙය පටිසෙසනෙන විසසජ්ජන නම් වේ. එය මෝඝ ප්‍රශ්නයෙහි ලැබේ. **යසස රූපකඛනෙධා නූපපජ්ජිසථ තසස වෙදනාකඛනෙධා නූපපජ්ජිසථ** (රූපස්කන්ධය නො ඉපදිණි නම් වේදනා ස්කන්ධය නො ඉපදුනේද? යන ප්‍රශ්නයෙහි **නත්ථි** නැතැයි මෙම විසඳුම එබඳු වූ සත්ත්වයෙක් නැතැයි අර්ථ ප්‍රතික්‍ෂෙපයෙන් ප්‍රශ්නය විසඳීය. එනිසා එබඳු තැන්වල ප්‍රතික්ෂේපයෙන් විසඳීම දතයුතුය.

යසස රූපකඛනෙධා උපපජ්ජති තසස වෙදනාකඛනෙධා නිරුජ්ඣති (යමකට රූපස්කන්ධය උපදී. ඊට වේදනා ස්කන්ධය නිරුද්ධ වේද? යන ප්‍රශ්නයෙහි නො නැත යන මේ විසඳුමය. එක් පටිසන්ධි ක්‍ෂණයෙහි ඉපදීම සමග නිරෝධය නො ලැබේ යයි අර්ථ ප්‍රතික්ෂේපයෙන් ප්‍රශ්නය විසඳීය. එනිසා මෙබඳු තැන්වල පටිසේධයෙන් විසඳීම දතයුතුය.

දැන් මේ ප්‍රශ්න සතර මේ පස් විසඳුම් ද විසිහත් තැනක තැබිය යුතුය. ඒ සත්විසි තැන් මෙසේ දතයුතුය. අසඤ්ඤසත්තයේ උපදින්නවුන්ගේ එක් ස්ථානයකි. අසඤ්ඤ සත්ත්වයෙහි තත්ත්වය එකකි. අසඤ්ඤ සත්ත්වයන්ගේ එකකි. අසඤ්ඤ සත්ත්වයෙන් චුත වන්නන්ගේ එකකි. අරූපයෙහි උපදින්නන්ගේ එකකි. අරූපයෙහි තත්ත්වය යයි

එකකි. අරූපයන්ගේ එකකි. අරූපයෙන් චුත වන්නන්ගේ එකකි. අරූපයෙහි පශ්චිම භවිකයන්ගේ එකකි. අරූපයෙහි පිරිනිවන්පාන්නන්ගේ එකකි. ඇතමෙක් අරූපයෙහි ඉපදී පිරිනිවන්පාන්නෝය යයි එකකි. පංචවෝකාරවල (ස්කන්ධ පහක් ඇති භවවල) උපදින්නන්ගේ එකකි. පංචවෝකාරවල තත්ත්වය යයි එකකි. පංචවෝකාරයන්ගේ එකකි. පංචවෝකාරවලින් චුතවන්නන්ගේ එකකි. පංචවෝකාරයෙහි පිරිනිවන් පාන්නන්ගේ එකකි. සුද්ධාවාසයෙහි උපදින්නන්ගේ එකකි. සුද්ධාවාසයෙහි තත්ත්වය යයි එකකි. සුද්ධාවාසිකයන්ගෙන් එකකි. සුද්ධාවාසයෙහි පිරිනිවන් පාන්නන්ගේ එකකි. සියල්ලන්ගේ උපදින්නන්ගේ එකකි. සියල්ලන්ගේ චුතවන්නන්ගේ එකකි. සියල්ලන්ට සාධාරණ වශයෙන් පශ්චිම භවිකයන්ගේ එකකි. පිරිනිවන් පාන්නන්ගේ එකකි. චතුවෝකාර පංචවෝකාරවල උපදින්නන්ගේ එකකි. චුතවන්නන්ගේ එකකි. මේ සතර ප්‍රශ්නවල මෙම විසඳුම් පහ මේ සත්විසි ස්ථානයන්හි බහා මේ පවතති මහා වාරයෙහි අර්ථ විනිශ්චය දතයුතුය. මෙසේ දැනගෙන වනාහි ප්‍රශ්නය විසඳන්නහු විසින් මනාව විසඳන ලද්දේ වේ. අර්ථය ද විනිශ්චය කරන ලද්දහු විසින් මනාව විනිශ්චය කරන ලද්දේ වේ.

එහි නය මෙසේය. **යස්ස රූපක්ඛන්ධො උප්පජ්ජති** යයි යම් පුද්ගලයෙකුට උත්පාද ක්‍ෂණ එකතුවෙන් රූප ස්කන්ධය උපදී. **තස්ස වෙදනාක්ඛන්ධො උප්පජ්ජති** යයි වේදනා ස්කන්ධය ද ඔහුට ඒ ක්‍ෂණයෙහිම උපදීදැයි අසයි. අසඤ්ඤසත්තයෙහි උපදින්නන්ට අචිත්තක ප්‍රතිසන්ධි වශයෙන් අසඤ්ඤසත්ත භවයෙහි උපදින්නන්ට. **තෙසං රූපක්ඛන්ධො උප්පජ්ජති** ඔවුන්ට ඒකාන්තයෙන් රූප ස්කන්ධයම උපදී. පැවැත්ම වනාහි එහි ඉපදුණු රූපස්කන්ධය ඉපදීම ද නිරුද්ධ වීමද වේ. එහෙයින් අසඤ්ඤ සත්ත්වයින්ගේ යයි නොකියා අසඤ්ඤ සත්ත්වයෙහි උපන්නවුන්ගේ යයි කියන ලදී. **නො ච තෙසං වෙදනාක්ඛන්ධො උප්පජ්ජති** අචිත්තක බැවින් ඔවුන්ට වේදනා ස්කන්ධය නූපදීමය. මේ සත්විසි ස්ථානවල පළමු ස්ථානයෙහි පරිපූර්ණ ප්‍රශ්නයේ පළමු කොටසේ ස්වරූප දැක්වීමෙන් විසඳීමයි.

පංචවෝකාරයෙහි උපන්නවුන්ගේ **පංච වොකාරං උප්පජ්ජන්තානං** රූපාරූප මිශ්‍රක ප්‍රතිසන්ධි බැවින් පංචවෝකාර භවවල උපදින්නවුන්ගේ, **තෙසං රූපක්ඛන්ධො ච උප්පජ්ජති වෙදනාක්ඛන්ධො ච** ඔවුන්ට ඒකාන්තයෙන් රූප වේදනා සංඛ්‍යාත ස්කන්ධ දෙකම උපදී.

පැවැත්ම වනාහි එහි උපදින ඒ ස්කන්ධ ඉපදීම ද නිරුද්ධ වීම ද වේ. එහෙයින් පංචවෝකාරයින්ගේ යයි නොකියා **පංචවොකාරං උපපජ්ජනතානං** පංචවෝකාරයෙහි උපන්නන්ගේ යයි කියන ලදී. මෙ **පංචවොකාරං උපපජ්ජනතානං** යන ස්ථානයෙහි පරිපූර්ණ ප්‍රශ්නයේ පැසුළු කොටසෙහි ස්වරූප දැක්වීමෙන් විසඳීමයි. මේ උපායෙන් සියළු විසඳීම් දතයුතුය. මෙය වනාහි මෙහි උපපාද නිරෝධවල නියම ලක්‍ෂණයයි. මේ සියළු ඛන්‍ධ යමකයෙහි ඒ ඒ තැන උපන්නවුන්ගේ මරණය දක්වා පැවැත්මෙහි ස්කන්ධයන්ගේ කෙළවරක් නැති උපපාද නිරෝධ විද්‍යමාන කල්හි වහා පරිවර්තනය වන ධර්මයන් වෙන්කොට උප්පාද නිරෝධයන් දැක්වීමට පහසු නොවේ. පැවැත්මෙහි උපපාද නිරෝධ ආමර්ශනය නොකොට අළුත් විපාක වෘත්තය නිෂ්පාදනය කරමින් නොයෙක් කර්මයෙන් උපන් ප්‍රතිසන්ධි ස්කන්ධයන්ගේ ඉපදීම දැක්වීමට පහසු යයි ප්‍රතිසන්ධි කාලයෙහි උත්පාද වශයෙන්ම උප්පාද වාරය කියන ලදී. උපන්නහුගේ වනාහි විපාක වෘත්තයේ අවසානයේ නිරෝධය දැක්වීමට පහසු යයි මැරෙන කාලයෙහි නිරෝධ වශයෙන් නිරෝධ වාරය කියන ලදී. පැවැත්මෙහි උපපාද නිරෝධවල අනාමර්ශනයෙහි ප්‍රමාණ මොනවාද? පෙළමය. විශේෂයෙන් උපපාද වාරයේ අනාගතකාල වාරයෙහි පච්ඡිමභවිකානං තෙසං රූපක්ඛන්‍ධො ච නූපපජ්ජිස්සති වෙදනාක්ඛන්‍ධොච නූපපජ්ජිස්සති. මේ පෙළ අතිප්‍රමාණ වේමය. පශ්චිම භවිකයන්ගේ පැවැත්මෙහි රූපාරූප ධර්මයන්ගේ ඉපදීමට සුදුසු බව ඇතිකල්හි රූපස්කන්ධය ද නූපදී. වේදනා ස්කන්ධය ද නූපදී. තීරණය කොට කියන ලද බැවින් පැවැත්මෙහි ඉපදීම නොගන්නා ලදැයි දතයුතුය. **සුද්ධාවාසෙ පරිනිබ්බන්තානං තෙසං තත්‍ථ සඤ්ඤාක්ඛන්‍ධො න නිරුජ්ඣිත්‍ථ නො ච තෙසං තත්‍ථ වෙදනාක්ඛන්‍ධො න නිරුජ්ඣතී** මෙය වනාහි පෙළෙහි පැවැත්මේ නිරෝධ අනාමර්ශන භාවයෙහි අතිශය ප්‍රමාණයකි. සුද්ධාවාසයෙහි පිරිනිවන්පාන්නන්ගේ චුති සිතේ පිළිසිඳීමේ සිට පැවති ඉපදී නිරුද්ධ වූ ස්කන්ධයන්ගේ ගණන් සීමාවක් නැත. මෙසේ ඇතිකල්හිද ඔවුන්ගේ එහි සඤ්ඤා ඛන්‍ධය නිරුද්ධ නොවූයේ යයි නිශ්චයකොට කියන ලද බැවින් පැවති නිරෝධය නොගන්නා ලදැයි දතයුතුය.

මෙසේ මෙහි උප්පාද නිරෝධවල නියම ලක්‍ෂණ දැන පටිසන්ධි ඉපදීමට චුති නිරෝධයම ද ගෙන ඒ ඒ තැන්වල ආවා වූ විසඳුම්වල අර්ථ විනිශ්චය දතයුතුය. එය වනාහි මුල් විසඳුමෙහි කී නයින් සියළු තැන දැනගැනීමට හැකියයි විසඳුම් පිළිවෙළ විස්තර නොකරන ලදී.

මෙයින් මෙසේ දෙන ලද නයින් යමෙකුට මේවායේ අර්ථ විනිශ්චය දැනගැනීමට නොහැකි වේ නම් ආචාර්යවරුන් ඇසුරුකර හොඳින් අසා දැනගත යුතුය.

ඉපදුමෙහි නිවුමේ - දෙකෙහිම ද එකතුව ගෙන
අනුලොම් නය සහා - පිළිලොම් නය ද දක්වන

විසින් යම් කඳුවල - යමකවල ද පහේ වන
පුගුල් සහ අවසර - පුගුල් අවසර යන මෙය

පහස් කොට පැවතුණු - තැන්වල මුනිඳු වදහළ
එම පෙළෙහි නියමය - දක්වනු අනුපිළිවෙළින්

අරුත්හි විනිස'රුත් - පැන විසඳුම් ද වන මෙම
විසඳුම්හි වන තැන් - යම් ඒ මේ හැම අතින්
දක්වා එක් පැනෙහි - යෙදුම් ද පැවසිණි එහී

විතරින් ගිය මෙහී - පැන විසඳුම් පිළිවෙළේ
අරුත් වැනුමට මෙහි - හැකිවෙද මීටත් වඩා
එහෙයින් මෙම නයින් - අරුත් දක්වති පඬිවරු

## පවත්තිමහාවාර වර්ණනාව නිමි.

ඉන් අනතුරුව පරිඤ්ඤාවාරයෙහි ද කාල ප්‍රභේද සයෙක් ම වේ. අනුලෝම පටිලෝම වශයෙන් නය දෙකකි. පුග්ගල වාර ඔකාසවාර පුග්ගලලෝකාසවාර යයි මේ පුග්ගල වාර තුනම ලබයි. ඉතිරි දෙක නොලැබේ. කුමන කරුණකින්ද? සමාන විසඳුම් බැවිනි. යම්කිසි පුද්ගලයෙක් යම්කිසි තැනක රූප ස්කන්ධය දනීද වේදනා ස්කන්ධය ද දනීමය. වේදනා ස්කන්ධය දනීද රූපස්කන්ධය ද දනීමය. රූපස්කන්ධය නොදනීද වේදනා ස්කන්ධය ද නොදනී. වේදනා ස්කන්ධය නොදනී ද

රූපස්කන්ධය ද නොදනී. එහෙයින් ඒවායෙහි ද **යස්ස රූපක්ඛන්ධං පරිජානාති තස්ස වෙදනාක්ඛන්ධං පරිජානාති** ආදි වශයෙන් ප්‍රශ්නකොට ආමන්තා යන විසඳීම කළයුතු වන්නේය. සමාන විසඳුම් බැවින් ඒවා මෙහි නොදක්වන ලදැයි දතයුතුය.

එසේ නැතහොත් පරිඤ්ඤා කෘත්‍යය නම් පුද්ගලයාටම වේ. අවකාශය නොවේ. පුද්ගලයාම දැනගැනීමට සමර්ථ වේ. අවකාශය නොවේ යයි මෙහි පුද්ගලවාරයම ගන්නා ලදී. අවකාශ වාරය නොවේ. එය නොගන්නා ලද බැවින් ඉන් අනතුරුව පුගගලො කායවාරය ලබන්නේද, නො ගන්නා ලදී. යමෙක් වනාහි මේ පුද්ගල වාරය ගන්නා ලද්දේ, එහි වර්තමාන කාලයෙහි රූප ස්කන්ධ මූලක සතරකි. වේදනා ස්කන්ධ මූලක තුනකි. සඤ්ඤා ස්කන්ධ මූලක දෙකකි. සංඛාරා ස්කන්ධ මූලක එකකියි යට කියන ලද නයින්ම අනුලෝම නයෙහි අගහිත ගහණයෙන් යමක දහයකි. පටිලෝම නයෙහි දහයයි විස්සකි. එසේම සෙසු කාල සයේ ද එකිනෙකේ විස්ස බැගින් යමක එක්සිය විස්සක් වේ. පුච්ඡා දෙසිය සතලිහකි. අර්ථ හාරසිය අසූවකි. මෙය මෙහි පෙළෙහි නියමයයි.

මෙහි අර්ථ විනිශ්චයෙහි වනාහි අතීත අනාගත වර්තමාන සංඛ්‍යාත ත්‍රිවිධ කාල පවත්ති වාරයෙහි මෙන් චුතිපටිසන්ධි වශයෙන් නො ලැබේ. පැවතීමේ චිත්තක්ෂණ වශයෙන්ම ලබයි. එහෙයින් මෙහි **යො රූපක්ඛන්ධං පරිජානාති සො වෙදනාක්ඛන්ධං පරිජානාති** යමෙක් රූපස්කන්ධය දනී නම් හේ වේදනා ස්කන්ධය දනීද? යනාදි ප්‍රශ්නවලට **ආමන්තා** ඔව් යයි විසඳීම කරන ලදී. ලෝකෝත්තර මාර්ග ක්ෂණයෙහි නිවන් අරමුණු කරා සිතෙන් පංචස්කන්ධය දැනගැනීමේ කෘත්‍යය ඇතිවීමෙන් එක් ස්කන්ධයක් දැනගැනීමෙන් සෙසු ස්කන්ධවල ද දැනීම ඇතිවන්නේ යයි කියනු ලැබේ. මෙසේ මෙහි **පරිජානාති** යන ප්‍රශ්නවල අනුලෝම නයෙහි පරිඤ්ඤා කෘත්‍යයේ මුදුන් පැමිණි අග්‍ර වූ මාර්ගය යුක්තවීම සඳහා **ආමන්තා** යයි කියන ලදැයි දතයුතුය. පටිලෝම නයෙහි වනාහි **න පරිජානිති** යන ප්‍රශ්නවල පුහුදුන් අය සඳහා **ආමන්තා** යයි කියන ලදී. **පරිජානිත්ථ** යන මේ අතීත කාලවාරයෙහි මාර්ගයට අනතුරුව අග්‍රඵලයෙහි (රහත්) සිටියහුට ද පරිඤ්ඤා කෘත්‍යයේ (දැනගැනීම් කිසේ) අවසානය වූ බැවින් පරිජානිත්ථම නම් වේ. යො රූපක්ඛන්ධං පරිජානාති සො වෙදනක්ඛන්ධං පරිජානිත්ථ (යමෙක් රූපස්කන්ධය දැනගනීද ඔහු වේදනා ස්කන්ධය

දැන ගත්තේද?) යන ප්‍රශ්නයෙන් අග්‍රමාර්ගයෙන් යුක්තදැයි අසයි. යම්හෙයකින් හෙතෙම ස්කන්ධ පංචකය දැනගැනීමය නම් වේ. තවම අවසාන පරිඤ්ඤා කෘත්‍යය නොවේ. එහෙයින් නැතැයි කියන ලදී. දෙවන ප්‍රශ්නයෙහි වනාහි **පරිජානිස්සති** යයි රහත්බව අසයි. ඔහුගේ අවසාන පරිඤ්ඤා කෘත්‍යය ඔහුගේ පරිඤ්ඤෙය්‍යය ද නොවේ. එහෙයින් නො යයි ප්‍රතිසේධය කරන ලදී. පටිලෝම නය විසඳීමෙහි වනාහි මෙහි **අරහා රූපක්ඛන්ධං න පරිජානාති** අරහා රූපස්කන්ධය නොදනී. අරහත් හෝ දැනීමේ අභාවයෙන් කියන ලදී. **අග්ගමග්ගසමංගී වෙදනාක්ඛන්ධං න පරිජානිස්සති** අරහතත මාර්ගස්ථ වූවහුට නොනිමි පරිඤ්ඤා කෘත්‍යය නිසා කියන ලදී. හුදෙක් වේදනා ස්කන්ධය පමණක් නොව එකම ධර්මයක්වත් නොදැන ගත්තේමය. මෙය වනාහි පුච්ඡා වශයෙන් කියන ලදී. නො ච **රූපක්ඛන්ධං** යයි මෙය පුච්ඡා වශයෙන් කියන ලදී. හේ සෙසු ස්කන්ධ දනී. යො රූපක්ඛන්ධං **පරිජානාති** සො වෙදනාක්ඛන්ධං **පරිජානිස්සති** යයි යමෙක් රූපස්කන්ධය දනී. හේ වේදනා ස්කන්ධය දන්නේද? මෙහි යම්හෙයකින් මාර්ගස්ථ පුද්ගලයා ඒකචිත්ත ක්‍ෂණිකය. එහෙයින් හේ දැනගන්නේ යයි යන සංඛ්‍යාවට නොයේ. එහෙයින් කියන ලදී නො කියා. **තෙ රූපක්ඛන්ධඤ්ච න පරිජානිස්සන්ති** පුච්ඡා සභාගයෙන් කියන ලදී. නොදැනගත්හ යනු මෙහි අර්ථයයි. මේ උපායෙන් සියළු තැන අර්ථ විනිශ්වය දතයුතුය.

පරිඤ්ඤාවාරය
නිමි.

බන්ධ යමක වර්ණනාව
නිමි.

# ආයතන යමක වර්ණනාව

දැන් මූල යමකයෙහි දේශනා කළ කුසලාදි ධර්මයන් ආයතන යමකයෙහි ද සංග්‍රහකොට ඛන්ධ යමකයට අනතුරුව දේශනා කළ ආයතන යමකයේ වර්ණනාව වේ. එහි ඛන්ධ යමකයෙහි කියන ලද නයින් ම පෙළෙහි නියමය දතයුතුය. එහි මෙන් මෙහි ද පණ්ණත්තිවාර, පවත්තිවාර, පරිඤ්ඤාවාර යයි මහාවාර තුනක් වේ. වචනාර්ථය ද ඒවායේ කියන ලද අයුරින්ම දතයුතුය. මෙහි ද පණ්ණත්තිවාරය උද්දේස නිද්දේස වශයෙන් නියම දෙකකි. සෙසු දෙකෙහි නිද්දේස වශයෙන් ම වේ. එහෙයින් **එහි ද්වාදසායතනානි** යන පදය ආදිකොට **නායතනා න මනො** යි දක්වා පණ්ණත්ති වාරයේ උද්දේසවාරය දතයුතුය. එහි **ද්වාදසායතනානි** යන මෙය යමක වශයෙන් ඇසිය යුතු ආයතනයන්ගේ උද්දේසයි. **චක්ඛායතනං.. -පෙ- ධම්මායතනං** ඒවායේම ප්‍රභේද වශයෙන් නාම නියමයයි. යමක වශයෙන් මෙහි ඇසීමේ පහසුව සඳහා පළමුව පිළිවෙළින් අජ්ඣත්ත රූප ආයතන කියන ලදී. බාහිර රූප ආයතන පසුව අවසානයෙහි මනායතන ධම්මායතන, යට යම්සේ ස්කන්ධ වශයෙන් මෙන් මෙසේ මෙහි මේ ආයතනයන්ගේ වශයෙන් පදසොධනවාරය, පදසොධන මූලචක්කවාරය, සුද්ධායතනවාරය, සුද්ධායතන මූලචක්කවාරය යයි නයවාර සතරක් වේ. මෙහි එක එකක් අනුලෝම පටිලෝම වශයෙන් දෙපරිදි වේ. ඒවායේ අර්ථ එහි කියන ලද නයින්ම දතයුතුය.

ඛන්ධ යමකයෙහි පදසෝධනවාර අනුලෝම වාරයේ යම්සේ **රූපං රූපක්ඛන්ධො, රූපක්ඛන්ධො රූපං** යනාදි පංච යමකයක් වීද, එසේම මෙහි **චක්ඛු චක්ඛායතනං, චක්ඛායතනං චක්ඛු** යනාදි දොළොසක් වේ. පටිලෝම වාරයෙහි ද **න චක්ඛු න චක්ඛායතනං න චක්ඛායතනං න චක්ඛු** යනාදි දොළොසක් වේ. මෙහි පදසෝධන මූලචක්කවාර අනුලෝම වාරයෙහි එක් එක් ආයතන මූලක එකොලහ බැගින් කර එකසිය තිස්දෙකක් වේ. සුද්ධායතනවාර අනුලෝම වාරයෙහි දොළොසක්, පටිලෝම වාරයෙහි දොළොසක් සුද්ධායතන මූල චක්කවාර අනුලෝම වාරයෙහි එක් එක් ආයතන මූලක එකොළහ බැගින් කොට යමක එකසිය තිස්දෙකක් වේ. පටිලෝමවාරයෙහි ද එක්සිය තිස්දෙකක්ම වේ. මෙසේ යමක පන්සිය සැත්තෑසයක් ඒ ඒ වාර අනුව (576 = 12x2 = 24 + 12x11 = 132x4 = 528 + 24 =

576) පුච්ඡා එක්දහස් එකසිය පනස් දෙකක් වේ. (576x2 = 1152) අර්ථ දෙදහස් තුන්සිය සතරක් වේ. (1152x2 = 2304) මෙසේ යුක්ත වූ පණ්ණත්ති වාරයේ උද්දේස වාරය දතයුතුය. නිද්දේස වාරයෙහි වනාහි යට ඛන්ධ යමකයේ පණ්ණත්තිවාර නිද්දේසයෙහි කියන ලද නයින් අර්ථය දතයුතුය. විශේෂ හැර. එහි විශේෂය මෙසේය. **දිබ්බ චක්ඛු** දෙවන විද්‍යා ඥාණයයි. **පඤ්ඤාචක්ඛු** තෙවැනි විද්‍යා ඥාණයයි. **දිබ්බසොතං** දෙවැනි අභිඥා ඥාණයයි. **තණ්හා සොතං** තෘෂ්ණාව. **අවසෙසො කායො** නාමකය, රූපකාය, හසතිකාය, අශ්වකාය මෙනි. **අවසෙසං රූපං** රූපායතනයෙන් සේස වූ භූත, උපාදාය රූපද පියරූප, මිහිරි රූපද. **සීලගන්ධො** යනාදිය හැමීම් අර්ථයෙන් සීලාදියටම නම් වේ. **අත්ථරසො** ආදියද යහපත් මිහිරි අර්ථයෙන් අර්ථවලටම නම් වේ. **අවසෙසො ධම්මො** අනේක ප්‍රභේද වූ පර්යාප්ති ධර්මාදිය මෙහි විශේෂයයි.

මෙහි ද පවත්තිවාරයේ උප්පාද වාරවල අන්තර තුනෙහි එක එකේ කාලභේද හය වේ. ඒවායේ එක් එක් කාලයෙහි පුද්ගල වාරාදි තුන්වාරයක් වේ. ඒ සියල්ල අනුලෝම පටිලෝම වශයෙන් ද්විධ වේ. එහි වර්තමාන කාලයේ පුද්ගලවාරයේ අනුලෝම නයෙහි ඛන්ධ යමකයෙහි රූපස්කන්ධ මූලක සතරය. වේදනා ස්කන්ධ මූලක තුනය, සඤ්ඤා ස්කන්ධ මූලක දෙකය, සංඛාර ස්කන්ධමූලක එකයයි අගහිත ගහණයෙන් යමක දහයක් වේ. එසේම යමෙකුට චක්ඛායතනය උපදීද ඔහුට සෝතායතනය උපදී. යමෙකුට වනාහි සෝතායතනය උපදීද ඔහුට චක්ඛායතනය උපදී. යමෙකුට චක්ඛායතනය උපදීද ඔහුට ඝානායතන ජිව්හායතන කායායතන රූපායතන සද්දායතන ගන්ධායතන, රසායතන, පොට්ඨබ්බායතන, මනායතන ධම්මායතන උපදී. යමෙකුට වනාහි ධම්මායතන උපදීද ඔහුට චක්ඛායතන උපදීයයි මෙසේ චක්ඛායතන මූලක එකොළහක් ද යමෙකුට සෝතායතනය උපදීද ඔහුට ඝානායතනය උපදී යනාදි නයින් සෝතායතන මූලක දහයක් ද ඝානායතන මූලක නවයක් ද ජිව්හායතන මූලක අටක් ද කායායතන මූලක සතක් ද රූපායතන මූලක හයක් ද සද්දායතන මූලක පහක් ද ගන්ධායතන මූලක හතරක්ද රසායතන මූලක තුනක් ද පොට්ඨබ්බායතන මූලක දෙක්ද මනායතන මූලක එකක්දැයි අගහිත ගහණයෙන් හැටහයක් යමක වේ. එහි චක්ඛු ආයතන මූලකවල එකොලහේ යමෙකුට චක්ඛායතනය උපදී. ඔහුට සෝතායතනය, ඝානායතනය, රූපායතනය, මනායතනය, ධම්මායතනය උපදී යයි මේ පසම විසඳන ලදී.

ඒවායින් පළමුව විසඳිය යුතු ඒවා විසඳන ලදී. දෙවනුව කිසිවක් ද පළමුවැන්නට සමානව විසඳන ලදී. චක්ඛු සෝත ආයතනවල පවතින ස්ථානයෙහි වනාහි ඝානායතනය ඒකාන්තයෙන් ම නො පවතී. මෙය කෙසේ විසඳිය යුතුදැයි විමතිය නිවාරණය කිරීම සඳහා විසඳන ලදී. රූපායතන මනායතන ධම්මායතන සමග යමක තුන අසදෘශ විසඳීම් බැවින් විසඳන ලදී. සෙසු ජිව්හායතන කායායතන සමග යමක දෙක පෙර දෙක සමග සමානව විසඳන ලදී. සද්දායතනය පටිසන්ධි ක්ෂණයෙහි නොපත් බැවින් එය සමග යමකයේ විසඳීමක් නැත. ගන්ධ රස පොට්ඨබ්බ ආයතන සමග යමක තුන පෙර දෙකට සමානව විසඳන ලද්දේ වේ. පෙළෙහි ලුහුබව සඳහා සංක්‍ෂෙප කරන ලදී. සෝතායතන මූලකවල යමක් ලබාද එය පෙර සමානව විසඳන ලද්දේ යයි එකක්වත් පෙළට ඇතුළත් නොකරන ලදී. ඝානායතන මූලකවල රූපායතනය සමග එකක්, මනායතන, ධම්මායතන සමග දෙකක් තුනක් යමක පෙළෙහි ඇතුළත් කරන ලදී. එසේම ජිව්හායතන කායායතන මූලකවල, රූපායතන මූලකවල මනායතන සමග දෙකක්ම විසඳන ලදී. ගන්ධ රස පොට්ඨබ්බ සමග තුනක් රූපායතන මනායතන සමග සමානව විසඳන ලදී. යම්සේ යට ස්වරූප වූ අචිත්තකයින්ගේ යනාදිය කියන ලදී. එසේම මෙහි ද ස්වරූප වූ අගන්ධවල අරසවල අපොට්ඨබ්බවල යෙදීම දතයුතුය.

මෙහි ගන්ධාදිය ආයතන වශයෙන් ම අභිප්‍රේතය. එහෙයින් **සරූපකානං සගන්ධායතනානං** යන ආයතන වශයෙන් මෙහි. අර්ථය දතයුතුය. සද්දායතන මූලකවල අර්ථ අභාවයෙන් පෙළෙහි ඇතුළත් නොකරන ලදී. ගන්ධ රස පොට්ඨබ්බ මූලකවල සතර තුන දෙක ද යට සමානව විසඳන ලද බැවින් පෙළෙහි ඇතුළත් නොකරන ලදී. මනායතන මූලක විසඳන ලදමයයි මෙසේ මේවා වර්තමාන කාලයේ පුද්ගලවාරයේ අනුලෝම නයෙහි යමක කීපයක් විසඳීමෙන් ම යමක හැටහයක් විසඳන ලද්දේ වේයයි දතයුතුය. පුද්ගල වාරයෙහි මෙන් ඕකාස වාරයෙහි ද පුග්ගලොකාසවාරයෙහි ද හැටහය යයි වර්තමාන කාලයේ තුන් වාරයෙහි අනුලෝම නයෙහි යමක එකසිය අනූඅටක් වේ. අනුලෝම නයෙහි මෙන් පටිලෝම නයෙහි ද වේ. වර්තමාන කාලයෙහි සියල්ල යමක තුන්සිය අනූහයක් වේ. ඒවායෙහි පුච්ඡා හත්සිය අනූදෙකක් වේ. අර්ථ එක්දහස් පන්සිය අසූහතරක් වේයයි දතයුතුය. මෙසේ සෙසු කාලප්‍රභේද පසෙහිද සියල්ල දෙදහස් තුන් හැත්තෑහයක් වේ. පුච්ඡා හාරදහස් හත්සිය පනස් දෙකක් වේ. අර්ථ නවදහස් පන්සිය හතරක් වේ යයි මෙය මෙහි

උප්පාද වාරයෙහි පෙළෙහි නියමයයි. නිරෝධවාර උප්පාද නිරෝධ වාරවලද මෙම නයම වේ. පවත්ති වාරයෙහි සියළු යමක හත්දහස් එකසිය විසිඅටක් වේ. පුච්ඡා එයින් දෙගුණය වේ. අර්ථ එයින් දෙගුණය වේයයි දතයුතුය.

පෙළ වනාහි මනායතන ධම්මායතන එක සමානය. විවිධ නැත. ඉහළ වනාහි වාර සංක්‍ෂෙප වේ යයි ආදිය කියා ඒ ඒ තැන සංක්‍ෂේප කරන ලදී. එහෙයින් යම් තැන්වල සංක්‍ෂෙපද ඒ සියල්ල නුමුළා වත්නන් විසින් සැලකිය යුතුය.

මෙහි අර්ථ විනිශ්චයෙහි වනාහි මේ නය මුඛය :- **සචක්ඛුකානං අසොතකානං** යයි අපායෙහි උපන් බිහිරි ඕපපාතිකයන් සඳහා කියන ලදී. හේ චක්ඛු සහිතව කන් රහිතව උපදී. යම්සේ කීහ. කාමධාතුවේ උපන් කෙණෙහි කිසිවෙකුගේ අපර වූ දස ආයතන පහළ වේ. ඕපපාතික ප්‍රේතයින්ගේ ඕපපාතික අසුරයන්ගේ ඕපපාතික තිරිසන්ගත සතුන්ගේ ඕපපාතික නිරයවාසීන්ගේ ජාති බිහිරන්ගේ උපන් කෙනෙහි දස ආයතන පහළ වේ. චක්ඛායතන, රූප, ඝාන, ගන්ධ, ජිව්හා, රස, කාය, ඵොට්ඨබ්බ ආයතන මනායතන ධම්මායතන වේ. **සචක්ඛුකානං සසොතකානං** සුගති දුගතිවල පරිපූර්ණ ආයතනවල ද ඕපපාතික රූපී බ්‍රහ්මයන් සඳහා කියන ලදී. ඔව්හු චක්ඛු සහිතව කන් සහිතව උපදිති. යම්සේ කීහ. කාම ධාතුවෙහි උපන් කෙනෙහි කිසිවකුට ආයතන එකොළහක් පහළ වේ. කාමාවචර දෙවියන්ට ප්‍රථම කල්පික මිනිසුන්ට ඕපපාතික ප්‍රේතයන්ට ඕපපාතික අසුරයින්ට ඕපපාතික තිරිසන්ගතයන්ට ඕපපාතික නෙරයිකයන්ට පරිපූර්ණ ආයතන වේ. රූප ධාතුවෙහි උපන් කෙනෙහි චක්ඛායතන රූප සෝත මනායතන ධම්මායතන යන පංචායතන පහළ වේ. **අඝාතකානං** බ්‍රහ්ම පාරිසද්‍යාදීහු සඳහා කියන ලදී. ඔව්හු චක්ඛු සහිතව ඝාන රහිතව උපදිති. කාමධාතුවෙහි වනාහි අඝානක ඕපපාතිකයෝ නැත්තාහ. ඉදින් වන්නේ නම් කිසිවකුට ආයතන අටක් පහළවේ යයි කියන්නේය. යම් ගබ්භ සෙය්‍යකයෙක් වනාහි අඝාතක වන්නේය. හේ **සචක්ඛුකානං** වචනයෙන් මෙහි අභිප්‍රේත නොවේ. **සචක්ඛුකානං අඝාතකානං** ජාති බධිරයන් ද පරිපූර්ණ ආයතන ඕපපාතිකයන් ද සඳහා කියන ලදී. **සඝාතකානං අචක්ඛුකානං** ජාති අන්ධයා ද ජාති බධිරයා ද ඕපපාතිකයාද සඳහා කියන ලදී. **සඝානකානං සචක්ඛුකානං** සම්පූර්ණ ආයතන ඇති ඕපපාතිකයන් සඳහා කියන ලදී.

**සරූපකානං අචක්ඛුකානං** මෙහි ජාති අන්ධ ජාති බධිර ඕපපාතිකයන් අතරෙහි ගබ්භසෙය්‍යකයා ද ලැබේ. **සචිත්තකානං අචක්ඛුකානං** මෙහි යට කියන ලද ජාති අන්ධ ආදි තුන්දෙනා සමග අරූපීහු ද ලබති. **අචක්ඛුකානං** මෙහි පෙර පදයෙහි කියන ලද සතර දෙනා සමග අසඤ්ඤසත්ත්වයෝ ද ලබති. **සරූපකානං අඝානකානං** මෙහි ගබ්භ සෙය්‍යා ද අසඤ්ඤ සත්ත්වයෝ ද සෙසු රූපී බ්‍රහ්මයෝ ද ලබති. **සචිත්තකානං අඝානකානං** මෙහි ගබ්භසෙය්‍යාද රූපාරූපී බ්‍රහ්මයෝ ද ලබති. **අචිත්තකානං අරූපකානං** පදවල වනාහි ඒකවෝකාර චතුවෝකාර සත්ත්වයෝම ලබති. මෙම නයින් සියළු පුග්ගලවාරවල පුග්ගල විභාගය දතයුතුය. ඕකාස වාරයෙහි **යත්ථ චක්ඛායතනං** රූපී බ්‍රහ්මලෝකය විචාරයි. එයින්ම **ආමන්තා** යයි කියන ලදී. ඒ තලයෙහි නියමයෙන් ඒ ආයතනවල පිළිසිඳීමෙහි උපදිති. මෙහි නය මුඛය මෙසේය. මෙම නය මුඛයෙන් සියළුම පවත්තිවාරවල අර්ථය දතයුතුය. පරිඤ්ඤා වාරය ඛන්ධ යමකයෙහි කියන ලද නයින්ම වේ.

ආයතන යමක වර්ණනාව
නිමි.

# ධාතුයමක වර්ණනාව

දැන් ඒ මූලයමකයෙහි දේශනා කරන ලද කුසලාද ධර්මයන් ධාතු වශයෙන් සංග්‍රහකොට ආයතන යමකයට අනතුරුව දේශනා කරන ලද ධාතු යමක වර්ණනාවේ වේ. එහි ආයතන යමකයෙහි කියන ලද නයින්ම පෙළ නියමය දතයුතුය. මෙහිද පණ්ණත්ති වාරාදි මහාවාර තුන අවසේස අතුරුවාරද සමග කාල ප්‍රභේද ආදියෙන් ආයතන යමකයෙහි පැමිණියා සේ සමානය. මෙහි ද යමක ඇසීම් පහසුව සඳහා පිළිවෙළින් අජ්ඣත්තික බාහිර රූපධාතු කියා විඤ්ඤාණ ධාතුව කියන ලදී. ධාතුන්ගේ බොහෝ බව නිසා මෙහි ආයතන යමකයට වඩා බහුතර යමක, යමක ද්විගුණව පුච්ඡා, පුච්ඡා ද්විගුණව අර්ථ වේ. එහි චක්ඛුධාතු මූලක යමකවල ලැබෙන

යමකයන්ගේ අර්ථ විනිශ්චය ආයතන යමකයෙහි කියන ලද නයින්ම දතයුතුය. මෙහි ඊට සමානවම අර්ථගත වේ. ඒ කරුණෙන් ම පෙළද සංක්ෂිප්තය. පරිඤ්ඤාවාරය ප්‍රකෘතිකමය වේ.

ධාතු යමක වර්ණනාව
නිමි.

# සත්‍ය යමක වර්ණනාව

දැන් ඒ මූලයමකයෙහි ම දේශනා කරන ලද කුසලාදි ධර්මයන් සත්‍ය වශයෙන් සංග්‍රහකොට ධාතු යමකයට අනතුරුව දේශනා කරන ලද සත්‍ය යමක වර්ණනාව වේ. එහි ද යට කියන ලද නයින්ම පණ්ණත්ති වාරාදි මහාවාර තුන, අන්තරවාරාදි වූ අවසේස ප්‍රභේදද දතයුතුය. මෙහි පණ්ණත්තිවාරයෙහි වනාහි චතුර් සත්‍ය වශයෙන් පදසෝධන වාරය, පදසෝධන මූල චක්කවාරය, සුද්ධ සච්චවාරය, සුද්ධ සච්චමූලචක්කවාරය යයි මේ සතර වාරයෙහි යමක ගණන දතයුතුය. පණ්ණත්ති වාර නිද්දේසයෙහි වනාහි **අවසෙසං දුක්ඛසච්චං** දුක්ඛ වේදනාවෙන් මෙන්ම තෘෂ්ණාවෙන් ද විනිර්මුක්ත වූ ත්‍රෛභූමක ධර්ම දතයුතුය. **අවසෙසො සමුදයො** සත්‍ය විභංගයෙහි නිර්දිෂ්ඨ කාමාවචර කුසලාදි භේද වූ දුක්ඛ සත්‍යයට ප්‍රත්‍ය වේ. **අවසෙසො නිරොධො** තදංග වික්ඛම්භන සමුච්ඡෙද පටිප්පස්සද්ධි, නිරෝධය ද ක්ෂණ භංගුර නිරෝධය ද. **අවසෙසො මග්ගො** ඒ සමයෙහි පංචංගික මාර්ගය වේ. අටඨංගික මාර්ගය, මිථ්‍යා මාර්ගය, අඩිපාර, කරත්ත පාර යනාදිය වේ.

මෙහි පවත්ති වාරයෙහි වනාහි වර්තමාන කාල පුග්ගල වාර අනුලෝම නයෙහි යමෙකුට දුක්ඛ සත්‍යය ඇතිවේද, ඔහුට සමුදය සත්‍යය උපදී. යමෙකුට වනාහි සමුදය සත්‍යය උපදීද ඔහුට දුක්ඛ සත්‍යය උපදී. දුක්ඛ සච්ච මූලකයෙහි තුනකින් සමුදය සත්‍යය මූලකයන් දෙකකින්

නිරෝධ සත්‍ය මූලකයෙන් එකකින් ලැබෙන ඒවාද නොලැබෙන ඒවාද ගෙන පෙළ වශයෙන් යමක හයකින් විය යුතුය. ඒවායෙහි නිරෝධයට උප්පාදය නැත. නිරෝධය නොයෙදේ. එහෙයින් දුක්ඛ සත්‍යමූලක, සමුදය සත්‍ය මාර්ග සත්‍ය සමගින් දෙකක් ද සමුදය සත්‍ය මූලක මාර්ග සත්‍ය සමග එකකැයි යමක තුනක් ආයේය. එහි පටිලෝම නයෙහි ඕකාස වාරාදියෙහි ද මෙම නයම වේ. මෙසේ මෙහි සියළු වාරවල යමක තුන තුන වශයෙන් යමක ගණන දතයුතුය. මෙහි අර්ථ විනිශ්චයෙහි වනාහි මේ ලක්‍ෂණය සච්ච යමකයේ පවත්ති වාරයෙහි නිරෝධ සත්‍ය තවම නොලැබේ. සෙසු ඒවායේ වනාහි සමුදය සච්ච මග්ග සච්චවල ඒකාන්තයෙන් ම පැවතීමම ලබයි. දුක්ඛ සත්‍යය චුතිපටිසන්ධිවල ද පැවතීමේ ද ලබයි. වර්තමානාදි තුන් කාල චුතිපටිසන්ධිවල ද පැවතීම් වශයෙන් ලබයි. මෙසේ මෙහි යමක් ලබයිද ඒ අනුව අර්ථ විනිශ්චය දතයුතුය.

එහි නයමුඛය මෙසේය. **සබ්බෙසං උපපජ්ජන්තානං** යටත් පිරිසෙයින් සුද්ධාවාසවල ද ඔව්හු ද දුක්ඛ සත්‍යයෙන් ම උපදිති. **තණ්හා විප්පයුත්ත චිත්තස්ස** මෙය දුක්ඛ සත්‍යය සමුදය සත්‍යවල එක් කොටසක උත්පත්ති දැක්වීම සඳහා කියන ලදී. එහෙයින් පංචවෝකාර වශයෙන් ගතයුතුය. සතර වෝකරයෙහි වනාහි තෘෂ්ණා විප්‍රයුක්ත ඵලසමාපත්ති සිතේ උපන් කෙණෙහි එකම සත්‍යකුදු නූපදී. මෙය මෙහි නොගත යුතුය. **තෙසං දුක්ඛසච්චං** එකෙණෙහි තෘෂ්ණාව හැර සෙසු දුක්ඛ සත්‍යය නම් වේයයි සඳහා කියන ලදී. මාර්ගයට ද උපන් කෙණෙහි මෙම නය වේ. එහි වනාහි රූපයම දුක්ඛ සත්‍ය වේ. සෙසු මාර්ග සම්ප්‍රයුක්ත ධර්ම සත්‍යය විනිර්මුක්තය. ඒ කාරණයෙන්ම **ආරුප්පෙ මග්ගස්ස උප්පාදක්ඛණෙ තෙසං මග්ගසච්චං උප්පජ්ජති, නො ච තෙසං දුක්ඛ සච්චං උප්පජ්ජතීති වුත්තං, සබ්බෙසං උපපජ්ජන්තානං පවත්තෙ තණ්හා විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ** ඔවුන්ගේ උපන් ක්‍ෂණයෙහි තෘෂ්ණා විප්‍රයුක්ත සිත උපන් කෙණෙහිම මෙසේ මෙහි ක්‍ෂණ වශයෙන් දතයුතුය. මෙබඳු ස්වරූප වූ වෙන තැන්වලද මෙම නයම වේ. **අනභිසමෙතාවීනං** චතුසසත්‍ය ප්‍රතිවෙධ සංඛ්‍යාත අභිසමයට නොපත් සත්ත්වයන්ගේ. **අභිසමෙතාවීනං** අවබෝධ කළ සත්‍යය. මෙම නය මුඛයෙන් සියළු තැන අර්ථ විනිශ්චය දතයුතුය. පරිඤ්ඤා වාරයෙහි වනාහි ඤාත පරිඤ්ඤා, තීරණ පරිඤ්ඤා, පහාන පරිඤ්ඤා යයි මෙහි පරිඤ්ඤා තුනක් ලබයි. ලෝකෝත්තර ධර්මවල පරිඤ්ඤා නම් නැත. එහෙයින් මෙහි සත්‍ය දෙකක් ගන්නා ලදී.

එහි දුක්ඛ සච්චං පරිජානාති ඤාත තීරණ පරිඤ්ඤා වශයෙන් කියන ලදී. සමුදය සච්චං පජහති ඤාත පහාන පරිඤ්ඤා වශයෙනි. මෙසේ මේ පරිඤ්ඤා වශයෙන් සියළු පදවල අර්ථය දතයුතුය.

**සච්ච යමක වර්ණනාව නිමි.**

# සංඛාර යමක අර්ථ වර්ණනාව

දැන් ඒ මූල යමකයෙහි ම දේශිත කුසලාදි ධර්මයන්ගේ ලැබීම් වශයෙන් ඒක දේශයක් සංග්‍රහකොට සච්ච යමකයට අනතුරුව දේශනා කළ සංඛාර යමක වර්ණනාව වේ. එහි ද යට කියන ලද නයින්ම පණ්ණත්තිවාරාදි මහාවාර තුණ ද අන්තර වාරාදිය ද අවසේස ප්‍රභේද ද දතයුතුය. මෙය එහි විශේෂයකි. පණ්ණත්තිවාරයෙහි පළමුව යට යම්සේ ඛන්ධාදි ධර්ම උද්දේස කොට, රූපං රූපක්ඛන්ධො, චක්ඛු චක්ඛායතනං, චක්ඛු චක්ඛුධාතු, දුක්ඛං දුක්ඛසච්චං යයි පදසෝධන වාරය ආරම්භ කරන ලදී. එසේ ආරම්භ නොකොට අස්සාසපස්සාසා කාය සංඛාරො යයි පළමුව සංඛාර තුනම බෙදා දක්වන ලදී. එහි කයේ සංඛාර කාය සංඛාර වේ. ආශ්වාස ප්‍රශ්වාස කායිකය. මේ ධර්ම කාය හා ප්‍රතිබද්ධ යයි වචන හෙයින් හේතු වූ කරජකායේ ඵල වූයේ සංඛාර යයි කාය සංඛාර වේ. තවද ක්‍රමයක්:- රැස් කෙරේය යනු සංඛාර වේ. කුමකින් රැස් කෙරේද? කයින්. මෙය භස්ත්‍රාවෙන් වායුව මෙන් කරජකයින් සංචේරීයති. මෙසේද කයේ සංඛාර කාය සංඛාර වේ. කයින් කළ ආශ්වාස ප්‍රශ්වාස වාතය යන අර්ථයයි. ඇවැත්ති විසාඛ, පෙරම විතර්ක කොට විචාරා පසුව වචනය බිඳී. එහෙයින් විතක්ක විචාර වචී සංඛාර යයි වචන හෙයින් සංඛාර යයි සංඛාර වේ. කුමක් පිළියෙළ කරයිද? වචනය. වචනයෙන් පිළියෙළ කෙරේ යනු වචීසංඛාර වේ. වචීභේදයෙන් හටගත් විතක්ක විචාර දෙකට

මෙය නමකි. සඤ්ඤාවද චේතනාවද චෛතසික වේ. මේ ධර්ම චිත්ත ප්‍රතිබද්ධ වේයයි වචනයෙන්ම වනාහි තුන්වන පදයෙහිද සංස්කරණය කෙරේනුයි සංඛාර වේ. කුමකින් සංස්කරණය කෙරේද? සිතින්. කරණාර්ථයෙනි. සාමි (ෂට්ඨී) වචනය කොට සිතේ සංඛාර චිත්ත සංඛාර වේ. සිතෙන් හටගන්නා සියළුම චෛතසික ධර්මවලට මෙය පර්යාය වචනයකි. විතක්ක විචාර වනාහි වචීසංඛාර භාවයෙන් වෙනම ගත් බැවින් විතර්කය හැර විචාරයෙහි යයි කියන ලදී.

දැන් කායො කායසංඛාරො යයි පදසොධනවාරය අරඹන ලදී. එහි අනුලෝම නයෙහි තුනකි. පටිලෝම නයෙහි තුනක් යයි යමක සයකි. පදසෝධන මූලචක්ක වාරයෙහි එක එක සංඛාර මූලකවල දෙක දෙක කොට අනුලෝම නයෙහි සයකි. පටිලෝම නයෙහි සය යයි යමක දොළොසක් වේ. සුද්ධ සංඛාර වාරයෙහි වනාහි සුද්ධ ඛන්ධවාරාදියෙහි මෙන් 'රූපං ඛන්ධො ඛන්ධා රූපං චක්ඛු ආයතනං ආයතනා චක්ඛු' යනාදි නයින් යමක කියන ලදී. මෙසේ කායො සංඛාරො, සංඛාරො කායො යයි නොකියා කාය සංඛාරො වචී සංඛාරො වචී සංඛාරො කාය සංඛාරො යනාදි නයින් කාය සංඛාර මූලක දෙකකි. වචීසංඛාර මූලක එකක් යයි අනුලෝමයේ තුනකි. පටිලෝමයේ තුනක් යයි සුද්ධික වාරයෙහි සියල්ල යමක හයක් කියන ලදී. කුමක් නිසාද? සුද්ධික එක් එක් පද වශයෙන් අර්ථ අභාවයෙන්. ඛන්ධ යමකාදියෙහි මෙන් රූපාදි විශිෂ්ඨ ස්කන්ධයන්ගේ චක්ඛු ආදි විශිෂ්ඨ ආයතන ආදීන්ගේ අභිප්‍රේත බැවින් රූපං ඛන්ධො ඛන්ධා රූපං චක්ඛු ආයතනං ආයතනා චක්ඛු යයි සුද්ධික එක් එක් පද වශයෙන් අර්ථ ඇත. එසේම මෙහි කායො සංඛාරො, සංඛාරො කායො නැත. කාය සංඛාරො යයි පද දෙකම එක අර්ථයක් ලබයි. ආශ්වාස හෝ ප්‍රශ්වාසය හෝ යයි සුද්ධික එක එක පද වශයෙන් අර්ථය අභාවයෙන් කායො සංඛාරො සංඛාරො කායො යයි නොකියන ලදී. කායො කායො සංඛාරො යයි ආදිය වනාහි කිවයුතු වන්නේ ය. එය ද කාය වචී චිත්ත පදවලින් මෙහි අදහස් වන සංඛාරයන්ගේ නො ගන්නා ලද බැවින් නොයෙදේ. මෙය සුද්ධ සංඛාරවාරය වේ. පදසෝධනයෙහි වනාහි අර්ථය හැර වචන යෙදේ යයි එහි ඒ නය ගන්නා ලදී. මෙහි වනාහි කාය සංඛාරයට වචී සංඛාරාදියෙන් වචී සංඛාරයට චිත්ත සංඛාරාදියෙන් චිත්ත සංඛාරයට කාය සංඛාරාදියෙන් අතිකක් බැවින් කාය සංඛාර වචී සංඛාර, වචී සංඛාර කාය සංඛාර යයි එක් එක් සංඛාර මූලකවල දෙක බැගින් යමක හයක් යෙදේ. ඒවායේ අගහිත ගහණයෙන් තුනක්ම ලැබේ. එහෙයින්

ඒවාම දැක්වීමට අනුලෝම නයෙහි තුනක් ද පටිලෝම නයෙහි තුනක්දැයි යමක හයක් කියන ලදී. සුද්ධ සංඛාර මූලචක්කවාරය වනාහි නොගන්නා ලදී. මෙසේ පණ්ණත්ති වාරයේ උද්දේසවාරය දතයුතුය. මෙහි නිද්දේස වාරයෙහි වනාහි පළමුව අනුලෝමයෙහි යම්හෙයකින් කායාදිය කාය සංඛාරාදිය නම් නොවේ. එහෙයින් **නො** යයි ප්‍රතිසේධ කරන ලදී. පටිලෝමයෙහි **න කායො න කාය සංඛාරො** යයි යමක් කාය නොවේද, එය කාය සංඛාර නොවේදැයි අසයි. **කාය සංඛාරො නකායො කාය සංඛාරො** යයි කාය සංඛාර කාය නොවේ. එය කාය සංඛාරම වේයයි අර්ථය වේ. **අවසෙසං** හුදෙක් සෙසු සංඛාර දෙක නොවේ. කාය සංඛාර විනිර්මුක්තය වනාහි සෙසු සියළු සංඛත සංඛත පණ්ණත්ති භේද ධර්මජාතය කාය නොවේ. කාය සංඛාර නොවේ යයි මේ උපායෙන් සියළු විසඳුම්වල අර්ථය දතයුතුය.

පණ්ණත්තිවාර වර්ණනාව නිමි.

මෙහි පවත්ති වාරයෙහි වනාහි වර්තමාන කාල පුග්ගලවාර අනුලෝම නයෙහි **යස්ස කාය සංඛාරො උප්පජ්ජති තස්ස වචී සංඛාරො උප්පජ්ජති** යයි කාය සංඛාර මූලක දෙකකි. වචීසංඛාර මූලක එකකැයි යමක තුනක් ලබයි. ඒවා ගන්නා ලදී. එහි පටිලෝම නයෙහි ඔකාසවාරාදියෙහි ද මෙම නයම වේ. මෙසේ මෙහි සියළු වාරවල යමක තුන තුන වශයෙන් යමක ගණන දතයුතුය.

මෙහි අර්ථ විනිශ්චයෙහි වනාහි මේ ලක්ෂණය වේ. මේ සංඛාර යමකයෙහි **අස්සාස පස්සාසානං උප්පාදක්ඛණෙ විතක්ක විචාරානං උප්පාදක්ඛණෙ** යනාදි වචනයෙන් වර්තමාන ආදි කාලභේදය පැවතීම් වසයෙන් ද ගතයුතුය. චුති පටිසන්ධි වශයෙන් නොවේ. **දුතියජ්ඣානෙ තතියජ්ඣානෙ තත්‍ථ කාය සංඛාරො උප්පජ්ජති** ආදි වචන බැවින් ද ධ්‍යාන ද ඔකාස වශයෙන් ගන්නා ලදැයි දතයුතුය. මෙසේ මෙහි යමක් ලබාද ඒ ඒ වශයෙන් අර්ථ විනිශ්චය දතයුතුය.

එහි නය මුඛය මෙසේය:- **විනා විතක්ක විචාරෙහි** දුතිය තතිය ජ්ඣාන වශයෙන් කියන ලදී. **තෙසං** ඒ දුතිය තතියජ්ඣාන සමග **කාමාවචරානං** යයි කාමාවචරයෙහි උපන් සත්ත්වයන්ගේ. රූපාවචර

දෙවියන්ගේ වනාහි ආශ්වාස ප්‍රශ්වාස නැත. අරූපාවචරයන්ගේ රූපයම නැත. **විනා අස්සාස පස්සාසෙහි** යයි රූප අරූප භවවල උපන් සතුන්ගේ විතක්ක විචාර ඉපදීම සඳහා කියන ලදී. **පඨමජ්ඣානෙ කාමාවචරෙ** යයි කාමාවචර භූමියෙහි උපන් ප්‍රථම ධ්‍යානයෙහි. මෙහි අංග පමණක් ප්‍රථමධ්‍යානය ගතයුතුය. අර්පණා වශයෙන් නොවේ. අර්පණාවට නොපැමිණියහු විසින්ද සවිතක්කස විචාර සිතේ මේ සංඛාර දෙක උපදවනු ලැබේමය. **විතක්කස්ස භංගක්ඛණෙ** යන මේ කාය සංඛාර ඒකාන්ත චිත්ත සමුට්ඨානය බැවින් කියන ලද සිත උපදින්නේ, රූපය හෝ අරූපය හෝ උපදවයි. බිඳෙමින් නොවේ. **සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ** පටිසන්ධියෙන් දෙවන භවාංග සිතේ මෙය ඒකාන්තයෙන් පටිසන්ධි සිත ද පවතින කල්හි එහි නූපදියි. යම්තාක් අමිශ්‍ර විපාක සිත පවතීද ඒතාක් නූපදින්නේ නමැයි දැක්වීම සඳහා මෙය කියන ලදී. යම් ධ්‍යානයක විපාක සිතින් මිදුනු ඉපදුනහ. එය සියයකින් ද දහසකින් ද ඉපදෙන්නේ පළමු සිතමය. විපාක සිතින් වනාහි විසදෑම වූ භව ආශාවෙන් ආවර්ජන සිත දෙවන සිත නම් වේ. එය සඳහා කියන ලදැයි දතයුතුය.

**පච්ඡිමචිත්තසමංගීනං** සියල්ලටම පසුව පටිසන්ධි නොවූන සිතින් යුක්ත වූ ක්ෂීණාශ්‍රවයන්ගේ. **අවිතක්ක අවිචාර පච්ඡිම චිත්තං** රූපාවචර ද්විතීය ධ්‍යානිකාදී චුති සිත වශයෙන් අරූපාවචරයින්ගේ චතුර්ථධ්‍යානික චුති සිත වශයෙන් මෙය කියන ලදී. **තෙසං** ඒ පශ්චිම සිතෙන් යුක්ත වූවන්ගේ. **යස්ස කාය සංඛාරො නිරුජ්ඣති තස්ස චිත්ත සංඛාරො නිරුජ්ඣති** මෙහි නිමයෙන් කාය සංඛාරයේ චිත්ත සංඛාරය සමග එක් ක්ෂණයෙහි නිරුද්ධ වීමෙන්. **ආමන්තා** යයි ප්‍රතිවචන දෙන ලදී. චිත්ත සංඛාරය කාය සංඛාරය සමග නිරුද්ධ නොවේ. කුමක් නිසාද? චිත්ත සංඛාරය වනාහි කාය සංඛාරය නැතුවද උපදී. නිරුද්ධ වේ. කාය සංඛාරය වනාහි සිතෙන් උපදවන ආශ්වාස ප්‍රශ්වාස වාතයෙන් යුක්ත වේ. චිත්ත සමුට්ඨාන රූප ද සිත උපදිනවිට ඉපදී අන් සොළොස් සිත් ඉපදෙන තුරු සිටී. ඒ සොළොස් සිත්වල සියල්ලට පසු සිත සමග නිරුද්ධ වේ. යම් සිතක් සම උපදීද එතැන් පටන් දාසත්වන සිත සමග නිරුද්ධ වේ. සිසි සිතක උප්පාද ක්ෂණයෙහි හෝ ඨිති ක්ෂණයෙහි නිරුද්ධ නොවේ. ඨිති ක්ෂණයෙහි හෝ භංග ක්ෂණයෙහි හෝ නූපදී. මෙය චිත්ත සමුට්ඨානික රූපවල ධර්මතාවයයි නියමයෙන් චිත්ත සංඛාර සමග ඒක ක්ෂණයෙහි නිරුද්ධවීමෙන් ආමන්තා යයි කියන ලදී.

යම්සේ විභංගප්පකරණයේ සිංහල අටුවා කථාවෙහි සිතින් උපදවන රූප (චිත්ත සමුට්ඨාන රූප) දාහතරවන සිතේ උප්පාද ක්ෂණයෙහි නිරුද්ධ වේයයි කියන ලදී. එය මේ පෙළට විරුද්ධය. අටුවාවෙන් ද පෙළම බලවත් යයි පෙළෙහි කියන ලදමය. ප්‍රමාණ වේ. **යස්ස කාය සංඛාරො උප්පජ්ජති තස්ස වචී සංඛාරො නිරුජ්ඣති** මෙහි යම්හෙයකින් කාය සංඛාරය සිතේ උප්පාද ක්ෂණයෙහි උපදී. ඒ ක්ෂණයෙහි විතක්ක විචාර නිරුද්ධ නොවේ. එහෙයින් නො යයි ප්‍රතිසේධය කරන ලදී. මේ නය මුඛයෙන් සියළු තැන අර්ථ විනිශ්චය දතයුතුය. පරිඤ්ඤා වාරය මුලින් කියන ලද්ද සේය.

**සංඛාර යමක වර්ණනාව නිමි.**

# අනුසය යමක අර්ථ වර්ණනාව

දැන් ඒ මූල යමකයෙහි දේශනා කරන ලද කුසලාදි ධර්මයන්ගේ ලැබීම් වශයෙන් ඒක දේශයක් සංග්‍රහකොට සංඛාර යමකවලට අනතුරුව දේශනා කළ අනුශය යමකයේ අර්ථ වර්ණනාව වේ. එහි මුලින් පෙළෙහි නියමය දතයුතුය. මේ අනුශය යමකයෙහි ඛන්ධ යමකාදියෙහි මෙන් දේශනා නොකොට වෙනත් නයකින් පෙළෙහි දේශනාව කරන ලදී. කෙසේද? පළමුව පරිච්ඡේද වශයෙන්, උද්දේස වශයෙන්, උප්පත්ත ස්ථාන වශයෙන් යයි තුන් ආකාරයකින් අනුශයන් ගැන්වීමට පරිච්ඡේද වාරය, පරිච්ඡින්නුද්දෙසවාරය, උප්පත්තට්ඨානවාරය යයි වාර තුනක් දේශනා කරන ලදී. එයින් මහාවාර හතක් වශයෙන් අනුශයන් යොදා යමක දේශනාව කරන ලදී. ඒවායින් මේ නම් අනුශය වාර, සානුශය වාර, පජහන වාර, පරිඤ්ඤා වාර පහීන වාර උප්පජ්ජනවාර, ධාතුවාරයයි වේ. ඒවායින් පළමුව අනුශය වාරය වේ. එය අනුලෝම පටිලෝම වශයෙන් ද්විධ වේ. එහි අනුලෝම නයෙහි 'යස්ස අනුසෙති, යත්ථ අනුසෙති, යස්ස යත්ථ අනුසෙති' යයි පුග්ගල ඕකාස ඒ දෙක වශයෙන් අන්තරවාර තුනක් වේ. ඒවායින් පළමුව පුග්ගල වාරයෙහි යමෙකුගේ කාමරාග අනුසය අත්නොහැර පවතී ද ඔහුගේ පටිසානුසය ද අත්නොහැර පවතී. යමෙකුගේ වනාහි පටිඝ අනුසය අත්නොහැර පවතීද ඔහුගේ කාමරාග අනුසයද අත්නොහැර පවතී. යමෙකුගේ කාමරාග අනුසය අත්නොහැර පවතීද

ඔහුගේ මාන අනුසය, දිට්ඨි අනුසය, විචිකිච්ඡා අනුසය, භවරාග අනුසය, අවිජ්ජා අනුසය අත්නොහැර පවතී. යමෙකුගේ වනාහි අවිජ්ජා අනුසය අත්නොහැර පවතීද ඔහුගේ කාමරාග අනුසය අත්නොහැර පවතී යයි කාමරාගානුසය මූලක යමක හයක් වේ. නැවත අගහිත ගහණ වශයෙන් පටිඝ අනුසය මූලක පහකි. මාන අනුසය මූලක සතරකි. දිට්ඨි අනුසය මූලක තුනකි. විචිකිච්ඡා අනුසය මූලක දෙකකි. භවරාග අනුසය මූලක එකක් යයි මෙසේ සියල්ල ඒක මූලක එක්විස්සක් වේ. නැවත යමෙකුට කාමරාග අනුසය ද පටිඝ අනුසය ද අත්නොහැර පවතීදැයි මෙසේ ආවා වූ දුක මූලක පහකි. තික මූලක හතරකි. චතුක්කමූලක තුනකි. පංචමූලක දෙකකි. ඡක්කමූලක එකකැයි තවත් පහළොවක් වේ. ඒවා පෙර එක්විස්ස සම තිස්හයක් වේ. පුග්ගල වාරයෙහි යමක තිස්හයක් වේ. එසේම ඕකාස වාරයෙහි ද, පුග්ගලොකාස වාරයෙහිදැයි අනුලෝම නයෙහි යමක සියල්ල එක්සිය අටක් වේ. පටිලෝම වාරයෙහි ද එසේ වේ. එසේ යමක දෙසිය දහසයක් වේ. එයින් දෙගුණය පුච්ඡා වේ. එයින් දෙගුණය අර්ථය වේයයි දතයුතුය. මෙහි යම්සේ මෙසේ සානුසය වාරය, පජහන වාරය, පරිඤ්ඤා වාරය, පහීන වාරය, උප්පජ්ජන වාරය යයි මේ පස්වාරයෙහි ද එක එකෙහි යමක ගණන, යමක දිගුණව පුච්ඡා, පුච්ඡා දිගුණව අර්ථ දතයුතුය. මෙහි මේ වනාහි පළමු තුන්වාරයෙහි විශේෂයකි. ඕකාස වාරයෙහි යත්‍ථ යත්‍ථ යයි නොකියා යතො තතො තතො යයි නිස්සක්ක (පංචමී) වචනයෙන් දේශනාව කරන ලදී. සෙස්ස ද එබඳු වේ. මේ සියල්ලට පසුව වූ ධාතුවාරය වේ. එය පුච්ඡාවාර විසජ්ජන වාර යයි ද්විධ වේ. ඒ පුච්ඡාවාරයෙහි කාමධාතුවෙන් චුත වූ කාමධාතුවේ උපදින්නකුට නේ යයි කියා, කාමධාතුවේ හෝ උපදින්නාට කාමධාතුවෙන් චුතවන්නා යයි නොකියන ලදී. කුමන කරුණක් නිසාද? අර්ථ විශේෂ අභාවයෙන් මේ පුච්ඡා දෙකම එකම අර්ථ වේ. එහෙයින් එක එකේ යමක එක එකේම ප්‍රශ්න අසා සියළු පුච්ඡා අවසානයෙහි පුච්ඡා අනුක්‍රමයෙන් ම කාමධාතුවෙන් චුත වූවහුගේ කාමධාතුවේ උපදින්නන්ගේ කිසිවෙකුගේ අනුසය සත අත්නොහැර පවතී යයි ආදි නයින් විසඳීම කරන ලදී. එහි කම් ධාතුවෙන් චුතවන්නාගේ කාමධාතුවේ උපදින්නාගේ රූපධාතුව, අරූපධාතුව කාමධාතු නොවේ. රූපධාතු නොවේ. අරූපධාතු නොවේ. උපදින්නාගේ සුද්ධික පුච්ඡා සය, කාමධාතු නොවේ. අරූපධාතු නොවේ. රූපධාතු නොවේ. අරූපධාතු නොවේ. කාමධාතු නොවේ. රූපධාතු නොවේ. උපදින්නාගේ යයි තුනයි. මිශ්‍රක පුච්ඡා යයි කාමධාතු මූලක අනුලෝම පුච්ඡා නවයක් වේ. එසේම රූපධාතු මූලක නවයකි.

අරූපධාතු මූලක නවයකැයි අනුලෝම පුච්ඡා විසිහතක් වේ. එසේම කාමධාතු නොවේ. රූපධාතු නොවේ. අරූපධාතු නොවේ. අරූපධාතු නොවන පටිලෝම පුච්ඡා විසිහතකි. නැවත කාමධාතු නොවේ. අරූපධාතු නොවේ. රූපධාතු නොවේ. අරූපධාතුවේ නොවේ. කාමධාතුවේ නොවේ. රූපධාතුවේ නොවේ යයි දුක මූලක පුච්ඡා විසිහතකි. සියල්ල පිඬු කළවිට පුච්ඡා අසූඑකක් වේ. ඒවායේ වශයෙන් මෙහි විසඳීම කරන ලදී. මෙය ධාතුවාරයෙහි පෙළෙහි නියමයයි. මෙසේ සියළුම අනුශය යමකයෙහි මේ පෙළෙහි නියමය දතයුතුය.

මුලසිට මෙහි යමක් නොකියන ලද නම් එහි මේ විනිශ්චය කථාවයි. **අනුසයා** කුමන අර්ථයකින් අනුශය වේද? ප්‍රහීන නොවූ අර්ථයෙන්. අප්‍රහීනාර්ථයෙන් මේවා ඒ ඒ සන්තාන අත්නොහැර පවතී. එහෙයින් අනුශයයි කියනු ලැබේ. **අනුසෙනති** අනුරූප කරුණක් ලැබ උපදී යන අර්ථයයි. තවද අනුශයාර්ථ නම් අප්‍රහීන ආකාර වන්නේය. අප්‍රහීන ආකාරයද ඉපදීම යයි කීමට නොයෙදේ. එහෙයින් අනුශය නූපදීද? ඊට ප්‍රතිවචන මෙසේය. අප්‍රහීනාකර අනුශය වනාහි අප්‍රහීන අර්ථයෙන් බලවත් වූ කෙලෙස් කියනු ලැබේ. එය සිත හා යුක්ත වූයේ අරමුණු සහිත වූයේ ප්‍රත්‍ය ලැබ සහේතුක වූ ඒකාන්ත කුසලයක් අතීතයේ විය. අනාගතයේද වේ. එහෙයින් උපදී යයි කීමට යෙදේ. එහි ප්‍රමාණය මෙසේය. අභිධර්මයෙහි කථා වස්තුවේ අනුශය කියන ලදී. අහේතුක අනුශය, චිත්ත විප්‍රයුක්ත අනුශය යයි සියළු වාද ප්‍රතිසේධිතය. පටිසම්භිදා මාර්ගයෙහි වර්තමානයෙහි කෙලෙසුන් දුරු කෙරේ යයි ප්‍රශ්න කොට අනුශය වර්තමානයේ ඇති බව බලවත් අනුශය දුරු කෙරේ යයි කියන ලදී. ධම්ම සංගණියේ මෝහ පදභාජනයෙහි අවිජ්ජා අනුශය අවිජ්ජා පරියුට්ඨානය (නැගිටීම) අවිජ්ජා ඇලීම මෝහය අකුසල මූලයකි. ඒ අවස්ථාවේ මේ මෝහය වේ යයි අකුසල සිත සමග අවිද්‍යානුශයේ උපන් බව කියන ලදී. මේ අනුශය යමකයෙහි සත්මහා වැර අතුරෙන් යමක උපන් වාරයෙහි යමෙකුට කාමරාග අනුශය උපදීද ඔහුට පටිඝානුසය උපදී යයි යනාදිය කියන ලදී. එහෙයින් අත්නොහරී යයි අනුරූප කාරණයක් ලැබ උපදී යයි යමක් කියන ලදද එය මේ පෙළෙහි ප්‍රමාණයෙන් මනාව කියන ලදැයි දතයුතුය. යමක් චිත්ත සම්ප්‍රයුක්ත ද අරමුණු සහිතයයි ආදිය කියන ලදී. අකුසල ධර්මය යයි මෙහි නිෂ්ඨාවට යා යුතුය. **කාමරාගානුදොසයො** යනාදියෙහි කාමරාගය ද එය අප්‍රහීන බැවින් අනුශය යයි කාමරාගානුසය වේ. සෙසු පදවලද මෙම නයයි.

දැන් ඒවායේ උත්පත්ති ස්ථාන පැවසීමට කාමරාග අනුසය කොහේ වැතිර සිටීද? යනාදිය කීහ. එහි කාමධාතුවෙහි වේදනා දෙකකය. කාමාවචර භූමියෙහි සැප සහ මැදහත් යන වේදනා දෙකෙහි. **එත්ථ කාමරාගානුසයො අනුසෙති** මෙම වේදනා දෙකෙහි උපදී. එය වනාහි මේ අකුසල වේදනාවල සහජාත වශයෙන් හා අරමුණු වශයෙන්දැයි දෙයාකාරයකින් අත්නොහැර පවතී. අකුසල්වල සැප වේදනාවේද මැදහත් වේදනාවේද එකට උපදී. ඒ වේදනා අරමුණු කොට උපදී යන අර්ථයයි. අවසේස කාමාවචර කුසල විපාක කිරිය වේදනා අරමුණු කොට උපදී. කාමධාතුවෙහි වේදනා දෙකක අත් නොහැර පවතින්නා වූ මෙය ඒ වේදනා හා සම්ප්‍රයුක්ත වූ සඤ්ඤා සංඛාර විඤ්ඤාණවලද අත්නොහැර පවතීමය. වේදනාවල අත්නොහැර පැවතීමෙන් එය හා යුක්ත වූ සංඥාදිය සමග සහජාත නොවී හෝ පැවතීමට නොහැකි වේ. එය හා යුක්ත වූ සංඥාදිය හෝ අරමුණු නොකොට ඉපදීමට නොහැකි වේ. මෙසේ ඇතිකල්හි වනාහි යම්හෙයකින් මේ වේදනා දෙකම මිහිරි අන්ත සැප අන්ත ආශ්වාදන අර්ථයෙන් කාමරාග අප්‍රාසයේ උපතින් සෙසු සම්ප්‍රයුක්ත ධර්මවල ප්‍රධාන වේ. එහෙයින් වේදනා දෙකෙහි කාමරාග අනුසය අත්නොහැර පවතී යයි කියන ලදී. ඕළාරික වශයෙන් අවබෝධ කළයුත්තන්ට පහසුවෙන් අවබෝධ කරවති. මෙය අරමුණු වශයෙන් අත්නොහැර පවතින්නේ හුදෙක් මේ වේදනා දෙකෙහි ද වේදනා සම්ප්‍රයුක්ත ධර්මවල ද අත්නොහැර පවතී. ඉෂ්ඨ රූපාදියෙහි ද අත්නොහැර පවතීමය. විභංග ප්‍රකරණයෙහි මෙය කියන ලදී. 'ලෝකයෙහි ප්‍රිය රූප වූ මිහිරි රූප වූ යමක් වේද, එහි සත්ත්වයින්ගේ කාමරාග අනුශය අත්නොහැර පවතී. මේ ප්‍රකරණයෙහි ම අනුශයවාර පටිලෝම නයෙහි කියන ලදඃ- යම්තැනක කාමරාග අනුශය අත්හැර පවතීද එතැන දිට්ඨි අනුශය අත්හැර පවතී. දුක් වේදනාවෙන් රූපධාතුවේ අරූප ධාතුවේ යන මෙහි ද කාමරාග අනුශය අත්හැර පවතී. දිට්ඨානුශයද එහි නොපවතී. අපරියාපන්න වශයෙන් මෙහි කාමරාග අනුශය ද නොපවතී. දිට්ඨානුශයද නොපවතී යයි මෙහි දුක්ඛ වේදනාවද රූපධාතු ආදියෙහි නොපවතී යයි කියන ලද බැවින් සම්ප්‍රයුක්ත ධර්ම වූ දුක්ඛ වේදනාව ඕකාස සහිත වූ රූපාවචර ධර්මයෙන්ද ලෝකෝත්තර ධර්මය හැර අවසේස රූප සද්දගන්ධ රස ස්පර්ශවල පවතී යයි කියන ලද්දේ වේ. එය මෙහි කුමක්හෙයින් නොකියන ලදද? ඕළාරික නොවන බැවිනි. යට කියන ලද නයින් වේදනාවම ඕළාරික බැවින් මෙයද ඕළාරික නොවේ. මේ රූපාදියෙහි පවතීයයි නොකියන ලදී. අර්ථ වශයෙන් වනාහි ලබයි. එහෙයින් මේවායෙහි ද කාමරාග

අනුශය පවතී යයි දතයුතුය. ශාස්තෲන් වහන්සේ සියල්ල සියළු තැන නො වදාළහ. අවබෝධ කළහැකි සත්ත්වයින්ගේ වශයෙන් කිසිතැනක යමක් ලබයි නම් ඒ සියල්ල වදාරති. කිසිතැනක නොවදාරති. එසේම මෙයින් දිට්ඨානුශය පවතීදැයි අසා සත්කාය ඇතුළත් සියළු ධර්මවල දිට්ඨානුශය පවතී යයි යමක් ලබාද ඒ සියල්ල වෙනත් තැනක විසඳමින් වදාරන ලදී. රූපධාතු අරූපධාතු යන මෙහි විචිකිච්ඡා අනුශයද මාන අනුශයද දිට්ඨි අනුශයද පවතී. කාමධාතුවේ වේදනා දෙකෙහිද ඉහත කී අනුශයන් පවතී. දුක්ඛ වේදනාවෙහි විචිකිච්ඡා අනුශය, පටිඝ අනුශය. දිට්ඨි අනුශය පවතී යයි යමක් ලබාද ඒ සියල්ල නොකියා රූපධාතු අරූප ධාතු සමග වේදනා තුන කියන ලදී. වේදනා සම්ප්‍රයුක්ත වනාහි අරූප ධර්ම සියල්ලද රූපයද නොකියන ලදී. කිසිවක් නොකියන ලදී. දිට්ඨි අනුශය මෙහි පවතී. එසේම රූපාදි ඉටු අරමුණෙහි කිසිවක් නොකියන ලදී. කාමරාග අනුශය මෙහි පවතීමය. මෙසේ කාමරාග අනුශයේ පවතින තැන් දතයුතුය.

පටිඝ අනුශය වනාහි දුක් වේදනාවේ වචනයෙන් දොම්නස් වේදනා දෙක, කාය විඤ්ඤාණ සම්ප්‍රයුක්ත දුක් වේදනාව යයි වේදනාව තුනෙහි පවතී. එය වනාහි මේ දොම්නස් වේදනා දෙකෙහි සහජාත වශයෙන් හා අරමුණු වශයෙන් යන දෙයාකාරයකින් පවතී. සෙසු දුක්වේදනාවල අරමුණු වශයෙන් පවතී. ඒ වේදනාවල පවතින්නේ ඒවා සමග සම්ප්‍රයුක්ත සංඥා ස්කන්ධාදියෙහි ද පවතීමය. යම් වේදනාවක් සමග මෙය සහජාත ද එය හා සම්ප්‍රයුක්ත සංඥාදියෙහි ද සහජාත වේ. යම් වේදනාවක් අරමුණු කෙරේ නම් එය හා සම්ප්‍රයුක්ත සංඥා ආදියද අරමුණු කෙරේ. මෙසේ පවතින කල්හි යම් දුක් වේදනාවක් අමිහිරි දුක් වේදනාදියක් බැවින් ආශ්වාද නොවන අර්ථයෙන් පටිඝ අනුශයේ ඉපදීමෙන් සෙසු සම්ප්‍රයුක්ත ධර්මවල අධිකව යෙදේ. එහෙයින් දුක්වේදනාවේ පටිඝ අනුශය පවතීයයි කියන ලදී. ඕළාරික වශයෙන් අවබෝධ කරන්නන්ට පහසුවෙන් අවබෝධ කරවීම සඳහාය. මේ දුක්වේදනාවල සහ එම සම්ප්‍රයුක්ත ධර්මවල පමණක් නොව අරමුණු වශයෙන් නොපවතින්නේ ද? අනිෂ්ට රූපාදියෙහි ද පවතීමය. විභංග ප්‍රකරණයෙහි කියන ලදී. ලෝකයෙහි යම් අප්‍රිය වූ අමිහිරි වූ රූපයක් වේද එහි සත්ත්වයින්ගේ පටිඝ අනුශය පවතී. මේ ප්‍රකරණයෙහිම අනුශය වාරයේ පටිලෝම නයෙහි කියන ලදී. කාමධාතුවේ වේදනා දෙකක පටිඝ අනුශය නොපවතී. එහි කාමරාග අනුශයද නොපවතී. එහි කාමාවචර වේදනාවල මෙන්ම රූපධාතුවල ද යන දෙකෙහි නොපවතී

යයි කියන ලද බැවින් සම්ප්‍රයුක්ත ධර්ම සහිත වේදනා දෙක ඕකාශයෙහි රූපාවචර අරූපාවචර ධර්ම නවය ද ලෝකෝත්තර ධර්මය හැර අවසේස රූපාදියෙහි පවතී යයි කියන ලද්දේ වේ. එය මෙහි කුමක් නිසා නොකියන ලදද? ඕළාරික නොවන බැවිනි. යට කියන ලද නයින් දුක් වේදනාවම ඕළාරික බැවින් මේවායේ වනාහි ඕළාරික නොවන බැවින් මේ රූපාදියෙහි පවතීම යයි දතයුතුය. ඉතිරි වේදනා දෙක ඉටු අරමුණ හෝ පටිසයේ අරමුණ කිම නොවේද? නොවන්නේ නොවේ. පිරිහුණු ධ්‍යානයේ විපිළිසර වශයෙන් සම්ප්‍රයුක්ත ධර්ම වූ ඒ වේදනා අරබයා දොම්නස උපදී. ඉටු අරමුණේ ද ලැබූ විපරිණාමය හෝ නොලද අලාභයේ හෝ සිහිකරන්නාට දොම්නස උපදී. එය දොම්නස් මාත්‍රයක් පමණක් වේ. පටිස අනුශය නොවේ. පටිසානුශය වනාහි අනිටු අරමුණෙහි හැපීම් වශයෙන් උපන්නේ බලවත් වූ ක්ලේශයකි. එහෙයින් මෙහි දොම්නස සමග පටිසය උපන්නේ ද තමාගේ පටිස කිස නොකරන බැවින්ම පටිස අනුශය නොවේ. අව්‍යවහාර බවට පැමිණේ. පාණාතිපාත චේතනාව සමග උපන් ව්‍යාපාදය මනෝකර්ම නම් නොවන්නා සේ අව්‍යවහාරයට පැමිණේ. මෙසේ පටිසානුශය නොවේ. අව්‍යවහාර බවම යයි. මෙය කියන ලදී. එක් ඉටු අරමුණක් නෙක්ඛම්ම සිතද හෝ දොම්නස සඳහා 'යම් එබඳු වූ දොම්නස් පටිසය එයින් දුරු කෙරේ, එහි පටිස අනුශය නොවේ' යයි මෙසේ පටිසානුශයේ අනුශය නැතිවීම දතයුතුය.

මානානුශය වනාහි කාමධාතුවේ වේදනා දෙකක යයි ආදි වචනයෙන් කාමාවචර වේදනා දෙකය. රූපධාතුව යයි මේ ස්ථාන තුන අනුශය ස්ථාන වේ. ඒ අකුසල වේදනාවල කාම රාගානුශය මෙන් සහජාත අනුශය බව දතයුතුය. සම්ප්‍රයුක්ත ධර්මවල වනාහි සියළු කාමාවචර සැප දුක් උපේක්ෂා වේදනාවල රූපාරූප ධාතුවලද අරමුණු වශයෙන් පවතී. අනුශය වාර පටිලෝම නයෙහි දුක් වේදනාවට ඇතුළත් නොවූ එහි කාමරාග අනුශයද මානානුශය ද නොපවතී යයි කියූ බැවින් නවවිධ දුක් වේදනාවද ලෝකෝත්තර ධර්මයද හැර සෙසු රූපාරූප ධර්මවලද මෙය පවතීමය. මෙසේ මානානුශයේ අනුශය ස්ථාන දතයුතුය.

දිට්ඨානුශය විචිකිච්ඡානුසය වනාහි හුදෙක් ලෝකොත්තර ධර්මවල නොපවතී. ත්‍රෛභූමක සියල්ලෙහි වනාහි පවතීමය. එයින් කියන ලදී. 'සියළු සක්කායවල ඇතුළත් ධර්මවල දිට්ඨානුසය පවතී. විචිකිච්ඡානුසයද පවතී. එහි සබ්බකාය පරියාපන්නෙනසු සසරවට නිශ්‍රිතාර්ථයෙන් සක්කාය

ඇතුළත් සියළු ධර්මවල යයි අර්ථය වේ. එහි වනාහි මේ පස් චිත්තුප්පාදවල සහජාත අනුශය වශයෙන් පවතී. ඒවා වනාහි චිත්තුප්පාද පසෙහි අන්‍ය වූ හෝ ත්‍රෛභූමක ධර්ම අරබයා පවතින කාලයෙහි අරමුණු අනුශය වශයෙන් පවතී. මෙසේ දිට්ඨානුසය විචිකිච්ඡානුසයවල පවතින සඳහා දතයුතුය.

භවරාග අනුසය වනාහි දිට්ඨිවිප්පයුත්ත සතර සිත්වල ඉපදීමෙන් සහජාත අනුසය වශයෙන් කාමධාතුවේ වේදනා දෙකෙහි පවතී යයි කිවයුතු වන්නේය. කාමධාතුවෙහි වනාහි මේ වේදනා දෙක සමාන උපදින්නේ ද රූපාරූප ධර්මම ලබයි. කාමධාතුවට ඇතුළත් එකම ධර්මයකුදු අරමුණු නොකරයි. එහෙයින් අරමුණු නොකරයි. එහෙයින් අරමුණු අනුශය වශයෙන් නියමකොට රූපධාතුවෙහි අරූප ධාතුවෙහි භවරාග අනුශය පවතී යයි කියන ලදී. තවද මෙම රාගය නම් කාමරාග භවරාග වශයෙන් ද්විධය. එහි කාමරාගය කාමධාතුවේ. වේදනා දෙකෙහි පවතී යයි කියන ලදී. ඉදින් භවරාගයද කාමරාගය මෙන් මෙසේ කියන්නේය. කාමරාගය සමග දේශනා සංකීර්ණ මෙන් වන්නේ යයි රාග ක්ලේශය දෙකට බෙදී කාමරාගයෙන් භවරාගයට විශේෂ දර්ශනාර්ථයක්ද මෙසේ දේශනා කරන ලදී. මෙසේ භවරාගානුසයේ අනුශය ස්ථානය දතයුතුය.

අවිජ්ජානුසය සියළු ත්‍රෛභූමක ධර්මවල පවතී. එයින් කියන ලදී. 'සියළු සක්කායවලට ඇතුළත් ධර්මවල යන මෙහි අවිජ්ජා අනුසය පවතී' යයි දොළොස් චිත්තුප්පාදවල සහජාත අනුසය බව දතයුතුය. අරමුණු කිරීම් වශයෙන් වනාහි කිසිදු ත්‍රෛභූමක ධර්මයක් අරබයා නොපවතී. මෙසේ අවිජ්ජා අනුසයේ අනුසය (පවතින) ස්ථාන දතයුතුය. මේ පරිච්ඡේද වාර, පරිචඡිනනුද්දෙසවාර, උප්පත්තිට්ඨානවාර විනිශ්චය කළ විස්තර වේ.

සත්මහා වාරවල වනාහි පළමු අනුශය වාරයෙහි යමෙකුගේ කාමරාග අනුශය පවතීද ඔහුගේ පටිඝානුසය පවතී යයි ප්‍රතිවචන දෙන ලදී. එය වැරදියට දෙන ලදැයි හැඟේ. කුමක් හෙයින්ද? කාමරාග පටිඝයන්ගේ ඒකක්ෂණයෙහි නො උපදින බැවින්. යමෙකුගේ මනායතනය උපදී නම් ඔහුගේ ධම්මායතනය උපදීද එසේය. ආශ්වාස ප්‍රශ්වාසවල උපත් කෙරෙන ඔවුන්ගේ කාය සංඛාරය ද උපදී. වචී සංඛාරය ද උපදී

යනාදියෙහි මනායතන ධම්මායතන කාය සංඛාර වචී සංඛාර ද එක් ක්ෂණයෙහි උපදී. කාමරාග පටිඝ එසේ නොවේ. කාමරාගය ලෝභසහගත සිත් අටෙහි උපදී. පටිඝය දොම්නස් සිත් දෙකෙහි උපදී. ඒවායේ ඒකක්ෂණයෙහි ඉපදීමක් නැත. එහෙයින් මෙහි 'නො' යයි ප්‍රතිෂේධ කළයුතු වන්නේය. එය නොකොට වනාහි 'ආමනතා' යයි ප්‍රතිවචන දුන් බැවින් යට යමකයෙහි මෙන් මෙහි ක්ෂණ වර්තමාන වශයෙන් වර්තමාන ව්‍යවහාරය නොගෙන වෙන ආකාරයකින් ගතයුතුය. කෙසේද? අප්‍රහීන වශයෙන්. අප්‍රහීන බව සඳහා මෙය පවතී යයි වර්තමාන ව්‍යවහාරයෙහි කියන ලදී. ක්ෂණ පචචුපපනන භාවයෙන් නොවේ. යම්හෙයකින් අප්‍රහීන බව සඳහා කියන ලදී. එහෙයින් යමෙකුගේ කාමරාග අනුසය පවතීද ඔහුගේ පටිඝානුසය පවතීදැයි ඇසීමෙන් යමෙකුගෙ කාමරාග අනුසය අප්‍රහීන වූයේ අනුපප්‍රාප්ති ධර්මතා ඉදිරිපත් නොවේ. ඔහුගේ පටිඝානුසයද අප්‍රහීන යයි මෙසේ අර්ථ වේයයි දැකිය යුතුය. යම්හෙයකින් ඒවායින් යමෙකුගේ එකක් අප්‍රහීනද ඔහුගේ ඉතිරි ඒවාද අප්‍රහීනම වේ. එහෙයින් 'ආමනතා' යයි කියන ලදී. ඉදින් මෙසේ යමක් ඉහළ උපදින වාරයේ යමෙකුගේ කාමරාග අනුසය උපදීද ඔහුගේ පටිඝානුසය උපදීදැයි අසා 'ආමනතා' යයි කියන ලදී. එහි අර්ථය කෙසේ ගතයුතු වේද? එහි ද අප්‍රහීන වශයෙන් ම උත්පත්ති ප්‍රත්‍යය ඇතිකල්හි උපතින් නො වැලැක්වීම් වශයෙන් හෝ. චිත්ත කර්මාදිය අරඹා නිමානොවූ කර්මාන්ත ඇත්තේ චිත්‍ර කාරාදීහූ ඒ කර්මාන්තවල නොකරන ක්ෂණයෙහි ද මිතුරු සුහදයන් විසින් දුටු දුටු තැන්වල මේ දවස්වල කුමක් කරවුදැයි කියන ලදී. චිත්‍ර කර්මය කරමු. වඩුවැඩ කරමු යයි කියති. ඔව්හු ඒ අවස්ථාවේ (කළණයේ) කිසිවක් නොකරති. අවිච්ඡිනන කර්මාන්තභාවය වනාහි කළ ක්ෂණය ද කළයුතු කළණයද ගෙන කෙරෙතිම යයි වේ. එසේම යමෙකුගේ සන්තානයෙහි අනුසයෝ අප්‍රහීන ද යමෙකුගේ වනාහි හෝ ඔහුගේ සන්තානයෙහි උත්පත්ති ප්‍රත්‍ය ඇතිකල්හි උපත නොවලක්වන ලදී. එහි නූපදින ක්ෂණයෙහි ද ඉපදීමෙන් පෙරද කාල අතරෙහි ඉපදීමද ගෙන යමෙකුගේ කාමරාගානුසය උපදීද ඔහුගේ පටිඝානුසය ඉපදීම වේයයි මෙසේ අර්ථය දතයුතුය. මෙයින් පසුවද මෙබඳු වූ විසඳුම්වල මෙම නයම වේ. **නො ච තසස** මෙය අනාගාමීහුගේ කාමරාග ව්‍යාපාදවල ඉතිරි නැතිව ප්‍රහීන බව කියන ලදී. **තිණණං පුගගලානං** පුථුක්ජන, සෝවාන්, සකදාගාමි. **දවිනනං පුගගලානං** සෝවාන් සකදාගාමි දෙදෙනා පසුවද මෙබඳු රූප තැන්වල මෙම නයම වේ.

ඕකාස වාරයේ පළමු දෙවන පුච්ඡාවල යම්සේ කාමරාගානුසය කාමධාතුවේ (ලෝකයේ) වේදනා දෙකක පවතී. පටිඝානුසය දුක්වේදනාවේ. එහෙයින් 'නො' යයි ප්‍රතිසේධ කරන ලදී. තුන්වන පුච්ඡාවෙහි දෙකද කාමධාතුවේ වේදනා දෙකෙහි පැවතීමෙන්. **ආමන්තා** යයි ප්‍රතිවචනය දෙන ලදී. රූපධාතු අරූප ධාතු වනාහි මාන අනුසයේ කාමරාග අනුසය සමග අසාධාරණ උත්පත්ති ස්ථාන වේ. එහෙයින් **නො ච තත්‍ථ කාමරාගානුසයො** යයි කියන ලදී. මෙම නයින් සියල්ලේ උත්පත්ති ස්ථාන වාරය බලා සාධාරණ අසාධාරණ උත්පත්ති ස්ථාන දතයුතුය. දුක මූලක පුච්ඡාවෙහි යම්හෙයකින් කාමරාග පටිඝානුසය එක එක තැන්වල නූපදී. එක ධර්මයක් අරමුණු නො කරයි. එහෙයින් **නත්‍ථි** යයි ප්‍රතික්ෂෙප කරන ලදී. එහි අදහස් මෙසේය. යම්සේ මේ අනුසය දෙක පවතින්නේ නම් ඒ ස්ථානයම නැත. එහෙයින් මාන අනුසය පවතී යයි මේ පුච්ඡා අපුච්ඡා වේමය. (ඇසීමක් නොවේ යන අර්ථයයි.) අනිත් මෙබඳු රූප තැන්වල මෙම නයම වේ. පුග්ගල ඔකාස වාරයෙහි **චතුන්නං** පෘථග්ජන, සෝවාන්, සකදාගාමි, අනාගාමි පටිලෝම නයෙහි **යස්ස කාමරාගානුසයො නානුසෙති** මේ පුච්ඡාව අනාගාමියා ගෙන අසයි. **ද්විනනං පුග්ගලානං සබ්බත්‍ථ කාමරාගානුසයො නානුසසති** අනාගාමී, අරහතුන්ගේ. **කාමධාතුයා තීසු** වෙදනාසු වේදනාව ගැනීමෙන් වේදනා සම්ප්‍රයුක්තයන්ගේ ද ඒවායේ වස්තු අරමුණු ද යන සියළු කාමාවචර ධර්මවල ගැනීම දතයුතුය.

**මේ අනුසයවාර විනිශ්චය කථා නිමි.**

සානුසය වාරයෙහි වනාහි **කාමරාගානුසයෙන සානුසයො** යයි යම්සේ ඒකන්තරික ජරාදි රෝගයෙන් ආබාධිතව යම්තාක් ඒ රෝගයෙන් නොමිදේ ද ඒතාක් ඔහුගේ රෝගයේ අනුප්පත්ති ක්‍ෂණයෙහි ද රෝග සහිත වූයේ නම් වේ. මෙසේ කෙලෙස් සහිත වූ සසරගාමි සත්ත්වයාගේ ආර්ය මාර්ගයෙන් අනුසය ඉවත්කරන තුරු ඒ අනුසයන්ගේ උප්පත්ති ක්‍ෂණයෙහි ද සානුසයම නම් වේ. මෙබඳුරූප වූ සානුසය බව සඳහා ආමන්තා යයි කියන ලදී. මෙහි සෙස්ස අනුසයවාර හා සමාන වේ.

ඔකාස වාරයෙහි වනාහි **රූපධාතුයා අරූපධාතුයා එත්ථ මානානුසයෙන සානුසයො** යයි කියන ලද්දේ ඒ ධාතුවල පුද්ගලයාගේ අනුසය සහිත බව පෙනෙන්නේය. අනුසයේ උත්පත්ති ස්ථානය නො පෙනෙන්නේය. අනුසයේ උත්පත්ති ස්ථානය දැකීම සඳහා මේ වාරය අරඹන ලදී. එහෙයින් එයින් **මානානුසයෙන සානුසයො** යයි කියන ලදී. මෙසේ ඇතිකල්හි ඒ ධාතු දෙකින් උපන් මාන අනුසයෙන් සානුසය යයි අනුසයේ උපන් ස්ථානය දක්වන ලද්දේ වේ. මේ ප්‍රශ්නයේ අර්ථය නොකියන ලද කල්හි මුල් ප්‍රශ්නයේ අර්ථය ප්‍රකට නොවේ යයි පළමුව නොකියන ලදී. එහෙයින් එය මෙසේ දතයුතුය. **යතො කාමරාගානුසයෙන** යමකින් උපන් කාමරාගානුසයෙන් සානුසය වේ. කිම එය එයින් උපන් පටිඝ අනුසයෙන් ද සානුසය වේද? යම්හෙයකින් ඒ දෙක එකම තැනින් නූපදී. එහෙයින් **නො** යයි ප්‍රතිසෙධ කරන ලදී. අරහා **සබ්බත්‍ථා** සුදුසු සියළු ධර්මවල උපදින්නා විසින් කිසියම් අනුසයෙන් නිරනුසය වේ. මෙයින් අර්ථ වශයෙන් සියළු තැන්වල සත්තමී විභත්තියම යොදන ලදී. මෙම උපායෙන් සියළු අර්ථ විනිශ්වය දතයුතුය.

**සානුසය වාර කථා නිමි.**

දුරුකරන වාරයෙහි **පජහති** ඒ ඒ මගින් ප්‍රහාන පරිඤ්ඤා වශයෙන් දුරකරයි. ඉදිරියේ අනුත්පත්ති ධර්මතාවට පමුණුවයි. **ආමන්තා** යයි අනාගාමි මාර්ගස්ථයා සඳහා ප්‍රතිවචනයයි. **තදෙකට්ඨං පජහති** ප්‍රහානයෙහි කාෂ්ඨභාවය සඳහා කියන ලදී. **නො** යයි අරහත් මාර්ගස්ථාන සඳහා ප්‍රතිසේධය. **යතො කාමරාග අනුසයං පජහති** යමකින් ඉපදෙන කාමරාග අනුසය දුරුකරයි යන අර්ථය වේ. **අට්ඨමකො** අරහත් ඵලයේ සිට ප්‍රති ආරෝහන ගණනින් ගණන් ගන්නේ සෝවාන් මාර්ගස්ථයා අට්ඨමකු නම් වේ. දක්‍ෂිණෙය්‍ය ගණනින් රහතන් වහන්සේ අග්‍ර දකඛිණෙය්‍ය බැවින් පළමුවැන්නාය. අරහත්ත මාර්ගස්ථයා දෙවැන්නාය. අනාගාමි තුන්වැන්නාය. සෝවාන් මාර්ගස්ථයා අටවැන්නාය. හේ මෙහි අට්ඨමකයයි කියන ලදී. ඔහුට මේ නාම සංඥාවක් වේ. **අනාගාමි මගග සමංගිඤ්ච අට්ඨමකඤ්ච ඨපෙත්වා අවසෙසා** යයි පෘථග්ජනයා සමග සේක අසේකයෝ. ඔවුනතුරෙන් පෘථග්ජනයා ප්‍රහාන පරිඤ්ඤාව නොමැති වීමෙන් දුරු නොකරයි. සෙස්සෝ ඔවුන්ගේ අනුශායවල ප්‍රහීන බැවින්.

**දවිනනං මගග සමංගිනං** යුක්ත වූ මාර්ග දෙක හැර යන අර්ථයයි. මෙම නයින් සියළු තැන විනිශ්චය දතයුතුය.

**පජහනවාර කථා නිමි.**

පරිඤ්ඤාවාරයෙහි **පරිජානාති** යයි පරිඤ්ඤා තුනකින් දැනගනී. මෙහි සෙස්ස යට කියන ලද නයම වේ. මෙම වාරය ද වනාහි පජහන වාරය මෙන් මාර්ග ස්ථාන වශයෙන් ම විසඳන ලදී.

**පරිඤ්ඤාවාර කථා නිමි.**

ප්‍රහීන වාරයෙහි එලස්ථ වශයෙන් ම දේශනාව අරඹන ලදී. අනාගාමියාට මේ අනුශය දෙකම ප්‍රහීනය. එහෙයින් **ආමනතා** යයි කියන ලදී. ඕකාස වාරයෙහි **යත්ථ කාමරාගානුසයො පහීනො තත්ථ පටිසානුසයො පහීනොති පුච්ඡිත්වා න වතතබ්බො පහීනොති වා අපපහීනොති වා** යයි කියන ලදී. එය කුමක් නිසාද? උපන් ස්ථානයේ අසාධාරණ බැවිනි. කාමරාගානුසයේ උපන් තැන අන් තැනකය. පටිසානුසයේ අන්තැන්කය. අභාවිත මාර්ගයේ ද යම්තැන අනුසය උපදී. එහිම භාවිත මාර්ගයෙහි එය ප්‍රහීන නම් වේ.එ හි යම්හෙයකින් කාමරාග අනුසය ස්ථානයෙහි පටිසානුසය නො උපදී. පටිස අනුසය ස්ථානයෙහි කාමරාගානුසය නූපදී. එහෙයින් එහි එය ප්‍රහීන හෝ අප්‍රහීන හෝ යයි නොකිව යුතුය. එය තමාගේ උපන් ස්ථානයෙහි කාමරාග අනුසය ප්‍රහීන වේ. එහි අප්‍රහීන බැවින් එහි ප්‍රහීන යයි නොකිව යුතුය. කාමරාගානුසයේ උපන් ස්ථානය යම්තැනක ද එහි සිටි බැවින් එහි අප්‍රහීන යයි නොකිව යුතුය. **යත්ථ කාමරාගානුසයො පහීනො තත්ථ මානානුසයො පහීනොති** මෙහි වනාහි සාධාරණ ස්ථානයන් සඳහා **ආමනතා** යයි කියන ලදී. කාමරාගානුසය වනාහි කාම ධාතුවේ වේදනා දෙකක පවතී. මානානුසය ඒවායෙහි මෙන්ම රූපාරූප ධාතුවල (රූප අරූප ලෝක) ද පවතී. එය අසාධාරණ ස්ථාන හැර සාධාරණ ස්ථානයේ එය සමග ප්‍රහීන වේ. **එහෙයින් ආමනතා** යයි කියන ලදී. මෙම නයින් සියළු ඕකාස වාරයෙහි ප්‍රහීන බවද නොකිව යුතු බවද දතයුතුය. **නත්ථි** යයි ආ තැන්වල වනාහි යට කියන ලද සමානව විනිශ්චය වේ.

පුගගලොකාසවාරය ඔකාසවාර ගතිකම වේ. පටිලෝම නයෙහි **යසස කාමරාගානුසයො අපපහීනො** පුථුජ්ජන, සෝතාපන්න, සකදාගාමී වශයෙන් අසයි. මේ අනුසය දෙකම පෘථග්ජනයාගේ සිට අනාගාමී මාර්ගස්ථයා දක්වා පුද්ගලයන් සදෙනාගේ අප්‍රහීනය. මෙහි වනාහි අන්‍ය වූ 'පුද්ගලයන් තිදෙනාගේ, පුද්ගලයන් දෙදෙනාගේ' යන ආදි වචනයෙන් මාර්ගස්ථයා අදහස් නො කෙරේ. එහෙයින් පෘථග්ජන සෝවාන් සකෘදාගාමීන් සඳහා ආමනතා යයි කියන ලදී. **දවිනනං පුගගලානං** සෝවාන් සකදාගාමී දෙදෙනාගේ මෙම නයින් පුද්ගල වාරයෙහි විනිශ්චය දතයුතුය. ඔකාසවාර පුගගලොකාසවාර වනාහි යට කියන ලද නයින්ම දතයුතුය.

පහීන වාර කථා නිමි.

උපපජ්ජනවාරය අනුසය වාරය හා සමාන වේමය.

ධාතුවාරයේ පුචඡාවාරයෙහි **කති අනුසයා අනුසෙනති** අනුසය කීයක් සත්ත්වයින්ට අනුගතව පවතීද **කති අනුසයා නානුසෙනති** අනුසය කීයක් සත්ත්වයින්ට අනුගත නැතිව නොපවතීද, **කති අනුසයා භංගාති** අනුසය කීයක් පවතීද, නොපවතීදැයි මෙසේ බෙදිය යුතුය යන අර්ථය වේ. මෙහි කිවයුතු සෙසු යමක් වේ නම් එය යට පෙළ නියමයෙහි කියන ලදමය. නිද්දේස වාරයේ වනාහි **කසසචි සතත අනුසයා අනුසෙනති** යයි පෘථග්ජන වශයෙන් කියන ලදී. **කසසචි පඤ්චාති** යයි සොතාපන්න සකදාගාමී වශයෙන් කියන ලදී. ඔවුන්ගේ වනාහි දිට්ඨි අනුසය සහ විචිකිච්ඡා අනුසය ප්‍රහීන යයි පහක්ම පවතී. එහි යම්සේ අනුසය වාරයෙහි පවතී යයි යන පදයේ උපදී යයි යන අර්ථය ගන්නා ලදී. මෙසේ මෙහි නොගත යුතුය. කුමක් හෙයින්ද? ඒ ක්ෂණයෙහි නූපදීම් වශයෙනි. කාමධාතුවේ උපදින්නාට විපාක සිත මෙන්ම කමම සමුට්ඨාන රූපද උපදී. අකුසල සිත නැත. අනුසය ද අකුසල චිත්ත ක්ෂණයෙහි උපදී. විපාක චිත්තක්ෂණයෙහි නොවේ යයි ඒ ක්ෂණයෙහි නො ඉපදීම් වශයෙන් එසේ අර්ථ නොගත යුතුය. කෙසේ නම් ගතයුතුද? යම්සේ ලබයිද එසේ ගතයුතුය. කෙසේ ලබයිද? අප්‍රහීනාර්ථයෙන්. යම්සෙස් රාග දෝස මෝහ අප්‍රහීන බව. කුසල අබ්‍යාකත චිත්ත සමංගි පුද්ගලයා රාග සහිත දෝස

සහිත මෝහ සහිත යයි කියනු ලැබේ. මෙසේ මාර්ග භාවනාවෙන් අප්‍රහීන වූ බැවින් ප්‍රතිසන්ධි ක්‍ෂණයෙහි ඒ ඒ පුද්ගලයන්ට ඒ ඒ අනුසයෝ පවතිත් යයි කියති. කේවලව නො කියති. අප්‍රහීන බැවින් ඒවා පවතී යයි දතයුතුය. **අනුසයා භංගානං** යයි යමෙකුගේ යම් අනුසයක් පවතීද එය පවතීමය. යම් අනුසයක් නොපවතීද එය නොපවතීමය. මෙය පවතීද නොපවතීද, මෙය පවතින්නේය. නොපවතින්නේ යයි මෙසේ බෙදිය යුතු අනුසය නම් නැත. **රූප ධාතුං උපපජ්ජනතසස කසසචි තයො** යයි අනාගාමි වශයෙන් කියන ලදී. ඔහුගේ වනාහි කාමරාග පටිඝ දිට්ඨි විචිකිච්ඡා අනුසය සතර ද ප්‍රහීන විය. ඉතිරි තුන අප්‍රහීනය. එයින් කියන ලදී. කිසිවෙකුගේ අනුසය තුනක් පවතී. **න කාමධාතුං** යයි කාමධාතුවෙන් ප්‍රතිසෙධ බැවින් සෙසු ධාතු දෙකේ උපන්නාගේ යයි අර්ථ වේ. **සතෙතව** යයි යම් ආර්ය ශ්‍රාවකයෙකුගේ රූපධාතුවෙන් චුතව කාමධාතුවේ උපතක් නම් නැත. පෘථග්ජනයාටම වේ. එහෙයින් සතෙත වා යයි නියමකොට කියන ලදී. **අරූප ධාතුයා චුතසස කාමධාතුං උපපජ්ජනතසස සතෙතවා** යයි මෙහිද එම නයම වේ. **රූපධාතුයා උපපතති නත්‍ථි** යයි කුමක් හෙයින් නැත්ද? උපත නිෂ්පාදකයාගේ රූපාවචර ධ්‍යානයේ අභාවය නිසා. හේ සියළු ආකාරයෙන් රූපසංඥාවන්ගේ සමතික්‍රමණය ඒ ධාතුවේ උපන්නේ යයි ඔහුට රූපාවචර ධ්‍යානයක් නැත. එය නොමැති වීමෙන් රූපධාතුවෙහි උපත් නැතැයි දතයුතුය. **අරූප ධාතුයා චුතසස න කාමධාතුං** මෙහි අරූපධාතුම අදහස් කරයි. මෙම නයින් සියළු විසඳුම්වල අර්ථ දතයුතුය.

**ධාතුවාර කථා නිමි.**

**අනුසය යමක වර්ණනාව සමාප්තයි.**

# චිතත යමක අර්ථ වර්ණනාව

දැන් ඒ මූල යමකයෙහි ම දේශනා කරන ලද කුසලාදි ධර්මවල ලැබීම් වශයෙන් ඒකදේශයක්ම සංග්‍රහකොට අනුසය යමකයට අනතුරුව දේශනා කළ චිත්ත යමකයේ අර්ථ වර්ණනාව වේ. මෙහි පෙළෙහි

නියමය පළමුව දැනගත යුතුය. මෙම චිත්ත යමකයෙහි. මාතිකා ඨපනය ඨපිත මාතිකා විසඳීම යයි වාර දෙකක් වේ. එහි මාතෘකා තැබීමේ පුග්ගලවාර, ධම්මවාර, පුග්ගල ධම්මවාර යයි මුලින් සුද්ධික මහාවාර තුනක් වේ. එහි **යස්ස චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣති** මෙසේ පුද්ගල වශයෙන් සිතේ උපදින නිරුද්ධවන ආදි භේද දක්වමින් යන ලද්දේ පුග්ගල ධම්මවාර නම් වේ. **යස්ස යං චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣති** යයි මෙසේ ධර්ම වශයෙන්ම සිතේ උපදින නිරුද්ධවන භේද දක්වන්නේ පුග්ගලධම්මවාර නම් වේ. ඉක්බිති **යස්ස සරාගං චිත්තං** යයි සොළොස් පදයන්ගේ වශයෙන් පසුව සරාගාදි පද විශේෂිත වූ සොළස පුග්ගල වාර, සොළස ධම්මවාර, සොළස පුග්ගල ධම්මවාර අට සතළිස් මිශ්‍රකවාර වේ. ඒවා සරාගාදි පද පමණක් දක්වා සංක්‍ෂෙප කරන ලදී. ඉක්බිති **යස්ස කුසලං චිත්තං** යනාදි නයින් දෙසිය හැටහය සංඛ්‍යාවක් අභිධර්ම මාතෘක පද වශයෙන් පසුව කුසලාදි පද විශේෂිතව දෙසිය හැටහයක් පුද්ගලවාර, දෙසිය හැටහයක් ධම්මවාර, දෙසිය හැටහයක් පුග්ගල ධම්මවාර යයි හත්සිය අනූඅටක් මිශ්‍රක වාර වේ. ඒවාද කුසලාදි පද පමණක් දක්වා සංක්‍ෂෙප කෙළේමය. මෙහි යම් නිදර්ශන සහිත පද සිත සමග නොයෙදේ. ඒවා මෝඝ පුච්ඡා වශයෙන් තබන ලදී. ඒවායින් තුන් වාරයක සියල්ලට පළමු සුද්ධික පුග්ගල මහාවාරයෙහි උප්පාද නිරොධ කාල සම්භේද වාරය, උප්පාදඋප්පන්න වාරය, නිරොධ උප්පන්න වාරය, උප්පාද වාරය, නිරොධ වාරය, උප්පාද නිරොධ වාරය, උප්පජ්ජමාන නිරොධ වාරය උප්පජ්ජමාන උප්පන්න වාරය, නිරුජ්ඣමාන උප්පන්නවාරය, උප්පන්න උප්පාදවාරය, නිරුද්ධ නිරුජ්ඣමාන වාරය, අතීතානාගතවාරය, අතික්කන්තකාල වාරය යයි අන්තරවාර තුදුසකි. ඒවා අතරින් උප්පාදවාරය, නිරෝධවාරය, උප්පාද නිරොධවාරය යයි මේ වාර තුනෙහි අනුලෝම පටිලෝම වශයෙන් හය හය කොට යමක අටළොසක් වේ. උප්පන්න උප්පාද වාරයෙහි අතීත අනාගත කාල වශයෙන් අනුලෝම දෙකක් වේ. පටිලෝම දෙකකැයි යමක සතරක් වේ. සෙසු ඒවායෙහි මුලින් නිර්දිට්ඨ තුන, අනතුරුව නිර්දිෂ්ඨ තුන අවසානයෙහි නිර්දිෂ්ඨ සතර යයි දසවාරයෙහි අනුලෝම වශයෙන් එකකි. පටිලෝම වශයෙන් එකකැයි දෙක දෙක කොට යමක විස්සක් වේ. මෙසේ සියළු තුදුසෙහිම අන්තරවාරයෙහි යමක සතළිස් දෙකකි. පුච්ඡා අසූහතරකි. අර්ථ එක්සිය හැටඅටකි. ඒක සුද්ධික පුද්ගල වාරයෙහි යම්සේද එසේම සුද්ධික ධම්ම වාරයෙහිද සුද්ධික පුග්ගල ධම්මවාරයෙහි ද තුන්මහා වාරයෙහි යමක එක්සිය විසිහයක් වේ. එයින් දෙගුණය පුච්ඡා වේ. එයින් දෙගුණය

අර්ථය වේයයි දතයුතුය. මෙය වනාහි වාර තුනේ සරාගාදි වශයෙන් සොළොස් ගුණයයි. කුසලාදි වශයෙන් දෙසිය හැටහය ගුණ කොට මේ චිත්ත යමකයෙහි අනෙක වූ යමක දහයක් වේ. එයින් දෙගුණය පුච්ඡා වේ. එයින් දෙගුණය අර්ථද වේයයි පාඨය සංක්ෂෙප කරන ලදී. මෙසේ මේ චිත්ත යමකයෙහි පෙළෙහි නියමය දතයුතුය.

## මතිකා ඨපන වැනුම නිමි.

දැන් තැබූ පිළිවෙළින් මාතෘකා විසඳීමට යමෙකුගේ සිත උපදියි නිරුද්ධ නොවේ' යනාදිය ආරම්භ කරන ලදී. එහි **උපපජ්ජති** යයි උපපාද ක්ෂණයෙන් යුක්තව උපදී. **න නිරුජ්ඣති** යයි නිරෝධ ක්ෂණය නොපැමිණි බැවින් නිරුද්ධ නොවේ. **තස්ස චිත්තං** යයි ඒ පුද්ගලයාගේ එතැන් පටන් සිත නිරුද්ධ වන්නේය. නූපදීදැයි අසයි. **තෙසං චිත්තං** සසර දුක් නැතිකළ යම් ක්ෂීණාශ්‍රවයන්ගේ සියල්ලටම පසුව චුති සිතේ උපපාද ක්ෂණය වැටේ. ඔවුන්ගේ ඒ චුති සිතම ඉපදීම් බවට පැමිණියෙන් උපදියි. භංගයට නොපැමිණි බැවින් නිරුද්ධ නොවේ. දැන් වනාහි භංගයට පැමිණ එය ඔවුන්ගේ සිත නිරුද්ධ වන්නේය. ඉක්බිති අප්‍රතිසන්ධි බැවින් අනිකක් නූපදින්නේය. **ඉතරෙසං** යයි අවසන් සිත ඇතුළත් ක්ෂීණාශ්‍රවයා හැර අවසේස සෙකාසෙක පෘථග්ජනයින්ගේ **නිරුජ්ඣිස්සති චෙව උප්පජ්ජිස්සති** යමෙක් උපපාද ක්ෂණයට පැමිණියේද ඔහු නිරුද්ධ වන්නේමය. අන්‍යයා වනාහි එහි හෝ වෙනත් ආත්මභාවයක හෝ උපදින්නේ ද නිරුද්ධ වන්නේද වේ. දෙවන පුච්ඡා විසඳීමෙහි ද එබඳු වූම ක්ෂීණාශ්‍රවයාගේ සිත සඳහා **ආමන්තා** යයි කියන ලදී. **නූපපජ්ජති නිරුජ්ඣති** යයි භංග ක්ෂණයෙහි රහතන් වහන්සේගේ අවසාන සිත ද සෙස්සන් ගේ බිඳෙන සිත ද, එතැන් පටන් වනාහි රහතන්ගේ සිත නිරුද්ධ නොවන්නේ යයි කීමට හැකිය. සෙස්සන්ගේ උපදින්නේ යයි කිවහැකිය. නිරුද්ධ නොවේ යයි කිව නොහැක. එහෙයින් **නො** යයි ප්‍රතිසෙධ කරන ලදී. දෙවන ප්‍රශ්නය. **යස්ස චිත්තං නො නිරුජ්ඣිස්සති උප්පජ්ජිස්සති** යයි ඒ පුද්ගලයාම නැත. එහෙයින් **නත්ථි** යයි ප්‍රතික්ෂේප කරන ලදී. **උප්පන්නං** උපත යුත් මෙය නමකි. ඉපදීමට පැමිණ නිරුද්ධ නොවන්නේ ද වේ. එහි උත්පාදයෙන් යුක්තවීම සඳහා **ආමන්තා** යයි, ඉපදීමට පැමිණ අනිරුද්ධභාවය සඳහා. **තෙසං චිත්තං උප්පන්නං** යයි කියන ලදී.

අනුපපතතං යයි උපතට නොපැමිණියෝ. **තෙසං චිතතං උපපජජිතථ** යන මෙහි ද සියල්ලන්ගේ සිත ක්‍ෂණ වර්තමානයම වී උපපාද ක්‍ෂණය අතීත බැවින් උපපජජිතථ නම් වේ. නිරෝධයට සමවැදුනවුන්ගේ නිරෝධයෙන් පෙර උපන් පෙර බැවින්, අසඤඤ සත්ත්වයින්ගේ සංඥී භවයෙහි උපන් පෙරටු බව. **උපපජජිතථචෙව උපපජජතිච** උත්පාදයට පැමිණියේ ඉපදුනහ. අනතීත බැවින් උපදී නමැයි අර්ථ වේ. **උපපාදකඛණෙ අනාගතඤච** උත්පාද ක්‍ෂණයෙහි සිත ද අනාගත සිත ද යන අර්ථය වේ.

අතිකකනත කාල වාරයෙහි **උපපජජමානං ඛීණං** යයි උපපාද ක්‍ෂණය යම්තැනක කිසියම් උපපාද ක්‍ෂණය ද උපදින්නේ නම් නොවේ. උපදින්නහුගේ වනාහි ක්‍ෂණබව මෙසේ කියන ලදී. **ඛණං වීතිකකනතං අතිකකනත කාලං** ඉක්මවී කලක් නොවේ. එයම වනාහි උපපාද ක්‍ෂණ අතික්‍රමණය වී අතිකකනත කාල යයි සංඛ්‍යාවට යයි. **නිරුජඣමානං ඛණං** නිරෝධ ක්‍ෂණය. එහි කිසියම් නිරෝධ කණය නිරුද්ධ වන්නේ නම් නොවේ. නිරුද්ධ වන්නාගේ ක්‍ෂණබව මෙසේ කියන ලදී. **ඛණං වීතිකකනතං අතිකකනත කාලං** අතික්‍රාන්ත කාලය නම් වේ යයි අසයි. එහි යම්හෙයකින් භංග ක්‍ෂණයෙහි සිත උත්පාද ක්‍ෂණ ක්‍ෂණය ඉක්මවා අතිකකනත කාලය වේ. නිරෝධ ක්‍ෂණ ක්‍ෂණය ඉක්මවා අතිකකනත කාලය නොවේ. අතීත සිත ක්‍ෂණ දෙකම ක්‍ෂණය ඉක්මවා අතිකකනතකාල නම් වේ. එහෙයින් **භංගකඛණෙ චිතතං උපපාදකඛණං වීතිකකනතං භංගකඛණං අවීතිකකනතං අතීතං චිතතං උපපාදකඛණඤච වීතිකකනතං භංගකඛණඤච වීතිකකනතං** විසඳමින් කීය. දෙවන ප්‍රශ්නයේ විසඳුමෙහි යම් හෙයකින් අතීත සිත ක්‍ෂණ දෙකෙහිම ඉක්මවා අතිකකන්ත කාල නම් වේ. එහෙයින් අතීත සිත යයි කියන ලදී. පටිලෝම ප්‍රශ්නය විසඳීමෙහි යම්හෙයකින් උපපාද ක්‍ෂණයේද සිත අනාගත සිත ද ක්‍ෂණ දෙකේම ක්‍ෂණය ඉක්මවා අතිකකනත කාල නම් නොවේ. ඔවුන්ගේ ක්‍ෂණ ඉක්මවීය. එහෙයින් **උපපාදකඛණෙ චිතතං අනාගතං චිතතං** යයි කියන ලදී. දෙවන විසඳුම ප්‍රකටය. ධමමවාරේ ද මෙම උපායෙන් සියළු විසඳීම් දතයුතුය.

පුගගල ධමමවාරය ධමමවාර ගතික වේ. සියළු මිශ්‍රක වාර 'යමෙකුගේ සරාග සිත' යනාදි නයින් මුඛමාත්‍රය දක්වා සංක්ෂේප කරන ලදී. ඒවායේ විස්තරය වනාහි යට කියන ලද නයින් ම දතයුතුය. ඒවායින් වනාහි යමෙකුගේ සරාග සිත උපදී. නිරුද්ධ නොවේ. ඔහුගේ සිත නිරුද්ධ වේ නූපදින්නේ ය'යි මෙසේ විස්තරයෙහි තැබිය යුතු ඇසීමද

සමාන වේ. යම්හෙයකින් සරාග සිත අවසාන සිත නොවේ. එහෙයින් යමෙකුගේ සරාග සිත උපදී. නිරුද්ධ නොවේ. ඔහුගේ සිත නිරුද්ධ වන්නේය. නූපදින්නේ ද නැතැ'යි මෙසේ විසඳිය යුතු බැවින් විසඳීම අසදෘශ වේ. එය ඇසීමට අනුරූප වශයෙන් දතයුතුය.

චිත්තයමක වර්ණනාව නිමි.

# ධම්ම යමක අර්ථ වර්ණනාව

දැන් ඒ මූල යමකයෙහිම දේශනා කරන ලද කුසලාදි ධර්මවල මාතෘකා තබා චිත්ත යමකයට අනතුරුව දේශනා කරන ලද ධම්ම යමකයෙහි වර්ණනාව වේ. එහි ඛන්ධ යමකයෙහි කියන ලද නයින්ම පෙළෙහි නියම දතයුතුය. යම්සේ එහි පණ්ණත්තිවාරාදි මහාවාර තුනකි. අවශේෂ වූ අන්තර වාරද වේ. එසේම මෙහිද වේ. 'යමෙක් කුසල් දහම් වඩාද හේ අකුසල දහම් දුරුකරයි' යයි ආ බැවින් වනාහි මෙහි පරිඤ්ඤා වාරය භාවනා වාර නමැයි දතයුතුය. එහි යම්සේ නොකියන ලද ධර්මය නොවැඩිය යුතුය. ප්‍රහානය නොකළ යුතුය. එහෙයින් ඒ පදයම නොඋදුරන ලදී. මෙහි පණ්ණත්තිවාරයෙහි වනාහි තුන් කුසලාදි ධර්ම වශයෙන් පදශෝධන වාරය පදසොධන මූල චක්කවාරය, සුද්ධ ධම්මවාරය, සුද්ධ ධම්ම මූල චක්කවාරය යයි මේ සතර වාරයෙහි යමක ගණන දතයුතුය.

පණ්ණත්ති වාර නිද්දේසය වනාහි 'කුසලාකුසල ධම්මා' යයි කුසලයන්ගේ ඒකාන්තයෙන් කුසල ධම්ම බව වේ. **ආමන්තා** යයි කියන ලදී. සෙසු විසඳුම්වල ද මෙම නයම වේ. **අවසෙසො ධම්මා න අකුසලා ධම්මා** යයි අවශේෂ ධර්ම අකුසල නොවේ. ධර්ම වේයයි අර්ථය වේ. මෙම නයින් සියළු විසඳීම් දතයුතුය.

මෙහි පවත්තිවාරයෙහි වනාහි වර්තමාන කාල පුග්ගල වාරයේ අනුලෝම නයෙහි උපදිති. ඔහුගේ අකුසල ධර්ම උපදී. 'යමෙකුගේ

වනාහි අකුසල ධර්ම උපදීද ඔහුගේ කුසල ධර්ම උපදී'යයි කුසල ධර්ම මූලකවල යමක දෙකකි. අකුසල ධම්ම මූලක එකකැයි යමක තුනක් වේ. එහි පටිලෝම නයේ ද ඕකාසවාරාදියෙහි ද මෙම නයම වේ. මෙසේ මෙහි සියළු වාරවල යමක තුන තුන වශයෙන් යමක ගණන දතයුතුය.

මෙහි අර්ථ විනිශ්චයෙහි වනාහි මේ ලක්ෂණ වේ. මේ ධර්ම යමකයේ පවත්ති මහාවාරයෙහි **උප්පජ්ජන්ති නිරුජ්ඣන්ති** මේ උප්පාද නිරෝධවල කුසලාකුසල ධර්ම ඒකාන්තයෙන් පැවතීමෙහිම ලැබේ. චුතිපටිසන්ධිවල නොවේ. අබ්‍යාකත ධර්ම වනාහි පැවතීමෙහි ද චුති පටිසන්ධිවලදැයි කාල තුනෙහිම ලැබේ. මෙසේ මෙහි යමක් ඒ ඒ තැන ලබයිද ඒ අනුව ඒ ඒ තැන විනිශ්චය දතයුතුය. එහි නයමුඛය මෙසේය. කුසල අකුසල ඒකක්ෂණයෙහි නොඉපදෙන බැවින් **නො** යයි ප්‍රතිසෙධ කරන ලදී. **අබ්‍යාකතාච** චිත්ත සමුට්ඨාන රූප වශයෙන් කියන ලදී. **යත්ථ කුසලා ධම්මා නුප්පජ්ජන්ති** අසඤ්ඤ භාවය සඳහා කියන ලදී. එහෙයින් එහි ආමනතා යයි විසඳීම කරන ලදී. **උප්පජ්ජන්ති** මෙය ද අසඤ්ඤ භවයම සඳහා කියන ලදී. අබ්‍යාකතවල වනාහි නූපන් ස්ථානයේ අභාවයෙන් නැතැයි ප්‍රතික්ෂෙප කරන ලදී. **දුතියෙ අකුසලෙ** දෙවන අකුසල යයි භවය ආශ්වාදකොට උපන් ආශා ජවනයන්හි දෙවන ජවන සිතෙහි, **දුතියෙ චිත්තෙ වත්තමානෙ** ප්‍රතිසන්ධියෙන් දෙවන භවාංග සිතෙහි පවතින පටිසන්ධිය සමග භවංගය විපාක වශයෙන් එකක්ම කොට භව ආශාව ආවර්ජන සිතෙහි. එයම ක්‍රියා සිත බව අබ්‍යාකත ජාති විපාකයෙන් දෙවැන්න නම් වේ. **යස්ස චිත්තස්ස අනන්තරා** අග්ගමග්ගං ගොත්‍රභූ සිත සඳහා කියන ලදී. **කුසලා ධම්මා උප්පජ්ජිස්සන්ති** ඒවා අග්‍ර මාර්ග ධර්මයම සඳහා කියන ලදී. **යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තස්ස චිත්තස්ස උප්පාදක්ඛණෙ** මේ සිත ජාති වශයෙන් කියන ලදී. ඒ ජාතියේ එක් ආවර්ජනයෙන් උපන් එයින් මේ හැම සිතේ උත්පාද ක්ෂණයෙහි ද මේ ලක්ෂණය ලැබේමය. නිරෝධ වාරයෙහි ද කුසල අකුසල එකට නිරුද්ධ නොවන හෙයින් **නො** යයි කියන ලදී. මෙම නය මුඛයෙන් සියලු විනිශ්චයන් දතයුතුය.

**ධම්ම යමක වර්ණනාව නිමි.**

# ඉන්ද්‍රිය යමක අර්ථ වර්ණනාව

දැන් මූල යමකයෙහි ම දේශනා කරන ලද කුසලාදි ධර්මවල ලැබීම් වශයෙන් එක් දේශයක් සංග්‍රහකොට ධම්ම යමකයට අනතුරුව දේශනා කළ ඉන්ද්‍රිය යමකයේ වර්ණනාව වේ. එහි ඛන්ධ යමකාදියෙහි කියන ලද නයින්ම පෙළ නියමය දතයුතුය. මෙහි ද පණ්ණත්තිවාර ආදි මහාවාර තුනකි. අවශේෂ අන්තරවාර ද කාලභේදාදිය සමග ඛන්ධ යමකාදියෙහි පැමිණි ලෙසට සමානය. ඉන්ද්‍රියන්ගේ බොහෝ බැවින් ධාතුයමකයට වඩා බොහෝ යමක වේ. යම්සේ යට පුග්ගල වාරාදියෙහි චක්ඛායතන චක්ඛුධාතු මූලක නයෙහි චක්ඛායතන චක්ඛුධාතු සමග ජිව්හායතන කායායතන නොයොදන ලදී. ජිව්හායතන කායායතන මූලක ද යමක යයි නො ගන්නා ලදී. එසේම මෙහි ද චක්ඛුන්ද්‍රිය මූලක නයෙහි ජිව්හින්ද්‍රිය කායින්ද්‍රිය මූලක යමක යයි නොගන්නා ලදී. ඒවා නොගන්නා කරුණ එහි කියන ලදයින්ම දතයුතුය. මනින්ද්‍රිය වනාහි චක්ඛුන්ද්‍රිය මූලකය මෙන් එසේම ඉත්ථින්ද්‍රිය මූලකය සමග යම්සේ යෙදීමට යයිද එහෙයින් තබන ලද පිළිවෙළින් නොයොදා සියළු චක්ඛුන්ද්‍රිය මූලක සමග අවසානයෙහි යොදන ලදැයි දතයුතුය. චක්ඛුඉන්ද්‍රිය සමග ඉත්ථින්ද්‍රිය පුරිසින්ද්‍රිය ජීවිතින්ද්‍රිය යොදන ලදී. සුඛින්ද්‍රිය දුක්ඛින්ද්‍රිය දොම්නස් ඉන්ද්‍රිය ප්‍රතිසන්ධියක් නැතැයි නොගන්නා ලදී. සොම්නස් ඉන්ද්‍රිය උපෙක්ඛා ඉන්ද්‍රිය ප්‍රතිසන්ධිය උපත් ස්වභාවයෙන් ගන්නා ලදී. එසේම සද්ධා ඉන්ද්‍රියාදි පසද ලෝකෝත්තර තුන ප්‍රතිසන්ධියෙහි අභාවයෙන් ම නොගන්නා ලදී. මෙසේ යමක් ගන්නා ලදද මෙහි ඒවා අනුව චක්ඛුන්ද්‍රිය මූලක නයෙහි යමක ගණන දතයුතුය. යම්සේ මෙහි ද සියළු තැන එසේය. යමක් වනාහි නො ගන්නා ලදද ඒවායේ වශයෙන් යමක නොගත යුතුය. ගණන් ගන්නේ නම් මොඝ පුච්ඡා වශයෙන් ගණන් ගතයුතුය. මෙසේ සියළු වාරවල පෙළෙහි නියමය දතයුතුය.

මෙහි අර්ථ විනිශ්චයෙහි වනාහි මේ නයමුඛය වේ. **සචක්ඛුකානං න ඉත්ථීනං** බ්‍රහ්ම පාරිසජ්ජාදීන් මෙන්ම රූපීන් ද නපුංසක පුරුෂයන් ද වශයෙන් කියන ලදී. ඔවුන්ට ද ඉත්ථින්ද්‍රිය නූපදී. **සචක්ඛුකානං න පුරිසානං** රූපී බ්‍රහ්මයන්ට ද ස්ත්‍රී නපුංසකයන්ට ද වශයෙන් කියන ලදී. ඔවුන්ට පුරිසින්ද්‍රිය නූපදී. **අචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං ජීවිතින්ද්‍රියං උපපජ්ජති** ඒකවෝකාර, චතුවෝකාර, කාමධාතු සත්ත්වයන් සඳහා කියන ලදී.

**සචක්ඛුකානං විනා සොමනස්සෙන** උපේක්ෂා සහගත සතර විපාක ප්‍රතිසන්ධි වශයෙන් කියන ලදී. **සචක්ඛුකානං විනා උපෙක්ඛාය** සෝමනස්ස සහගත ප්‍රතිසන්ධිකයන්ගේ වශයෙන් කියන ලදී. **උපෙක්ඛාය අචක්ඛුකානං** අහේතුක ප්‍රතිසන්ධි වශයෙන් කියන ලදී. **අහෙතුකානං** අහේතුක ප්‍රතිසන්ධි සිත සමග සද්ධින්ද්‍රියන්ගේ අභාවයන් කියන ලදී. එහි ඒකාන්තයෙන් ම සද්ධා, සති, පඤ්ඤා ආදිය නැත. සමාධි විරිය වනාහි ඉන්ද්‍රිය බවට නොපැමිණේ. **සහෙතුකානං අචක්ඛුකානං** ගබ්භසෙය්‍යක වශයෙන් ද අරූපී වශයෙන් ද කියන ලදී. වෙන සහේතුක අචක්ඛුක නම් නැත. **සචක්ඛුකානං අහෙතුකානං** අපායෙහි ඕපපාතික වශයෙන් කියන ලදී. **සචක්ඛුකානං ඤාණවිප්පයුත්තානං** කාම ධාතුවෙහි ද්‍විහේතුක ප්‍රතිසන්ධිකයන්ගේ වශයෙන් කියන ලදී. **සචක්ඛුකානං ඤාණසම්පයුත්තානං** රූපී බ්‍රහ්මයෝ ද කාමාවචර දෙවි මිනිසුන් ද සඳහා කියන ලදී. **ඤාණසම්පයුත්තානං අචක්ඛුකානං** අරූපීන් ද ත්‍රිහේතුක ගබ්භසෙය්‍යකයන් ද සඳහා කියන ලදී. ජීවිතින්ද්‍රිය මූලකයෙහි **විනා සොමනස්සෙන උපපජ්ජන්තානං** ජීවිතින්ද්‍රිය දෙක සඳහා කියන ලදී. **පවත්තෙ සොමනස්සවිප්පයුත්තස්ස උප්පාදක්ඛණෙ** අරූපී ජීවිතින්ද්‍රිය සඳහා කියන ලදී. මෙම නයින් සියළු තැන ප්‍රතිසන්ධි පැවැත්ම වශයෙන් ජීවිතින්ද්‍රිය යෙදීම් දතයුතුය. සෝමනස්ස ඉන්ද්‍රිය මූලකවල ද ප්‍රතිසන්ධි පැවැත්ම වශයෙන් අර්ථය ගතයුතුය.

පටිලෝම නයෙහි වනාහි නිරෝධ වාරයෙහි ද මේවායෙහි ද අන්‍ය ඒවායේ ද ධර්මයන්ගේ යථාලාභ (ලැබීම්) වශයෙන් චුති පටිසන්ධි පැවැත්මෙහි අනුත්පාද නිරෝධ තුන ද දතයුතුය.

අනාගත වාරයෙහි **එත්තෙනෙව භාවෙන** මේ පුරුෂ භාවයෙන්ම අතර ඉත්ථීභාවයට නොපැමිණ පුරිස පටිසන්ධි ගැනීමෙන් යයි අර්ථ වේ. **කති චි හවෙ දස්සෙත්වා පරිනිබ්බායිස්සන්ති** ප්‍රතිසන්ධි කීයක් ගෙන ස්ත්‍රී භාවයට නොපැමිණම පිරිනිවන්පාන්නේ ද යන අර්ථයයි. දෙවන පුච්ඡාවෙහි ද මෙම නයම වේ.

වර්තමානයේ අතීත වාරයේ නොවේ. **සුද්ධාවාසානං උපපත්තිචිත්තස්ස භංගක්ඛණෙ මනින්ද්‍රියඤ්ච නුප්පජ්ජිත්ථ** චිත්ත යමකයෙහි මෙන් උත්පාද ක්ෂණ ඉක්මවීම් වශයෙන් අර්ථය නොගෙන ඒ භවයෙහි නූපන් පෙර වශයෙන් ගතයුතුය. මෙම නය මුඛයෙන් සියළු පැවැත්ම වාරයෙහි

අර්ථ විනිශ්චය දතයුතුය. පරිඤ්ඤා වාරයෙහි වනාහි චක්ඛු මූලාදියෙහි එකම චක්ඛුසොත යමකය දක්වන ලදී. යම්හෙයකින් වනාහි බැලිය හැකි අබ්‍යාකතා ද ලෞකික අබ්‍යාකත මිශ්‍රවද වැඩීමෙන්ම වේ. එහෙයින් ඒවා නො දක්වන ලද්දේ ද මෙයම දක්වන ලදී. යම්හෙයකින් වනාහි අකුසලය ඒකාන්තයෙන් ප්‍රහාණය කළයුතුමය. කුසලය ඒකාන්තයෙන් වැඩිය යුතුය. ලෝකෝත්තර අබ්‍යාකතය සාක්‍ෂාත් කළයුතුය. එහෙයින් **දොමනස්සින්ද්‍රියං පජහති** දොම්නස් ඉන්ද්‍රිය දුරුකරයි. **අනඤ්ඤඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය** වැඩිය යුතුයයි ද අඤ්ඤතාවින්ද්‍රිය සාක්‍ෂාත් කළයුතු යයි ද කියන ලදී. අඤ්ඤින්ද්‍රිය වනාහි වැඩිය යුත්තක් ද ඇත. සාක්‍ෂාත් කළයුත්තක් ද ඇත. එය භාවනා වශයෙන් ම ගන්නා ලදී. එහි දෙව පුගගලා යයි සකදාගාමි මාර්ගයුත්තාද අරහත් මාර්ග යුත්තාද ඔවනතුරෙන් එක්කෙනෙක් සමුච්ඡේද කිරීමට අසමර්ථ බැවින් දොම්නස් ඉන්ද්‍රිය දුරු නොකෙරේ නම් වේ. එක්කෙනෙක් දෝස ප්‍රහීන බැවින් **චක්ඛුන්ද්‍රියං න පරිජානාති** යයි අනුපපාදයට පැමිණීමට අසමත් බැවින් නොදනී. මෙම නයින් සියළු විසඳුම්වල අර්ථය දතයුතුය.

**ඉන්ද්‍රිය යමක වර්ණනා නිමි.**

මෙපමණකින්

ඔවායෙහි පිහිටා - නිමි කිස කිසයුත් තමා
යුවතිය ද පෙරදා - කෙළේ නියම අණ සොඳින්

දෙව්පුරයෙහි සියළු - දෙව්පිරිස මැද වැඩහිඳ
දෙසී යමකය නම් - ගුණ'ගමිණි මුනිරජ 'තුම්

පෙළ නියම විදියද - පුළුවුත් විසඳුම් නයද
දක්වනු ඇරඹි මා - යමකයෙ අටුවා කතා

ලොවැ බහුල අනතුරු - නැතිවම කිසි අනතුරු
අද එය වන පහක - පමණ බණවර පෙළෙහි

නිමවී එය මෙසේ - පැමිණෙනු හැම නිමාවට
හිතසුව නිවුම වෙත - හැමසත් පැතුම් විලසේ

**යමකප්පකරණ අටුවාව නිමි.**

# පරමත්ථදීපනී නම් වූ
# පට්ඨානපපකරණට්ඨ කථා

නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට
නමස්කාරය වේවා !

දෙවියනට අතිදෙව් - දෙව් අසුරයන් පුදකළ
යමකය දෙසා'තුම් - පිරිසිදු සංයමයකින්

අරුතින් ද දහමින් - සුගැඹුරුව යන යම් ඒ
අනතුරුව මහවිරු - සත්වැනි වන රුැසි පසත්

'පට්ඨානය' යන නමින් - නම් රූ පැවත නවතිනි
දෙසී ගැඹුරු දෙසුම් - නය ලකරින් ලකර වූ

දැන් පැමිණ ඇත එහී - අරුත් වැනුම් පිළිවෙළින්
එනිසා එය වනමි - එය'සනු සන්සුන් සිතින්

සම්මා සම්බුද්ධයන් වහන්සේ විසින් අනුලෝම පට්ඨානයෙහි දෙවිස්ස නිසා තික පට්ඨානය නම් නිර්දේශ කරන ලදී. සියළු දුක නිසා දුක පට්ඨානය නම් නිර්දේශ කරන ලදී. ඊට පසුව දෙවිස්ස ගෙන දුක සියයෙහි බහා දුකතික පට්ඨානය නම් දක්වන ලදී. ඉන්පසු දුක සියය

ගෙන දෙවිස්ස තිකයෙහි බහා තික දුක පට්ඨානය නම් දක්වන ලදී. තිකයෙහි වනාහි තිකයෙහිම බහා තික තික පට්ඨානය නම් දක්වන ලදී. දුකය ද දුකයෙහිම බහා දුක දුක පට්ඨානය නම් දක්වන ලදී. මෙසේ:-

පට්ඨාන 'තුම් තික - 'තුම්දුක දුකතික ද යන
තික දුකද තික තික - දුක දුක ද යන මේ සය
අනුලොම්හි වන මෙම - සුගැඹුරු නයයි දන්නේ

ප්‍රත්‍යනීය පට්ඨානයෙහි ද දෙවිස්ස නිසා තික පට්ඨාන නම් වේ. දුක සියය නිසා දුක පට්ඨාන නම් වේ. දෙවිස්සෙහි දුක සියයෙහි බහා දුක තික පට්ඨාන නම් වේ. දුක සියය දෙවිස්සෙහි ම බහා තික දුක පට්ඨාන නම් වේ. තිකයෙහි තිකයෙහි ම බහා තික තික පට්ඨාන නම් වේ. දුකයෙහි දුකයෙහිම බහා දුක දුක පට්ඨාන නම් වේ. මෙසේ ප්‍රත්‍යනියෙහි නය සයෙහි පට්ඨානය දක්වන ලදී. එයින් කියන ලදී:-

'පට්ඨාන' තික'තුම් - දුක'තුම් දුකතික ද යන
තිකදුකද තික තික - දුක දුකද යන මේ සය
සුගැඹුරු නයයි මේ - අනුලොම් විරුදු පසනියෙ

ඉන්පසුව අනුලෝම පච්චනියෙහි ද මෙම උපායෙන් නය සයක් දක්වන ලදී. එයින් කීහ:-

'පට්ඨාන' තික'තුම් - දුක'තුම් දුකතිකද යන
තික දුක ද තිකතික - දුක දුක ද යන මේ සය
අනුලොම් පසනියෙහි - සුගැඹුරු නයයි දන්නේ

ඉන් අනතුරුව පච්චනිය අනුලෝමයෙහි එයින්ම නය සයකින් දක්වන ලදී. එයින් කීහ :-

'පට්ඨාන තික'තුම් - දුක'තුම් දුකතික ද යන
තික දුක ද තිකතික - දුක දුක ද යන මේ සය
පසනිය අනුලොම්හි - සුගැඹුරු නයයි දන්නේ

මෙසේ අනුලෝම පට්ඨාන සයකි පච්චනියෙහි සයකි. අනුලොම් පච්චනියේ සයකි. පච්චනිය අනුලොම්හි සයකියි මෙය සූවිසි සමන්ත පට්ඨාන සමොධාන පට්ඨාන මහා පකරණය නමැයි කියන ලදී. එහි සූවිසි සමන්ත පට්ඨානයන්ගේ සමෝධාන වශයෙන් මෙය සූවිසි සමන්ත පට්ඨාන සමෝධානය පට්ඨාන මහා ප්‍රකරණ මැයි කියන ලදී. එහිම මේ ප්‍රකරණයේ නාමයේ අර්ථය පළමුව දැනගත යුතුය.

කුමන අර්ථයකින් පට්ඨාන වේද? නානාප්‍රකාර වූ ප්‍රත්‍යයන් ගේ අර්ථයෙන් 'ප'කාරය විවිධ ප්‍රකාර අර්ථ දක්වයි. 'ඨාන' ශබ්දය ප්‍රත්‍යය අර්ථය. ඨානා ඨාන කුසලතා ආදියෙහි පච්චය, ඨාන යයි කියන ලදී. මෙසේ නානාප්‍රකාර වූ ප්‍රත්‍යයන්ගේ වශයෙන් දේශනා කරන ලද බැවින් මේ සූවිසි පට්ඨාන අතුරෙහි එක එකක් පට්ඨාන නම් වේ. මේ පට්ඨානයන්ගේ සමූහයෙන් මේ සියළු ප්‍රකරණය පට්ඨානයයි දතයුතුය. තවද නයක්:- කුමන අර්ථයකින් පට්ඨාන වේද? බෙදීම් අර්ථයෙන්. 'පඤ්ඤාපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං' යන ආ තැන්වල බෙදීම් අර්ථයෙන් පට්ඨානය පෙනී යයි. මෙසේ කුසලාදි ධර්මයන් හේතුප්‍රත්‍ය වශයෙන් බෙදන ලද බැවින් මෙම සූවිසි පට්ඨානවල එක එකක් පට්ඨාන නම් වේ. මෙම පට්ඨානවල සමූහ වශයෙන් මේ සියළු ප්‍රකරණය පට්ඨාන නම් යයි දතයුතුය. තවද නයක්:- කුමන අර්ථයකින් පට්ඨාන වේද? පට්ඨිතපෝන = ගමනාර්ථයෙනි. ගොට්ඨාපට්ඨිත ගාවො (ගාලෙන් පිටට යන ගවයා) ආ තැන්වල යම් පට්ඨානයකින් 'පට්ඨිත ගාවො' යයි කියන ලදී. එය අර්ථ වශයෙන් ගමන වේ යයි විස්තර නැති නයවල ධම්මසංගනී ආදියෙහි ඇලීම් ගමනේ සර්වඥතා ඥානයේ හේතුප්‍රත්‍යාදි වශයෙන් බෙදුණු කුසල්වල විස්තර කරන ලද නය ලැබීමෙන් ඇලීම් නැතිව පවත්වන ගමන බව මේ සූවිසි පට්ඨානවල එක එකක් පට්ඨාන නම් යයි දතයුතුය.

එහි අනුලෝමයෙහි පළමුව තික වශයෙන් දේශනා කරන ලද බැවින් තික පට්ඨාන නම් වේ. එහි පද බිඳීම :- තිකානං පට්ඨානං එත්ථ අත්ථීති = තිකයන්ගේ පට්ඨානය මෙහි ඇතැයි යනු = තිකපට්ඨානං. තිකයින්ගේ නානාප්‍රකාරක ප්‍රත්‍ය මේ දේශනාවේ ඇතැයි අර්ථයයි. දෙවන විකල්පයෙහි ද තිකයින්ගේ පට්ඨානය එයින් තික පට්ඨානය හේතුප්‍රත්‍යාදි වශයෙන් තිකයින්ගේ බෙදීම යයි අර්ථ වේ. තුන්වන විකල්පයෙහි හේතුප්‍රත්‍යාදි භේදයෙන් බෙදීමෙන් ලද විස්තර තිකවලම පට්ඨානය තික

පට්ඨානය වේ. සර්වඥ ඥානයේ ඇලීම් රහිත ගමන භූමියයි (ගමන් බිමන්) අර්ථ වේ. දුක පට්ඨානාදියෙහි ද මෙම නයම වේ. මෙසේ අනුලෝමයෙහි පට්ඨාන සයකැයි දැන පච්චනියාදියෙහි ද මෙම උපායෙන් දතයුතුය. යම්හෙයකින් වනාහි මෙම අනුලෝමයෙහි පච්චනීයෙහි, අනුලෝම පච්චනියෙහි, පච්චනී අනුලෝමයෙහි යයි සියල්ල සය සය වී සූවිසි වේ. එහෙයින් සූවිසි සමනත පට්ඨාන යයි කියනු ලැබේ. මෙසේ මෙම සූවිස්සෙන් කුඩා පට්ඨාන සංඛ්‍යාත සියළු පට්ඨානයන්ගේ සමෝධාන (එක් කිරීම්) වශයෙන් ඒ සූවිසි සියළු පට්ඨාන සමෝධාන වූ පට්ඨාන මහා ප්‍රකරණය නම්.

එය වනාහි යම් මේ තිකාදිය නිසා නිදර්ශිත බැවින් තික පට්ඨානං, දුක පට්ඨානං........දුක දුක පට්ඨානං යයි කියන ලදී. ඒවා ස්පර්ශ නොකොට යම් ප්‍රත්‍යයන්ගේ වශයෙන් ඒ තිකාදිය බෙදන ලදී. ඒ ප්‍රත්‍ය දැක්වීමට මුලින් මාතෘකා තබන වාරය නම් යයි කියන ලදී. පච්චය විභංග වාරය යයි ඊටම නමකි. එය උද්දේස නිද්දේස යයි දෙයාකාරය. එහි හෙතු පච්චයා.........අවිගත පච්චයො යන මෙය උද්දේසයයි.

එහි හේතු ද පච්චය දැයි හෙතුපච්චයො. හේතු වී පච්චය, හේතු භාවයෙන් පච්චය යයි කියන ලද්දේ වේ. ආරම්මණ පච්චයාදියෙහි ද මෙම නයම වේ. එහි හෙතු යනු වචන අවයව, කාරණ, මූල යන මේවාට සමාන වචනයකි. 'පටිඤ්ඤා හෙතු' යනාදියෙහි ලෝකයෙහි වචන අවයව හේතු යයි කියනු ලැබේ. එය මෙහි අදහස් කෙරේ. පච්චයො යන මෙහි වනාහි මේ වචනාර්ථයයි. පටිච්ච එතසමා එති (නිසා මෙයින් එයි) පච්චයො. ප්‍රත්‍යක්ෂයෙන් (පෙනීමෙන්) තොරව එය පවතී යන අර්ථයයි. යම් ධර්මයෙක් හෝ යම් ධර්මයක් පෙනීමෙන් තොරව සිටියි හෝ උපදියි හෝ වේ. එය එයට ප්‍රත්‍ය වේ යයි කියන ලද්දේ වේ. ලක්‍ෂණ වශයෙන් වනාහි උපකාරක ලක්‍ෂණ වේ පච්චය. යම් ධර්මයක් යම් ධර්මයක පැවතීමට හෝ ඉපදීමට හෝ උපකාර වේ. එය ඊට ප්‍රත්‍ය යයි කියනු ලැබේ. පච්චය හේතු කාරණා, නිදාන සම්භව වේ. ප්‍රභව වේ යයි අර්ථ වේ. ව්‍යඤ්ජන වශයෙන් මෙය නානා විධය. මෙසේ මූලාර්ථයෙන් පච්චය යයි සංක්‍ෂෙපයෙන් මූලාර්ථයෙන් උපකාරක ධර්මය හෙතුපච්චයො වේ. එය හැල් ආදියේ හැල් බීජාදිය මෙනි. මිණි පහා (එළියාදිය මෙන් ද මිණි වර්ණාදිය කුසලාදියේ කුසලාදභාවයට සාධක යයි ඇදුරුවරුන්ගේ අදහසයි. මෙසේ ඇතිකල්හි වනාහි එයින් උපදවන රූපවලද හේතුප්‍රත්‍ය

බව නොසිදුවේ. එය ඒවායේ කුසලාදිභාවය නො සාදයි. ප්‍රත්‍ය නොවන්නේද නොවේ. මෙය කියන ලදී. 'හේතු සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ ඒවායින් උපන් රූපයන්ට හේතුපච්චයෙන් ප්‍රත්‍ය වේ' යයි අහේතුක සිත්වලට හැර මේ අව්‍යාකෘත බව සිදුවේ. සහේතුකයන්ටද නුවණින් මෙනෙහි කිරීම් ආදිය හා බැඳුණු කුසලාදි භාවය වේ. සම්ප්‍රයුක්ත හේතු හා බැඳුණු ඒවාට නොවේ. ඉදින් සම්ප්‍රයුක්ත හේතුවල ස්වභාව වශයෙන් කුසලාදි භාවය වන්නේය. ඒ සම්ප්‍රයුක්තවල බැඳුණු අලෝභය කුසල හෝ අව්‍යාකෘත හෝ වන්නේය. යම්හෙයකින් වනාහි දෙකම වන්නේය. එහෙයින් යම්සේ සම්ප්‍රයුක්තවල මෙසේ හේතුවලද කුසලාදි බව සෙවිය යුතුය. කුසලාදිභාවය සාධන වශයෙන් වනාහි හේතුන්ගේ මූලාර්ථ නොගෙන මනාව පිහිටි බැව් සාධන වශයෙන් ගැනීමේ කිසිවෙක් විරුද්ධ නොවේ. ලද හේතුප්‍රත්‍ය ධර්ම වැඩුණු මූල මෙන් වෘක්ෂ ස්ථිර වේ. මනාව පිහිටියේ වේ. අහේතුක වනාහි තිලබීජකාදියේ සේවාල (සෙවෙල්) මෙන් ස්ථිර නොවේ. මෙසේ මූලාර්ථයෙන් උපකාරක යයි මනාව පිහිටි බව සාධනයෙන් උපකාරක ධර්මයකැයි හේතුපපච්චය දතයුතුය.

ඉන්පසුව අරමුණු භාවයෙන් උපකාරක ධර්මය **ආරම්මණ පච්චයො** වේ. එය රූපායතනය විඤ්ඤාණ ධාතුව යයි අරඹා ද යම් යම් ධර්ම අරබයා යම් යම් ධර්මයෝ උපදිත්. චිත්ත චෛතසික ධර්ම රූපාදි අරමුණු අරබයාම උපදී ද සිටීද වේ. එහෙයින් සියළු චිත්ත චෛතසික ධර්මයන්ගේ අරමුණෙන් යුත් ධර්ම යයි ආරම්මණ පච්චය දතයුතුය.

ජ්‍යෙෂ්ඨ අර්ථයෙන් උපකාරක ධර්මය **අධිපති පච්චයා** වේ. සහජාත අරමුණු වශයෙන් ද්විධ වේ. එහි ඡන්ද අධිපති ඡන්ද සමපයුක්ත ධර්ම සහ එයින් උපදවන රූපවල අධිපති පච්චයෙ ප්‍රත්‍ය වේයයි ආදි වචනයෙන් ඡන්ද චිත්ත විරිය වීමංස සංඛ්‍යාත සතර ධර්ම සහජාත අධිපති පච්චය යයි දතයුතුය. ඒවා එකට නොවේ. යම්කලෙක ඡන්ද ධුරය ජ්‍යෙෂ්ඨ කොට සිත පවතී. එකල ඡන්දයම අධිපති වේ. ඉතිරි ඒවා නොවේ. සෙසු ඒවා කෙරෙහි ද මෙම නය වේ. යම්විට ධර්මය ගරුකොට අරූප ධර්ම පවතී. එය ඒවායේ ආරම්මණාධිපති වේ. එයින් කියන ලදී. 'යම් යම් ධර්ම ගරුකොට ඒ ඒ ධර්ම උපදී. චිත්ත චෛතසික ධර්ම, ඒ ඒ ධර්ම ඒ ඒ ධර්මයන්ට අධිපති පච්චයෙන් පච්චය වේ.

අනන්තරභාවයෙන් උපකාරක වූ ධර්මය **අනන්තර පච්චයො** වේ. සමනන්තර භාවයෙන් උපකාරක ධර්මය **සමනන්තර පච්චයො** වේ. මේ ප්‍රත්‍ය දෙක ද බොහෝසෙයින් ප්‍රපඤ්චව වේ. එහි සාරය මෙසේය. යමෙක මේ චක්ඛු විඤ්ඤාණයට අනතුරුව මනෝ ධාතු, මනෝධාතුවලට අනතුරුව මනෝ විඤ්ඤාණ ධාතු ආදි චිත්ත නියමය එය යම් හෙයකින් පෙර චිත්ත වශයෙන් ම සිදු වේ. වෙනස් අයුරකින් නොවේ. එහෙයින් තම තමාට අනතුරුව අනුරූප චිත්තුප්පාදයේ උපපාදන සමර්ථ ධර්මය අනන්තර පච්චය වේ. එයින් කීහ. 'අනන්තර පච්චය යයි චක්ඛුවිඤ්ඤාණ ධාතු එය සම්ප්‍රයුක්ත ධර්ම ද මනෝධාතුවෙන් එය සම්ප්‍රයුක්ත ධර්මවලටද අනන්තර පච්චයෙන් පච්චය යයි ආදිය වේ. යම් අනන්තර ප්‍රත්‍යයක් වේ නම් එයම සමනන්තර ප්‍රත්‍ය වේ. ව්‍යඤ්ජන මාත්‍රය පමණක් මෙහි විවිධය. උපචය සන්තති ආදියෙහි මෙන් අධිවචන නිරුක්ති ද්වකාදිවල මෙන් ද අර්ථ වශයෙන් නානා බවක් නැත. යම් මාර්ග අනන්තරයකින් ද අනන්තර පච්චය වේ. කාල අන්තර බවෙහි සමනන්තර පච්චය වේයයි ආචාර්යවරුන්ගේ මතයයි. එය නිරෝධයෙන් නැගිටින්නාට නෙවසඤ්ඤා නාසඤ්ඤා කුසල ඵල සමාපත්තියෙන් සමනන්තර පච්චයෙන් පච්චය වේ යයි ආදියෙන් විරුද්ධ වේ. එහි යමක් කියයි. ධර්මයන්ගේ ඉපදවීමේ සාමාර්ථ්‍යය නොපිරිහේ. භාවනා බලයෙන් වනාහි වලකන ලද බැවින් ධර්ම සමනන්තරව නූපදී. එය ද කාලාන්තර බවින් අභාවයම සාදයි. භාවනා බලයෙන් එහි කාල අන්තර බව නැතැයි අපිද එයම කියමු. යම්හෙයකින් කාල අන්තර නැත්ද එහෙයින් සමනන්තර පච්චය බව නොයෙදේ. කාල අනන්තරතාවෙන් ඔවුන්ට සමනන්තර පච්චය වේ යයි විශ්වාසය එනිසා ඇතුළත් නොකොට ව්‍යඤ්ජන මාත්‍රයෙන්ම මෙහි විවිධත්වය වේයයි දැනගන්න. අර්ථ වශයෙන් නොවේ. කෙසේද? මේවායේ අන්තරයක් නැත. අනන්තරය. සටහන්බවින් මනාසේ අනන්තර යයි සමනන්තර වේ.

ඉපදෙමින් ද ඉපදීම් භාවයෙන් ද උපකාරක ධර්මය **සහජාත පච්චයො** වේ. ආලෝකයට පහන මෙනි. එය අරූප ස්කන්ධ වශයෙන් සයාකාර වේ. යම්සේ කීහ. 'අරූපී සතර ස්කන්ධ ඔවුනොවුන් සහජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වේ. සතරමහා භූත ඔවුනොවුන්............බැසගන්නා ක්ෂණයෙහි නාමරූප ඔවුනොවුන්.......චිත්ත චෛතසික ධර්මයෝ සිතින් උපදවන රූපයන්ගේ........මහාභූත උපාදාය රූපවල රූපී ධර්ම අරූපී ධර්මවලට කිසි කාලයක් සහජාත පච්චයෙන් පච්චය වේ. කිසි කාලයක්

සහජාත පච්චයෙන් පච්චය නොවේ. මෙය හෘදය වස්තුවම සඳහා කියන ලදී.

ඔවුනොවුන් උපපාද උපත්ථම්භන භාවයෙන් උපකාරක ධර්මය අඤ්ඤමඤ්ඤ පච්චයො වේ. ඔවුනොවුන්ට උපස්ථම්භක ත්‍රිදණ්ඩ මෙන් එය අරූප ස්කන්ධ වශයෙන් ත්‍රිවිධ වේ. යම්සේ කීහ:- සතර අරූපී ස්කන්ධ අන්‍යොන්‍ය ප්‍රත්‍යයෙන් පච්චය වේ. සතරමහාභූත........බැසගන්නා ක්ෂණයෙහි නාමරූප අන්‍යෝන්‍ය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වේ.

අධිෂ්ඨාන ආකාරයෙන් නිසසය ආකාරයෙන් උපකාරක ධර්මය නිසසය පච්චයො වේ. තරු චිත්‍ර කර්මාදීන්ගේ පෘථිවි වස්ත්‍ර ආදිය මෙන් එය සතර අරූපී ස්කන්ධ ඔවුනොවුන් නිසසය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. මෙසේ සහජාතයෙහි කියන ලද නයින්ම දතයුතුය. මෙහි සවැනි කොට්ඨාශය චක්ඛායතනය, චක්ඛු විඤ්ඤාණ ධාතුව, සොත, ඝාන, ජිව්හා, කායායතන, කාය විඤ්ඤාණ ධාතු ඒ හා සම්ප්‍රයුක්ත ධර්මයන්ට නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වේ. යම් රූපයක් නිසා මනෝධාතු ද මනෝ විඤ්ඤාණ ධාතු ද පවතී. ඒ රූපය මනෝධාතුවෙන් ද මනෝ විඤ්ඤාණ ධාතුවෙන්ද ඒ හා සම්ප්‍රයුක්ත වූවන්ගේ ද නිසසය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වේ යයි මෙසේ බෙදන ලදී.

උපනිසසය පච්චයො යයි මෙහි මෙය වචනාර්ථය වේ. තද්ධිත වෘත්තියෙන් තමාගේ ඵලයෙන් නිශ්‍රිත වූයේ ප්‍රතික්ෂේප නොකරන ලද්දේ නිසසය වේ. යම්සේ වනාහි බොහෝ ආයාසය උපායාස වේ. මෙසේ බොහෝ නිසසය උපනිසසය වේ. බලවත් කාරණයට මෙය අධිවචනයකි. එහෙයින් බලවත් කාරණා භාවයෙන් උපකාරක ධර්මය උපනිසසය ප්‍රත්‍ය යයි දතයුතුය. එය ආරම්මණූපනිසසය, අනන්තරූපනිසසය, පකතූපනිසස යයි තුන් ආකාර වේ. එහි දන් දී සිල් සමාදන් වී පොහොය කර්ම කොට එය ගරුකොට ප්‍රත්‍යවේක්ෂා කරයි. පෙර හොඳ පුරුදු ගරුකොට ප්‍රත්‍යවේක්ෂා කරයි. ධ්‍යානයෙන් නැගිට ධ්‍යානය ගරුකොට ප්‍රත්‍යවේක්ෂා කරයි. සෛක්ෂ ගෝත්‍රභූ ගරුකොට ප්‍රත්‍යවේක්ෂා කරයි. පිරිසිදු බව ගරුකොට ප්‍රත්‍යවේක්ෂා කරයි. සෛක්ෂ මාර්ගයෙන් නැගිට මාර්ගය ගරුකොට ප්‍රත්‍යවේක්ෂා කරයි. යනාදි නයින් ආරම්මණා උපනිසසය ආරම්මණ අධිපතියා සමග නානත්වය නොකොට බෙදන ලදී. එහි යම් අරමුණක් ගරුකොට චිත්ත චෛතසික උපදී. එය නියමයෙන් ඒවායේ

අරමුණුවල බලවත් අරමුණ වේ. මෙසේ ගරු කළයුතු අර්ථයෙන් අරමුණු අධිපති බලවත් කාරණ අර්ථයෙන් ආරම්මණ උපනිස්සය යයි මෙසේ මේවායේ නානා බව දතයුතුය. අනන්තරූප නිස්සය ද පෙර වූ කුසල ස්කන්ධ පසු කුසලයේ ස්කන්ධයන්ගේ උපනිස්සය ප්‍රත්‍යයෙන් පච්චය වේයයි යනාදි නයින් අනන්තර පච්චය සමග නානත්වය නොකොට බෙදන ලදී. මාතෘකා තැබීමේ වනාහි ඒවායේ චක්ඛු විඤ්ඤාණ ධාතු එය හා සම්ප්‍රයුක්ත ධර්මද මනෝධාතුව එය සම්ප්‍රයුක්ත ධර්මවලට ද අනන්තර පච්චයෙන් පච්චය යනාදි නයින් අනන්තරයට ද මුලින් මුලින් වූ කුසල ධර්ම පසු පසුව වූ කුසල ධර්මවලට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වේ. යනාදි නයින් උපනිස්සය ද ආ බැවින් බහා තබන විශේෂයක් ඇත. එය ද අර්ථ වශයෙන් ඒකීභාවයටම යයි. මෙසේ ඇතිකල්හිද තම තමාගේ අනන්තරය අනරූප චිත්තුප්පාදයේ පැවැත්ම සමත් බවෙන් අනන්තරබව වේ. පෙර සිතටද පසු චිත්තුප්පාදයෙන් බලවත් අනන්තර උපනිස්සය බව දතයුතුය. යම්සේ වනාහි හේතුප්‍රත්‍යාදියෙහි කිසි ධර්මයක් නැතිවද සිත උපදී. මෙසේ අනන්තර සිත නැතිව සිතේ උපතක් නම් නැත. එහෙයින් බලවත් ප්‍රත්‍ය වේ. මෙසේ තම තමාගේ අනන්තර අනුරූප චිත්තුප්පාද වශයෙන් අනන්තර පච්චය බලවත් කාරණය වශයෙන් අනන්තර උපනිස්සය වේ. මෙසේ මේවායේ නා නා බව දතයුතුය. පකතුපනිස්සය වනාහි ප්‍රකෘතියෙන් උපනිස්සය පකතුපනිස්සය නම් තමාගේ සන්තානයෙහි උපන් හෝ සද්ධා සීලාදි උපසේවිත හෝ ඍතු භෝජනාදි ප්‍රකෘතීන් හෝ උපනිස්සය වූයේ පකතුපනිස්සය වේ. අරමුණු අතරෙහි අසම්මිශ්‍ර යන අර්ථයයි. එහි පකතුපනිස්සය සද්ධාව නිසා දන් දෙයි. සිල් සමාදන් වෙයි. පෙහෙවස් රකියි. ධ්‍යාන උපදවයි. විපස්සනා උපදවයි. මාර්ගය උපදවයි. අභිඤ්ඤා උපදවයි. සමාපත්ති උපදවයි. සීල සුත චාග පඤ්ඤා උපනිශ්‍රයෙන් දන් දෙති..........සමාපත්ති උපදවයි. සද්ධා සුත සීල චාග පඤ්ඤා, සද්ධාය, සීලස්ස, සුතස්ස, චාගස්ස, පඤ්ඤාය (ශ්‍රද්ධාවේ සීලයේ ඇසීමේ ත්‍යාගයේ ප්‍රඥාවේ) උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වේ යනාදි නයින් අනේකප්‍රකාර වූ ප්‍රභේද දතයුතුය. මෙසේ මේ ශ්‍රද්ධාදිය ප්‍රකෘති මෙන්ම බලවත් කාරණාර්ථයෙන් උපනිස්සය දැයි පකතුපනිස්සය වේ.

පළමුව ඉපදී වර්තමාන භාවයෙන් උපකාරක ධර්මය පුරෙජාත පච්චයො වේ. එය පඤ්චද්වාරයෙහි වත්‍ථු ආරම්මණ හදයවත්‍ථු වශයෙන් එකොළොස් වැදෑරුම් වේ. යම්සේ කීහ. චක්ඛායතනය, චක්ඛු විඤ්ඤාණ ධාතුව එය සම්ප්‍රයුක්ත ධර්මයන්ටද පුරෙජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වේ.

සොත, ඝාන, ජිව්හා, කායායතන, රූපායතන, සද්ද, ගන්ධ, රස, පොට්ඨබ්බායතන කාය විඤ්ඤාණ ධාතුව එය සම්ප්‍රයුක්ත ධර්මයන්ට පුරේජාත පච්චයෙන් පච්චය වේ. රූප, සද්ද, ගන්ධ, රස, ස්පර්ශායතන, මනෝධාතුව එය සම්ප්‍රයුක්ත ධර්මවලට පුරේජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වේ. යම් රූපයක් නිසා මනෝධාතු මනෝ විඤ්ඤාණ ධාතු ද පවතී. ඒ රූපය මනෝධාතු එය සම්ප්‍රයුක්ත ධර්මයන්ට ද පුරෙජාත පච්චයෙන් පච්චය වේ. මනෝ විඤ්ඤාණ ධාතුව එය සම්ප්‍රයුක්ත ධර්මවලට කිසියම් කාලයක් පුරෙජාත පච්චයෙන් පච්චය වේ. කිසියම් කාලයක් පුරෙජාත පච්චයෙන් පච්චය නොවේ.

පුරේජාත ධර්මයන්ට උපස්ථම්භක අර්ථයෙන් උපකාරක අරූප ධර්මය **පච්ඡාජාත පච්චයො** වේ. ගිජුපෝතක ශරීරවලට ආහාරය ඒ චේතනා මෙන් එයින් කියන ලදී. පසුව උපන් චිත්ත චෛතසික ධර්ම පුරෙජාත මේ ශරීරයට පච්ඡාජාත පච්චයෙන් පච්චය වේ.

ආසේවන අර්ථයෙන් අනතුරුව ප්‍රගුණ බව බලවත් බැවින් උපකාරක ධර්මය **ආසෙවන පච්චයො** වේ. ග්‍රන්ථාදියෙහි පුරිම පුරිම අභියෝගය මෙන් ඒ කුසල අකුසල ක්‍රියා ජවන වශයෙන් ත්‍රිවිධ වේ. යම්සේ කීහ:- මුලින් මුලින් වූ කුසල ධර්ම පසු පසු වූ කුසල ධර්මයන්ට ආසේවන පච්චයෙන් පච්චය වේ. මුලින් මුලින් වූ අකුසලා........ක්‍රියා අබ්‍යාකතා ධර්ම පසු පසු වූ ක්‍රියා අබ්‍යාකතා ධර්මයන්ට ආසෙවන පච්චයෙන් පච්චය වේ.

චිත්ත ප්‍රයෝග සංඛ්‍යාත ක්‍රියා භාවයෙන් උපකාරක වූ ධර්මය **කම්මපපච්චයො** නම් වේ. එය නානාක්ෂණික මෙන්ම කුසලාකුසල චේතනාවල සහජාතද සියළු චේතනා වශයෙන් ද්විධය කීහ. කුසලාකුසල කම්මවිපාකවලට ස්කන්ධයන්ගේ කටත්තා රූපවලට කම්ම පච්චයෙන් පච්චය වේ.

නිරුත්සාහ සාන්ත භාවයෙන් නිරුත්සාහ සාන්තභාවයට උපකාරක ධර්මය **විපාක පච්චයො** නම් වේ. එය පවත්නේ චිත්ත සමුට්ඨාන ප්‍රතිසන්ධිය කටත්තා ද රූපවලට සියළු තැන සම්ප්‍රයුක්ත ධර්මවලට විපාක පච්චයෙන් පච්චය වේ. යම්සේ කීහ. විපාක අබ්‍යාකත තුන් ස්කන්ධයන් ගෙන එක් ස්කන්ධයකි. චිත්ත සමුට්ඨාන රූපවලට විපාක

පච්චයෙන් පච්චය වේ.........පටිසන්ධි ක්ෂණයෙහි විපාක අබ්‍යාකත එක් ඛන්ධයකි..........ඛන්ධ දෙකකි. කඳු දෙකට කටත්තාවලටද රූපවලටද විපාක පච්චයෙන් පච්චය වේ. ස්කන්ධවලට වස්තුවට විපාක පච්චයෙන් පච්චය වේ.

රූප අරූපවලට උපස්ථම්භක අර්ථයෙන් උපකාරක වන ආහාර සතර **ආහාර පච්චයො** වේ. යථාහ:- 'මේ කයට කබලිංකාර ආහාරය ආහාර පච්චයෙන් පච්චය වේ. අරූපී ආහාර සම්ප්‍රයුක්ත ධර්මයන්ට ඒවායින් උපන් රූපවලටද ආහාර පච්චයෙන් පච්චය වේ' ප්‍රශ්න වාරයෙහි වනාහි ප්‍රතිසන්ධිය ක්ෂණයෙහි විපාක අව්‍යාකත ආහාර සම්ප්‍රයුක්ත ඛන්ධවලට කටත්තාවලට ද රූපවලට ද ආහාර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වේයයි කියන ලදී.

අධිපති අර්ථයෙන් උපකාරක වූ ස්ත්‍රී පුරුෂ ඉන්ද්‍රිය හැර විසි ඉන්ද්‍රිය **ඉන්ද්‍රිය පච්චයො** නම් වේ. එහි චක්ඛු ඉන්ද්‍රියාදිය අරූප ධර්ම වේ. සෙස්ස රූප අරූපවලට ප්‍රත්‍ය වේ. යම්සේ කීහ. චක්ඛු ඉන්ද්‍රිය චක්ඛු විඤ්ඤාණ ධාතුවටද සොත, ඝාන, ජිව්හා, කාය ඉන්ද්‍රිය කාය විඤ්ඤාණ ධාතුවටද එය සම්ප්‍රයුක්ත ධර්මවලට ද ඉන්ද්‍රිය පච්චයෙන් පච්චය වේ. රූප ජීවිතේන්ද්‍රිය කටත්තා රූපවලට ඉන්ද්‍රිය පච්චයෙන් පච්චය වේ. අරූපී ඉන්ද්‍රිය සම්ප්‍රයුක්ත ධම්මවලට ද එයින් උපන් රූපවලට ද ඉන්ද්‍රිය පච්චයෙන් පච්චය වේ. ප්‍රශ්න වාරයෙහි වනාහි ප්‍රතිසන්ධි ක්ෂණයෙහි විපාක අව්‍යාකත ඉන්ද්‍රිය සම්ප්‍රයුක්ත ධම්මවලට කටත්තාද රූපවලට ඉන්ද්‍රිය පච්චයෙන් පච්චය වේයයි ද කියන ලදී.

උපනිජ්ඣායන (නැවත සිතා බැලීම්) අර්ථයෙන් උපකාරක දෙපස් විඤ්ඤාණය හැර කායික සැප දුක් වේදනා දෙක සියළු කුසල භේද සත් ධ්‍යානාංග **ඣාන පච්චයො** වේ. යම්සේ කීහ. ධ්‍යානාංග ධ්‍යාන සම්ප්‍රයුක්ත ධර්මවලට එයින් උපන් රූපවලටද ඣාන පච්චයෙන් පච්චය වේ. ප්‍රශ්න වාරයෙහි ප්‍රතිසන්ධි ක්ෂණයෙහි විපාක අව්‍යාකත ධ්‍යානාංග සම්ප්‍රයුක්ත ස්කන්ධවලට කටත්තා ද රූපවලට ඣාන පච්චයෙන් පච්චය වේ යයි කියන ලදී.

යම් ඒ තැනකින් පැමිණවීම් අර්ථයෙන් උපකාරක කුසලාදි භේදයෙන් යුත් දොළොස් මාර්ගාංග **මග්ග පච්චයො** වේ. යම්සේ කීහ. 'මාර්ග අංග මාර්ග සම්ප්‍රයුක්ත ධර්මවලට එයින් උපදවන රූපවලට

මගග පච්චයෙන් පච්චය වේ. ප්‍රශ්න වාරයෙහි වනාහි පිළිසිඳුම් කෙණෙහි විපාක අව්‍යාකතවලට මගග අංග සම්ප්‍රයුක්ත ඛන්ධවලට කටත්තා රූපවලටද මගග පච්චයෙන් පච්චය වේයයි කියන ලදී. මේ ඣාන මගග පච්චය දෙකම දෙපස් විඤ්ඤාණ අහේතුක සිත්වල නොලැබේ යයි දතයුතුය.

ඒක වස්තු ඒක ආරම්මණ ඒක උප්පාද ඒක නිරෝධ සංඛ්‍යාත සම්ප්‍රයුක්තභාවයෙන් උපකාරක අරූප ධම්ම **සමපයුතත පච්චයො** වේ. යම්සේ කීහ. අරූපී සතර ස්කන්ධවලට ඔවුනොවුන් සම්ප්‍රයුක්ත පච්චයෙන් පච්චය වේ.

ඒකවත්ථුකාදිභාව අනුපගමයෙන් උපකාරක රූපී ධර්ම අරූපී ධර්මවලට අරූපී ධර්ම රූපී ධර්මවලට විපපයුතත පච්චයෙන් පච්චය වේ. එය සහජාත, පුරෙජාත, පච්ඡාජාත වශයෙන් ත්‍රිවිධ වේ. මෙය කියන ලදී. 'සහජාත කුසල චේතනාව' සිතින් උපදවන රූපවලට **විපපයුතත පච්චයෙන්** පච්චය වේ. පච්ඡාජාත කුසල ඛන්ධ පුරෙජාතයට මේ කයට විපපයුතත පච්චයෙන් පච්චය වේ. ස්කන්ධ වස්තුවට, වස්තු ස්කන්ධවලට විපපයුතත පච්චයෙන් පච්චය වේයි කියන ලදී. පුරේජාතය වනාහි චක්ඛු ඉන්ද්‍රියාදී වස්තු වශයෙන්ම දතයුතුය. යම්සේ කීහ. පුරේජාතය, චක්ඛායතනය, චක්ඛු විඤ්ඤාණයට...........කායගත කාය විඤ්ඤාණයට විපපයුතත පච්චයෙන් පච්චය වේ. වත්ථුවිපාක අව්‍යාකතවලට ක්‍රියා ආඛ්‍යාකතවලට ස්කන්ධවලට වස්තු කටයුතුවලට ස්කන්ධවලට විපපයුතත පච්චයෙන් පච්චය වේ.

වර්තමාන ලක්‍ෂණයෙන් ඇත යන බවෙන් එබඳු වූම ධර්මයනට උපස්ථම්භක අර්ථයෙන් උපකාරක ධර්මය **අත්ථි පච්චයො** නම් වේ. එයට අරූප ස්කන්ධ, මහාභූත, නාමරූප, චිත්ත චෛතසික, ආයතන, වස්තු වශයෙන් මාතෘකා සත්ආකාර කොට තබන ලදී. යම්සේ කීහ:- අරූපී සතර ස්කන්ධ, ඔවුනොවුන්ට අත්ථි පච්චයෙන් පච්චය වේ. මහාභූතයෝ ඔවුනොවුන්ට බැසගන්නා ක්‍ෂණයෙහි නාමරූප ඔවුනොවුන්, චිතත චෛතසික ධර්ම සිතින් හටගන්නා රූප, මහාභූත, උපාදාන රූප, චකඛායතන, චකඛු විඤ්ඤාණ ධාතුව.......... කාය ආයතන......... පොට්ඨබ්බායතන කාය විඤ්ඤාණ ධාතුව සම්පයුත්ත ධර්ම යන මේවාට අත්ථි පච්චයෙන් පච්චය වේ. රූපායතනය.....පොට්ඨබ්බායතනය....මනෝ

ධාතුව එය සමපයුතත ධමම මේවාට අත්ථි පච්චයෙන් පච්චය වේ. යම් රූපයක් නිසා මනෝධාතු ද මනෝ විඤ්ඤාණ ධාතු ද පවතීද ඒ රූපය මනෝධාතුව මනෝවිඤ්ඤාණ ධාතුව එය සමපයුතත ධමම යන මේවාට අත්ථි පච්චයෙන් පච්චය වේ. ප්‍රශ්න වාරයෙහි වනාහි සහජාත පුරෙජාත පච්ඡාජාත ආහාර ඉන්‍ද්‍රියද තබා සහජාතයෙහි එක් ස්කන්ධයක් ස්කන්ධයන් තුනක චිත්ත සමුට්ඨාන රූපවලට අත්ථි පච්චයෙන් පච්චය වේයයි ආදි නයින් නිද්දේස කරන ලදී. පුරෙජාතයෙහි පුරෙජාතවලට චක්ඛු ආදීන්ගේ වශයෙන් නිර්දේශ කරන ලදී. පච්ඡාජාතයෙහි පුරෙජාතයට මේ කයට පච්ඡාජාත චිත්ත චෛතසිකයන්ට පච්චය වශයෙන් නිර්දේශ කරන ලදී. ආහාර ඉන්‍ද්‍රියවල වනාහි කබලීකාර ආහාරය. මේ කයට අත්ථි පච්චයෙන් පච්චය වේ. රූප ජීවිතේන්‍ද්‍රිය කටතතා රූපවලට අත්ථි පච්චයෙන් පච්චය වේ. මෙසේ නිද්දේස කරන ලදී.

තමාගේ අනනතරය උපදින්නන්ගේ අරූප ධර්මයන් ගේ පැවැත්ම අවකාශාදීමෙන් උපකාරක සමනනතර නිරුද්ධ අරූප ධර්ම **නත්ථි පච්චයො** වේ. යම්සේ කීහ:- සමනනතර නිරුද්ධ චිත්ත චෛතසික ධර්ම වර්තමාන චිත්ත චෛතසික ධර්මයන්ට නත්ථි පච්චයෙන් පච්චය වේ. (නැති පසින් පස වේ.)

ඒ වෙන් වූ බවෙන්ම උපකාර කරන බව **විගත පච්චයො** වේ. යම්සේ කීහ:- සමනනතර විගත (ඉවත් වූ) චිත්ත චෛතසික ධර්ම පටුපපනන චිත්ත චෛතසික ධර්මවලට විගත පච්චයෙන් පච්චය වේ.

අත්ථි පච්චයම අවිගත භාවයෙන් උපකාර කරන බව **අවිගත පච්චයො** යයි දතයුතුය. දේශනා විලාශයෙන් වනාහි එසේ හික්මවිය යුතු විනේයන් වශයෙන් හෝ මේ දෙක කියන ලදී. සහේතුක දෙකක් කියා ද හේතු සම්ප්‍රයුක්ත දෙකක් වෙත්.

මේ සූවිසි ප්‍රත්‍යවල අසසම්මෝහය පිණිස :-

**දහම් කල් සමගින් - නා නා බේද විසිනා**
**පස ඉපදුමෙන් හා - විනිස දතයුතු වන්නේ**

එහි 'ධම්මතො' යනු මේ පච්චයවල හේතුපච්චය නාමරූප ධර්මවල නාමධර්ම ඒක දේශයකි. ආරම්මණ පච්චය සමග පඤ්ඤත්තියෙහි ද අභාවයෙන් සියල්ලම නාමරූප ධර්ම වේ. අධිපති පච්චයෙහි සහජාත අධිපති නාම ධර්මයෙන් ඒක දේශයකි. (එක් කොටසකි.) එසේම කම්ම, ඣාන, මග්ග පච්චයෝය. ආරම්මණ අධිපති සියල්ලම ගරුකළයුතු ආරම්මණ ධර්ම වේ. අනන්තර, සමනන්තර, පච්ඡාජාත, සේවන, විපාක, සම්පයුත්ත, නත්ථි, විගත පච්චයෝ නාම ධර්ම වේ. නිවනෙහි අසංගෘහිත බැවින් නාම ධර්ම ඒකදේශයකැයි කීමට වටී. පුරේජාත පච්චය රූප ඒකදේශයකි. සෙස්ස ලැබෙන ලෙස නාම රූප ධර්ම වේ. මෙසේ මෙහි ධර්ම වශයෙන් විනිශ්චය දතයුතුය. කාල වශයෙන් :-

වත්මනෙහි දනු මෙහි - පස පසළොසක් වන්නේ
අයූහි පසකි පස - ඒවා දෙකල් ඇසුරුය
තුන්කල්හි තුණකුත් - කල්මුත් පසද වන්නේ

මේවායෙහි හේතුපච්චය, සහජාත, අඤ්ඤමඤ්ඤ නිස්සය, පුරෙජාත, පච්ඡාජාත, විපාක, ආහාර, ඉන්‍ද්‍රිය, ඣාන, මග්ග, සම්පයුත්ත, විප්පයුත්ත, අත්ථි, අවිගත පච්චය යන මේ පසළොස් පච්චය වර්තමාන ධර්ම වේ. අනන්තර පච්චය, සමනන්තර, ආසේවන, නත්ථි විගත පච්චය යයි මේ පහ අතීත වේ. එකක් වනාහි කම්ම පච්චය වේ. ඒවා වර්තමාන අතීත කාල දෙකම ඇසුරු කරයි. සෙසු ආරම්මණ පච්චය, අධිපති පච්චය, උපනිස්සය පච්චය යන මේ පච්චය තුන ත්‍රෛකාලිකය. පඤ්ඤත්තිය සමග නිවන සංග්‍රහ කළ බැවින් කාලවිමුත්ත ද වේ. මෙසේ මෙහි කාල වශයෙන් ද විනිශ්චය දතයුතුය. 'නානා ප්‍රකාර භේදයෙන් පච්චයුප්පන්න (පස උපන්) වශයෙන්' යන මේ පද දෙකේ අර්ථය නිද්දේස වාරයෙහි එන්නේ ය.

## උද්දේස වාර වර්ණනාව
## නිමි.

**හෙතු පච්චය**

දැන් ඒ සියළු ප්‍රත්‍යයන් උද්දේස කළ පිළිවෙළින් නිද්දේස කොට දැක්වීමට **හෙතුපච්චයොති හෙතු හෙතු සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං හෙතු පච්චයෙන පච්චයො** යනාදිය කීහ.

එහි **හෙතුපච්චයො** සූවිසි ප්‍රත්‍යවල තැබූ පිළිවෙළින් සියල්ලට පළමු බෙදිය යුතු පදය උපුටා දැක්වීමය. සෙසු ප්‍රත්‍යවල ද මෙම නයින්ම පළමුව බෙදිය යුතු පදය උපුටා ම විසඳීම කරන ලදැයි දතයුතුය. මේ මෙහි සම්බන්ධය වේ. පච්චය උද්දේසයෙහි යමක් හෙතුපච්චය යයි උදෙසන ලදී. එය නිද්දේසයෙන් හේතු හේතු සම්පයුත්ත ධර්මවලට ද එයින් උපන් රූප ධර්මවලට ද හේතු පච්චයෙන් පච්චය වේ යයි මෙසේ දතයුතුය. මෙම උපායෙන් සියළු පච්චයවල බෙදිය යුතු පදයේ විසඳීම සමග සම්බන්ධය දැනගත යුතුය. දැන් **හෙතු හෙතුසම්පයුත්තකානං** යන මෙහි හේතුසම්පයුත්තකානං යයි නොකියා හෙතු හෙතුසම්පයුත්තකානං යයි කුමක් හෙයින් කියන ලදද? පච්චය මෙන්ම පච්චයෙන් උපන් දෙයද විස්තර කිරීම් වශයෙනි. හෙතුසම්පයුත්තකානං යයි කීකල්හි හේතුවෙන් සම්පයුක්ත වූවන්ට හේතු පච්චයෙන් පච්චය වේ යයි අර්ථ වන්නේය. මෙසේ ඇතිකල්හි අසවල් ධර්මය හේතුපච්චයෙන් පච්චය වේයයි පච්චය නියමය නො පෙනෙන්නේ ය. තව ද හේතුවෙන් සම්ප්‍රයුත්ත වූවන්ගේ හේතු සම්ප්‍රයුක්තයන්ගේ යයි අර්ථය නොගෙනම යම්කිසි සම්ප්‍රයුක්තයන්ට හේතු පච්චයෙන් පච්චය වේයයි අර්ථය වන්නේය. මෙසේ ඇතිකල්හි හේතුවෙන් විප්‍රයුක්ත චක්ඛු විඤ්ඤාණාදිය ද සම්ප්‍රයුක්තයන්මය. හේතුවෙන් සම්ප්‍රයුත්ත කුසලාදිය ද එසේය. එහි මේ හේතු අසවල් සම්ප්‍රයුක්ත ධර්මයට ප්‍රත්‍ය යයි පච්චයෙන් උපන් නියමය නො පැනෙන්නේ ය. එහෙයින් පච්චය ද පච්චය උපපන්නය ද පැහැදිලි කරන්නේ හේතු හේතු සම්ප්‍රයුත්තකානං යයි කීය. එහි තේරුම හේතු සම්ප්‍රයුක්ත වූ කුසලාදි ධර්මවලට යම් හේතු සම්ප්‍රයුක්තයක් වේද, එය හේතු ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. එහිද පච්චයයි නොකියා හේතු පච්චයෙන් යයි වචනය හේතුවේ. අන්‍යථා පච්චයභාවය ප්‍රතිසේධ කිරීම සඳහා. මේ හේතු හේතු පච්චයෙන් ද පච්චය වේ. සහජාතාදි පච්චයෙන් ද පච්චය වේ. එහි යම් මේ සහජාතාදි පච්චයෙන් අන් ආකාරයකින් ද පච්චයභාවය වේ. එය ප්‍රතිසේධනය සඳහා හේතුපච්චයෙන් යයි කියන ලදී. මෙසේ ඇතිකල්හි ද එය සම්ප්‍රයුක්තකාන යයි නොකියා කුමක් හෙයින් හේතු සම්පයුත්තකානං යයි කියන ලද්දේද? නිද්දේස කළයුත්තේ අප්‍රකට බැවිනි.

එය සමපයුකතකානං යයි කීකල්හි යමකින් එය සමපයුතතක නම් වේ. මේ එය යයි නිද්දේස කළයුත්ත අප්‍රකටය. එහි අප්‍රකට බැවින් යමකින් සම්පයුක්තය. එය සම්පයුත්තකා යයි කියති. එය ස්වරූපයෙන්ම දැක්වීමට හේතුසම්පයුත්තකානං යයි කියන ලදී.

තං සමුට්ඨානං මෙහි නිදෙසිය යුත්ත ප්‍රකට බැවින් 'තං' ගැනීම කරන ලදී. මෙහි අර්ථය මෙසේය. ඒවා හේතු සහ හේතුසම්ප්‍රයුක්ත ධර්මද වේ. සමුට්ඨානා එතෙසං හටගැනීම මොවුන්ටය යනු තං සමුට්ඨානානි ඒ සමුට්ඨානයන්ගේ හේතුවෙන් මෙන්ම හේතුවලින් යුත් ධර්මවලින් ද නිපත්තන්ගේ යන අර්ථය වේ. මෙයින් චිත්ත සමුට්ඨාන රූප (සිතෙන් උපදින රූප) ගනියි. කිම එය වනාහි සිතින් ද අනිකකින් උපදී ද? ඔව් උපදී. සිය චිත්ත චෛතසික එකතුව රූප උපදවයි. ලෞකික ධර්ම දේශනාවල වනාහි සිතේ අධික භාවයෙන් එබඳු රූප චිත්ත සමුට්ඨානං යයි කියයි. එයින් කීහ:- චිතත චෛතසික ධර්ම චිතත සමුට්ඨාන රූපයන්ගේ සහජාත පච්චයෙන් පච්චය වේ යයි. ඉදින් මෙසේ මෙහි ද 'තං සමුට්ඨානං' යයි නොකියා චිතත සමුට්ඨානං යයි කුමක් හෙයින් කියන ලදද? අචිතත සමුට්ඨානද ගන්නා බැවිනි. ප්‍රශ්න වාරයෙහි පිළිසිඳුම් කෙණෙහි විපාක අව්‍යාකෘත හේතුසම්ප්‍රයුක්ත ස්කන්ධවලට කටත්ත රූපවලට ද හේතුපච්චයෙන් පච්චය වේයයි ආවේය. එය සංග්‍රහ කිරීම සඳහා මෙහි 'චිතත සමුට්ඨානං' යයි නොකියා 'තං සමුට්ඨානං' යයි කියන ලදී. එහි අර්ථය චිතතජ රූප (සිතින් හටගන්නා රූප) නො උපදවන්නේ ද ඒ හේතු හේතුවලින් යුත් ධර්ම සහජාතාදි පච්චය වශයෙන් ඉපදවීම මොවුන්ට වේයයි තං සමුට්ඨානානි වේ. ඒවායේ ඒ සමුට්ඨාන පවතින කල්හි චිතතජ පටිසන්‍ධියද කටතතා රූපවලට ද හේතු හේතු පච්චයෙන් පච්චය වේ. මෙම උපායෙන් අනිත් තැන්වල 'තං සමුට්ඨාන' ආ තැන්වල අර්ථය දතයුතුය. එහෙයින් මේ හේතු පටිසන්‍ධියම කටත්ත රූපවලට හේතුපච්චය වේ. නොපවත්නා කල්හි පටිසන්‍ධියෙහි කම්මජ රූපයන්ගේ චිත්ත පටිබද්ධව පැවතීමෙන් පටිසන්ධියෙහි කමම රූප චිතත පටිබද්ධව පවතී. සිත් වශයෙන් ඉපදීම ද සිටීමද වේ. ඒ ක්‍ෂණයෙහි සිත චිතතජ රූප ඉපදවීමට නොහැකි වේ. ඒවාද හැර සිතින් ඉපදවීමට හෝ සිටීමට හෝ නොහැකි වේ. එහෙයින්ම කීහ. 'විඤ්ඤාණ පච්චයා නාමරූපං' එය පිහිටි කල්හි විඤ්ඤාණයෙහි නාමරූප බැසගැන්ම වේ'යයි පැවතීම වනාහි ඒවායේ සිත විද්‍යමාන වූ කල්හිද කමම පටිබදධවම පවතී. චිත්ත පටිබදධව නොවේ. සිත නොපවත්නා කල්හිද

නිරෝධයට පැමිණෙන්නන්ගේ ඉපදීමය. පටිසන්ධි ක්ෂණයෙහි සිත චිත්තජ රූප ඉපදවීමට නොහැකිවන්නේ කුමක් නිසාද? කර්ම වේගයෙන් බහා තැබීමද වස්තු තුන නොපිහිටීමද දුර්වල බැවිනි. එහි එකල්හි කර්ම වේගයෙන් තබන ලද පෙර නූපන් වස්තුක බවද නොපිහිටි වස්තු යයි දුර්වල වේ. එහෙයින් ප්‍රපාතයෙහි වැටෙන මිනිසෙක් කිසි ශිල්පයක් කිරීමට නොහැකි මෙන් රූප ඉපදවීමට නොහැකි වේ. කර්මජ රූපම චිත්ත සමුට්ඨාන රූප ස්ථානයෙහි සිටී. එය කර්මජ රූපවල බීජ ස්ථානයෙහි සිටියි. කර්මය වනාහි කුඹුර හා සමානය. කෙලෙස් ජලය මෙනි. එසේ ඇතිකල්හි කෙතෙහිද ජලයෙහි ද පළමු උපතෙහි බීජානුභාවයෙන් රුක් ඉපදීම මෙන් පටිසන්ධි ක්ෂණයෙහි චිත්තානුභාවයෙන් රූපකායේ උපත වේ. බීජය නැති කල්හිද පොළොව ජලය මේවායේ ආනුභාවයෙන් ගසේ මතු මත්තෙහි පැවැත්ම මෙන් සිත නැතිව කර්මයෙන්ම කටත්තා රූපයන්ගේ පැවැත්ම වේයයි දතයුතුය. එය කියන ලදී. කර්මය කෙතය. විඤ්ඤාණය බීජයයි. තෘෂ්ණාව ස්නේහයයි. මේ අර්ථය වනාහි ඕකාශ වශයෙන්ම ගතයුතුය. ඕකාශ තුනකි. නාම ඕකාස, රූප ඕකාස, නාමරූපොකාස යනුවෙනි. එහි අරූප භවය නාම ඕකාස වේ. එහි හෘදය වස්තු මාත්‍රයම රූප ප්‍රත්‍යය හැර අරූප ධර්මම උපදී. අසඤ්ඤභවය රූපොකාස නම්. එහි පටිසන්ධි සිත පමණක් අරූප ප්‍රත්‍ය හැර රූප ධර්මම උපදී. පංචවෝකාර භව නාමරූපෝකාස නම්. එහි වස්තු රූප පමණක් පටිසන්ධියෙන් තොරව අරූප ධර්ම පටිසන්ධි සිතද කර්මජ හැර රූප ධර්ම නූපදී. යුගනන්ධව රූප අරූප උපත. යම්සේ සස්වාමික සරාජ ගෙදර දොරටුපල්ලන් රජ අණ හැර ප්‍රථම ප්‍රවේශය නම් නැත. පසුකාලයේ වනාහි අණ හැරද පෙර අණෙහි ආනුභාවයෙන්ම වේ. එසේම පංචවෝකාර පටිසන්ධි විඤ්ඤාණ රජුගේ සහජාතාදි පච්චයභාව හැර රූපයට පටිසන්ධි වශයෙන් පළමු උපත නම් නැත. පසුව වනාහි පටිසන්ධි විඤ්ඤාණය නැතිව සහජාතාදි පච්චයානුභාවය පෙර ආනුභාව වශයෙන් ලැබූ ප්‍රවේශයේ කර්ම වශයෙන් පවතී. අසඤ්ඤ භවයෙහි වනාහි යම්හෙයකින් අරූප ඕකාශ නැත. එහෙයින් එහි අරූප ප්‍රත්‍ය හැරද අසඤ්ඤසත්වයේ රූප පවතී. අස්වාමික ශූන්‍ය ගෙදර තමාගේ ගෙයෙහිද පුරුෂයන්ගේ ප්‍රවේශය මෙන් අරූප භවයෙහි ද රූපඕකාශ නොවේ. එහෙයින් එහි රූපප්‍රත්‍ය නැතිව අන්‍ය ඕකාශයකින් අරූප ධර්ම පවතී. පංචවෝකාර භවය වනාහි රූප අරූප ඕකාශ එහි නැත. එහි අරූප ප්‍රත්‍ය හැර ප්‍රතිසන්ධි ක්ෂණයෙහි රූපයන්ගේ උපත වේ. මෙසේ මෙය හේතු පටිසන්ධියම කටත්තා රූපවලට ප්‍රත්‍ය වේ. නො පවත්වයි. හේතු

සහජාතයන්ට හේතු පච්චයෙන් පච්චයයි කීකල්හි සියල්ලම මේ අර්ථය ගන්නා ලද්දේ නොවේද? ඉක්බිති කුමක් හෙයින් හේතු සම්ප්‍රයුක්ත ධර්මයන්ට එය උපදවන රූපයන් යයි මෙය ගන්නා ලද්දේද? පැවැත්මෙහි කටත්තා රූපාදීන්ට ප්‍රත්‍යභාවය ප්‍රතිබාහනය කිරීමෙන් මෙසේ ඇතිකල්හි යම් පැවැත්මෙහි හේතුව සමග ඒකක්ෂණයෙහි කටත්තා රූප මෙන්ම උතු ආහාර සමුට්ඨාන ද උපදී. ඒවායේ ද හේතු හේතුප්‍රත්‍ය යයි පැමිණෙන්නේය. එය ඒවාට ප්‍රත්‍ය නොවේ. එහෙයින් ඒවායේ ප්‍රත්‍යභාවයේ මෙය ප්‍රතිබාහනය පිණිස ගන්නා ලදැයි දතයුතුය.

දැන් නා නා ප්‍රකාර භේදයෙන් පච්චය උපන් හෙයින් යයි මේ පදයන්ගේ වශයෙන් මෙහි විනිශ්චය වේ. ඒවා අතරින් නා නා ප්‍රකාර භෙදතො යයි මෙහි හේතු නම් ජාතියෙන් කුසල අකුසල විපාක ක්‍රියා යයි භේද වශයෙන් සතරාකාරය. එහි කුසල හේතු භූමි වශයෙන් කාමාවචරාදි භේදයෙන් සතරාකාරය. අකුසල හේතු කාමාවචරද විපාක හේතු කාමාවචරාදි භේදයෙන් සතරවිධය. කිරිය හේතුවෙන් කාමාවචර රූපාවචර අරූපාවචර යයි තුන්ආකාරය. එහි කාමාවචර කුසල හේතු නාමයෙන් අලොභාදි වශයෙන් ත්‍රිවිධය. රූපාවචරාදි කුසල හේතුවල ද මෙම නය වේ. අකුසල හේතු ලෝභාදි වශයෙන් ත්‍රිවිධය. විපාක කිරිය හේතු වනාහි අලෝභාදි වශයෙන් තුන තුන වේ. ඒ ඒ චිත්ත සම්පයෝග වශයෙන් වනාහි ඒ ඒ හේතුන්ගේ නා නා ප්‍රකාර භේද ඇතැයි මෙසේ මෙහි නා නා ප්‍රකාර භේද වශයෙන් විනිශ්චය දතයුතුය.

'පච්චයුප්පන්නතො' යයි මේ පච්චයෙන් මේ ධර්මයෝ උපදිත්. මේ ධර්මයන්ගේ මේ ප්‍රත්‍ය යයි මෙසේ දැනගත යුතු විනිස යන අරුතයි. එහි මේ හේතු ප්‍රත්‍යයෙහි කාමාවචර කුසල හේතු කාමභව රූප භවවල තමා හා සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ චිත්ත සමුට්ඨාන රූපවලද හේතුපච්චය වේ. අරූප භවයෙහි සම්ප්‍රයුක්ත ධර්මවලද හේතු පච්චය වේ. රූපාවචර කුසල හේතු, කාමභවවලම සම්ප්‍රයුක්ත ධර්මවල මෙන් චිත්ත සමුට්ඨාන රූපවලද හේතුපච්චය වේ. අරූපාවචර කුසල හේතු කාමාවචර කුසල හා සමානය. අපරියාපන්න කුසල හේතු ද එසේය. අකුසල හේතුද එසේය. කාමාවචර විපාක හේතු වනාහි කාම භවයෙහි ම තමා විසින් සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ ප්‍රතිසන්ධියෙහි කටත්තා රූප පවතින විට චිත්ත සමුට්ඨාන රූපවලට ද හේතුප්‍රත්‍ය වේ. රූපාවචර විපාක හේතු රූප භවයෙහි කියන ලද ආකාරයන්ටම හේතුප්‍රත්‍ය වේ. අරූපාවචර විපාක හේතු අරූප

භවයෙහි සම්ප්‍රයුක්තයන්ම හේතුපච්චය වේ. අපරියාපන්න විපාක හේතු කාමභව රූප භවවල සම්ප්‍රයුක්තයන්ද චිත්ත සමුට්ඨාන රූපවලට ද හේතුපච්චය වේ. අරූප භවයෙහි අරූප ධර්මයන්ටම හේතුපච්චය වේ. කිරිය හේතුවල වනාහි ක්‍ෂෙත්‍රභූමිවලද කුසල හේතු හා සමානව ප්‍රත්‍ය වේ. මෙසේ මෙහි පච්චයුප්පන්න වශයෙන් ද විනිශ්චය දතයුතුය.

හේතුපච්චය නිද්දේසය
නිමි.

## 2. ආරම්මණ

ආරම්මණ පච්චය නිද්දේසයෙහි **රූපායතනං** - රූප සංඛ්‍යාත ආයතනයයි. සෙස්සෙහි ද මෙම නයයි. **චක්ඛු විඤ්ඤාණධාතුයා** - චක්ඛු විඤ්ඤාණ සංඛ්‍යාත ධාතුවෙන් සෙසු පදවලද මෙම නයයි. **තං සම්පයුත්තකානං** ඒ චක්ඛු විඤ්ඤාණ ධාතුවෙන් සම්ප්‍රයුක්ත වූ ස්කන්ධ තුනට සියළු චක්‍ෂු ප්‍රසාදක වස්තුවල ස්කන්ධ සතරට රූපායතනයට ආරම්මණ පච්චයෙන් පච්චය වේයයි අර්ථයයි. මෙයින් පසුව ද මෙම නයයි. **මනොධාතුයා** සම්පයුක්ත ධර්මයෙන් ත්‍රිවිධ මනෝධාතුවට රූපායතනාදි විසම ආරම්මණ පච්චයෙන් පච්චය වේ. එක ක්‍ෂණයෙහි නොවේ. **සබ්බෙ ධම්මා** මේ රූපායතනාදි විසි අවසේස සියළු ඥෙය්‍ය ධර්ම, මේ ධාතු සය, හැර සෙසු සසම්පයුක්ත ධර්මයටද මනෝවිඤ්ඤාණ ධාතුවටද ආරම්මණ පච්චය වේ යයි දක්වයි. **උප්පජ්ජන්ති** මේ නදිය ගලයි. පර්වත සිටියි. සියළු කාල සංග්‍රහ වශයෙන් මෙසේ කියන ලදැයි දතයුතුය. එයින් යමක් අරබයා යමක් ඉපදුනහ. උපදින්නේ යයිද සිදුවේ. **චිත්ත චෙතසිකා ධම්මා** මෙය ඒ ඒ ධර්මයයි කියන ලද්දේ ස්වරූප වශයෙන් නිදර්ශනයි. **තෙ තෙ ධම්මා** ඒ ඒ අරමුණු ධර්ම. **තෙසං තෙසං** ඒ ඒ චිත්ත චෛතසික ධර්මයන්ගේ මේ මෙහි පෙළ වර්ණනාවයි.

මේ අරමුණ වනාහි රූපාරම්මණයයි. සද්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ ධම්මාරම්මණ යයි කොටස් වශයෙන් සයාකාරය. එහි පඤ්ඤත්තිය හැර සෙස්ස භූමි වශයෙන් කාමාවචර........... අපරියාපන්න යයි සතරාකාරය. එහි කාමාවචර කුසල අකුසල විපාක කිරිය රූප භේදයෙන් පස් ආකාරය.

රූපාවචර කුසල විපාක කිරිය වශයෙන් තුන් ආකාරය. අරූපාවචරද එසේය. අපරියාපන්න කුසල් විපාක නිබ්බාන වශයෙන් ත්‍රිවිධය. සියල්ලම හෝ මේ කුසල අකුසල විපාක කිරිය රූප නිබබාන පඤ්ඤත්ති භේද වශයෙන් සත්විධ වේ. එහි කුසලය භූමි භේදයෙන් සතරවිධ වේ. අකුසලය කාමාවචරම වේ. විපාකය චතුභූමකය. (සිව්භූමි වේ.) කිරිය තුන් භූමිය. රූප ඒකභූමි වේ. පඤ්ඤත්තිය භූමි විනිර්මුක්තය. මෙසේ මෙහි නානාප්‍රකාර භේදයෙන් විනිශ්චය දතයුතුය.

මෙසේ බෙදුණු මේ අරමුණෙහි කාමාවචර කුසල අරමුණ කාමාවචර කුසලයට රූපාවචර කුසලයට අකුසලයට කාමාවචර විපාකයට කාමාවචර කිරියට රූපාවචර කිරියටදැයි මේ රාසි හයට ආරම්මණ පච්චය වේ. රූපාවචර කුසල අරමුණ ඒ රාසි හය අතරෙන් කාමාවචර විපාකය හැර රාසි පහට ආරම්මණ පච්ච වේ. අරූපාවචර කුසල අරමුණ කාමාවචර කුසලයට රූපාවචර කුසලයට අරූපාවචර කුසලයට අකුසලයට අරූපාවචර විපාකයටදැයි මේ රාසි අටට ආරම්මණ පච්චය වේ. අපරියාපන්න කුසලාරම්මණය කාමාවචර රූපාවචරවලින් කුසලක්‍රියාවනටම ආරම්මණ පච්චය වේ. කාමාවචර රූපාවචර කුසලයට අකුසලයට කාමාවචර විපාකයට කාමාවචර රූපාවචර කිරියටදැයි මේ රාසි හයට ආරම්මන ප්‍රත්‍ය වේ. නිබබාන ආරම්මණය කාමාවචර රූපාවචර කුසලයට අපරියාපන්න වශයෙන් කුසල විපාකයට කාමාවචර රූපාවචර කිරියටදැයි මේ රාසි හයට ආරම්මණ ප්‍රත්‍ය වේ. රූපාවචර කුසල කිරියාවලට කිසිවෙක් බැහැර කරති. එය යුක්ති වශයෙන් සැලකිය යුතුය. නා නා ප්‍රකාර වනාහි ප්‍රඥපන ආරම්මණය ත්‍රෛභූමක කුසලයට අකුසලයට රූපාවචර විපාකයට අරූපාවචර විපාකයට ත්‍රෛභූමක කිරියට යන මේ රාසි නවයට ආරම්මණ පච්චය වේ. එහි යම් යම් අරමුණු යමෙකුගේ ප්‍රත්‍ය ඒවා ඒ ඒ ප්‍රත්‍ය උත්පන්න නම් වේයයි මෙසේ මෙහි වර්තමාන වශයෙන් ද විනිශ්චය දතයුතුය.

**ආරමමණ පච්චය නිද්දේස**
**නිමි.**

### 3. අධිපති

අධිපති පච්චය නිද්දේසයෙහි ඡන්දාධිපති යයි ඡන්ද සංඛ්‍යාත අධිපති වේ. ඡන්දය ධුරය කොට ඡන්දය ජ්‍යෙෂ්ඨ කොට සිත උපදින කාලයෙහි උපන්නහුට කත්තු කම්‍යතා ඡන්ද යයි මෙයට නම් වේ. සෙස්සෙහි ද මෙම නයම වේ. එහෙයින් හේතුපච්චය නිද්දේසයෙහි යම්සේ හේතු හේතු සම්පයුත්තකානං යයි කියන ලදද එසේ මෙහි අධිපති අධිපති සම්පයුත්තකානං යයි නොකියා ඡන්දාධිපති ඡන්ද සම්පයුත්තකානං යනාදි නයින් දේශනා කරන ලදද? ඒක ක්ෂණයෙහි අභාවයෙන්. පෙර නයෙහි නය දෙක හේතු ඒක ක්ෂණයෙහි හේතු පච්චය වේ. මූල අර්ථයෙන් උපකාරක බවට අත්නොහැරීමෙනි. අධිපති වනාහි ජ්‍යෙෂ්ඨ අර්ථයෙන් උපකාරකය. ඒක ක්ෂණයෙහි බොහෝ ජ්‍යෙෂ්ඨයෝ නොවෙති. එහෙයින් එකට උපන්නේ නමුදු ඒක ක්ෂණයෙහි අධිපතිභාවය නැත. එහි අධිපතිභාවය ඒකක්ෂණයෙහි අභාවයෙන් මෙහි මෙසේ දේශනා කරන ලදී.

මෙසේ සහජාත අධිපති දක්වා දැන් ආරම්මණ අධිපති දැක්වීමට **යං යං ධම්මං ගරු කත්වා** යනාදිය අරඹන ලදී. එහි **යං යං ධම්මං** යයි යම් යම් ආරම්මණ ධර්ම. **ගරුං කත්වා** ගරුකාර ගෞරව කිරීම් වශයෙන් හෝ ආශ්වාද වශයෙන් හෝ ගරුබව ලැබිය යුතුය. අත්නොහැරිය යුතුය. අවමන් නොලැබීම කොට. තෙ තෙ ධම්මා ඒ ඒ ගරුකළයුතු ධර්ම. **තෙසං තෙසං**. ඒ ඒ ගරුකළයුතු ධර්මයන්ගේ. **අධිපති පච්චයෙන** ආරම්මණ අධිපති පච්චයෙන් පච්චය වේ යයි. මෙය මෙහි පෙළ වර්ණනාවයි.

මේ අධිපති වනාහි සහජාත ආරම්මණ වශයෙන් ද්විධය. එහි සහජාත ඡන්දාදි වශයෙන් සතරාකාරය. ඒවායින් එක එකක් කාමාවචරාදි වශයෙන් භූමියෙන් සිව්වැදෑරුම්ය. එහි කාමාවචර කුසල අකුසල කිරිය වශයෙන් ත්‍රිවිධය. අකුසලයට පැමිණ වනාහි මෙහි වීමංස අධිපති නො ලබයි. රූප අරූප කුසල කිරිය වශයෙන් ද්විධය. ආරම්මණ අධිපති වනාහි ජාති භේදයෙන් කුසල අකුසල විපාක කිරිය රූප නිබ්බාන වශයෙන් සවැදෑරුම් වේ. මෙසේ මෙහි නා නා ප්‍රකාර භේද වශයෙන් විනිශ්චය දතයුතුය.

මෙසේ වෙන් වූ කල මෙහි සහජාත අධිපති කෙරෙහි කාමාවචර කුසල් කිරිය සංඛ්‍යාත අධිපති දුහේතුක ත්‍රිහේතුක චිත්තුප්පාදවල ඡන්දාදි අන්‍යතරයක් ජ්‍යෙෂ්ඨ කොට උත්පත්ති කාලයෙහි තමා හා සම්ප්‍රයුක්ත

ධර්මවලට ද චිත්ත සමුට්ඨාන රූපවලට ද අධිපති පච්චය වේ. රූපාවචර කුසල කිරිය සඳහා ද මෙම නයම වේ. මෙය වනාහි ඒකාන්තයෙන්ම ලැබේ. ඒ ධර්ම සහජාත අධිපති හැර නූපදී. අරූපාවචර කුසල කිරිය නියම කළ බැවින් පංචවෝකාර රූපාවචර අධිපති හා සමානය. චතු වෝකාරයෙහි වනාහි සම්ප්‍රයුක්ත ධර්මයන්ට ද අධිපති පච්චය වේ. එසේම එහි උපන්න සියල්ල ද කාමාවචරාධිපති වේ. අපරියාපන්න කුසලයෙන් වූ විපාකයෙන් ද පංචවෝකාරයෙහි ඒකාන්තයෙන්ම සම්ප්‍රයුක්ත ධර්මවලටද චිත්ත සමුට්ඨාන රූපවලටද අධිපති පච්චය වේ. චතුවෝකාරයෙහි අරූප ධර්මවලට ද කාමභවයෙහි අකුසලය මිච්ඡත්ත නියත සිත්වල ඒකාන්තයෙන් ම සම්පයුත්තකයන්ට ද චිත්ත සමුට්ඨාන රූපවලටද අධිපති පච්චය වේ. අනියත වශයෙන් කාමරූප භවවල තමා අධිපති කාලයෙහි ඒවාගේම අරූප භවයෙහි අරූප ධර්මවලට ද ආරති පච්චය වේ. මෙය සහජාත අධිපති නයයි.

අරමුණු අධිපති කෙරෙහි කාමාවචර කුසල අරමුණු අධිපති කාමාවචර කුසලයට ලෝභ සහගත අකුසලවලට යයි මේ රාශි දෙකට ආරම්මණ අධිපති පච්චය වේ. රූපාවචර අරූපාවචරයෙහි ද කුසල ආරම්මණ අධිපති කෙරෙහි මෙම නයම වේ. අපරියාපන්න කුසලය වනාහි ආරම්මණ අධිපති කාමාවචර බැවින් ඤාණ සම්පයුත්ත කුසලයට මෙන්ම ඤාණ සම්පයුත්ත කියටද ආරම්මණ අධිපති පච්චය වේ. අකුසලය වනාහි ආරම්මණ අධිපති නම් ලෝභසහගත චිත්තුප්පාදයයි කියයි. ඒ ලෝභ සහගත කුසලයටම ආරම්මණ අධිපති පච්චය වේ. එසේම රූපාවචර අරූපාවචර විපාක ආරම්මණ අධිපති ලෝකෝත්තරය වනාහි විපාක ආරම්මණාධිපති කාමාවචර හෙයින් ඤාණ සම්පයුක්ත කුසල කිරියාම ආරම්මණ අධිපති පච්චය වේ. කාමාවචරාදි භේද වශයෙන් වනාහි ත්‍රිවිධ කිරිය ආරම්මණ අධිපති ලෝභ සහගත අකුසලයටම ආරම්මණ අධිපති පච්චය වේ. චතු සමුට්ඨානික රූප නියමයන් රූපස්කන්ධය ආරම්මණ අධිපති ලෝභ සහගත අකුසලයටම ආරම්මණ අධිපති පච්චය වේ. නිවන කාමාවචර හෙයින් ඤාණසම්පයුත්ත කුසලයට ඤාණ සම්පයුත්ත කිරියට ලෝකෝත්තර කුසලයට ලෝකෝත්තර විපාකයටදැයි මේ රාශි සතරම ආරම්මණ අධිපති පච්චය මේ යයි මෙසේ මෙහි පච්චය උත්පත්ත වශයෙන් ද විනිශ්චය දතයුතුය.

**අධිපති පච්චය නිද්දේසය නිමි.**

**4. අනන්තර**

අනන්තර පච්චය නිද්දේසයෙහි **මනොධාතුයා** - විපාක මනෝධාතුව වේ. **මනො විඤ්ඤාණධාතුයා** සන්තීරණ කෘත්‍යය පිණිස අහේතුක විපාක මනෝවිඤ්ඤාණ ධාතුව. ඉන්පසුව වනාහි වොට්ඨපන ජවන තදාරම්මණ භංග කෘත්‍යය මනෝවිඤ්ඤාණ ධාතු කිවයුතු වේ. ඒවා නොකියා ද මෙම නයෙන්ම දතයුතුයයි නය දක්වා දේශනාව සංක්ෂේප කරන ලදී. 'පුරිමා පුරිමා කුසලං ධම්මා' යයි ආදිකයෙහි ද සවැනි නයෙහි ඒවා සංග්‍රහ කරන ලද බැවින් මෙහි නොකියන ලදැයි දතයුතුය. එහි **පුරිමා පුරිමා** යයි දොරවල් සයෙහිද අනනතර අතීත කුසල ජවන ධර්ම දැකිය යුතුය. **පච්ඡිමානං පච්ඡිමානං** යයි අනනතර උපදින්නා වූම වේ. **කුසලානං** සමාන කුසල. **අබ්‍යාකතානං** මෙය වනාහි කුසල අනනතර තදාරම්මණ භවංග ඵලසමාපත්ති වශයෙන් කියන ලදී. අකුසල මූලකයෙහි. **අබ්‍යාකතානං** තදාරම්මණ භවංග නියමයෙන්ම. අබ්‍යාකත මූලකයෙහි. **අබ්‍යාකතානං** ආවර්ජන ජවන වශයෙන් හෝ භවංග වශයෙන් හෝ පවත්වන කිරිය විපාක අබ්‍යාකතයන්ගේ කිරිය මනෝධාතුවේ සිට වොට්ඨපන කෘත්‍ය දක්වා මනෝවිඤ්ඤාණ ධාතු එතෙක් පවතින වීථි සිත්වලද මේ නය ලැබේමය. **කුසලානං** පංචද්වාරයෙහි වොට්ඨපනයට අනතුරුව මනෝ ද්වාරයෙහි ආවර්ජනයට අනතුරුව පළමු ජවන කුසලයන්ගේ. **අකුසලානං** පදයෙහි ද මෙම නයමය. **යෙසං යෙසං** මෙය සියළුම අනන්තර පච්චය ධර්මයන්ගේ සංක්ෂෙප ලක්ෂණ වේ. මෙය මෙහි පෙළෙහි වර්ණනාවය.

මේ අනන්තර පච්චය නම් නිවන හැර චතුභූමක අරූප ධම්ම රාශියම යයි දතයුතුය. එය ජාති වශයෙන් කුසල අකුසල විපාක කිරිය වශයෙන් සතරාකාරයට බෙදේ. එහි කුසලය කාමාවචරාදි භේදයෙන් සතර අයුරුය. අකුසලය කාමාවචරම වේ. විපාකය චතුභූමකය. කිරිය අනන්තර පච්චය වනාහි ත්‍රෛභූමකය. මෙසේ මෙහි නානා ප්‍රකාර භේද වශයෙන් විනිශ්චය දතයුතුය.

මෙසේ බෙදුණුවිට වනාහි මෙහි කාමාවචර කුසලය අනන්තර පච්චය තමා සමානවම කාමාවචර කුසලයට අනන්තර පච්චය වේ. **ඤාණ** සම්ප්‍රයුක්ත කාමාවචර කුසලය වනාහි රූපාවචර කුසලයට අරූපාවචර කුසලයට ලෝකෝත්තර කුසලයට යයි මේ රාසි තුනට අනන්තර පච්චය වේ. කාමාවචර කුසලයද කාමාවචර විපාකයට රූපාවචර

අරූපාවචර විපාකයට ඤාණ සම්පයුත්ත ලෝකෝත්තර විපාකයටදැයි මේ රාශි සතරට අනන්තර පච්චය වේ. රූපාවචර කුසලය රූපාවචර කුසලයට ඤාණ සම්පයුත්ත කාමාවචර විපාකයට රූපාවචර විපාකයටදැයි මේ රාශි තුනට අනන්තර පච්චය වේ. අරූපාවචර කුසලය ඒ දෙකේ විපාකවලට තමාගේ කුසලයේ විපාකයටදැයි අවිශේෂයෙන් රාශි හතරට අනන්තර පච්චය වේ. මෙහි විශේෂයෙන් වනාහි නේවසඤ්ඤා නාසඤ්ඤායතන කුසලය අනාගාමි ඵලයට ද ලෝකෝත්තර විපාකයටද අනන්තර පච්චය වේ. අකුසලය අවිශේෂයෙන් අකුසලයට මෙන්ම කුසල අකුසල විපාකයට ද විශේෂයෙන් වනාහි මෙහි සැප මැදහත් වේදනා යුත් අකුසලය රූපාවචර අරූපාවචර විපාකයටදැයි මේ රාසි සතරට අනන්තර පච්චය වේ. කාමාවචර විපාකය කාමාවචර විපාකයටද ඤාණ සම්පයුත්ත හෝ ඤාණ විපපයුතත විපාකය කාමාවචර කිරිය ආවර්ජනයට ඤාණ සම්පයුත්ත විපාකය වනාහි මෙහි ප්‍රතිසන්ධි වශයෙන් උපදින්නාට රූපාවචර අරූපාවචර විපාකයටදැයි මේ රාසි සතරට අනන්තර පච්චය වේ. රූපාවචර විපාකය සහේතුක කාමාවචර විපාකයට රූපාවචර අරූපාවචර විපාකයට කාමාවචර කිරිය ආවර්ජනයටදැයි මේ රාසි සතරට අනන්තර පච්චය වේ. අරූපාවචර විපාකය ත්‍රිහේතුක කාමාවචර විපාකයට අරූපාවචර විපාකයට කාමාවචර කිරිය ආවර්ජනයටදැයි රාසි තුනට අනන්තර පච්චය වේ. ලෝකෝත්තර විපාකය ත්‍රිහේතුක කාමාවචර විපාකයට රූපාවචර අරූපාවචර ලෝකෝත්තර විපාකයටදැයි රාසි සතරට අනන්තර පච්චය වේ. කාමාවචර කිරිය කාමාවචර කුසලයට, අකුසලයට චතුභූමක විපාකයට ත්‍රෛභූමක කිරියටදැයි රාසි නවයට අනන්තර පච්චය වේ. රූපාවචර කිරිය ත්‍රිහේතුක කාමාවචර විපාකයට රූපාවචර විපාකයට රූපාවචර කිරියටදැයි රාසි තුනට අනන්තර පච්චය වේ. අරූපාවචර කිරිය ත්‍රිහේතුක කාමාවචර විපාකයට රූපාවචර අරූපාවචර ලෝකෝත්තර විපාකයට අරූපාවචර කිරියටදැයි රාසි පහට අනන්තර පච්චය වේ. මෙසේ මෙහි පච්චය උප්පනන වශයන් වශයෙන් ද විනිශ්චය දතයුතුය.

**අනනතර පච්චය නිද්දේසය**

**නිමි.**

## 5. සමනන්තර

සමනන්තර පච්චය නිද්දේසය ද මෙයට සමාන ගතික වේ. මෙම ප්‍රත්‍ය දෙක වනාහි මහා විත්ථාර වේ. එහෙයින් සියළු චිත්තුප්පත්ති වශයෙන් ඒවායෙහි පරීක්‍ෂා කොට විස්තර ගතයුතුය.

**සමනන්තර පච්චය නිද්දේසය**
**නිමි.**

## 6. සහජාත

සහජාත පච්චය නිද්දේසයෙහි අඤ්ඤමඤ්ඤං අනිකෙක් අනෙකෙකුට. ඒ ධර්මයන්ගේ ඒක ක්‍ෂණයෙහි පච්චය භාවය ද පච්චය උප්පන්න භාවයද දක්වයි. **ඔක්කන්තික්ඛණෙ** පංචවෝකාර භවයෙහි ප්‍රතිසන්ධි ක්‍ෂණයෙහි. එකෙණෙහි නාමරූප බැසගත්තාක් මෙන් ඇතුළට වදින්නාක් මෙන් පරලොවින් මෙලොවට පිවිසෙන්නාක් මෙන් උපදී. එහෙයින් ඒ ක්‍ෂණය ඔක්කන්තික්ඛණ යයි කියනු ලැබේ. මෙහි ද රූපං හෘදය වස්තුව පමණක් අදහස් කරයි. එහි නාමය වේ. එහි නාමයට අඤ්ඤමඤ්ඤ සහජාත පච්චය ස්ථාන පැතිරෙයි. **චිත්ත** චෙතසිකා පැවැත්මෙහි සතර ස්කන්ධ. **සහජාත පච්චයෙන** මෙහි චිත්ත සමුට්ඨාන රූප චිත්ත චෛතසිකයන්ට නො පැතිරේ. එහෙයින් අඤ්ඤමඤ්ඤ යයි නොකියන ලදී. එසේම උපාදා රූප භූත රූපයන්ගේ. **රූපිනො** ධම්මා **අරූපීනං** ධම්මානං හෘදය වස්තුව සතර ස්කන්ධයන්ට. **කිඤ්චි කාලෙ** කිසියම් කාලයක. **සහජාත පච්චයෙන** ප්‍රතිසන්ධි සඳහා කියන ලදී. මේ ස්කන්ධ සතර වනාහි අරූපීය. අඤ්ඤමඤ්ඤ සහජාත පච්චයෙන් පච්චය වේයයි මෙසේ කොටස් හයක සිටියේය. එහි කොටස් තුනක් අඤ්ඤමඤ්ඤ වශයෙන් කියන ලදී. තුනක් අඤ්ඤමඤ්ඤ වශයෙන් නොවේ. එහි පළමු කොටසෙහි අරූප පච්චය මෙන්ම පච්චය උප්පන්න ද වේ. දෙවැන්නෙහි රූපම වේ. තුන්වැන්නෙහි නාමරූප වේ. සතරවැන්නෙහි පච්චය අරූප වේ. පස්වැන්නෙහි පච්චය ද පච්චය උප්පන්න ද රූප ම වේ. සවැන්නෙහි පච්චය රූප වේ. පච්චය උප්පන්න අරූප වේයයි මේ මෙහි පෙළෙහි වර්ණනාවයි.

මේ සහජාත පච්චය වනාහි ජාති වශයෙන් කුසලය, අකුසලය, විපාකය, කිරිය, රූප යයි පඤ්චවිධියට බෙදේ. එහි කුසලය භූමි වශයෙන්

චතුර්විධය. අකුසලය ඒකවිධය. විපාකය චතුර්විධය. කිරිය නියමය ත්‍රිවිධය. රූපය ඒකවිධය. කාමාවචරම වේ. මෙසේ මෙහි නා නා ප්‍රකාර භේද වශයෙන් විනිස දතයුතුය. මෙසේ බෙදුණු මෙහි චතුභූමක කුසලය පංචවෝකාර භවයෙහි තමා සම්ප්‍රයුක්ත ධර්මයන්ට ද චිත්ත සමුට්ඨාන රූපයට ද සහජාත පචචය වේ. එසේම අකුසලය මෙහි අරූපයෙහි යමක් උපදීද ඒ අරූප ධර්මයන්ටම සහජාත පචචය වේ. කාමාවචර රූපාවචර විපාකය චිත්ත සමුට්ඨාන රූපයට මෙන්ම සම්ප්‍රයුක්ත ධර්මයන්ට ද සහජාත පචචය වේ. යමක් මෙහි රූප ඇති නොකරයිද ඒ සම්ප්‍රයුක්ත ධර්මයන්ට ද යමක් පටිසන්ධියෙහි උපදීද ඒ කටත්තා රූපවලට ද සහජාත පච්චය වේ. අරූපාවචර විපාකය සම්ප්‍රයුක්ත ධර්මයන්ටද ලෝකෝත්තර විපාකය පංචවෝකාරයෙහි සම්ප්‍රයුක්ත ධර්මයන්ටම චිත්ත සමුට්ඨාන රූපවලට ද චතුවෝකාරයෙහි අරූපවලට ද කාමාවචර අරූපාවචර කිරිය පංචවෝකාරයෙහි සම්ප්‍රයුක්ත ධර්මවලටද චිත්ත සමුට්ඨාන රූපවලටද සහජාත පචචය වේ. චතු වෝකාරයෙහි සම්ප්‍රයුක්තයන්ට ද චිත්ත සමුට්ඨාන රූපවලට ද ඒකාන්තයෙන් සහජාත පච්චය වේ. චතුවෝකාරයෙහි අරූපයන්ට ද රූපාවචර කිරිය සම්ප්‍රයුක්ත ධර්මයන්ට මෙන්ම චිත්ත සමුට්ඨාන රූපයන්ට ද ඒකාන්තයෙන් සහජාත පච්චය වේ. චතුසමුට්ඨානික රූපයට කම්ම සමුට්ඨාන රූපයෙහි එකක් මහාභූතයේ තුනෙන් එකට දෙකක් මහාභූතයේ දෙකකට මහාභූත උපාදාය රූපයට සහජාත පචචයෙන් පචචය වේ. කාමාවචර රූපාවචර පටිසන්ධි ක්ෂණයෙහි වස්තු රූපය විපාක ස්කන්ධවලට සහජාත පච්චයෙන් පච්චය වේ. උතු චිත්ත ආහාර සමුට්ඨාන රූපවල වනාහි මහාභූත අඤ්ඤමඤ්ඤ මෙන්ම උපාදාය රූපයට ද සහජාත පච්චයෙන් පච්චය වේ. මෙසේ මෙහි පච්චය උප්පන්න වශයෙන් ද විනිශ්චය දැනගත යුතුය.

**සහජාත පචචය නිද්දේසය නිමි.**

### 7. අඤ්ඤමඤ්ඤ

අඤ්ඤමඤ්ඤ පචචය නිද්දේසයෙහි සහජාත පචචය නිද්දේසයේ පෙර කොටස් තුන වශයෙන් පෙළෙහි ආවේය. එය එහි කියන ලද්දට සමානව වර්ණනාව වේයයි නැවත නොගන්නා ලදී. මේ අඤ්ඤමඤ්ඤ

පච්චය ද ජාති වශයෙන් කුසලය, අකුසලය, විපාකය, කිරිය, රූප යයි පංචවිධ වශයෙන් බෙදුණේය. එහි කුසලය භූමි වශයෙන් චතුර්විධය. සියල්ල පෙර සමානම යයි මෙසේ මෙහි නා නා ප්‍රකාර භේද වශයෙන් විනිශ්චය දැනගත යුතුය.

මෙසේ බෙදුණු මෙහි චනාහි සියළුම චතුභූමක කුසලය තමා සම්ප්‍රයුක්ත ධර්මයන් අඤ්ඤමඤ්ඤ පච්චයෙන් පච්චය වේ. අකුසලයට ද එසේය. විපාකයෙහි චනාහි කාමාවචර රූපාවචර විපාකය පටිසන්ධියෙහි වස්තු රූපයට, පවිත සම්ප්‍රයුක්ත ධර්මයන්ට ද, අරූපාවචර ලෝකෝත්තර විපාකය සම්ප්‍රයුක්ත ධර්මයන්ට ද, අරූපාවචර ලෝකෝත්තර විපාකය සම්ප්‍රයුක්ත ධර්මයන්ට ද අඤ්ඤමඤ්ඤ පච්චයෙන් පච්චය වේ. චතු සමුට්ඨානික රූපයට කම්ම සමුට්ඨානයෙහි එකක් මහාභූත තුනක්. තුනෙන් එකකට, මහා භූතයන් දෙකේ දෙකකට අඤ්ඤමඤ්ඤ පච්චයෙන් පච්චය වේ. කාමාවචර රූපාවචර ප්‍රතිසන්ධියෙහි වස්තු රූපය විපාක ස්කන්ධවලට අඤ්ඤමඤ්ඤ පච්චයෙන් පච්චය වේ. උතු චිත්ත ආහාර සමුට්ඨානවල මහාභූතම මහාභූතයන්ට අඤ්ඤමඤ්ඤ පච්චයෙන් පච්චය වේ. මෙසේ මෙහි පච්චය උප්පන්න වශයෙන් විනිශ්චය දතයුතුය.

අඤ්ඤමඤ්ඤ පච්චය නිද්දේසය
නිමි.

## 8. නිස්සය

නිස්සය පච්චය නිද්දේසයෙහි සහජාත පච්චය නිද්දේසයේ පෙර කොටස් පහේ සහජාත නය දක්වා නැවත සවැනි කොට්ඨාශයෙන් පුරෙජාත නිස්සය නය දැක්වීමට චක්ඛායතනං චක්ඛු විඤ්ඤාණ ධාතුයා යනාදිය අරඹන ලදී. එහි යං රූපං නිස්සායං වස්තු රූපය සඳහා කියන ලදී. එහි නිස්සය ත්‍රිවිධය. මනෝධාතු හැර අරූප විපාකය, දෙසැත්තෑ විධ මනෝ විඤ්ඤාණ ධාතු යයි මේ සිත් සැත්තෑපහ පවතී යයි මෙය මෙහි පෙළෙහි වර්ණනාවය.

මේ නිස්සය පච්චය ද ජාති වශයෙන් කුසලාදි භේදයෙන් පංචවිධම වේ. එහි කුසලය භූමි වශයෙන් සතරවිධය. අකුසලය ඒකවිධය. විපාකය

සතරවිධය. කිරිය තුන්විධය. රූපය ඒකවිධ යයි මෙසේ මෙහි නානා ප්‍රකාර භේද වශයෙන් විනිශ්චය දතයුතුය.

මෙසේ බෙදුණුවිට වනාහි චතු භූමක කුසලය පංචවෝකාරයෙහි සම්ප්‍රයුක්ත ධර්මවලට ද චිත්ත සමුට්ඨාන රූපයට ද නිසසය පච්චයෙන් පච්චය වේ. අකුසලයට ද එසේය. ආරුප්පයෙහි යමක් උපදීද ඒ ආරුප්ප ධර්මයන්ට ද නිස්සය ප්‍රත්‍යය වේ. කාමාවචර රූපාවචර විපාකය පවත්නා සම්ප්‍රයුක්ත ධර්මයන්ට මෙන්ම චිත්ත සමුට්ඨාන රූපයට ද ප්‍රතිසන්ධියෙහි කටත්තා රූපයට ද නිස්සය පච්චය වේ. අරූපාවචර විපාකය සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ටම වේ. ලෝකෝත්තර විපාකය පංචවෝකාරයෙහි සම්ප්‍රයුක්ත ධර්මයන්ට මෙන්ම චිත්ත සමුට්ඨාන රූපයට ද චතුවෝකාරයෙහි අරූපයට ද නිස්සය පච්චය වේ. කාමාවචර රූපාවචර කිරිය පංචවෝකාරයෙහි සම්ප්‍රයුක්තකයින්ට මෙන්ම චිත්ත සමුට්ඨාන රූපයටද නිස්සය පච්චය වේ. චතුවෝකාරයෙහි අරූපවලටද රූපාවචර කිරිය පංචවෝකාරයෙහි සම්ප්‍රයුක්තකයන්ට ද චිත්ත සමුට්ඨාන රූපයටද කම්ම සමුට්ඨාන රූපයෙහි එකක් මහාභූත තුනක්, මහාභූත දෙකෙන් දෙකක්, මහාභූත උපාදානය රූපවලට, වස්තු රූපය පංචවෝකාර භාවයෙහි චතු භූමක කුසලයට අකුසලයට ආරුප්ප හැර විපාකයට ද දෙපස් විඤ්ඤාණයට ද සෙසු තෛභූමක විපාකයට ද තෛභූමක කිරියට දැයි මේ ධර්මයන්ට නිස්සය පච්චය වේ. චක්ඛායතනාදි පංච සම්ප්‍රයුත්තයන්ට චක්ඛු විඤ්ඤාණාදියට නිස්සය පච්චය වේ. උතු චිත්ත ආහාර සමුට්ඨානවලද මහාභූත මහාභූත උපාදාය රූපවලටද නිස්ස පච්චයෙන් පච්චය වේ. මෙසේ මෙහි පච්චය උප්පන්න වශයෙන් ද විනිශ්චය දතයුතුය.

**නිස්සය පච්ච නිද්දේසය නිමි.**

## 10. උපනිසසය

උපනිසසය පච්චය නිද්දේසයෙහි **පුරිමා පුරිමා** යයි අනන්තර උපනිස්සයෙහි සමනන්තර අතීත ලබයි. ආරම්මණ උපනිස්ස ප්‍රකෘති උපනිස්සයවල නානා වීථි වශයෙන් පුරිමතරය. ඒ රාශි තුනම කුසල වශයෙන් කුසලය පදය ලබයි. කුසලයෙන් වනාහි අකුසලයෙහි සමනන්තර අතීත නොලබයි. එයින් කියන ලදී. **අකුසලානං ධම්මානං කෙසඤ්චි උපනිසසය පචචයෙන පචචයො** මෙය වනාහි

කුසල ධර්මය අකුසල ධර්මයට උපනිස්සය පච්චයෙන් පච්චය වේ. ආරම්මණ උපනිස්සය, ප්‍රකෘති උපනිස්සය වශයෙන් වේ. ආරම්මණ උපනිස්සය දන් දී සිල් සමාදන් වී උපෝසථ කර්ම කොට එය ගුරුකොට ආශ්වාද කරයි. එය ගුරු රාගය උපදියි. දෘෂ්ටිය උපදියි. පෙර යහපත් ක්‍රියා ගරුකොට ආශ්වාද කරයි. සතුටුවෙයි. එය ගරුකොට රාගය උපදියි. දෘෂ්ඨිය උපදියි. ධ්‍යානයෙන් නැගිට ධ්‍යානය ගරුකොට ආශ්වාද කරයි. සතුටු වෙයි. එය ගරුකොට රාගය උපදී. දෘෂ්ටිය උපදී. ප්‍රකෘති උපනිස්සය ශ්‍රද්ධාව නිසා මානය ජපකරයි. දෘෂ්ටිය ගනියි. සීල, සුත, චාග, පඤ්ඤා ඇසුරුකොට මානය මතුරයි. දෘෂ්ඨිය ගතිය. සද්ධා, සීල සුත චාග පඤ්ඤා රාගයට දෝසයට මෝහයට මානයට දෘෂ්ඨියෙන් පැතුමෙන් උපනිස්සය පච්චයෙන් පච්චය වේ.

මෙම නය සඳහා කියන ලදී. කුසලයෙන් අව්‍යාකෘතයෙහි තුනම ලැබේ. අකුසලයෙන් එසේම අකුසලයෙහි. අකුසලෙන් වනාහි කුසලයෙහි සමනන්තර අතීතය නොලබයි. එයින් කියන ලදී. **කුසලානං ධමමානං කෙසඤචි උපනිසස පචචයෙන පචචයොති** මෙයද :-

අකුසල ධර්ම කුසල ධර්මයට උපනිස්සය පච්චයෙන් පච්චය වේ. ප්‍රකෘති උපනිස්සය රාගය ආශ්‍රයකොට දන් දෙයි. සිල් සමාදන් වේ. ධ්‍යාන උපදවයි. විපස්සනා උපදවයි. මාර්ගය උපදවයි. අභිඤ්ඤා උපදවයි. සමාපත්ති උපදවයි. දෝස, මෝහ, මාන, දිට්ඨි, ප්‍රාර්ථනා ඇසුරුකොට දන්දෙයි. සමාපත්ති උපදවයි. රාග, දෝස, මෝහ, මාන, දිට්ඨි, පත්‍ථනා, ශ්‍රද්ධාවට, සීලයට, සුතයට, ත්‍යාගයට, ප්‍රඥාවට උපනිස්සය පච්චයෙන් පච්චය වේ. ප්‍රාණය නිසා ඒ පටිඝාතය සඳහා දන් දෙයි.

ආදි නයින් ප්‍රශ්න වාරයෙහි ආ ප්‍රකෘති උපනිස්සය සඳහා කියන ලදී. අකුසලය වනාහි කුසලයට ආරම්මණ උපනිස්සය නොවේ. කුමක් නිසාද? එය ගරුකොට එහි නොපවත්වන හෙයිනි. අනන්තර උපනිස්සය මෙන් මෙසේ ආරම්මණ උපනිස්සය ද මෙහි නොලැබේ යයි දතයුතුය. අකුසලයෙන් අබ්‍යාකත පදයෙහි ආරම්මණ උපනිස්සය නොලැබේ. අබ්‍යාකත ධර්ම අකුසලය ගරු නොකරයි. යම්හෙයකින් වනාහි අනන්තර බව ලබයිද එහෙයින් මෙහි කිසිවක් නොකියන ලදී. අබ්‍යාකතයෙන් වනාහි අබ්‍යාකත කුසලයෙහි අකුසලෙහි යයි තුන් නයෙහි තුන ද උපනිස්සය ලබයි. **පුගගලොපි සෙනාසනමපි** මේ දෙක ප්‍රකෘති උපනිස්සය

වශයෙන් කියන ලදී. මේ දෙක කුසල අකුසල පැවැත්මෙන් බලවත් ප්‍රත්‍ය වේ. මෙහි පච්චයභාවය වනාහි පරියාය වශයෙන් දතයුතුය. මේ පෙළෙහි වර්ණනාවයි.

මේ උපනිස්සය පච්චය නම් එක් ප්‍රඥප්තියක් සමග සියළුම චතුභූමක ධර්ම වේ. විභාග වශයෙන් වනාහි ආරම්මණ උපනිස්සය ආදි වශයෙන් ත්‍රිවිධ වේ. එහි ආරම්මණ උපනිස්සය ආරම්මණ අධිපති විසින් නානා කරන නොකරන ලදැයි යට කියන ලද නයින් ම නා නා ප්‍රකාර භේද වශයෙන් ගතයුතුය.

අනන්තර උපනිස්සය අනන්තර පච්චයෙන් තින් නානා කරණ ලදී. එය යට කියන ලද නයින්ම නා නා ප්‍රකාර භේද වශයෙන් දතයුතුය. පච්චය උප්පන්න වශයෙන් එහි කියන ලද නයින් ම විනිශ්චය දතයුතුය.

ප්‍රකෘති උපනිස්සය වනාහි ජාති වශයෙන් කුසල අකුසල විපාක කිරිය රූප භේදයෙන් පංචවිධ වේ. කුසලාදීන්ගේ වනාහි භූමි භේදයෙන් අනේකවිධ යයි මෙසේ මෙහි නා නා ප්‍රකාර භේද වශයෙන් විනිශ්චය දතයුතුය.

මෙසේ බෙදුණු මෙහි වනාහි ත්‍රෛභූමක කුසලය චතු භූමක කුසලයට ද අකුසලයට විපාක කිරියටදැයි රාසි හතරට ප්‍රකෘති උපනිස්සය වේ. ලෝකෝත්තර අකුසලයට නොවේ. අපගේ ආචාර්යවරයන් විසින් ලෝකෝත්තර ධර්මය උපදවන ලදැයි මෙම නයින් වනාහි අන්‍යයන් අකුසල් ද වේ. යමෙකුට හෝ උපදින්නේ ද ඔහුටද අනුත්තර විමොක්ෂවල ආශාවෙන් උපස්ථාන කරවයි මෙම නයින් වේ. අකුසලය සියළු චතුභූමක ඛන්ධවලට ප්‍රකෘති උපනිස්සය වේ. ත්‍රෛභූමක විපාකය ද එසේය. ලෝකෝත්තර විපාකයෙහි යටම තුන්පල අකුසල නොවේ. උපරි කුසලයද පෙර නයෙන් වනාහි අන්‍යයන්ට හෝ යමෙකුට හෝ උපදින්නේය. ඔහුගේ සන්තානයෙහි සියළු ලෝකෝත්තර විපාකය සියළු කුසල් ආදිය අරූප ස්කන්ධවලට ප්‍රකෘති උපනිස්සය වේ. කිරිය නියමය ද ප්‍රකෘති උපනිස්සය චතුභූමක කුසලාදි ස්කන්ධවලට වේමය. රූප නියමයද එසේය. ස්වකීය රූපය මේ පට්ඨාන ප්‍රකරණයෙහි ආවා වූ නයින් උපනිස්සය

පච්චය නොලබයි. සූත්‍රාන්තික පරියායෙන් වනාහි ලැබේ යයි කීමට වටී. මෙසේ මෙහි වර්තමාන වශයෙන් ද විනිශ්චය දතයුතුය.

උපනිස්සය පච්චය නිද්දේසය
නිමි.

## 11. පුරෙජාත

පුරෙජාත පච්චය නිද්දේසයෙහි **පුරෙජාත පච්චයෙන පච්චයො** යයි මෙහි පුරේජාත නම් යමෙකුට පච්චය වේ. එයින් පෙර උපන් ජාති ක්‍ෂණය නොඉක්මවා ඨිති ක්‍ෂණයට පැමිණි. **චක්ඛායතනං** යනාදි වස්තු පුරේජාත වශයෙන් කියන ලදී. **රූපායතනං** ආරම්මණ පුරේජාත වශයෙන්. **කිඤ්චිකාලෙ පුරෙජාත පච්චයෙන** පැවතීම සඳහා කියන ලදී. **කිඤ්චිකාලෙ න පුරෙජාත පච්චයෙන** ප්‍රතිසන්ධිය සඳහා කියන ලදී. මෙසේ හැම ආකාරයෙන්ම පඤ්ච ද්වාරයෙහි වස්තු ආරම්මණ වශයෙන් මනෝද්වාරයේ වස්තු වශයෙන් ද පෙළෙහි ආයේය. පඤ්ච ද්වාරයෙහි වනාහි ආරම්මණ පුරේජාතය සේකයෝ හෝ පෘථග්ජනයෝ හෝ ඇස අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් බලත් යයි ආ බැවින් මනෝද්වාරයේ ද ආරම්මණ පුරේජාත ලැබේ. මෙහි වනාහි සාවසේස (ඉතිරියක් ඇතිව) වශයෙන් දේශනාව කරන ලදැයි මේ එහි පෙළ වර්ණනාවයි.

මෙය වනාහි පුරෙජාත පච්චය සුද්ධ රූපයම වේ. එය ද උත්පාද ක්‍ෂණය නො ඉක්මවා ඨිති භාවයට පැමිණි අටළොස් ආකාර වූ රූපයම වේ. ඒ සියල්ලම වස්තු පුරේජාත ආරම්මණ පුරේජාත යයි දෙයාකාරයකින් සිටියේය. එහි චක්ඛු ආයතනය.......කාය ආයතනය වස්තු රූපයයි මෙය වස්තු පුරේජාත නම් වේ. සෙස්ස මේ පෙළෙහි ආවා වූද අනාගතයද වර්ණ, ශබ්ද, ගන්ධ, රස, සතර ධාතු ඉන්‍ද්‍රිය තුන, කබලීකාර ආහාරය යයි දොළොස් ආකාර රූපය ආරම්මණ පුරේජාත යයි මෙසේ මෙහි නා නා ප්‍රකාර භේද වශයෙන් විනිශ්චය දතයුතුය.

මෙසේ බෙදුණු මෙහි වනාහි චක්ඛායතනය චක්ඛු විඤ්ඤාණ දෙකට පුරේජාත පච්චයෙන් පච්චය වේ. ඉතිරි සෝතාදි සතර

විඤ්ඤාණයට ද එසේය. වස්තු රූපය වනාහි පඤ්ච විඤ්ඤාණ හැර ආරුප්ප විපාක සතරෙහි ද සෙසු සියළු චතු භූමක කුසල අකුසල අව්‍යාකතවලට චිත්ත චෛතසිකයන්ට පුරේජාතය පච්චය වේ. රූපාදිය වනාහි පඤ්චද්වාර අරමුණු වේ. දෙපස් විඤ්ඤාණයන්ට ද මනෝධාතුවලටද ඒකාන්තයෙන්ම පුරේජාත පච්චය වේ. මේ රූපාරූප අටළොස් ආකාරය, කාමාවචර කුසලයට රූපාවචර වශයෙන් අභිඤ්ඤා කුසලයට තදාරම්මණ කාමාවචර කිරියට රූපාවචරයෙන් අභිඤ්ඤා කිරියටදැයි මේ රාසි සයට පුරේජාත පච්චය වේ යයි මෙසේ මෙහි පච්චය උප්පන්න වශයෙන් ද විනිශ්චය දතයුතුය.

## පුරේජාත පච්චය නිද්දේසය
## නිමි.

12. පච්ඡාජාත

පච්ඡාජාත පච්චය නිද්දේසයෙහි **පච්ඡා ජාතා** යයි යමෙකුගේ කයට පච්චය වේ. එහි ඉපදී සිටිකල්හි උපන්. **පුරෙජාතසස** ඒවායේ ඉපදීම්වලින් මුලින් උපන් ජාති ක්‍ෂණය නො ඉක්මවා ඨිතියට පැමිණියට. **ඉමසස කායසස** මේ චතු සමුට්ඨානික ති සමුට්ඨානික භූත පාදාය රූපයයි කියන ලද කයට. මෙහි ද **තිසමුට්ඨානික කායො** ආහාර සමුට්ඨාන අභාවයෙන් බ්‍රහ්ම පාරිසජ්ජාදීන්ගේ කය දැනගත යුතුය. මේ මෙහි පෙළ වර්ණනාවයි.

මෙය වනාහි පච්ඡාජාත පච්චය නම් සංක්‍ෂෙපයෙන් ආරුප්ප විපාක හැර අවශේෂ චතුභූමක අරූප ස්කන්ධ එය ජාති වශයෙන් කුසල අකුසල විපාක කිරිය භේදයෙන් සතර ආකාරයට බෙදේ යයි මෙසේ මෙහි නා නා ප්‍රකාර භේද වශයෙන් විනිශ්චය දතයුතුය.

මෙසේ බෙදුණු මෙහි වනාහි පංචවෝකාර භවයෙහි උපන් චතුභූමක කුසලයද අකුසලය ද උපන් ක්‍ෂණය නො ඉක්මවා ඨිතියට පැමිණියහුට චතු සමුට්ඨානික තිසමුට්ඨානික රූප කයට පච්ඡාජාත පච්චය වේ. ප්‍රතිසන්ධි විපාකය හැර විපාකයෙහි ද අවසේස කාමාවචර රූපාවචර විපාකය එයටම ඒකාන්තයෙන් පච්ඡාජාත වේ. ලෝකෝත්තරයෙහි ද

පංචවෝකාරයෙහි උපන් විපාකය එයටම පච්ඡාජාත පච්චය වේ. ත්‍රෛභූමක කිරියද පංචවෝකාරයෙහි උපන් කියන ලද ආකාර කයට පච්ඡාජාත පච්චය වේ යයි මෙසේ මෙහි පච්චයුප්පන්න වශයෙන්ද විනිශ්චය දතයුතුය.

පච්ඡාජාත පච්චය නිද්දේසය
නිමි.

## 13. ආසෙවන

ආසේවන පච්චය නිද්දේසයෙහි පුරිමා පුරිමා සියළු නයවල සමනන්තර අතීතබව දතයුතුය. එහෙයින් මෙහි අනන්තර පච්චයෙහි මෙන් 'පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං' යනාදි නයින් වෙනස් ජාතීන් සමග නිද්දේස නො කරන ලදද? තමාගේ ගතිය ගැන්වීමට අසමර්ථ බැවින්, වෙනස් ජාතිකයෝ වෙනස් ජාතිකයින්ට අරූප ධම්මානං අරූප ධර්මවලට ආසේවන ගුණයෙන් ප්‍රගුණ බලවත් බව සාදමින් තමාගේ කුසලාදි භාව ගතිය ගැන්වීමට නොහැකි වේ. එහෙයින් ඒවා සමග නිද්දේසය නොකොට යමෙක් ඔවුන්ගේ වාසනා සංඛ්‍යාත ආසේවනයෙන් ප්‍රගුණ බව බලවත් බවින් විශිෂ්ඨ වූ තමාගේ කුසලාදි භාව ගතිය ගැන්වීමට හැකිවේ. ඒවායේ ඒවා සමග සමාන ජාතිකයන් සමගම නිද්දේසය කරන ලදැයි දතයුතුය. ඉක්බිති විපාක අබ්‍යාකත කුමක් නිසා නො ගන්නා ලදද? ආසේවන අභාවයෙන්, විපාකයෙහි කර්ම වශයෙන් විපාක භවයට පැමිණ කම්ම පරිණාමය මෙන් වී පවතී. නිරුත්සාහ දූර්වල එය ආසේවන ගුණයෙන් තමාගේ ස්වභාවය ගන්වා වඩා නෙවසඤ්ඤා විපාකය ඉපදවීමට හැකිය. පෙර විපාක අනුභාවයෙන් ගෙන ඉපදවීමට යයි කර්ම වේගයෙන් තබන ලද වැටුනාක් මෙන් වී උපදී යයි විපාකයෙහි සියළු ආකාරයෙන් ආසේවන නැතැයි ආසේවන අභාවයෙන් විපාකය නොගන්නා ලදී. කුසල අකුසල කිරිය අනතුරු උපදින්නේ ද මෙය කර්ම ප්‍රතිබද්ධ පැවැත්මෙන් ආසේවන නොගනී යයි කුසලාදියටද ආසේවන පච්චය නොවේ. තවද නා නා ජාතික බවද මෙහි නොවේ. භූමි වශයෙන් වනාහි ආරම්මණ වශයෙන් හෝ නා නා ජාතික බව නම් නැත. එහෙයින් කාමාවචර කුසල කිරිය

මහග්ගත කුසල කිරියවලට ද සංඛාර අරමුණ ද අනුලෝම කුසලය නිවන් අරමුණට ගොත්‍රභූ කුසලයට ආසේවන පච්චය වේයයි මේ එහි පෙළ වර්ණනාවයි.

මේ ආසේවන පච්චය ජාති වශයෙන් කුසල, අකුසල, කිරියඅබ්‍යාකත යයි තුන් විදියකින් සිටියේය. එහි කුසලය භූමි වශයෙන් කාමාවචර, රූපාවචර, අරූපාවචර යයි ත්‍රිවිධය. අකුසලය කාමාවචරමය. කිරිඛ්‍යාකතා කාමාවචර, රූපාවචර, අරූපාවචර යයි ත්‍රිවිධය. ලෝකෝත්තරයට ආසේවන පච්චය නම් නැතැයි මෙසේ මෙහි නා නා ප්‍රකාර බේද වශයෙන් විනිශ්චය දතයුතුය.

මෙසේ බෙදුණු මෙහි කාමාවචර කුසලය තමාගේ අනතුරු කාමාවචර කුසලයටම, යමක් වනාහි මෙහි ඤාණ සම්පයුත්තද, එය තමා හා සමාන වේදනා රූපාවචර කුසලයට අරූපාවචර කුසලයට ලෝකෝත්තර කුසලයටදැයි මේ රාසිවලට ආසේවන පච්චය වේ. රූපාවචර කුසලය වනාහි රූපාවචර කුසලයට ද අරූපාවචර කුසලය අරූපාවචර කුසලයට ද අකුසලය වනාහි අකුසලයට ආසේවන පච්චය වේ. කිරියෙන් වනාහි කාමාවචර කිරිය නියමයෙන් කාමාවචර කිරියටම යමෙක් ඤාණ සම්පයුත්ත වේද එය තමා හා සමාන වේදනා රූපාවචර කිරියට අරූපාවචර කිරියටදැයි මේ රාසිවලට ආසේවන පච්චය වේ. රූපාවර කිරිය නියමයෙන් වනාහි රූපාවචර කිරියටම අරූපාවචර කිරිය නියමයෙන් අරූපාවචර කිරියටම ආසේවන පච්චය වේ. විපාකය වනාහි එක් ධර්මයකට එක් ධර්මයක් හෝ කිසි විපාකයකට ආසේවන පච්චය නැතැයි මෙසේ මෙහි පච්චයුප්පන්න වශයෙන් ද විනිශ්චය දතයුතුය.

**ආසේවන පච්චය නිද්දේසය නිමි.**

14. කම්ම

කම්ම පච්චය නිද්දේසයෙහි **කම්මං** චේතනා කර්මයම. **කටත්තා ච රූපානං** කර්මයේ කටත්තා උපන් රූපයන්ගේ **කම්ම පච්චයෙන** අනේක කල්පකෝටි මත්තෙහි තමාගේ ඵලය ඉපදවීමට සමත් බැවින් නා නා ක්‍ෂණික කර්ම පච්චයෙන් යන අර්ථයයි. කුසල අකුසලවල කර්මය තමාගේ

පවත්ති ක්ෂණයෙහි ඵල නොදේ. ඉදින් දෙන්නේ නම් යම් මනුෂ්‍යයෙක් දෙව්ලෝගාමී කුසල කර්මයක් කරයිද එය අනුභාවයෙන් ඒ කෙණෙහි දෙවියෙක් වන්නේය. යම් ක්ෂණයක එය කරන ලදද එයින් අනිත් ක්ෂණයක විද්‍යමාන නොවේද හුදෙක් කටත්තා පමණක් මෙම ආත්මයෙහි උපදී හෝ වෙනත් අවස්ථාවක හෝ අවසේස පච්චය එක්වූ කල්හි පල උපදවයි. නිරුද්ධ වීමද පළමු ශිල්පාදි ක්‍රියා මෙන් කාලාන්තරයෙහි පැසුළු ශිල්පාදි ක්‍රියාවෙන් එහෙයින් නා නා ක්ෂණික කමම පචචය යයි කියයි. චේතනා සම්පයුත්තකානං ධමමානං යම් චේතනාවක් තමා සම්පයුත්ත ධර්මයන්ගේ තං සමුට්ඨා නානනති මේ ප්‍රතිසන්ධි ක්ෂණයෙහි කටත්තා රූපද ගනී. **කමම පචචයෙන** මේ සහජාත චේතනා සඳහා කියන ලදී. කුසලාදියෙහි යම්කිසි චේතනාවක් සෙසු ධර්මයන්ගේ චිත්ත ප්‍රයෝග නියමයෙන් කිරිය අභාවයෙන් උපකාරක වේ. එහෙයින් සහජාත කමම පච්චයයි කියයි. මෙහි පෙළ වර්ණනාවයි.

මෙය කම්ම පච්චය වනාහි අර්ථ වශයෙන් චතුභූමක චේතනා පමණක්ම වේ. එය ජාති භේදයෙන් කුසල, අකුසල, විපාක, කිරිය යයි සතරාකාරය. එහි කුසලම භූමි වශයෙන් කාමාවචරාදි වශයෙන් සතරාකාරය. අකුසල ඒකාකාරය. විපාකය සතරවිධය. කිරිය තුන් අයුරුයයි මෙසේ මෙහි නා නා ප්‍රකාර භේද වශයෙන් විනිශ්චය දතයුතුය.

මෙසේ බෙදුණු මෙහි වනාහි සහජාත කාමාවචර කුසල චේතනා පංචවෝකාරයෙහි තමා හා සම්ප්‍රයුක්ත ධර්මවලට මෙන්ම චිත්ත සමුට්ඨාන රූපයට ද චතුවෝකාරයෙහි සම්ප්‍රයුක්ත ස්කන්ධ ධ්‍යානවලටද සහජාත කම්ම පච්චය වේ. ඉපදී නිරුද්ධ වූ තමාගේ විපාකවලට ස්කන්ධයන්ට කටත්තා රූපවලට නා නා ක්ෂණික කම්ම පච්චයෙන් පච්චය වේ. එය ද වනාහි පංචවෝකාරයේමය. අන්තැනක නොවේ. සහජාත රූපාවචර කුසල චේතනා තමා හා සම්ප්‍රයුක්ත ධර්මයන්ට චිත්ත සමුට්ඨාන රූපවලටද ඒකාන්තයෙන් සහජාත කම්ම පච්චයෙන් පච්චය වේ. ඉපදී නිරුද්ධ වූ තමාගේ විපාකවලටද කටත්තා රූපවලටද නා නා ක්ෂණික කම්ම පච්චයෙන් පච්චය වේ. අරූපාවචර වනාහි ලෝකෝත්තර සහජාත කුසල චේතනා ද පංචවෝකාරයෙහි තමා හා සම්පයුත්ත ධම්මවලට ද චිත්ත සමුට්ඨාන රූපවලට ද චතුවෝකාරයෙහි සම්පයුත්ත ස්කන්ධ ධ්‍යාන ද සහජාත කම්ම පච්චයෙන් පච්චය වේ. ඉපදී නිරුද්ධ වූවෝ වනාහි ද්විධ වෙති. තම තමාගේ විපාක ස්කන්ධ

ධ්‍යානවලට නා නා ක්‍ෂණික කම්ම පච්චයෙන් පච්චය වේ. සහජාත අකුසල චේතනා පංචවෝකාරයෙහි තමා හා සම්ප්‍රයුක්ත ස්කන්ධවලටද චිත්ත සමුට්ඨාන රූපවලටද චතුවෝකාරයෙහි අරූප ස්කන්ධ ධ්‍යානවලටද සහජාත කම්ම පච්චයෙන් පච්චය වේ. ඉපදී නිරුද්ධ වූ චනාහි විපාක ස්කන්ධ ධ්‍යානවලටද කටත්තා රූපවලටද නා නා ක්‍ෂණික කමම පච්චයෙන් පච්චය වේ. කාමාවචර රූපාවචර වශයෙන් විපාක චේතනා තමා හා සම්පයුත්ත ධර්මයන්ටද සහජාත කම්ම පච්චයෙන් පච්චය වේ. අරූපාවචර විපාක චේතනා තමා හා සම්පයුත්ත ධර්මවලටද සහජාත පච්චයෙන් පච්චය වේ. ලෝකෝත්තර විපාක චේතනා පංචවෝකාරයෙහි තමා හා සම්පයුත්ත ධර්මවලටද චිත්ත සමුට්ඨාන රූපයටද චතුවෝකාරයෙහි අරූපාවචරයටද සහජාත කම්ම පච්චයෙන් පච්චය වේ. ත්‍රෛභූමික කිරිය චේතනා පංචවෝකාරයෙහි සම්ප්‍රයුත්ත ධර්මවලට ද චිත්ත සමුට්ඨාන රූපයට ද, සහජාත කම්ම පච්චයෙන් පච්චය වේ. යමෙක් ආරුප්පයෙහි උපදීද ඒ අරූප ධර්මවලට ද සහජාත කම්ම පච්චයෙන් පච්චය වේයයි මෙසේ මෙහි පච්චයුප්පන්න වශයෙන් ද විනිශ්චය දතයුතුය.

කම්ම පච්චය නිද්දේසය
නිමි.

15. විපාක

විපාක පච්චය නිද්දේසයෙහි විපාකා චතතාරො ඛන්ධා යයි යම්සේ කමම සමුට්ඨාන රූපද විපාක නොවේ. එහෙයින් විපාකයයි කියා සතර ස්කන්ධ කියන ලදී. මෙසේ මේ පෙළෙහි අරූප ධර්මම විපාක පච්චයෙන් ආයේය. ප්‍රශ්න වාරයේ චනාහි :-

විපාක අබ්‍යාකත එක් ස්කන්ධයකි. ස්කන්ධ තුනටද චිත්ත සමුට්ඨාන රූපවලටද විපාක පච්චයෙන් පච්චය වේ. ප්‍රතිසන්ධි ක්‍ෂණයෙහි විපාක අබ්‍යාකත එක් ස්කන්ධයකි. ස්කන්ධ තුනටද කටත්තා රූපවලටද විපාක පච්චයෙන් පච්චය වේ.

ආවා වූ චිත්ත සමුට්ඨාන කම්ම සමුට්ඨාන රූපද විපාක පච්චය ලබයි. මෙහි චනාහි සාවසේස වශයෙන් දේශනා කළායයි මෙහි පෙළ වර්ණනාවයි.

මේ විපාක පච්චය විපාක භාවයෙන් ජාති වශයෙන් ඒකවිධය. භූමි භේද වශයෙන් කාමාවචරාදි වශයෙන් චතුර්විධය. මෙසේ මෙහි නා නා ප්‍රකාර භේද වශයෙන් විනිශ්චය දතයුතුය.

මෙසේ බෙදුණු මෙහි කාමාවචර රූපාවචර විපාකය තමා හා සම්ප්‍රයුක්ත ධර්මවලට පැවති චිත්ත සමුට්ඨාන රූපවලට ප්‍රතිසන්ධියෙහි කටත්තා රූපවලටද විපාක පච්චය වේ. අරූපාවචර විපාකය සම්ප්‍රයුක්ත ධර්මයන්ට ද ලෝකෝත්තර විපාකය පංචවෝකාරයෙහි සම්ප්‍රයුක්ත ධර්මයන්ටද චිත්ත සමුට්ඨාන රූපයටද චතුවෝකාරයෙහි සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට ම විපාක පච්චය වේ යයි මෙසේ මෙහි පච්චයුප්පන්න වශයෙන් ද විනිශ්චය දතයුතුය.

විපාක පච්චය නිද්දේසය
නිමි.

16. ආහාර

ආහාර පච්චය නිද්දේසයෙහි කබලීකාරො ආහාරො සතර සන්තති සමුට්ඨාන රූපයෙහි ඕජාව ආහාර නම්. එය වනාහි යම්සේ පිඬු කොට ගිලීමෙන් ආහාර කෘත්‍ය කරයි. පිටත නො සිටියේය. එහෙයින් ආහාර යයි නොකියා කබලීකාර ආහාර යයි කියන ලදී. පිඬු කොට ගිලිය යුතු වස්තු බැවින් හෝ කබලීකාර යයි මේ නම වේ. ඊට අරූපිනො ආහාරා ඵස්ස චේතනා විඤ්ඤාණ ආහාර. තං සමුට්ඨානානං මෙහිද කම්ම සමුට්ඨාන ගන්නා ලදී. පඤ්හ වාරයේ මෙය කියන ලදී. 'ප්‍රතිසන්ධි ක්‍ෂණයෙහි විපාක අබ්‍යාකත ආහාර සම්ප්‍රයුත්ත ස්කන්ධයන්ට කටත්තා රූපයන්ටද ආහාර පච්චයෙන් පච්චය වේ'යයි මේ මෙහි පෙළෙහි වර්ණනාවය.

මේ ආහාර පච්චය වනාහි සංක්‍ෂේපයෙන් කබලීකාර ආහාරය. ඵස්ස, චේතනා, විඤ්ඤාණ යයි සතර දහම් වේ. එහි කබලීකාර ආහාරය හැර සෙසු තුන අරූප ආහාර වේ. ජාති වශයෙන් කුසල, අකුසල, විපාක, කිරිය භේද වශයෙන් සතරට බෙදේ. නැවත භූමි භේදයෙන් කුසලය සතරාකාරය. අකුසලය ඒක්විධය. විපාකය සතරවිධය. කිරිය ත්‍රිවිධය.

මෙසේ විවිධව බෙදේ. කබලීකාර ආහාරය වනාහි ජාති වශයෙන් අව්‍යාකෘතය. භූමි වශයෙන් කාමාවචරයයි මෙසේ මෙහි නා නා ප්‍රකාර භේද වශයෙන් විනිශ්චය දතයුතුය.

මෙසේ බෙදුණු මෙහි චතු භූමිකද කුසල ආහාර තුන ද පංච වෝකාරයෙහි තමා හා සම්පයුත්ත ධර්මයන්ට මෙන්ම චිත්ත සමුට්ඨාන රූපයට ද ආහාර පච්චයෙන් පච්චය වේ. රූපාවචර හැර අවසේස ආරුප්පයෙහි සම්ප්‍රයුක්ත ධර්මයන්ටද ආහාර පච්චයෙන් පච්චය වේ. අකුසල ආහාරයෙහි ද මෙම නයම වේ. චතුභූමක විපාක ආහාරය වනාහි සියළු තැන සම්ප්‍රයුත්තකයන්ට ආහාර පච්චය වේ. මෙහි කාමාවචර රූපාවචර විපාකය වනාහි පංචවෝකාරයේ උපදිමින් පවත්නේ චිත්ත සමුට්ඨාන රූපයට ප්‍රතිසන්ධියේ උපදිමින් පවත්නේ චිත්ත සමුට්ඨාන රූපයට ප්‍රතිසන්ධියේ කටත්තා රූපයට ද ආහාර පච්චය වේ. ලෝකෝත්තර චිත්ත සමුට්ඨාන රූපයට ද, ආරුප්පයෙහි උපන් රූපයට පච්චය නොවේ. තෛභූමකයද කිරිය ආහාර තුන පංචවෝකාරයෙහි සම්ප්‍රයුත්ත ධර්මයන්ටද චිත්ත සමුට්ඨාන රූපයටද ආහාර පච්චයෙන් පච්චය වේ. කාමාවචර අරූපාවචර වනාහි ආරුප්පයෙහි සම්ප්‍රයුත්ත ධර්මයන් ආහාර ප්‍රත්‍ය වේ. සතර සන්තති සමුට්ඨාන කබලීකාර ආහාර කිසිවක් මේ කයට යයි අවිසේසයෙන් කියන ලදී. විශේෂයෙන් වනාහි මෙහි ආහාර සමුට්ඨාන රූපයට උපදවන්නාද අනුපාලකයාද වී ආහාර පච්චයෙන් පච්චය වේ. සෙසු සමුට්ඨාන සැත්තෑ තුන අනුපාලක වී ආහාර පච්චයෙන් පච්චය වේ යයි මෙසේ මෙහි පච්චයුප්පන්න වශයෙන් ද විනිශ්චය දැනගත යුතුය.

**ආහාර පච්චය නිද්දේසය නිමි.**

17. ඉන්‍ද්‍රිය

ඉන්‍ද්‍රිය පච්චය නිද්දේසයෙහි **චක්ඛුන්‍ද්‍රියං** චක්ඛු සංඛ්‍යාත ඉන්‍ද්‍රිය. **ඉන්‍ද්‍රිය පචචයෙන** තමා පෙර ඉපදී අරූප ධර්ම ඉපදවීමේ සිට නිරුද්ධ වන තුරු ඉන්‍ද්‍රිය පච්චයෙන් පච්චය වේ. සෝත ඉන්‍ද්‍රියාදියෙහි ද මෙම නයයි. **අරූපිනො ඉන්‍ද්‍රියානි** මෙහි අරූප ජීවිතෙන්‍ද්‍රිය ද ඇතුළත්ය. **තං සමුටඨානං** මෙය යට කියන ලද නයින්ම කටත්තා රූප ද ඇතුළත් කරන

ලදී. ප්‍රශ්න වාරයෙහි මෙය කියන ලදී. 'ප්‍රතිසන්ධි ක්‍ෂණයෙහි විපාක අබ්‍යාකත ඉන්‍ද්‍රිය සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට කටත්තා රූපවලට රූපවලට ඉන්‍ද්‍රිය පච්චයෙන් පච්චය වේ' යයි මෙසේ මෙහි පෙළ වර්ණනාව දතයුතුය.

මේ ඉන්‍ද්‍රිය පච්චය වනාහි ස්ත්‍රී පුරුෂ ඉන්‍ද්‍රිය හැර ඉන්‍ද්‍රිය විස්සක් පවතී. ස්ත්‍රී පුරුෂ ඉන්‍ද්‍රිය කිසිවක් ස්ත්‍රී පුරුෂ ලිංගවලට බීජ වේ. කලල ආදි කාලයෙහි පවතින ඒවායෙහි ස්ත්‍රී පුරුෂ ලිංගාදීන්ගේ අභාව නොමැති බව ඒවා ඒවට, වෙනත් ඒවාට ඉන්‍ද්‍රිය ප්‍රත්‍ය බව නොපතුරුවයි. ඉන්‍ද්‍රිය පච්චය තමාගේ විද්‍යමාන ක්‍ෂණයෙහි නො නිවි දහම්වලට ඉන්‍ද්‍රිය පච්චයභාවය නො පතුරුවන්නේ නම් නැත. එහෙයින් ඒවා (ස්ත්‍රී පුරුෂ) ඉන්‍ද්‍රිය පච්චය නොවේ. ඒවා යමකට බීජ වේද ඒවාට ඒවා සූත්‍රාන්තික පරියායෙන් (ක්‍රමයෙන්) ප්‍රකෘති උපනිස්සය භාවය භජනය කරයි. මෙසේ ඉන්‍ද්‍රිය පච්චය සමවිසි ඉන්‍ද්‍රිය වශයෙන් පවතී යයි දතයුතුය.

එය ජාති වශයෙන් කුසල, අකුසල, විපාක, කිරිය, රූප වශයෙන් පස් ආකාරයට බෙදේ. එහි කුසලය භූමි වශයෙන් සිව් අයුරුය. අකුසලය කාමාවචර වේ. විපාකය සිව් අයුරුය. කිරිය තුන් අයුරුය. රූපය කාමාවචරමය. මෙසේ විවිධව බෙදේ. මෙසේ මෙහි නා නා ප්‍රකාර භේද වශයෙන් විනිශ්චය දැනගත යුතුය.

මෙසේ බෙදුණු මෙහි චතු භූමක කුසල ඉන්‍ද්‍රිය පච්චය පංච වෝකාරයෙහි සම්ප්‍රයුක්ත ධර්මයන්ට ද චිත්ත සමුට්ඨාන රූපයට ද ඉන්‍ද්‍රිය පච්චයෙන් පච්චය වේ. අකුසලය ද එසේය. රූපාවචර කුසලය හැර අවසේස කුසල අකුසල, ආරුප්පයෙහි සම්ප්‍රයුක්ත ධර්මවලටද ඉන්‍ද්‍රිය පච්චයෙන් පච්චය වේ. චතුභූමක විපාක ඉන්‍ද්‍රිය පච්චය ඒකාන්තයෙන්ම සම්ප්‍රයුක්තකයන්ට ඉන්‍ද්‍රිය පච්චයෙන් පච්චය වේ. මෙහි කාමාවචර රූපාවචර වනාහි පංචවෝකාරයෙහි ඉපදීමෙන් පවතින චිත්ත සමුට්ඨාන රූපයට ප්‍රතිසන්ධියෙහි කටත්තා රූපයට ද ඉන්‍ද්‍රිය පච්චයෙන් පච්චය වේ. ලෝකෝත්තරය චිත්ත සමුට්ඨාන රූපයටද අරූපයෙහි උපන් ලෝකෝත්තර විපාකයට ඉන්‍ද්‍රිය රූපයෝ පච්චය නොවේ. තෛභූමක කිරිය ඉන්‍ද්‍රිය පංචවෝකාරයෙහි සම්ප්‍රයුක්ත ධර්මයන්ට ද චිත්ත සමුට්ඨාන රූපයට ද (කාමාවචර රූපාවචර) ආරුප්පයෙහි සම්ප්‍රයුක්ත ධර්මයන්ට ද ඉන්‍ද්‍රිය පච්චය භාවය පතුරයි. චක්ඛු ඉන්‍ද්‍රියාදි වශයෙන් සවැදෑරුම් රූප ඉන්‍ද්‍රියෙහි චක්ඛු ඉන්‍ද්‍රිය කුසල අකුසල විපාක වශයෙන් සසම්ප්‍රයුත්ත

ධම්මවලට චක්ඛු විඤ්ඤාණ දෙකට. සෝත ඉන්ද්‍රියාදි එබඳු වූවන්, සෝත, විඤ්ඤාණාදියට, රූප ජීවිතේන්ද්‍රිය තමා හා සහජාතයන්ට ඨිති ක්‍ෂණයෙහි ඉන්ද්‍රිය පච්චයෙන් පච්චය වේ. සහජාත පච්චයභාවය වනාහි එයට නැතැයි මෙසේ මෙහි පච්චයුප්පන්න වශයෙන් ද විනිශ්චය දතයුතුය.

**ඉන්ද්‍රිය පච්චය නිද්දේසය නිමි.**

18. ඣාන

ඣාන පච්චය නිද්දේසයෙහි ඣානංගානි දෙපස් විඤ්ඤාණය හැර සෙසු සිත්වල උපන් විතක්ක විචාර පීති සෝමනස්ස දෝමනස්ස උපෙක්ඛා චිතෙතකගගතා යන අංග හත. විඤ්ඤාණ කාය පහේ ඉදිරියේ වැටෙන බව ඒවා කෙරෙහි විද්‍යමාන වුවද උපේක්ඛා සුඛ දුක්ඛ ධ්‍යාන වැඩීම් ආකාරයේ අභාවයෙන් ඣාන අංග නො උපුටන ලදමය. තං සමුට්ඨානානං මෙහි ද කටත්තා රූප සංග්‍රහ කරන ලදැයි දතයුතුය. ප්‍රශ්න වාරයෙහි මෙය කියන ලදී. ප්‍රතිසන්ධි ක්‍ෂණයෙහි විපාක අබ්‍යාකත ඣාන අංග සම්ප්‍රයුක්ත ස්කන්ධවලට කටත්තා රූපවලට ඣාන පච්චයෙන් පච්චය වේ.

මේ ඣාන පච්චය වනාහි ඣානාංග සත වශයෙන් පැවතියේද ජාති භේදයෙන් කුසල අකුසල විපාක කිරිය වශයෙන් සතරාකාරයට බෙදේ. නැවත භූමි වශයෙන් සතර එක සතර තුන යයි ආකාර වශයෙන් දොළොස් ආකාරයට බෙදේ යයි මෙසේ මෙහි නා නා ප්‍රකාර භේද වශයෙන් විනිශ්චය දතයුතුය.

මෙසේ බෙදුණු මෙහි චතු භූමියද කුසල ඣාන අංගය පංච වෝකාරයෙහි සම්ප්‍රයුත්ත ධර්මවලට ද චිත්ත සමුට්ඨාන රූපයට ද රූපාවචරය හැර අවසේස ආරුප්පයෙහි සම්ප්‍රයුත්ත ධර්මවලට ද ඣාන පච්චයෙන් පච්චය වේ. අකුසලයෙහි ද මෙම නයම වේ. කාමාවචර රූපාවචර විපාකයේ පවතින සම්ප්‍රයුත්ත ධර්මවලටද චිත්ත සමුට්ඨාන රූපයටද ප්‍රතිසන්ධියෙහි සම්ප්‍රයුත්ත ධර්මයන්ටද කටත්තා රූපයටද, ආරුප්පයෙහි විපාක සම්ප්‍රයුත්ත ධර්මයන්ටද ආරුප්පයෙහි ලෝකෝත්තර යම් විපාකයක් උපදීද එයද පංචවෝකාරයෙහි වනාහි ඒ චිත්ත සමුට්ඨාන රූපයටද ඣාන පච්චයෙන් පච්චය වේ. තුන් බිම ද කිරිය දැහැන්

අංගයද පංචවෝකාරයෙහි සම්ප්‍රයුත්ත දහම්වලටද චිත්ත සමුට්ඨාන රූපයටද මෙහි ආරුප්පයෙහි යමක් උපදීද එය සම්ප්‍රයුත්ත ධර්මවලටද ඣාන පච්චයෙන් පච්චය වේයයි මෙසේ මෙහි පච්චයුප්පන්න වශයෙන්ද විනිශ්චය දතයුතුය.

ඣාන පච්චය නිද්දේසය නිමි.

## 19. මගග

මගග පච්චය නිද්දේසයෙහි මගගංගානි අහේතුක චිතතුපපාද (සිත්) හැර සෙසු සිත්වල උපන් ප්‍රඥා විතර්ක සම්මා වාචා කම්මන්ත ආජීව විරිය සති සමාධි මිච්ඡා දිට්ඨි මිච්ඡා වාචා කම්මන්ත ආජීව යන මේ අංග දොළොසය. මාර්ගයේ වනාහි හේතු පශ්‍යමක බැවින් අහේතුක සිත්වල මාර්ග අංග නො උපුටන ලදී. තං සමුට්ඨානානං මෙහි ද කටත්තා රූපය සංගෘහීතය. ප්‍රශ්න වාරයෙහි එය කියන ලදී. 'ප්‍රතිසන්ධි ක්‍ෂණයෙහි විපාක අබ්‍යාකත මාර්ගාංග සම්ප්‍රයුක්ත ස්කන්ධවලට කටත්තා රූපවලට මග්ග පච්චයෙන් පච්චය වේ' යයි මෙය මෙහි පෙළ වර්ණනාවය.

මේ මග්ග පච්චය දොළොස් මාර්ගාංග වශයෙන් සිටියේ ද ජාති භේදයෙන් කුසලාදි වශයෙන් චතුර්විධය. කුසලාදියේ ද කාමාවචරාදි භූමි භේදයෙන් දොළොස් අයුරුය. මෙසේ මෙහි නා නා ප්‍රකාර භේද වශයෙන් විනිශ්චය දැනගත යුතුය.

මෙසේ බෙදුණු මෙහි වනාහි සිව් බිමද කුසල මග්ග අංගය පංච වෝකාරයෙහි සම්පයුත්ත ධර්මයන්ට ද චිත්ත සමුට්ඨාන රූපයට ද රූපාවචරය හැර සෙසු ආරුප්පයෙහි සම්පයුත්ත ධර්මයන්ට ද මග්ග පච්චයෙන් පච්චය වේ යයි සියල්ල ඣාන පච්චයේ මෙන් විස්තර විය යුතුයයි මෙසේ මෙහි පච්චයුප්පන්න වශයෙන්ද විනිශ්චය දතයුතුය.

මග්ග පච්චය නිද්දේසය
නිමි.

## 20. සම්පයුත්ත

සම්පයුත්ත පච්චය නිද්දේසයෙහි පෙළ නො ගැඹුරු අරුත් වේ. මේ සම්පයුත්ත පච්චය නම් සංක්ෂේපයෙන් සියළුම අරූපී ස්කන්ධ වේ. ප්‍රභේද වශයෙන් මෙය ජාති විසින් කුසලාදිය භූමි විසින් ද කාමාවචරාදිය වශයෙන් විවිධව බෙදේ යයි මෙසේ මෙහි නා නා ප්‍රකාර භේද වශයෙන් විනිශ්චය දතයුතුය.

මෙසේ බෙදුණු මෙහි සිව් බිමෙහි ද කුසල ස්කන්ධවල එක් ස්කන්ධයකි ස්කන්ධ තුනේ. තුන එකට දෙක දෙකට යයි මෙසේ සියළුම ඔවුනොවුන් සම්පයුත්ත පච්චයෙන් පච්චය වේ. අකුසල විපාක කිරිය ස්කන්ධවලද මෙම නයම වේයයි මෙසේ මේහ පච්චයුප්පන්න වශයෙන්ද විනිශ්චය දතයුතුය.

සම්පයුත්ත පච්චය නිද්දේසය
නිමි.

## 21. විප්පයුත්ත

විප්පයුත්ත පච්චය නිද්දේසයෙහි රූපිනො ධම්මා අරූපිනං මෙය හෘදය වස්තුවද චක්ඛු ඉන්ද්‍රියාදී වශයෙන් දතයුතුය. රූප ධර්මවල මේ කොටස් සයම අරූප ස්කන්ධවලට විප්පයුත්ත පච්චයෙන් පච්චය වේ. රූපායතනාදිය වනාහි ආරම්මණ ධම්ම කිසිවක් විප්පයුත්ත ධම්ම වේ. විප්පයුත්ත පච්චය නොවේ. කුමන කරුණකින්ද? සම්පයෝග සංකාය අභාවයෙන් අරූපී ස්කන්ධ චක්ඛු ආදී වස්තූන්ගේ අභ්‍යන්තරයෙන් නික්මෙන්නා මෙන් උපත වේ. එහි සැක වේ. මේවා මේවා සමග සම්පයුත්තද නැතහොත් විප්පයුත්ත වේද ආරම්මණ ධම්ම වනාහි වස්තු නිශ්‍රයෙන් උපදිමින් ආරම්මණය පමණක් වේ. ඒවාවල සම්පයෝග සංකා නැත. මෙසේ සම්පයෝග සංකාය අභාවයෙන් ඔවුහු විප්පයුත්ත පච්චය නොවෙති. හෘදය වස්තු ආදියෙහි මේ විප්පයුත්ත පච්චය වශයෙන් දතයුතුය. මෙය ප්‍රශ්න වාරයෙහි කියන ලදී.

'වස්තු කුසල ස්කන්ධයන්ගේ විප්පයුත්ත පච්චයෙන් පච්චය වේ. වස්තු අකුසල ස්කන්ධවලට විප්පයුත්ත පච්චයෙන් පච්චය වේ.

චක්ඛායතනය චක්ඛු විඤ්ඤාණයට විප්පයුත්ත පච්චයෙන් පච්චය වේ. සෝත, ඝාන, ජිව්හා, කායායතනය කාය විඤ්ඤාණයට විප්පයුත්ත පච්චයෙන් පච්චය වේ. වස්තු විපාක අබ්‍යාකතවලට කිරිය අබ්‍යාකත ස්කන්ධවලට විප්පයුත්ත පච්චයෙන් පච්චය වේ.'

අරූපී ධර්ම රූපී ධර්මවලට මෙය වනාහි සතර ස්කන්ධයන්ගේ වශයෙන් දතයුතුය. අරූප ධර්මවල සතර ස්කන්ධම සහජාත පුරේජාත රූප ධර්මවලට විප්පයුත්ත පච්චය වේ. නිවන අරූප හා සමාන නිසා රූපයට විප්පයුත්ත පච්චය නොවේ. 'සතරකින් සම්පයෝගය සතරකින් විප්පයෝගය වේ' යයි කියන ලදී. මෙසේ සතර අරූප ස්කනධවලටම විප්පයුත්ත පච්චයභාවය දතයුතුය. ප්‍රශ්න වාරයෙහි මෙය කියන ලදී.

සහජාත කුසල ස්කන්ධ චිත්ත සමුට්ඨාන රූපවලට විප්පයුත්ත පච්චයෙන් පච්චය වේ. පච්ඡාත කුසල ස්කන්ධ පුරේජාත මේ කයට විප්පයුත්ත පච්චයෙන් පච්චය වේ. ප්‍රතිසන්ධි ක්ෂණයෙහි විපාක අබ්‍යාකත ස්කන්ධ කටත්තා රූපවලට විප්පයුත්ත පච්චයෙන් පච්චය වේ. ස්කන්ධ වස්තුවලට' යයි මෙසේ මෙහි පෙළ වර්ණනාව දතයුතුය.

මේ විප්පයුත්ත පච්චය නම් සංක්ෂෙපයෙන් පංචවෝකාර භවයෙහි පවත්නා රූප අරූප ධර්ම වේ. ඒවායින් රූපය චක්ඛු ආදි වස්තු වශයෙන් සවැදෑරුම් බෙදෙන ලදී. අරූපය පංචවෝකාර භවයෙහි උපන් කුසල අකුසල විපාක කිරිය වශයෙන් සතර වැදෑරුම්ව බෙදෙන ලදී. එහි භූමි, කාමාවචරාදි වශයෙන් චතුර්විධය. එක්විධය. තිවිධය යයි එකොළොස් ආකාර භේද වේ. ආරුප්ප විපාකයට විප්පයුත්ත පච්චය නොවේ යයි මෙසේ මෙහි නා නා ප්‍රකාර භේද වශයෙන් විනිශ්චය දතයුතුය.

මෙසේ බෙදුණු මෙහි වනාහි පංචවෝකාර භවයෙහි උපන් චතු භූමක කුසලය අකුසලයද තමා විසින් උපදවන ලද චිත්ත සමුට්ඨානික රූපයට සහජාත විප්පයුත්ත පච්චයෙන් පච්චය වේ. උත්පාද ක්ෂණය නො ඉක්මවා ඨිති ක්ෂණයට පැමිණි පුරේජාත චතුසමුට්ඨානික තිසමුට්ඨානික රූප කයට පච්ඡාජාත විප්පයුත්ත පච්චයෙන් පච්චය වේ. ලෝකෝත්තර විපාකය චිත්ත සමුට්ඨාන රූපයටම. මෙය ත්‍රිවිධ වේ. පුරේජාත චතුසමුට්ඨානික තිසමුට්ඨානික කයට පච්ඡාජාත විප්පයුත්ත පච්චයෙන් පච්චය වේ. ත්‍රෛභූමක කිරිය චිත්ත සමුට්ඨානිකයට සහජාත

විප්පයුත්ත පච්චයෙන් පච්චය වේ. රූප සය අයුරින් සිටි කල්හි වස්තු රූපය ප්‍රතිසන්ධි ක්ෂණයෙහි කාමාවචර රූපාවචර විපාකවලට චතුභූමක කුසල්වලට අකුසල්වලට දෙපස් විඤ්ඤාණය හැර ත්‍රෛභූමක විපාකවලට ත්‍රෛභූමක කිරියවලට පුරේජාත විප්පයුත්ත පච්චයෙන් පච්චය වේ. චක්ඛායතන ආදිය චක්ඛු විඤ්ඤාණ ආදියට පුරේජාත විප්පයුත්ත පච්චයෙන් පච්චය වේ. මෙසේ මෙහි පච්චයුප්පන්න වශයෙන් ද විනිශ්චය දතයුතුය.

විප්පයුත්ත පච්චය නිද්දේසය
නිමි.

## 22. අත්ථි

අත්ථි පච්චය නිද්දේසයෙහි **චත්තාරො ඛන්ධා** යනාදියෙන් සහජාත වශයෙන් අත්ථි පච්චය නිර්දිෂ්ටය. **චක්ඛායතනං** යනාදියෙන් පුරේජාත වශයෙන්. **යං රූපං නිස්සාය** මෙහි සහජාත පුරේජාත වශයෙන් අත්ථි පච්චය දක්වන ලදී. මෙසේ මෙය පෙළෙහි සහජාත පුරේජාතම අත්ථි පච්චය වශයෙන් ආයේය. ප්‍රශ්න වාරයෙහි වනාහි සහජාත, පුරේජාත, පච්ඡාජාත, ආහාර, ඉන්ද්‍රිය යන ඒවායේ වශයෙන් ආ බැවින් පච්ඡාත ආහාර ඉන්ද්‍රිය වශයෙන් ද අත්ථි පච්චය ලැබේ. මෙහි වනාහි සාවසේස වශයෙන් දේශනය කරන ලදැයි මෙය පෙළ වර්ණනාවය.

මේ අත්ථි පච්චය වනාහි අඤ්ඤමඤ්ඤ වශයෙන් හා අඤ්ඤමඤ්ඤ වශයෙන් නොවේ යයි දෙයාකාරය. මෙහි අඤ්ඤමඤ්ඤ ත්‍රිවිධය. අරූප අරූපයෙන්, රූප රූපයෙන්, රූපාරූප රූපාරූපයෙන් වශයෙනි. **චත්තාරො ඛන්ධා අරූපිනො** මෙහි සියළු සිත් ඉපදීම් වශයෙන් අරූප අරූපයෙන් යයි කියන ලදී. **චත්තාරො මහාභූතා** මෙහි සියළු සිත් වශයෙන් රූප රූපයෙන් යයි කියන ලදී. **ඔක්කන්තික්ඛණෙ නාමරූපං** මෙහි ප්‍රතිසන්ධි ස්කන්ධයන් මෙන්ම වස්තු වශයෙන් රූපා රූප රූපාරූපයෙන් යයි කියන ලදී. අඤ්ඤමඤ්ඤ නොවත් ද අරූපං අරූපස්ස, රූපං රූපස්ස, රූපං අරූපස්ස වශයෙන් ත්‍රිවිධය. **චිත්ත චෙතසිකා ධම්මා** මෙහි පංච වෝකාර වශයෙන් අරූපය අරූපයට යයි කියන ලදී. **මහාභූත උපාදාය**

**රූපානං** මෙහි සියළු සිත් වශයෙන් රූපය රූපයට යයි කියන ලදී. **චක්ඛායතනං චක්ඛු විඤ්ඤාණ ධාතුයා** යනාදියෙහි වස්තු ආරම්මණ වශයෙන් රූපය අරූපයට යයි අත්ථි පච්චය කියන ලදී. තව මේ අත්ථි පච්චය නම් සංක්ෂෙපයෙන් ක්ෂණ තුනට පැමිණියේය. නාමය මෙන්ම රූපයද වර්තමාන ස්කන්ධ යයි කීමට වටී. එය ජාති භේදයෙන් කුසල, අකුසල, විපාක, කිරිය, රූප වශයෙන් පස් ආකාරයට බෙදේ. එහි කුසලය සහජාත පච්ඡාජාත වශයෙන් දෙවැදෑරුම් වේ. එසේම අකුසලය විපාකය හා කිරියද, ඒවායින් කුසලය කාමාවචරාදි භේදයෙන් සතරට බෙදේ. අකුසලය කාමාවචරමය. විපාකය චතුභූමකය. කිරිය තිභූමකය. රූප නියමයෙන් අත්ථි පච්චය කාමාවචරය. එය සහජාත පුරේජාත වශයෙන් ද්විධය. එහි පංච වස්තු ආරම්මණ ද පුරේජාත වේ. හෘදය වස්තුව සහජාත හෝ පුරේජාත හෝ වේ යයි ප්‍රශ්න වාරයෙහි ආවේය. ආහාරය ඉන්ද්‍රිය ද සහජාතාදි භේද නො ලැබේ යයි මෙසේ මෙහි නා නා ප්‍රකාර භේද වශයෙන් විනිශ්චය දතයුතුය.

මෙසේ බෙදුණු මෙහි වනාහි චතුභූමක කුසලය ද සහජාත අත්ථි පච්චය වේ. එක් ස්කන්ධයක් ස්කන්ධ තුනකට ආදි නයින් අඤ්ඤමඤ්ඤ ස්කන්ධයන්ට මෙන්ම චිත්ත සමුට්ඨාන රූපයට ද රූපාවචර කුසලය හැර අවසේස ආරුප්පයෙහි සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ටම සහජාත කුසලය අත්ථි පච්චයෙන් පච්චය වේ. අකුසලයෙහි ද මෙම නයම වේ. එය ද පංච වෝකාරයෙහි සම්ප්‍රයුක්ත ස්කන්ධවලට මෙන්ම චිත්ත සමුට්ඨාන රූපයටද චතුවෝකාරයෙහි සම්පයුත්ත ස්කන්ධයන්ට ද සහජාත කුසලය අත්ථි පච්චයෙන් පච්චය වේ. පංචවෝකාරයෙහි චතු සමුට්ඨානික තිසමුට්ඨානික කයට පච්ඡාත කුසලය අත්ථි පච්චයෙන් පච්චය වේ. විපාකය වනාහි කාමාවචර රූපාවචර අත්ථි පච්චය නියමයෙන් ම ප්‍රතිසන්ධි - ක්ෂණයෙහි ස්කන්ධවලටද කටත්තා රූපයටද සහජාත අත්ථි පච්චයෙන් පච්චය වේ. පවතින සම්පයුත්ත ස්කන්ධයන්ට ද චිත්ත සමුට්ඨාන රූපයට ද සහජාත අත්ථි පච්චයෙන් පච්චය වේ. ඨිතිභාවයට පැමිණි චතු සමුට්ඨානිකති සමුට්ඨානික කයට පච්ඡාජාත අත්ථි පච්චයෙන් පච්චය වේ. අරූපාවචර විපාකය වනාහි ආරුප්පයෙහි උපන් ලෝකෝත්තර විපාකයද තමා හා සම්ප්‍රයුක්ත ස්කන්ධම සහජාත අත්ථි පච්චයෙන් පච්චය වේ. පංච වෝකාරයෙහි ලෝකෝත්තර විපාකය සම්පයුත්ත ස්කන්ධයන්ටම චිත්ත සමුට්ඨාන රූපයද සහජාත අත්ථි පච්චයෙන් පච්චය වේ. චතුසමුට්ඨානික තිසමුට්ඨානික කයට පච්ඡාජාත පච්චයෙන් පච්චය වේ. කිරිය වශයෙන්

රූපාවචර අත්‍ථි පච්චය වේ. සම්පයුත්ත ස්කන්ධයන්ටද චිත්ත සමුට්ඨානික රූපයට ද සහජාත පච්චයෙන් පච්චය වේ. චතු සමුට්ඨානික තිසමුට්ඨානික කයට පච්ඡාජාත අත්‍ථි පච්චයෙන් පච්චය වේ. කාමාවචර රූපාවචර වනාහි ආරූප්පයෙහි සම්පයුත්ත ස්කන්ධයන්ටද පංචවෝකාරයෙහි චිත්ත සමුට්ඨාන රූපයට ද සහජාත අත්‍ථි පච්චයෙන් පච්චය වේ. රූප සංඛ්‍යාතය අත්‍ථි පච්චය සහජාත, පුරේජාත, ආහාර, ඉන්‍ද්‍රිය යයි සතරාකාරය. එහි සහජාත අත්‍ථි පච්චය චතු සමුට්ඨානික වශයෙන් සතරාකාරයෙන් සිටියේය. එහි කම්ම සමුට්ඨාන එකය, මග්ග මහාභූත තුනය. තුන එකටය. දෙක දෙකටය. මහාභූත උපාදාය රූප යයි මෙසේ සහජාත පච්චයෙන් පච්චය වේ. ප්‍රතිසන්ධි ක්‍ෂණයෙහි වස්තුරූපය කාමාවචර රූපාවචර විපාක ස්කන්ධයන්ට සහජාත අත්‍ථි පච්චයෙන් පච්චය වේ. සෙසු ති සමුට්ඨාන රූපද එක මහාභූතය. මහාභූත තුනට තුන එකට මහාභූත දෙක දෙට උපාදාය රූපවලට යයි මෙසේ සහජාත අත්‍ථි පච්චයෙන් පච්චය වේ. පුරේජාත අත්‍ථි පච්චය වනාහි වත්‍ථු පුරේජාත ආරම්මණ පුරේජාත වශයෙන් ද්විධ වේ. ඒ දෙවිධියම යට පුරේජාත පච්චයෙහි කියන ලද නයින්ම යොදා ගතයුතුය. ආහාර පච්චය ද යට කබලීකාර ආහාර පච්චයෙහි යොදන ලද නයින්ම යෙදිය යුතුය. මෙහි වනාහි මෙය නිරුද්ධ නොවූ ක්‍ෂණයෙහි පච්චයභාවයෙන් අත්‍ථි පච්චය යයි කියන ලදී. රූප ජීවිතේන්‍ද්‍රියද යට ඉන්‍ද්‍රිය පච්චයෙහි රූප ජීවිතේන්‍ද්‍රිය යෙදීමෙහි කියන ලද නයින්ම යෙදිය යුතුය. මෙහි වනාහි මෙයද තමාගේ අනිරුද්ධ ක්‍ෂණයෙහිම පච්චය භාවයෙන් අත්‍ථි පච්චය යයි කියන ලදැයි මෙසේ මෙහි පච්චයුප්පන්න වශයෙන් ද විනිශ්චය දතයුතුය.

**අත්‍ථි පච්චය නිද්දේසය නිමි.**

## 23. නත්‍ථි

නත්‍ථි පච්චය නිද්දේසයෙහි **සමනන්තර නිරුද්ධා** යයි අන්‍ය සතකින් අනන්තරිකව සමනන්තර නිරුද්ධ වේ. **පච්චුප්පන්නානං** යනු පච්චුප්පන්නානං (වර්තමානයේ). මෙයින් නත්‍ථි පච්චයට අවකාස දීම් අර්ථයෙන් නත්‍ථි පච්චයභාවය සාදයි. පෙර නිරෝධ වශයෙන් පසුව වූවන්ට පැවතීමේ අවකාස (ඉඩ) නොදෙන්නවුන් අතරෙහි ඔවුන්ගේ පැවතීම් බව නොවන්නේය. මේ මෙහි පෙළ වර්ණනාවයි.

සෙසු සියල්ල අනන්තර පච්චයෙහි කියන ලද නයින්ම දතයුතුය. පච්චය ලක්‍ෂණයම මෙහි වෙනසයි. පච්චයන්ගේ වනාහි වර්තමාන කාලයේද විවිධ කිරීම් නැත. හුදෙක් එහි චක්ඛු විඤ්ඤාණධාතු සම්පයුත්තයන්ටද 'ධම්මා මනොධාතුයා' යනාදි නයින් පච්චයද පච්චය උපන්නද ස්වරූප වශයෙන් දක්වන ලදී. මෙහි වනාහි සමනන්තර නිරුද්ධ චිත්ත චෛතසික ධර්මයන්ගේ යයි ඒ සියල්ලද නිරෝධ උප්පාද වශයෙන් සමානව දක්වන ලදී.

නත්‍ථි පච්චය නිද්දේසය
නිමි.

## 23. විගත

විගත පච්චය නිද්දේසයෙහි **සමනනතර විගත** යයි සමනන්තරම විගත වේ. මෙයින් විගත පච්චයේ වෙන්ව ගමන්කිරීම් භවයෙන්ම පච්චය භාවය දක්වයි. නත්‍ථි පච්චයේද මෙහිද ව්‍යඤ්ජන මාත්‍රයෙන්ම (අකුරුවලින්) විවිධත්වය වේ. අර්ථයෙහි නොවේ.

විගත පච්චය නිද්දේසය
නිමි.

## 24. අවිගත

අවිගත පච්චය නිද්දේසයෙහි **චත්තාරො ඛන්ධා** යනාදියේ සියළු ආකාරයෙන් අත්‍ථි පච්චය නිද්දේසයෙහි කියන ලද නයින්ම අර්ථය දතයුතුය. මේ පච්චයේ අත්‍ථි පච්චය සමග අක්‍ෂරවලින් පමණක් නානත්වය වේ. අර්ථයෙහි නොවේ.

අවිගත පච්චය නිද්දේසය
නිමි.

දැන් මෙසේ උද්දේස නිද්දේස වශයෙන් දක්වන ලද මේ සූවිසි ප්‍රත්‍යවල ඤාණ වාරයේ විසදහාවය සඳහා :-

අනේක ධර්මවල ඒක පච්චයභාවයෙන්, එක් ධර්මයක අනේක පච්චයභාවයෙන්, එක් පච්චයක අනේක පච්චයභාවයෙන්, පච්චය සභාගයෙන්, පච්චය විසභාගයෙන්, යුගළකයෙන්, ජනකා ජනකයෙන්, සබ්බට්ඨානික සබ්බට්ඨානිකයෙන්, රූපය රූපයට යනාදි විකල්පයෙන්, භව භේදයෙන් යයි මේ පද දහය වශයෙන් ප්‍රකීර්ණක විනිශ්චය දතයුතුය.

එහි 'අනේක ධම්මානං එක පච්චයභාවතො' යයි මේවා අතරෙන් කම්ම පච්චය හැර අවසේස පච්චය විසිතුනේ අනේක ධර්ම එක පච්චයෙන් වේ. කම්ම පච්චය වනාහි එක් චේතනා ධර්මයම යයි මෙසේ එහි අනේක ධර්මවල එක් පච්චය භාව වශයෙන් විනිශ්චය දතයුතුය.

'එක ධම්මස්ස අනෙක පච්චයභාවතො' හේතු පච්චයෙහි අමෝහය එක් ධර්මයකි. එය පුරෙජාත, කම්ම, ආහාර, ඣාන පච්චය නොවේ. සෙසු පච්චය විස්ස පච්චය වේ. අලෝභ අදෝස, ඉන්ද්‍රිය මග්ග පච්චය නොවේ. සෙසු පච්චය අටළොස පච්චය වේ. ලෝභ, මෝහ, විපාක පච්චය නොවේ. සෙසු පච්චය සතළොස් පච්චය වේ. දෝසය අධිපති පච්චය නොවේ. සෙසු පච්චය සොළොස් පච්චය වේ.

ආරම්මණ පච්චයෙහි රූපායතනය චක්ඛු විඤ්ඤාණ ධාතුවට ආරම්මණ පුරේජාත, අත්‍ථි, අවිගත වශයෙන් සතරාකාර පච්චය වේ. එසේම මනෝ ධාතුවට අහේතුක මනෝ විඤ්ඤාණ ධාතුවට ද, සහේතුකයට වනාහි ආරම්මණ අධිපති ආරම්මණ උපනිස්සය වශයෙන් ද පච්චය වේ. මෙම නයින් සියළු ආරම්මණ ධර්මයන්ට අනේක පච්චයභාවය දතයුතුය.

අධිපති පච්චයෙහි ආරම්මණ අධිපති ආරම්මණ පච්චයෙහි කියන ලද නයින්ම අනේක පච්චයභාවය දතයුතුය.

සහජාත අධිපති කෙරෙහි වීමංස අමෝහ හේතු මෙන් විසි ආකාර පච්චය වේ. ඡන්දය, හේතු පුරේජාත, කම්ම, ආහාර, ඉන්ද්‍රිය, ඣාන, මග්ග පච්චය නොවේ. සෙසු සතළොස් පච්චය වශයෙන් පච්චය වේ. සිත

හේතු, පුරේජාත, කම්ම, ඣාන, මග්ග පච්චය නොවේ. සෙසු එකුන් විසි පච්චය වශයෙන් පච්චය වේ. විරිය හේතු, පුරේජාත, කම්ම, ආහාර, ඣාන පච්චය නොවේ. සෙසු එකුන් විසි වශයෙන් පච්චය වේ.

අනන්තර පච්චයෙහි 'චක්ඛු විඤ්ඤාණ ධාතු' යනාදි නයින් කියන ලද සතර ස්කන්ධවල වේදනා ස්කන්ධය, හේතු, පුරේජාත, කම්ම, ආහාර, මග්ග පච්චය නොවේ. සෙසු එකුන් වීසති වශයෙන් පච්චය වේ. සඤ්ඤා ඛන්ධය. ඉන්ද්‍රිය ඣාන පච්චය නොවේ. සෙසු සතළොස වශයෙන් පච්චය වේ. සංඛාර ඛන්ධයෙහි හේතු, හේතු පච්චයෙහි කියන ලද නයින්. ඡන්ද විරිය අධිපති පච්චයෙහි කියන ලද පච්චය වේ. ඵස්ස, හේතු පුරේජාත කම්ම ඉන්ද්‍රිය ඣාන මග්ග පච්චය නොවේ. සෙසු අටළොස වශයෙන් පච්චය වේ. චේතනා හේතු පුරේජාත ඉන්ද්‍රිය ඣාන මග්ග පච්චය නොවේ. සෙසු එකුන් විස්ස වශයෙන් පච්චය වේ. විතක්කය - හේතු පුරේජාත කම්ම ආහාර ඉන්ද්‍රිය පච්චය නොවේ. සෙසු එකුන් විස්ස වශයෙන් පච්චය වේ. විචාරය, මග්ග පච්චය ද නොවේ. සෙසු අටළොස වශයෙන් පච්චය වේ. පීති ඒවායේ වශයෙන්ම පච්චය වේ. චිතෙතකගගතා - හේතු පුරේජාත කම්ම ආහාර පච්චය නොවේ. සෙසු විස්ස වශයෙන් පච්චය වේ. සද්ධා - හේතු පුරේජාත කම්ම ආහාර ඣාන පච්චයෝ නොවෙති. සෙසු අටළොස වශයෙන් පච්චය වේ. සතිය ඒවා සමග මග්ග පච්චය ද යුක්ත එකුන් විසි අයුරින් පච්චය වේ. ජීවිතේන්ද්‍රිය සද්ධාවෙහි කියන ලද අටළොස වශයෙන් පච්චය වේ. හිරි ඔත්තප්ප (ලජ්ජා භය) එයින් ඉන්ද්‍රිය පච්චය බැහැරකොට සෙසු සතළොස වශයෙන් පච්චය වේ. කාය පස්සාදි යුගලයද එසේය. යෙවාපන කයෙහි (තවත් අනිත් ධර්මවල) අධිමොක්ඛ මනසිකාර තත්‍රමජ්ඣත්තතා කරුණා මුදිතා ද විරති වනාහි ඒවා සමග මග්ග පච්චයෙන්දැයි අටළොස් ආකාර පච්චය වේ. මිච්ඡාදිට්ඨි - එයින් විපාක පච්චය හැර සතළොස් ආකාරයකින්. මිච්ඡා වාචා කම්මන්ත ආජීව - ඒවායින් ද කම්ම ආහාර පච්චයෙන්දැයි එකුන්විසි ආකාරයකින්. අහිරික, අනොත්තප්ප, මාන, ථීන, මිද්ධ, උද්ධච්ච යන මේවාට හේතු පුරේජාත කම්ම විපාක ආහාර ඉන්ද්‍රිය ඣාන මග්ග පච්චය නොවේ. සෙසු සොළොස් පච්චය වශයෙන් පච්චය වේ. විචිකිච්ඡා, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච යන මේවාට එයින් අධිපති පච්චය හැර පසළොස් ආකාරයෙන්. විඤ්ඤාණ ස්කන්ධයට අධිපති පච්චයෙහි කියන ලද නයින්ම අනේක පච්චයභාවය දතයුතුය. සමනන්තර පච්චයෙහි ද මෙම නයම වේ.

සහජාත පච්චයෙහි සතර ස්කන්ධවල එක එක ධර්මයට අනේක පච්චයභාවය කියන ලද නයින්ම දතයුතුය. සතර මහාභූත ආරම්මණ, ආරම්මණා අධිපති, සහජාත අඤ්ඤමඤ්ඤ, නිසසය, උපනිසසය, පුරේජාත අත්ථි අවිගත වශයෙන් නව ආකාරයට පච්චය වේ. හෘදය වස්තුව - ඒවායේද විප්පයුත්තයේද වශයෙන් දස ආකාරයට පච්චය වේ. අඤ්ඤමඤ්ඤ පච්චයෙහි පෙර නොවූවක් නැත. නිස්සය පච්චයෙහි චක්ඛායතන ආදි-ආරම්මණ, ආරම්මණාධිපති, උපනිස්සය පුරේජාත, අත්ථි, අවිගත වශයෙන් සයාකාරයකින් පච්චය වේ. මෙහි පෙර නොවූවක් මෙපමණය. පච්ඡා ජාතාදියෙහි අපුබ්බ නැත. ආහාර පච්චයෙහි කබළීකාර ආහාරය - ආරම්මණ, අරම්මණාධිපති, උපනිස්සය ආහාර අත්ථි, අවිගත වශයෙන් පච්චය වේ. ඉන්ද්‍රියාදියෙහි අපුබ්බ නැත. මෙසේ මෙහි ඒක ධර්මයේ අනේක පච්චයභාව වශයෙන් ද විනිශ්චය දතයුතුය.

'එක පචචයසස අනෙක පචචය භාවතො' යයි හේතු පච්චයාදියෙහි යම්කිසි එක් පච්චයකට යම් අයුරකින් යම් අරුතකින් යම් පච්චයුප්පන්නයින්ගේ පච්චයක් වේද, ඒ අයුරු ඒ අරුත අත්නොහැරම අන්‍ය වූ යම් අයුරකින් යම් අරුතකින් එය එකෙණෙහිම ඒ ධර්මයන්ට අනේක පච්චයභාවයට යයි. එයින් අනේක පච්චයභාවයෙන් එහි විනිශ්චය දතයුතු යයි අර්ථය වේ. කෙසේද? අමෝහය හේතු පච්චයකි. එය හේතු පච්චය අර්ථය අත් නොහරින්නේම අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිසසය, විපාක, ඉන්ද්‍රිය, මගග, සම්පයුත්ත, විප්පයුත්ත, අත්ථි, අවිගත වශයෙන් අන්‍ය වූ ද එකොළොස් අයුරකින් අනේක පච්චයභාවයට යයි. අලෝභ අදෝස ඒවායින් අධිපති ඉන්ද්‍රිය, මග්ග පච්චය යන තුන හැර සෙස්සන්ගේ වශයෙන් අනේක පච්චයභාවයට යයි. මෙය විපාක හේවලද ලැබේ. කුසල කිරියවල වනාහි විපාක පච්චයභාවය පිරිහෙයි. සෙස්සන්ගේ වශයෙන් අනේක පච්චයභාවයට යයි.

ආරම්මණ පච්චය - ඒ ආරම්මණ පච්චයභාවය අත්නොහැරම ආරම්මණාධිපති, නිස්ස, උපනිස්සය, පුරේජාත, විප්පයුත්ත, අත්ථි අවිගතයන්ගේ වශයෙන් අන්‍ය වූ සත් ආකාරයකින් අනේක පච්චයභාවයට යයි. මෙය මෙහි උත්කෘෂ්ඨ පරිච්ඡේදයයි. අරූප ධර්මයන්ගේ වනාහි අතීත අනාගතවල හෝ රූප ධර්මයන්ගේ ආරම්මණ පච්චය නැතිකල්හි ආරම්මණාධිපති ආරම්මණ උපනිස්සය පමණක්ම මතුවෙහි ලබයි.

අධිපති පච්චයෙහි වීමංසය අමෝහයට සමානය. ඡන්දය. අධිපති පච්චය අධිපති පච්චයභාවය අත්නොහරින්නේම සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය, විපාක, සම්පයුත්ත, අත්‍ථි, අවිගතයන්ගේ වශයෙන් අන්‍ය වූ අට ආකාරයකින් අනේක පච්චයභාවයට යයි. අවිගතයන්ගේ වශයෙන් අනන්‍ය වූ ද දස ආකාරයකින් අනේක පච්චය භාවයට යයි. සිත ඒවායින් මග්ග පච්චය ඉවත්කොට ආහාර පච්චය බහා මේවායේ වශයෙන් අධිපති පච්චයෙන් මත්තෙහි දස ආකාරයකින් අනේක පච්චයභාවයට යයි. ආරම්මණාධිපති වනාහි යට ආරම්මණ පච්චයෙහි කියන ලද නයින් අනේක පච්චයභාවය දතයුතුය.

අනන්තර සමනන්තර පච්චය අනන්තර සමනන්තර පච්චයභාවය අත්නොහැරම උපනිස්සය, කම්ම, ආසේවන, නත්‍ථි, විගතයන්ගේ වශයෙන් අන්‍ය වූ පස් ආකාරයකින් අනේක පච්චයභාවයට යයි. ආර්ය මාර්ග චේතනාම මෙහි කම්ම පච්චයභාවය ලබයි. සෙසු ධර්ම නොවේ.

සහජාත පච්චය - සහජාත පච්චයභාවය අත් නොහරින්නේම හේතු, අධිපති, අඤ්ඤමඤ්ඤ, නිසසය කමම, විපාක, ආහාර, ඉන්‍ද්‍රිය, ඣාන, මගග, සම්පයුත්ත, විප්පයුත්ත, අත්‍ථි, අවිගතයන්ගේ වශයෙන් අන්‍ය වූ ද තුදුස් ආකාරයකින් අනේක පච්චයභාවයට යයි. මෙය ද උත්කෘෂ්ඨ පරිච්ඡේදයකි. වස්තු සහජාතාදීන්ගේ වනාහි වශයෙන් මෙහි හේතු පච්චයාදීන්ගේ අභාවයද දතයුතුය.

අඤ්ඤමඤ්ඤ පච්චයෙහි ද මෙම නයම වේ. නිස්සය පච්චය, නිස්සය පච්චයභාවය අත්නොහරින්නේ ම සූවිසි පච්චයවල තමාගේ නිස්සය පච්චය භාවය මෙන්ම අනන්තර, සමනන්තර, පච්ඡාජාත, ආසේවන, නත්‍ථි, විගතයද සය ඉවත්කොට සෙස්සන්ගේ වශයෙන් අන්‍ය වූද සතළොස් ආකාරයකින් අනේක පච්චයභාවයට යයි. මෙය ද උත්කෘෂ්ඨ පරිච්ඡේදයකි. වස්තු නිස්සයාදීන්ගේ වශයෙන් වනාහි මෙහි හේතු පච්චයාදීන්ගේ අභාවය දතයුතුය.

උපනිස්සය පච්චයෙහි ආරම්මණ උපනිස්සය ආරම්මණාධිපති සමානය. අනන්තර උපනිස්සය අනන්තර උපනිස්සය පච්චයභාවය අත්නොහරින්නේම අනන්තර, සමනන්තර, කම්ම, ආසේවන, නත්‍ථි, විගතයන්ගේ වශයෙන් අන්‍ය වූ ද සයාකාරයකින් අනේක පච්චයභාවයට

යයි. ආර්ය මාර්ග චේතනාම මෙහි කම්ම පච්චයභාවය ලබයි. සෙසු ධර්ම නොවේ.

පකතූපනිස්සය පකතූපනිස්සයම. කම්ම පච්චය ද පුරේජාත පච්චය තමාගේ පුරේජාත පච්චයභාවය අත්නොහැරම ආරම්මණ, ආරම්මණ අධිපති, නිස්සය, උපනිස්සය, ඉන්ද්‍රිය, විප්පයුත්ත, අත්‍ථි, අවිගතයන්ගේ වශයෙන් අන්‍ය වූ ද අට ආකාරයකින් අනේක පච්චයභාවය යයි මෙයද උත්කෘෂ්ඨ නිර්දේශයකි. මෙහි ආරම්මණ පුරේජාතයෙහි වනාහි නිස්සය ඉන්ද්‍රිය, විප්පයුත්ත, පච්චයභාවය නොලබයි. මෙයින් මතුවටද ලබන නොලබන බව දතයුතුය.

පච්ඡාජාත පච්චය තමාගේ පච්ඡාජාත පච්චයභාවය අත්නොහැර විප්පයුත්ත, අත්‍ථි අවිගතයන්ගේ වශයෙන් අන්‍ය වූ තුන් ආකාරයකින් අනේක පච්චයභාවයට යයි.

ආසේවන පච්චය ආසේවන පච්චයභාවය අත්නොහැරම අනන්තර, සමනන්තර, උපනිස්සය, නත්‍ථි, විගතයන්ගේ වශයෙන් අන්‍ය වූ පස් ආකාරයකින් අනේක පච්චයභාවයට යයි.

කම්ම පච්චය කම්ම පච්චයභාවය අත්නොහැරම ඒක ක්‍ෂණික සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, ආහාර, සම්පයුත්ත, විප්පයුත්ත, අත්‍ථි, අවිගතයන්ගේ වශයෙන් අන්‍ය වූද නව ආකාරයකින් අනේක පච්චයභාවයට යයි. නානා ක්‍ෂණික උපනිස්සය, අනන්තර, සමනන්තර, නත්‍ථි, විගතයන්ගේ වශයෙන් අන්‍ය වූද පස් ආකාරයකින් අනේක පච්චයභාවයට යයි.

විපාක පච්චය විපාක පච්චයභාවය අත්නොහැරම හේතු, අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිසසය, කම්ම, ආහාර, ඉන්ද්‍රිය, ඣාන, මග්ග, සම්පයුත්ත, විප්පයුත්ත, අවිගතයන්ගේ වශයෙන් අන්‍ය වූද තුදුස් ආකාරයකින් අනේක පච්චයභාවයට යයි.

ආහාර පච්චයෙහි කබලීකාර ආහාරය ආහාර පච්චයභාවය අත්නොහැරම අත්‍ථි, අවිගතයන්ගේ වශයෙන් අන්‍ය වූද දෙයාකාරයකින් අනේක පච්චයභාවයට යයි. සෙසු තුන ආහාර පච්චයභාවය අත්නොහැර

යථානුරූපව අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, කම්ම, විපාක, ඉන්‍ද්‍රිය, සම්පයුත්ත, විප්පයුත්ත, අත්‍ථි, අවිගතයන්ගේ වශයෙන් අන්‍ය වූද එකොළොස් ආකාරයකින් අනේක පච්චයභාවයට යයි.

ඉන්‍ද්‍රිය පච්චයෙහි රූපී පඤ්චඉන්‍ද්‍රිය ඉන්‍ද්‍රිය පච්චයභාවය අත්නොහැර නිස්සය, පුරේජාත, විප්පයුත්ත, අත්‍ථි, අවිගතයන්ගේ වශයෙන් අන්‍ය වූද පස් ආකාරයකින් අනේක පච්චයභාවයට යයි. රූප ජීවිතේන්‍ද්‍රිය ද ඉන්‍ද්‍රිය පච්චයභාවය අත්නොහැරම අත්‍ථි, අවිගත වශයෙන් අන්‍ය වූද දෙයාකාරයකින් අනේක පච්චයභාවයට යයි. අරූපි ඉන්‍ද්‍රිය ද යථානුරූපව ඉන්‍ද්‍රිය පච්චයභාවය අත්නොහරින්නේම හේතු, අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිසසය, විපාක, ආහාර, ඣාන, මගග, සම්පයුත්ත, විප්පයුත්ත, අත්‍ථි, අවිගතයන්ගේ වශයෙන් අන්‍ය වූද සොළොස් ආකාරයකින් අනේක පච්චයභාවයට යයි.

ඣාන පච්චය ඣාන පච්චයභාවය අත්නොහරින්නේම යථානුරූපව සහජාත, අඤ්ඤමඤ්ඤ, නිසසය, විපාක, ඉන්‍ද්‍රිය, මගග, සම්පයුත්ත, විප්පයුත්ත, අත්‍ථි අවිගතයන්ගේ වශයෙන් අන්‍ය වූද දස ආකාරයකින් අනේක පච්චයභාවයට යයි.

මග්ග පචචය මගග පචචයභාවය අත්නොහරින්නේම යථානුරූපව ඣාන පච්චයේ කියන ලද දහයේ හේතු අධිපතීන්ගේ වශයෙන් අන්‍ය වූ දොළොස් ආකාරයකින් අනේක පච්චයභාවයට යයි.

සම්පයුත්ත පච්චය, සම්පයුත්ත පච්චයභාවය අත්නොහරින්නේ යථානුරූපව හේතු, අධිපති, සහජපන, අඤ්ඤමඤ්ඤ, නිස්සය, කම්ම, විපාක, ආහාර, ඣාන, මග්ග, අත්‍ථි, අවිගතයන්ගේ වශයෙන් අන්‍ය වූද, තෙළෙස් ආකාරයෙන් අනේක පච්චයභාවයට යයි.

විප්පයුත්ත පච්චය, විප්පයුත්ත පච්චයභාවය අත්නොහරින්නේ අනන්තර, සමනන්තර, ආසේවන, සම්පයුත්ත, නත්‍ථි, විගත සංඛ්‍යාත පච්චය සය ඉවත්කොට සෙස්සන්ගේ වශයෙන් යථානුරූපව අන්‍ය වූද සතළොස් ආකාරයෙන් අනේක පච්චයභාවයට යයි. එහි රූපයේද අරූපයේද පච්චය විභාගය දතයුතුයි.

අත්ථි පච්චය අත්ථි පච්චයභාවය අත්නොහරින්නේ. අනන්තර, සමනන්තර, ආසේවන, විගත සංඛ්‍යාත පච්චය පහ බැහැරකොට සෙස්සන්ගේ වශයෙන් යථාරූපව අන්‍ය වූද අටළොස් ආකාරයෙන් අනේක පච්චයභාවයට යයි.

නත්ථි පච්චය විගත පච්චය අනන්තර පච්චයට සමානය. අවිගත පච්චය අත්ථි පච්චයට සමාන වේමය. මෙසේ මෙහි එක් පච්චයකට අනේක පච්චය භාව වශයෙන් විනිශ්චය දතයුතුය.

'පච්චය සභාගතො' යයි මේ සූවිසි පච්චයෙහි අනන්තර, සමනන්තර, අනන්තරරූපනිස්සය, ආසේවන, නත්ථි, විගත, සභාග යම්සේ ද එසේම ආරම්මණ, ආරම්මණාධිපති, ආරම්මණූපනිස්සය ද වේ. මෙම උපායෙන් මෙහි පච්චය සභාග වශයෙන් විනිශ්චය දතයුතුය.

'පච්චය විසභාගතො' යයි පුරේජාත පච්චය වනාහි මෙහි පච්ඡාජාත පච්චය සමග විසභාග වේ. එසේ සම්පයුත්ත පච්චය විප්පයුත්ත පච්චය සමග, අත්ථි පච්චය නත්ථි පච්චය සමග, විගත පච්චය අවිගත පච්චය සමග. මෙම උපායෙන් මෙහි පච්චය විසභාග වශයෙන් විනිශ්චය දතයුතුය.

'යුගළකතො' යයි මේවායෙහි ද අර්ථ සමාන බව ශබ්ද සමාන බව කාල ප්‍රතිපක්ෂභාවය, හේතුඵලභාවය, අඤ්ඤමඤ්ඤ ප්‍රතිපක්ෂ භාවය යයි මෙම කරුණුවලින් යුගළක වශයෙන් විනිශ්චය දතයුතුය. අනන්තර සමනන්තර අර්ථ සමාන බවට එක් යුගළකයක් නම් වේ. නිස්සය උපනිස්සය ශබ්ද සමාන බවට, පුරේජාත පච්ඡාජාත කාල ප්‍රතිපක්ෂ බවට, කම්ම පච්චය විපාක පච්චය හේතුඵල භාවයට, සම්පයුත්ත විප්පයුත්ත පච්චය ඔවුනොවුන් ප්‍රතිපක්ෂ බවට, එක් එක් යුගළක නම් වේ. එසේම අත්ථි නත්ථි පච්චය විගත අවිගත පච්චය යයි මෙසේ මෙහි යුගළක වශයෙන් ද විනිශ්චය වේ.

'ජනකා ජනකතො' යයි මේවායෙහි ද අනන්තර සමනන්තර අනන්තරූප නිස්සය පකතුපනිස්සය ආසේවන පච්චය නා නා ක්ෂණිකය, කම්ම පච්චය නත්ථි විගත පච්චය යන මේවා ජනක පච්චය වේ. අජනක නොවේ. පච්ඡාජාත පච්චය හුදෙක් උපස්ථම්භකය. ජනක නොවේ. සෙසු

පච්චය ජනක ද අජනක ද වේ. උපස්ථම්භකද වේ යන අර්ථයයි. මෙසේ මෙහි ජනක අජනක වශයෙන් ද විනිශ්චය දතයුතුය.

'සබ්බට්ඨානිකාසබ්බට්ඨානිකතො' මේවායෙහි ද සහජාත නිස්සය අත්ථි අවිගත පච්චය සබ්බට්ඨානිකය. සියළු රූප අරූප ධර්මයන්ට ස්ථාන වූ කරුණු වූ යන අර්ථයයි. මේවායින් හැර උපදින එක් ධර්මයකුදු නැත. ආරම්මණ ආරම්මණ අධිපති අනන්තර සමනන්තර අනන්තර උපනිස්සය පකතූපනිස්සය ආසේවන සම්පයුත්ත නත්ථි විගත පච්චය අසබ්බට්ඨානික නම් වේ. සියළු රූප අරූප ධර්මයන්ට ස්ථාන නොවේ. අරූප ස්කන්ධයන්ටම ස්ථාන වේ. කරුණු වේ යන අර්ථයයි. අරූප ධර්මවලම මේවා උපදියි. රූප ධර්මවල නොවේ. පුරේජාත පච්ඡාජාත පච්චය ද අසබ්බට්ඨානිකය. අරූප රූපවලටම පිළිවෙළින් පච්චයවීමෙන් කියන ලද අවසේස ද රූප අරූප ධර්මයන්ට උත්පත්ති හේතුභාවයෙන් සබ්බට්ඨානික නොවේයයි මෙසේ මෙහි සබ්බට්ඨානික අසබ්බට්ඨානික වශයෙන් ද විනිශ්චය දතයුතුය.

'රූපං රූපස්සාති ආදි විකප්පතො' මේවායෙහි ද සූවිසි ප්‍රත්‍යවල එක පච්චයක් ද ඒකාන්තයෙන්ම රූපය වී රූපයටම පච්චයවීමක් නම් නැත. ඒකාන්තයෙන් ම රූපය වී අරූපයට පච්චයවීමක් නම් නැත. මෙය කවරේද යත්? පුරේජාත පච්චයයි. පුරේජාත පච්චය වනාහි ඒකාන්තයෙන්ම රූපය වී අරූපයට පච්චය වේ. ඒකාන්තයෙන් ම රූපය වී රූප අරූපවලට පච්චයවීමක් නම් නැත. ඒකාන්තයෙන්ම අරූපය වී අරූපයට පච්චයවීමක් ඇත. මෙය කවරේද? අනන්තර සමනන්තර ආසේවන සම්පයුත්ත නත්ථි විගත වශයෙන් සයාකාරය. ඒ සියල්ල ද ඒකාන්තයෙන් ම අරූපය වී අරූපයටම පච්චය වේ. ඒකාන්තයෙන්ම අරූපය වී ඒකාන්තයෙන්ම රූපයට පච්චයවීමක් ද ඇත. මෙය කවරේද? පච්ඡාජාත පච්චයයි. එය ඒකාන්තයෙන් අරූපය වී රූපයටම පච්චය වේ. ඒකාන්තයෙන් අරූප ධර්මයව රූප අරූපවලට පච්චයවීමක් ද ඇත. මෙය කවරේද? හේතු, කම්ම, විපාක, ඣාන, මග්ග වශයෙන් පංචවිධය. ඒ සියල්ල ඒකාන්තයෙන් අරූපම වී රූපධර්මවල ද අරූප ධර්මවලට ද පච්චය වේ. ඒකාන්තයෙන් රූප අරූප වී රූපයට පච්චයවීමක් නම් නැත. අරූපයටම පච්චයවීමක් ඇත. එය කවරේද? ආරම්මණ හා උපනිස්සය පච්චය. මේ දෙක ඒකාන්තයෙන් රූප අරූප වී අරූපයටම පච්චය වේ. ඒකාන්තයෙන් රූප අරූප වී රූප අරූපවලට පච්චයවීමක් ද

ඇත. මෙය කවරේද? අධිපති සහජාත, අඤ්ඤමඤ්ඤ, නිසසය, ආහාර, ඉන්ද්‍රිය, විප්පයුත්ත, අත්‍ථි, අවිගත වශයෙන් නව ආකාරය. ඒ සියල්ල ඒකාන්තයෙන් රූප අරූප වී රූප අරූපවලටම පච්චය වේයයි මෙසේ මෙහි රූපාරූපසසති විකපප වශයෙන් ද විනිශ්චය දතයුතුය.

'භව භෙදතො' සූවිසි පච්චයවල පංචවෝකාර භවයෙහි කිසි පච්චයක් නොලැබෙන්නේ නොවේ. චතුවෝකාර භවයෙහි පුරේජාත, පච්ඡාජාත විප්පයුත්ත හැර සෙසු එක්විසි පච්චය ලැබේ. ඒකවෝකාර භවයෙහි සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය කම්ම ඉන්ද්‍රිය අත්‍ථි අවිගත වශයෙන් සතක් ලැබේ. බාහිරයෙහි වනාහි ඉන්ද්‍රියබද්ධ නොවන රූපයෙහි සහජාත, අඤ්ඤමඤ්ඤ නිස්ස අත්‍ථි අවිගත වශයෙන් පහක්ම ලබයි යයි මෙසේ මෙහි භවභේද වශයෙන් ද විනිශ්චය දැනගත යුතුය.

### පච්චය නිද්දේස වාර වර්ණනාව
### නිමි.

මෙසේ අනුලෝම පට්ඨාන ආදියෙහි තික පට්ඨාන ආදි වශයෙන් සූවිසි සියළු ප්‍රත්‍ය සමෝධාන පට්ඨාන මහා ප්‍රකරණයෙහි යම් තිකාදියක් නිසා නිර්දේශිත මේ තික පට්ඨානය, දුක පට්ඨානය..........දුක දුක පට්ඨානං යයි කියන ලදී. ඒවා ආමර්ශනය නොකොට යම් ප්‍රත්‍යයන්ගේ වශයෙන් ඒ තිකාදිය බෙදන ලදී. ඒ පච්චයම මේ මාතෘකා තබන පච්චය විභංග සංඛ්‍යාත වාරයෙන් උද්දේශ වශයෙන් ද නිද්දේස වශයෙන් ද දක්වා දැන් යම් තිකාදියක් නිසා දක්වන ලද මේ තික පට්ඨානය, දුක පට්ඨානය....දුක දුක පට්ඨානයයි කියන ලදී. ඒ තිකාදිය මේ පච්චයන්ගේ වශයෙන් විස්තර කොට දැක්වීමට එක එක තික දුක නිසා සත්මහා වාරයකින් දේශනා කරන ලදී. ඒවායේ නම් මෙසේය. පටිච්ච වාරය, සහජාත වාරය, පච්චය වාරය, නිස්සය වාරය, සංසට්ඨ වාරය, සම්පයුත්ත වාරය, පඤ්හා වාරය යනුවෙනි.

එහි **කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො** යයි පටිච්ච නම් වශයෙන් කියන ලද්දේ පටිච්ච වාරයයි. **කුසලං ධම්මං සහජාතො කුසලො ධම්මො** යයි සහජාත නම් වශයෙන් කියන ලද්දේ සහජාත වාරයයි. එය

පෙර පටිච්ච වාරය සමග අර්ථ වශයෙන් වෙනසක් නැත. පටිච්ච නම අවබෝධ කරන්නන්ගේ වශයෙන් පළමුව කියන ලදී. සහජාත නම අවබෝධ කරන්නන්ගේ වශයෙන් දෙවනුව කියන ලදී. දෙකේම චේතනාවල රූප අරූප ධර්ම වශයෙන් පච්චය මෙන්ම පච්චයුප්පන්නද දතයුතුය. ඒවා ද සහජාතමය. පුරේජාත පච්ඡාජාත නො ලැබේ. **කුසලං ධම්මං පච්චයා කුසලො ධම්මො** යයි මෙසේ පච්චය නම් වශයෙන් කියන ලද්දේ පච්චය වාරයයි. එයද පෙර වාර දෙක මෙන් රූප අරූප ධර්ම වශයෙන්ම දතයුතුය. මෙහි පච්චය වනාහි පුරේජාත ද ලබයි. පෙර දෙකට වඩා වෙනස මෙය වේ. ඉන් අනතුරුව කුසලං ධම්මං නිස්සාය කුසලො ධම්මො යයි මෙසේ නිස්සය නම් වශයෙන් කියන ලද්දේ නිස්සය වාරයයි. එය පෙර පච්චය වාරය සමග අර්ථයෙන් වෙනසක් නැත. පච්චය නම් වශයෙන් අවබෝධ කරන්නන්ට පළමුව කියන ලදී. නිස්සය නම් වශයෙන් අවබෝධ කරන්නන්ට දෙවනුව කියන ලදී. ඉනික්බිතිව **කුසලං ධම්මං සංසට්ඨො කුසලො ධම්මො** යයි මෙසේ සංසට්ඨ නම් වශයෙන් කියන ලද්දේ සංසට්ඨ වාරයයි. **කුසලං ධම්මං සම්පයුත්තො කුසලො ධම්මො** යයි මෙසේ සම්පයුත්ත නම් වශයෙන් කියන ලද්දේ සම්පයුත්ත වාරයයිය. එය පෙර සංසට්ඨ වාරයෙන් අර්ථ වශයෙන් වෙනස් නැත. සංසට්ඨ නම් වශයෙන් අවබෝධ කරන්නන්ට පළමුව කියන ලදී. සම්පයුත්ත නම් වශයෙන් අවබෝධ කරන්නන්ට දෙවනුව කියන ලදී. චේතනා දෙකේම අරූප ධර්ම වශයෙන් ම පච්චය පච්චයුප්පන්න ද දතයුතුය. සත්වන වාරයෙහි වනාහි යම්සේ **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස හෙතු පච්චයෙන පච්චයො** යනාදි නයින් ඒ ඒ ප්‍රශ්න උපුටා නැවත **කුසලා හෙතු සම්පයුත්තකානං** යනාදි නයින් ඒ සියළු ප්‍රශ්න ගැට නැතිව අවුල් නැතිකොට බෙදන ලදී. එහෙයින් ඒ වාරය ප්‍රශ්න මැනවින් බෙදන ලද බැවින් පඤ්හවාර සංඛ්‍යාවට ගියේය. මෙහි පච්චය ද පච්චයුප්පන්න ද රූපාරූප වශයෙන්ම දතයුතුය.

එහි යම් ඒ පටිච්ච වාරය සියල්ලට පළමුව උද්දේස නිද්දේස වශයෙන් එය ද්විධ වේ. එහි පළමුව උද්දේස වාරය පුච්ඡා වාරයයි ද කියයි. පණ්ණත්ති වාරයයි ද ඊටම නමකි. ඒ කුසලාදිය කුසලාදිය නිසා, හේතුප්‍රත්‍ය ආදීන්ගේ වශයෙන් උදෙසන ලද බැවින් උද්දේස වාර වේ. කුසලාදිය නිසා හේතුප්‍රත්‍යාදි වශයෙන් කුසලාදියේ උපත විමසන ලද බැවින් පුච්ඡාවාර වේ. කුසලාදිය නිසා හේතුප්‍රත්‍යාදි වශයෙන් කුසලාදි උපත පණවන ලද බැවින් පණ්ණත්ති වාරයයි කියන ලදී.

එහි **සියා කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය හෙතු පච්චයා** යනු පරිකල්පන පුච්ඡාය. එහි අර්ථය මෙසේය. යම් කුසල ධර්මයක් හේතු ප්‍රත්‍යයෙන් උපදින්නේ නම් එය කුසල ධර්මය නිසා වන්නේද? නොහොත් කුසල ධර්මය නිසා යම් කුසල ධර්මයක් උපදින්නේද එය හේතුප්‍රත්‍යයෙන් වන්නේදැයි මෙය මෙහි අර්ථයයි.

එහි **පටි** යනු සමාන අර්ථයෙහි පවතී. සදිස පුග්ගලයා පටිපුග්ගලයාය. සදිස (සමාන) භාග පටිභාග යයි කියනු ලැබේ. **ඉච්චා** මෙය ගමන උද්‍යොග කරන වචනයකි. දෙක එකතුකොට **පටිච්ච** එකට ඉපදීම් සංඛ්‍යාත සමාන භාවයට පැමිණ එක් උත්පත්ති භාවයට පැමිණේ යයි කියන ලද්දේ වේ. **කුසලො ධම්මො** යයි මෙසේ එකට ඉපදීම් වශයෙන් කුසල ධර්ම නිසා කුසල ධර්ම උපදින්නේ යයි අසයි. එසේ නැතහොත් **පටිච්චා** යයි පච්චයකොට ඒ පච්චය කිරීම පුරේජාත ද සහජාතද පච්චය ලබයි. මෙහි සහජාත අදහස් කරයි. **සියා කුසලං ධම්මං පටිච්ච අකුසලො** ආදියෙහි ද මෙම නයමයි. එහි සහජාත වශයෙන් කුසල ධර්මය නිසා කිසි අකුසලයක් නැත. මේ පුච්ඡා වාරයෙහි වනාහි යමක් විසඳන්නේ අර්ථ වශයෙන් ලබයි. යමක් නොලැබේද, ඒ සියල්ල ප්‍රශ්න වශයෙන් උපුටන ලදී. අන්‍යයා වශයෙන් වනාහි විසඳීමෙහි යමක් නොලැබේද, එය හැර යමක් ලැබේද එයම විසඳන ලදී. මෙසේ මෙහි ඇසීම්වල තේරුමද ඇසීමේ ස්වභාවය ද දැන ගණන වශයෙන් පුච්ඡා පරිච්ඡේදය දතයුතුය.

මෙහි වනාහි 'කුසලං ධම්මං පටිච්ච' යයි කුසල පදය මුල්කොට කුසල අකුසල අබ්‍යාකත තුන පුච්ඡා වේ. නැවත එයම මුල්කොට කුසල අබ්‍යාකතා වශයෙන් දුක ප්‍රභේද බැවින් තුන, නැවත එයම මුල්කොට තික අන්තකොට ඇති එකකි. මෙසේ **කුසලං ධම්මං පටිච්චා** කුසලය මුල්වූ ප්‍රශ්න හත. එසේම අකුසලය මුල්වූ. එසේම අබ්‍යාකතා මුල්වූ. එසේම කුසල අබ්‍යාකතා මුල්වූ. එසේම අකුසල අබ්‍යාකතා මුල්වූ. කුසල අකුසල ආදික, කුසල අකුසල අබ්‍යාකතාදික, සියල්ල සතක් වූ සත්තකයන්ගේ වශයෙන් කුසලතික නිසා හේතු පච්චයෙහි එකුන් පනස් ප්‍රශ්න ඇසීම්. එහි එකක් මුල්කොට එකක් අවසන්කොට ඇති නවයක්, එකක් මුල්කොට දෙකක් අවසන් කොට නවයක්, එකක් මුල්කොට තුනක් අවසන්කොට තුනක්, දෙකක් මුල්කොට දෙකක් අවසන්කොට ඇති නවයක්, දෙකක් මුල්කොට තුනක් අවසන්කොට ඇති තුනක්, තුනක් මුල්කොට

එකක් අවසන්කොට ඇති තුනක්, තුනක් මුල්කොට දෙකක් අවසන්කොට ඇති තුනක් තුනක් මුල්කොට තුනක් අවසන්කොට ඇති එකක් යයි මෙසේ මේවා මූල අවසාන වශයෙන් දතයුතුය. යම්සේ හේතුපච්චයෙහි එකුන්පනසක් ආරම්මණ පච්චයාදියෙහිද එසේම යයි සියළු සූවිසි ප්‍රත්‍යවලः-

එක් මුල් නයෙහි පැන - දහස් එක්සිය සැත්තෑ
යළි සයක් වන ලෙස - පිඬුකර ඇතැයි දන්නේ

ඉන්පසු හෙතුපචචයා ආරමමණ පචචයා යයි දෙමුල් නය ඇරඹී. එහි හේතු ආරම්මණ දෙක............හේතු අවිගත දෙක යයි හේතු පච්චය සමග තෙවිසි දෙකක් (දුක) වේ. ඒවා අතරින් හේතු පච්චයෙහි මෙන් හේතු ආරම්මණ දුකයෙහි ද එකුන් පනස් පුච්ඡා (පැන) වේ. ඒවායෙහි පෙළ දෙකක්ම දක්වන ලදී. හේතු ආරම්මණ දුකයෙහි යම්සේ එකුන්පනස් වේද හේතු අධිපති දුකාදියෙහි ද එසේය. එහි පළමු පුච්ඡා වශයෙන් හේතු අධිපති දුක, හේතු අනන්තර දුක, හේතු සමනන්තර දුක යයි පිළිවෙළින් දුක තුනක් දක්වා අවසානයෙහි හේතුඅවිගත දුක දක්වන ලදී. සෙස්ස සංක්ෂිප්ත පුච්ඡා වේ. මෙහි පරිච්ඡේදය වනාහි මෙසේ දතයුතුය.

දෙමුලෙහි පැන විසින් - දහස් එක්සිය සත් විසි
ලෙස දුකවල තෙවිසි - වන බව සොඳින් දන්නේ

ඉන්පසු හෙතු පචචයා ආරමමණ පචචයා අධිපති පචචයා යයි තුන්මූලක නය අරඹන ලදී. එහි හේතු ආරම්මණ දුක සමග අධිපති පච්චයාදි දෙවිසි පච්චයවල එක එකේ යෙදීම් වශයෙන් දෙවිසි තිකයෙ (තුන)ක් වේ. ඒවායින් පළමු පුච්ඡා වශයෙන් පළමු තිකයද දෙවන තිකයද දක්වා අවසාන තිකය දක්වන ලදී. සෙස්ස සංක්‍ෂෙප කරන ලදී. දුකවල මෙන් තිකවලද එක් එක් තිකයෙහි එකුන් පනස්කොට සියළු දෙවිසි තිකවල

තුන් මුල් නයෙහි පැන - එක් දහස් අට සැත්තෑ
වන ලෙසට ගණනින් - (සැක හැර දැනගත යෙහෝ)

ඉන්පසුව හෙතුපචචයා ආරමමණ පචචයා අධිපති පචචයා අනනතර පචචයා යයි චතු මූලක නය අරඹන ලදී. එහි පළමු තික සමග අනන්තර

පච්චයාදි එක්විසි පච්චයවල එක එකේ යෙදීම් වශයෙන් එක්විසි චතුක්ක වේ. ඒවායින් චතුක්ක දෙකක් දක්වා සෙස්ස සංක්‍ෂෙප කරන ලදී. මෙහිද එක එක චතුක්කයෙහි එකුන් පනසක් කොට සියළු එක්විසි චතුක්කවල-

සිව්මුල්හි පැන නය - එක්දහස් එකුන් තිසක්
වන ලෙසට ගණනින් - (සැකහැර දැනගත යෙහේ)

ඉනික්බිතිව පස්මුල් ආදිකොට සියළු මූලක දේශනා කරන ලදී. මත්තෙහි කිවයුතු සියල්ල සංක්‍ෂේප කොට යට කියූ දෙය ද මත්තෙහි කිවයුත්ත ද එකතුකොට පෙළෙහි එක මූලකං දුක මූලකං තික මූලකං චතු මූලකං සබ්බ මූලකං අසමමුයහනෙතන විත්‍ථාරෙ තබ්බං යන නය දක්වන ලදී. ඒවායෙහි එක එකෙහි එකුන් පනසක් කොට :-

පස්මුල් නයෙහි පැන - නවසියයකුදු වන යළි
අසූවක් ගණනින් - වන බව (සොඳින් දන්නේ)

සමුල්හි පළමු පංචකය සමග සහජාත පච්චයාදි එකුන් විසි පච්චයවල එක එකේ යෙදීම් වශයෙන් එකුන්විසි ඡකක (සය) වේ. ඒවායෙහි එක එකෙහි එකුන් පනස් කොට :-

සමුල්හි නය විසින් - නවසියයකුදු වන යළි
එක් තිසක් ලෙස පැන - වන බව (සොඳින් දන්නේ)

සත්මුල්හි පළමු ඡකකය සමග අඤ්ඤමඤ්ඤ පච්චයාදි අටලොස් පච්චයවල එක එකේ යෙදීම් වශයෙන් අටලොස් සත්තක වේ. ඒවායෙහි එක එකෙහි එකුන් පනස්කොට :-

සත්මුල්හි පැන නය - අටසියයකුදු වන යළි
දෙවිස්සක් ගණනින් - වන බව (සොඳින් දන්නේ)

අටඨ මූලකයෙහි පළමුවැනි සත්තකය සමග නිස්සය පච්චයාදි සතලොස් පච්චයවල එක එකේ යෙදීම් වශයෙන් සතලොස් අට්ඨක වේ. ඒවායේ එක එකෙහි එකුන් පනසක් කොට :-

**අටමුල් නයෙහි පැන - අටසිය තෙතිසක් ද වේ**
**යයි ගණන් වසයෙන් - දැනගනු යෙහේ නිසැකව**

නව මූලකයෙහි පළමුවන අට්ඨකය සමග උපනිස්සය පච්චයාදී සොළොස් පච්චටයවල එක එකේ යෙදීම් වශයෙන් සොළොස් නවකයක් වේ. ඒවායේ එක එකෙහි එකුන් පනසක් කොට :-

**සත්සියක් පැනයත් යළි සූ අසූ වන්නේ**
**විමසුම්හි ගණනින් - නව මූල්හි නය වන්නේ**

දස මූලකයෙහි පළමුවන නවකය සමග පුරේජාත පච්චයාදි පසළොස් පච්චයවල එක එකේ යෙදීම් වශයෙන් පසළොස් දසකය වේ. ඒවායේ එක එකෙහි එකුන් පනසක් කොට :-

**සත්සියක් පැනයන් - යළි පන්තිස ද වේ**
**විමසුම්හි ගණනින් - දසමූල්හි නය වන්නේ**

එකොළොස් මූලකයෙහි පළමුවන දසකය සමග පච්ඡාජාත පච්චයාදි තුදුස් පච්චයවල එක එකේ යෙදීම් වශයෙන් තුදුස් ඒකාදසකයක් වේ. ඒවායේ එක එකෙහි එකුන් පනසක් කොට :-

**එකොළොස් මුලෙහි පැන - සසියක් යළි සය ඇසූ**
**විමසුම්හි ගණනින් - දැනගනු එම නයෙහි තතු**

දොළොස් මූලකයෙහි පළමුවන එකොළොස් එකකය සමග ආසේවන පච්චයාදි තෙළෙස් පච්චයෙහි එක එකේ යෙදුම් වශයෙන් තෙළෙස් ද්වාදසක වේ. ඒවායේ එක එකෙහි එකුන් පනසක් කොට :-

**දොළොස් මුල් පැන නය - සසියක් යළිදු සත් තිස්**
**විමසුම්හි ගණනින් - දැනගනු නිසැකව යෙහේ**

තෙළෙස් මූලකයෙහි පළමුවන දොළොස සමගින් කම්ම පච්චයාදි දොළොස් පච්චයවල එක එකේ යෙදීම් වශයෙන් දොළොස් තෙළෙස් වේ. ඒවායේ එක එකෙහි එකුන් පනසක් කොට :-

තෙළෙස් මුල් නය පැන - පන්සිය යළි අට අසූ
විමසුම්හි ගණනින් - වන බව දැනගනු යෙහේ

තුන් මූලකයෙහි පළමුවන තෙළෙස සමග විපාක පච්චයාදි එකොළොස් පච්චයවල එක එකේ යෙදීම් වශයෙන් එකොළොස් තුදුසක් වේ. ඒවායේ එක එකේ එකුන් පනසක් කොට :-

තුදුස් මුල් නය පැන - පන්සිය එකුන් සතළිස්
විමසුම්හි ගණනින් - වන බව දැනගනු යෙහේ

පසළොස් මූලකයෙහි පළමුවන තුදුස සමග ආහාර පච්චයාදි දස පච්චයවල එක එකේ යෙදීම් වශයෙන් දස පසළොස් වේ. ඒවායේ එක එකේ එකුන් පනසක් කොට :-

පසළොස් මුල් නයෙහි - පැන සාරසිය අනූ
විමසුම්හි ගණනින් - වන බව දැනගනු යෙහේ

සොළොස් මූලකයෙහි පළමුවන පසළොස සමග ඉන්ද්‍රිය පච්චයාදි නව පච්චයවල එක එකේ යෙදීම් වශයෙන් නව සොළොස් වේ. ඒවායේ එක එකෙහි එකුන් පනසක් කොට :-

සොළොස් මුල් නය පැන - සාරසිය එක් සාළිස්
විමසුම්හි ගණනින් - වන බව දැනගනු යෙහේ

සතළොස් මූලකයෙහි පළමුවන සොළොස සමග ඣාන පච්චයාදි පච්චය අටෙහි එක එකේ යෙදීම් වශයෙන් අට සතළොස් වේ. ඒවයේ එක එකෙහි එකුන් පනසක් කොට :-

සතළොස් මුල් නයෙහි - තුන්සිය දෙයානූවක්
විමසුම්හි ගණනින් - වන බව දැනගනු යෙහේ

අටළොස් මූලකයෙහි පළමුවන සතළොස සමග මග්ග පච්චයාදි පච්චය සතෙහි එක එකේ යෙදීම් වශයෙන් සත අටළොස වේ. ඒවායේ එක එකේ එකුන් පනසක් කොට :-

**අටළොස් මුල් නයෙහි - තුන්සිය තෙසාළිස් වේ**
**විමසුම්හි ගණනින් - වන බව දැනගනු යෙහේ**

එකුන් විසි මූලකයෙහි පළමුවන අටළොස සමග සම්පයුත්ත පච්චයාද පච්චය සයෙහි එක එකේ යෙදීම් වශයෙන් සය එකුන් විසි වේ. ඒවායේ එකිනෙකෙහි එකුන් පනසක් කොට :-

**එකුන් විසි මුල් නයෙ - දෙසිය අනූ සතරෙක් වේ**
**විමසුම්හි ගණනින් - වන බව දැනගනු යෙහේ**

විසි මූලකයෙහි පළමුවන එකුන් විස්ස සමග විප්පයුත්ත පච්චයාදි පච්චය පසෙහි එක එකේ යෙදීම් වශයෙන් පස් විස්තික වේ. ඒවායේ එකිනෙකෙහි එකුන් පනසක් කොට :-

**විසි මුල් නයෙහි පැන - දෙසිය පන්සාළිස් වේ**
**විමසුම්හි ගණනින් - වන බව දැනගනු යෙහේ**

එක්විසි මූලකයෙහි පළමු වීසතිකය සමග අත්ථි පච්චයාදි පච්චය සතරෙහි එක එකේ යෙදීම් වශයෙන් සතර එක් වීසතික වේ. ඒවායේ එකිනෙකෙහි එකුන් පනසක් කොට :-

**එක්විසි මුල් නයෙහි - පැන එක්සිය සයානූ**
**විමසුම්හි ගණනින් - වන බව දැනගනු යෙහේ**

දෙවිසි මූලකයෙහි පළමු එක්විස්ස සමග නත්ථි පච්චයාදි පච්චය තුනෙහි එක එකේ යෙදීම් වශයෙන් තුන දෙවිස්ස වේ. ඒවායේ එකිනෙකෙහි එකුන් පනසක් කොට :-

**දෙවිසි මුල් පැන නයෙ - එක්සිය සත් සාළිසක්**
**විමසුම්හි ගණනින් - වන බව දැනගනු යෙහේ**

තෙවිසි මූලකයෙහි දෙවිස්ස සමග විගත අවිගත පච්චය දෙකෙහි එක එකේ යෙදීම් වහයෙන් දෙක තුන් විසි වේ. ඒවායේ එකිනෙකෙහි එකුන් පනසක් කොට :-

තුන්විසි මුල් නයෙහි - අටඅනූ පැන වන්නේ
විමසුම්හි ගණනින් - වන බව දැනගනු යෙහේ

සූවිසි මූලකයෙහි වනාහි සියළු පච්චයන්ගේ එක්කාසු කිරීමක් වශයෙන් දතයුතුය. එයින්ම සියළු මූලක යයි කියන ලදී. එහි එකුන් පනසක්ම විමසුම් වේ යයි මේ සියල්ලම හේතුපච්චය පදයම ගෙන ඒක මූලාකාදීන්ගේ සියළු මූලක අවසානය වශයෙන් ශාස්තෲන් විසින් දේව පිරිසට විස්තර වශයෙන් බෙදන ලදී. මෙහි විමසුම් සංක්ෂෙපයෙන් දක්වන ලදී. ඒ සියල්ලේම ගණන පිඩුකොට මෙය දක්වයි. ඒක මූලක නයෙහි එක්දහස් එක්සිය හැත්තෑහයක් විමසුම් ආවේය. හේතු පච්චය නයෙහි එම මූලකයෙන්ම එකුන් පනසක් කොට මේ හේතුපච්චය මූලකයෙහි ගතයුතුය. සෙස්ස සෙසු පච්චය මූලකවල බහාතැබිය යුතුය. දු මූලකයෙහි එක්දහස් එකසිය විසිහතකි. තිමූලකයෙහි එක්දහස් සැත්තෑ අටක් ද සිව් මූලකයෙහි එක්දහස් විසිනවයක් ද පංච මූලකයෙහි නවසිය අසූවක් ද සය මූලකයෙහි නවසිය තිස් එකක් ද සත්ත මූලකයෙහි අටසිය අසූදෙකක්ද අට්ඨ මූලකයෙහි අටසිය තිස්තුනක්ද නව මූලකයෙහි හත්සිය අසූහතරක්ද දසමූලකයෙහි හත්සිය තිස්පහක්ද එකොළොස්වන මූලකයෙහි හයසිය අසූහයක්ද දොළොස්වන මූලකයෙහි හයසිය තිස්හතක්ද තෙළෙස්වන මූලකයෙහි පන්සිය අසූඅටක්ද තුදුස්වන මූලකයෙහි පන්සිය තිස්නවයක්ද පසළොස්වන මූලකයෙහි හාරසිය අනූවක් ද සොළොස්වන මූලකයෙහි හාරසිය හතළිස් එකක්ද සතළොස්වන මූලකයෙහි තුන්සිය අනූදෙකක්ද අටළොස්වන මූලකයෙහි තුන්සිය හතළිස් තුනක්ද එකුන්වීසති මූලකයෙහි දෙසිය අනූහතරක් ද විසිවන මූලකයෙහි දෙසිය හතළිස්පහක්ද එක්විසි මූලකයෙහි එකසිය අනූහයක් ද දෙවිසි මූලකයෙහි එකසිය හතළිස් හතක්ද තෙවිසි මූලකයෙහි අනූඅටක්ද සියළු මූලකයෙහි හතළිස් නවයක්දැයි මෙසේ හේතු පදය ආදිකොට බෙදන ලද ඒකමූලකාදියෙහිː-

තුදුස් දහසක් සහ - යළි සත්සියයකින් යුත්
විමසුම් හේතු පද - එක්මුල් ඈ බේදයෙන්

මෙසේ හේතුපච්චය ආදිකොට එක් මූලයේ සිට සබ්බමූල නය දක්වා විමසුම් බේද දක්වා දැන් ආරම්මණ පච්චය ආදිකොට දැක්වීමට **සියා කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය ආරම්මණ පච්චයා හෙතුපච්චයා** යනාදිය කීහ.

එහි **ආරම්මණ පච්චයා හෙතුපච්චයා** යයි මෙපමණකින් ආරම්මණ පච්චය ආදිකොට හේතුපච්චය අවසන්කොට ඒක මූලක නය දක්වන ලදී. ඉන්පසු **ආරම්මණ පච්චයා අධිපති පච්චයා** යයි දුක මූලක ආරම්භ කරන ලදී. එහි මෙම පළමු දුක මෙන්ම ආරම්මණ විගත දුක ද දක්වා සෙස්ස සංක්ෂෙප කරන ලදී. **ආරම්මණ පච්චයා හෙතු පච්චයා** යයි මේ අවසාන දුකද නො දක්වන ලදී. ඉදින් වනාහි කිසියම් වාචනා මාර්ගයක් දක්නා ලැබේ ද, ඒ වාචනා මගම ගතයුතුය. ඉන්පසු ආරම්මණ පච්චය වශයෙන් තික මූලකාදිය නොදක්වාම අධිපති පච්චය ආදිකොට ඒකක ආදිය දැක්වීමට **අධිපති පච්චයා අනන්තර පච්චයා සමනන්තර පච්චයා සහජාත පච්චයා අඤ්ඤමඤ්ඤ පච්චයා** යයි මෙපමණක්ම කියන ලදී. එය ඒක මූලක වශයෙන් හෝ සබ්බ මූලක වශයෙන් හෝ දතයුතුයි. ඉන්පසු අවිගත පච්චය ආදිකොට දුමූලකම දැක්වීමට **අවිගත පච්චයා හෙතු පච්චයා** යනාදිය අරඹන ලදී. එහි අවිගතහෙතු දුක, අවිගත ආරම්මණ දුක, අවිගත අධිපති දුක, අවිගත විගත දුක යයි පිළිවෙළින් දුක තුනක් දක්වා අවසානයෙහි එක දුකක් දක්වන ලදී. එයින් අවිගත පච්චය වශයෙන් ම තිමූලකය දැක්වීමට **අවිගත පච්චයා හෙතු පච්චයා ආරම්මණ පච්චයා, අවිගත පච්චයා හෙතු පච්චයා අධිපති පච්චයා, අවිගත පච්චයා හෙතු පච්චයා අනන්තර පච්චයා** යයි මෙසේ පිළිවෙළින් තික තුනක් කියා **අවිගත පච්චයා හෙතුපච්චයා විගත පච්චයා** යයි අවසානයෙහි තිකය කියන ලදී. ඉක්බිති අවිගත පච්චය වශයෙන්ම චතු මූලකය දැක්වීමට **අවිගත පච්චයා හෙතු පච්චයා ආරම්මණ පච්චයා අධිපති පච්චයා, අවිගත පච්චයා හෙතු පච්චයා ආරම්මණ පච්චයා අනන්තර පච්චයා** යයි චතුක්ක දෙකක් කියා විගත පච්චයා යන පදය උදුරා තබන ලදී. සෙසු සියල්ල සංක්ෂේප කරන ලදී. එහි සංක්ෂේපභාවය දැක්වීමට **එකෙකස්ස පදස්ස එකමූලං දුමූලං තිමූලං සබ්බමූලං අසම්මු යහනෙතන විත්ථාරෙ තබ්බං** යයි කියන ලදී. එහෙයින් හේතු පච්චය මුල්කොට හේතු ආදි පද වශයෙන් ඒක මූලකයෙහි එක්දහස් එක්සිය හැත්තෑ හයක් විමසුම්...........සබ්බ මූලකයෙහි එකුන් පනසක්, මෙසේ ආරම්මණ පච්චය ආදියෙහි ද එක එක මුල්කොට ආරම්මණ ආදි පද වශයෙන් එක එක පදයේ එක්දහස් එකසිය හැත්තෑහයක් ද විමසුම්....... සබ්බ මූලකයෙහි එකුන් පනසක්දැයි එක එක පදයේ ඒක මූලකාදි භේදයෙහි විමසුම් තුදුස් දහස් හැත්තෑහතක් වේ. ඒ සියලු සූවිසි පච්චයවලද මේ ගණන සීමා වේ.

දෙපනස් දහස් අට - සිය තුන් සියදහස් වන
කුසලතික විමසුම් - අනුලොම් නයෙහි සුබෙදුම්

කුසල තිකයේ මෙන්, මෙසේ වේදනා තික ආදියෙහි යයි සියළුම දෙවිසි තිකවල

එක් සියදහස් සැට - එක් දහස් හයසිය සත්
සැත්තෑ විමසුමක් - වෙනස් විසින් තිකෙහි බේ

මෙසේ වාචනා මාර්ගයෙහි සංක්ෂේප කරන ලදී.

දුකවල - වනාහි හෙතුං ධමමං පටිච්ච හෙතුධමෙමා උපපජෙජයා හෙතු පච්චයා යයි මෙසේ වන්නේය. හෙතුං පටිච්ච හෙතු, හෙතුං පටිච්ච න හෙතු, හෙතුං පටිච්ච හෙතු ච න හෙතුච, න හෙතුං පටිච්ච න හෙතු, න හෙතුං පටිච්ච හෙතු, න හෙතුං පටිච්ච හෙතු ච න හෙතු ච, හෙතුඤ්ච න හෙතුඤ්ච පටිච්ච හෙතු, හෙතුඤ්ච න හෙතුඤ්ච පටිච්ච න හෙතු, හෙතුඤ්ච න හෙතුඤ්ච පටිච්ච හෙතු ච න හෙතුච යයි එක එක දුකෙහි හේතු පච්චය ආදියෙහි එක් එක් පච්චයෙහි විමසීම් නවයක් වේ. ඒවායෙහි හේතු පච්චය මුල්කොට ඒක මූලකයෙහි දෙසිය සොළොසක් විමසීම් වේ. ඒවායෙහි හේතු පච්චයේම අන්‍යයකින් අසම්මිශ්‍ර වූ විමසීම් නවය ගතයුතුය. සෙස්ස අටවාරයෙහි නොගන්නා ලදී. ඒ දුක මූලාදියෙහි තෙවිසි වාරයෙහි එක එක නවය අත්හැර සබ්බ මූලකය දක්වා මේ ගණන පිරිසිඳීමය.

දුක මූලකයෙහි ඒක මූලකයෙහි දක්වන ලද දෙසිය සොළසක් විමසීම්වල නවයක් අත්හැර දෙසියහතක් විමසීම් වේ. ඉක්බිති නවයක් අත්හැර තිමූලකයෙහි එකසිය අනූඅටක්, මෙසේ පළමු පළමුව නවය නවය අත්හැර චතු මූලකයෙහි එක්සිය අසූනවයක්, පඤ්ච මූලකයෙහි එකසිය අසූවක්, සය මූලකයෙහි එකසිය සැත්තෑ එකක්, සත් මූලකයෙහි එකසිය හැටදෙකක්, අට මූලකයෙහි පනස් තුනක්, නව මූලකයෙහි එකසිය හතළිස් හතරක්, දස මූලකයෙහි එකසිය තිස්පහක්, ඒකාදස මූලකයෙහි එකසිය විසිහයක් දොළොස් මූලකයෙහි එකසිය දාහතක්, තෙළෙස් මූලකයෙහි එකසිය අටක්, තුදුස් මූලකයෙහි අනූනවයක්, පසළොස් මූලකයෙහි අනූවක්, සොළොස් මූලකයෙහි අසූ එකක්, සතළොස්

මූලකයෙහි හැත්තෑදෙකක්, අටළොස් මූලකයෙහි හැටතුනක්, දසනව මූලකයෙහි පනස් හතරක්, විසි මූලකයෙහි හතළිස් පහක්, එක්විසි මූලකයෙහි තිස්හයක්, දෙවිසි මූලකයෙහි විසිහතක්, තෙවිසි මූලකයෙහි දහඅටක්, සබ්බ මූලකයෙහි නවයක් වේ. යම්සේ වනාහි මේවා හෙතු පච්චය වශයෙන් ඒක මූලකයෙහි විමසීම් දෙසිය සොළොසක්.........සබ්බ මූලකයෙහි නවයක්. ආරම්මණ පච්චයාදියෙහි ද මෙසේ එක එක මුල්කොට ආරම්මණ ආදි පද වශයෙන් එක එක පදයේ ඒක මූලකයෙහි විමසීම් දෙසිය සොළොසක්..........සබ්බ මූලකයෙහි නවයක් යයි එක එක පදයේ ඒක මූලකාදි භේදයෙහි විමසීම් දෙදහස් හත්සියයක් වේ. ඒ සියළු සූවිසි පච්චයවල මේ ගණන පිරිසිඳීමය.

සූ සැට දහස් යළි - විමසුම් හේතු අටසිය
දුකයටම වනබව - අනුලොම් සයෙහි දන්නේ

හේතු දුකට මෙන්, මෙසේ සහේතුක දුකාදියෙහි දැයි සියළුම දුක සතෙහි

සැට සියදහස් යළි - සසූ අසූ දහසක් වන
දුක සතෙහි විමසුම් - වන බව දැනගනු යෙහේ

මේ සුද්ධික තික පට්ඨානයෙහි මෙන්ම දුක පට්ඨානයෙහි ද විමසුම්වල ගණන පිරිසිඳීමය.

ඉන්පසු යමක් වනාහි දෙවිස්සෙහි ගෙන දුක සතෙහි බහා දුක තික පට්ඨාන නම් දේශිතය. එහි **සියා හෙතුං කුසලං ධම්මං පටිච්ච හෙතු කුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය හෙතු පච්චයා** මෙසේ දෙවිසි තිකයෙහි එක එක තික දුකවල, සියය සියය සමග යොදා දක්වා තබන විමසුම්වල යට කියන ලද නයින් සියළු ඒක මූලකාදි වශයෙන් ගෙන පරිච්ඡේදය දතයුතුය.

ඉන්පසු යම් දුක සතයක් ගෙන දෙවිසි තිකයෙහි බහා තබා තික දුක පට්ඨානය නම් දේශිතය. එහිද **සියා හෙතුං කුසලං ධම්මං පටිච්ච හෙතු කුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය හෙතු පච්චයා** යයි මෙසේ දුක සතයෙහි එක එක දුක දෙවිසි තිකය සමග යොදා දැක්විය යුතු විමසීම්වල

යට කියන ලද නයින් සියළු ඒක මූලකාදීන්ගේ වශයෙන් ගෙන පරිච්ඡේදය දතයුතුය.

ඉන්පසු තිකයන් තිකවලම බහා තික පට්ඨාන නම් දේශිතය. එහිද **සියා කුසලං සුඛාය වෙදනාය සමපයුතතං ධමමං පටිචච කුසලො සුඛාය වෙදනාය සමපයුතෙතා ධමෙමා උපපජෙජයා හෙතු පචචයා** යයි මෙසේ දෙවිසි තිකවල එක එක තික සෙසු එක්විසි තික සමග යොදා දැක්විය යුතු විමසීම්වල යට කියන ලද නයින් සියළු ඒක මූලකාදීන්ගේ වශයෙන් ගෙන පිරිසිඳීම දතයුතුය.

ඉන්පසු දුක දුකවල බහා දුක දුක පට්ඨාන නම් දේශිතය. එහි ද **සියා හෙතුං සහෙතුකං ධමමං පටිචච හෙතු සහෙතුකො ධමෙමා උපපජෙජයා හෙතු පචචයා** යයි මෙසේ දුක සතෙහි එක එක දුක සෙසු අනූනවය දුක සමග යොදා දැක්විය යුතු විමසීම්වල යට කියන ලද නයින් සියළු ඒක මූලකාදීන්ගේ වශයෙන් ගෙන පිරිසිඳීම දතයුතුය.

තථාගතයන් වහන්සේ විසින් මේ සියළු ප්‍රභේද දක්වා දෙව් පිරිසට ධර්මය දේශනා කරන ලදී. දම්සෙනෙවියන් වහන්සේ වනාහි එයින් අද මේ මේවාද දේශනා කරන ලදැයි සංක්ෂේප කොට නය දැක්වීම් පමණක්ම දේශනාව කියන ලදී. තෙරුන් වහන්සේ විසින් ද සංක්ෂේප කොටම වාචනා මාර්ගය පවත්වන ලදී. එය (වාචනා මග) තෙරුන් විසින් පවත්වන ලද නයින්ම සංගීති කාලයෙහි සංග්‍රහයට ආරෝපනය කරන ලදී. ඒ සංක්ෂේප නය දැක්වීමට, **තිකඤච පටඨාන වරං** යන මේ ගාථාව තබන ලදී. එහි අර්ථය :- තිකඤච පටඨාන වරං උතුම් තික පටඨානය ද, **දුකුතතමං** උතුම් ශ්‍රේෂ්ඨ දුක පටඨානය ද **දුක තිකඤෙචව** යයි දුක තික පටඨානය ද, **තික දුකඤච** තික දුක පටඨානය ද, **තික තිකඤෙචව** තික තික පටඨානයද **දුක දුකඤච** දුක දුක පටඨානය ද **ඡ අනුලොමමහි නයා සුගමභීර,** මේ තික පටඨානාදිය මනාව ගැඹුරුය. අනුලෝමයෙහි නය සය දතයුතුය.

එහි ධම්මානුලෝම පච්චයානුලෝම යයි අනුලෝම දෙකකි. එහි **කුසලං ධමමං පටිචච කුසලො ධමෙමා** යයි මෙසේ අභිධර්ම මාතෘකා පදවලින් සංග්‍රහ කරන ලද ධර්මය අනුලෝම දේශනා වශයෙන් පැවතියේ ධම්මානුලෝම නම් වේ.

**හෙතු පච්චයා ආරම්මණ පච්චයා** යයි මෙසේ සූවිසි ප්‍රත්‍යයන්ගේ අනුලෝම දේශනා වශයෙන් පැවතියේ පච්චයානුලෝම නම් වේ. එහි යට අටුවා කථාවෙහි **තිකඤ්ච පට්ඨාන වරං..... ඡ අනුලොමම්හි** නය සුගැඹුරු යයි මේ ගාථාව ධම්මානුලෝමය සඳහා කියන ලදී. මෙහි වනාහි මෙම ගාථාව ඒ ධම්මානුලෝමයෙහි පච්චයානුලෝමය සඳහා කියන ලදී. එහෙයින් අනුලෝම සයෙහි නය සුගැඹුරු යයි අටුවා ගාථාව ධම්මානුලෝමයෙහි තික පට්ඨානාදි නය සිය සුගැඹුරු යයි මෙසේ අර්ථය දතයුතුය. මෙම අවකාශයෙහි වනාහි 'හේතු පච්චයා ආරම්මණ පච්චයා' යයි මෙසේ පැවති පච්චයානුලෝමයෙහි මේ ධම්මානුලෝමයේ තික පට්ඨානාදි නය සය සුගැඹුරු යයි මෙසේ අර්ථය දතයුතුය. ඒවා අතරෙන් අනුලෝම තික පට්ඨානයෙහි කුසලත්තික මාත්‍රය වශයෙන්ම මෙය මේ පටිච්ච වාරයේ පණ්ණත්ති වාරයෙහි සංක්ෂේප කොට විමසීම් භේදය දක්වන ලදී. සෙසු තිකවල සෙසු පට්ඨානවලද එකම විමසීමක්වත් නොදක්වන ලදී. එයින් පසුව වනාහි සහජාත වාරවල කුසලතිකයේ වශයෙන් විමසීම් නො උදුරා ලැබීම් වශයෙන් විසඳීමම දක්වන ලදී. 'අනුලෝම සයෙහි නය සුගැඹුරු' යයි වචනයෙන් වනාහි මෙම පච්චයානු ලෝමයෙහි මේ පට්ඨාන නය සය ද විමසීම් වශයෙන් උදුරා දැක්විය යුතුය. පට්ඨානය වර්ණනා කරන ආචාර්යවරුන්ට මෙය භාර වේ.

දැන් පච්චනීය වේ. එය දැක්වීමට **සියා කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය න හෙතු පච්චයා** යනාදිය අරඹන ලදී. එහි අනුලෝම විමසීම්වලින් සමර්පණය කරන්නා වූ විමසීම් පිරිසිඳීමය. එහෙයින්ම මෙහි **අනුලොමෙ හෙතුපච්චයො විත්ථාරිතො එවං පච්චනියෙපි න හෙතු පච්චයො විත්ථාරෙතබ්බො** යයි කියා නැවත අවසානයෙහි **යථා අනුලොමෙ එකෙකස්ස පදස්ස එකමූලං දුමූලං තිමූලං චතුමූලං යාව තෙවීසති මූලකං එවං පච්චනියෙපි විත්ථාරෙ තබ්බං** යයි කියන ලදී. තෙවිසි මූලකයෙහි මෙහි මෙය දුමූලකය සඳහාම කියන ලදී. අවසානයෙහි වනාහි සබ්බමූලක සූවිසි මූලකයද වේමය. ඒ සියල්ල සංක්ෂේපම වේ.

**තිකඤ්ච පට්ඨානවරං......... ඡ පච්චනියම්හි** නයා සුගම්භිරා යයි මෙහි ද ධම්ම පච්චනිය ද පච්චය පච්චනියදැයි පච්චනිය දෙකක් වේ. එහි කුසලා ධම්මා යයි මෙසේ අභිධර්ම මාතෘක පදවලින් සංගෘහීත වූ ධර්මයන්ගේ **න කුසලං ධම්මං පටිච්ච න කුසලො ධම්මො** යයි පච්චනිය දේශනා වශයෙන් පැවතියේ ධම්ම පච්චනිය නම් වේ. **න හෙතු පච්චයා**

**නාරම්මණ පච්චයා** යයි මෙසේ සූවිසි පච්චයන්ගේ පච්චනිය දේශනා වශයෙන් පැවතියේ පච්චය පච්චනිය නම් වේ. එහි යට අටුවා කථාවේ **තිකඤ්ච පට්ඨාන වරං.........ඡ පච්චනියම්හි නයා සුගම්භිරා** මේ ගාථාව ධම්ම පච්චනිය සඳහා කියන ලදී. මෙහි වනාහි මේ ගාථාව ධම්මානුලෝමයෙහි මෙන්ම පච්චය පච්චනිය සඳහා කියන ලදී. එහෙයින් 'පච්චනියේ නය සය සුගැඹුරු' යයි අටුවා කථා ගාථාවෙහි ධම්ම පච්චනියෙහි තික පට්ඨානාදි නය සය සුගැඹුරු යයි මෙසේ මෙහි අර්ථය දතයුතුය. මෙම ඕකාශයෙහි වනාහි 'න හෙතු පච්චයා නාරම්මණ පච්චයා යයි මෙසේ පැවති පච්චය පච්චනීය මේවා ධම්මානුලෝමයෙහි ම තික පට්ඨානාදිය නය සය සුගැඹුරු යයි මෙසේ අර්ථය දතයුතුය. ඒවා අතරෙහි අනුලෝම තික පට්ඨානයෙහිම කුසලත්තික මාත්‍ර වශයෙන් මෙය මේ පටිච්ච වාරයේ පණ්ණත්ති වාරයෙහි සංක්ෂෙප කොට විමසීම් ප්‍රභේද දක්වන ලදී. සෙසු තිකවලද වනාහි සෙසු පට්ඨානවලද එකම විමසීමක්වත් නො දක්වන ලදී. ඉන්පසු සහජාත වාරවල කුසලත්තිකයේ වශයෙන් විමසීම් නො උදුරා ලැබීම් වශයෙන් විසඳීමම දක්වන ලදී. 'පච්චනිය නය සය සුගැඹුරු' යයි වචනයෙන් මේ පච්චය පච්චනියෙහි මේ පට්ඨාන නය සයද විමසීම් වශයෙන් උදුරා දැක්විය යුතුය. පට්ඨානය වර්ණනා කරන්නා වූ ආචාර්යවරයන්ට එය භාර වේ.

දැන් අනුලෝම පච්චනිය වේ. එය දැක්වීමට **සියා කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය හෙතුපච්චයා න ආරම්මණ පච්චයා** යනාදිය අරඹන ලදී. එහි **හෙතුපච්චයා න ආරම්මණ පච්චයා.........හෙතු පච්චයා න අධිපති පච්චයා** යයි හේතු පදයේ සෙසු තෙවිසි පච්චයවල එක එක සමග යෙදීම් වශයෙන් හේතු පද ආදි ඒකමූලකයෙහි තෙවිසි අනුලෝම පච්චය වේ. ඒවායේ එක එකෙහි එකුන් පනසක් කොට එක්දහස් එකසිය විසිහතක් විමසීම් වේ. දුමූලකයෙහි වනාහි හේතුආරම්මණ පදයන්ගේ සෙසු දෙවිසි පච්චයවල එක එක සමග යෙදීම් වශයෙන් දෙවිසි අනුලෝම පච්චනීය වේ. මෙසේ අනුලෝමයෙහි කියන ලද සියළු ඒකමූලකාදියෙහි එක එක පදය පිරිහෙළා අවසේස වූවන්ගේ වශයෙන් විමසීම් ගණන දතයුතුය. මෙහි ඒක මූලකාදියෙහි යම් විමසීමක් පෙළෙහි ආවා වූ හෝ නො ආවා වූ හෝ ඒ සියල්ල යට කියන ලද අනුසාරයෙන් දතයුතුය.

**තිකඤ්ච පට්ඨාන වරං..........ඡ අනුලෝම පච්චනීයම්හි නයා**

**සුගම්භිරා** මෙහි වනාහි යට කියන ලද නයින්ම අනුලෝම පච්චනීය දෙකඃ- ධම්මානුලෝමපච්චනීය, පච්චයානුලෝමපච්චනීය ද වේ. එහි 'කුසලා ධම්මා' යයි මෙහි අභිධම්ම මාතෘකා පදවලින් සංගෘහීත ධර්මයන්ගේ **කුසලං ධම්මං පටිච්ච න කුසලො ධම්මො** යයි අනුලෝමපච්චනීය දේශනා වශයෙන් පවතින්නේ ධම්මානුලෝමපච්චනීය නම් වේ. **හෙතු පච්චයා න ආරම්මණ පච්චයා** යයි මෙසේ සූවිසි පච්චයවල ලබන පදයන්ගේ අනුලෝම පච්චනීය දේශනා වශයෙන් පච්චයානුලෝමපච්චනීය නම් වේ. එහි යට අට්ඨකථාවේ තිකඤ්ච පට්ඨානවරං........ඡ අනුලෝමපච්චනීයම්හි නයා සුගම්භිරා මේ ගාථාව ධම්මානුලෝමපච්චනීය සඳහා කියන ලදී. මෙහි වනාහි මේ ගාථාව ධම්මානුලෝමයෙහි ම පච්චයානුලෝමපච්චනීය සඳහා කියන ලදී. එහෙයින් ඡ අනුලෝමපච්චනීයම්හි නයා සුගම්භිරා යයි අටුවා ගාථාව ධම්මානුලෝමපච්චනීයෙහි තිකපට්ඨානාදිය නය සය සුගැඹුරු යයි මෙසේ අර්ථය දතයුතුය. මේ ඕකාසයෙහි වනාහි 'හේතු පච්චයා නාරම්මණ පච්චයා' යයි මෙසේ පවත්නා පච්චයානුලෝම පච්චනීයෙහි මේවා ධම්මානුලෝමයෙහි ම තික පට්ඨානාදිය නය සය සුගැඹුරු යයි මෙසේ අර්ථය දතයුතුය. ඒවා අතර අනුලෝම තික පට්ඨානයෙහිම කුසලත්තික මාත්‍ර වශයෙන් මෙය පටිච්ච වාරයේ පණ්ණත්ති වාරයෙහි සංක්ෂේප කොට විමසීම් ප්‍රභේදය දක්වන ලදී. සෙසු තිකවල සෙසු පට්ඨානවලද එකද විමසුමක් නොදක්වන ලදී. ඉන්පසුව සහජාත වාරාදියෙහි කුසලත්තික වශයෙන් විමසීම් නො උදුරා ලැබීම් වශයෙන් විසඳුමම දක්වන ලදී. 'අනුලෝමපච්චනීය නය සය සුගැඹුරු' යයි වචනයෙන් මේ පච්චනියානුලෝමපච්චනීයෙහි මේ පට්ඨාන නය සයද විමසීම් වශයෙන් උදුරා දැක්විය යුතුය. පට්ඨානය වර්ණනා කරන්නා වූ ආචාර්යවරයන්ට මෙය භාරය.

දැන් පච්චනියානුලෝමය වේ. එය දැක්වීමට **සියා කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය න හෙතුපච්චයා** යනාදි අරඹන ලදී. එහි අනුලෝම පච්චනීය විමසුම්වලින් සමර්පණය කරනු ලබන විමසීම් පිරිසිඳීය. මෙහි ඒකමූලකාදී යම් විමසුමක් නො ආවේද ඒ සියල්ල යට කියන ලද නය අනුසාරයෙන්ම දතයුතුය.

**තිකඤ්ච පට්ඨානවරං..........ඡ පච්චනීයානුලොමම්හි නයා සුගම්භිරො**

මෙහි ද ධම්ම පච්චනීයානලෝමය පච්චයපච්චනීයානුලෝමය යන පච්චනීයානුලෝම දෙක යට කියන ලද නයින්ම වේ. එහි 'කුසලා ධම්මා'

යයි මෙසේ අභිධර්ම මාතෘකා පදවලින් සංගෘහීත ධර්මවල **න කුසලං ධම්මං න කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො** යයි පච්චනීයානුලෝම දේශනා වශයෙන් පැවතියේ ධම්මපච්චනීයානුලෝම නම් වේ. **න හෙතු පච්චයා ආරම්මණ පච්චයා** යයි සූවිසි ප්‍රත්‍යවල ලැබෙන පදයන්ගේ පච්චයපච්චනීයානුලෝම දේශනා වශයෙන් පැවතියේ පච්චය පච්චනීලෝම නම් වේ. එහි යට අටුවාවෙහි 'තිකඤ්ච පට්ඨානවරං.....ඡ පච්චනීයානුලොමම්හි නයා සුගම්භිරා' යන මේ ගාථාව ධම්මපච්චනීයානු ලෝමය සඳහා කියන ලදී. මෙහි වනාහි මේ ගාථාව ධම්මානුලෝමයෙහිම පච්චයපච්චනීයානුලෝමය සඳහා කියන ලදී. එහෙයින් 'පච්චනීයානුලෝම නය සය සුගැඹුරු' යයි අටුවා කථාවේ ධම්මපච්චනීයානුලෝමයෙහි තික පට්ඨාන ආදිය නය සය සුගැඹුරු යයි මෙසේ අර්ථය දතයුතුය. මෙම ඕකාසයෙහි 'න හෙතුපච්චයා ආරම්මණ පච්චයා' යයි මෙසේ පැවති පච්චය පච්චනීයලෝමයෙහි මෙම ධම්මානුලෝමයෙහිම තික පට්ඨාන ආදිය නය සය සුගැඹුරු යයි මෙසේ අර්ථය දතයුතුය. ඒවායින් අනුලෝම පට්ඨානයෙහිම කුසලත්තිකය පමණක්ම වශයෙන් මෙය මෙම පටිච්ච වාරයේ පණ්ණත්ති වාරයෙහි හකුළුවා විමසීම් ප්‍රභේද දක්වන ලදී. සෙසු තිකවල සහ සෙසු පට්ඨානවල ද එකම විමසීමක්වත් නො දක්වන ලදී. ඉන්පසු වනාහි සහජාතවාරාදියෙහි කුසලත්තික වශයෙන් ම විමසීම නො උදුරා ලැබීම් වශයෙන් විසඳීමම දක්වන ලදී. 'ඡ පච්චනීයානුලොමම්හි නයා සුගම්භිරා' යන වචනයෙන් මෙම පච්චයපච්චනීයානුලෝමයෙහි මේ පට්ඨාන නය සය විමසීම් වශයෙන් උදුරා දැක්විය යුතුය. පට්ඨානය වර්ණනා කරන්නා වූ ආචාර්යවරයන්ට මෙය භාර වේ.

**පණ්ණත්තිවාර වර්ණනාව**
**නිමි.**

දැන් මේ පණ්ණත්ති වාරයෙහි කුසලත්තිකය නිසා හේතු පච්චයාදි වශයෙන් එකුන්පනස් ආදිකොට නය මාත්‍රය දක්වන්නාහු විසින් අප්‍රමාණ පුච්ඡාවක් (විමසීම්) දක්වන ලදී. එහි කුසල අකුසල ආදීන්ගේ එකට ඉපදීමේ අභාවයෙන් යම් විමසීමක 'කුසල ධර්ම නිසා හේතුප්‍රත්‍යයෙන් අකුසල ධර්ම ඉපදේ' යයි මෙසේ විසඳුමක් නොලැබේ. එය හැර යම් විසඳුමක් ලැබේ ද එයම විසඳීමට මේ **කුසලං ධම්මං පටිච්ච කුසලො**

ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා යනාදි නයින් පටිච්චවාරයේ නිද්දේස වාරය අරඹන ලදී. එහි ඉදින් මේ හේතුපච්චයාදි වශයෙන් එකුන් පනසක් පුච්ඡා (විමසීම්) හැම අතින් විසඳුම නොලැබේ. ඉක්බිති කුමක් දක්වන ලදද? යමක් ලැබේ නම් එයම දැක්විය යුතුද? එසේය දැක්විය යුතු වේ. එසේ දක්වනු ලබන්නේ වනාහි සියළු තික දුක පට්ඨාන ආදියෙහි එක එක තිකයෙහි, දුකෙහි, දුක තිකයෙහි, තික දුකයෙහි, තික තිකෙහි, දුක දුකෙහි ද සංක්ෂේප නොකොට දැක්විය යුතුම වන්නාහ. කුමක් හෙයින්ද? යම්හෙයකින් යමක් කුසලත්තිකයෙහි ලබයිද එයම වෙදනාත්තතාදියෙහි ධම්මානුලෝම පච්චනීයෙහි ද තික පට්ඨානයෙහි විතක්ක තික පීති තිකයන්ගේ විසඳීමෙහි මේ සියළු විසඳීම නො ලබයි. එහෙයින් උත්කෘෂ්ඨ පරිච්ඡේදයෙන් එක එක තිකයෙහි යම් පමණ විමසීම් ප්‍රමාණයක් විය යුතුද, ඒ සියල්ල කුසලත්තිකයෙහි දක්වන ලදී. මෙසේ දක්වන ලද ඒවායෙහි යම් විසඳුමක් නො ලැබේ ද, එය හැර යමක් ලැබේද එය කියනු ලැබීමෙන් පහසුවෙන් දැන ගැනීමට හැකිවේද, පහසුවෙන් දැනගැනීම සඳහා සියල්ල කුසලත්තිකයෙහි දක්වන ලදී. යම් විසඳුමක් නොලැබේද, එය හැර යම් විසඳුමක් ලැබේද එයම විසඳුම යයි දතයුතුය.

එහි **කුසලං ධම්මං පටිච්ච** යයි චතුභූමක කුසල ධර්මවල වේදනාදි ස්කන්ධ භෙද එක් ධර්මයක් නිසා පිළිගෙන එකට ඉපදීම් සංඛ්‍යාත සමාන භාවයට පැමිණ එය සමග පවතින බවට එළඹීම යයි අර්ථ වේ. **කුසලො ධම්මො** යනු චතුභූමක කුසල ධර්මවලම සංඥා ස්කන්ධාදි භේද එක් ධර්මයකි. **උප්පජ්ජති** ඉපදීමේ සිට නිරෝධ ගමන දක්වා යයි උපදියි යන අර්ථයයි. ආත්ම ලබයි. ඉපදීම් ආදි ක්‍ෂණ තුනට පැමිණේ යයි කියන ලද්දේ වේ. **හෙතු පච්චයා** කුසල හේතුවෙන් හේතුභාවය සාදන්නා විසින් මෙසේ උපදින්නේදැයි විමසීම සඳහා 'උපදී' යයි විසඳීම කියා දැන් යම් ධර්මයක් නිසා යම් ධර්මයක් උපදී. ඒ ධර්මය ස්කන්ධ වශයෙන් දැක්වීමට **කුසලං එකං ඛන්ධං** යනාදිය කීහ. එහි **එකං** වේදනාදි සතරෙන් යම්කිසි එකක් **තයො ඛන්ධා** යමක් පච්චයභාවයෙන් ගන්නා ලදද එය හැර අවසේස ස්කන්ධ තුනය. **තයො ඛන්ධෙ** වේදනාදියෙහි යම් එක් ස්කන්ධයක් උපදී යයි ගන්නා ලදද එය හැර සෙසු තුන. **ද්වෙ ඛන්ධෙ** වේදනා සඤ්ඤාදි දුක සයෙහි යම් කිසිවක්. **ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා** යමක් යමක් පච්චයභාවයෙන් ගන්නා ලද නම් ඒ එය හැර අවසේස ස්කන්ධ දෙක කුසල හේතුවෙන් හේතුපච්චයභාවය සාදමින් උපදී යයි අර්ථ වේ. යම්හෙයකින් වනාහි එක් ස්කන්ධයක් එකක්ම,

දෙකක්ම හෝ දෙකකට හෝ වනාහි එකක්ම පච්චය නම් නැත. එනිසා එක් ස්කන්ධයක් නිසා, එක් ස්කන්ධයකි. එක් ස්කන්ධයක් නිසා ස්කන්ධ දෙකකි. ස්කන්ධ දෙකක් නිසා එක් ස්කන්ධයකැයි නො කියන ලදී. **කුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උපපජ්ජති** යනාදියෙහි ද කියන ලද නයින්ම අර්ථය දතයුතුය. **චිත්ත සමුට්ඨානං රූපං** මෙය පටිච්ච අර්ථයේ සහජාත අර්ථය බැවින් කුසලයකින් යම් සහජාතයද හේතුපච්චය ද ලබයි. එය දැක්වීමට කියන ලදී. පසුවද මෙබඳු ස්වරූප ඇති තැන්වල මෙම නයම වේ. **විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං** මෙහි හේතුපච්චය අභාවයෙන් අහේතුක රූපය සමග අනුපපත්තියෙන් ආරූප්ප විපාකය ද නොගත යුතුයි. **පටිසන්ධික්ඛණෙ** යයි කටත්තා රූප සංඛ්‍යාත අබ්‍යාකතයේ අබ්‍යාකතය නිසා උත්පත්තිය දැක්වීම සඳහා කියන ලදී. **විපාකාබ්‍යාකතං** ඒ **ක්ෂණයෙහි** විද්‍යමාන අබ්‍යාකත වශයෙන් කියන ලදී. **ඛන්ධෙ පටිච්ච වත්ථු වත්ථුං පටිච්ච ඛන්ධා** මෙය කටත්තා රූප ගැනීමෙන් වස්තු ගත්කල්හි වස්තු නිසා ස්කන්ධයන්ගේ උත්පත්ති දැක්වීමට කියන ලදී. **එකං මහාභූතං** ආදි රූප අබ්‍යාකතය නිසා රූප අබ්‍යාකතයේ උත්පත්තිය දැක්වීම සඳහා කියන ලදී. **එකං ඛන්ධං** යනාදියෙහි කියන ලද නයින්ම මෙහි අර්ථ යෙදීම දතයුතුය. මෙසේ රූපාබ්‍යාතයෙහි භූත නිසා භූතයන්ගේ උපත කියා දැන් භූත නිසා උපාදාය රූපයන්ගේ උත්පත්තිය දැක්වීමට මහාභූතයන් නිසා චිත්ත සමුට්ඨාන යනාදිය කියන ලදී. මෙසේ ඇතිකල්හි උපාදාය රූප මෙපමණක්ම යයි කිවයුතුය. ඉතිරි දෙක කුමක් නිසා කියන ලදද? මහාභූතයන් නිසා උත්පත්තිය දැක්වීම සඳහා එහි චිත්ත සමුට්ඨානය පවතීමය. කටත්තා රූප පටිසන්ධියෙහිද. **උපාදා රූපං** ඒ දෙකටම විශේෂණ වේ. **කුසලෙ ඛන්ධෙ ච මහාභූතෙ ච පටිච්ච** මෙහි චිත්ත සමුට්ඨානම මහාභූත ගන්නා ලදී. **චිත්ත සමුට්ඨානං රූපං** මෙහි වනාහි භූත රූපද උපාදා රූපද ගන්නා ලදී. එක් මහාභූතයක් නිසා මහාභූත තුනක් ආදි නයින් භූතරූප ද ස්කන්ධයන් ද මහාභූත ද නිසා උපදී. **මහාභූතෙ පටිච්ච උපාදා රූපං** කියන ලද නයින් උපාදා රූපද. අකුසල ද අබ්‍යාකතදැයි ප්‍රශ්න විසඳීමෙහි ද මෙම නයම වේ. මෙසේ හේතුපච්චයෙහි පුච්ඡ නවයක් විසඳන ලදී. මේවා ම මෙහි ලැබේ. සෙසු සතලිස මොඝපුච්ඡා යයි නො විසඳන ලදී. මෙම උපායෙන් ආරම්මණ පච්චයාදියෙහි ද විමසීම් විසඳීම්වල අර්ථය දතයුතුය. ඒ ඒ තැන්වල විචාරිය යුත්තම විචාරන්නෙමු.

ආරම්මණ පච්චයෙහි රූපයේ ආරම්මණ පච්චය වශයෙන් නූපන්

හෙයින් ඒ නවයෙහි රූප මිශ්‍රක හැර විමසීම් තුනක් ම විසඳන ලදී. ඒ කරුණින් ම වත්‍ථුං පටිච්ච ඛන්‍ධා යයි කියා 'ඛන්‍ධෙ පටිච්ච වත්‍ථුං' යයි නොකියන ලදී. එය ආරම්මණ පච්චයෙන් නූපදී.

අධිපති පච්චයෙහි **විපාකාබ්‍යාකතං** යයි ලෝකෝත්තරය ම සඳහා කියන ලදී. එහෙයින්ම මෙහි පටිසන්‍ධික්ඛණෙ යයි නොගන්නා ලදී. සෙස්ස හේතුපච්චය හා සමානය.

අනන්තර සමනන්තරවල ද රූප නො ලැබේ යයි ආරම්මණ පච්චයෙහි මෙන් පුච්ඡා තුනකි.

සහජාත පච්චයෙහි **පටිසන්‍ධික්ඛණෙ** යයි පංචවෝකාරයෙහි පටිසන්‍ධි වශයෙන් කියන ලදී. යට පච්චය විභංගයෙහි බැසගන්නා ක්‍ෂණයෙහි පැමිණි, එයද මේ සමග අර්ථ වශයෙන් එකය. ව්‍යඤ්ජන මාත්‍රයම මෙහි වෙනසයි. තවද 'තිදෙනෙකුගේ එක්වීම ගැබේ පිළිසිඳ ගැන්ම වේ' යයි වචනයෙක් ඔක්කන්ති යයි පංචවෝකාර ප්‍රතිසන්ධියම මෙ නම් වේ. පටිසන්‍ධිය සියළු භවවලට සාධාරණය. මෙහි වනාහි කටත්තා රූප යනාදි වචනයෙන් පංචවෝකාර පටිසන්ධියම අදහස් කෙරේ. එය රූපයෙහි ද අරූපයෙහි ද පච්චය භාවයම පච්චයුප්පන්න භාවයද සංග්‍රහ කරයි. එනිසා සම්පූර්ණ විසඳුම වේ යයි ගන්නා ලදී. බාහිරං එකං මහාභූතං අනින්‍ද්‍රියබද්ධ පෘථිවි පාසාණ ආදියෙහි මහාභූත සඳහා කියන ලදී. පච්චය විභංග වාරයෙහි **චත්තාරො මහාභූතා** අජ්ඣත්තික ද බාහිර ද එකක්කොට ගන්නා ලදී. එය සංක්‍ෂෙප දේශනාවෙහිය. මෙය වනාහි විස්තර දේශනාවය. එහෙයින් සියල්ල බෙදා දක්වන්නේ **බාහිරං එකං මහා භූතං** යනාදිය කීහ. **අසඤ්ඤසත්තානං එකං මහාභූතං පටිච්ච** සන්තාන දෙකක සමුට්ඨාන භූත වශයෙන් ම කියන ලදී. **මහාභූතෙ පටිච්ච කටත්තා රූපං** යන මෙය වනාහි කම්ම සමුට්ඨාන වශයෙන්ම කියන ලදී. **උපාද රූපං** උතු සමුට්ඨාන වශයෙන්ම.

**අඤ්ඤමඤ්ඤ** පච්චයෙහි **ඛන්‍ධෙ පටිච්ච වත්‍ථු වත්‍ථුං පටිච්ච ඛන්‍ධා** ස්කන්ධ සතරේම එකතුවෙන් වස්තුව මගින් අඤ්ඤමඤ්ඤ පච්චයභාවය දැක්වීමට කියන ලදී.

**නිස්සය** පච්චයෙහි යම්සේ පටිච්ච අර්ථය නම් සහජාත අර්ථය

වේ. එහෙයින් යමක් යට පච්චය විභංග වාරයෙහි චක්ඛායතනාදීන්ගේ නිස්සය පච්චයභාවය දක්වන ලදී. එය ගන්නා ලදී. චක්ඛායතානාදිය පුරේජාත වී පච්චය වේ. මෙහි සහජාතම ලබයි. එහෙයින් කියන ලදී. **නිසසය පචචය සහජාත පචච සදිසො** නිස්සය සහජාත හා සමානය.

උපනිසසය පචචයෙහි රූපයට උපනිසසය පච්චය අභාවයෙන් විසඳුම් තුනක්ම ලබයි. එයත් කියන ලදී. **ආරමමණ පචචය සදිසං** එහි සියළු කුසල අකුසල අබ්‍යාකතා ආරමමණ උපනිසසය කිසිවක් නො ලබයි. යමක් ලබයිද ඔවුන්ගේ වශයෙන් මෙය කියන ලදැයි දතයුතුය.

පුරෙජාත පච්චයෙහි **වත්‍ථුං පුරෙජාත පචචයා** වස්තුව නිසා වස්තුව විසින් පුරේජාත පච්චයභාවය සාදමින් උපදී යන අර්ථයයි. **විපාකාබ්‍යාකතං එකං ඛන්‍ධං** මෙහි යම් විපාක අබ්‍යාකත වස්තුව පිළිසිඳගත් ක්‍ෂණයෙහි සහජාත පච්චය වේ. එය පුරේජාත පච්චය භාජනීය බැවින් මෙහි නොගත යුතුය. යම් කුසලාදිය ආරප්පයෙහි පුරෙජාත පච්චය නොලබාද ඒවා ද පුරේජාත පච්චයභාජනීයම වේ. මෙහි නොගත යුතුය. ආරම්මණය වනාහි නියමයෙන් පුරේජාත පච්චයභාවය නො ලබයි. රූපායතනාදිය චක්ඛු විඤ්ඤාණාදියේ ම පුරේජාත පච්චයභාවය සිදුකරයි. චක්ඛු විඤ්ඤාණ ධාතුවට අතීත අනාගත ද අරමුණු වේමය. එහෙයින් මෙහි නොගන්නා ලදී. මේ දේශනා ස්කන්ධ වශයෙනි. විඤ්ඤාණ ධාතු වශයෙන් නොවේ. **විපාකාබ්‍යාකතං එකං ඛන්‍ධං** යන දේශනාවට සියළු විඤ්ඤාණ ධාතු ගන්නා ලදී. චක්ඛු විඤ්ඤාණ ධාතුවම නොවේ.

පචඡාජාතය කුසල අකුසලවලට පච්චය නොවේ. අබ්‍යාකතයට ද උපස්ථම්භක පමණකි. ජනක නොවේ. එහෙයින් 'පච්ඡාජාත පච්චය උපදියි' යන එක් ධර්මයක්වත් නැතැයි කිවයුතුය. පච්ඡාජාත පච්චය වශයෙන් විසඳුම් නොකරන ලදී.

ආසේවන පච්චයෙහි සියළු කිරියා ආසේවන පච්චය නොලබයි. ලැබීම් වශයෙන් වනාහි කිරිය අබ්‍යාකත යයි කියන ලදී. එහෙයින් ජවන කිරිම මෙහි ගන්නා ලදැයි දතයුතුය.

කම්ම පච්චයෙහි කුසල අකුසලවල ඒකක්‍ෂණික යයි දතයුතුය. කිරිය අබ්‍යාකතවල ද එසේය. විපාක අබ්‍යාකතවල නා නා ක්‍ෂණික වේ.

ප්‍රතිසන්ධි ක්ෂණයෙහි මහාභූතවල ද එසේය. චිත්ත සමුට්ඨානවල ඒක ක්ෂණිකය. කටත්තා රූපවල නා නා ක්ෂණිකය. අසඤ්ඤසත්ත රූපවලද එසේය. මෙහි කටත්තා රූපය වනාහි ජීවිතේන්ද්‍රිය වේ. සෙස්ස ඒකාන්ත නොවේ. කම්ම සමුට්ඨාන බව උපාදා රූපයයි කියන ලදී. මෙසේ ඇතිකල්හිද මෙහි කම්ම සමුට්ඨානයම අදහස් කරන ලදී.

විපාක පච්චයෙහි කුසල අකුසල කිරිය නො ලබයි යයි අබ්‍යාකත වශයෙන් විසඳීම කරන ලදී. **චිත්ත සමුට්ඨානං** යනු විපාක චිත්ත සමුට්ඨානයම වේ. **කටත්තා රූපං** ලැබෙන පරිදි ඉන්ද්‍රිය රූපය ද වස්තු රූපය ද වේ. **උපාදා රූපං** ඊට අවශේෂව ඒ අවස්ථාවේ විද්‍යමාන උපාදා රූපය වේ.

ආහාර පච්චයෙහි සියළුම කුසලාදි ස්කන්ධයන්ගේ චිත්ත සමුට්ඨාන රූපයේද අරූප ආහාර වශයෙන් උපත දතයුතුය. ප්‍රතිසන්ධි ක්ෂණයෙහි මහාභූතයන්ගේ ද එසේය. චිත්ත සමුට්ඨානං යනු භවංගාදි චිත්ත සමුට්ඨානයන්ගේ. **ආහාර සමුට්ඨානං** කබලිංකාර ආහාරයෙන් උපදවන රූප. **චිත්ත සමුට්ඨානං** කුසල අකුසල සිතින් උපදවන රූප. පච්චය විභංග වාරයෙහි ආහාර පිළිවෙළින් කබලිංකාර ආහාරය දක්වන ලදී. මෙහි වනාහි කුසලං ධම්මං යයි පුච්ඡා වශයෙන් පළමුව අරූප ආහාර දක්වන ලදැයි දතයුතුය.

ඉන්ද්‍රිය පච්චයෙහි ද පච්චය විභංගයේ ඉන්ද්‍රිය පිළිවෙළින් චක්ඛු ඉන්ද්‍රියාදිය දක්වන ලදී. මෙහි වනාහි කුසලාදි පුච්ඡා වශයෙන් අරූප ඉන්ද්‍රියන්ගේ පච්චය බව දක්වන ලදී. එහි කුසලාදියෙහි ලැබෙන පරිද්දෙන් අරූප ඉන්ද්‍රිය ගතයුතුය. අසඤ්ඤ සත්තානයේ භූත රූපවලද ජීවිතේන්ද්‍රිය වේ. ඣාන පච්චයවලද හේතුපච්චය හා විසඳීම සමානය. එහෙයින් මෙහි **හෙතුපච්චය සදිසං** යයි කියන ලදී.

සම්පයුත්ත පච්චයෙහි විසඳීම ආරම්මණ පච්යට සමානය. එහෙයින්ම මෙහි **ආරම්මණ පච්චය සදිසං** යයි කියන ලදී.

විප්පයුත්ත පච්චයෙහි **වත්ථුං විප්පයුත්ත පච්චයා** යයි වස්තුව (හෘදය වස්තුව) නිසා විප්පයුත්ත පච්චය වේ. විප්පයුත්ත පච්චයභාවය වස්තුවෙන් සාදමින් උපදීයයි අර්ථය වේ. **ඛන්ධෙ විප්පයුත්ත පච්චයා** ඛන්ධ නිසා

විප්පයුත්ත පච්චය වේ. ස්කන්ධවලින් විප්පයුත්ත පච්චයභාවය සාදමින් උපදී යයි අර්ථය වේ. **ඛන්ධා වත්ථුං විපපයුතත පචචයා** වස්තුව නිසා ස්කන්ධ විප්පයුත්ත පච්චය වේ. වස්තුව විසින් විප්පයුත්ත පච්චය බව සාදමින් උපදීයයි අර්ථය වේ. **චිතත සමුට්ඨාන රූපං ඛන්ධෙ විපපයුතත පචචයා** ස්කන්ධ නිසා විප්පයුත්ත පච්චය වේ. චිත්ත සමුට්ඨාන රූපය ස්කන්ධවලින් විප්පයුත්ත පච්චයභාවය සාදමින් උපදී යයි අර්ථය වේ. සෙසු විසඳීම්වලද වස්තුව විප්පයුත්ත පච්චයාදියෙහි ද කියන ලද නයින්ම අර්ථය දතයුතුය. මෙහි විපාක අබ්‍යාකත වස්තුව ගැනීමෙන් චක්ඛු ආදියෙන් සංග්‍රහ කළයුතුය. එක් මහා භූතයයි ආදිය රූප අබ්‍යාකතයට පච්චයභාවය දැක්වීමට කියන ලදී. **චිතත සමුට්ඨානං** අබ්‍යාකත චිත්ත සමුට්ඨානය ද කුසලාකුසල චිත්ත සමුට්ඨානය ද.

අත්ථි පච්චයෙහි සියළු සහජාත පච්චය ස්වභාවයයි. එහෙයින් **සහජාත පචචය සදිසං** යයි කියන ලදී. නත්ථි විගත ආරම්මණ පච්චය ස්වභාවය ඇත. අවිගතය සහජාත ස්වභාවය වේ. එහෙයින් මෙහි **ආරමමණ සදිසං, සහජාත පචචය සදිසං** යයි කියන ලදී. මේ තෙවිසි ප්‍රත්‍ය සංක්ෂේප කර දැක්වීම් වශයෙන් මෙය කියන ලදී. **විත්ථාරෙතබ්බා** යම් විමසීමක් විසඳුම් ලබයිද ඒවායේ වශයෙන් විස්තර කළයුතුය. මේ හේතුපච්චය ආදිකොට එක් මුල්හි පච්චයානුලෝමයෙහි පච්චය වාරයේ කුසලත්තික විසඳුමෙහි අර්ථ වර්ණනාව වේ.

දැන් මෙහි හෙතුපචචයවල එක් එක් පච්චයෙහි විසඳුම්වාර ලැබීය. ඒවා ගණන් වශයෙන් දැක්වීමට **හෙතුයා නවා** යනාදිය ඇරඹීය. එහි **හෙතුයා නවා** හේතුපච්චයේ විමසීම් (පුච්ඡා) නවයක් විසඳුම්වාර වේ. කෙසේද? කුසලයෙන් කුසල, කුසලයෙන් කුසල අබ්‍යාකත, කුසලයෙන් අබ්‍යාකත, අකුසලයෙන් අකුසල, අකුසලයෙන් අබ්‍යාකත, අකුසලයෙන් අකුසල අබ්‍යාකත, අබ්‍යාකතයෙන් අබ්‍යාකත, කුසලා බ්‍යාකතයෙන් අබ්‍යාකත, අකුසලා බ්‍යකතයෙන් අබ්‍යාකත යයි වේ. **ආරමමණෙ තීණි** කුසලයෙන් කුසල, අකුසසලයෙන් අකුසල, අබ්‍යාකතයෙන් අබ්‍යාකත, **අධිපතියා නවා** හෙතු පච්චයට සමානය. පච්චය දොළොසක **නව නවා** නවය නවයයි කියන ලදී. සියළු පුච්ඡා විස්සජ්ජන (විමසීම් විසඳුම්) හේතුපච්චයට සමාන වේ. විභංගයෙහි විශේෂයක් ඇත. පච්චය දහයක **තීණි තීණි** තුන තුන යයි කියන ලදී. සියළු පුච්ඡා විස්සජ්ජා ආරම්මණ පච්චයට සමාන වේ. විභංගයෙහි විශේෂයක් ඇත. **අඤ්ඤමඤ්ඤ**

පච්චයෙහි අබ්‍යාකත පදයේ විසඳුමෙහි රූපයද ලබයි. පුරේජාත පච්චයෙහිද එසේය. ආසේවන පච්චයෙහි විපාක මෙන්ම වීථි සිත් ද නොලබයි. **විපාකෙ එකං** අබ්‍යාකත පමණකි. මෙසේ මෙහි සංක්‍ෂේපයෙන් නවය තුන එක යයි වාර පරිච්ඡේද තුනකි. විස්තර වශයෙන් දොළොස නවක දසතික එක යයි සියළු තෙවිසි පච්චයවල එකුන් සතළිසකට අධික වාර හතක් වේ. එතැන් සතළිසකට අධික පුච්ඡා හතක්ද වේ. එකුන් සතළිසකට අධික පුච්ඡා විසසජජන සතක් යයිද ඊට නමකි.

මෙසේ හේතු පච්චයාදියෙහි ඒක මූලකයෙහි ගණන දක්වා මෙයින් පසු දුමූලකාදියෙහි විස්තර දේශනා හකුළුවා ඒක මූලකයෙහි දක්වන ලද දේශනාවේ ගණනම ගෙන වාර පරිච්ඡේද දැක්වීමට දුමූලකයෙහි **හෙතු පචචයා ආරමමණෙ තීණි** යනාදිය කීහ. එහි ලක්‍ෂණ මෙසේය. බොහෝ ගණනක් ඇති පච්චය අඩු ගණනක් ඇති පච්චය සමග යුක්තව සමාන ගණනක් වේ. එයින් කියන ලදී. **හෙතු පචචයා ආරමමණෙ තීණි** හේතුපච්චය ආරම්මණයෙහි තුනය. හේතු ආරම්මණ දුකයෙහි ආරම්මණයෙහි කියන ලද තුනම විසඳුම් ලබයි යන අර්ථය වේ. සමාන ගණන වනාහි සමාන ගණන සමග යෙදී අපරිහීන ගණනක්ම වේ. එයින් කියන ලදී. **හෙතු පචචයා අධිපතියා නවා** හේතු අධිපති දුකයෙහි නවයක්ම විසඳුම් ලබයි යන අර්ථය වේ. **විපාකෙ ඒකං** හේතුවිපාක දුකයෙහි විපාකයෙහි කියන ලද විසඳුම් එකක්ම ලබයි. මෙසේ දුමූලකයෙහි වාර පරිච්ඡේදය දතයුතුය. තිමූලකාදියෙහි ද මේ ලක්‍ෂණම වේ. එයින් කීහ. '**හෙතුපචචයා ආරමමණ පචචයා අධිපතියා තීණි**' හේතුආරම්මණ අධිපති තිකයෙහි ආරම්මණයෙහි කියන ලද විසඳුම් තුනම ලබයි යන අර්ථය වේ. මෙසේ සියළු නය පැමිණවිය යුතුය. දොළොස්වන මූලකයෙහි වනාහි විපාක පච්චය නොලබයි. එහෙයින් **ආසෙවන පචචයා කමෙම තීණි** යයි කියා විපාකය පරාමර්ශනය නොකොට **ආහාරෙ තීණි** යයි කියන ලදී. තෙළෙස් මූලකාදියෙහි ද මෙම නයම වේ. ඒවා වනාහි හකුළුවා තෙවිසි මූලකය ද මෙහි දක්වන ලදී. එය ද්විධ වේ. සාසේවන හෝ සවිපාක හෝ යනුවෙනි. පළමුව සාසේවනය දක්වන ලදී. එය විසඳුම් තුනක්ම ලබයි. එයින් කියන ලදී. **ආසෙවන පචචයා අවිගතෙ තීණි** සවිපාකය වනාහි ආසේවනය නො ලබයි. එහෙයින් එය හැර විපාක වශයෙන් ගණනින් දැක්වීමට අනතුරුවම **හෙතුපචචයා.........විපාක පචචයා ආහාරෙ එකං** යන එක් නයක් දක්වා පසුව තෙවිසි මූලකයම දක්වන ලදී. මෙම තෙවිසි මූලක දෙකෙහි එකක විපාක පච්චය නැත.

එකක ආසෙවනපච්චය නැත. දෙකෙහිම පච්ඡාජාතපච්චය නැත. රූඪී වශයෙන් වනාහි මේවා තෙවිසි මූලක වශයෙන් දතයුතුය. ඒවායෙහි සාසේවන ආසේවන වශයෙන් සියළු තැන විසඳුම් තුනක්ම වේ. සවිපාකයෙහි විපාක පච්චය වශයෙන් එකක්ම වේ. මෙය හේතුපච්ච මුල්කොට ඇති ඒක මූලකාදියෙහි ගණනය. මේ හේතුමූලකයට අනතුරුව ආරම්මණයෙහි සිටි සියළු තැන ප්‍රශ්න තුනක්ම කියන ලදී. එය ආරම්මණ පච්චය මුල්කොට ඒක මූලකයෙහි ද දුමූලකාදියෙහි ද යම්තැනක නවයකින් වියයුතු ද එහි ප්‍රශ්න තුනක් වේයයි දැක්වීමට කියන ලදී. විපාක පදයෙහි වනාහි විපාක පදය සමග සෙසු පච්චය යෝජනාවල ද එකම ප්‍රශ්නයක් වේයයි යට කියන ලදහ. බොහෝ ගණන් ඇති පච්චය බොහෝ ගණන සමග යෙදී එය හා සමාන ගණන වේයයි එය මනාව කියන ලද්දේමය.

දැන් ආරම්මණාදි පච්චයන්ගේ වශයෙන් යම් ඒක මූලකාදිය දැක්විය යුතු වේ. ඒවායින් ඒකමූලකය හේතු ඒක මූලකය සමග සමානයයි එකම පච්චයකුදු නොදක්වන ලදී. ආරම්මණ පච්චය වශයෙන් දුමූලකයෙහි ගණන දැක්වීමට **ආරමමණ පචචයා හෙතුයා තීණි අධිපතියා තීණි**..... අවිගතෙ **තීණි** යයි කියන ලදී. මෙහි ද ආරම්මණ පච්චයා අධිපතියා තීණි..........අවිගතෙ තීණි යයි කිවයුතු තැන හේතු පච්චයාදි පච්චය බොහෝ ගණනක්, ඒවාට අඩු ගණනකින්ද සමාන ගණනකින්ද සමග සැසඳීමෙන් යම් ගණනක් ලැබේද එය දැක්වීමට ආරම්මණ පච්චයේ පෙර භාගයේ සිටි හේතුපච්චය පසුභාගයෙහි තබා ආරම්මණ පච්චයා හේතුයා තීණි යයි කියන ලදී. එයින් මෙය ප්‍රකට කරයි. ආරම්මණ පච්චය යම් බහුතර ගණනින් හෝ සමාන ගණනින් හෝ පච්චය සමග දුක තිකාදි භේදයට යයි. ඒ සියළු තැන ප්‍රශ්න විසඳීම් තුනම යයි දතයුතුය. විපාක පච්චය සමග වනාහි සැසඳීමෙහි එකක්ම ලැබේ. එය විපාක පච්චය සමග ගණනින් ප්‍රකට වන්නේ යයි මෙහි නොදක්වන ලදී. දුමූලකයෙහි මේ ගණන දක්වන ලදී. තිමූලකාදියෙහි ද මේ ගණන් ආරම්මණ පච්චය වශයෙන් තිමූලකාදිය විස්තර නොකරන ලදී.

දැන් අධිපති පච්චයාදි වශයෙන් දුමූලකාදියෙහි ගණන දැක්වීමට **අධිපති පචචයා හෙතුයා නවා** යනාදිය කියන ලදී. එහිද කියන ලද නයින්ම පච්චය සන්නිවේශය දතයුතුය. අධිපති පච්චයේ හේතු නවය යම්සේද එසේම සෙසු ඒවායේද සමාන ගණන්වල හේතු නවයම වේ. මෙසේ යම් යම් පච්චය මුලින් සිටීද එය එය සමග සමාන ගණන් වලදී

දැක්වීමෙහි මුලින් සිටි පච්චය අනුව ගණන වේ. ආරම්මණ පච්චය වශයෙන් යම්සේද අධිපති පච්චය වශයෙන් ද එසේය. එයින් පසු සමනන්තරාදීන්ගේ වශයෙන් ද තිමූලකාදිය විස්තර නොකරන ලදී. එහෙයින් දුමූලකයෙහි දක්වන ලද ගණන වශයෙන් ම සියළු තැන සෑදිය යුතුය. එහෙයින්ම කියන ලදී. **එකෙකං පච්චයං මූලකං කාතුන සජ්ඣාය මග්ගෙන ගණෙතබ්බා** එක එක පච්චය මුල්කොට සජ්ඣාය මාර්ගයෙන් ගිනිය යුතුය.

## පච්චයානුලෝමය නිමි.

පච්චයපච්චනීය වනාහි කුසල පදයෙහි නොලබයි. හේතුපච්චය හැර කුසල ධර්මයේ නො ඉපදීමෙන්, එහෙයින් **අකුසල ධම්මං පටිච්ච** යනාදිය අරඹන ලදී. එහි **න හෙතුපච්චයා** හේතුපච්චය ප්‍රතික්ෂේපය, හේතු පච්චය හැර වෙන ප්‍රත්‍යයකින් උපදී යයි අර්ථය වේ. **විචිකිච්ඡා සහගතො උද්ධච්ච සහගතො මොහො** මෙය සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ ද චිත්ත සමුට්ඨාන රූපයේ ද තමාම හේතුපච්චය වේ. අන්‍ය සම්ප්‍රයුක්ත හේතුවේ අභාවයෙන් හේතුපච්චයෙන් නූපදීයයි හේතුපච්චය හැර තමාගේ සෙසු අනුරූප පච්චයවලින් උපදී. මෙම නයින් සියළු පච්චය ප්‍රතික්ෂේපවල අර්ථය දතයුතුය. **අහෙතුකං විපාකාබ්‍යාකතං** මෙය රූප සමුට්ඨාන වශයෙන්ම දතයුතුය. මෙබඳු අනන්‍ය ඒවායේද මෙම නයම වේ. අධිපති පච්චයෙහි නොවේ. අධිපති ද තමා සමග දෙවැනි අධිපතියෙකුගේ අභාවයෙන් අධිපති පච්චය නොලබයි. යම්සේ වනාහි විචිකිච්ඡා, උද්ධච්ච සහගත මෝහය අහේතුකය. අධිපති එසේ නොවේ. නිරාධිපති ඡන්දාදියෙහි වනාහි අන්‍ය අධිපතියකු නොකොට කුසලාදියේ උත්පත්ති කාලයෙහි සියළු කුසලාදිය නිරාධිපති වේ. එහෙයින් මෝහය මෙන් වෙනම අධිපති පමණක්ම නොඋදුරා සර්ව සංග්‍රාහික වශයෙන් මෙය **එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා** යනාදි දේශනා කරන ලදැයි දතයුතුය. අනන්තර සමනන්තරවල න ආරම්මනයෙහි මෙන් රූපයම පච්චයුප්පත්ත නොවේ. එයින් කියන ලදී. **නා රම්මණ පච්චය සදිසං** සහජාත පච්චය පරිහීනය. එය මෙන්ම නිස්සය අත්ථි අවිගත පච්චය ද එසේ වේ. කරුණු කිම? මේවායින් තොරව කිසිවක් නූපදින හෙයින්, සහජාත නිස්සය අත්ථි අවිගත පච්චයවලද ප්‍රත්‍යක්ෂයෙන් එක ද රූපාරූප ධර්මයක් නූපදී.

එහෙයින් ඒවා පරිහීනය. අඤ්ඤමඤ්ඤ පච්චය විභංගයෙහි **පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතෙ ඛන්‍ධෙ පටිච්ච කටත්තා රූපං** හෘදය වස්තුව වර්ජිත නොවන බව දතයුතුය. උපනිස්සය විභංගයෙහි රූපයම පච්චයුප්පන්න නොවේ. එහි උපනිස්සය නො ලබයි. අරූපය වනාහි කිසිම ආරම්මණ උපනිස්සය පකතූපනිස්සය නො ලබන්නේ ය. අනන්තර උපනිස්සය මුක්තකය වනාහි නැත. එයින් කියන ලදී. **නාරම්මණ පච්චය සදිසං** න පුරේජාතයෙහි **චිත්ත සමුට්ඨානා රූපං** පංචවෝකාර වශයෙන් කියන ලදී. **න පච්ඡාජාත පච්චයා** මෙහි සහජාත පුරේජාත පච්චය සංග්‍රහයට යයි. එහෙයින් සහජාත පච්චය සමාන යයි මෙහි පෙළයි. එය න අධිපති පච්චයෙහි විස්තර කරන ලදැයි මෙහි සංක්ෂේප කරන ලදී. නාසේවන පච්චයේ කුසලාකුසල පළමුවන ජවනය වශයෙන් දතයුතුය. කිරිය අබ්‍යාකතද එසේය. පෙළ වනාහි මෙහි ද න අධිපති පච්චයෙහි විස්තර කළ ලෙසින් දතයුතුය. එහෙයින් කීහ. **න පච්ඡාජාත පච්චයම්පි නාසෙවන පච්චයම්පි නාධිපති පච්චය සදිසං** න කම්ම පච්චයෙහි විපාක චේතනා නා නා ඛණික කම්ම පච්චය ලබා යයි නො ගන්නා ලදී. නාහාර පච්චයෙහි එකක් රූපයම පච්චයුප්පන්න වේ. ඉන්‍ද්‍රිය පච්චයෙහි ද එසේය. න ඣාන පච්චයෙහි පඤ්ච විඤ්ඤාණ ධර්ම ද එක් රූපයක් ද පච්චයුප්පන්න වේ. පඤ්ච විඤ්ඤාණයෙහි වේදනාවද චිත්තෙකග්ගතාවද දුබල බැවින් උපනිජ්ඣාන ලක්ෂණය නොපැමිණේ යයි ඣාන පච්චයෙහි නොගන්නා ලදී. නමග්ග පච්චයෙහි අහේතුක විපාක කිරියද එක් රූපයක්ද පච්චයුප්පන්න වේ. න සම්පයුත්ත නොනත්ථි අවිගතවල රූපයම පච්චයුප්පන්න වේ. එයින් කියන ලදී. නා රම්මණ පච්චය සදිසං. **න හෙතුයා** දෙව යයි ඒකමූල ගණනය සඳහා පෙළෙහි වෙත පැමිණවිය. ද්‍වි මූලකයෙහි **න හෙතුපච්චයා නාරම්මණෙ එකං** මෙහි බහු ගණන සමග ඌනතර ගණනේ සැසඳීමේ ඌනතර ගණන වශයෙන් න හේතුව මෙන් දෙකකින් විය යුතුය. නාරම්මණ වශයෙන් වනාහි අරූප ධර්මයන්ගේ පරිහීන බැවින් අබ්‍යාකතය නිසා රූප අබ්‍යාකතයේ උපත සඳහා **එකං** යයි කියන ලදී. සියළු ඒකකවල ද මේ නයම වේ. දෙව යයි කියූ තැන්වල වනාහි නහේතුවෙන් ලත් වාර දෙක දතයුතුය. තිමූලකාදියෙහි වනාහි සියළු නාරම්මණ පච්චය අපරිහීන බැවින් එකම විසඳුමක් වේ. මේ පච්චනීයෙහි නහේතු පච්චය මුල්කොට ඒකමූලකාදියෙහි ගණන වේ. නාරම්මණ පච්චය ආදිය වනාහි එක මූලකයෙහි පෙර මෙන් සමාන බැවින් මෙහිද දක්වන ලද්දේමය. නාරම්මණ පච්චය වශයෙන් ද්‍වි මූලකයෙහි **නාරම්මණ පච්චයා හෙතුයා එකං** යයි න හෙතු ද්‍වි මූලකයෙහි කියන

ලද්දේමය. නාධිපතියා පඤ්ච නාරම්මණ පච්චයෙහි ලැබූ සේ දතයුතුය. මෙසේ සියළු සැසඳීම්වල ඌනතර ගණනේ පච්චය වශයෙන් ගණන දතයුතුය. යම් යම් තැනක නාරම්මණ පච්චය පිවිසේද ඒ ඒ තැන්වල රූපයම පච්චයුප්පන්න වේ. න අනන්තර, න සමනන්තර, න අඤ්ඤමඤ්ඤ, න උපනිස්සය, න ආහාර, න ඉන්‍ද්‍රිය, න සමපයුත්ත, නො නත්‍ථි, නො විගත පච්චයන්ගේ පිවිසි තැන්වලද මෙම නයම වේ. න ආහාර, න ඉන්‍ද්‍රිය, න ඣාන, න මග්ග පච්චය සියළු තැන්වල සමාන විසඳීම් වේ. න සහජාතාදි සතර මෙහිද පරිහීනම වේ. මෙහි මේ ලක්‍ෂණ වේ. මෙම ලක්‍ෂණයෙන් සියළු දු මූලවල මේ පච්චය මූල වේ. මෙය මෙහි දු මූලක වේ. මෙය තිමූලක වේ. මෙය සබ්බමූලක වේ යයි සලකා ඌනතර ගණන පච්චයේ වශයෙන් ගණන දතයුතුය.

## පච්චය පච්චනීය නිමි.

දැන් අනුලෝම පච්චනීය ගණන දැක්වීමට හෙතුපච්චයා නාරම්මණෙ පඤ්ච යනාදිය අරඹන ලදී. එහි හේතු අධිපති මග්ග පච්චයවල අනුලෝමයෙන් සිටි සහජාතාදි සතර සබ්බට්ඨානික පච්චය ආහාර ඉන්‍ද්‍රිය ඣාන මග්ග පච්චය සතරදැයි මේ අට පච්චනීක වශයෙන් නො ලබයි. හේතු පච්චයාදි වශයෙන් උපදින ධර්ම මේ පච්චය අට නොලබන්නෝ නම් නැත්තාහ. ආරම්මණ අනන්තර සමනන්තර උපනිස්ස සම්පයුත්ත නත්‍ථි විගත පච්චයවල වනාහි අනුලෝම වශයෙන් සිටි අරූපට්ඨානික පච්චනීක වශයෙන් නොලබයි. ආරම්මණ පච්චයාදින් උපදිනු ලබන අනන්තර සමනන්තර පච්චයාදිය නොලබන්නේ නොවේ. සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය කම්ම ආහාර ඉන්‍ද්‍රිය අත්‍ථි අවිගත පච්චයවල වනාහි අනුලෝමයෙන් සිටි සතර සබ්බට්ඨානිකම පච්චනීක වශයෙන් නොලබයි. මේ පච්චයන්ගේ වශයෙන් උපදින සබ්බට්ඨානිකයෙහි නොලබන්නේ නම් නැත. පච්ඡාජාත පච්චයේ අනුලෝම වශයෙන් ස්ථානයක් නම් නැත. මෙසේ සෙසු ඒවාවල අනලෝමයෙන් සිටි ලැබෙන ඒවාද නොලැබෙන ඒවාද සලකා සියළු දු මූලක නයවල ඒ ඒ පච්චයන්ගේ සැසඳීමේ ඌනතර ගණනම වශයෙන් ගණන දතයුතුය.

## පච්චයානුලෝම පච්චනීය නිමි.

දැන් පචචනීයානුලෝමයෙහි ගණන දැක්වීමට **න හෙතුපචචයා ආරමමණෙ දෙව** යනාදිය ඇරඹීය. එහි හේතුවෙහි පච්චනීකයෙන් සිටි අධිපති හැර සෙස්ස අනුලෝමයෙන් ලබයි. පච්ඡාජාතය වනාහි අනුලෝමයෙන් සියළු තැන්වල නො ලබයි. යම් නව පච්චයන් අරූපයෙහිම යයි කියන ලදී. ඒවායෙහි පුරේජාතයද ආසේවනය ද හැර අවසේස සතෙහි පච්චනීකයෙන් සිටි සෙසු අරූපධ්‍යානිකයෝ අනුලෝමයෙන් නොලබති. යමෙක් ආරම්මණාදියෙන් නූපදී. එය අනන්තරාදි නොලබයි. පටිසන්ධි විපාකය වනාහි පුරේජාතයෙන් සියළු විපාකද කිරිය මනෝධාතුව සමග ආසේවනයෙන් නූපදින්නේම අනන්තරාදිය ලබයි. එහෙයින් පුරේජාත පච්ඡාජාත ආසේවනයද හැර යයි කියන ලදී. පුරේජාත පච්ඡාජාත ආසේවන විපාක විප්පයුත්තවල පච්චනීකයෙන් සිටි එක හැර අවසේස අනුලෝමයෙන් ලබයි. කම්ම පච්චයේ පච්චනීකයෙන් සිටි විපාක පච්චය හැර අවසේස අනුලෝමයෙන් ලබයි. ආහාර ඉන්ද්‍රියවල පච්චනීකයෙන් සිටි සබ්බධ්‍යානික මෙන්ම අඤ්ඤමඤ්ඤ කමම ආහාර ඉන්ද්‍රිය පච්චයන් හැර අවසේස පච්චය අනුලෝමයෙන් නො ලබයි. ඉතිරි ඒවා යෙදීම් වශයෙන් ලබයි. ඣාන පච්චයේ පච්චනීකයෙන් සිටි හේතු අධිපති ආසේවන මග්ග පච්චය අනුලෝමයෙන් නො ලබයි. මග්ග පච්චයේ පච්චනීකයෙන් සිටි හේතු අධිපති පච්චය අනුලෝමයෙන් නො ලබයි. විප්පයුත්ත පච්චයේ අනුලෝමයෙන් සිටි පුරේජාත පච්චය හැර අවසේස පච්චය අනුලෝමයෙන් ලබයි. මෙසේ ඒ ඒ පච්චයවල පච්චනීකයෙන් සිටි යම් යම් අනුලෝමයෙන් නො ලබයිද ඒ ඒවා දැන ඒ ඒ පච්චයන්ගේ සැසඳීමෙහි ඌනතර ගණන් මුල වශයෙන් ගණන් දතයුතුය. දූ මූලකාදි නයවලද යම් යම් පච්චය මුල්කොට යම් යම් දුකාදිය දක්වන ලදී. ඒ ඒ ලැබෙන නොලැබෙන පච්චය වශයෙන් යම්සේ දක්වන ලදද එසේ මනාව සැලකිය යුතුය. එහි යමක් න හේතු වශයෙන් දූ මූලකාදි නයෙහි දක්වන්නේ **න හෙතුපචචයා නාරමමණ පචචයා නාසෙවන පචචයා** යයි කියා යාව **ආසේවනා සබබං සදිසං** යයි කියන ලදී. එහි න අඤ්ඤමඤ්ඤ පචචය සහජාතයෙහි එකක් යයි ආදියෙන් සමාන බව දතයුතුය. යමක් වනාහි **න කමෙම ගණිතෙ පඤ්ච පඤ්චහාති** යයි සිංහල භාෂාවෙන් ලියන ලදී. එහි අර්ථය නහේතු පච්චය මුල්කොට නකමමපච්චය යයි මෙසේ න කම්ම පච්චයෙන් ගැටුණු සහජාතයෙහි එකක් යයි මෙසේ දක්වන ලද පච්චය පහම අනුලෝමයෙන් ලබයි. අනිකක් නොවේ. මෙසේ අන්‍ය වූද මෙබඳු වූ ස්ථානවල ව්‍යඤ්ජනය

(අකුරු) නොගෙන අදහස් කළ අර්ථයම ගතයුතුය. මෙබඳු වූ බ්‍යඤ්ජන තමාගේ දැනගැනීම් අර්ථය සඳහා පුරාණයන් විසින් තම තමාගේ භාෂාවෙන් ලියන ලදී.

තව ද මේ පච්චනීයානුලෝමයෙහි පච්චයුප්පන්න ධර්මවලද අඝටී ධර්මය කම්ම පච්චය ලබයි. ඉන්‍ද්‍රිය පච්චය නොවේ. එය අසඤ්ඤයෙහි මෙන්ම පංච වෝකාරයෙහි පවතින රූප ජීවිතේන්‍ද්‍රිය වශයෙන් දතයුතුය. අඝටී ධර්මය මග්ග පච්චය ලබයි. හේතුපච්චය නොවේ. එය විචිකිච්ඡා උද්ධච්ච සහජාත මෝහ වශයෙන් දතයුතුය. අඝටී ධර්මය ඣාන පච්චය ලබයි. මග්ග පච්චය නොවේ. එය මනෝධාතු අහේතුක මනෝ විඤ්ඤාණ ධාතු වශයෙන් දතයුතුය. යම්තැනක කටත්තා රූප නා නා ක්ෂණික කම්ම වසයෙන් ම කම්ම පච්චය ලබයි. එහි රූපධර්ම හේතු අධිපති විපාක ඉන්‍ද්‍රිය ඣාන මග්ග පච්චයන් නොලබයි. සබ්බඨානික පච්චනීය නොවේ. අහේතුකයෙහි අධිපති පච්චය නැතැයි මේවායේ ද ප්‍රකීර්ණක වශයෙන් මෙහි ගණන වාරය මුළා නොවීමෙන් දතයුතුය.

එහි නය මෙසේය. **හෙතු පචචයා ආරමමණෙ දෙව** යයි මෙහි අහේතුක මෝහය මෙන්ම අහේතුක විපාක කිරිය ද පච්චයුප්පන්න වේ. එහෙයින් අකුසලයෙන් කුසලය අබ්‍යාකතයෙන් අබ්‍යාකතය සඳහා මෙහි දෙව යයි කියන ලදී. සෙස්සෙහි ද මෙම නයම වේ. ආසේවන වනාහි විපාක නො ලබයි. කිරිය මනෝධාතුවද එසේය. එහෙයින් කිරිය අහේතු මනෝවිඤ්ඤාණ ධාතු වශයෙන් මෙහි අබ්‍යාකතයෙන් අබ්‍යාකත දතයුතුය. **විපාකෙ එකං** යයි අබ්‍යාකතයෙන් අබ්‍යාකතම වේ. **මගෙග එකං** අකුසලයෙන් අකුසලම වේ. නාරමමණ මූලකයෙහි **හෙතුසා පඤ්ච** රූපයම සඳහා කියන ලදී. එහි කුසලය, අකුසලය, අබ්‍යාකතය, කුසල අබ්‍යාකතය, අකුසල අබ්‍යාකත යයි කොටස් පහ නිසා උපදියි. සියළු පංචකයෙහි මෙම නය වේ. **අඤ්ඤමඤ්ඤ එකං** යයි භූත රූපවල මෙන්ම වස්තු රූපයද සඳහා කියන ලදී. ඒවා නාරම්මණ පච්චයේ අඤ්ඤමඤ්ඤ පච්චයේ උපදී. තිමූලකයෙහිද මෙම නය වේ. නාධිපති මූලකයෙහි **හෙතුයා නවා** යයි අනුලෝම හේතුවෙහි කියන ලදී. **තීණි** යයි ආදියද යට අනුලෝමයෙහි කියන ලද්දට සමාන වේමය. න පුරේජාත මූලකයෙහි **හෙතුයා සතතා** යට 'ආරුපෙප කුසලං එකං ඛනධං පටිචච' යනාදි නයින් පුරේජාතයෙහි දක්වන ලදමය. සියළු සත්තකවල මේ නයම වේ. න කමම මූලකයෙහි **හෙතුයා තීණි** යනාදියෙහි චේතනාව පච්චයුප්පන්න වේ. එහෙයින් කුසලය

අකුසලය අබ්‍යාකතය ද නිසා උපත සඳහා **තීණියයි** කියන ලදී. මෙම නයින් **එකං** දෙව **තීණි පඤ්ච සතත නවා** ආ තැන්වල ගණන දතයුතුය. සතර සය අට යන මේ තුනට ගණන් නැත්තේමය.

## පච්චය පච්චනීයානුලෝමය
## නිමි.

## පච්චය වාරයේ අර්ථ වර්ණනාව නිමි.

සහජාත වාරයෙහි **කුසලං ධම්මං සහජාතො** යයි කුසල ධර්ම නිසා එයින් සහජාත වී යයි අර්ථය වේ. මෙහි සෙස්ස පටිච්ච වාරයෙහි කියන ලද නයින්ම දතයුතුය. අවසානයෙහි වනාහි **පටිච්චට්ඨං නාම සහජාතට්ඨං සහජාතට්ඨං සහජාතට්ඨං නාම පටිච්චට්ඨං** මේ දෙකම මේවායේ වාරවල අර්ථ වශයෙන් වෙනසක් නැති බව දැක්වීම සඳහා කියන ලදී. අර්ථ වශයෙන් මේ දෙකෙහිම වෙනසක් නැති බව පැවතුනද ඔවුනොවුන්ගේ අර්ථ නියාමය සඳහා කියන ලදී. 'චක්ඛුඤ්ච පටිච්ච රූපෙච' ආදියෙහි අසහජාතද නිසා උපදී යයි කියයි. සහජාතද උපාදාරූපය භූත රූපයට පච්චය නොවේ. මෙසේ පටිච්ච වාරයෙන් සහජාත පච්චයභාවය මේ දෙකෙහිම කියන ලදී. තවද එසේ අවබෝධ කරන්නන්ගේ අදහස් වශයෙන් දේශනා විලාසයෙන් නිරුක්ති පටිසම්භිදා ප්‍රභේද දැනීම් වශයෙන්දැයි මේ දෙකම කියන ලදී.

## සහජාත වාර වර්ණනාව
## නිමි.

පච්චය වාරයෙහි **කුසලං ධම්මං පච්චයා** කුසල ධර්මයෙහි පිහිටා කුසලා ධර්ම නිසස අර්ථයෙන් පච්චය කොට යන අර්ථයයි. **කුසලං එකං ඛන්ධං පච්චයා** කුසලය එක් ස්කන්ධයකට නිස්සය පච්චය කොට හේතු පච්චයෙන් ස්කන්ධ තුනක් උපදී යයි කියන ලද්දේ වේ. මෙම උපායෙන් සියළු පදවල අර්ථය දතයුතුය. **වත්ථුං පච්චයා විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා ඛන්ධා** මෙය පංචවෝකාරයේ පැවතීම් වශයෙන් කියන

ලදී. පංචවෝකාරයෙහි පවතින ස්කන්ධයන්ගේ පූර්වජාතය වත්ථු නිස්සය පච්චය වේ. පටිච්ච අර්ථයට වනාහි සහජාත අර්ථබව පටිච්ච වාරයෙහි මේ නය නොලැබේ යයි පටිසන්ධියෙහි සහජාතයම වත්ථු සඳහා වත්ථු නිසා ස්කන්ධ යයි කියන ලදී. **කුසලං එකං ඛන්ධංච වත්ථුංච පච්චයා තයො ඛන්ධා** යනාදියෙහි ද මෙම නයින්ම අර්ථය දතයුතුය. **අබ්‍යාකතං ධම්මං පච්චයා කුසලො ච අබ්‍යාකතොච** කුසල අබ්‍යාකතවල හේතුපච්චය වශයෙන් එකට උපත සඳහා කියන ලදී. කුසල උත්පත්ති ක්‍ෂණයෙහි වස්තුව නිසා කුසල ස්කන්ධ චිත්ත සමුට්ඨාන මහාභූතයන් නිසා චිත්ත සමුට්ඨාන උපාදා රූපය හේතුපච්චය වශයෙන් එකට උපදී. මෙසේ පච්චය භූත වූ අබ්‍යාකතයට නානත්ත ද පච්චයුප්පන්න සත්ත හේතුපච්චය වශයෙන් එකට උපත සඳහාම මෙය කියන ලදැයි දතයුතුය. අන්‍ය වූ මෙබඳු තැන්වල මෙම නයම වේ. මෙසේ මේ හේතුපච්චයෙහි සහජාත ද පූර්වජාත ද නිස්සය අර්ථයෙන් පච්චය කොට ප්‍රශ්න දාහත විසඳන ලදී. එහි ස්කන්ධ ද භූත ද සහජාත වශයෙන්, වත්ථු සහජාත පූර්වජාත වශයෙන් ගන්නා ලදී. පටිච්ච වාරයෙහි වනාහි සහජාත වශයෙන් පච්චය ලබයි. එහෙයින් එහි ප්‍රශ්න නවයම විසඳන ලදී. යමෙක් මෙහි මේ සතළොස් ප්‍රශ්න විසඳන ලදද ඒවායෙහි ඒකාදික ඒකාවසාන විසඳීමේ කුසලාදියෙහි ඒක පච්චය බැවින් එක් පච්චයුප්පන්නයෙක් වේ. ඒකාදික දුකාවසානයේ එක් පච්චයකින් නා නා පච්චයුප්පන්න වේ. ආරම්මණ පච්චයාදියෙහි ද මෙම උපායෙන් ප්‍රශ්න විසඳුම් ප්‍රභේදය දතයුතුය. ආරම්මණ පච්චයෙහි ඒ මේ **වත්ථුං පච්චයා ඛන්ධා** යයි කියන ලදී. එය ප්‍රතිසන්ධි ක්‍ෂණයෙහි විපාක ස්කන්ධයම සඳහා කියන ලදී. චක්ඛු විඤ්ඤාණ ආදිය අබ්‍යාකත නිසා ආරම්මණ පච්චයෙන් උපදින්නන්ගේ ප්‍රභේද දැක්වීම සඳහා කියන ලදී. නැවත **වත්ථුං පච්චයා** යයි ප්‍රවෘත්ති විපාක කිරිය අබ්‍යාකතවල උත්පත්ති දැක්වීමට කියන ලදී. සෙස්ස පෙර නයින්ම දතයුතුය. මේ මේ ආරම්මණ පච්චයෙහි සහජාත ද පූර්වජාත ද පච්චය කොට ප්‍රශ්න සත විසඳන ලදී. එහි ස්කන්ධ සහජාත වශයෙන් වත්ථු සහජාත පූර්වජාත වශයෙන් චක්ඛායතනාදිය පූර්වජාත වශයෙන්ම ගන්නා ලදී. පටිච්ච වාරයෙහි සහජාත වශයෙන්ම පච්චය ලබයි. එහෙයින් එහි ප්‍රශ්න තුනක්ම විසඳන ලදී. අධිපති පච්චයෙහි විපාක අබ්‍යාකත ලෝකෝත්තරම දතයුතුය. අනන්තර සමනන්තර අරූපභාවයෙන් ආරම්මණය හා සමානය. පසුව ආසේවන නත්ථි විගතවලද මෙම නයම වේ. සහජාත පච්චයෙහි **කටත්තා රූපං උපාදා රූපං** යයි කියන ලද උපාදා රූප කටත්තා රූප වේ. මෙය අසඤ්ඤ සත්ත්වයින්ගේම රූපය

සඳහා කියන ලදී. චක්ඛායතනාදිය පංචවෝකාර වශයෙන් කියන ලදී. අඤ්ඤමඤ්ඤ පච්චයෙහිද යථා ආරම්මණ පච්චයා එවං විසඳීම් සමනය සඳහා කියන ලදී. පච්චයුප්පන්නවල වනාහි නා නා බවක් ඇත. උපනිස්සය පච්චයෙහි **ආරමමණ පචචය සදිසං** රූප අභාවයෙන් ද විසඳීම් සමතාව සඳහා කියන ලදී. **වත්ථුං පුරෙජාත පචචයා** යනාදියේ පටිච්ච වාරයෙහි කියන ලද නයින්ම අර්ථය ගතයුතුය. **කමමපචචයෙ තීණි** කුසලය, අබ්‍යාකතය, කුසල අබ්‍යාකත යයි මෙසේ තුන දතයුතුය. අකුසලයෙහිද මෙම නයයි. විප්පයුත්ත පච්චයෙහි **ඛන්‍ධෙ විපපයුතත පචචයා** ස්කන්ධයන් නිසා විප්පයුත්ත පච්චය උපදී යන අර්ථය වේ. **ඛන්‍ධා වත්ථුං විපපයුතත පචචයා** ස්කන්ධ වස්තුව නිසා විප්පයුත්ත පච්චය උපදී යන අර්ථයයි. සෙස්ස යට කියන ලද නයින්ම දතයුතුය.

දැන් යම්සේ ලැබුණු විසඳුම් ගණන වශයෙන් දැක්වීමට **හෙතුයා** සතතරසා යනාදිය කීහ. එහි 'හෙතුයා සතතරසා' යනු කුසලයෙන් කුසලය, කුසලයෙන් අබ්‍යාකතය, කුසලයෙන් කුසල අබ්‍යාකත යයි මෙසේ කුසල වශයෙන් ඒකාදික ඒකාවසාන වේ. දෙකක් දුක අවසන් කොට එකක් යයි තුන කියන ලදී. එසේම අකුසල වශයෙන් අබ්‍යාකතයෙන් අබ්‍යාකත එයින් කුසලය, අකුසලය කුසල් අබ්‍යාකතය, අකුසල අබ්‍යාකතයෙන් අකුසලය අබ්‍යාකතය අකුසල අබ්‍යාකත යයි මෙසේ සතළොස දතයුතුය. **ආරමමණෙ සතත** යයි, කුසලෙන කුසලය, අකුසලෙන් අකුසලය, අබ්‍යාකතයෙන් අබ්‍යාකතය, කුසලය, අකුසලය, කුසල අබ්‍යාකතයෙන් කුසලය, අකුසල අබ්‍යාකතයෙන් අකුසලය යයි මෙසේ සත. **විපාකෙ එකං** යයි අබ්‍යාකතයෙන් අබ්‍යාකතයම වේ. මෙසේ මෙහි සතළොස, සත, එක යයි වාර පරිච්ඡේද තුනක් වේ. ඒවායෙහි දොළොස, සතළොස, දස, සත ඒකක එක යයි ඒ සියල්ල මනාව සලකා පසුව දුක තිකාදි වශයෙන් පච්චය සැසඳීමේ ඌනතර ගණන වශයෙන් ගණන දතයුතුය. මේ ගණනින් දුක මූලදියෙහි වාර පරිච්ඡේද දැනගැනීමට හැකි වේයයි නැවත කුසලං ධමමං පචචයා කුසලො ධමෙමා යයි ස්පර්ශ නොකොට ගණන වශයෙන් ම වාර පරිච්ඡේදය දැක්වීමට **හෙතු පචචයා ආරමමණෙ සතත** යනාදිය ඇරඹීය. එහි කුසලං ධමමං පචචයා කුසලො ධමෙමා උපදී. හේතු පච්චය ආරම්මණ පච්චය කුසලය එක් ස්කන්ධයකි. පච්චය ස්කන්ධ තුනකි යයි මෙම නයින් ආරම්මණයෙහි ලැබූ විසඳුම්ද විස්තර කළයුතුය.

මේ අනුලෝමයෙහි නය වේ.

පච්චනීයෙහි වනාහි කුසලය නොලැබේ යයි **අකුසලං ධම්මං පච්චයා** යයි අකුසලම මුල්කොට විසඳුම ආරම්භ කරන ලදී. එය පෙළෙහි නියමයම වේ. මෙහි යමක් කිවයුතු වන්නේ නම් එය පටිච්චවාර පච්චනීයෙහි කියන ලද්දේමය. මේ පච්චනීයෙහි ලද විසඳුම් පරිච්ඡේද ගණනින් දැක්වීමට **න හේතුයා චත්තාරි** යනාදිය කියන ලදී. එහි සතර, සතළොස, සත, පහ, තුන, එක යයි පරිච්ඡේද හයකි. ඒවායේ වශයෙන් දුක තිකාදියෙහි පච්චය සැසඳීමෙන් ගණන දතයුතුය. යම පච්චයක් විසඳුම් සතළොසක් ලබයිද, එය සමග සමාන ඒවා සැසඳීමෙන් සතළොස, ඌනතර සැසඳීමෙන් සෙසු පරිච්ඡේද සය ලබයි. මෙසේ සෙස්සෙහි ද අධික පරිච්ඡේදය, සම සම ඒවා හැර ඌනතරම ලබයි. මෙහි ද අධිකතර නොලබයි. මෙහි මෙය නියමයයි. සම සම ඒවා වනාහි අරුත් විරෝධ ඇතිකල්හි ඌනතරව ද ලබයි. එයින් මෙහි **න හෙතු පච්චයා නාරම්මණෙ එකං** යනාදිය කියන ලදී. මෙහි න හෙතු මෙන් සතරක් නාරම්මණයෙන් පහක් ආ බැවින් නහේතු වශයෙන් සතරකැයි කිවයුතු වන්නේය. නාරම්මණය සමග ගැටුණු බැවින් ආරම්මණ ධර්මය නිරුද්ධ වේයයි **අකුසලං ධම්මං පච්චයා අකුසලො ධම්මො** අබ්‍යාකතං ධම්මං පච්චයා අකුසලො, අකුසලංච අබ්‍යාකතංච ධම්මං පච්චයා අකුසලො' යයි විසඳුම් තුන පරිහීනය. **අබ්‍යාකතං ධම්මං පච්චයා** අබ්‍යාකතො රූප වශයෙන් එකක්ම කියන ලදී. මෙසේ සියළු තැන විරුද්ධ අවිරුද්ධ දැන ලැබෙන පරිච්ඡේද දතයුතුය.

තවද මෙහි මෙම නය මාත්‍ර දර්ශනය. **නාධිපතියා චත්තාරි** න හේතුවෙන් ලද්දේමය. සෙසු සතරෙහි ද මෙම නය වේ. **නානන්තරෙ එකං** අහේතුක චිත්ත සමුට්ඨානයේ මෙන්ම සෙසු රූපයේ ද වශයෙන් අබ්‍යාකතයෙන් අබ්‍යාකතය වේ. මෙසේ සියළු ඒකකවල යෙදෙන රූපය දැනගත යුතුය. **නපුරෙජාතෙ දෙව** මෙහි ද න හේතු වශයෙන් සතරකැයි කිවයුතුය. නපුරේජාත සමග ගැටුණු බැවින් වනාහි 'අබ්‍යාකත ධර්මය නිසා අකුසලය, අකුසලය ද අබ්‍යාකතය ද ධර්මය නිසා අකුසල'යයි වස්තු පුරේජාත වශයෙන් විසඳුම් දෙක අඩු විය. ආරුප්පයෙහි වනාහි අහේතුක මෝහයේ ද අහේතුක කිරියේ ද වශයෙන් දෙකක් කියන ලදී. **න විප්පයුත්තෙ දෙව** ආරුප්පයෙහි අහේතුක කුසල, කිරිය වශයෙන් දෙකකි. **නො නත්‍ථි නො විගතෙසු එකං** සියළු රූපයේ වශයෙන් අබ්‍යාකතයෙන් අබ්‍යාකතය දැකිය යුතුය. තිකාදියෙහි අපුබ්බ නැත. නාරම්මණ මූලකයෙහි වනාහි **පඤ්ච** යයි නාරම්මණයෙහි ලැබුයේමය.

න කමෙම එකං මෙහි චිත්ත සමුට්ඨාන ද කටත්තා රූපද නොගෙන සෙසු රූප වශයෙන් අබ්‍යාකතයෙන් අබ්‍යාකත යයි දතයුතුය. නාධිපති මූලකයෙහි, න පුරෙජාතෙ සතත නපුරේජාතයෙහි ලද්දේමය. න පචඡාජාතෙ සතතරස මෙය ද එහි සතළොස ලද්දේය. නානන්තර න සමනන්තර න අඤ‍ඤමඤඤ න උපනිසසය න සමපයුතත නො නඤ නො විගත මූලක නාරම්මණ මූලකය හා සමානය. මේ නයමතත දස්සනයෙන් සියළු තැන ආ නොආ ලැබෙන නොලබන දේ දැනගත යුතුය.

## පචචනීය නිමි.

මේ ලකෂණයෙන්ම අනුලෝමය පෙරටු කොට අනුලෝම පචචනීයෙහි පචචනීය පෙරටුකොට පචචනීයානුලෝමයෙහි ද ගණන පරිච්ඡේදය පැමිණි නොපැමිණි ලැබීම් නොලැබීම් ද දතයුතුය.

## පචචය වාර වර්ණනාවය.

නිසසය වාරයෙහි කුසලං ධමමං නිසසයා කුසල ධර්ම පිහිටීම් අර්ථයෙන් නිස්සය කොට යන අර්ථයයි. මෙහි සෙස්ස පච්චය වාරයෙහි කියන ලද්ද අනුව දතයුතුය. අවසානයෙහි වනාහි **පචචයටඨං නාම නිසසයටඨං නිසසයටඨං නාම පචචයටඨං** යන මෙම දෙකම ඒවායේ වාරවල අර්ථ වශයෙන් වෙනසක් නැති බව දැක්වීමට කියන ලදී. අර්ථ වශයෙන් වෙනසක් නැති බව දැක්වීමට කියන ලදී. මෙසේ පැවතියද ඔවුනොවුන්ගේ අර්ථ නියාමය සඳහා කියන ලදී.

'අවිජ්ජා පචචයා සංඛාරා' යනාදියෙහි අනිස්සයෙන් පවතින නා නා ක්ෂණික ද පච්චයෙන් උපදී යයි කියන ලදී. ඔවුනොවුන් ඇලී සිටි ස්ථානවල ද එකකට එකක් නිස්සය පච්චය නොවේ. එසේ උපාදා රූප මහාභූතවලට නිස්සය පච්චය නොවේ. මෙසේ පච්චය වාරයෙන් නිස්සය පච්චය භාවය නිස්සය වාරයෙන් ද පච්චය යයි කියන ලද්දේ සහජාත

පුරේජාත භාවය පැමිණවීමට මේ දෙකම කියන ලදී. තවද එසේ අවබෝධ කරන්නන්ගේ අදහස් වශයෙන් දේශනා විලාසයෙන් නිරුක්ති ප්‍රතිසම්භිදා ප්‍රභේද දැනගැනීම් වශයෙන් යයි මේ දෙකම කියන ලදී.

**නිස්සය වාර වර්ණනාව නිමි.**

සංසට්ඨ වාරයෙහි **කුසලං ධම්මං සංසට්ඨො** කුසල ධර්ම ඒක උප්පාද ලක්‍ෂණයෙන් සම්ප්‍රයෝග අර්ථයෙන් පච්චය කොට යයි අර්ථය වේ. **කුසලං එකං ඛන්ධං සංසට්ඨො** කුසලය එක් ස්කන්ධයක් සම්ප්‍රයුක්ත පච්චය කොට ස්කන්ධ තුනක් උපදී. හේතු පච්චය යයි කියන ලදී. මේ උපායෙන් සියළු පදවල අර්ථය දතයුතුය. මේ හේතු පච්චයෙහි අරූප ධර්මයම සම්ප්‍රයෝග අර්ථයෙන් පච්චය කොට ප්‍රශ්න තුනක් විසඳන ලදී. හේතු පච්චයෙහි මෙන් ආරම්මණ පච්චයාදියෙහි ද කේවල වූ විපාක පච්චයෙහි එකම විසඳුමකි. දැන් ලැබූ විසඳීම් ගණන් වශයෙන් දැක්වීමට **හෙතුයා තීණි** යනාදිය කියන ලදී. එහි සියළු තිකවල කුසලෙන කුසලං, අකුසලෙන අකුසලං, අබ්‍යාකතෙන අබ්‍යාකතං යන මේ නියමයම වේ. ඒකකයෙහි වනාහි අබ්‍යාකතයෙන් අබ්‍යාකතම ලබයි. මෙසේ මෙහි දෙවිසි පච්චයේ තුන, විපාකයෙහි එක, පරිච්ඡේද දෙකකි. පච්ඡාජාතයෙහි අනුලෝම නැත. එහෙයින් තුන, එක යයි මේවායේ වශයෙන් දුක තිකවලද පච්චය සැසඳීමෙන් විපාක පච්චය පිවිසේ. එහි එක සෙස්සෙහි තුන යයි මෙසේ ගණන දතයුතුය. මෙහි සෙස්ස අනුලෝමයෙහි කියන ලද අර්ථම වේ.

පච්චනීයෙහි වනාහි කුසල නොලැබේ යයි අකුසලම මුල්කොට විසඳීම කරන ලදී. එය නොගැඹුරු අරුත් වේ. මෙහි පච්චනීයෙහි යම් විසඳුම් පරිච්ඡේද ගණනින් දැක්වීමට **න හෙතුයා** දෙව යනාදිය කියන ලදී. එහි දෙක තුන එක යයි පරිච්ඡේද තුනකි. ඒවායේ වශයෙන් දුක තිකාදියෙහි පච්චය සැසඳීමෙන් ඌනතර ගණනම ලබයි. සම ගණන සමග සම ගණන. යම්සේ මෙහි අරූප ධම්ම පච්චයුප්පන්න ද එහෙයින් න හෙතු, නාධිපති, න පුරෙජාත, න පච්ඡාජාත, නා සේවන, න කම්ම, න විපාක, නඣාන, නමග්ග, න විප්පයුත්ත වශයෙන් පච්චය දහයක්ම පච්චනීක වශයෙන් දක්වන ලදී. සෙසු තුදුස නොලබයි. න හෙතු පච්චයා නාධිපතියා දෙව න හේතුවෙන් දෙකම ලැබී. සෙසු ද්වයවලද මෙම නය

වේ. **න කම්මෙ එකං** අහේතුක කිරිය චේතනා පච්චයුප්පන්න කොට අබ්‍යාකතයෙන් අබ්‍යාකතය වේ. **න විපාකෙ දෙව** අහේතුක මෝහ කිරිය වශයෙන් දෙකක්. **න ඣානෙ එකං** අහේතුක පඤ්චවිඤ්ඤාණ වශයෙන් අබ්‍යාකත විසඳුම දතයුතුය. **න මග්ගෙ එකං** අහේතුක විපාක කිරිය වශයෙන් අබ්‍යාකත විසඳුම. මේ උපායෙන් සියළු සැසඳීම්වල අර්ථය දතයුතුය.

**පච්චනිය නිමි.**

අනුලෝම පච්චනීයෙහි යට කී න හෙතු ආදිය පච්චනීයෙහි දහයක්ම ලබයි. සෙස්ස නොවේ. යමක් ලබයිද ඒවායෙහි හේතුවේ. අනුලෝම වශයෙන් සිටි ඣාන මාර්ග පච්චනීයෙන් නොලබා යයි සියල්ල යට කියන ලද නයින්ම දතයුතුය.

**අනුලෝම පච්චනීය නිමි.**

පච්චනීයානුලෝමයෙහි න හෙතු පච්චයුප්පන්නවල අහේතුක මෝහයම ඣාන මග්ග පච්චය ලබයි. සෙස්ස නො ලබයි. න ඣාන පච්චයෙහි අට අහේතුක සිත් ද. **න කම්මන හෙතුනාධිපති න පුරෙජාත පච්චයා ආරම්මණෙ එකං** ආරුප්පයෙහි අහේතුක කිරිය චේතනා වශයෙන් අබ්‍යාකතයෙන් අබ්‍යාකත. මේ උපායෙන් යමක් ලබාද යමක් නොලබාද එය වශයෙන් සියළු තැන ගණන් දතයුතුය.

**පච්චනීයානුලෝම නිමි.**

**සංසට්ඨවාර වර්ණනාව නිමි.**

සම්ප්‍රයුක්ත වාරයෙහි **කුසලං ධම්මං සම්පයුත්තො** කුසල ධර්මය සම්ප්‍රයුක්ත පච්චය කොට යන අර්ථයයි. මෙහි සෙස්ස සංසට්ඨ වාරයෙහි කියන ලද නයින් දතයුතුය. මෙහි අවසානයෙහි වනාහි **සංසට්ඨං නාම සම්පයුත්තට්ඨං, සම්පයුත්තට්ඨං නාම සංසට්ඨං** මෙය දෙකේම අර්ථ

වශයෙන් මේ වාරවල වෙනසක් නැතිබව දැක්වීම සඳහා කියන ලදී. අර්ථ වශයෙන් පටිච්ච සහජාතයේ මෙන්ද නිස්සය පච්චයේ මෙන් ද යන මේවායේ වෙනසක් නැත. මෙසේ ඇති කල්හිද අඤ්ඤමඤ්ඤයේ අර්ථ නියමය සඳහා කියන ලදී. 'සංසට්ඨා යොජිතා භයා' යනාදියෙහි සම්ප්‍රයුක්ත නොවූ විටද සංසට්ඨ යයි කියන ලදී. යම් ඒ විමසීමක් 'කොසජ්ජ සහගතා කොසජ්ජ සම්පයුත්තා' යනාදියෙහි මෙය සම්පයුත්තට්ඨ නම් වේ. අසංසට්ඨ වූ ගැවසීගන්නා ලද්ද ද සම්පයුත්ත වේයයි සම්පයුත්ත වාරයෙන් ද සංසට්ඨයේ ඒක උප්පාද ලක්ෂණයේ සම්පයුත්තයේ සම්පයුත්තභාවය වෙන්කොට දැක්වීමට මේ දෙකම කියන ලදී. තවද අවබෝධ කරන අයගේ අදහස් වශයෙන් දේශනා විලාශයෙන් නිරුක්ති ප්‍රතිසම්භිදා ප්‍රභේද දැනගැනීම් වශයෙන්දැයි මේ දෙකම කියන ලදී.

## සම්ප්‍රයුක්ත වාර වර්ණනා නිමි.

මෙම වාර සයෙහි ඒකාන්තයෙන් අනුලෝම වශයෙන් නොසිටින කිසියම් පච්චය ඇත. ඒවා පච්චනීක වශයෙන් සිටී. පච්චනීක වශයෙන් නොසිටින අනුලෝම වශයෙන් සිටින පච්චය ද ඇත. ඒකාන්ත නොවන අනුලෝම වශයෙන් සහ පච්චනීක වශයෙන් ද සිටින පච්චය ද ඇත. මේ ප්‍රකීර්ණය දතයුතුය. එහි පළමුවන ප්‍රශ්නය පච්ඡාජාතයේ, දෙවැන්න මහා චතුක්කයේ තෙවැන්න යෙදෙන සෙසු ඒවායේ වශයෙන් දැනගත යුතුය.

ප්‍රශ්න වාරයෙහි 'කුසල ධර්මය කුසල ධර්මයේ හේතු ප්‍රත්‍යයෙන් පච්චය වන්නේය' යනාදියෙන් කුසල ත්‍රිකයෙහි ඉදිරිය යුතු ඇසීම්වල ලැබීම් වශයෙන් විසඳීම දැක්වීමට **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස හෙතු පච්චයෙන පච්චයො** යනාදිය කියන ලදී. මේ කුසලය නම් තමා උපදින පච්ඡාජාත සහ විපාක හැර සෙසු දෙවිසි පච්චයෙන් උපදියි. පුරෙජාත පච්ඡාජාත විපාක විප්පයුත්ත පච්චය හැර කුසලයට ප්‍රත්‍යවෙමින් සෙසු විසි පච්චයවලින් පච්චය වේ. එහෙයින් යම් පච්චයකින් කුසලය කුසලයට පච්චය වේද ඒ පච්චය පිළිවෙළින් දැක්වීමට හේතුපච්චයෙන යනාදිය ඇරඹූහ.

එහි යම් මෙය පච්චය විභංග වාරයෙහි මෙන් හේතු සම්ප්‍රයුක්ත

ධර්මයන්ගේ යයි නොකොට හෙතුසමපයුතතකානං ඛන්ධානං යයි දේශනා කෙළේය. ඒ කාරණයේම මේ ප්‍රයෝජනයයි. එහි ශූන්‍යාර්ථය දැක්වීමට ධර්මයන්ගේ යයි කියන ලදී. මෙහි පච්චයෙන් උපදින ධර්ම රාශි වශයෙන් උපදී. එක එකින් රාශි අර්ථය දැක්වීමට ඛන්ධානං යයි කියන ලදී. පටිච්ච වාරාදියෙහි හෝ ස්කන්ධ වශයෙන් පටිච්ච සමුප්පන්න දේශනා පැන නැංගේ යයි එම අනුක්‍රමයෙන්ම මෙහිද නැංගේය. කුමක් හෙයින් මෙසේ පැනනැංගේද? අසංඛාර වශයෙන් විභාග දැක්වීම සඳහාය. එක් ධර්මයක් නිසා සෙසු ධර්ම යයි ආදි නයින් කියන කල්හි අසවල් නම් ධර්මය නිසා අසවල් ධර්මය යයි අසංඛාර වශයෙන් පච්චය ද පච්චයුප්පන්නයන් ද දැනගැනීමට නොහැකි වේ. මෙසේ ඇති කල්හි උද්දේස නිද්දේස විශේෂයක් නොවේ. එහෙයින් අසංඛාර වශයෙන් විභාග දැක්වීම සඳහා මෙසේ නගන ලදැයි දතයුතුය. චිතත සමුටඨානානං මෙය යම් අව්‍යාකෘතයකට හේතු පච්චයෙන් පච්චය වේ. එයම දැක්වීමට කියන ලදී. පච්චය විභංගයෙහි වනාහි කුසලාදි වශයෙන් විභාග නොකොට සාමාන්‍යයෙන් සියල්ලේ හේතු වශයෙන් උපන් රූප දැක්වීම සඳහා චිත්ත සමුට්ඨානං යයි නොකියා ඒ හටගැනීම්වල යයි කියන ලදී. එහෙයින් එහි අව්‍යාකත හේතු සමුට්ඨාන රූප බැසගන්නා ක්‍ෂණයෙහි කටත්තා රූප ද සංග්‍රහයට ගියේය. මේ උපායෙන් මෙබඳු සෙසු තැන්වලද විසඳුම්වල අර්ථ දැනගත යුතුය.

දානං දත්‍වා යයි දේය ධර්ම අත්හැර. යම් චේතනාවකින් එය දෙනු ලැබේද, ඒ චේතනාව දානයයි. දත්‍වා යයි ඒ චේතනාව පිරිසිදුකොට විසුද්ධ කොට. සීලං සමාදයිත්‍වා පංචංගික වශයෙන් නිත්‍ය ශීලය ගෙන. මෙයින් සමාදාන විරතිම දක්වන ලදී. සම්පත්ති විරති සමුච්ඡේද විරති වනාහි ලොවේ සීල යයි අප්‍රකට බැවින් නොකියන ලදී. කිසිවක් නොකියන ලදී. ආරම්මණ පච්චය වනාහි චේමය. එහි සමුච්ඡේද විරතිය ශෛක්‍ෂයින්ටම කුසලයේ අරමුණ වේ. අන් අයට නොවේ. උපොසථ කමමං කත්‍වා 'ප්‍රාණ නොනසයි, නුදුන් දේ නොගනී' යයි කියන ලදී. පොහෝ දිනවල අටසිල් සමාදන්ව. තං පචචවෙකඛති ඒ කුසලය ශෛක්‍ෂයෝ ද පෘථග්ජනයෝ ද ප්‍රත්‍යවේක්‍ෂා කරයි. රහතන් වහන්සේ ද හෝ ප්‍රත්‍යවේක්‍ෂා කෙරේමය. රහතන් වහන්සේගේ පෙර කළ කුසලය කුසලම වේ. යම් සිතකින් මෙනෙහි කෙරේද එය කිරිය සිතක්ම වේ. එහෙයින් මේ කුසල ධර්මය කුසල ධර්මයාගේ යයි මේ අධිකාරයෙහි නොලබයි.

**පුබ්බෙ සුචිණ්ණානි** දී සමාදන් වී කොට යයි ආසන්නයෙහි කරන ලදැයි කියන ලදී. මේවා ආසන්නයෙහි නොකරන ලදැයි දතයුතුය. දානාදි සෙසු කාමාවචර කුසල දැක්වීමට මෙය කියන ලදී. **ඣානං වුට්ඨහිත්වා** ධ්‍යානයෙන් නැගිට. හේ ගෝත්‍රභූ සිත මෙනෙහි කරයි. **වොදානං** මෙය වනාහි සකදාගාමි අනාගාමීන් සඳහා කියන ලදී. ඔවුන්ගේ ඒ සිත පිරිසිදු වේ. **මග්ගා වුට්ඨහිත්වා** මාර්ග ඵල භවංග අතික්‍රමණ වශයෙන් තමා ලද මාර්ගයෙන් නැගිට. සුද්ධ මාර්ගයෙන් නැගිට වනාහි ප්‍රත්‍යවේක්‍ෂා නැත. **කුසලං අනිච්චතො** මෙහි විපස්සනාවට පැමිණි ත්‍රෛභූමක කුසලයම දතයුතුය. විපස්සනා කුසලය කාමාවචරමය. **චෙතොපරිය ඤාණෙන** රූපාවචර කුසලය දක්වයි. **ආකාසානඤ්චායතනං** යනාදියෙන් අරූපාවචර කුසල් අරමුණු වශයෙන් උපදින අරූපාවචර කුසලම වේ. **කුසලා ඛන්ධා ඉද්ධිවිධ ඤාණස්ස** ආදියෙන් පුද්ගලයා පරාමර්ශනය නොකොට ධර්මය වශයෙන්ම දක්වයි. එහෙයින්ම මෙහි යට ගන්නා ලද චේතෝපරිය ඤාණය නැවත කියන ලදී. **අස්සාදෙති** සොම්නස් සහගත ලෝභ සම්ප්‍රයුක්ත සිත්වලින් අනුභවනය ද ඇලීමද වේ. **අභිනන්දති** ප්‍රීතිය සහිත තෘෂ්ණා වශයෙන් සතුටු වේ. තුටු පහටු වේ. දැකීම් සතුටෙන් හෝ සතුටු වේ. **රාගො උප්පජ්ජති** ආශ්වාදනය කරන්නාට රාගය උපදී. මේ අටම ලෝභ සහගතයන් ගෙන කියන ලදී. **දිට්ඨි උප්පජ්ජති** සතුටු වූවහුට තමා තමා කෙරෙහි ආදි වශයෙන් සතර සිත්වලින් යුක්තව දිට්ඨිය උපදී. ස්ථිර නිගමනයට (තීරණයට) නොගිය තැනැත්තාට විචිකිච්ඡාව උපදී. වික්‍ෂෙප වූ තැනැත්තාට උද්ධච්චය. කලණ දහම් නොකරන ලදැයි විපිළිසර වූයේ දොම්නස. **තං ආරබ්භ** ඒ පිරිසිදු අරමුණු කොට යන අර්ථය වේ. **අරහා මග්ගා වුට්ඨහිත්වා** මාර්ග වීථියේ ඵලයට අනතුරුව භවාංගයේ ඉක්මවීම් වශයෙන් නැගී සිට. ප්‍රත්‍යවේක්‍ෂා සිත් වනාහි කිරිය අව්‍යාකෘත වේ. මේ කිරිය අබ්‍යාකතවලට ආරම්මණ පච්චය දක්වා නැවත විපාක අබ්‍යාකතවලට දැක්වීමට **සෙක්ඛා වා** යනාදිය කීහ. **කුසලෙ නිරුද්ධෙ** විපස්සන ජවන වීථියේ සිඳීම සඳහා. **විපාකො** කාමාවචර විපාකය. **තදාරම්මණතා** තදාරම්මණ බව සඳහා. ඒ කුසල ජවනයාගේ අරමුණු වූ විපස්සනා කුසලය අරමුණු කොට උපදී යනු අර්ථය වේ. හුදෙක් තදාරම්මණ වශයෙන් නොව ප්‍රතිසන්ධි භවංග චුති වශයෙන්ද විපාකය වනාහි කර්මය අරමුණුකොට ගන්නා ලද ප්‍රතිසන්ධියේ කුසල අරමුණ වේමය. එය වනාහි දැනීමට දුෂ්කර නිසා මෙහි නොදක්වන ලදී. **කුසලං අස්සාදෙති** යනාදිය අකුසල ජවනාවසානයෙහි කුසල අරමුණු විපාකය දැක්වීමට කියන ලදී. **විඤ්ඤාණඤ්චායතන විපාකස්ස** මෙය දුබ්බිඥෙයයාට ද සමාන

මහග්ගත විපාකයට තදාරම්මණ භාවයෙන් අනුව ඉපදීම් වශයෙන් ලැබෙන්නේ යයි කියන ලදී. **කිරියසස** රහත්බවට පැමිණ පෙර අසමාපන්න ආකාසානඤ්චායතනයේ පටිලෝම වශයෙන් හෝ එකක් හැර එකක් වශයෙන් හෝ සමාපත්ති කිරියාවෙන්. **චෙතොපරිය ඤාණසස** යනාදිය පසුව ආවර්ජනය සඳහා යෙදිය යුතුය. මේවායේ යම් ආවර්ජනාවක් ඒ කුසල ස්කන්ධ ආරම්මණ පච්චයෙන් පච්චය වේ යයි මෙය මෙහි අර්ථයයි. රාගං තමාගේ හෝ අනුන්ගේ රාගය. මෙහි තමාගේ රාගය වශයෙන් වර්ණනාව ප්‍රකට වේ. **අසසාදෙති** යනාදියට අර්ථ කියන ලදී. විචිකිච්ඡාදි තුනෙහි ආශ්වාද කළයුතු බවක් නැති නිසා අසසාදෙති යයි නොකියන ලදී. මෙහි දිට්ඨිය වනාහි උපදී. 'අසසාදෙති' පදයේ පරිහීන බවක් නොවූ නිසා ආ පිළිවෙළින් පළමුව නොකියන ලදී. විචිකිච්ඡාදියෙහිම ඒ ඒ සභාගය පළමුව කියා ඒවාට අනතුරුව කියන ලදී. මේ රාගාදියෙහි කිම මේ පාපධර්ම උපදිනුයේ නො ඉවසීම් වශයෙන් හෝ කරන ලද පාප කරන ලද ලෝභය විපිළිසර වශයෙන් හෝ දොම්නස් ඇතිවීම දතයුතුය. ඇස අනිත්‍ය යයි විපස්සනා අනුක්‍රමයෙන් ඕලාරික ආයතන දහය ද වස්තු රූපයද එකොළොස් රූප ප්‍රකට බැවින් ගන්නා ලදී. නැවත රූපායතන චක්ඛු විඤ්ඤාණාදියේ අරමුණු බැවින් ගන්නා ලදී. විඤ්ඤාණ ධාතු වශයෙන් නොව කාය වශයෙන් දේශනා නිසා මනෝධාතු නොගන්නා ලදී. මෙසේ සියළු තැන ගන්නා ලද නොගන්නා ලද දේ දතයුතුය. **ඵලං පචචවෙකඛනති නිබබානං පචචවෙකඛනති** ප්‍රත්‍යවෙක්ෂා කුසලයේ අරමුණු දැක්වීම සඳහා කියන ලදී.

ආරම්මණ අධිපති නිද්දේසයෙහි ශෛක්‍ෂ පෘථග්ජන වශයෙන් චතුභූමක කුසලය දක්වන ලදී. එහි සහජාත අධිපති නිද්දේසයේ අර්හත් වූ උත්තම ධර්මය අධිගත බැවින් ලෞකික කුසලයෙහි ගෞරව නැතැයි අග්‍ර මාර්ගයම දක්වන ලදී.

අනන්තර පච්චයෙහි **පුරිමා පුරිමා** ඒකභූමික ද නා නා භූමික ද කුසල් එකතුකොට කියන ලදී. **අනුලොමං ගොත්‍රභුසස අනුලොමං වොදානසස** නා නා ආරම්මණ වශයෙන් **ගොත්‍රභූ මගගසස වොදානං මගගසස** නා නා භූමි වශයෙන්. **කුසලං වුටඨානසස** මෙහි වනාහි **කුසලං** ත්‍රෛභූමක කුසලය. **වුටඨානං** ත්‍රෛභූමක විපාකය. ඒවායින් කුසල ජවන වීථිවලින් නැගිටී. එහෙයින් 'වුටඨානං' යයි කියන ලදී. තදාරම්මණ භවංග වශයෙන් එය දෙයාකාරය. එහි කාමාවචර කුසලයේ දෙකද වුට්ඨාන

වේ. මහග්ගතයේ භවංගම වේ. **මග්ගා ඵලස්ස** මෙය යම් හෙයකින් ලෝකෝත්තර විපාක ජවන වීථි අවසන්කොට ඇති බැවින් වුට්ඨාන නම් නොවේ. එනිසා වෙන්ව කියන ලදී. **අනුලෝමං සෙක්ඛායති** අශෛක්ෂයාට කුසලයට අනතුරුව නොවේ. එහෙයින් විභාග කරයි. **ඵල සමාපත්තියා** සෝවාන් ඵල සකෘදාගාමිඵල අනාගාමි ඵල සමාපත්තිය ද. **ඵලසමාපත්තියා** අනාගාමි ඵලසමාපත්තිය අකුසලයෙහි වුට්ඨාන දෙකම ලැබේ. **විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා** මෙහි විපාක අබ්‍යාකත විපාක අබ්‍යාකතවලින්ම කිරිය අබ්‍යාකත කිරිය අබ්‍යාකතවලින් ම දතයුතුය. **භවංගං ආවජ්ජනාය** මුලදී මිශ්‍ර වශයෙන් කියන ලදී. එහි කිරියා කාමාවචර කිරියා. එය ද්විධ වේ. නැගිටි අනන්තර පච්චය වේ. මහග්ගත භවංගයටම මෙසේ යට පච්චය විභංග නිද්දේසයෙහි 'පුරිමා පුරිමා කුසලා ධම්මා' මුලින් වූ කුසල දහම් පසුව වූ කුසල ධර්මයන්ගේ අනන්තර පච්චයෙන් පච්චය වී යයි අරඹා 'කුසලං කුසලස්ස, කුසලං අබ්‍යාකතස්ස අකුසලං අකුසලස්ස, අකුසලං අබ්‍යාකතස්ස, අබ්‍යාකතං අබ්‍යාකතස්ස, අබ්‍යාකතං කුසලස්ස, අබ්‍යාකතං අකුසලස්ස යයි වාර සතක් දක්වන ලදී. ඒවායේ වශයෙන් මෙහි සංක්ෂෙපයෙන් අනන්තර පච්චය බෙදන ලදී. මෙහි විස්තර වශයෙන් වනාහි :-

**දස ද සතළොසයුරු - සමසැට විදි ලෙසින් යෙදූ**
**නිදෙස බුහු අයුරින් - වෙන්කොට ලකුණු කරනුයැ**

මේ අනන්තර පච්චය තනිවූ සත් අයුරින් නිද්දේස නො ලබයි. කුසලය වනාහි කුසල විපාකයේ, අකුසලය අකුසල විපාකයේ, විපාකය විපාක කිරියේ, කිරිය අකුසලයේ කුසලයේ විපාකයේ කිරියේ යයි මෙසේ දස අයුරකින් නිද්දේසය ලබයි.

නියම තනිව දස අයුරු නොවේ. කුසලය වනාහි කුසලයේ කුසල විපාකයේ අකුසල විපාකයේ, අකුසලය අකුසලයේ අකුසල විපාකයේ කුසල විපාකයේ, කුසල විපාකය කුසල විපාකයේ අකුසල විපාකයේ කිරියේ, කිරිය කිරියේ කුසලයේ අකුසලයේ කුසල විපාකයේ අකුසල විපාකයේ යයි මෙසේ සතළොස් අයුරු නිද්දේසය ලබයි.

තනිව සතළොස් අයුරු ද නොවේ. සම සැට නියමයෙන් ද ලැබේමය. කෙසේද? කාමාවචර කුසලය භූමි භේදයෙන් සතරාකාර

කුසලයට අනන්තර පච්චය වේ. රූපාවචර අරූපාවචර තම තම භූමියේ හෝ කුසලය කුසලයට සයාකාරයකින් අනන්තර පච්චය වේ.

කාමාවචර කුසලය කාමාවචර කුසල විපාකයට අකුසල විපාකයට රූපාවචර විපාකයට අරූපාවචර විපාකයට ලෝකෝත්තර විපාකයට රූපාවචර කුසලය රූපාවචර විපාකයට කාමාවචර කුසල විපාකයට, අරූපාවචර කුසලය කාමාවචර කුසල විපාකයට රූපාවචර අරූපාවචර ලෝකෝත්තර විපාකයට, ලෝකෝත්තර කුසලය ලෝකෝත්තර විපාකයටදැයි කුසල විපාකයට දොළොස් අයුරකින් අනන්තර පච්චය වේ.

අකුසලය අකුසලයට අකුසල විපාකයට තෛ‍්‍රභූමක කුසල විපාකයටදැයි පස් ආකාරයකින් අනන්තර පච්චය වේ.

කාමාවචර කුසල විපාකය කාමාවචර කුසල විපාකයට අකුසල විපාකයට රූපාවචර විපාකයට අරූපාවචර විපාකයටදැයි කාමාවචර කුසල විපාකය විපාකයට සතරාකාරයකින් අනන්තර පච්චය වේ. රූපාවචර විපාකය තෛ‍්‍රභූමක කුසල විපාකයට යයි තුන් ආකාරයකින් අනන්තර පච්චය වේ. අරූපාවචර විපාකය අරූපාවචර විපාකයට කාමාවචර කුසල විපාකයට දැයි දෙයාකාරයකින් අනන්තර පච්චය වේ. ලෝකුත්තර විපාකය චතුභූමක කුසල විපාකයට යයි සතරාකාරයකින් අනන්තර පච්චය වේ. මෙසේ කුසල විපාකය විපාකයට තෙළෙස් අයුරකින් අනන්තර පච්චය වේ.

මෙසේ අකුසල විපාකය අකුසල විපාකයට කාමාවචර කුසල විපාකයටදැයි දෙයාකාරයකින් අනන්තර පච්චය වේ. මෙසේ සියළු අයුරින් විපාකය විපාකයට පසළොස් අයුරකින් අනන්තර පච්චය වේ.

කාමාවචර කුසල විපාකය වනාහි කාමාවචර කිරියට, එසේ අකුසල විපාකය, එසේ රූපාවචර විපාකය, එසේ අරූපාවචර විපාකයදැයි විපාකය කිරියට සතරාකාරයකින් අනන්තර පච්චය වේ.

කාමාවචර කිරිය තෛ‍්‍රභූමක කිරියට, රූපාවචර අරූපාවචර කිරිය රූපාවචර අරූපාවචර කිරියට පස් ආකාරයකින් අනන්තර පච්චය වේ.

කාමාවචර කිරිය අකුසල විපාකයටද චතුභූමක කුසල විපාකයට ද රූපාවචර කිරිය කාමාවචර කුසල විපාකයට රූපාවචර විපාකවලට ද අරූපාවචර කිරිය චතුභූමක කුසල විපාකයටදැයි කිරිය විපාකයට එකොළොස් ආකාරයකින් අනන්තර පච්චය වේ.

කාමාවචර කිරිය චනාහි කාමාවචර කුසලයට අකුසලයටදැයි කුසල අකුසලවලට දෙයාකාරයකින් අනන්තර පච්චය වේ. මෙසේ සමසැට විධියෙන් ද නිද්දේස ලබයි.

හුදෙක් සැමසැට විධියෙන් ම නොව බොහෝ ආකාරයෙන් ද ලබාමය. කෙසේද? කාමාවචර පළමුවන කුසල සිත තමාගේ ද සතර රූපාවචර කුසලයන්ගේ පාදක යෝගයෙන් සොළොස් ලෝකෝත්තර ද එක්විසි කුසල්වල ජවන අවසානයෙහි තදාරම්මණ භවංග වශයෙන් උපදින එකොළොස් කාමාවචර විපාකයන්ගේ පල සමාපත්ති වශයෙන් පවතින රූපාවචර අරූපාවචර විපාකවල ඵලසමාපත්ති වශයෙන් පවතින දොළොස් ලෝකෝත්තර විපාකදැයි මෙසේ එක්විසි කුසලයන්ගේ දෙතිස් විපාකයන්ගේදැයි තෙපනස් සිත්වලට අනන්තර පච්චය වේ. දෙවන කුසල් සිතද එසේය. තුන්වන සතරවන හැර උපරි භූමක කුසල් ද ලෝකෝත්තර විපාක ද සෙසු එක්විසි සිත්වල පස්වන හවන තමාගේ ද නවය ද උපරිභූමි උපේක්ඛා කුසල්වල තෙවිසි විපාකවල තිස්තුන ද සත්වන අටවන එක් විස්සද රූපාවචර කුසල පහ තම තමාගේ පැසුළු රූපාවචර කුසලයන්ගේ ඤාණ සම්පයුත්ත මහා විපාක සතරද රූපාවචර විපාක පහදැයි දහය මේ නයින්ම අරූපාවචර කුසල්වල පළමුවන තමාගේ විපාකය සමග එකොළොසද, දෙවන දොළොසද, තෙවන තෙළෙසද, සතරවන තුදුසේද පල සමාපත්තියැදයි පසළොස් ලෝකෝත්තර කුසලය තම තමාගේ විපාකවල ලෝභසහගත අටෙහි එක් එක් අකුසල එකොළොස, කාමාවචර විපාක මනෝවිඤ්ඤාණ ධාතුන්ගේ නවය, මහග්ගත විපාකවල තම තමාගේ අවසානයේ එක්විස්සද, දොම්නස් සහගත දෙක, උපෙකඛා සහගත හය, කාමාවචර විපාක මනෝවිඤ්ඤාණ ධාතුවල තමාගේ අවසානයේ සත ද, විචිකිච්ඡා උද්ධච්ච සහගත දෙක ද, සොම්නස් සහගත හේතු විපාකය සමග එකොළොස ද, කාමාවචර විපාක මනෝවිඤ්ඤාණ ධාතුන්ගේ නවය, රූපාවචර අරූපාවචර විපාකවල තමාගේ අවසානයේදැයි එක්විස්ස, කුසලවිපාක පංච විඤ්ඤාණ කුසල විපාක මනෝධාතුව, මනෝධාතු දෙක, විපාක මනෝවිඤ්ඤාණ ධාතුන්ගේ,

ඒවායේ සොම්නස් සහගත දෙකේ දහය, විපාක මනෝවිඤ්ඤාණ ධාතුන්ගේ භවංග වූ තදාරම්මණ කාලයෙහි තමාගේ අවසානයේ තීරණ කිරියදැයි දොළොස, උපෙක්ඛා සහගත අහේතුක මනෝවිඤ්ඤාණ ධාතු වනාහි ආවර්ජන මනෝධාතුවෙන් දෙකොටසේ ආවර්ජන මනෝ විඤ්ඤාණ ධාතුවෙන් දහය ද, විපාක මනොවිඤ්ඤාණ ධාතුන්ගේ දොළොසම වේ. ත්‍රිහේතුක මහා විපාක සොම්නස් සහගත අහේතුක හැර දහයද කාමාවචර විපාක මනෝවිඤ්ඤාණ ධාතුන්ගේ රූපාවචර අරූපාවචර විපාකයන්ගේ ආවර්ජන දෙකදැයි එක්විස්සද, ද්විහේතුක විපාක හැර මහග්ගත විපාකයෙහි සෙසු දොළොසද, රූපාවචර විපාක පහ, ත්‍රෛභූමක කුසල විපාක සහෝතුක පටිසන්ධි සිත්වල සතළොස, ආවර්ජන දෙකදැයි එකුන්විස්ස, අරූපාවචර විපාකවල පළමුවන කාමාවචර කුසල විපාක ත්‍රිහේතුක පටිසන්ධි සිත්වල සතර අරූපාවචර විපාක සිත්වල සතර මනෝද්වාරාවජ්ජනය දහය නවය, දෙවන යටම විපාකය හැර අට, තෙවන යට දෙක හැර සත, සතරවන යටම තුන හැර සය, ලෝකෝත්තර විපාක සතර ත්‍රිහේතුක විපාකවල තෙළෙස, තම තමාගේ අවසානයේ සය තුදුස, අකුසල විපාක පංච විඤ්ඤාණ අකුසල විපාක මනෝධාතුව, මනෝධාතුව, අකුසල විපාක හේතු මනෝවිඤ්ඤාණ ධාතුව, එය තදාරම්මණ කාලයෙහි තමාගේ අවසානයේ චුතිකාල ප්‍රතිසන්ධි වශයෙන් භවංග වශයෙන් ද පවත්වන කාමාවචර විපාකයන්ගේ නවය, උපෙක්ඛා සහගත පරිත්තකිරිය දෙකදැයි දොළොස, කිරිය මනෝධාතු විඤ්ඤාණවල දහය, හසිතුපපාද කිරිය, පංචවෝකාරයෙහි භවංග වශයෙන් පවතින ත්‍රිහේතුක විපාකවල නවය, තදාරම්මණ වශයෙන් පවතින සොම්නස් සහගත විපාකවල පහ, තමාගේ අවසානයේ දැයි අගහිත ග්‍රහණයෙන් තෙළෙස, වොත්ථපන කිරිය හැර කිරිය මනෝධාතු දහය, කාමාවචර කිරියවල, කාමාවචර කුසල් අකුසල්වල, පංචවෝකාරයෙහි භවංග වශයෙන් පවතින පසළොස් විපාක සිත්දැයි පන්සාළිස, කාමාවචර ත්‍රිහේතුක, සොම්නස් සහගත කිරිය දෙක, භවංග වශයෙන් පවතින තෙළෙස් ත්‍රිහේතුක විපාකවල තදාරම්මණ වශයෙන් පහ, සොම්නස් සහගත විපාකවල පරිකර්ම වශයෙන් පවත්වන සතර රූපාවචර කිරියවල අර්හත්ඵල සමාපත්තියෙන් තමාගේ අවසානයේ යැයි අගහිත ග්‍රහණයෙන් පස්විස්ස, ද්විහේතුක සොම්නස් සහගත කිරිය දෙක, කියන ලද තෙළෙස් භවංග සිත්වල, තදාරම්මණ පහේ තමාගේ අවසානයදැයි අගහිත ගහණයෙන් සතළොස, කාමාවචර ත්‍රිහේතුක උපේක්ෂා සහගත කිරිය දෙක, ඒවායේම තෙළෙස් භවංගවල තදාරම්මණ වශයෙන් පවතින සය,

උපේක්ෂා සහගත විපාකවල පරිකර්ම වශයෙන් පවතින එක් රූපාවචර කිරියෙන් අරූපාවචර කිරියවල සතර, අර්හත්ඵල සමාපත්තියෙන් තමාගේ අවසානයේදැයි අගහිත ගහණයෙන් සූවිස්ස, ද්විහේතුක උපේක්ෂා සහගත කිරිය දෙක ඒවාගේම තෙළෙස් භවංගවල සය, තදාරම්මණවල තමාගේ අවසානයේදැයි අගහිත ගහණයෙන් අටළොස, රූපාවචර කිරියවල එක එකේ නවය, පංචවෝකාරයෙහි ත්‍රිහේතුක භවංගවල තමාගේ අවසානයේදැයි දහය, අරූපාවචර කිරියවල පළමුවන පංචවෝකාරයෙහි නවය භවංගවල චතුවෝකාරයෙහි භවංග දෙකක් ලබයි. තුන්වැන්නෙහි තුනක්, සතරවැන්නෙහි සතර පලසමාපත්ති. ඒවායෙහි එක එකෙහි පිළිවෙළින් එකොළොසක් දොළොසක්, තෙළෙසක්, පසළොසක් ද අනන්තර පච්චය වේ. මෙසේ බොහෝ විධියෙන් ද නිද්දේස ලබයි. එයින් කියන ලදී.

**දසද සතළොසයුරු - සමසැට විදි ලෙසින් යෙදූ**
**නිදෙස බුහු අයුරින් - වෙන්කොට ලකුණු කරනුයැ**

සමනන්තර පච්චය ආදිය පැහැදිලි තේරුම් ඇත්තේය. උපනිස්සයෙහි සද්ධං **උපනිසසාය** කර්ම කර්මපල මෙලොව පරලොව ආදියෙහි ශ්‍රද්ධාව උපනිශ්‍රය කොට. යම්සේ පුරුෂයෙක් පොළොව යට ජලය ඇතැයි විශ්වාසකොට පොළොව කනියි. මෙසේ ශ්‍රද්ධාවත් කුලපුත්‍රයා දානාදි පල ද ආනිසංස ද විශ්වාසකොට දානාදිය පවත්වයි. එහි ශ්‍රද්ධාව උපනිශ්‍රය වේයයි කියන ලදී. **සීලං උපනිසසාය** ආදියෙහි ද මේ සීලාදි ෂධර්මයන් උපනිශ්‍රය කොට යන අර්ථයයි. සිල්වතා වනාහි සීලානුභාවයෙහි සීලානිසංසයේද දක්ෂ වූයේ සීලය උපනිශ්‍රය කොට සිල්වතුන්ට දන් දෙයි. මතු මත්තෙහි සීලය සමාදන් වෙයි. පිරිසිදුව අඛණ්ඩව රකියි. තුදුස්වක් ආදි පක්‍ෂ දවස්වල පෙහෙවස් රකියි. සීල සම්පත්තිය නිසා ධ්‍යානාදිය උපදවයි. බහුශ්‍රැතයා ද දානාදි පුණ්‍යක්‍රියාදියෙන් දානාදි සියළු සම්පත් ද සංකිලෙස චෝදනාද (කිලිටි පිරිසිදු)ය. සුතමය ප්‍රඥාවෙන් දැන සිටියේ සුත උපනිශ්‍රයකොට දානාදිය පවත්වයි. ත්‍යාගවන්තයා ද චාගාදියෙන් යුත් තමාගේ ත්‍යාග සම්පත්තිය උපනිශ්‍රයකොට දන් දෙයි. සිල්වත් වී දෙන ලද්ද මහත්ඵල වේ. සිල් සමාදන් වේ. පෙහෙවස් රකී. ඒ ප්‍රතිපත්තියෙන් පිරිසිදු වූ සිත ධ්‍යානාදිය උපදවයි. ප්‍රඥාවන්තයා ද මෙලොව පරලොව දියුණුව පිණිස ද ලෝක සමතික්‍රමණ උපායද පරීක්‍ෂා කිරීමට දක්ෂ වේ. තමාගේ මේ ප්‍රතිපත්තියෙන් මෙලොව යහපත ද

පරලොව දියුණුවද ලෝක සමතික්‍රමණ උපායද සම්පාදනය කිරීමට ප්‍රඥාව උපනිශ්‍රයකොට දානාදිය පවත්වයි. ශ්‍රද්ධාදිය දානාදියට පමණක් උපනිශ්‍රය කොට දානාදිය පවත්වයි. ශ්‍රද්ධාදිය දානාදියට පමණක් උපනිශ්‍රය නොවේ. අපර භාගයෙහි තමාගේ උපදින ශ්‍රද්ධාදියට ද උපනිශ්‍රය වේ. එහෙයින් **සද්ධා සීලං සුතං චාගො පඤ්ඤා සද්ධාය සීලස්ස සුතස්ස චාගස්ස පඤ්ඤාය** යයි කියන ලදී. **පරිකම්මං** යනු අනන්තරය නොගෙන පූර්ව භාගයෙහි පරිකර්මය ගතයුතුය. යථා කම්මූපග ඤාණයට අනාගතංස ඤාණයටදැයි මේ දෙකට දිබ්බ චක්ඛු පරිකර්මය වේ. පරිකර්ම වෙන්ව නැත. දිවැසම පරිභණ්ඩ ඤාණ වේ. එහි සමාධිය සිදුවේ. මෙසේ ඇතිකල්හි තද්ධිමුත්තතාව සහිත දිබ්බචක්ඛු පරිකර්මය ඒවාට පරිකර්මය යයි දතයුතුය. ඒවා සියල්ලට දිවැසේ සමාන ගතියක් නැත. එහෙයින් මෙහි පරිකර්ම වශයෙන් විය යුතුය. දිබ්බචක්ඛු දිබ්බායසොත ධාතුයා දුර රූප දැක ඒවායේ ශබ්ද ඇසීමට කැමතිව දිවැස දිවකන පිරිසිදුවීම පිණිස උපනිශ්‍රය වේ. ඒවායේ ශබ්දය අසා යෑමට කැමති බව ආදි වශයෙන් දිබ්බසොත ධාතු ඉද්ධිවිධ ඤාණයට උපනිශ්‍රය වේ. මෙසේ සියළු තැන උපකාරක භාව වශයෙන් උපනිශ්‍රය පච්චය බව දතයුතුය. **මග්ගං උපනිස්සාය අනුප්පන්නං සමාපත්තිං** ඒ ඒ මගින් ලිහිල්කරන ලද උවදුරු ඇති බව ප්‍රහීන කරන ලද උවදුරු ද ඒ ඒ සමාපත්ති උපදවයි යන ඒවායේ මාර්ගය සමාපත්තියෙන් උපනිශ්‍රය වේ. **විපස්සනං** ඉහළ ඉහළ මාර්ග සඳහා විදර්ශනා වඩයි. **අත්‍ථ පටිසම්භිදාය** ආදි පටිසම්භිදානවල මාර්ග ප්‍රතිලාභයෙන් සමෘද්ධ වන්නේ යයි කියන ලදී. පසුව ඒ ඒ අරමුණුවල පවතින මාර්ගයම උපනිශ්‍රය නම් වේ. **සද්ධං උපනිස්සාය මානං ජප්පෙති** මම වෙමියි ශ්‍රද්ධාවෙන් ප්‍රසන්නව මානය පවත්වයි. **දිට්ඨිං ගණ්හාති** ඒ ඒ වචනයෙහි ශ්‍රද්ධාව වශයෙන් ගොස් ප්‍රඥාවෙන් අර්ථය පරීක්‍ෂා කරන්නේ පුද්ගලයෙක් ඇත ආදි වශයෙන් දෘෂ්ටිය ගනී. **සීලං සුතං චාගං පඤ්ඤං** මම සිල්වත් වෙමි. සුතවත් වෙමි. ත්‍යාගවන්ත වෙමි. ප්‍රඥා සම්පන්න වෙමියි මානය ජපකරයි. සීල සුත චාග පඤ්ඤාවල වනාහි මාන හැඟීම මෙන් දෘෂ්ටි හැඟීම උපදවන්නේ දෘෂ්ඨිය ගනී. **රාගස්ස** ආදියෙහි ශ්‍රද්ධාදි සම්පත් උපනිශ්‍රය කොට තමා උසස්කොට සලකන කාලයෙහි ඒවායෙහි එක එක ධර්ම රාගයේ, අනුන් පහත් කරන කාලයෙහි ද්වේෂය ද, දෙකින් යුක්ත වූ විට මෝහයේ, කියන ලද ආකාර මාන දිට්ඨිවල සද්ධා සද්ධ සම්පදාය උපනිශ්‍රය කොට භවභෝග සම්පත් ප්‍රාර්ථනාවෙන් උපනිශ්‍රය වේ. මෙසේ මෙහි ලෞකික කුසලයම දක්වන ලදී. ලෝකෝත්තරය වනාහි සාන්ත ප්‍රණීත උතුම් අකුසලය විනාශ කිරීම වේ. එහෙයින් අඳුරට

චන්ද්‍රයා සේ අකුසලයට උපනිශ්‍රය වේයයි නොගත්තා ලදී. ආතාපෙති ආදි කායික දුක් වශයෙන් අබ්‍යාකත ධර්ම දැකීම සඳහා කියන ලදී. ශ්‍රද්ධාව ශ්‍රද්ධාව නිසා අති ශීත යයි අති උෂ්ණ යයි පසුනොබැස නා නා ප්‍රකාර නවකර්ම වතාවත් ආදිය කරන්නේ තමා තනයි. මොනවට තවයි. භෝග උපදවා පින් කරන්නෙමියි පර්යේෂණ මූලක දුක අනුභව කරයි. සිල්වතා ද සීලානු රක්‍ෂණය සඳහා අබෙහාකාසික ආදි වශයෙන් තමා තවයි. තදින් තවයි. පිඬුසිඟා යාම් වශයෙන් සෙවීම් මූලක දුක අනුභව කරයි. සුතයා ද බාහුසච්ච අනුරූප ප්‍රතිපත්ති පිළිපදින්නෙමියි කියන ලද නයින්ම පිළිපදින්නේ තමා තවයි. සෙවීම් මූලක දුක විඳියි. ත්‍යාගවන්තයා ද චාගාධිමුත්තතා සඳහා තමා යැපෙන පමණක් ප්‍රත්‍යයන් ඉතිරි නොකොට පරිත්‍යාග කරන්නේ ශරීරාංගාදිය පරිත්‍යාග කරන්නේ තමා තවයි. පරිත්‍යාග කළයුතු වස්තුව ඉපදවීම සඳහා සෙවීම් මූලක දුක විඳියි. ප්‍රඥාවන්තයා ද මතුමත්තෙහි ප්‍රඥාව වඩන්නෙමියි සප්‍රාඥභාවය නිසා සීත උෂ්ණාදිය ගණන් නොගෙන සජ්ඣායනාදි යෝග කරන්නේ තමා තවයි. මිථ්‍යා ජීවයෙහි ආදීනව ද සම්‍යක් ජීවයෙහි ආනිසංස ද දැක මිච්ඡාජීවය හැර පිරිසිදු ආජීවයෙන් ජීවිත වෘත්තය සොයන්නේ සෙවීම් මූලක දුක විඳියි.

**කායිකසස සුඛසස** සද්ධා සම්පත්ති උපනිශ්‍රයෙන් උපන් සැප උපකරණ පරිහරණය කරන කාලයෙහි ශ්‍රද්ධාදියෙන් උපන් ප්‍රණීත රූප ස්පර්ශ ශරීරයට ද ඒවායේ වශයෙන් අවිප්පටිසාර මූලක පාමොජ්ජ පීතියෙන් උපන් රූප ස්පර්ශ ශරීරයට ද සැප ඇති කාලයෙහි ඒවායේ කටත්තා විපාක ඇති සැප කාලයෙහි ශරීර සුවයට, කියන ලද නයින්ම දුක් ඇති කාලයෙහි ශ්‍රද්ධාදි ගුණ සම්පත්තිය නොඉවසමින් ප්‍රයුක්ත වධබන්ධනාදි කාලයෙහි ද කායික දුකට, ශ්‍රද්ධාදිය උපනිශ්‍රයෙන් පවතින ඵලසමාපත්ති කාලයෙහි ඵලසමාපත්තියට ද මේවායෙහි එක එකක් උපනිශ්‍රය පච්චයෙන් පච්චය වේ යයි දතයුතුය. **කුසලං කමමං** කුසල චේතනා තමාගේ විපාකයට උපනිශ්‍රය පච්චයෙන් පච්චය වේ. එය වනාහි බලවත් චේතනාව ලබයි. දුබල නොවේ. ඊට මේ වස්තුවයි. එක් ස්ත්‍රියක් වනාහි ගෙල වැලලාගනු කැමත්තේ ගසක රැහැනක් බැඳ සංවිධාන කටයුතු කරයි. ඉක්බිති එක් සොරෙක් රාත්‍රියේ ඒ ගෙට එළඹ මේ රැහැනින් කිසිවක් බැඳ ගෙනියන්නෙමියි ආයුධයෙන් කැපීමට ලඟට ගියේය. ඉක්බිති ඒ රැහැන සර්පයෙක් වී සුසු ගෑවේය. සොරා බියේ ඉවත්විය. ස්ත්‍රිය තමාගේ නිවසින් නික්ම රැහැන්මලෙහි ගෙලබැඳ එල්ලී

කළුරිය කළාය. මෙසේ බලවත් චේතනාව අනතුරු වලක්වා තමාගේ විපාකයට උපනිශ්‍රය වේ. මෙය ඒකාන්තයෙන් නොගත යුතුය. කරන ලද අවකාස ඇති කර්මයම විපාකයට අනතුරු වලක්වා විපාක දෙයි. විපාක උපදවන කර්මය වනාහි විපාකයට උපනිශ්‍රය ප්‍රත්‍ය නොවේ යයි නොකිව යුතුය. **කම්මං** මෙහි චතු භූමකයද දතයුතුය. යමක් වනාහි පරව 'මාර්ගය ඵලසමාපත්තිය'යි කියන ලදී. එය අචේතන වශයෙනි. එහෙයින් මෙය දක්වයි. යම්කිසි විපාක උපදවන ධර්මයක්, එය තමාගේ විපාකයට උපනිශ්‍රය වේ. **රාගං උපනිස්සාය පාණංහනති** යම් වස්තුවක් කෙරෙහි ඇලුනේ වේද, එහි විරුද්ධ වූයේ හෝ ඒ අර්ථය සඳහා ප්‍රාණය නසයි. අදින්නා දානාදියෙහි ද මෙම උපායෙන් අර්ථය දතයුතුය. **සන්ධිං ඡින්දති** අදින්නාදාන වශයෙන් කියන ලදී. එහි **සන්ධි** යනු ගෘහ සන්ධි වේ. **නිල්ලොපං හරති** සැඟවී ගෙන යයි. **එකාගාරිකං කරොති** බොහෝ දෙනෙක් සමග එකම ගෙයක් වටකොට මංකොල්ල කයි. **පරිපන්ථෙ තිට්ඨති** මං පහරයි. **දොසං උපනිස්සාය** ආදියෙහි අනර්ථයෙහි මා හැසිරුණේ යයි ආදි වශයෙන් උපන් දෝසය උපනිශ්‍රය කොට, **මොහං උපනිස්සාය** පාණාතිපාතාදියෙහි ආදීනව වසන මෝහය උපනිශ්‍රය කොට, **මානං උපනිස්සාය** කිම මම නැසීමට නොහැකි වෙමි. ගැනීමට නොහැකි වෙමියි මානය උපනිශ්‍රය කොට, කිසියම් අවඥාවකින් යුක්ත වූයේ පිළිකුලෙන් එය පහත් මානය උපනිශ්‍රය කොට යන අර්ථයයි. **දිට්ඨිං උපනිස්සාය** යාගාදියෙහි බ්‍රාහ්මණයින් මෙන් පාරසික මිලක්ඛාදීහු මෙන් ද දෘෂ්ඨිය උපනිශ්‍රය කොට, **පත්ථනං උපනිස්සාය** ඉදින් මා මේ දෙය බලාපොරොත්තු වන්නේය. මෙබඳු වූ බලිකර්මයක් කරන්නෙමියි මෙසේ දේවතා ආයචන සංඛ්‍යාත වූ හෝ අසවලා ඝාතනය කරවයි හෝ අසවලාගේ සන්තකය ගෙනෙවයි හෝ එව මේ කටයුතුවලට මට සහාය වන්න යයි මේ ආදී බලාපොරොත්තු උපනිශ්‍රය කොට, **රාගො දොසො මොහො මානො දිට්ඨි පත්ථනා රාගස්ස** මෙහි රාගය රාගයට ද උපනිශ්‍රය වේ. දෝසාදියට ද දෝසාදියෙහි ද මෙම නයයි. **පාණාතිපාතො පාණාතිපාතස්ස** පාණාතිපාතය අසංවරයෙහි සිටි බැවින් අන්‍ය ප්‍රාණ ද නසයි. යමෙක් හෝ මෙයින් නසන ලද්දේය. ඔහුගේ ඥාති මිත්‍රයින් උපද්‍රවයට පැමිණියේ ඔව්හු අන්‍යයන් ද නසිති. මෙසේ පාණාතිපාතය පාණාතිපාතයට උපනිශ්‍රය පච්චයෙන් පච්චය වේ. ස්වාමියා හෝ ආරක්ෂකයා හෝ ඝාතනය කොට අනුන්ගේ භාණ්ඩ ගැනීමේ, ඝාතනය කොට ඔහුගේ අඩුවක් ඉක්මවීමේ මම නොනැසුවෙමියි බොරු කීමෙහි, කළ තැනැත්තා සැඟවීමේ නොකළ තැනැත්තා පිට වරද පැටවීමේ, කේලාම් කීමේ, ඒ නයින්ම ඵරුෂ වචන කීමේ, හිස්වචන

දෙඩීමේ, අනුන් නසා අනුන් සන්තක වස්තුව ගැනීමේ, යමෙක් එයින් ඝාතනය කරනු ලබන්නේ වේ. ඔහුගේ මිතුරෝ විනාශ කෙරේවා යනාදි සිතුවිලිවල මෙසේ මට ප්‍රාණඝාතය නිජ්ජිණණ (නිදහස) වන්නේ යයි දුෂ්කරක්‍රියා වශයෙන් දෘෂ්ටි ගැනීම් කාලයේ ද ප්‍රාණඝාතය අදත්තාදානයට උපනිශ්‍රය වේ. මේ උපායෙන් අදින්නාදානාදි මූලක චක්‍රවල අර්ථය දතයුතුය. **මාතුඝාතිකම්මං මාතුඝාතිකම්මස්ස** අන්‍යයෙකුගේ මවක් නසනු දැක මෙය කිරීමට වටී යයි තමාගේ මව මරන්නහුට හෝ එක් භවයක නසා පසුව නැසීම් වශයෙන් හෝ එක් භවයෙක්හිම යව මගේ මව නසවයි නැවත නැවත අණ කිරීම් වසයෙන් හෝ දෙවරකින් නියත මරණය පිණිස දෙවන පහරදීම් වශයෙන් හෝ මාතුඝාත කර්මය මාතුඝාත කර්මයට උපනිස්සය වේ. සෙස්ස ද සුදුසු පරිදි මේ නයින්ම දතයුතුය. යම්හෙයකින් බලවත් කුසලය දුබල කුසලයට උපනිශ්‍රය නොවේ. එහෙයින් කර්මපථ ආනන්තරිය කර්ම වශයෙන්ද දේශනාව කරන ලදැයි කියති. එය ඒකාන්ත වශයෙන් නොගත යුතුය. ප්‍රාණඝාතාදිය කොට කුමක් හෙයින් මෙසේ කෙළේදැයි චෝදනා කරනු ලබන්නේ කෝපය පමණක් කරයි. විපිළිසරද වේ. ස්වල්ප වූ කෙලෙස්ද උපන්කල්හි එය වඩා ව්‍යතික්‍රමණය කරයි. එහෙයින් බලවත් දේ දුබල දේට දුබල දේ බලවත් දේටද උපනිශ්‍රය වේ. පච්චය විභංගයෙහි උද්දේස වර්ණනාවේ යමක් කියන ලදී. බලවත් කාරණ අර්ථයෙන් උපනිශ්‍රය වේ' යයි ඒ කාරණය ස්වභාවයෙන් බලවත් බැවින් කියන ලදී. උපනිශ්‍රය පච්චය ධර්මයන්ගේ නොවේ. කර්ම ක්ලේශ වනාහි බලවත් වුවද දුබල වුවද බලවත් කාරණ වේමය. **රාගං උපනිස්සාය දානං දෙති** යනාදියෙහි අහෝ චාතුම්මහා රාජිකයෙහි උපදින්නෙම් යයි උත්පත්ති භවයෙහි හෝ සම්පත්වල හෝ රාගය උපනිශ්‍රය වී දන්දෙයි. සීල සමාදාන පෙහෙවස් කර්මයෙහි ද මෙම නයම වේ. ධ්‍යානය වනාහි රාගය විෂ්කම්භනය සඳහා විදර්ශනාව රාග ප්‍රහානය පිණිස මාර්ගය සමුච්ඡේදය පිණිස උපදවන්නේ රාගය උපනිශ්‍රය කොට උපදී නම් වේ. වීතරාග භාවය සඳහා වනාහි අභිඤ්ඤාව සමාපත්ති ද උපදවමින් රාගය උපනිශ්‍රය උපදවන්නේ නම් වේ. මෙපමණකින් වීතරාග නම් වේ. **සද්ධාය** දානාදී වශයෙන් පවතින ශ්‍රද්ධාවය. සීලාදියෙහි ද මෙම නයම වේ. දානාදි වශයෙන් යම්සේද ශ්‍රද්ධාදිය උපදවමින් රාගය උපනිශ්‍රයකොට උපදියි නම් වේ. මෙසේ රාගාදියද ශ්‍රද්ධාදියට උපනිශ්‍රය පච්චය වේයයි දතයුතුය. **තස්ස පටිඝාතත්ථාය** එහි වැළැක්වීම සඳහා විපාක අවකාශයේ අනුත්පාදනය සඳහා යන අර්ථයයි. පටිඝාත සහිතව තැන්වල මෙසේ වේ. යම් අපපටිඝාත වූ ආනන්තරිය

කර්ම, ඒවායෙහි ඔහුගේ පටිඝාතය පිණිස යයි කුමක් නිසා කියන ලදද? ඔහුගේ අදහස වශයෙන් එය වැලැක්වීම සඳහා පවත්වමි යනු ඔහුගේ අදහසයි. එය ගෙන මෙසේ කියන ලදී. **රාගං උපනිස්සාය අත්තානං ආතාපෙති** යම්තැන ඇලුනේද එහි දුෂ්කරව පැමිණීමට බලන්නේ මෙසේ කෙරේයයි සියල්ල පෙර නයින්ම දතයුතුය. **කායිකස්ස සුඛස්ස** රාගාදිය සමතික්‍රමණ වශයෙන් කුසල් කොට ලැබූ සැපය හෝ රාගාදි වශයෙන් ආදීනව නොදකින්නා කාමයෙහි පරිභුඤ්ජන වශයෙන් උපන් සැප හෝ. **දුක්ඛස්ස** තැවීම් වශයෙන් උපන් දුක හෝ රාගාදි හේතුවෙන් පවත්වන වධබන්ධන ආදි වශයෙන් උපන් දුක හෝ **ඵල සමාපත්තියා** රාගාදිය සමුච්ඡේදනය කොට හෝ උපන් එයින් හෝ පිළිකුල් කරමින් පැමිණියා වූ (සිතේ සහනයට). **කායිකං සුඛං** ආදියෙහි සැප උපන් කල්හි එය ආශ්වාදනය කොට නැවත නැවත එබඳු ප්‍රත්‍යවලින් එය උපදවන්නාට පෙර වූ දෙය පසුව වූ දෙයට උපනිශ්‍රය වේ. සීතාදියෙහි වනාහි ගිනිතැපීම් ආදිය අතිශයින් සේවනය කරන්නාට පූර්වභාගයෙහි සැපය අපරභාගයෙහි දුකක් 'මේ තරුණ පරිබ්බාජිකාවගේ ලොමින් ගැවසුණු අත ස්පර්ශය සැපයකි' කාමයන්හි ආශ්වාදයට පැමිණියන්ට. මෙහි කායික සැපය නිරයවාසීන්ට කායික දුකකි. අරෝග බවින් සැපවත් වූ ඵලසමාපත්තියට සමවැදුණු තැනැත්තාට කායික සැපයට ඵලසමාපත්තිය උපනිශ්‍රය පච්චය වේ. දුක් වැලැක්වීම සඳහා සැප සෙවුනාට දුක් වැලැක්වීමද භාග්‍යවතුන් වහන්සේගේ මෙන් ආබාධය යටපත්කොට ඵලසමාපත්තියට සමවැදෙන්නාට කායික දුක කායික සැපයට ද ඵලසමාපත්තියට ද උපනිශ්‍රය පච්චය වේ. උතු (ඍතු) සප්පාය ඵල සමාපත්තියට ද සුවයකි. අසප්පාය දුකකි. උතු අසප්පාය හෝ අභිභවනය කොට සමාපත්තියෙන් උපන් රූප වශයෙන් උපන් සැප අනුභව කරනු කැමැත්තාට අසප්පාය ද ඍතු ඵල සම්පත්තිය පච්චය වේ. භෝජන සේනාසනවල ද මෙම නය වේ. නැවත **කායික සුඛං** ආදිය තනිව එකට දක්වන ලදී. යට කියන ලද නයින්ම මේ පච්චයභාවය දතයුතුය. **ඵල සමාපත්ති කායිකස්ස සුඛස්ස** ඵල සමාපත්තියෙන් නැගිට අනුභව කරයි. **කායිකං සුඛං උපනිස්සාය** දානං ආදියෙහි මේ සැපය නොපිරිහෙන්නේ යයි පැමිණි තැනැත්තාට හෝ නොපැමිණි අයට පැමිණීම් වශයෙන් අනාගතයෙහි මෙබඳු සැපයට පැමිණෙන්නේ යයි, දුක්ඛයෙහි ද අහෝ මේ දුක පිරිහෙන්නේ ය. පරිහායන වශයෙන් හෝ අනාගතයෙහි මෙබඳු දුකක් නොපැමිණේවායි නොඉපදීම් ප්‍රාර්ථනා වශයෙන් හෝ සැපදුක්වල උපනිස්සයභාවය දතයුතුය. උතු භෝජන සේනාසන කියන ලද නයින්ම වේ. නැවත **කායිකං සුඛං** ආදියෙහි

යම්සේ සාධු යහපත්ය. පින්වත් මුගලන් හිමියනි, 'ඒ බුදුන් සරණාගමන වේ.' සැපයට පැමිණියද සම්මා සම්බුදුහිමි එබඳු දුක දැන දහම් දෙසයි. දුකට පැමිණියහුටද සද්ධාව උපදී. සැප දුක්හි සංයෝග වියෝගයට සීලාදිය සම්පූර්ණ කරන්නේය. එහෙයින් සැපදුක් සද්ධාදීන්ගේ උපනිස්සය භාවයෙන් දක්වන ලදී. ඍතු ආදිය සුදුසු පරිදි යෙදිය යුතුය. කායික සැපය උපනිශ්‍රය වී ප්‍රාණ නසති. ආදියෙහිද කියන ලද නය අනුසාරයෙන්ම සැප ආදියේ උපනිස්සය බව දතයුතුය.

මේ උපනිස්සය බෙදීමෙහි කුසලය කුසලයට තුන් ආකාරයකින් උපනිශ්‍රය වේ. අකුසලයට දෙයාකාරයකින් අව්‍යාකෘතයට තුන් ආකාරයකින් අකුසලය ද අකුසලයට තුන් ආකාරයකින් කුසලයට එක් ආකාරයකින්. අබ්‍යාකතයට දෙයාකාරයකින්. අබ්‍යාකතයද අබ්‍යාකතයට තුන් ආකාරයකින්. එසේ කුසලයට. එසේ අකුසලයට. මෙසේ කුසලය අට අයුරකින්, අකුසලය සය අයුරකින් අබ්‍යාකතය නව අයුරකින්දැයි තෙවිසි ආකාරයකින් උපනිස්සය බෙදන ලදැයි දතයුතුය.

පුරේජාතයෙහි චක්ඛාදිය ඕළාරික වශයෙන් කියන ලදී. ආපෝ ධාතු ආදිය පුරේජාත ආරම්මණ වේ. **වත්‍ථු** පුරෙජාතං චකඛායතනං යනාදිය යම් වස්තුවකට පුරේජාත වේ. එය දැක්වීමට කියන ලදී. **වත්‍ථු විපාකාබ්‍යාකතං** පවතින පුරේජාත පච්චය සඳහා කියන ලදී.

පචඡාජාතයෙහි **ඉමසස කායසස** චතුභූමක කයේ. පචඡාජාත **පචචයෙන පචචයො** උපත්‍ථමහන වශයෙන් පචඡාජාතය වී පච්චය වේ. උපස්ථම්භක අර්ථයෙන් පච්චයභාවයම මේ පච්ඡාජාත පච්චය යයි මේ ප්‍රශ්න වාරයෙහි අනුලෝම වශයෙන් ආවේය.

ආසේවන පච්චයෙහි **අනුලොමං ගොත්‍රභුසස** යනාදිය වෙන්ව ගැනීමෙහි යට කියන ලද නයින්ම කරුණු දතයුතුය.

කම්ම පච්චයෙහි **කුසල චෙතනා සමපයුතතකානං** මෙහි සහජාත නානා **ක්‍ෂණික** විභාගයේ අභාවයෙන් සහජාත යයි නො කියන ලදී. අබ්‍යාකත විසඳීමෙන් වනාහි ඒ විභාගය ඇත. එහෙයින් එහි කියන ලදී. ප්‍රතිසන්ධි ග්‍රහණය කටත්තා රූප වශයෙන් කරන ලදී. **චෙතනා වත්‍ථුසස** ප්‍රතිසන්ධි ක්‍ෂණයෙහි කිසියම් වස්තුවක් ද පිහිටියේය. අරූප ධර්ම වත්‍ථු

පච්චයෙන් පවතී. චේතනා වනාහි වස්තුවට ද පච්චය වේ යයි දැක්වීමට කියන ලදී.

විපාක පච්චයෙහි ද මේ නයින්ම පටිසන්ධි වාරයෙහි අර්ථය දතයුතුය.

ආහාර පච්චයෙහි **ඉමසස කායසස** මේ චතුසනතති වශයෙන් පවතින චතුමහාභූත කයෙහි ආහාරයෙන් උපන් ජනක වශයෙන් සෙස්සට උපත්ථම්භක වශයෙන් ආහාර පච්චයෙන් පච්චය වේ.

ඉන්ද්‍රිය පච්චයාදියෙහි ද ප්‍රතිසන්ධි වාරය කියන ලද නයින් දතයුතුය.

**පඤ්හවාර විභංග වර්ණනාව නිමි.**

දැන් මෙහි ලැබූ විසඳුම් ගණන වශයෙන් දැක්වීමට **හෙතුයා සතත** යනාදිය කියන ලදී. එහි **සතත** යනු කුසලයෙන් කුසලය, අබ්‍යාකතය, කුසල අබ්‍යාකත යයි තුනකි. එසේම අකුසලයෙන්, අබ්‍යාකතයෙන් අබ්‍යාකත යයි සත වේ. **ආරමමණෙ නවා** ඒක මූලක ඒක වසන යයි නවය, **අධිපතියා දස** කුසලය කුසලයට සහජාත මෙන්ම ආරම්මණ වශයෙන් ද අකුසලය ආරම්මණ වශයෙන් අබ්‍යාකතයට සහජාත වශයෙන් මෙන්ම ආරම්මණ වශයෙන් ද අබ්‍යාකතයට සහජාත වශයෙන් මෙන්ම ආරම්මණ වශයෙන් ද කුසල අබ්‍යාකතයට සහජාත වශයෙන්දැයි කුසල මූලක සතරකි. අකුසලය අකුසලයට සහජාත වශයෙන්, එසේ අකුසල අබ්‍යාකතයටදැයි අකුසල මූලක තුනකි. අබ්‍යාකතය අබ්‍යාකතයට සහජාතද ආරම්මණ වශයෙන්ද කුසලයට අරමුණු වශයෙන්ද එසේ අකුසලයටදැයි අබ්‍යාකත මූලක තුනකි. මෙසේ දහයකි. මෙහි වනාහි ආරම්මණ අධිපතිද සත් ආකාරයකින් ද සහජාත අධිපති ද සත් අයුරින්ම ලබයි. **අනනතරෙ සතත** කුසල මූලක දෙක, අකුසල මූලක ද එසේය. අබ්‍යාකත මූලක තුන මෙසේ සතකි. **සමනන්තරයෝද** මේවාමය. **සහජාතෙ නව** කුසල මූලක තුන, අකුසල මූලක තුන, අබ්‍යාකත මූලක එක, එසේම කුසලාබ්‍යාකත මූලක, අකුසලාබ්‍යාකත මූලකදැයි මෙසේ නවයක් වේ. **අඤ්ඤමඤ්ඤෙ තීණි** කුසලයෙන් කුසලය, අකුසලයෙන්

අකුසලය, අබ්‍යාකතයෙන් අබ්‍යාකතයදැයි මෙසේ තුනක් වේ. **නිසසයෙ තෙරසානි** සහජාතයෙන් කුසල මූලක තුන, එසේම අකුසල මූලක, අබ්‍යාකත මූලක එසේය. මෙහි පුරෙජාත ද ලබයි. අබ්‍යාකතය අබ්‍යාකතයට සහජාතද වේ. පුරේජාතද වේ. කුසලයට පුරේජාතය. අකුසලයට ද එසේය. නැවත කුසලා බ්‍යාකතය සහජාත පුරේජාත වශයෙන් කුසලයට, සහජාත වශයෙන් අබ්‍යාකතයට, අකුසලා බ්‍යාකතයට එසේමයයි මෙසේ තෙළෙස වේ. **උපනිසස** නවා ඒක මූලකයෙහි ඒක අවසානයේ නවය, ඒවායෙහි විභංගයෙහි තෙවිසි භේදයක් දක්වන ලදී. ඒවායින් ආරම්මණ උපනිස්සයෙහි සත, අනන්තර උපනිස්සයෙහි සත ප්‍රකෘති උපනිස්සයෙහි නවය වේ. **පුරෙජාතෙ තීණි** අබ්‍යාකතය අබ්‍යාකතයට, කුසලය අබ්‍යාකතයට, අකුසලය අබ්‍යාකතයට යයි මෙසේ තුනක් වේ. **ආසෙවනෙ තීණි** අඤ්ඤමඤ්ඤයට සමානය. **කමෙම සතත** හේතුවලට සමානය. එහි විසඳුම් දෙකක නා නා ක්‍ෂණික කමම ද ආයේය. පහේ සහජාතමය. **විපාකෙ එකං** අබ්‍යාකතයෙන් අබ්‍යාකතය. ආහාර **ඉන්‍ද්‍රිය ඣාන මගෙගසු සතත** හේතු හා සමානය. මෙහි ඉන්‍ද්‍රිය වනාහි සහජාත පුරෙජාත වශයෙන් ආවේය. **සමපයුතෙත තීණි** අඤ්ඤමඤ්ඤ හා සමානය. **විපපයුතෙ පඤ්ච** සහජාත පච්ඡාජාත වශයෙන් කුසලයෙන් අබ්‍යාකතය අකුසලෙන් අබ්‍යාකතය සහජාත පුරෙජාත පච්ඡාජාතවලින් අබ්‍යාකතයෙන් අබ්‍යාකතය, වත්‍ථු පුරේජාතයෙන් අබ්‍යාකතයෝ කුසලය, එසේ අකුසලය යයි එක් කුසල මූලයකි. එක් අකුසල මූලයකි. අබ්‍යාකත මූල තුනකි. මෙසේ පහක් වේ. **අත්‍ථියා තෙරස** සහජාත කුසලයෙන් කුසලය, සහජාත පච්ඡාජාත කුසලයෙන් අබ්‍යාකතය, සහජාත කුසලයෙන් කුසලබ්‍යාකත යයි කුසල මූල තුනකි. එසේම අකුසල මූල, සහජාත පුරෙජාත පච්ඡාජාත ආහාර ඉන්‍ද්‍රිය වශයෙන් අබ්‍යාකතයෙන් අබ්‍යාකතය. වත්‍ථු ආරම්මණ පුරෙජාත වශයෙන් අබ්‍යාකතයෙන් කුසලය. එසේම අකුසලය. සහජාත පුරෙජාත වශයෙන් කුසලයද අබ්‍යාකතයද කුසලයට, ඒ අබ්‍යාකතයට, සහජාත පච්ඡාජාත ආහාර ඉන්‍ද්‍රිය වශයෙන් අකුසලයද අබ්‍යාකතයද අකුසලයට, ඒ අබ්‍යාකතයට සහජාත පච්ඡාජාත ආහාර ඉන්‍ද්‍රිය වශයෙන් මෙසේ තෙළෙස. **නත්‍ථි විගතෙසු සතත** අනන්තර හා සමානය. **අවිගතෙ තෙරස** අත්‍ථි හා සමානය.

මෙසේ මෙහි සත ගණන පිරිසිඳීමය. එක තුන පහ හත නවය දහය, දහතුන යයි වේ. ඒවායෙහි විපාක වශයෙන් එකම එකක්, අඤ්ඤමඤ්ඤ, පුරෙජාත පච්ඡාජාත ආසෙවන සමපයුතත වශයෙන් පහේ

තුන, විපපයුතත වශයෙන් එකම පංචකයක්, හෙතු අනන්තර, සමනන්තර කමම ආහාර ඉන්‍ද්‍රිය ඣාන මග්ග නත්ථි විගත වශයෙන් දස සත්තක වේ. ආරම්මණ සහජාත උපනිස්සය වශයෙන් තුන නවක, අධිපති වශයෙන් එකක්, දසක, නිස්සය අත්ථි අවිගත වශයෙන් තුන තෙළෙස යයි මෙසේ එහි පච්චයන් නිද්දිට්ඨ වාරයෙහි ගණන් වශයෙන් මනාව සලකා ඒවායේ වශයෙන් දුක තිකාදියෙහි පච්චය සැසඳීමෙන් ගණන් දතයුතුය.

යම් ප්‍රත්‍යයෙන් යම් ප්‍රත්‍යයන්ට විෂභාග හෝ විරුද්ධ වෙත්ද ඒවා ඒවා සමග නොයෙදිය යුතුය. කෙසේද? හේතු පච්චයට ආරම්මණ අනන්තර සමනන්තර උපනිස්සය පුරෙජාත පච්ඡාත කම්ම ආසේවන ආහාර ඣාන නත්ථි විගත අධිපති පච්චයද හැර සෙසු අධිපති විසභාගය. සහජාත ආදිය සභාගය. කවර හෙයින්ද එසේ භාව භාව වශයෙන් හේතු පච්චය යමකට හේතු පච්චය වේද, ඒවා සහජාතාදි පච්චයද වේ. ආරම්මණ පච්චය වනාහි නොවේ යයි ආරම්මණාදිය ඊට විසභාග නම් වේ. එහෙයින් එය ඒවායින් ඒව හෝ එය සමග නොයෙදිය යුතුය. පුරෙජාත පච්ඡාජාත සම්පයුත්ත විප්පයුත්ත අත්ථි නත්ථි විගත අවිගතද අඤ්ඤමඤ්ඤ විරුද්ධ වේ. ඒවා ද අඤ්ඤමඤ්ඤ නොයෙදිය යුතුය.

එහි නොයෙදීම හැර යෙදිය යුතු යෝගයෙහි යමෙක් වාර ලබයිද ඒවා සංක්ෂේපයෙන් දැක්වීමට **හෙතුපචචයා අධිපතියා චතතාරි** යනාදිය කියන ලදී. එහි කිසියම් හේතු පච්චයක අධිපති සමග සැසඳීමේ අඩු ගණන වශයෙන් සත් වාරයකින් විය යුතුය. යම්හෙයකින් අධිපති කෙරෙහි වීමංසයම හේතුපච්චය වේද, ඉතිරිය නොවේ. එහෙයින් විසභාගයන් හැර සභාග වශයෙන් සතරකැයි කියන ලදී. ඒවා මෙසේ දතයුතුය.

කුසල ධර්මය කුසල ධර්මයට හේතු පච්චයෙන් පච්චය වේ. අධිපති පච්චයෙන් පච්චය වේ. කුසල වීමසංය සම්ප්‍රයුක්ත ස්කන්ධවල කුසල ධර්මය අබ්‍යාකත ධර්මයට හේතු පච්චයෙන් පච්චය වේ. අධිපති පච්චයෙන් පච්චය වේ. කුසල වීමංසය චිත්ත සමුට්ඨාන රූපයන්ගේ කුසල ධර්මය කුසලයට, අබ්‍යාකත ධර්මයට ද හේතු පච්චයෙන් පච්චය වේ. අධිපති පච්චයෙන් පච්චය වේ. කුසල වීමංස සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ගේ චිත්ත සමුට්ඨාන රූපයන්ගේ අව්‍යාකත ධර්මය අව්‍යාකත ධර්මයට හේතු පච්චයෙන් පච්චය වේ. අධිපති පච්චයෙන් පච්චය වේ.

විපාක අබ්‍යාකතා කිරිය අබ්‍යාකතා වීමංස සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ගේ චිත්ත සමුට්ඨාන රූපවලට.

මෙහි ද විපාක අබ්‍යාකතා ලෝකෝත්තර වශයෙන් ගතයුතුය. ආරම්මණ පච්චය අනන්තර පච්චයාදිය වනාහි විසභාග බැවින් නොයොදන ලදී. මේ උපායෙන් සියළු ලැබීම්ද නොලැබීම්ද දැන ලැබීම් වශයෙන් උපුටා දැක්විය යුතුය.

**සහජාතෙ සත්ත** හේතුවෙන් ලැබුවේමය. **අඤ්ඤමඤ්ඤෙ තීණි** සුද්ධික අඤ්ඤමඤ්ඤයෙහි ලැබුවේමය. **නිස්සයෙ සත්ත** හේතුවෙන් ලැබුයේමය. **විපාකෙ ඒකං** සුද්ධ විපාකයෙහි ලැබුවේමය. **ඉන්ද්‍රිය මග්ගෙසු චත්තාරි** යට කියන ලද නයින්මය. **සම්පයුත්තෙ තීණි** සුද්ධික සම්පයුත්තයෙහි ලැබුවේමය. **විප්පයුත්තෙ තීණි** කුසලාදි චිත්ත සමුට්ඨාන රූප පච්චයුප්පන්න කොට දතයුතුය. **අත්ථි අවිගතෙසු සත්ත** හේතුවෙන් ලැබුයේමය.

මෙසේ යම් අධිපති පච්චයාදි එකොළොස් පච්චයන් සමග හේතු පච්චය යෙදීම් ලබයි. ඔවුන්ගේ වශයෙන් දුමූලක නයෙහි ගණන දක්වා දැන් තිමූලකාදියෙහි එය දැක්වීම සඳහා ලක්ෂණ තබන්නේ **හෙතු සහජාත නිස්සය අත්ථි අවිගතං සත්ත** යනාදිය කීහ. පොත්වල වනාහි නිස්සය උපනිස්සය අධිපති මේ ආදිය පිරිහුණු අකුරු පච්චය නම් ලියයි. එය සංඥාව සඳහා පමණක් ලියන ලදී. එහෙයින් එබඳු තැන්වල පරිපූර්ණ පෙළ කළයුතුය. යම් මේ ලක්ෂණය තබන ලදී. එයින් මෙය දක්වයි. මේ හේතුපච්චය සහජාතාදි සතර සමග සැසඳීමේ තමාගේ විභංගයෙහි ලැබූ සතම විසඳුම් ලබයි. ඉදින් මෙහි වනාහි අඤ්ඤමඤ්ඤ පච්චය පිවිසෙයි. අඤ්ඤමඤ්ඤ ලැබූ තුන ලබයි. ඉදින් සම්පයුත්ත පච්චය පිවිසේද ඒවාම තුන ලබයි. ඉදින් විපාක පච්චය පිවිසේද සියළු විපාක සභාගයන් සමග සැසඳීමේ එකම විසඳුම ලබයි. ඉදින් විප්පයුත්ත පච්චය පිවිසේද හේතු විප්පයුත්ත දුකයෙහි ලැබූ තුන ලබයි. ඉදින් මෙහි ඉන්ද්‍රිය මග්ග පච්ච පිවිසේද ඒවා සමග දු මූලකයෙහි ලැබූ සතරම ලබයි. ඉදින් ඒවා සමග අඤ්ඤමඤ්ඤ පච්චය පිවිසේද හේතු අධිපති දුකෙහි දැක්වූ සතර විසඳුම්හි 'කුසල ධර්මය අබ්‍යාකතට, කුසල ධර්මය කුසලයට, අබ්‍යාකතට හෝ' යයි දෙකක් බැහැරකොට සෙසු දෙක ලබයි. ඉදින් එහි සම්පයුත්ත පච්චය පිවිසේද ඒ දෙක ලබයි. ඉදින් විප්පයුත්ත පච්චය පිවිසේද ඉතිරි

දෙක ලබයි. ඉදින් වනාහි ඒවායෙහි විපාක පච්චය පිවිසේද සියළු තැන එකක්ම ලබයි. අධිපති සමග හේතු අධිපති දුක වශයෙන් ඌනතර ගණණෙහි නොපිවිසෙන්නේ සතරම ලබයි. ඌනතර ගණනෙහි පිවිසෙන ඔවුන්ගේ වශයෙන් දෙක එක ලබයි. මෙසේ ඒ ඒ පච්චයන්ගේ සමායෝගයෙහි ලැබෙන ගණන දැන තිමූලකාදියෙහි ගණන ඉපිටිය යුතුය. මේ ගැළපීම්වල පළමුව සතර ගැළවුම, සාමාන්‍යයෙන් නවයද හේතු වශයෙන් කියන ලද අවිපාක වේ. මෙහි අබ්‍යාකතයෙන් අබ්‍යාකත විසඳුමෙහි වනාහි විපාක හේතුවද ලබයි. ඉන්පසුව පස් ගැළපුම් විපාක හේතු වශයෙන් කියන ලදී. එහි සියළු සහජාත විපාකද විපාක සහජාත රූපද, ඒවායෙහි පළමු විපාක මෙන්ම ඒ සමුට්ඨාන රූපද ලබයි. දෙවැන්නෙහි විපාක මෙන්ම ප්‍රතිසන්ධිය ද වස්තු රූපය. තෙවැන්නෙහි අරූප ධර්මම සිව්වැන්නෙහි විපාක චිත්ත සමුට්ඨාන රූපම ලබයි. පස්වැන්නෙහි වස්තු රූපයම. ඉන්පසු පසළොස්වන ගැළපීම්. ඉන්ද්‍රිය මග්ග යුත්ත අමෝහ හේතු වශයෙන් කියන ලදී. එහි පළමුවැන්න අධිපති හැර නවය, අවසානයේ අධිපති සහිත සය. නිරාධිපතිවලද පළමු සතර සමාන බැවින් සියළු තැන අමෝහ වශයෙන් කියන ලදී. අවසානයේ පංච විපාක මෝහ වශයෙන්. එහි නිරාධිපතිවල පළමුවැන්නෙහි චත්තාරි යට හේතු අධිපති දුකයෙහි දක්වන ලද්දේමය. දෙවැන්නෙහි චිත්ත සමුට්ඨාන රූප පිරිහෙයි. තෙවැන්නෙහි වස්තු රූපය පිරිහෙයි. සිව්වැන්නෙහි කුසල ධර්මය චිත්ත සමුට්ඨානයන්ගේ. අබ්‍යාකතය ඒ සමුට්ඨාන රූපයම ලබයි. ඉන්පසුව විපාක යුත් පහ යට කියන ලද නයින්ම. සාධිපතික පළමුවැන්නෙහි ගැළපුම් තුන සමාන බවින් විපාක අවිපාක වශයෙන් කියන ලදී. ඒවායෙහි පළමු සතර කියන ලද නයින්ම දෙවැන්නෙහි රූප පිරිහෙයි. තෙවැන්නෙහි අරූප පිරිහෙයි. ඉන්පසු තුන විපාක හේතු වශයෙන් කියන ලදී. ඒවායෙහි පළමුවැන්නෙහි රූප අරූප ලබයි. දෙවැන්නෙහි අරූප පමණක්. තුන්වැන්නෙහි රූප පමණක්. මෙසේ ඒ ඒ පච්චයන්ගේ සමායෝගයෙහි ලැබෙන ගණන දැන තිමූලකාදියෙහි ගණන ඉදිරිය යුතුය.

**හේතුමූලක නිමි.**

ආරම්මණ මූලකයෙහි ද අධිපති පච්චයාදි හත ආරම්මණ සභාගය. සෙසු සොළොස විසභාග යයි ඒවා නොයොදා හතම යොදන ලදී.

ඒවායින් අධිපතියෙහි හත කුසල ධර්මය කුසල ධර්මයට, අකුසල ධර්මයට, අබ්‍යාකතයටදැයි මෙසේ කුසලමූල තුනය. අකුසල මූල එකය. අබ්‍යාකත මූල තුන යයි හත. **නිසසයෙ තීණි** වස්තු වශයෙන් අබ්‍යාකත මූලමය. උපනිස්සයෙහි අඩු වශයෙන් හත. මෙසේ **පුරෙජාතෙ තීණි** වස්තු ආරම්මණ වශයෙන් අබ්‍යාකත මූල. **විපපයුතත තීණි** - වස්තු වශයෙනි. **අතථි අවිගතෙසු තීණි** වස්තු ආරම්මණ වශයෙන්. හේතු මූලකයෙහි ලක්‍ෂණ දැක්වීම සඳහා ගැළපීම් තබන ලදී. එහි පළමුවැන්න ආරම්මණ අධිපති වශයෙන් අධිපති සහිතය. එහි හතයයි ආරම්මණ අධිපති දුකයෙහි ලැබූ විසඳුම්මය. දෙවැන්නෙහි නිරාධිපතික වේ. එහි **තීණි** යයි වස්තු ආරම්මණ වශයෙන්, ආරම්මණ වශයෙන් හෝ අබ්‍යාකත මූල. තෙවැන්නෙහි නිස්සයෙන් කියන ලදී. එහි **තීණි** යනු වස්තු වශයෙන් අබ්‍යාකත මූල. සතර පස්වැනි අධිපති සහිතය. ඒවායෙහි සතරෙහි **එකං** යනු වස්තු ආරම්මණ වශයෙන් ආරම්මණ වශයෙන් හෝ අබ්‍යාකත මූලය අකුසලය. පස්වැන්නේ **එකං** යනු නිස්සයෙන් අබ්‍යාකත මූලය අකුසලය. මෙසේ මෙහි ලැබීම් වශයෙන් තිකාදියෙහි ගණන දතයුතුය. එසේම අධිපති මූලකාදියෙහි ආරම්මණ ඉන්‍ද්‍රිය විපාක වශයෙන් විස්තර යෙදීම නොකියා ඒ ඒ තැන කිවයුත්තම කියමු.

අධිපති මූලකයෙහි **සහජාතෙ සතත** සහජාත අධිපති වශයෙන් කුසල් මුල් තුන, අකුසල් මුල් තුන, අබ්‍යාකත එක. සහජාතයෙන් වනාහි ආරම්මණ අධිපති ආරම්මණාධිපති සමග සහජාත නොලබයි. **අඤ්ඤමඤ්ඤෙ තීණි** සහජාත අධිපති වශයෙන්. **නිසසයෙ අටඨ** කුසල මූල තුන, අකුසල මූල තුන, අබ්‍යාකත මූල දෙක. අබ්‍යාකතය අධිපති අබ්‍යාකතයට සහජාත වශයෙන් ආරම්මණ වශයෙන් නිස්සය වේ. අකුසලයට ආරම්මණ වශයෙන් කුසලයට වනාහි උභය වශයෙන් නොවේ යයි අබ්‍යාකත මූල දෙකම යයි මෙසේ අට උපනිස්සයෙහි සත ආරම්මණ සමානය. **පුරෙජාතෙ එකං** අබ්‍යාකතාධිපති ආරම්මණ වශයෙන් අකුසලයට. විපාකයෙහි එක අබ්‍යාකතයෙන් අබ්‍යාකතය. ලෝකුත්තරය. ආගාරාදියෙහි සත යට ඒකමූලකයෙහි ලැබුයේමය. **විපපයුතෙත චතතාරි** කුසලයෙන් අබ්‍යාකතය. එසේම අකුසලයෙන්, අබ්‍යාකතයෙන් අබ්‍යාකතද කුසලද. අවිගතයෙහි අට නිස්සය හා සමානය.

මෙහි ගැලපීම් වනාහි පිළිවෙළින් ආරම්මණාදියෙන් නොයොදා පළමුව අතථි අවිගතවලින් යොදන ලදී. කුමන කරුණක් නිසාද? අධිපති

දෙකම මිශ්‍ර බැවිනි. එහි පළමුවැන්නෙහි ගැළපීමේ ආරම්මණ අධිපති වශයෙන් වස්තු ආරම්මණ ලබයි. දෙවැන්නෙහි නිස්සය වශයෙන් ගරුකොට ආශ්වාදනය කරන්නාට වස්තුවම වේ. තුන්වැන්නෙහි සහජාත අධිපති වශයෙන් කුසලාදි රූපයන්ගේ ආරම්මණාධිපති වශයෙන් වස්තු අකුසලයට. ඉන්පසුව ගැළපීම් තුන ආරම්මණාධිපති වශයෙන් කියන ලදී. එහි **පඨමෙ සතන** යට කියන ලද්දේමය. දෙවැන්නෙහි **එකං** පුරෙජාත වස්තු ආරම්මණ අකුසලයට. තෙවැන්නේ වස්තුවම අකුසලයට. ඉන්පසුව ගැළපීම් තුන විපාක අවිපාක සාධාරණ සහජාතාධිපති වශයෙන් කියන ලදී. ඒවායෙහි ද පළමුව රූප අරූප ලබයි. දෙවනුව අරූප. තෙවනුව රූපම. ඉන්පසු ගැළපුම් සය ආහාර ඉන්‍ද්‍රිය යුත් චිත්තාධිපති වශයෙන් කියන ලදී. එහි අවිපාක තුනය. සවිපාක තුනය. ඒවායෙහි ගණන ප්‍රකටය. ඉන්පසු ගැළපුම් සය එසේම විරියාධිපති වශයෙන් කියන ලදී.

අධිපති පිළිවෙළින් පළමුව විරියාධිපති වශයෙන් කිවයුතු වන්නේ නොවේද? කුමක් හෙයින් එසේ නොකියන ලදද? පසුව හේතු වශයෙන් කියන ලද ගැළපීමෙන් සමාන බව නිසා. පසුව හේතු වශයෙන් ගැළපීම් අමෝහයේ වීමංසාධිපති බව වීමංසනයෙන් ද සම්මා දිට්ඨිභාවයෙන් මාර්ග සම්ප්‍රයුක්ත වේ. විරියද සම්මා වායාම මිච්ඡා වායාම භාවයෙන් මාර්ගයයි එය සමග ගැළපීම් පරතො හේතු වශයෙන් කියන ලද ගැළපීම්වලින් සමාන යයි කියන ලදී. ඒවායෙහි ද ගණන ප්‍රකටය. දැන යමක් ඉහළ පච්චය සමග ගැළපුනේද, ඒවායෙහි ඌනතර ගණනේ වශයෙන් සියළු ගැළපීම්වල ගණන දතයුතුය.

එහි සහජාත මූලකයෙහි ගැළපීම් දහය. ඒවායින් පහක් අවිපාකය. පහක් සවිපාකය. එහි අවිපාකවල පළමුව කුසලය අකුසලයට, අබ්‍යාකතයට, කුසලාබ්‍යාකතයට, කුසලාබ්‍යාකතය අබ්‍යාකතයටදැයි සතර. එසේ අකුසලය, අබ්‍යාකතය. අබ්‍යාකතයටදැයි මෙසේ නවය. එහි කුසල අකුසල ආදියෙහි විසඳුම් අටෙහි අරූප මෙන්ම චිත්ත සමුට්ඨාන රූප ද ලැබේ. අබ්‍යාකතයෙහි වස්තු රූපයද දෙවනුව ගැළපීමේ අබ්‍යාකත විසඳුමේ රූපවල වස්තුවම ලබයි. තෙවනුව තුනෙහිද අරූපම වේ. සිව්වෙනුව චිත්ත සමුට්ඨාන රූපමය. පස්වෙනුව ප්‍රතිසන්ධියෙහි වස්තුව සමග අරූප ධර්ම. සවිපාකවල පළමුව විපාක මෙන් විපාක චිත්ත සමුට්ඨාන රූපද දෙවනුව විපාක මෙන්ම වස්තු රූපයද තෙවනුව විපාකයම සිව්වනුව විපාක චිත්ත සමුට්ඨානයම. පස්වනුව වස්තු රූපයම ලබයි.

අඤ්ඤමඤ්ඤ මූලකයෙහි ගැළපීම් සය. ඒවායෙහි පළමු තුන අවිපාකය. පැසුළු තුන සවිපාකය. ඒවායෙහි ගණන ප්‍රකටය.

නිස්සය මූලකයෙහි **නිස්සය පච්චයා ආරම්මණෙ තීණි** වස්තුව අරමුණ කොට පැවති කුසලාදි වශයෙන් දතයුතුය. **උපනිස්සයෙ එකං** වස්තු ආරම්මණ උපනිස්සය කොට උපන් කුසලය. සෙස්ස දුමූලකයෙහි යට කියන ලද නයින්ම දතයුතුය. මේ නිස්සය පච්චයෙහි ගැළපීම් විස්සකි. ඒවායින් මුල් ගැළපීම් සය පුරේජාත සහජාත වශයෙන් කියන ලදී. එයින් සතරක් පුරෙජාත වශනේම එයින් දහයක් සහජාත වශයෙන්. එහි පළමු ගැළපීමේ **තෙරසා** යයි සහජාතාධිපති වශයෙන් සත, වස්තු ගරුකොට අකුසලයද අට. තෙවැන්නෙහි සත ඉන්‍ද්‍රිය පච්චයෙහි ලැබුවේමය. සතරවැන්නෙහි විප්පයුත්ත පහක් ලැබේය. **පඤ්චමෙ චත්තාරි** කුසලාදිය චිත්ත සමුට්ඨානවල වස්තුව අකුසලයට. සයෙහි **තීණි** කුසලාදිය චිත්ත සමුට්ඨානයට. පුරෙජාත වශයෙන් සතරෙහි පළමුව **තීණි** වස්තු කුසලාදිය චක්ඛු ආදියද අබ්‍යාකතයට. දෙවනුව වස්තුවම කුසලාදියේ. තෙවනුව **එකං** වස්තු අකුසලයට. සිව්වෙනුව චක්ඛු ආදිය විඤ්ඤාණ පංචකයට, සහජාත වශයෙන් දහය සවිපාක අවිපාක වශයෙන් දෙකොටසට බෙදා සහජාත මූලකයෙහි කියන ලද නයින් දතයුතුය.

උපනිස්සය මූලකයෙහි **ආරම්මණෙ සත්ත** ආරම්මණ උපනිස්සයෙහි ලැබුයේමය. **අධිපතියා සත්ත** ඒවාම. අනන්තර සමනන්තරවල අනන්තර උපනිස්සයෙහි ලැබුයේමය. **නිස්සයෙ එකං** වස්තු අකුසලයම. **පුරෙජාතෙ එකං** එයම වස්තුව හෝ අරමුණ හෝ. ආසේවනයෙහි තුන. අනන්තර උපනිස්සය වශයෙන් කර්මයෙහි දෙක ප්‍රකෘති උපනිස්සය වශයෙන්. ලෝකෝත්තර කුසල චේතනා වනාහි අනන්තර උපනිස්සයද වේ. විප්පයුත්තයෙහි එක ආරම්මණ උපනිස්සය වශයෙන්. එසේ අත්ථි අවිගතවල. නත්ථි විගතවල හත අනන්තර සමානය. උපනිස්ස මූලක ගැළපීම් හතක් වේ. එහි පළමු තුන ආරම්මණ උපනිස්සය වශයෙන් කියන ලදී. එහි පළමුව **සත්ත** කුසලය කුසලාදියට, එසේම අබ්‍යාකතය, අකුසලය අකුසලයටදැයි මෙසේ හත. දෙවනුව එක චක්ඛාදි අබ්‍යාකතය අකුසලයට. වස්තු අකුසලයට, ඉන්පසු දෙක අනන්තර උපනිස්සය වශයෙන් කියන ලදී. ඒවායෙහි ගනන ප්‍රකටමය. එයින් දෙක අනන්තර ප්‍රකෘති උපනිස්සය වශයෙන් කියන ලදී. එහි පළමුව ලෞකික

කුසල චේතනා පච්චය භාවයෙන් ගතයුතුය. දෙවනුව ලෝකෝත්තර කුසලම.

පුරෙජාත මූලකයෙහි **ආරමමණෙ තීණි** අබ්‍යාකතය කුසලාදියේ අධිපතියෙහි **එකං** අබ්‍යාකතය අකුසලයට. සෙස්සෙහි ද මෙම නයයි. මෙහි වනාහි ගැළපීම් සතකි. ඒවායෙහි පළමුවැන්න වස්තු ආරම්මණ වශයෙන් කියන ලදී. දෙවැන්න වස්තු වශයෙන්ම. තෙවැන්න ආරම්මණ වශයෙන්. සතර ආරම්මණ කාල වශයෙන්. පස්වැන්න ආරම්මණ අධිපති වශයෙන්. සවැන්න වස්තුවේ ආරම්මණාධිපති කාල වශයෙන්. සත්වැන්න චක්ඛු ආදි වශයෙන්.

පචඡාජාත මූලකයෙහි පච්චය විස්සක් නොයෙදේ. තුනක් යෙදේ. මෙහි එකක්ම ගැළපේ. එය කයෙහි කුසලාද වශයෙන් දතයුතුය. ආසේවන මූලකයෙහි ද එකක්ම ගැළපේ.

කම්ම මූලකයෙහි අනනතරෙ එකං මාර්ග චේතනා වශයෙන් කියන ලදී. **අඤ්ඤමඤ්ඤෙ තීණි** මෙහි ප්‍රතිසන්ධියෙහි වස්තුවද ගතයුතුය. උපනිසසයෙ දෙව අනන්තර ප්‍රකෘති උපනිස්සය වශයෙන් යට කියන ලද නයින්ම දතයුතුය. මෙහි වනාහි ගැළපීම් එකොළොසකි. එහි පළමු දෙක ප්‍රකෘති උපනිස්සය අනන්තර උපනිස්සය විභාග වශයෙන් නා නා ක්ෂණික කර්ම වශයෙන් කියන ලදී. ඉන්පසුව සතර විපාක අවිපාකයෙන් ඒක ක්ෂණික කර්ම වශයෙන් කියන ලදී. එහි පළමුවැන්න අරූපය සමග චිත්ත සමුට්ඨාන රූපය ලබයි. දෙවැන්න අරූපය සමග වස්තුව. තෙවැන්න අරූපයම. සතරවැන්න චිත්ත සමුට්ඨාන රූපයම. ප්‍රතිසන්ධියෙහි වනාහි කටත්තා රූපයද ලැබේ. ඉන්පසු සවිපාක පහ යට කියන ලද නයින්ම.

විපාක මූලකයෙහි ගැළපීම් පහකි. අර්ථ පැහැදිලිය. ආහාර මූලකයෙහි හත ආදිය කියන ලදමය. මෙහි ගැළපීම් වනාහි තිස්හතරකි. ඒවායින් පළමුවැන්න විපාක සමානත්වයෙන් පහ කියන ලදී. එහි පළමු සතරද ආහාර ලබයි. දෙවැන්න අරූපාහාර තුන වේ. තෙවැන්න වස්තුවද පච්චයුප්පන්න වේ. ඉන්පසු පහ සවිපාක ගැළපීම්ය. ඒවා යට කියන ලද නයින්ම. ඉන්පසු ගැළපීම් චේතනාහාර වශයෙන් කියන ලදී. ඉන්පසුව නවය නිරාධිපති විඤ්ඤාණ ආහාර වශයෙන්. ඉන්පසුව සාධිපති විඤ්ඤාණ ආහාර වශයෙන් ගැළපීම් සිය කියන ලදී. එහි තුනක් විපාක සමානත්වයෙන්

කියන ලදී. තුනක් විපාක වශයෙන්ම. එහි ලෞකික විපාක අභාවයෙන් වස්තු පිරිහෙයි.

ඉන්ද්‍රිය මූලකයෙහි පුරෙජාත එකං චක්ඛු ඉන්ද්‍රියාදි වශයෙන් අබ්‍යාකතයෙන් අබ්‍යාකතය, සෙසු දුමූලක යට කියන ලද නයින් ම දතයුතුය. මෙහි ගැළපීම් වනාහි සැත්තෑහයකි. එහි පළමුවැන්නෙහි සියළු ඉන්ද්‍රිය පච්චය අර්ථයෙන් ලබයි. දෙවැන්නෙහි රූප ජීවිතේන්ද්‍රිය පිරිහෙයි. එහි නිස්සය නොවේ. තෙවැන්නෙහි අරූප ඉන්ද්‍රිය රූපයන්ගේ. සිව්වැන්නේ චක්ඛු ආදිය චක්ඛු විඤ්ඤාණාදියට. ඉන්පසු ගැළපීම් නවය සහජාත අරූප ඉන්ද්‍රිය වශයෙන් කියන ලදී. ඉක්බිති නවය මාර්ග වූ ඉන්ද්‍රියන්ගේ වශයෙන්. ඉක්බිති නවය ධ්‍යානාංග වීමෙන්. ඉක්බිති නවය ධ්‍යාන මාර්ගව. ඉක්බිති නවය මතින්ද්‍රිය වශයෙන්ම. ඉක්බිති සාධිපති සය. ඉන්පසු විරිය වශයෙන් මාර්ග සම්ප්‍රයුක්ත සය. ඉක්බිති අමෝහ හේතු වශයෙන් නිරාධිපති නවය, සාධිපති සය. ඒ සියල්ලෙහි විපාක පච්චයෙන් නොයෙදීම් ද යෙදීමද යට කියන ලද නයින්ම දතයුතුය.

ඣාන මූලකයෙහි ද දුමූලකය යට කියන ලද නයින් දතයුතුය. මෙහි ගැළපීම් තිස්හයකි. ඒවායින් පළමු නවය ඉන්ද්‍රිය මාර්ග භාවය ස්පර්ශ නොකොට සාධාරණ ඣානංග වශයෙන්ම කියන ලදී. චේතනා සතරෙහි නවය, ඒවායෙහි සතර සතර විපාක අවිපාක සාධාරණ අවසානයෙහි පහ පහ විපාකම. ඒවා යට කියන ලද නයින්ම.

මග්ග මූලකයෙහි ද දුමූලකය කියන ලද නයින් දතයුතුය. මෙහි ගැළපීම් පනස් හතකි. ඒවායින් පළමු නවය ඉන්ද්‍රිය ධ්‍යානභාවය ස්පර්ශ නොකොට සුද්ධික මග්ග වශයෙන්ම කියන ලදී. ඉක්බිති නවය ඉන්ද්‍රිය මග්ග වශයෙන්. ඉක්බිති නවය ධ්‍යාන වූ මාර්ග වශයෙන්. ඉක්බිති නවය ඉන්ද්‍රිය ධ්‍යාන මාර්ග වශයෙන්. ඉක්බිති සය සාධිපති මාර්ග හේතු වශයෙන්. එහි නවකවල පහ පහද ඡක්කයෙහි තුන තුන විපාක වේ. සෙස්ස සාධාරණය. ඒවා යට කියන ලදී.

සම්පයුත්ත මූලකයෙහි දුමූලකය පැහැදිලි අරුත් වේ. මෙහි ගැළපීම් දෙකක්මය. එහි එකක් සාධාරණ වශයෙන්. එකක් විපාක වශයෙන් කියන ලදී.

විප්පයුත්ත මූලකයෙහි ද දුමූලක පැහැදිලි අරුත් වේ. මෙහි ගැළපීම් වනාහි තෙළෙසකි. පඨමෙ පඤ්ච කුසලය අබ්‍යාකතයට. අකුසලය එසේය. අබ්‍යාකතය තුනක්ද. මෙහි මේ විප්පයුත්තාදිය සහජාත ද වේ. පච්ඡාජාත පුරෙජාත ද වේ. දෙවැන්නේ පුරෙජාත සහජාතව. තෙවැන්නේ ඒවම අධිපති වශයෙන්. එහි කුසලය අබ්‍යාකතයට. එසේ අකුසලය. අබ්‍යාකතය වනාහි අබ්‍යාකතයට ද ආරම්මණාධිපති වශයෙන් අකුසලයටදැයි මෙසේ සතරකි. සිව්වැන්නේ තීණි යයි කුසලාදිය අබ්‍යාකතයට. මෙහි ඉන්ද්‍රිය වනාහි රූපද අරූපද වේ. පස්වැන්නේ පච්චය අරූපම. සවැන්නේ වස්තු වශයෙන් රූපම. සත්වැන්නේ කුසල අබ්‍යාකතවල විපස්සනා වශයෙන්. අකුසලයට ආශ්වාදන වශයෙන් වස්තුවම. අටවැන්නේ එම අකුසලයටම. නවවැන්නේ චක්ඛු ආදිය අබ්‍යාකතයට. දසවැන්නේ කුසලාදිය චිත්ත සමුට්ඨානවල. එකොළොස්වැන්නේ ප්‍රතිසන්ධියෙහි වස්තු ස්කන්ධවල. දොළොස්වැන්නේ ස්කන්ධ කටත්තා රූපවල. තෙළෙස්වැන්නේ ප්‍රතිසන්ධියෙහි ස්කන්ධ වස්තුවේ.

අත්ථි පච්චය මූලකයෙහි උපනිසසයෙ එකං ආරම්මණ උපනිස්සය වශයෙන් අබ්‍යාකතය අකුසලයට. සෙසු දුමූලකය පැහැදිලිය. මෙහි ගැළපීම් වනාහි එකුන් තිසකි. ඒවායින් පළමුවැන්නේ අරූප වත්ථු ආරම්මණ මහාභූත ඉන්ද්‍රිය ආහාර වශයෙන් සහජාත පුරෙජාත පච්ඡාජාත පච්චය ලබයි. දෙවැන්නේ පච්ඡාත කබලීකාර ආහාර නොලබයි. පළමු දෙවන ගැළපීම්ම අධිපති සමග ඉහළ තතිය චතුත්ථ කරන ලදී. නැවත පළමුවන සතරෙන් ආහාරය සමග පස්වැන්න. රූප ඉන්ද්‍රිය සම සවැන්න. රූප අරූපි ඉන්ද්‍රිය සමග සත්වැන්න කරන ලදී. දෙවැන්නම හෝ ඉන්ද්‍රියන් සමග සත්වැන්න කරන ලදී. පළමු දෙවනම විප්පයුත්ත පච්චය සමග අට නවය. ඒවායින් නවය අධිපති සමග දහවැන්න කරන ලදී. ඉක්බිති එකොළොස් වැන්නෙහි පච්චය වශයෙන් වස්තු පිරිහෙයි. දොළොස්වැන්නේ අරූප ධර්මම පච්චය වේ. තෙළෙස්වැන්නේ වස්තු ආරම්මණ. තුදුස්වැන්නේ වස්තුම. පසළොස්වැන්නේ ආරම්මණම. සොළොස්වැන්නේ වස්තුම ආරම්මණ වේ. සතළොස්වැන්නේ එයම ආරම්මණ අධිපති භාවයෙන් අටළොස් වැන්නේ එයම ආරම්මණ උපනිස්සය වශයෙන් එකුන් විස්සේ චක්ඛු ආදියම පච්චය වේ. මේ එකුන් විස්ස ප්‍රකීර්ණක ගැළපීම් නම්. සහජාත නොගෙන කියන ලදී. ඉන්පසු දහය සහජාත වශයෙන් කියන ලදී.

නත්ථි විගත මූලකවල අනන්තර සමනන්තර මූලකවල මෙන් උපනිස්සය ආසේවන කම්ම වශයෙන් ගැළපීම් තුනක්ම වේ. අවිගත මූලකය අත්ථි මූලකය හා සමාන වේ.

මේ ප්‍රශ්න වාරයෙහි යම් මේ ගැළපීම් කියන ලදී. ඒවා සියල්ලම දෙයාකාර වේ. ප්‍රකීර්ණ වශයෙන් සහ සහජාත වශයෙනි. එහි සියළුම ආරම්මණ මූලකාදීන්ගේ මුලින් සහජාතය නොගෙන කියන ලද්දේ ප්‍රකීර්ණක නම් වේ. ඒවා ආරම්මණ මූලකයෙහි පහක්ද. අධිපති මූලකයෙහි හයක් අනන්තර මූලකයෙහි තුනක්, සමනන්තර මූලකයෙහි ද එසේය. නිස්සය මූලකයෙහි දහසයක්, තුනක්, සමනන්තර මූලකයෙහි ද එසේය. නිස්සය මූලකයෙහි දහයක්, උපනිස්සය මූලකයෙහි හතක්, පුරෙජාත මූලකයෙහි හතක්. පච්ඡාජාත මූලකයෙහි එකක්. එසේම ආසෙවන මූලකයෙහි කම්ම මූලකයෙහි දෙකක්. ආහාර මූලකයෙහි එකක්. ඉන්ද්‍රිය මූලකයේ සතරක්. විප්පයුත්ත මූලකයෙහි නවයක්. අත්ථි මූලකයෙහි එකුන් විස්සක්. නත්ථි මූලකයෙහි තුනක්. විගත මූලකයෙහි එසේම අවිගත මූලකයෙහි එකුන් විස්සක්. සියල්ල එක්සිය තුනක් වේ. සහජාත නිස්සය භාවයෙන් මේ ප්‍රකීර්ණක යයි කියනු ලැබේ.

යම් සහජාත ලබයිද ඒවා සහජාත ගැළපීම් නමැයි කියනු ලැබේ. ඒවා ආරම්මණ මූලකයෙහි අනන්තර සමනන්තර උපනිස්සය පුරෙජාත, පච්ඡාජාත ආසේවන නත්ථි විගත මූලකවල නො ලැබේ. ඒ පච්චයෝ සහජාතයන්ගේ පච්චය නොවේ. සහජාතයන්ගේ යම්සේ නොවේද එසේ හේතු සහජාත අඤ්ඤමඤ්ඤ විපාක ඣාන මග්ග සම්පයුත්ත පච්චයන්ගේ අසහජාතයයි හේතු මූලකයෙහි සියල්ල සූවිසි ගැළපුම් සහජාත ගැලපුම්ම වේ. එසේ අධිපති මූලකයෙහි ද සූවිස්සකි. සහජාත මූලකයෙහි දහයකි. අඤ්ඤමඤ්ඤ මූලකයෙහි සයකි. නිස්සය මූලකයේ දහයකි. කම්ම මූලකයෙහි නවයකි. විපාක මූලකයෙහි පහකි. ආහාර මූලකයෙහි තිස්තුනකි. ඉන්ද්‍රිය මූලකයෙහි සැත්තෑ දෙකකි. ඣාන මූලකයෙහි තිස්හයකි. මග්ග මූලකයෙහි පනස් හතකි. සම්පයුත්ත මූලකයෙහි දෙකකි. විප්පයුත්ත මූලකයෙහි සතරකි. අත්ථි මූලකයෙහි දහයකි. අවිගත මූලකයෙහි දහයකැයි සියල්ල තුන්සිය දොළොසක් වේ. මෙසේ පෙර එකසිය තුනද මේ තුන්සිය දොළහද සියල්ල හාරසිය පහළොවක් පඤ්හවාරයේ ආවේය.

ඒවායෙහි යම් පච්චය ධර්මයක් නම් වශයෙන් ප්‍රකට නොවී පෙනේ.

ඒවාද හේතු මූලකාදීන්ගේ නයේ මුල විපාක අවිපාක සමානත්වයෙන් කියන ලද ගැළපීම්වල දැක්විය යුතුය. හේතු දොළොසෙහි ද අරමුණු හයද, අධිපති හතර, ආහාර හතර ඉන්ද්‍රිය විස්ස ඣානංග සත, මාර්ගාංග දොළොසදැයි මේ පච්චය ධර්ම නම් වේ. ඒවායින් යම් ධර්මයක් ඒකාන්තයෙන් කුසලය. ඒකාන්තයෙන්ම අකුසලය. ඒකාන්තයෙන් කුසල විපාකය. ඒකාන්තයෙන්ම අකුසල විපාකය. ඒකාන්තයෙන් විපාකය. ඒකාන්තයෙන් අවිපාකය. ඒ ඒවා මනාව සලකා එහි යමක් විපාකද ඒවා විපාක ගැළපීම්වල යමක් අවිපාකද ඒවා අවිපාකවල ගැළපීම්වල සුදුසු පරිදි යෙදිය යුතුය.

## පඤ්හ වාරයෙහි ගැළපීමේ අනුලෝම ගණන තිමි.

දැන් පච්චනීය වේ. එහි යම්සේ පටිච්ච වාරාදියෙහි 'අකුසල ධර්ම නිසා අකුසල ධර්මය උපදී. හේතු පච්චය නොවේ' යනාදි නයින් ලැබෙන ප්‍රශ්න ලැබෙන පච්චයන්ගේ වශයෙන් ස්වරූපයෙන්ම විස්තර කරන ලදී. මෙසේ විස්තර නොකොට එක් ලක්‍ෂණයකින් සංක්‍ෂේප වශයෙන් දැක්වීමට ධම්ම සංගණියෙහි **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස ආරම්මණ පච්චයෙන පච්චයො** යනාදි නයින් අනුලෝම වශයෙන් කුසලාදීන්ගේ පච්චය උපුටන ලදී. ඒ පච්චයෝද සමූහ වශයෙනි. එක එක පච්චය වශයෙන් නොවේ. එහෙයින් යමක් යම්තැන සමූහ වශයෙන් දක්වන ලදද ඒවාද බෙදා දතයුතුය.

මේ සියළු සූවිසි පච්චයෝ පච්චය අටක සංග්‍රහ වේ. කුමන අටකද? ආරම්මණයෙහි, සහජාතයෙහි, උපනිස්සයෙහි, පුරෙජාතයෙහි, පච්ඡාජාතයෙහි, කම්මයෙහි, ආහාරයෙහි, ඉන්ද්‍රියෙහි.

කෙසේද? මේ පච්චය අට හැර සෙසු සොළොසෙහි හේතු පච්චය, අඤ්ඤමඤ්ඤ, විපාක, ඣාන, මග්ග, සම්පයුත්ත පච්චය යයි මේ පච්චය හය ඒකාන්තයෙන් සහජාත වී සහජාතයන්ගේම පච්චය භාවයෙන් සහජාත පච්චයෙහි සංග්‍රහ වේ.

අනන්තර පච්චය, සමනන්තර, ආසේවන, නත්ථි විගත පච්චයෝ යයි මේ පහ වනාහි ඉපදී නිරුද්ධව තමාගේ අනතුරුව උපදිනු ලබන්නේම පච්චය භාවයෙන් අනන්තර උපනිස්සය ලක්ෂණයෙන් උපනිස්සයෙහි සංග්‍රහ වේ.

නිස්සය පච්චය, සහජාත පුරෙජාත භේදයෙන් ද්විධ වේ. එහි සහජාත නිස්සය සහජාතයෙන්ම නිස්සය පච්චයභාවයෙන් සහජාත පච්චයෙහි සංග්‍රහ වේ. පුරෙජාත නිස්සය පුරෙජාත පච්චයෙහි සංග්‍රහ වේ.

අධිපති පච්චය ද සහජාත අධිපති ආරම්මණ අධිපති වශයෙන් ද්විධය. එහි සහජාතාධිපති සහජාතයන්ගේම අධිපතිභාවයෙන් සහජාත පච්චයෙහි සංග්‍රහ වේ. ආරම්මණාධිපති ආරම්මණ උපනිස්සය වේයයි ආරම්මණ උපනිස්සය ලක්ෂණයෙන් උපනිස්සය පච්චයේ සංග්‍රහ වේ.

විප්පයුත්ත පච්චය සහජාත පුරෙජාත පච්ඡාජාත භේදයෙන් ත්‍රිවිධ වේ. එහි සහජාත විප්පයුත්ත සහජාතයන්ගේම විප්පයුත්ත පච්චයභාවයෙන් සහජාත පච්චයේ සංග්‍රහ වේ. පුරෙජාත විප්පයුත්ත පෙර ඉපදී පසුව උපදින්නන්ට පච්චයභාවයෙන් පුරෙජාතයෙහි සංග්‍රහ විය. පච්ඡාජාත විප්පයුත්ත පසුව ඉපදී පෙර උපන් අයට උපස්ථම්භන වශයෙන් පච්චයභාවයෙන් පච්ඡාජාත පච්චයෙහි සංග්‍රහ වේ.

අත්ථි පච්චය අවිගත පච්චය සහජාත පුරෙජාත පච්ඡාජාත ආහාර ඉන්ද්‍රියන්ගේ ද අත්ථි අවිගතවලද එක එකේ වශයෙන් භේද හයකින් සිටියේය. එහි සහජාත අත්ථි අවිගත සහජාතයන්ගේම අත්ථි අවිගත පච්චයභාවයෙන් සහජාත පච්චයෙහි සංග්‍රහ වේ. පුරෙජාත පෙර ඉපදී පසුව උපදිනු ලබන්නන්ට පච්චයභාවයෙන් පුරෙජාත පච්චයෙහි සංග්‍රහ වේ. පච්ඡාජාත පසුව ඉපදී පෙර උපන්නාට උපස්ථම්භන වශයෙන් පච්චයභාවයෙන් පච්ඡාජාත පච්චයෙහි සංග්‍රහ වේ.

ආහාර කබලීකාර ආහාර පච්චයෙහි සංග්‍රහ වේ. ඉන්ද්‍රිය රූප ජීවිතේන්ද්‍රිය පච්චයෙහි සංග්‍රහ වේ. මෙසේ මේ සොළොස් පච්චය මේ පච්චය අටෙහි සංග්‍රහ වේයයි දතයුතුය.

මේ පච්චය අටේ අන්‍යොන්‍ය සංග්‍රහ ද ඇත්තේය. මුලින් දැක්වූ

ආරම්මණ පච්චය අධිපති අනධිපති භේදයෙන් ද්විධය. එහි අධිපති වූ ආරම්මණ උපනිස්සය ලක්‍ෂණයෙන් උපනිස්සයෙහි සංග්‍රහ වේ. අනධිපති සුද්ධ ආරම්මණ පච්චය වේ.

කම්ම පච්චය ද සහජාත නා නා ක්‍ෂණික වශයෙන් ද්විධ වේ. තම සහජාතයන්ගේම කම්ම පච්චයභාවයෙන් සහජාතයෙහි ම සංග්‍රහ වේ. නා නා ක්‍ෂණික කම්මය බලවත් දුබල වශයෙන් ද්විධය. එහි බලවත් කර්මය විපාක ධර්මයන්ගේ උපනිස්සයව පච්චය වේයයි උපනිස්සය පච්චයෙහි සංග්‍රහ වේ. බලවත් රූපයන්ගේ දුබල වූ අරූපයන්ගේ නා නා ක්‍ෂණික කම්ම පච්චයෙන්ම පච්චය වේ.

ආහාර පච්චයද රූප අරූප වශයෙන් ද්විධය. එහි අරූපාහාරය තම සහජාතයන්ගේ ම පච්චය වේ යයි සහජාත පච්චයෙහි සංග්‍රහ වේ. රූපාහාරය සහජාත පුරෙජාත පච්ඡාජාතයන්ගේ පච්චය නොවේ. තමාගේ වනාහි උප්පාද ක්‍ෂණය ඉක්මවා ඨිතියට පැමිණ ආහාර පච්චයභාවය සාදන්නේ යයි ආහාර පච්චය වේ.

ඉන්‍ද්‍රිය පච්චය ද රූප අරූප වශයෙන් ද්විධය. අරූප ඉන්‍ද්‍රිය පච්චය තම සහජාතයන්ගේම ඉන්‍ද්‍රිය පච්චයභාවය සාදන්නේ යයි සහජාතයෙහිම සංග්‍රහ වේ. රූප ඉන්‍ද්‍රිය පච්චය වනාහි අජ්ඣත්ත බාහිර භේදයෙන් ද්විවිධය. එහි අජ්ඣත්ත ඉන්‍ද්‍රිය පච්චය පෙර ඉපදී පසුව උපදිනු ලබන්නන්ට සසම්ප්‍රයුත්ත ධර්මයන්ගේ චක්ඛු විඤ්ඤාණාදියට ඉන්‍ද්‍රිය පච්චය වේ යයි පුරෙජාතයෙහි ම සංග්‍රහ වේ. බාහිර ඉන්‍ද්‍රිය පච්චය නම් රූප ජීවිතේන්‍ද්‍රිය වේ. එය සහජාතයන්ගේ පච්චය වේ යයි අනුපාලන මාත්‍ර වශයෙන් ම වේ. ජනක වශයෙන් නොවේ. ඉන්‍ද්‍රිය පච්චය වේ.

මෙසේ මේ පච්චය අට ඔවුනොවුන් කෙරෙහි සංග්‍රහයට යයි. මේ පච්චය අටෙහි අවසේස සොළොසෙහිම ඒවායේම අට අඤ්ඤමඤ්ඤ වශයෙන් සංග්‍රහ නය.

දැන් මේ පච්චය අටේ එක එකෙහි සූවිසි පච්චයවල යමක් යමක් සංග්‍රහයට යයිද ඒ ඒවා දතයුතුය. එහි අටේ සියල්ලට පළමුව ආරම්මණ පච්චයෙහි ආරම්මණ පච්චයම සංග්‍රහයට යයි. සෙසු තෙවිස්ස නොවේ.

දෙවැන්නෙහි සහජාත පච්චයෙහි හේතු පච්චය, සහජාතාධිපති පච්චය, සහජාත පච්චය, අඤ්ඤමඤ්ඤ පච්චය, සහජාත නිස්සය පච්චය, සහජාත ඉන්‍ද්‍රිය පච්චය, ඣාන පච්චය, මග්ග පච්චය, සම්පයුත්ත පච්චය, සහජාත විප්පයුත්ත පච්චය, සහජාත අත්ථිපච්චය, සහජාත විගත පච්චය යයි මේ පසළොස් පච්චය සංග්‍රහ වේ.

තෙවැන්නෙහි උපනිස්සය පච්චයෙහි අධිපති වූ ආරම්මණ පච්චය, ආරම්මණ වූ අධිපති පච්චය, අනන්තර, සමනන්තර, උපනිස්සය, ආසෙවන පච්චයා නා නා ක්ෂණික බලවත් කම්ම පච්චය, නත්ථි පච්චය, විගත පච්චය යයි මේ පච්චය නවය සංග්‍රහ වේ.

සිව්වැන්නෙහි පුරෙජාත පච්චයෙහි පුරෙජාත නිස්සය පච්චය, පුරෙජාත ඉන්‍ද්‍රිය පච්චය, පුරෙජාත විප්පයුත්ත පච්චය, පුරෙජාත අත්ථි පච්චය, පුරෙජාත විගත පච්චය යයි මේ පච්චය හය සංග්‍රහ වේ.

පස්වැන්නෙහි පච්ඡාජාත පච්චයෙහි පච්ඡාජාත පච්චය, පච්ඡාජාත විප්පයුත්ත පච්චය, පච්ඡාජාත අත්ථි පච්චය, පච්ඡාජාත විගත පච්චය යයි මේ පච්චය සතර සංග්‍රහ වේ.

සවැන්නේ කම්ම පච්චයෙහි නා නා ක්ෂණික කම්ම පච්චයම සංග්‍රහ වේ.

සත්වැන්නෙහි ආහාර පච්චයෙහි කබලීකාර ආහාර වශයෙන් ම ආහාර පච්චය, ආහාර අත්ථි පච්චය, ආහාර අවිගත පච්චය යයි මේ පච්චය තුන සංග්‍රහ වේ. අටවැන්නෙහි ඉන්‍ද්‍රිය පච්චයෙහි රූප ජීවිතේන්‍ද්‍රිය පච්චය, ඉන්‍ද්‍රිය අත්ථි පච්චය, ඉන්‍ද්‍රිය විගත පච්චය යයි මේ පච්චය තුන සංග්‍රහ වේ.

මෙසේ මේ පච්චය අටේ එක එකෙහි මේ මේ පච්චය සංග්‍රහ වීයයි දැන යමක් යම්තැනක සංග්‍රහවීද ඒවා එහි ගණනින් ගන්නා ලදැයි දතයුතුය.

මෙසේ සියළු පච්චය සංග්‍රහ වූ මේ පච්චය අට වශයෙන් එකුන් පනස් ප්‍රශ්නවල මේ පච්චනීයෙහි කුසලො ධම්මා කුසලස්ස ධම්මස්ස

ආරම්මණ පච්චයෙන පච්චයො යනාදිය මේ පසළොස් ප්‍රශ්න උපුටා විසඳන ලදී. එහි කුසලය කුසලයට, කුසලය අකුසලයට, කුසලය අබ්‍යාකතයට, කුසලය කුසලඅබ්‍යාකතයට යයි කුසලාදික සතර ප්‍රශ්න. එසේම අකුසලාදික. අබ්‍යාකතය වනාහි අබ්‍යාකතයට, අබ්‍යාකතය කුසලයට, අබ්‍යාකතය අකුසලයටදැයි අබ්‍යාකතාදිකය තුනකි. කුසලයද අබ්‍යාකතය අකුසලයටදැයි අබ්‍යාකතාදිකය තුනකි. කුසලයද අබ්‍යාකතයද කුසලයට, එසේම අබ්‍යාකතයට, අකුසලය ද අබ්‍යාකතයද අකුසලයට, එසේ අබ්‍යාකතයටදැයි ද්‍රමූලක ඒක අවසානයේ සතරක් වේ. ඒවායෙහි පළමු ප්‍රශ්නයෙහි යමකින් විය යුතුද ඒ සියල්ල සංග්‍රහකොට පච්චය තුන කියන ලදී. දෙවන දෙක, තෙවන පහ, සිව්වන එක, නවවන හත, දහවන තුන, එකොළොස්වන තුන, දොළොස්වන දෙක, තෙළෙස්වන සතර, තුදුස්වන දෙක, පසළොස්වන සතර, ඒවා සහජාත පච්චයෙන් යයි නොකියා සහජාත පච්ඡාජාත යයි කියන ලදී. එහි කාරණය පසුව කියමු.

සමාස වශයෙන් එක, දෙක, තුන, හතර, පහ, හත යයි හයේම පච්චය පරිච්ඡේද වේ. මේ ප්‍රශ්න වාරය් පච්චනීයෙහි උත්කෘෂ්ඨ වශයෙන් ප්‍රශ්න පරිච්ඡේද මෙන්ම ඒ ඒ පච්චයන් සංග්‍රහ කොට දක්වන ලද පච්චය පරිච්ඡේදයද, හේතු පච්චය නොවේ යයි යනාදියෙහි වනාහි සූවිසි පච්චය පච්චනීවල එක් පච්චනීයේ ද මෙයින් උඩ ප්‍රශ්න හෝ පච්චය හෝ නොලැබේ. යට ලැබේ. එහෙයින් යම් ප්‍රශ්නවල කුසලො ධම්මො කුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස' කුසල ධර්මය කුසලයට ද අබ්‍යාකත ධර්මයට ද සහජාත පච්චයෙන් පච්චය වේ යයි මෙසේ එක් පච්චයක් ආවේය. ඒ පච්චයෙහි ප්‍රතික්ෂේපයෙන් ඒ ප්‍රශ්න පිරිහේ. යම් ප්‍රශ්නයක 'කුසල ධර්මය අකුසල ධර්මයට ආරම්මණ පච්චයෙන් පච්චය වේ. උපනිස්ස පච්චයෙන් පච්චය වේයයි මෙසේ පච්චය දෙකක් ආවේය. එහි 'නාරම්මණ පච්චය' යයි මෙසේ එක් පච්චයක් ප්‍රතික්ෂේප කළද ඉතිරිය පච්චය වශයෙන් ඒ ප්‍රශ්නය ලබයි. ඒ පච්චය දෙකෙහි ප්‍රතික්ෂේප කළ කල්හි ඒ වාරය නවතී. මෙසේ යම් ප්‍රශ්නවල තුන සතර පහ හත හෝ ලබයි. ඒවා හැර ප්‍රතික්ෂේප කළ පච්චයන් අවසේසයන්ගේ වශයෙන් ඒ ප්‍රශ්න ලබයි. සියළු පච්චයවල ප්‍රතික්ෂේප කළ සියළු වාර නවතී. මෙයම මෙහි ලක්ෂණයයි. මේ ලක්ෂණයෙන් මුල පටන් ඒ ඒ ප්‍රශ්නවල හකුළුවා කියන ලද නයවල ප්‍රභේද ද ඒ ඒ පච්චනීයෙහි ඒ ඒ ප්‍රශ්නයන්ගේ පිරිහීමද දතයුතුය.

එහි විස්තර කථාව මෙසේය. පළමු ප්‍රශ්නයෙහි පච්චය තුනකින් එකුන් විසි පච්චයන් දක්වන ලදී. කෙසේද? කුසලය කුසලයට පුරේජාත පච්ඡාජාත විපාක විප්පයුත්ත පච්චය නොවේ. සෙසු විසි පච්චය වේ. ඒවායින් ආරම්මණ පච්චය තනිව. සහජාතයෙහි වනාහි සර්ව සංග්‍රාහික වශයෙන් පසළොස් පච්චය සංග්‍රහ වේයයි කියන ලදී. ඒවායින් හේතු පච්චයෙහි ප්‍රතික්ෂේප තුදුස වන්නේය. කුසලය වනාහි කුසලයට විපාක පච්ච නොවේ. විප්පයුත්ත පච්චය නොවේ. ඒ දෙක ඉවත්කර සෙසු දොළොස සඳහා සහජාත පච්චයෙන් පච්චය වේ යයි කියන ලදී. උපනිස්සය පච්චයෙහි ද සබ්බ සංගාහික වශයෙන් පච්චය නවයක් සංග්‍රහ වේයයි කියන ලදී. ඒවායින් අධිපතිභූත ආරම්මණ පච්චය ආරම්මණ භූත අධිපති පච්චය ආරම්මණ උපනිස්සය වශයෙන් උපනිස්සයේම පිවිසියේය. කුසලය වනාහි කුසලයට නා නා ක්‍ෂණික කම්ම පච්චය නොවේ යයි එය ඉවත්කර සෙසු හය සඳහා උපනිස්සය පච්චයෙන් පච්චය වේයයි කියන ලදී. මෙසේ පළමුවන ප්‍රශ්නයෙහි පච්චය තුනකින් එකුන් විසි පච්චය දක්වන ලදැයි දතයුතුය. ඒවායින් මේ හේතුපච්චනීයෙහි **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස න හෙතු පච්චයෙන පච්චයො** 'දන් දී සිල් සමාදන් වී පෙහෙවස් කම් කොට එය නැවත සිහිකරයි. පෙර පිරිසිදුව පුරුදු කරන ලදැයි ප්‍රතික්ෂේප කරයි' මේ ආදියෙන් ආරම්මණ පච්චයාදියෙහි කියන ලද නයින්ම උපුටා පෙළහි දැක්විය යුතුය. ආරම්මණ පච්චයෙහි වනාහි ප්‍රතික්ෂේප කළ එහි විස්තර හැර හේතුපච්චය විස්තර බහා එයම පෙළ දැක්විය යුතුය. සෙසු පච්චය ප්‍රතික්ෂේපවල ද මෙම නයම වේ. එහි වනාහි පච්චය ප්‍රතික්ෂේප කළ කල්හි යම් වාරයක් පිරිහේද එය පසුව කියමු.

දෙවන ප්‍රශ්නයෙහි වනාහි පච්චය දෙකකින් පච්චය තුනක් දක්වන ලදී. කෙසේද? කුසලය අකුසලයට අනන්තරාදි වශයෙන් පච්ච නොවේ. එහෙයින් ඒවා ඉවත්කර ආරම්මණ උපනිස්සය වශයෙන් ආරම්මණාධිපතිද සංග්‍රහ කරන ලදී. ප්‍රකෘති උපනිස්සය සඳහා උපනිස්සය පච්චයෙන් පච්චය වේ යයි කියන ලදී. එහෙයින් සුද්ධ ආරම්මණ පච්චය ආරම්මණාධිපති වශයෙන් අධිපති පච්චය උපනිස්සය පච්චය යයි දෙවන ප්‍රශ්නයෙහි පච්චය දෙකකින් මේ පච්චය තුන දක්වන ලදැයි දතයුතුය.

තුන්වන ප්‍රශ්නයෙහි වනාහි පච්චය පහකින් පච්චය අටළොසක් දක්වන ලදී. කෙසේද? කුසලය අබ්‍යාකතයට අඤ්ඤමඤ්ඤ පුරේජාත

ආසේවන විපාක සම්පයුත්තවලින්ම පච්චය නොවේ. සෙසු එකුන් විස්සෙන් වේ. ඒවායින් ආරම්මණ පච්චය තනිව. යම්හෙයකින් වනාහි කුසලය අබ්‍යාකතයට අඤ්ඤමඤ්ඤ විපාක සම්පයුත්ත වශයෙන් පච්චය නොවේ. හේතු පච්චය ප්‍රතික්ෂිප්තය. කම්ම පච්චය වෙන්ව ගන්නා ලදී. එහෙයින් මේ පහ ඉවත්කර සහජාතයෙන් පච්චය දහයක් දක්වන ලදී. උපනිස්සයෙන් යට කියන ලද සය ආසේවන හැර සෙසු පහ පච්ඡාජාතය තනිව, එසේ සහජාත නා නා ක්‍ෂණික වශයෙන් ධම්ම පච්චය දෙක ද මෙසේ තුන්වන ප්‍රශ්නයෙහි පච්චය පහකින් මේ අටළොස් පච්චය දක්වන ලදී.

සිව්වන ප්‍රශ්නයෙහි එක් පච්චයකින් වනාහි දහයක් කෙසේද? කුසලය කුසල අබ්‍යාකතයට සහජාතයෙහි කියන ලද පසළොසෙහි අඤ්ඤමඤ්ඤ විපාක සම්පයුත්ත විප්පයුත්තවලින් පච්චය නොවේ. හේතු පච්චය ප්‍රතික්ෂිපතය. මෙසේ මේ පහ ඉවත්කර සෙසු දහය මෙහි එක් පච්චයකින් දක්වන ලදැයි දතයුතුය. මේ කුසලාදික සතරෙහි යම්සේද එසේ අකුසලාදික ප්‍රශ්න සතරෙහි ඒ ඒ පච්චයවලින් ඒ ඒ පච්චය දක්වන ලදැයි දතයුතුය.

ඉක්බිති අබ්‍යාකතාදි ප්‍රශ්න තුනේ පළමුවන ප්‍රශ්නයෙහි පච්චය සතකින් පච්චය විසිතුනක් දක්වන ලදී. කෙසේද? අබ්‍යාකතයට සූවිසි පච්චයවලින් පච්චය වේ. හේතු පච්චය ප්‍රතික්ෂේප කළ කල්හි තෙවිස්සක් වේ. ඒවායින් ආරම්මණ පච්චය තනිව. යම්හෙයකින් මෙහි සහජාත නොවූවන්ගේ ද සංග්‍රහණය පිණිස ආහාර ඉන්‍ද්‍රිය පච්චය වෙනම ගන්නා ලදී. එහෙයින් මේ තුන ඉවත්කර සහජාතයෙන් පච්චය දොළොසක් දක්වන ලදී. උපනිස්සයෙන් යට කියන ලද සය. පුරේජාත එකක්ව. එසේ පච්ඡාජාත ආහාර ඉන්‍ද්‍රිය පච්චය යයි මෙසේ මෙහි පච්චය සතකින් මේ තෙවිසි පච්චය දක්වන ලදැයි දතයුතුය.

දෙවැන්නෙහි පච්චය තුනකින් පච්චය දොළොසක් දක්වන ලදී. කෙසේද? ආරම්මණ පච්චය එකකි. උපනිස්සයෙන් වනාහි ආරම්මණ උපනිස්සය වශයෙන් ආරම්මණාධිපති අනන්තර සමනන්තර නත්‍ථි විගත උපනිස්සය පච්චයයි හය දක්වන ලදී. පුරෙජාතයෙන් පුරේජාත නිස්සය විප්පයුත්ත අත්‍ථි අවිගත පහ යයි මෙසේ පච්චය තුනකින් මේ දොළොස් පච්චය දක්වන ලදැයි දතයුතුය. තුන්වැන්නෙහි ද මෙම නයම වේ.

ඉන්පසුව දුක මූලකයන්ගේ ප්‍රශ්න සතරේ පළමුවන ප්‍රශ්නයෙහි 'සහජාත පච්චයෙන් පුරෙජාත පච්චයෙන්' යයි නොකියා 'සහජාත පුරෙජාත' යයි දෙකක් කියන ලද බැවින් නිස්සය අත්‍ථි අවිගත වශයෙන් පච්චය තුනක් දක්වන ලදී. කුසල ඛන්‍ධ වස්තුව සමග එක්වීමෙන් කුසලයේ පච්චයභාවය සිදුකරමින් කිසියම් සහජාතද, සහජාත පච්චය වනාහි නොවේ. වස්තු මිශ්‍ර බැවිනි. එහෙයින් ඒ සහජාතයන්ගේ නිස්සය අත්‍ථි අවිගතයන්ගේ වශයෙන් සහජාත යයි කියන ලදී. වස්තුවද මෙම නයම වේ. එයද කිසියම් පුරෙජාත. ඛන්‍ධ මිශ්‍ර බැවින් වනාහි පුරෙජාත පච්චය නොවේ. කෙවල වූ පුරෙජාත නිස්සයාදීන්ගේ වශයෙන් පුරෙජාත යයි කියන ලදී.

දෙවන ප්‍රශ්නයෙහි 'සහජාත පච්ඡාජාත ආහාර ඉන්‍ද්‍රිය' යයි කියන ලද සතරින් ද සහජාත නිස්සය අත්‍ථි අවිගත වශයෙන් පච්චය සතර දක්වන ලදී. මේ වාරයෙහි සහජාත පච්චය ලැබේ. පච්ඡාජාත පච්චයාදිය නො ලැබේ. පච්ඡාජාතයන්ගේ වනාහි ආහාර ඉන්‍ද්‍රිය සංඛ්‍යාත අත්‍ථි අවිගත වශයෙන් මෙය කියන ලදී. කුසල ඛන්‍ධ අබ්‍යාකතද මහාභූත උපාදා රූපයන්ගේ සහජාත පච්චයෙන් නිස්සය පච්චයෙන් අත්‍ථි අවිගත පච්චයවලින් සතරාකාර පච්චය වේ. පච්ඡාජාත වනාහි කුසල ඒ භූත සමග ඒවායේම උපාදා රූපයන්ගේ අත්‍ථි අවිගත වශයෙන් පච්චය වේ. කබලීකාර ආහාරයද පච්ඡාජාත කුසලය සමග පුරේජාත කයේ අත්‍ථි අවිගත වශයෙන්ම පච්චය වේ. රූප ජීවිතේන්‍ද්‍රිය ද පච්ඡාජාත කුසලය සමග කටත්තා රූපයන්ගේ අත්‍ථි අවිගත පච්චයෙන්ම පච්චය වේ. මෙසේ මෙම සතරාකාර පච්චයභාවය සඳහා 'සහජාත පච්ඡාජාත ආහාර ඉන්‍ද්‍රියං' යයි මෙය කියන ලදී. මෙහි පච්ඡාජාත ආහාර ඉන්‍ද්‍රිය පච්චය වනාහි නො ලැබේමය. පසුව අකුසල මිශ්‍ර ප්‍රශ්න දෙකේ ද මෙම නය වේ. මෙසේ මෙහි ඒ ඒ ප්‍රශ්නවල සංක්‍ෂේප කොට කියන ලද පච්චයන්ගේ ප්‍රභේද දතයුතුය. ඒ ඒ පච්චයෙහි ඒ ඒ ප්‍රශ්නවල පරිහානිය අපරිහානිය පසුව ප්‍රකට කරන්නෙමි.

**පච්චයුද්ධාරස්ස අර්ථ වර්ණනා**

**නිමි.**

දැන් 'එතෙ කුසලො ධම්මා කුසලස්ස ධම්මස්ස' යනාදිය අනුලෝම වශයෙන් පසළොස් වාරයක් දක්වන ලදී. යම්සේ පච්චනීයෙහි ද මේවාමය. මෙයින් උඩ නොවේ. පහළ නොවේ. එහෙයින් යම් යම් පච්චයට පච්චනීයෙහි යම් යම් වාර ලබාද ඒ ඒවා මුල පටන් ගණන වශයෙන් දැක්වීමට **න හෙතුයා පන්නරසා** යනාදිය අරඹන ලදී. එහි 'න හෙතුයා සියල්ල ද යම්සේ දක්වන ලද පච්චයන්ගේ වශයෙන් පසළොස ලබයි. නාරම්මණ සහජාතයෙහි හේතුපච්චය පිවිසේ. ඒ ඒ වාරයෙහි සුද්ධ ආරම්මණ පච්චය පිරිහෙයි. සෙසු පච්චය වශයෙන් ඒ වාර විසඳුම් ලයි. නාරම්මණයෙහි යම්සේද මෙසේ සෙසු ඒවායෙහිද සහජාතයෙහි හේතුපච්චය පිවිසෙයි. ඒ ඒ වාරයේ ද න උපනිස්සයේ අනන්තර යයි මෙසේ පච්චනීයෙන් සිටියේ පච්චය පිරිහෙයි. අවසේස පච්චය වශයෙන් ඒ ඒ වාර විසඳුම් ලබයි. න සහජාතයෙහි කුසල ධර්මය කුසලයට ද අබ්‍යාකතයට ද, අකුසල ධර්මය අකුසලයට ද අබ්‍යාකතයටද කුසලද අබ්‍යාකතද ධම්ම කුසලයට ද අකුසලද අබ්‍යාකතද ධම්ම අකුසලයටදැයි මේ වාර සතර පිරිහෙයි. මේවායේ පළමු දෙක සහජාත පච්චයෙන් පච්චය වේ යයි එකොළොස් පච්චයන් ගේ වශයෙන් එකම පච්චය සංග්‍රහ කියන ලදී. ඒවා එහි ප්‍රතික්ෂිප්ත වූ කල අන්‍ය ආකාරයකින් විසඳුම් නො ලබයි. අවසාන දෙකෙහි නිස්සය අත්ථි අවිගත පච්චය සඳහා 'සහජාතං පුරෙජාතං' යයි කියන ලදී. ඒවා සහජාතය ප්‍රතික්ෂේප කළ කල්හි අවසේස හේතු ආදියේ ද පුරෙජාතයන්ගේ ද නිස්සය අත්ථි අවිගතයන්ගේ වශයෙන් විසඳුම් නොලබයි. මේ වාර සතරද පිරිහෙයි. අවසේසයන්ගේ වශයෙන් එකොළොස කියන ලදී. එහි හේතු ප්‍රතික්ෂේප කළා සේ සෙසු අධිපති ආදීන්ගේ වශයෙන් ඒ වාර ලදී. මෙසේ සහජාතය ප්‍රතික්ෂේප කළ කල්හි අවසේස හේතු ආදීන්ගේ වශයෙන් කුමක් නිසා නොලබාද? වෙනම බැවිනි. හේතු ආදිය සහජාතයන්ගේ ඒකදේස පමණකින් සප්පදේසය. එහෙයින් ඒවා ප්‍රතික්ෂේප කළ කල්හි අන්‍යයන්ගේ වශයෙන් ඒ වාර ලබයි. සහජාතය වනාහි වෙනම සියළු හේතු ආදිය ගනී. එහෙයින් එය ප්‍රතික්ෂේප කළවිට ඒ සියල්ල ප්‍රතික්ෂේප කළා වේ. අසහජාත හේතු පච්චය ආදිය නම් නැත. මෙසේ සහජාතයේ වෙනම බැවින් එය ප්‍රතික්ෂේප වූ විට සියළු ඒ වාර දෙකම නොලැබේ. **සහජාතං පුරෙජාතං** විසඳූ වාරවල කිසිම සහජාත පච්චයෙක් නැත. යම්සේ මෙහි සහජාත මෙන් අරූප ස්කන්ධ නිස්සය අත්ථි අවිගත වශයෙන් පච්චය වේ. සහජාතය ප්‍රතික්ෂේප වූ විට ඒකාන්තයෙන් සහජාත නිස්සය අත්ථි අවිගත ප්‍රතික්ෂේප වේ. එහෙයින් එය ප්‍රතික්ෂේප කළ බැවින් ඒ වාරද

නොලැබේ. මෙසේ මෙහි මේ වාර සතර සියළු ආකාරයෙන් පිරිහේ. අවසේසන්ගේ වශයෙන් එකොළොස කියන ලදී. අඤ්ඤමඤ්ඤ නිස්සය න සම්පයුත්තයෙහිද ඒ වාරම පිරිහේ. කුමක් හෙයින්ද, සහජාත ගත් බැවිනි.

අරූප සහජාත පච්චය යම්සේ වෙන් වූ සතර අරූප ස්කන්ධ ගනී. එසේ අඤ්ඤමඤ්ඤ නිස්සය සම්පයුත්ත ද සහජාත ගතික බැවින් මේවායේ ද ප්‍රතික්‍ෂෙප වූ බැවින් ඒ වාර නොලබයි. එයින් කියන ලදී. **න අඤ්ඤමඤ්ඤ එකාදස, න නිසසයෙ එකාදස, න සමපයුතෙත එකාදස** මේ කිසිවක් අවිසේසයෙන් කුසලාදි භේද සතර ස්කන්ධයන්ගේ සංගාහක බැවින් සහජාතගතික වේ. කුසලය කුසලාබ්‍යාකතයට සහජාත පච්චය හැර අන් ආකාරයකින් පච්චය නොවේ. එහෙයින් එය ප්‍රතික්‍ෂෙප වූ විට ඒ වාරය පිරිහේ. කුසලය වනාහි කුසලාබ්‍යාකතයේ අඤ්ඤමඤ්ඤ පච්චය නොවේ. එය ප්‍රතික්‍ෂෙප වූ විට ඒ වාරය කුමක් නිසා පිරිහේද? අඤ්ඤමඤ්ඤ පච්චය ධර්ම වශයෙන් පැවති ස්වභාවයෙන්. කුසලා බ්‍යාකතා කුසලයට සහජාත පච්චය යම්සේ නොවේද. සහජාත ධම්ම වශයෙන් නිස්සයාදි පච්චයවලින් පැවති ස්වභාවය නිසා ඒ වාරය පිරිහේ. **න අඤ්ඤමඤ්ඤ පචචයෙන පචචයො** පදයේ මේ අර්ථය යම් ධර්මයක් අඤ්ඤමඤ්ඤ පච්චයේ සංග්‍රහ වීද ඒවායින් පච්චය නොවේ. කුසලයද කුසලාබ්‍යාකතවල සහජාතාදි වශයෙන් පච්චය වන්නේ අඤ්ඤමඤ්ඤ පච්චය ධර්මයේම පච්චය වේ. එහෙයින් එය ප්‍රතික්‍ෂේප වූ විට ඒ වාරය පිරිහේ. ඒ වාරය යම්සේද, එසේ සෙසු තුන යයි ඒ වාර සතරද පිරිහේ. **න නිසසයෙ ඒකාදස** මෙහිද යම්සේ ඒ වාරවල ඒකාන්තයෙන් සහජාත පච්චය ධර්මයම නිස්සය වූ, එහෙයින් නිස්සය ප්‍රතික්‍ෂේප වූ විට පිරිහේ. **න පුරෙජාත තෙරස** සහජාත පුරෙජාතං යයි කියන ලද විසඳුමේ දුමූලකයෙහි දෙක ඉවත්කර තෙළෙස, යම්සේ ඒ සහජාතය ප්‍රතික්‍ෂේප වූ විට පුරෙජාතයේම නිස්සය අත්‍ථි අවිගතයන්ගේ වශයෙන් විසඳුම් නොලැබේ. එසේ පුරෙජාතයේ ද ප්‍රතික්‍ෂේප වූ විට සහජාතයේම නිස්ස අත්‍ථි අවිගතයන්ගේ වශයෙන් විසඳුම නොලැබේ. එහෙයින් ඒවා ඉවත්කර තෙළෙස යයි දතයුතුය.

**න පචඡාජාතෙ පනතරස** මෙහි 'පචඡාජාත පචචයෙන පචචයො' යයි හෝ 'සහජාතං පචඡාජාතං ආහාර ඉන්‍ද්‍රියං' හෝ ආ තැන්වල පච්ඡාජාත හැර අවසේස වශයෙන් ඒවා ප්‍රශ්න ලබයි. එහෙයින් පසළොසම

කියන ලදී. න කමෙම යනාදියෙහි යම්සේ කම්ම විපාක ආහාර ඉන්ද්‍රිය ඣාන මග්ග ද කුසලාදි භේද සතර ස්කන්ධයන්ගේ ඒකදේසයක්ම, එහෙයින් ඒ ධර්ම හැර අවසේස ධර්ම වශයෙන් සහජාත ධර්මය පච්චය වේ. එක ප්‍රශ්න විසඳුමක් නො පිරිහේ. **න සමපයුතෙත එකාදස** යම්හෙයින් ඒ වාර සතරෙහි සම්පයුත්ත ධම්ම සහජාතාදි පච්චයෙන් පච්චය වේ. එහෙයින් සම්පයුත්ත පච්චය ප්‍රතික්ෂේපයෙන් ඒ වාරම පිරිහේ යයි දතයුතුය. **න විපපයුතෙ නවා** දූ මූලක ඒක අවසාන සතර, ඒක මූලක දුකාවසාන දෙකදැයි මේ වාර හය ඒකාන්තයෙන් විප්පයුත්ත පච්චය ධර්මයෙහි යුක්තය. ඒවා 'සහජාතාදි වශයෙන් පච්චය වේ. එහෙයින් විප්පයුත්ත ප්‍රතික්ෂේප වීමෙන් ඒ සියල්ල පිරිහේ යයි නවයම ලැබේ. එයින් කියන ලදී. 'න විපපයුතෙත නවා' නො අත්‍ථිනො අවිගතවලද ඒවාම දතයුතුය. ඒකාන්තයෙන් ඒ වාර අත්‍ථි අවිගත පච්චය ධම්ම දතයුත්තය. එහෙයින් ඒවා ඒවායේ ප්‍රතික්ෂේපයෙන් පිරිහේ. යමක් ලබාද ඒවායෙහි ආරම්මණ වශයෙන් හෝ අනන්තරාදි වශයෙන් හෝ විසඳීම් කළයුතුය. සහජාත පුරෙජාත පච්ඡාජාත ආහාර ඉන්ද්‍රිය භේදයෙන් පසේ අත්‍ථි අවිගතයන්ගේ විප්පයුත්ත ධර්මයන්ගේ වශයෙන් හෝ නොකළ යුතුය.

මෙසේ පච්චනීයෙහි ලැබූ වාරයේ ගණන දක්වා දැන් දූමූලකාදි වශයෙන් පච්චය ගණන දැක්වීමට **න හෙතු පචචයා නාරමමණෙ පනතරසා** යනාදිය අරඹන ලදී. එහි නහෙතු මූලක දුකවල අතිරේක ගණන අඩු ගණන සමග යෙදීමෙන් අඩු ගණනම වේ. තිමූලකයෙහි **න උපනිසසයෙ** තෙරස යයි කුසලය 'අකුසලයට අකුසලය කුසලට' යයි වාර දෙක පිරිහෙයි. කුමක් නිසාද? නාරම්මණය සමග න උපනිස්සය ගැටුණු බැවිනි. ආරම්මණ වශයෙන් උපනිස්සය වශයෙන් ද මේවායේ පවතී. ඒ දෙක ද ප්‍රතික්ෂිප්තය. ආරම්මණාධිපති ද ආරම්මණා උපනිස්සය ගැනීමෙන් ගන්නා ලද්දේ වේ. ස මූලකයෙහි ද **න උපනිසසයෙ තෙරසා** ඒ තෙළෙසම.

සත් මූලකයෙහි වනාහි න උපනිසසයෙ සතත න සහජාතය සමග ගැටුණු බැවින් එහි පිරිහුණු සතර සමග කුසලය කුසලයට, කුසලය අකුසලට අකුසලය අකුසල කුසලයට යයි මේ අනන්ත රූපනිස්සය ප්‍රකෘති උපනිස්සය වශයෙන් පවතින සතරයයි අට පිරිහේ. එහෙයින් අවසේසයන්ගේ වශයෙන් සතයයි කියන ලදී. **න පුරෙජාතෙ එකාදස** ඒ එකොළොසෙහි සහජාත පච්ඡාජාත ආහාර ඉන්ද්‍රිය යයි ලැබූ විසඳුම්වල

දූ මූලකයෙහි අබ්‍යාකත කෙළවර වාර දෙක ඉවත්කර ඒවායින් සහජාත ප්‍රතික්ෂේප වූ කල්හිද පච්ඡාජාත වශයෙන් නොපිරිහිණ. සහජාතය සමග පච්ඡාජාත ප්‍රතික්ෂේප වූ කල පිරිහේ යයි සෙස්සන්ගේ වශයෙන් නවයයි කියන ලදී. අට මූලකයෙහි **න නිසසයෙ එකාදස** සියල්ල යට කියන ලද්දට සමානය. නව මූලකයෙහි **න උපනිසසයෙ පඤ්ච** කුසලාදිය අබ්‍යාකත අන්තකොට ඇති දූමූලක අබ්‍යාකත අන්ත දෙකදැයි පහ. ඒවායෙහි නා නා ක්ෂණික කම්ම ආහාර රූප ජීවිතේන්ද්‍රිය පච්ඡාජාත ධර්ම වශයෙන් විසඳුම දතයුතුය. දස මූලකයෙහි **න පුරෙජාත පඤ්ච** යනාදියෙහි ද ඒවාමය. **න පචඡාජාතෙ තීණි** පච්ඡාජාත වශයෙන් ලබමින් දූමූලක අබ්‍යාකත කෙළවර දෙක හැර අවසේස. න විප්පයුත්තයෙහි ද ඒ තුනම. නො අත්ථියෙහි දෙකයයි නා නා ක්ෂණික කම්ම වශයෙන් කුසලයද අකුසලයද කටත්තා රූපයට. මෙහි විපාකය වනාහි න උපනිස්සය සමග ගැටුණු බැවින් නොලැබේ. එකොළොස් වන මූලකයෙහි යට කියන ලද සමාන ගණන වේ. දොළොස්වන මූලකයෙහි **න කමෙම එකං** අබ්‍යාකතයෙන් අබ්‍යාකතය. එහිද ආහාර ඉන්ද්‍රිය වශයෙන් විසඳුම දතයුතුය. තෙළෙස් මූලකාදියෙහි ද සියළු තැන **එකං** යයි ආ තැන මෙයම ගතයුතුය. ඉන්ද්‍රිය වශයෙන් විසඳුම දතයුතුය න ඉන්ද්‍රිය ආහාර වශයෙන්. තුදුස් මූලකාදියෙහි න කමම සමග ගැටුණු බැවින් නො අත්ථි අවිගත නොලැබේ යයි කියන ලදී. **න හාර පචචයා නඣාන පචචයා** න ඉන්ද්‍රිය ඉවත්කර කියන ලදී. එහෙයින් එහි ඉන්ද්‍රිය වශයෙන් එක යයි දතයුතුය. **නවිපාක පචචයා න ඉන්ද්‍රිය පචචයා** නාහාරය ඉවත්කර කියන ලදී. එහෙයින් එහි ආහාර වශයෙන් එක යයි දතයුතුය. මේ පච්චනීය දෙකෙහි සිටි ගණන නම් නැත. එහෙයින් එක යයි නොදක්වන ලදී.

**න හෙතුක මූලක නිමි.**

නාරම්මණ මූලකාදියෙහි ද තෙළෙස එකොළොස නවය යයි සියළු දූකවල මූළ ගණන සතරම වේ. තිකාදියෙහි වනාහි බුහු පස සමායෝගයෙහි ඉතිරි හත පහ තුන දෙක එක යයි පිරිසිඳින ගණනින් විසඳුම් ලබාමය. ඒවායින් යම් පච්චයවල සමායෝගයෙහි යම් යම් ලබයිද ඒ ඒවා යට කියන ලද නයින් මනාව සලකා ඉදිරිය යුතුය. සියළු චේතනාරම්මණ මූලකාදියෙහි නාරම්මණ පද ඉක්මවමින් හේතුපදය සමග පළමුව බැඳුණු චක්ඛු ආදිය කරන ලදී. යම්හෙයකින් වනාහි න

හෙතු මූලකයෙහි කියන ලද සමානවම වේද එහෙයින් විස්තර වශයෙන් නොදක්වා සංක්ෂේප කොට දක්වන ලදී. එහි යම්සේ නහෙතු මූලකයෙහි නාරම්මණ නඋපනිස්සය වෙනම පසළොස්වන වාරයෙහි ලබන්නේද සමායෝගයෙහි තෙළෙස ලැබීය. මෙසේ සියළු තැන තෙළෙසම ලබයි. යම්සේ නාරම්මණ සහජාත සමග න උපනිසසයෙහි සත්වර වේද මෙසේ න උපනිස්සය නාරම්මණ සමග න සහජාතයෙහි සත. **න නිසසය පච්චයා නඋපනිසසය පච්චයා න පච්ඡාජාතෙ තීණි** කුසලාදිය අබ්‍යාකත අන්ත. ඒවායින් කටත්තා රූපද ආහාර සමුට්ඨානයද පච්චය උප්පන්නයද. නාහාර න ඉන්‍ද්‍රිය මූලක චතුක්කවල න කම්මය සමග නොගැටුණු බැවින් නහෙතු මූලකයෙහි මෙන් ඒකාන්තයෙන් ලබයි. න ඉන්‍ද්‍රිය මූලකයෙහි න උපනිස්සයෙහි ද න පුරෙජාතයෙහි ද නාහාරය හැර තුන යයි කළයුතුය. න ඉන්‍ද්‍රිය පච්චයෙන් මේ පච්චය දෙක ගටා නඉන්‍ද්‍රිය පච්චය..........න උපනිස්ස පච්චය නාහාරයෙහි තුන, න ඉන්‍ද්‍රිය පච්චය.......න පුරෙජාත පච්චය නාහාරයෙහි තුන යයි මෙසේ මේ පච්චය සමග නාහාර පච්චයෙහිද ගණන කළයුතුය යන අර්ථයයි. එහි **තීණි** යයි කුසලාදියම අබ්‍යාකතයට. එහි කුසල අකුසල කටත්තා රූපයන්ගේ පුරෙජාතයේ ද කයට පච්ඡාජාත පච්චයෙන්. අබ්‍යාකත වනාහි චිත්ත චෛතසික පච්ඡාජාත පච්චයෙන්ම යයි මේවායේ වශයෙන් විසඳුම් තුන දතයුතුය. පසුව වනාහි න පච්ඡාජාතය සමග ගැටුණු බැවින් නාහාරයෙහි කෙ යයි කියන ලදී. එහි කටත්තා රූප වශයෙන් කුසලය අබ්‍යාකතයට, එසේ අකුසලයයි මෙපමණක්ම ලබයි. ආහාරයේ ප්‍රතික්ෂෙප කළ බැවින් කබලීකාර ආහාරය අත්‍ථි අවිගත වශයෙන් ද පච්චයභාවය නොලබයි. න විප්පයුත්ත මූලකයේ චතු මූලකයෙහි **න උපනිසසයෙ පඤ්ච** කුසලය සහජාත කුසලයට කුසලය කටත්තරූප සංඛ්‍යාත අබ්‍යාකතයට අකුසලය සහජාත අකුසලයට එසේ කටත්තා රූප සංඛ්‍යාත අබ්‍යාකතයට, අබ්‍යාකතය සහජාත අබ්‍යාකතයටදැයි මෙසේ පහ. **න විපපයුතත පච්චයා.... න උපනිසසයෙ තීණි** යයි යට කියන ලද නයින්ම කුසලාදි තුන අබ්‍යාකතයට. **නො අත්‍ථි පච්චයා නහෙතුයා නවා** න හෙතු පච්චය නො අත්‍ථිය කියන ලද නවයම සියල්ලද ඒකමූලක ඒක අවසාන අනන්තර ප්‍රකෘති උපනිස්සය වශයෙන් ලබයි. **නාරමමණෙ නවා** ඒවාම නාරම්මණයෙහි සිට න උපනිසසයෙහි දෙක කළයුතුය. යාව **නිසසයමපි** නො අත්‍ථි මූලක නයෙහි නො අත්‍ථි පච්චය නහෙතු පච්චය නාරම්මණ පච්චය යයි මෙසේ චක්‍රබන්ධ ගණයෙන් නාරම්මණ පච්චයෙහි සිට මේ තුනෙන් මෙයින් පසු නාධිපති ආදියෙහි එක්තරා එකකින් හෝ සමග

නිස්සය පච්චය දක්වා පැමිණේද එතෙක් සිට න උපනිස්සයෙහි දෙක විසඳීම කළයුතුයයි යන අර්ථය වේ. මෙසේ ලක්‍ෂණ හැර නැවත නාරම්මණයේ සිට නිස්සය දක්වා පච්චය සතක් ගෙන න උපනිසසයෙ දෙව යයි කීහ. එහි නො අත්‍ථි පච්චය නහෙතු පච්චය නාරම්මණ පච්චය න උපනිස්සයෙහි දෙක, 'නො අත්‍ථි පච්චය නහෙතු නාරම්මණාධිපති පච්චය න උපනිස්සයෙන් දෙක' යයි. මෙසේ නාරම්මණයෙන් පෙර පසුව නිස්සය අවසානයෙහි සියළු පද සමග යෙදීම කළයුතුය. දෙව යයි මෙහි කුසලය අබ්‍යාකතයට, අකුසලය අබ්‍යාකතයටදැයි නා නා ක්‍ෂණික කම්ම වශයෙන් කටත්තා රූපයට පච්චය වශයෙන් දතයුතුය. නඋපනිස්සය පදය සමග න පුරෙජාතාදියෙහි සියළු තැන දෙක, මෙහි කම්ම පච්චය වනාහි නොගන්නා ලදී. එය ගත් කල ඒවාර කැඩේ. විසඳුමම නො ලැබේ. මෙසේ යමකින් යමකින් සිට යමකින් යමකට සැසඳීමෙන් යමක් ලබයිද යමක් පිරිහෙයිද ඒ සියල්ල මනාව සලකා සියළු පච්චනීයෙහි ගණන ඉදිරිය යුතුය.

පච්චනීය නිමි.

අනුලෝම පච්චනීයෙහි 'හේතුවෙහි සහ අරමුණෙහි නවය' මෙසේ අනුලෝමයෙහි 'නහෙතුවෙහි පසළොස නාරම්මණයෙහි පසළොස' යයි මෙසේ පච්චනීයෙහි ලැබූ පච්චය ගණන්වල යම් පච්චයක් අනුලෝම වහයෙන් සිටීද එහි අනුලෝමයෙහි ලැබූ වාර සමග යම් පච්චනීයෙන් සිටි පච්චනීයේ ලැබූ වාරවල සමාන වාර ඒවායේ වශයෙන් ගණන දතයුතුය. අනුලෝමයෙහි හේතු පච්චයේ හේතුවෙහි සත යයි වාර හතක් ලබන ලදී. පච්චනීයෙහි නාරම්මණ පච්චයෙහි නාරම්මණයෙහි පසලොස යයි පසළොස ලැබීය. ඒවායින් හේතුවෙහි සත යයි කියන ලද ඒවා සමග නාරම්මණයෙහි කියන ලද පසළොසෙහි කුසලය කුසලයට අබ්‍යාකතයට කුසලාබ්‍යාකතයට අකුසලය අකුසලයට අබ්‍යාකතයට අකුසලාබ්‍යාකතයට අබ්‍යාකතය අබ්‍යාකතයටදැයි මේ සත හා සමානය. ඒවා සඳහා **හෙතුපචචයා නාරමමණ සතතාති වුතතං නාධිපතියා සතතනි** යනාදියෙහි ද මෙම නයම වේ. න සහජාතයට වනාහි හේතු පච්චයේ අභාවයෙන් න සහජාතයෙහි එකක්වත් නොලැබේ. එහෙයින් එය සමග යෙදීම නොකළේය. න අඤ්ඤමඤ්ඤ කුසලාදි තුන රූපාබ්‍යාකතයට ලැබේ. ඒවා සඳහා **තීණික** යයි කියන ලදී. න සමපයුතතයෙහිද එසේය.

න විපපයුතතයෙහි වනාහි කුසලය කුසලයට අකුසලය අකුසලයට, අබ්‍යාකතය අබ්‍යාකතයටද අරූප ධම්ම වශයෙන් තුන දතයුතුය. න හිසසයට අත්ථියට අවිගත නාසහජාත මෙන් නොලැබේ යයි ඒවා සමග යෙදීම නො කෙළේය. මෙසේ මෙහි සත තුන දෙක ගණන වේ. ඒවායේ වශයෙන් අඩු ගණන සමග අතිරේක ගණනේ ද ගණන පිරිහෙළා පච්චය ගැටීම්වල ගණන දතයුතුය.

එහි හෙතු සහජාත නිසසය අත්ථි අවිගතංති නාරමමණෙ සතත යයි 'කුසල ධර්මය කුසල ධර්මයට හේතු පච්චයෙන් පච්චය වේ. නාරම්මණ පච්චයෙන් පච්චය වේ. කුසල හේතු සම්පයුත්ත ස්කන්ධයන්ට හේතු පච්චයෙන් පච්චය වේ. සහජාත නිස්සය අත්ථි අවිගත පච්චයෙන් පච්චය වේ. නාරම්මණ පච්චයෙන් පච්චය වේ' යයි මෙම නයින් සත් වාරයෙහි ඉදිරිය යුතුය. නාධිපතියා සතත යනාදියෙහි ද මෙම නයම වේ. දෙවන ගැටුමෙහි අඤ්ඤමඤ්ඤයට න සමපයුතත හැර පිවිසි බව සෙසු තුන යයි කියන ලදී. න සමපයුතතයෙහි වනාහි අඤ්ඤමඤ්ඤ විප්පයුත්තය ප්‍රතිසන්ධි නම් රූපය සඳහා එකං යයි කියන ලදී. මෙහි අඤ්ඤමඤ්ඤ පච්චයද අනුලෝම ගැටුමෙහි පිවිසි බැවින් පච්චනීයෙන් නොලබයි. එහෙයින් න අඤ්ඤමඤ්ඤ යයි නො කියන ලදී. මෙහි යම්සේ ද මෙසේ සෙසු ගැටුම්වලද පිවිසි පච්චය පච්චනීයෙන් නොලබයිනොකියන ලදී. තෙවන ගැටුමෙහි සම්පයුත්තයට පිවිසි බැවින් සියළු තැන තුනම වේ. සිව්වන ගැටුමෙහි විප්පයුත්තයට පිවිසි බැවින් කුසලාදි තුන චිත්ත සමුට්ඨාන රූපයට. පහේ විපාකයට පිවිසි බැවින් සියළු තැන එක අබ්‍යාකතයෙන් අබ්‍යාකතය. මෙයින් පසුවද විපාක සම්පයුත්තවල මෙම නයම වේ. හෙතු සහජාත නිසසය ඉන්‍ද්‍රිය මගග අත්ථි අවිගතනති නාරමමණෙ චතතාරි කුසලය කුසලයට, අබ්‍යාකතයට, කුසලාබ්‍යාකතයට, අබ්‍යාකතය අබ්‍යාකතයට යන මේවායේ වශයෙන් දතයුතුය. සෙස්සෙසහි ද මෙම නය වේ. මෙම උපායෙන් සියළු ගැටුම්වල ලැබීම් වශයෙන් ගණන දතයුතුය. සියළුම චේතනා මේ අනුලෝම පච්චනීයෙහි සහජාත වශයෙන් ද ප්‍රකීර්ණක වශයෙන්ද ගැටුම් හාරසිය පසළොසක් කියන ලදී. ඒවායෙහි ඒ ඒ ගැටුමෙහි යමක් අනුලෝම වශයෙන් පච්චය සිටියේ ද ඒවායේ එකකුදු පච්චනීයෙන් නොලබයි. හේතු මූලකයෙහිද පළමු ගැටුමේ අනුලෝමයෙන් පච්චය පහක් සිටි බැවින් පච්චනීයෙන් එකුන් විසි පච්චය ආවේය. මෙසේ සෙස්සෙහි ද අනුලෝමයෙන් සිටි අවසේසා පච්චනීයෙන් ආවේය. මෙහි අනුලෝමයෙන් බොහෝ සිටිකල්හි

පච්චනීයෙන් එක එකම ආවේයයි දතයුතුය. හේතු මූලකයෙහි යම්සේද ආරම්මණ මූලක ආදියෙහිද එසේම සියළු මේ විධාන යථානුරූපව දතයුතුය.

## අනුලෝම පච්චනීය නිමි.

පච්චනීයානුලෝමයෙහි ද 'හෙතුවෙහි සහ අරමුණෙහි නවය' යයි මෙසේ අනුලෝමයෙහි 'න හේතුවේ පසළොස, නාරමමණයෙහි පසළොස' යයි මෙසේ පච්චනීයෙහි ද පච්චයවල ලැබූ ගණන්වල යමක් පච්චනීයෙහි සිටියේද එය පච්චනීයෙන් ලැබූ වාරවල යමෙක් අනුලෝමයෙන් සිටි විට අනුලෝමයෙන් ලැබූ වාරවලින් සමාන වාර වේ. ඒවායේ වශයෙන් ගණන දතයුතුය. පච්චනීයෙහි නහෙතු පච්චයෙහි න හේතුවේ සතළොස යයි පසළොස්වාර ලැබීය. අනුලෝමයෙහි ආරම්මණ පච්චයෙහි ආරම්මණයෙහි නවය යයි නව වාර ලැබීය. එහි යමෙක් නහෙතුවේ පසළොස කියන ලදී. ඒවායෙහි යමෙක් නව වාර ආරම්මණයෙහි කියන ලද බැවින් නවයෙන් සමාන වේ. ඒවායේ වශයෙන් ගණන දතයුතුය. එහි යමෙක් ආරම්මණයෙහි නවය කියන ලද්දේද එයින් හේතුවෙන් කියන ලද පසළොසෙහි කුසලය කුසලය අකුසල අබ්‍යාකතවලට, අකුසලය අකුසල කුසල අබ්‍යාකතවලට, අබ්‍යාකතය අබ්‍යාකත කුසල අකුසලවලට යයි මේ නවයෙන් සමානය. ඒවා සඳහා න හෙතුයා ආරමමණෙ නවා යයි කියන ලදී. අධිපතියා දසා ආදියෙහි ද මෙම නය වේ. ආරම්මණාදියෙහි අනුලෝම ගණනින් යම් වාර කියන ලදද, න හෙතු පච්චය සමග සැසඳීමෙන් ද ඒ සියල්ල ලැබේ යයි දතයුතුය. 'කුසල ධම්මය කුසල ධම්මයට නහෙතු පච්චයෙන් පච්චය වේ. ආරම්මණ පච්චයෙන් පච්චය වේ. දන් දී සිල් සමාදන් වී පෙහෙවස් රැක එය ප්‍රත්‍යවේක්ෂා කරයි. පෙර යහපත් පුරුදු ප්‍රත්‍යවේක්ෂා කෙරේ යයි මේ උපායෙන් ඒවායේ පෙළ ඉදිරිය යුතුය. න හෙතු පචචය අධිපතියා දස මෙහි වීමංසාධිපති හැර සෙසු අධිපති වශයෙන් අනුලෝම විභංගයෙහි ආ වාර ඉදිරිය යුතුය. මෙසේ මෙහි නවය, දහය, හත, තුන, තෙළෙස, එක යයි ගණන සයකි. ඒවායේ වශයෙන් අඩුතම ගණන සමග අතිරේක ගණනේ ද ගණන අඩුකර නහේතු මූලකාදි නයේ තිමූලකාදියේ සියළු සැසඳීම්වල ගණන දතයුතුය. මෙය සාධාරණ ලක්ෂණය. මෙය සියළු සැසඳීම්වල නොවේ. යම් පච්චය සමග යම් පච්චයවල සැසඳීමේ යම්

වාර විරුද්ධ වේද, ඒවා ඉවත්කර අවසේසයන්ගේ වශයෙන් මෙහි ගණන දතයුතුය. **න හෙතු පච්චයා නාරම්මණ පච්චයා අධිපති පච්චයා සතත** මෙහි කුසලය අකුසලයට, අබ්‍යාකතය කුසලයට අකුසලයට යයි මේ ආරම්මණාධිපති වශයෙන් ලබන තුන්වාරය විරුද්ධ වේ. කවර හෙයින්ද? නාරම්මණ පච්චය යයි කියන ලද බැවිනි. එහෙයින් ඒවා ඉවත්කර මෙහි සහජාතාධිපති නයෙන් කුසලය කුසලයට, අබ්‍යාකතයට, කුසලබ්‍යාකතයට, අකුසලය අකුසලයට, අබ්‍යාකතයට, අකුසලාබ්‍යාකතයට, අබ්‍යාකතය අබ්‍යාකතයට යයි සත්වාරය දතයුතුය. ඒවා ද නහෙතු පච්චයා යයි වචනයෙන් වීමංසාධිපති හැර සෙසු අධිපතීන්ගේ වශයෙන්. මෙසේ සියළු තැන ඌනතර ගණන පච්චය වශයෙන් ද අවිරුද්ධ ගණන වශයෙන්ද ගණන දතයුතුය. යම් පච්චයවල යම් පච්චය පච්චනීය වශයෙන් සිටිවිට අනුලෝම වශයෙන් නොසිටී. ඒවා දතයුතුය. කෙසේද? අනන්තරය පච්චනීය වශයෙන් නොසිටී. සහජාතය පච්චනීය වශයෙන් සිටිවිට හෙතු අඤ්ඤමඤ්ඤ විපාක ඣාන මග්ග සම්පයුත්ත අනුලෝම වශයෙන් නොසිටී. නිස්සය පච්චනීය වශයෙන් සිටිවිට වත්‍ථු පුරෙජාත අනුලෝම වශයෙන් නොසිටී. ආහාරය හෝ ඉන්‍ද්‍රිය හෝ පච්චනීය වශයෙන් සිටිවිට හේතු අඤ්ඤමඤ්ඤ විපාක ඣාන මග්ග සම්පයුත්ත අනුලෝම වශයෙන් නොසිටී. ආරම්මණය වනාහි පච්චනීය වශයෙන් සිටිවිට අධිපති උපනිස්සය අනුලෝම වශයෙන් නොසිටී. ආරම්මණාධිපති ආරම්මණූපනිස්සය වනාහි නොලබයි. මෙම උපායෙන් සියළු තැන යමක් ලබයිද යමක් නො ලබයිද එය දැන ලැබීම් වශයෙන් වාර ඉදිරිය යුතුය. එහි සියළු තිමූලකාදියෙහි අනන්තරයෙහි සත ආදියෙහි දුක මූලකයෙහි ලැබූ වාරම වේ. සත් මූලකාදියෙහි වනාහි **න සහජාත පච්චයා නිසසයෙ තීණි** පුරෙජාත වශයෙන් වත්‍ථු නිස්සයෙහි තුන වේ. කම්මයෙහි දෙක නා නා ක්‍ෂණික වශයෙනි. ආහාරයෙහි එක, කබලීකාර ආහාර වශයෙනි. ඉන්‍ද්‍රියෙහි එක, රූප ඉන්‍ද්‍රිය සය වශයෙනි. ක්‍රමයෙන් ගොස්, **විපපයුතෙත තීණි** කුසලාදියේ අබ්‍යාකත කෙළවර පච්ඡාජාත වශයෙනි. **අත්‍ථි අවිගතෙසු පඤ්ච** ඒවා මෙන්ම තුන, කුසලා බ්‍යාකත අබ්‍යාකතයට, අකුසල අබ්‍යාකතය අබ්‍යාකතයටදැයි මේ දෙක, පච්ඡාජාත ආහාර ඉන්‍ද්‍රිය වශයෙනි. පච්ඡාජාත පච්චයේ පච්චනීය භාවයේ සිට **අත්‍ථි අවිගතෙසු එකං** අබ්‍යාකතය අබ්‍යාකතයට. ආහාර ඉන්‍ද්‍රිය වශයෙනි. නාහාර ගත්කල නඉන්‍ද්‍රිය පච්චය ගතයුතුය. න ඉන්‍ද්‍රිය ගත්කල එසේ ආහාර පච්චය, කවර හෙයින්ද? දෙක එකක් වශයෙන් ගත්කල ගිණිය යුතු වාර අභාවයෙන්. ඣාන මග්ගාදියෙහි ද පච්චනීය වශයෙන් සිටි

කල ආහාරයෙන් හෝ ඉන්‍ද්‍රියෙන් හෝ එක අනුලෝමයක් නොකොට අවසානයෙහි ඉන්‍ද්‍රියෙ එකං, අත්‍ථියා එකං, අවිගතෙ එකං, ආහාරෙ එකං, අවිගතෙ එකං යයි කියන ලදී. මෙහි සෙස්ස පැහැදිලි අරුත් වේ.

නහෙතු මූලක නිමි.

නාරම්මණ මූලකාදියෙහි න අඤ්ඤමඤ්ඤ මූලකයෙහි න අඤ්ඤමඤ්ඤ පච්චයා හෙතුයා තීණි අකුසලාදිය චිත්ත සමුට්ඨානයන්ගේ. අධිපතියා අට්ඨ අධිපති කියන ලද දහයෙහි කුසලය කුසල අබ්‍යාකතයට, අකුසලය අකුසල අබ්‍යාකතයටදැයි දෙක ඉවත්කර සෙසු අට. සහජාතෙ පඤ්ච හේතුවෙහි කියන ලද තුන සමග කුසලයද අබ්‍යාකතයද අබ්‍යාකතයට, අකුසලයද අබ්‍යාකතයද අකුසල අබ්‍යාකතයටදැයි මේ දෙක. නිසසයෙ සතත ඒ පහ සමග අබ්‍යාකතය කුසලයට, අබ්‍යාකතය අකුසලයටදැයි මේ දෙක වස්තු වශයෙන්. කමෙම තීණි හේතුවෙහි කියන ලදමය. සෙසු තිකයෙහි ද මෙම නයම වේ. අධිපතියා තීණි යට කියන ලද වේ.

නාහාර මූලකයෙහි අඤ්ඤමඤ්ඤෙ තීණි ආහාර හැර සෙසු චෛතසික වශයෙන් දතයුතුය. යට යම්සේද එසේම මෙහි ද නාහාර නඉන්‍ද්‍රියවල එක එක ගන්නා ලදී. දෙක එකක් වශයෙන් නොවේ. න සමපයුතත පච්චයා හෙතුයා තීණි යයි යට න අඤ්ඤමඤ්ඤයෙහි කියන ලදී. අධිපතියා අට්ඨ යට කියන ලදී.

න විපපයුතත මූලකයෙහි කුසල ආදි චේතනා සහජාත කුසලාදියේ නානා ක්‍ෂණික කුසල අකුසල චේතනා විපාකවල කම්ම සමුට්ඨාන රූපයේ යයි මෙසේ පහ. ආහාර ඉන්‍ද්‍රියවල තුන සහජාත සමානය. ඣාන මග්ග ආදියෙහි තුන හේතු හා සමානය.

නො අත්‍ථි මූලකයෙහි යම්හෙයින් හේතු නො අත්‍ථි නම් නොවේ. නියම වශයෙන් අත්‍ථිමය. එය නොගෙන නාරමමණො නවා කියන ලදී. හෙතු යම්සේ ද අන්‍ය වූද අත්‍ථි පච්චය ලක්‍ෂණ යුක්ත වූයේ මෙහි අනුලෝම වශයෙන් නො සිටී. කමෙම දෙව මෙය වනාහි නානා ක්‍ෂණික කම්ම වශයෙන් කියන ලදී. පච්චනීය වශයෙන් සියල්ල ලබයි. යමක්

වනාහි අනුලෝම වශයෙන් ලැබෙන්නේ ද නොගෙන එයින් පෙර පච්චය පච්චනීය වශයෙන් ගනියි. එය පසුව යෙදීම ලබයි. එහෙයින්ම මෙහි නො අත්‍ථි පච්චයා......... නො අවිගත පච්චයා උපනිස්සයෙ නව මෙහිද එම නයමය. මෙය වනාහි ප්‍රකෘති උපනිස්ස වශයෙන් කියන ලදී. මෙම උපායෙන් සියළු තැන ලැබෙන නොලැබෙන පෙර කියන ලද පසුව කියන ලද්ද ද දතයුතුය.

### පඤ්හ වාරයේ පච්චනීයානුලෝමය නිමි.

### කුසලත්තික පට්ඨානයේ වර්ණනාව නිමි.

වෙදනා ත්‍රිකයෙහි වේදනා තුන රූප තිවන යයි මේ ධම්ම නොලබයි. එහෙයින් එකං ඛන්ධං පටිච්ච ද්වෙ ඛන්ධා යනාදිය කියන ලදී. පටිසන්ධික්ඛණෙ සුඛාය වෙදනාය සහේතුක ප්‍රතිසන්ධි වශයෙන් කියන ලදී. දුක්ඛ වේදනාව ප්‍රතිසන්ධියෙහි නොලබා යයි දෙවන වාරයෙහි ප්‍රතිසන්ධි ග්‍රහණය නොකරන ලදී. තුන්වන වාරයෙහි පටිසන්ධික්ඛණෙ සහේතුක ප්‍රතිසන්ධි වශයෙන් කියන ලදී. මෙහි සෙස්ස මෙයින් පසු පච්චයවල පෙළම පමුණුවයි. සියළු තැන වාර තුන තුන කියන ලදී. එයින් කියන ලදී. හෙතුයා තීණි.......අවිගතෙ තීණි.

පච්චය සැසඳීමේ වනාහි සහේතුක විපාක දුක්වේදනාවේ අභාවයෙන් හේතුමූලක නයෙහි විපාකෙ ද්වෙ යයි කියන ලදී. අධිපති ආදිය සමග සැසඳීමෙහි ද විපාකයෙහි දෙකක්මය. කුමක් නිසාද? විපාකයෙහි දුක් වේදනාවේ අධිපති ඣාන මග්ගවල අභාවයෙන්. යමක් සමග සැසඳීමේ විපාකයෙහි වාර දෙකක් ලබයි. විපාකය සමග සැසඳීමෙහි ඒ දෙකම.

පච්චනීයෙහි න පුරෙජාතයෙහි ආරුප්පයෙහි ද ප්‍රතිසන්ධියද දුක් වේදනාවේ අභාවයෙන් වාර දෙක ආවේය. න විප්පයුත්තයෙහි ද ආරුප්පයෙහි දුක් නැති හෙයින් දෙකමය. සියළු අරූප ධර්ම පරිග්‍රාහක (අයිතිකොට ගන්නා) සහජාතාදි පච්චය මේ පච්චනීය වාරයෙහි පිරිහේ.

කුමක් නිසාද? වේදනා සම්ප්‍රයුක්ත ධර්මයට වේදනා සම්පයුත්ත නිසා සහජාතාදියෙන් වෙන්ව නූපදීමෙන්. පච්ඡාජාත පච්චයෙන් වෙන්වම උත්පත්ති හේතුවෙන්.

පච්චය සැසඳීමේ වනාහි න පුරෙජාතයෙහි එක යයි අරූපයෙහි ද ප්‍රතිසන්ධියෙහි ද අහේතුක අදුක්ඛමසුඛ වේදනා සම්පයුත්තය සඳහා කියන ලදී. **න කම්මෙ දෙව** යයි අහේතුක කිරිය සම්ප්‍රයුක්ත චේතනා වශයෙන් කියන ලදී. සුඛ උපෙක්ඛා වේදනා සම්පයුත්ත ධර්මයන් නිසා ඒ වේදනාවලින් යුත් අහේතුක කිරිය චේතනා උපදී. නහෙතු පච්චය නවිපාකයෙහි ද මෙම නයම වේ. **න විප්පයුත්තෙ එකං** යයි අරූපයෙහි ආවර්ජන වශයෙන් කියන ලදී. මේ උපායෙන් සියළු සැසඳීම්වල ගණන දතයුතුය.

අනුලෝම පච්චනීයෙහි ලද පච්චයම පච්චනීයෙන් සිටී. පච්චනීයානු ලෝමයෙහි සියළු අරූප ධර්ම පරිග්‍රාහක සහජාත ආදිය අනුලෝමයෙන්ම සිටී. පච්චනීයෙන් නොවේ. අහේතුක චිත්තුප්පාදයට වනාහි අධිපති නැතැයි අධිපති පච්චය අනුලෝමයෙන් නොසිටී. පටිච්ච වාර ආදියෙහි වනාහි පච්ඡාජාතය අනුලෝමයෙන් නොලැබීම යයි පිරිහිණි. මෙහි යමක් අනුලෝමයෙන් ලබාද ඒවා පච්චනීයෙන් ලැබෙන ඒවා සමග පෙරළීද යෙදේමය. ඒවායෙහි තුන දෙක එක යයි තුනක්ම වාර පිරිසිඳීම වේ. ඒවා සියළු තැන සුදුසු සේ සැලකිය යුතුය. මේ පටිච්ච වාරයෙහි යමෙක් කියන ලදද සහජාත වාරාදියෙහි ද මේ වර්ණනා නයම වේ.

ප්‍රශ්න වාරයෙහි වනාහි **සම්පයුත්තකානං ඛන්ධානං** යයි එය සමග සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ගේ ඒවා සමගම හෝ හේතුසැප වේදනාවලින් හෝ **විප්පටිසාරිස්ස** දානාදියෙහි (විපිළිසර වන්නේය.) මවිසින් මෙය කරන ලදී. නරක ලෙස මෙය මා කරන ලදී. නොකළේ නම් හොඳ වන්නේ යයි මෙසේ විපිළිසර වන්නේය. ධ්‍යාන පරිහානිය වනාහි ධ්‍යානයෙන් මා පිරිහුනේය. මෙසේ විපිළිසර වන්නේය. **මොහො උප්පජ්ජති** මෝහය දෝස (තරහ) සම්ප්‍රයුක්තය. එසේ **මොහං ආරබ්භ** දෝසයෙන් යුත් මෝහයම. **සුඛාය වෙදනාය සම්පයුත්තං භවංගං අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තස්ස භවංගස්ස** තදාරම්මණ සංඛ්‍යාත පිට භවංගය මූල භවංගයට. මේ දෙකම කුසල අකුසල ජවනයෙන් නැගිටි හෙයින් වුට්ඨාන යයි කියනු ලැබේ. **කිරිය වුට්ඨානස්ස** මෙහිද එම

නයයි. ඵලං වුට්ඨානස්ස ඵල සිත භවංගයට. භවංග ඵලයෙන් නැගියේ වේ. පරතො වුට්ඨානං (අන්‍යයාගෙන් නැගිටි) ආ තැන්වල ද මෙම නයම වේ.

දුක්ඛාය වෙදනාය සම්පයුත්තා ඛන්ධා දොම්නසින් යුත් අකුසල ස්කන්ධ. අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තස්ස වුට්ඨානස්ස තදාරම්මණ සංඛ්‍යාත ආගන්තුක භවංගයට හෝ උපෙක්ඛා සම්පයුත්ත මූල භවංගයට හෝ ඉදින් සොම්නස් සහගත මූල භවංගය වේද තදාරම්මණයට ද උපන් කරුණු නොවේ. ජවනයට අරමුණින් අන්‍ය වූ අරමුණෙහිද අදුක්ඛමසුඛ වේදනා අකුසල විපාකය උපදීමය. එය ද ජවනයෙන් නැගිටි බැවින් 'වුට්ඨානං' යයි කියනු ලැබේ. සහජාත පච්චය නිද්දේස පැහැදිලි අරුත් වේ. එහි කිසිවක් ඇත. යට කියන ලද දැනගැනීමට යමක් නොහැකි වන්නේ නම් එහෙයින් මනාව වෙනස සැලකිය යුතුය.

දැන් යම් යම් පච්චයවල යම් යම් වාර ලැබීය. ඒ සියල්ල සංක්ෂේප කොට ගණන දැක්වීමට හෙතුයා තීණි යනාදිය කියන ලදී. එහි සියළු තුන සුද්ධ තුන පද වශයෙන් දතයුතුය. අරමුණෙහි නවය ඒකමූලකයෙහි ඒක අවසානය වේ. අධිපතියෙහි පහ සහජාත අධිපති වශයෙන් අමිශ්‍ර තුන, ආරම්මණ අධිපති වශයෙන් ද සැපයෙන් යුත් සැපයුත්තට අදුක්ඛම සුඛයෙන් යුත් අදුක්ඛම සුඛයෙන් යුත්තටදැයි දෙක, ඒවා නො ගිණිය යුතුය. සැපයෙන් අදුක්ඛමසුඛය, අදුක්ඛමසුඛයෙන් යුත් සැපය යන මේ දෙක ගිණිය යුතුය. මෙසේ පහ. අනන්තර සමනන්තරෙසු සත්ත සැප දෙකකි. දුක්ද එසේය. අදුක්ඛමසුඛ තුනකි. මෙසේ හත උපනිස්සයෙ නව සුඛ සම්පයුත්තය සුඛ සම්පයුත්තයට උපනිස්සය තුනකින්, දුක්ඛ සම්පයුත්තයට ප්‍රකෘති උපනිස්සයෙන්ම අදුක්ඛමසුඛ සම්පයුත්තයට දෙයාකාරයෙන් අදුක්ඛමසුඛ සම්පයුත්තය අදුක්ඛමසුඛ සම්පයුත්තයට තුන් ආකාරයකින් එසේ සුඛ සම්පයුත්තයට, දුක්ඛ සම්පයුත්තයට අනන්තර ප්‍රකෘති උපනිස්සයෙන්දැයි නවය, අනන්තර උපනිස්සයෙහි හත, ආරම්මණ උපනිස්සයේ සතරදැයි උපනිස්සය විස්සකි.

පුරෙජාත හෝ පච්ඡාජාත වනාහි මෙහි නොවේ. පුරෙජාත පච්ඡාජාත හෝ අරූප ධර්ම නොවේ. අරූප ධර්මයන්ගේ පච්චය වේ. කම්මෙ අට්ඨ සුඛ සම්පයුත්තය සුඛ සම්පයුත්තයට දෙයාකාරයකින්, දුක්ඛ සම්පයුත්තයට නා නා ක්ෂණිකයෙන්ම එසේම අනිකට, දුක්ඛ සම්පයුත්තය දුක්ඛ

සම්පයුත්තයට දෙයාකාරයෙන්, සුඛ සම්පයුත්තයට නැත. අනිකට නා නා ක්‍ෂණිකවම අදුක්ඛමසුඛ සම්පයුත්තය අදුක්ඛමසුඛ සම්පයුත්තයට දෙයාකාරයකින් ද ඉතිරි ඒවාට නා නා ක්‍ෂණික අට, සහජාත තුන එකොළොස් කම්ම පච්චය. එසේම පුරෙජාත පච්ඡාජාත, මෙසේ විප්පයුත්ත පච්චය ද මෙහි අතහැරෙයි. අරූප ධම්ම අරූපවලට විප්පයුත්ත පච්චය නොවේ.

නත්ථි විගතවල හත අනන්තරවලට සමානය. මෙසේ මෙහි තුන, පහ, සත, අට, නවය යයි ගණන පරිච්ඡේද පහකි. ඒවායේ වශයෙන් පච්චය සැසඳීමේ අඩුම ගණන සමග සැසඳීම්වල අතිරේකය ද නොලැබෙන්න ද ඉවත්කර ගණන දතයුතුය. හේතුව සමග අරමුණ නොලබයි. අනන්තර ආදියද එසේය. අධිපතියා දෙව යයි දුක්ඛ පදය හැර සෙසු දෙක, දුක්ඛ සම්පයුත්ත හේතු අධිපති නම් නැත. එහෙයින් එය නොලබයි. සෙසු දෙකෙහිද මෙම නයයි.

මෙසේ හේතු මූලකයෙහි දෙකමය. ඒවායේ වශයෙන් ගැටුම් සය කියන ලදී. ඒවායින් පළමුවැන්න අවිපාක වූ ඥාණ විප්පයුත්ත නිරාධිපති ධර්මයන්ගේ වශයෙන් කියන ලදී. දෙවැන්න ඒවායේම විපාකයය. තෙවන, සිව්වන ඒවායේම ඥාණ සම්පයුත්තයන්ගේය. පස්වැන්න අවිපාක වූ සාධිපති අමෝහ වශයෙනි. සවැන්න විපාක වූ සාධිපති අමෝහ වශයෙන් පළමුව හෝ සියළු හේතු වශයෙන් දෙවැන්න සියළු විපාක හේතු වශයෙන් තෙවැන්න සියළු මෝහ හේතු වශයෙන්, සතරවැන්න සියළු විපාක මෝහ හේතු වශයෙන්, පස්වැන්න සියළු සාධිපති අමෝහ වශයෙන්, සවැන්න සියළු සාධිපති විපාක අමෝහ වශයෙන්

ආරම්මණ මූලකයෙහි **අධිපතියා චත්තාරි** ආරම්මණාධිපති වශයෙන් සැපය සැපයට, අදුක්ඛමසුඛයට, අදුක්ඛමසුඛය අදුක්ඛමසුඛයට, සුඛයටදැයි මෙසේ සතර උපනිස්සයෙහි ද ආරම්මණ උපනිස්සය වශයෙන් සතරක් කියන ලදී. මෙහි ගැටුම් එකකි. අධිපති මූලකාදියෙහි ද යට කියන ලද නයින්ම යමක් ලබයිද යමක් නොලබයිද ඒ සියල්ල මනාව සලකා සැසඳුම් ගැටුම් ගණන දතයුතුය.

පච්චනීයෙහි කුසලත්‍රිකයෙහි කියන ලද නයින්මය. අනුලෝම වශයෙන් පච්චය උදුරා එහි ලද වාර වශයෙන් පච්චනීයෙන් ගණන

වශයෙන් 'න හේතුවෙහි නවය' සියළු පච්චයවල නව වාරය දක්වන ලදී. ඒවා ඒකමූලක ඒක අවසානයේ විසඳුම් නවයක් වශයෙන් 'සැප වේදනාවෙන් යුත් ධර්මය සැප වේදනාවෙන් යුත් ධර්මයට නහෙතු පච්චයෙන් පච්චය වේ. සැප වේදනාවෙන් යුත් සිතින් දනය දී යනාදි නයින් පෙළ උපුටා දැක්විය යුතුය.

පච්චය සැසඳීමේ වනාගි මෙහි **න හෙතු පචචයා** උපනිස්සයෙහි අට යයි නා නා ක්‍ෂණික කම්ම පච්චය වශයෙන් දතයුතුය. හුදෙක් නා නා ක්‍ෂණික කම්ම පච්චයෙන් පච්චය වේ. මෙහි සෙස්ස අනුලෝම පච්චනීය පච්චනීය අනුලෝමයෙහි ද ඒ ඒ පච්චයන්ගේ යෝගයෙහි ලැබූ වාර වශයෙන් යට කියන ලද නයින් ගිනීමට හැකිවේ. එහෙයින් විස්තර නොකරන ලදී.

**වේදනාත්තික වර්ණනා නිමි.**

විපාකත්තිකයෙහි **විපාකං ධම්මං පටිච්ච විපාකො ධම්මො උපපජ්ජති හෙතුපච්චයා** යයි යම් තෙළෙස් වාර කියන ලදී. ඒවා සංක්‍ෂේප කර ගණන දැක්වීමට **හේතුයා තෙරස** යයි කියන ලදී. **ආරම්මණෙ පඤ්ච** යනාදියෙහි ද මෙම නයයි. මෙසේ මෙහි තෙළෙස, පහ, නවය, හත, තුන, දෙක යයි ගණන පරිච්ඡේද හයකි. ඒවායේ වශයෙන් පච්චය සැසඳීමේ යට කියන ලද නයින්ම ගණන දතයුතුය.

පච්චනීයෙහි **විපාකං ධම්මං පටිච්ච විපාකො ධම්මො උපපජ්ජති නහෙතු පච්චයා** යම් න හෙතු පච්චයෙහි දස වාරයක් කියන ලදී. ඒවා හකුළුවා ගණන දැක්වීමට **න හෙතුයා දස** යයි කියන ලදී. **න ආරම්මණෙ පඤ්ච** යනාදියෙහි ද මෙම නය වේ. මෙසේ මෙහි දහය, පහ, තෙළෙස, දොළොස, දෙක, එක, එක, නවය, තුණ යයි ගණන පරිච්ඡේද අටකි. ඒවායේ වශයෙන් පච්චය සැසඳීමේ යට කියන ලද නයින්ම විස්තර වශයෙන් ගණන දතයුතුය. පෙළ වූනාහි සංක්‍ෂිප්තය. මේවායේම ලැබූ ගණන පරිච්ඡේද වශයෙන් සසඳ අනුලෝම පච්චනීයද පච්චනීය අනුලෝමයද දතයුතුය. සහජාත වාරය මෙය මෙන් එක ගතිකය. පච්චය නිස්සය සංසට්ඨ සම්පයුත්ත වාර පෙළෙහි මෙන් පමුණුවයි.

ප්‍රශ්න වාරයෙහි **කුසලා කුසලෙ නිරුද්ධෙ** මෙහි විපස්සනා වශයෙන් පැවති කුසලයෙහි ඇලීම් වශයෙන් පැවති අකුසලයෙහි ද නිරුද්ධ විය. **විපාකො තදාරම්මණතා උප්පජ්ජති** කාමාවචර විපාකය තදාරම්මණ බව පිණිස උපදී. යම් විපස්සනා ජවනයන්ගේ විචිකිච්ඡා උද්ධච්චයන්ගේ අවසානයෙහි තදාරම්මණ නැතැයි කියති. එය මේ පෙළින් ප්‍රතිෂේධ කළයුතුය. **ආකාසානඤ්චායතන කුසලං විඤ්ඤාණඤ්චායතනස්ස කිරියස්ස ආරම්මණ පච්චයෙන පච්චයො** රහත්බවට පැමිණ පෙර සම නොවැදුණු සමාපත්ති පටිලෝම වශයෙන් සමවැදෙන්නාගේ වශයෙන් කියන ලදී. මේ උපායෙන් සියළු විසඳුම්වල මනාව පෙළ පරීක්ෂාකොට අර්ථය දතයුතුය.

**හෙතුයා සත්ත, ආරම්මණෙ නව, අධිපතියා දස** ආදියෙහි ද සහජාතාධිපති වශයෙන් ආරම්මණාධිපති වශයෙන් පුරෙජාත නිස්සය වශයෙන් අනන්තරූපනිස්සය වශයෙන් ආරම්මණ උපනිස්සය වශයෙන් සහජාත නිස්සය වශයෙන් ප්‍රකෘති උපනිස්සය වශයෙන් සහජාත විප්පයුත්ත වශයෙන් පුරෙජාත විප්පයුත්ත වශයෙන්දැයි යම් පමණ විසඳුම් ලබාද ඒ ඒ තැන ඒ සියල්ල සැලකිය යුතුය. එසේ පච්චනීයාදියෙහි ද අනුලෝම වශයෙන් හෝ ඉදිරිම, අනුලෝම වශයෙන් ලද වාරවල පච්චනීය වශයෙන් ගණන, පච්චය සැසඳීම, අනුලෝම පච්චනීය පච්චනීයානුලෝමයෙහි ද සුද්ධිවල මෙන්ම සංසන්දන වශයෙන් පැවති හේතු මූලකාදියෙහි ද ලබන වාර ගණන, නොලැබෙන්නන්ගේ නොලැබෙන බව යන සියල්ල යට කියන ලද නයින්ම දතයුතුය. මෙහි යම්සේ ද මෙයින් පසුවද තික දුකවල මෙසේය.

පට්ඨාන පකරණයෙහි පෙළම අනන්තය. අප්‍රමාණය. එහි පද පිළිවෙළින් අර්ථය වර්ණනා කරමියි පිළිපන්නහුට අති දීර්ඝායුෂ වූයේද ආයුෂ නො පොහොනේය. එහි ඒක දේසයක් එක් කොටසක් වර්ණනා කොට සෙස්ස නය වශයෙන් දැක්වීමෙන් අර්ථය දැනගැනීමට නොහැකි වේ. එහෙයින් මෙයින් පසු මෙපමණද නොකියා සෙසු තික දුකවල යට නොකියන ලද ප්‍රකාර ඇති යම් යම් කිවයුතු අවශ්‍ය දේ ඒ ඒ තැන්වල කියමු. යමක් නොකියා යන්නෙමු නම් එය පෙළෙහි නයින්ම දතයුතු වෙත්.

**විපාක තික වර්ණනා නිමි.**

උපාදාන උපාදානිය තිකයේ ප්‍රශ්න වාරයේ **වක්ඛු උපාදානියානං ඛන්ධානං පුරෙජාත පච්චයෙන පච්චයො** පැවැත්ම සඳහා කියන ලදී. ප්‍රතිසන්ධියෙහි වනාහි ඒ පුරෙජාත නොවේ. **උපාදින්නුපාදානියො කබලීකාරාහාරො උපාදින්නුපාදානියස්ස කායස්ස ආහාර පච්චයෙන පච්චයො** මෙහි උපාදින්න උපාදානිය කබලීකාර ආහාර නම් කම්ම සමුට්ඨාන රූපයන්ගේ අභ්‍යන්තරගත ඕජාවය. **උපාදින්නුපාදානියස්ස කායස්ස** ඒ කම්ම සමුට්ඨාන රූප කයට ආහාර පච්චයෙන් පච්චය වේ. රූප ජීවිතේන්ද්‍රිය මෙන් කටත්තා රූපවලට අනුපාලන උපස්ථම්භන වශයෙන් පච්චය වේ. ජනක වශයෙන් නොවේ. ගෙම්බන් ආදි සතුන් ගිල සිටි සර්පයින්ගේ කයට දිවමන් ගෙඹි ආදීන්ගේ ශරීර ඕජාව ආහාර පච්චයෙන් පච්චය වේ යයි කියති. එය නො ගත යුතුය. ජීවමාන ශරීරයේ ඕජා අනෙකෙකුගේ ශරීරයට ආහාර පච්චයභාවය නො සාදයි. **අනුපාදින්නුපාදානියස්ස කායස්ස** මෙහි වනාහි ජනක වශයෙන් ද ලබයි. **උපාදින්නුපාදානියස්ස ච** මෙහි එකකට උපස්ථම්භක වශයෙන් එකකට ජනක වශයෙන් දෙකටම හෝ උපස්ථම්භක වශයෙන්ම කියන ලදී. ආහාර දෙක එක පච්චයෙන් වන්නේ උපස්ථම්භකම වේ. ජනක නොවේ. මෙහි සෙස්ස පෙළම මනාව බලා දතයුතුය.

සංකිලිට්ඨ සංකිලෙසි තිකයෙහි සියල්ල කුසලත්තිකයෙහි කියන ලද අනුසාරයෙන්ම දතයුතුය.

විතක්ක තිකයෙහි යථා කම්මූපග ඤාණයට පරිකර්ම යයි දිබ්බචක්ඛු පරිකර්මයම එය ඉපදීම සඳහා පරිකර්ම වේ. ඉපදීමෙන් පසු ජීවත්වන කාලයෙහි පරිකර්ම සඳහා මෙය කියන ලදී. මෙහි සෙස්ස පෙළෙහි මෙන් පැමිණේ.

පීති තිකයෙහි **සුඛ සහගත භවංගං උපෙක්ඛා සහගතස්ස භවංගස්ස අනන්තර පච්චයෙන** තදාරම්මණ භවංග මූල භවංගයන්ගේ වශයෙන් කියන ලදී. මෙහි සෙසු සියල්ල පෙළ වශයෙන්ම දතයුතුය.

දස්සන තිකයෙහි **දස්සනෙන පහාතබ්බො රාගො උප්පජ්ජති** යනාදියෙහි පෘථග්ජනයාගේ ඉපදීම දර්ශනයෙන් (දැකීමෙන්) පහකළ යුතුය. භාවනාවෙන් ප්‍රහානය කළයුතුය. සෝවාන් වූ පුද්ගලයාගේ ද මෙසේ ඉහළට ඉහළට මිස පහළට පහළට නූපදින්නේ යයි දතයුතුය.

දර්ශනයෙන් පහකළයුතු ධර්මය භාවනාවෙන් පළකළයුත්තට එකම පච්චයකින්වත් පච්චය නොවේ. මෙහි සෙස්ස පෙළ අනුගමනය කර කුසලත්තිකයෙහි කියන ලද ලක්‍ෂණ වශයෙන්ම දතයුතුය.

දස්සනයෙන් පහළ කළයුතු හෙතුතතිකයෙහි දර්ශනයෙන් පහකළයුතු හේතුකාදියේ විභාගය අටුවා කාණ්ඩයෙහි කියන ලද නයින්ම දතයුතුය. විචිකිච්ඡා උද්ධච්ච සහගත මෝහය අහේතුක බැවින් තුන්වන පදයෙහි පිවිසියේය. මෙසේ මෙහි යමක් දර්ශන භාවනාවෙන් ප්‍රහානය කිරීමට හේතු ඇත. ඒවා ප්‍රහානය කළයුතු හේතුය. යමකට එය නැත. ඒවා දර්ශනයෙන් භාවනාවෙන් ප්‍රහානය කළයුතු හේතුක නොවේයයි මේ ප්‍රහානය කළයුතු හේතුක විභාගය දැන සෙස්ස දර්ශනයෙන් ප්‍රහානය කළ බවෙහිද කුසලත්තිකයෙහි ද දක්වන ලද ලක්‍ෂණ අනුසාරයෙන් දතයුතුය.

ආචයගාමී තිකයෙහි ද ධර්මය සේක ධර්මයට කිසි පච්චයකින් පච්චය නොවේ. අසේකයට අනන්තර ප්‍රකෘති උපනිස්සය වේ. මෙහි සෙස්ස විසඳීම් වශයෙන් ද ගණන් වශයෙන් ද පෙළ අනුව පමුණුවයි.

සෙකඛ තිකයෙහි අසේක ධර්මය සේක ධර්මයට කිසි පච්චයකින් පච්චය නොවේ. සේක අසේකයට අනන්තර ප්‍රකෘති උපනිස්සය වේ. මෙහි සෙස්ස පෙළ අනුව පමුණුවයි. පරිත්ත තිකයෙහි ද එසේය.

පරිත්තාරම්මණ තිකයෙහි අප්පමාණා රම්මණා චෙතනා සේකයන්ගේ (හික්මෙන්නන්ගේ) ගෝත්‍රභූ (භවය අවසන් කරන) චේතනාව. ප්‍රතිසන්ධි කර්මය අරමුණුකොට පවතින චක්ඛු විඤ්ඤාණයද වශයෙන් රූපාදි අරමුණු තදාරම්මණ වශයෙන් ජවනයෙන් ගත් කුඩා අරමුණද අරමුණු කොට ඉපදුනවුන්ට ගෝත්‍රභූ සිතින් යම් ප්‍රතිසන්ධියක් නැතැයි කියති. ඒවා මේ සූත්‍රයෙන් ප්‍රතිසේධ කළයුතුය. මෙහි සෙස්ස පෙළින්ම දතයුතුය. හීනතතිකය සංකිලිට්ඨතතිකයට සමානය.

මිච්ඡතතිකයෙහි නියත මිථ්‍යාව සම්මත නියතයට, සම්මත නියමයෙන් හෝ නියත මිථ්‍යාවට කිසියම් පච්චයකින් පච්චය නොවේ. නියත මිථ්‍යාව හෝ නියත සම්මතයට හෝ සහජාතාධිපති රහිතව නම් නැත. නියත සම්මතයෙහි ඒකාන්තයෙන් ආරම්මණ පුරෙජාතය නැත.

නියත මිථ්‍යාවෙහි ආරම්මණ පුරේජාත ඇත. අනියත සිත අරබයා නියත මිච්ඡාදිට්ඨි උපදින්නේ ය. සෙසු නියත අරබයා නියත නූපදී. නියත මිථ්‍යාව ගරුකොට කිසි ධර්මයක් නූපදී. කුසලය මිථ්‍යාවට උපනිස්සය පච්චය නොවේ. මෙහි සෙස්ස පෙළෙහි කී නයින් දතයුතුය.

මග්ගාරම්මණ තිකයෙහි පච්චය වාරයේ අනුලෝමයෙහි විපාක පච්චය නැත. කම්ම පච්චයෙහි ද මේ තිකයෙහි නා නා ක්‍ෂණික නො ලබයි. උප්පන්නතික අතීත තිකවල ද එසේය. පච්චනීයෙහි අහෙතුකං මගගාරමමණං අහේතුක මාර්ග අරමුණ ආවර්ජනය සඳහා මෙය කියන ලදී. මෙහි සෙස්ස පෙළ අනුසාරයෙන් දතයුතුය.

උප්පන්න තිකයෙහි ද අතීත තිකයෙහි ද පටිච්චවාර ආදිය නැත. ප්‍රශ්න වාරය පමණක් ලබයි. කවර හෙයින්ද? පටිච්චවාර ආදිය සහජාත පුරෙජාතයෙහි ම වේ. මේ තික ද අතීත අනාගත මිශ්‍රය. මෙහි උප්පන්න තිකයෙහි අනන්තර භාගිය පච්චය නොලැබේ. ඇයි? උප්පන්න තිකයෙහි අතීතය අභාවයෙන්, උප්පන්න ද අනුප්පන්න ද යන මේ ධර්ම දෙක උප්පන්නයට ද අනුප්පන්නයට ද යන මේ දෙකට කිසියම් පච්චයකින් පච්චය නොවේ. අනුප්පන්නයද උපදී යන මේ උප්පන්න දෙකට ආරම්මණ උපනිස්සය වශයෙන් පච්චය දෙකකින් පච්චය වේ. මෙහි සෙස්ස පෙළෙහි ආ නයින්ම දතයුතුය.

අතීත තිකයෙහි වර්තමානය අතීත අනාගත දෙකට අතීත අනාගත ද අතීත අනාගතයට කිසියම් පච්චයකින් පච්චය නොවේ. නිවන වනාහි මේ තික දෙකෙහිම පච්චය වශයෙන් නොවේ පච්චය උප්පන්න වශයෙන් නොලබයි. මෙහි සෙස්සද පෙළෙහි ආ නයින් දතයුතුය.

අජඣතත තිකයෙහි අජඣතත බාහිර පදය නො ගන්නා ලදී. අජඣතත බහිද්ධා සංඛ්‍යාත දෙක එකක් වශයෙන් (එකට) පච්චය නොවේ. පච්චයුප්පන්න ද නොවේ. සාසප (අබ) වර්ණය ද අත්තල වර්ණයද සමග එකට අරමුණු නොවේ යයි දතයුතුය. අජඣතත බහිද්ධා පද මෙනි. මෙසේ මෙහි අජඣතත ආරම්මණ තිකයෙහි ද අජ්ඣත්ත බහිද්ධාරම්මණ පද නොලබයි. සෙස්ස පෙළ අනුව පමුණුවන්න.

සනිදස්සන තිකයෙහි පෙළ වශයෙන් ම අර්ථය ගතයුතුය. මෙහි ගණන ද පෙළෙහි ආ වාර හකුළුවා යට කියන ලද නයින්ම සැසඳීමෙන් සසඳ දතයුතුය.

## ධම්මානුලෝමයෙහි තිකපට්ඨාන තිකපට්ඨාන වර්ණනාව නිමි.

දුක පට්ඨානයෙහි ද සියළු දුකවල ප්‍රශ්න විසඳීම් ද ගණන ද පෙළෙහි ආ නයින්ම දතයුතුය. එසේ වුවද මෙහි සහේතුක හේතු සම්පයුත්ත දුකවල විසඳීම හේතුදුක විසඳීම හා සමානය. හේතුචෙව සහේතුක හේතුචෙව හෙතු සමපයුතත දුකවල ද එසේය. සපපචචය සංඛත දුකවල ද එසේය. මේ දුක සපපචචය දුක මෙන් කළයුතුය. මෙය යම් හෙයකින් සප්පච්චය මෙන් අප්පච්චයෙන් සංඛතය ද අසංඛතය සමග යෙදීම නො ලබයි. එහෙයින් කියන ලදී. අරමුණු සහිත චිත්ත සම්ප්‍රයුක්ත සංසට්ඨ දුකද සමාන විසඳුම් වේමය. එසේ ආසව ඕඝ යෝග පොකුර. මේ තුන ඔවුනොවුන් සමාන විසඳුම් වේ.

තව ද ලෞකික සාශ්‍රව සංයෝජනිය ගන්ථනිය නීවරණීය පරමට්ඨ සංකිලෙසික දුක ආසව විප්පයුත්ත සාශ්‍රව සංයෝජන විප්පයුත්ත සංයෝජනීය ගන්ථ විප්පයුත්ත ගන්ථනීය නීවරණ විප්පයුත්ත නීවරණීය පරාමාස විප්පයුත්ත පරාට්ඨ කිලෙස විප්පයුත්ත සංකිලෙසික පරියාපන්න උත්තර දුකද මේ දුක සමානය. කිලෙස දුක සංයෝජන දුකට සමානය. සංකිලිට්ඨ කිලෙස සම්පයුත්ත නීවරණ සම්පයුත්ත දර්ශනයෙන් ප්‍රහාණය කළයුතු සරණ දුක ද සමානය. එසේම කිලෙසද සංකිලිට්ඨ නීවරණ මෙන්ම නීවරණ සම්පයුත්ත කෙලෙසද කෙලෙස් සම්පයුත්ත දුක. මෙම නයින් සියල්ලේ අර්ථය වශයෙන් සමාන දුකයන්ගේ විසඳුම් සමාන වේමයයි දතයුතුය.

සියළු පට්ඨානයේ පැමිණවිය යුතු දුකක් නොලැබේ. ආශ්‍රව මෙන්ම ආශ්‍රව සම්ප්‍රයුක්ත සංයෝජන මෙන්ම සංයෝජන සම්ප්‍රයුක්ත ග්‍රන්ථ මෙන්ම ග්‍රන්ථ සම්ප්‍රයුක්ත නීවරණ මෙන්ම නීවරණ සම්ප්‍රයුක්ත කෙලෙස් මෙන්ම සංකිලිට්ඨදැයි මෙබඳු දුකවල විපාක පච්චය මෙන්ම නා නා ක්‍ෂණික කම්ම පච්චය ද නොලබයි. න හෙතු සහෙතුක න හෙතු

අහේතුකවල හේතු පච්චය නැත. හේතු මෙන්ම හේතු සම්පයුත්තද ආශ්‍රව මෙන්ම ආශ්‍රව සම්පයුත්තව ග්‍රන්ථ මෙන්ම ග්‍රන්ථ සම්පයුත්තදැයි මේ දුකවල නහේතු ඣාන මග්ග නොලබයි. සංයෝජන මෙන්ම සංයෝජන සම්පයුත්තද නීවරණ මෙන්ම නීවරණ සම්පයුත්තද කෙලෙස් මෙන්ම සංකිලිට්ඨදැයි මේවායෙහි වනාහි විචිකිච්ඡා උද්ධච්ච සහගතයට මෝහයේ වශයෙන් න හේතු පච්චය ලබයි. න ඣාන මග්ග පච්චය නොලබයි. මෙසේ සියළු දුකවල ලැබෙන නොලැබෙන්න පරීක්‍ෂා කොට පෙළ වශයෙන්ම වාර ගණන දතයුතුය.

## දුක පට්ඨාන නිමි.

දුකතික පට්ඨානයෙහි **හෙතුං කුසලං ධම්මං පටිච්ච හෙතු කුසලො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා** මෙසේ ප්‍රශ්න පමණක් ඉදිරීම් වශයෙන් සංක්‍ෂේපයෙන් දේශනා කරන ලදී. **කුසලං අලොභං පටිච්ච අදොසො අමොහො** යනාදි නයින් විස්තර කළයුතු වන්නේය. එය යට දක්වන ලද නයින් හැකි වේ. නොකියන ලද්ද දැනගැනීමට එක් පදයක් ද එක් පච්චයක් හෝ නොකියන ලදී. සංක්‍ෂේපයෙන් යම් දේශනාවක් කරන ලද්දේද එය මෙසේ කරන ලදැයි දතයුතුය.

හේතු දුක සමග කුසල පද යොදා පටිච්ච වාරයෙහි අනුලෝමයේද පච්චනීයේ ද වශයෙන් සියළු ලැබෙන පච්චයන් දක්වන ලදී. අනුලෝම පච්චනීය පච්චනීය අනුලෝම නය ද සහජාත වාරාදිය ද නො දක්වන ලදී. හුදෙක් **පටිච්ච වාරෙ සදිසංයෙව විත්‍ථාරෙ තබ්බං** යයි කියන ලදී.

ප්‍රශ්න වාරයෙහි ප්‍රශ්න නො විසඳ හුදෙක් ප්‍රශ්න ඉදිරීම් පමණක් කොට අනුලෝම පච්චනීය වශයෙන්ම ලැබෙන පච්චය දක්වන ලදී. **යථා ච කුසල පදං එවං අකුසල අබ්‍යාකත පදානිපි හෙතු දුකෙන සද්ධිං යොජෙතබ්බා හෙතු කුසල දුකතිකං නිද්දිසිතබ්බං** යයි කියන ලදී. ඉන්පසු හේතු සැප වේදනාවෙන් යුත් ධර්මය ආදි නයින් හේතුවේදනා දුකතිකාදි එක්විසි දුකතික දක්වන ලදී. යම් හේතුවක් නම් සනිදස්සන සප්පටිඝ අනිදස්සන සප්පටිඝ පද නොයොදන ලදී. මෙසේ හේතු දුක සමග ලැබීම් වශයෙන් දෙවිස්සෙහි යොදා නැවත ඒවා සහේතුක දුකාදියෙන් සරණ දුක අවසන් කොට ඇති සියළු දුක සමග යොදන ලදී.

එහි යම් යම් පද යම් යම් පද සමග යෙදීම් නො ලබයි. ඒවා පෙළෙහි නොලැබේ යයි කියන ලදී. මෙසේ මෙහි එක් දුකක් සමග දෙවිසි වන තිකයෙහි යොදා නැවත වෙනත් දෙවිස්සක් වෙනත් දෙවිස්සක්දැයි පිළිවෙළින් දුක සියයෙහි ලැබෙන දුක පද සමග දෙවිසි තිකය යොදන ලදී. දෙවිසි තිකය ගෙන දුක සියයෙහි බහා දුකතික පට්ඨානය නම් දේශනා කරන ලදී. එහි ඒ ඒ තැන්වල නය දක්වා පෙළ සංක්‍ෂෙප කරන ලදී. ඒ ඒ තැන්වල දක්වන ලද නයානුරූපයෙන් විස්තර දතයුතුය.

දුකතික පට්ඨානය
නිමි.

තිකදුක පට්ඨානයෙහි ද කුසලං හෙතුං ධම්මං පටිච්ච කුසලො හෙතු ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා ප්‍රශ්න ඉදිරීම් වශයෙන් පමණක් දේශනා කරන ලදී. එහි යට යම්සේ හේතු දුක සමග කුසල පද යොදා සියළු පච්චය වශයෙන් සියළු වාරවල සංක්ෂේපයෙන් දේශනා කරන ලදී. මෙසේ මෙහි කුසලත්තිකය සමග හේතු පද යොදා සියළු පච්චය වශයෙන් සියළු වාරවල සංක්ෂේපයෙන් දේශනා කරන ලදී. හේතු පද යම්සේද මෙසේ නහේතු පද ද කුසලත්තිකය සමග යොදා කුසලත්තික හේතු දුක අවසන් කරන ලදී.

ඉන්පසු සුඛාය වෙදනාය සම්පයුත්තං හෙතුං ධම්මං යනාදි නයින් වේදනා තික දුකාදිය එක්විසි තික දුක දක්වන ලදී. මෙසේ දෙවිසි තිකයෙහි සමග හේතු දුක යොදා යළි ඒවා සමග සහේතුක දුකාදිය සරණ දුක අවසන් කොට ඇති ලැබීම් වශයෙන් සියළු දුක යොදන ලදී. මෙහි ද යම් යම් පද යෙදීමට නොයේද ඒවා පෙළෙහිම ප්‍රතික්‍ෂිප්තය. මෙසේ දුක සියය ගෙන දෙවිසි තිකයෙහි බහා තික දුක පට්ඨාන දේශනා කරන ලදී. එහිද යම් යම් නයවලින් පෙළෙහි සංක්ෂේප කරන ලදද ඒ ඒ නය විස්තර වශයෙන් දතයුතුය.

තික දුක පට්ඨාන
නිමි.

තික තික පට්ඨානයෙහි ද **කුසලං සුඛාය වෙදනාය සම්පයුත්තං ධම්මං පටිච්ච කුසලො සුඛාය වෙදනාය සම්පයුත්තො ධම්මො උප්පජ්ජති හෙතු පච්චයා** යයි ප්‍රශ්න ඉදිරීම් වශයෙන් ම සංක්ෂේපයෙන් දේශනා කරන ලදී. මෙහි ද කුසලත්තිකය වෙදනාත්තිකාදියෙන් වෙදනාත්තිකාදිය ද කුසලත්තිකයෙන්දැයි මෙසේ තිකවලම තික බහාලන ලදී. යම් යම් පද සමග යම් යම් පද යෙදීමට නොයේද, ඒවා පිරිහෙළා ලැබෙන වශයෙන්ම සියළු පච්චයවල වාර ද ගණන නය ද දක්වන ලදී. එහෙයින් ඒවා මනාව පෙළ පරීක්ෂාකොට දතයුතුය. කුසලත්තිකය වේදනාත්තිකාදියෙන් වෙදනාත්තිකාදියද එය සමග යොදා දත යුතුය. එසේ එක එක තික සෙස්සෙන් සෙස්සද ඒවා සමග යොදා දතයුතුය.

### තික තික පට්ඨාන නිමි.

දුක දුක පට්ඨානයෙහි ද **හෙතුං සහෙතුකංධම්මං පටිච්ච හෙතු සහෙතුකොධම්මො උප්පජ්ජති හෙතු පච්චයා**

ප්‍රශ්න ඉදිරීම් වශයෙන් ම සංක්ෂේපයෙන් දේශනා කරන ලදී. එහි හේතු දුක සහේතුක දුකාදියෙන් සහේතුක දුකාදිය ද එය සමග යොදන ලදී. එක එක දුක වනාහි සෙස්සෙන් සෙස්සද ඒවා සමග පිළිවෙළින් යෙදිය යුතුය. මෙය දුක දුක පට්ඨානය නම් දුකවලම දුක බහා දේශනා කරන ලදී. එයින් මෙය සියළු දුක සමග සියළු දුකවල යෙදීම දතයුතුය. පෙළ සංක්ෂේප කරන ලදී. යම් යම් පද සමග යම් යම් පද යෙදීමට නොයේද ඒවා පිරිහෙළා දේශනා කරන ලදී.

### දුක දුක පට්ඨාන නිමි.

මෙපමණකින්

**පට්ඨාන තික'තුම් - දුක'තුම් දුකතික ද යන**
**තික දුක ද තික තික - දුක දුකද යන මේ සය**
**සුගැඹුරු නයයි මේ - අනුලෝමයෙහි දක්වන**

අටුවාවෙහි කියන ලද ගීයෙන් දක්වන ලදී. ධම්මානුලෝම පට්ඨානයෙහි නය සයක් දක්වන ලද්දේ වේ. මෙහි පච්චය වශයෙන්

වනාහි එක එක පට්ඨානයෙහි අනුලෝම ආදිය සතර සතර නය යයි එක් පරියායකින් සූවිසි නය ප්‍රතිමණ්ඩිත අනුලෝම පට්ඨානයම දතයුතුය.

## අනුලෝම පට්ඨාන වර්ණනා නිමි.

දැන් කුසලාදි පද ප්‍රතික්ෂේප වශයෙන් පච්චනීය භාවයෙන් (විරුද්ධ භාවයෙන්) ලැබූ නම පච්චනීය පට්ඨානය දැක්වීමට **න කුසලං ධම්මං පටිච්ච න කුසලො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා** යනාදිය ආරම්භ කරන ලදී. එහි **න කුසලං ධම්මං පටිච්ච** කුසලයට පච්චයභාවය වලක්වයි. **න කුසලො ධම්මො උප්පජ්ජති** කුසලයේ උපත වලක්වයි. එහෙයින් අකුසල අබ්‍යාකත එක් ස්කන්ධයක් නිසා අකුසල අබ්‍යාකත ස්කන්ධ තුනක් චිත්ත සමුට්ඨාන රූපය යයි මේ ආදි නයින් මෙහි ප්‍රශ්නය විසඳිය යුතුය. ඒ ඒ පච්චයෙහි ලද ගණන වනාහි පෙළෙහි කියන ලද්දේමය. යම් වාර සමාන විසඳුම් වේද ඒවාද එහිම දක්වන ලදී. එහෙයින් මෙහි සියල්ල යට කියන ලද නයානුසාරයෙන් පෙළ පරීක්ෂා කොට දතයුතුය. මෙහි යම්සේද එසේ දුක පට්ඨානයෙහි, දුකතික පට්ඨානයෙහි තිකදුක පට්ඨානයෙහි තික තික පට්ඨානයෙහි දුක දුක පට්ඨානයෙහි ද වේ.

මෙපමණකින්

> **පට්ඨාන තික'තුම් - දුක'තුම් දුකතික ද යන**
> **තික දුක ද තික තික - දුක දුක ද යන මේවා**
> **පසනිය සයෙහි නය - සුගැඹුරු ලෙසින් දන්නේ**

අටුවාවෙහි කියන ගීයෙන් දක්වන ලදී. ධම්ම පච්චනීය පට්ඨානයෙහි නය සයක් දක්වන ලද්දේ වේ. මෙහි පච්චය වශයෙන් වනාහි එක එක පට්ඨානයෙහි අනුලෝම ආදිය සතර සතර නය යයි එක් පරියායකින් සූවිසි නය ප්‍රතිමණ්ඩිත පච්චනීය පට්ඨානයම දතයුතුය.

## පච්චනීය පට්ඨාන වර්ණනා නිමි.

දැන් කුසලාදි ධර්මවල පච්චනීය ධර්මය ප්‍රතික්ෂේප නොකොට පච්චයුප්පන්නයේ කුසලාදි භාවය ප්‍රතික්ෂේප වශයෙන් ධර්මයන්ගේ

අනුලෝම පච්චනීකතාවෙන් ලද නම අනුලෝම පච්චනීය පට්ඨානය දැක්වීමට **කුසලං ධම්මං පටිච්ච න කුසලො ධම්මො උප්පජ්ජති හෙතු පච්චයා** ආදිය අරඹන ලදී. එහි කුසලං ධම්මං පටිච්ච කුසලයේ පච්චයභාවය අනු දනී. **න කුසලො ධම්මො උප්පජ්ජති** කුසලයේම උපත වලක්වයි. එහෙයින් (කුසල් ස්කන්ධයන් නිසා චිත්ත සමුට්ඨාන රූප) **කුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්ත සමුට්ඨානං රූපං** යනාදි නයින් විසඳීම දක්වන ලදී. ඒ සියල්ල පෙළ බලා මනාව සැලකිය යුතුය. යමක් යමක් හා සමානද යමක් යම්තැනක ලබයිද යමක් යම් විසඳුම්වල යම් පච්චයවල ගණන දක්වාද ඒ සියල්ල පෙළෙහි දක්වන ලදී. එහෙයින් පෙළෙහි ම මෙහි අර්ථය වේ. මෙසේ දුක පට්ඨාන ආදියෙහි ද.

මෙපමණකින්

'පට්ඨාන තික'තුම් - දුක'තුම් දුකතික ද යන
තික දුක ද තික තික - දුක දුක ද යන මේ සය
අනුලොම් පසනියෙහි - සුගැඹුරු නයයි දන්නේ

අටුවාවෙහි කියන ලද ගීයෙන් දක්වන ලදී. ධම්මානුලෝම පච්චනීය පට්ඨානයෙහි නය සයක් දක්වන ලද්දේ වේ. මෙහි පච්චය වශයෙන් වනාහි එක එක පට්ඨානයෙහි අනුලෝමාදිය සතර සතර නය යයි එක් පරියායකින් සූවිසි නය ප්‍රතිමණ්ඩිත අනුලෝම පච්චනීය පට්ඨානයම දතයුතුය.

## අනුලොම පච්චනීය පට්ඨාන වර්ණනාව නිමි.

දැන් කුසලාදි ධර්මවල පච්චය ධර්ම ප්‍රතික්ෂේප කොට පච්චයුප්පන්නයෝ කුසලාදිභාවය ප්‍රතික්ෂේප නොකිරීම් වශයෙන් ධර්මයන්ගේ පච්චනීයානුලෝමතාවෙන් පච්චනීයානුලෝම පට්ඨානය දැක්වීමට **න කුසලං ධම්මං පටිච්ච අකුසලො ධම්මො උප්පජ්ජති හෙතු පච්චයා** යනාදිය අරඹන ලදී. එහි **න කුසලං ධම්මං පටිච්ච** කුසලයේ පච්චයභාවය වලක්වයි. **අකුසලො ධම්මො උප්පජ්ජති** අකුසලයේ උපත අනුදනී. න කුසලය අකුසලය අබ්‍යාකතය හෝ, එය ද සහජාත පච්චය කොට උපදිනු ලබන කුසලයක් නම් නැත. එහෙයින් අකුසල අබ්‍යාකත

වශයෙන් දේශනා කරන ලදී. එහි අකුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා න කුසල ධර්මය නිසා විසඳුම දතයුතුය. අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා මේ ප්‍රශ්නය වනාහි විපාකාබ්‍යාකතය, කිරියාබ්‍යාකත එක ස්කන්ධයක් නිසා ස්කන්ධ තුන චිත්ත සමුට්ඨාන රූපයද යයි විසඳන ලදී. මෙසේ සියළු නො විසඳුණු ප්‍රශ්නවල අර්ථයට අනුරූපව විසඳුම විසඳන ලද්ද ද පෙළෙහි ආ ලෙසම විසඳීම. තික දුකේ එක එකෙහි වාර ප්‍රභේද පච්චය ගණන විධානය යන සියල්ල යට කියන ලද අනුසාරයෙන් දතයුතුය.

මෙපමණකින් ද

'පට්ඨාන' තික'තුම් - දුක'තුම් දුකතික ද යන
තික දුක ද තික තික - දුක දුක ද යන මේ සය
පසනිය අනුලොම්හි - සුගැඹුරු නයයි දන්නේ

අටුවාවෙහි කියන ලද ගීයෙන් දක්වන ලදී. ධම්ම පච්චනීය අනුලෝම පට්ඨානයෙහි නය සයක් දක්වන ලද්දේ වේ. මෙහි පච්චය වශයෙන් වනාහි එක එක පට්ඨානයෙහි අනුලෝමාදිය එක් පරියායකින් සතර සතර නය යයි සූවිසි නය ප්‍රතිමණ්ඩිත පච්චනීයානුලෝම පට්ඨානයම දතයුතුය.

පච්චනීයානුලෝම පට්ඨාන වර්ණනාව නිමි.

මෙසේ ධම්මානුලෝමාදි වශයෙන් වාර සතරෙහි එක එකෙහි සූවිසි නය වශයෙන් නය සයානූවක් වේ. එහි පච්චය නය නොගෙන එක එක පට්ඨානයෙහි තික දුකාදීන්ගේම නය සය සය වශයෙන් සූවිසි නය ප්‍රතිමණ්ඩිත මේ සමස්ත පට්ඨාන ප්‍රකරණය දතයුතුය. කිසිවෙක් වනාහි 'කුසලාරම්මණො ධම්මො අකුසලාරම්මණො ධම්මො' (කුසල් අරමුණු දහම අකුසල අරමුණු ද) යනාදි නයින් ආරම්මණ මාතෘකා නම් තබා 'කුසලාරම්මණ ධර්මය කුසලාරම්මණ ධර්මයට හේතු පච්චයෙන් පච්චය වේ' යනාදි නයින් ආරම්මණ පට්ඨාන යයි දක්වා පසුව ඵස්සාදි වශයෙන් ද ඵස්ස පට්ඨානයයි උදුරා දක්වති. එය පෙළෙහි අටුවා කථාවල නො දක්නා ලැබේයයි මෙහි නො විචාරන ලදී. සංගීති ආරූඪ පෙළ වශයෙන් ම මෙහි වර්ණනා කරන ලදැයි දතයුතුය

මෙපමණකින් -

මුළා වූ ජනයා - ඒ කුලවලට පැමිණී
නෙක දුක් ගහණ වූ - සසරින් නොම ගොඩවෙතී

පස් බේහි කුසල වූ - ලොවැ ගරු ඒ පස'යුරු
අති නිපුණ ගැඹුරැති - ජවන් බිම්හි බුදුණැනේ

කුසල් ඈ දම් මේ - නිසා නේ නය ගණනින්
විස්තරන සත් - විදම් පකරණ මුනිඳුන්

සනිටුහන් කළ මනා - දෙසූ 'පට්ඨානය' නම්
සැදැහැයෙන් ඇරඹූ - මවිසින් එයට අටුවා

ඇදුරු මග නොහෙළා - සිසුනට 'විභජ්ජවාදී'
බුහු අනතුරු ලොවේ - රහිතව කිසි අනතුරක්

නිමාවට පත් සේ - බුහු දෙනෙතගෙ එසේ වේ
පැමිණෙත්වා වහා - කලණ සියළු සිතිවිලි

මෙපමණකින්

සත් පකරණ බුදුහු - බිදම් දෙසුවන පැණසර
දෙවියනට දෙව් වූ - දෙව්ලොව පෙරදී සමතැස්

එහි අටුවාව මෙහි - හැමතින් නිමවිය මනා
නිමවමින් එය මා - චිර පැවතුමට දහමේ

යම් කුසල් එහි චිත් - ආනුභාවයෙන් සිතුනට
සදහම් රජුගෙ මුළු - දහම් දැන සැප එලවන

සුව පිළිවෙතින් පිරි - සිදු බවට පැමිණෙත්වා
අසෝ නොතැවුල් වන - උතුම් නිවනේ සුවයට

චිර කලක් සදහම් - පවතීවා ගරු ලබා
සැම දෙනගෙන් මනා - කලටම වැසි වසීවා

හොඳ රජවරුන් මෙය - රැකි ලෙසට පොරණේ වූ
සුතනඹුවන් සේ තමා - දැහැමින් රකීවා රට

පට්ඨාන පකරණ අට්ඨකථා නිමි.

උතුම් පිරිසිදු ශ්‍රද්ධා බුද්ධි වීර්‍යයෙන් ප්‍රතිමණ්ඩිත වූ සිල්වත් ඍජු මෘදු ගුණයෙන් මූර්තිමත් වූ ස්වකීය සමයාන්තර ග්‍රහණ අධ්‍යයන සමර්ථ වූ ප්‍රඥා ව්‍යක්ත භාවයෙන් සමන්නාගත වූ අර්ථ කථා සහිත ත්‍රිපිටක පර්යාප්ති ප්‍රභේද ශාස්තෘඃ ශාසනයෙහි අප්‍රතිහත ඥාන ප්‍රභාවයෙන් මහා වෛයාකරණඥව හේතු සම්පත්තියෙන් ජනිත වූ සැප ඇත්තා වූ නිර්දෝෂ වර්ණයෙන් යුත් මිහිරි උදාර වදනින් පෝසත් වූ කිවයුත්ත නිසිලෙස කිමෙහි වාදීවර මහා පඬිවර වූ අර්ථාදි ප්‍රභේදගත වූ පිළිසුඹුයෙහි පිරිවර වූ ෂඩ්භිඥාදි ගුණ ප්‍රතිමණ්ඩිත වූ උතුරු මිනිස්දම්හි සුප්‍රතිෂ්ඨිත බුද්ධියෙන් ස්ථවිර වංශයට ප්‍රදීපායමාන මහා විහාරවාසීන්ගේ වංශයට අලංකාරයක් වූ මහත් වූ විසුද්ධ බුද්ධියෙන් බුද්ධඝෝෂ නම් වූ ගුරුවරුන් දෙන ලද නාමයෙන් ප්‍රසිද්ධ වූ මහා ස්ථවිරයන් විසින් සියළු අභිධර්ම පිටකයේ අර්ථකථාව කරන ලදී.

ලොවැ දෙටු මහරිසි - 'බුදු' නම පවතින තුරු
ලොව තරණය සොයන - කුලපුතුනට පිරිසිදු

එපමණ කල් ලොවේ - පෙන්වමින් සිත් ඇත්තට
විසුදු පැණ නය මෙම - පවතීවා එළිය දී

පරමත්ථදීපනී නම් වූ පඤ්චපපකරණ අට්ඨකථා

නිමා විය.

මහතෙරිඳු බුදුගොස් - කළ පෙළබසින් අටුවා
'පරමත්ථ දීපනී' - පස් පකරණය අටුවා

පඬුවස් නුවර වැසි - ඉපැරණිම රජදහනය
බාලසූරිය නම් - කළ සිහළ පෙරළිය මා

මෙදිව මතු නොව මුළු - ලොව බැබළ සිරිදම්රම්
විදුලකර අග පහත් - වියත් අගමිණ සිසුමිණ

විජම් මග පැහැයූ - ගුරුවර 'බිදම් වෙසරද
වතපොත් කළ සියළු - පෙළ'ටුවා ටීකා සැම

දුලබ පඬිවර පුන් - සිසි ලෙස බැබළි මෙ දිවේ
මීවැව එළිය කළ - යූ. බී. රාජකරුණා

මෙම පෙරළියෙන් වන - පිනක් වේද ඒ සියල්ලම
කරමි පින්පඬුරක් - ගුරුපඬුරු සේ පුදමින්

පළමු සෝදනය ද - අටුවාව පස්පකරණ
කළ සිරිලක්දිවෙහි - විජම් අතැඹුල සේ වී



THE BO-TREE AT ANARAJAPOORA.

ටෙනන්ට් 1859

භදන්ත බුද්ධඝොෂාචාර්යපාදයන් අනුරාධපුර
ශ්‍රී මහා බෝධිය අසල ප්‍රදේශයෙහි වැඩවසමින්
සිහළට්ඨකථා පාලියට පරිවර්තනය කළ බව
බොහෝදෙනාගේ විශ්වාසයයි

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන: 2734256, 2728468, 2726234 ෆැක්ස්: 2736737
විද්‍යුත් තැපෑල: bcc456@sltnet.lk, info@buddhistcc.com
www.buddhistcc.com

ISBN 978-955-1604-29-5